297 වන කාණ්ඩය - 08 වන කලාපය
தொகுதி 297- இல. 08
Volume 297 - No. 08

2022 නොවැම්බර් 22 වන අඟහරුවාදා
2022 நவம்பர் 22, செவ்வாய்க்கிழமை
Tuesday, 22nd November, 2022

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
ආංශික අධීක්ෂණ කාරක සභා: සාමාජිකයන් නම් කිරීම

**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව**

**සංචාරක වීසා මත ඕමාන් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයට ශ්‍රී ලාංකිකයන් යැවීමේ ජාවාරම:**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ ප්‍රකාශය

**විසර්ජන පනත් කෙටුම්පත, 2023 - [හත්වන වෙන් කළ දිනය]**
දෙවන වර කියවීම - විවාදය අවසන් කරන ලදී
පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවට පවරන ලදී

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
துறைசார் மேற்பார்வைக் குழுக்கள்: உறுப்பினர்கள் நியமனம்

**கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை**

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை**

**நுழைவு விசாமூலம் ஓமான், ஐக்கிய அரபு அமீரகம் ஆகிய நாடுகளுக்கு இலங்கையர்களை ஆட்கடத்தல்:**
தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சரினது கூற்று

**ஒதுக்கீட்டுச் சட்டமூலம், 2023 - [ஒதுக்கப்பட்ட ஏழாம் நாள்]:**
இரண்டாம் மதிப்பு - விவாதம் முடிவுற்றது
சட்டமூலம் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்பட்டது

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Sectoral Oversight Committees: Nomination of Members

AUDITOR-GENERAL'S REPORT

PUBLIC FINANCE COMMITTEE REPORT

TRAFFICKING OF SRI LANKANS ON VISIT VISA TO OMAN AND THE UAE:
Statement by Minister of Labour and Foreign Employment

APPROPRIATION BILL, 2023 – [Seventh Allotted Day]
Second Reading – Debate Concluded
Bill Committed to a Committee of the Whole Parliament

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2022 නොවැම්බර් 22*** *වන අඟහරුවාදා*
*2022 நவம்பர் 22, செவ்வாய்க்கிழமை*
*Tuesday, 22nd November, 2022*

**පූ. භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා [ගරු අජිත් රාජපක්ෂ මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு. ப. 9.30 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு அஜித் ராஜபக்ஷ] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. DEPUTY SPEAKER
[THE HON. AJITH RAJAPAKSE] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### ආංශික අධීක්ෂණ කාරක සභා: සාමාජිකයන් නම් කිරීම
### துறைசார் மேற்பார்வைக் குழுக்கள்: உறுப்பினர்கள் நியமனம்
### SECTORAL OVERSIGHT COMMITTEES: NOMINATION OF MEMBERS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111 හි විධිවිධාන සහ 2022 නොවැම්බර් 21 දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව පත් කරන ලද, ආංශික අධීක්ෂණ කාරක සභා 17 සඳහා සේවය කිරීමට තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද සාමාජික මන්ත්‍රීවරයන්ගේ නම් සියල්ල මවිසින් **සභාගත*** කරනු ලබන අතර, ඒවා හැන්සාඩ් වාර්තාවේ භාෂා ත්‍රිත්වයෙන්ම පළ කරනු ලබන බව මෙම සභාවට දන්වනු කැමැත්තෙමි.

****සභාමේසය මත තබන ලද නාම ලේඛනය:***
*சபாபீடத்தில் வைக்கப்பட்ட பெயர்ப் பட்டியல்:*
*List of names tabled:*

**1. ආගමික කටයුතු හා සහජීවනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා
ගරු නිමල් ලාන්සා මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු අලි සබ්රි රහීම් මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා
ගරු එම්. රාමේෂ්වරන් මහතා

**2. ප්‍රතිසන්ධානය සහ ජාතික සමගිය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
ගරු ඒ.එල්.එම්. අතාඋල්ලා මහතා
ගරු කුලසිංහම් තිලීපන් මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා
ගරු චින්තක අමල් මායාදුන්න මහතා
ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය

**3. ජාතික ආරක්ෂාව පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
ගරු චමල් රාජපක්ෂ මහතා
ගරු (ආචාර්ය) සරත් වීරසේකර මහතා
ගරු සම්පත් අතුකෝරල මහතා
ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා
ගරු (ආචාර්ය) (මේජර්) ප්‍රදීප් උඳුගොඩ මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා

**4. ජාතික ආර්ථික හා භෞතික සැලසුම් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
ගරු විමලවීර දිසානායක මහතා
ගරු ධම්මික පෙරේරා මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු නිපුණ රණවක මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

**5. ජාත්‍යන්තර සබඳතා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
ගරු නීතිඥ නාමල් රාජපක්ෂ මහතා
ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා
ගරු අකිල එල්ලාවල මහතා
ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය
ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා
ගරු යදාමිණී ගුණවර්ධන මහතා

**6. භාණ්ඩ හා සේවා අපනයන ඉහළ නැංවීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා
ගරු නිමල් ලාන්සා මහතා
ගරු සම්පත් අතුකෝරල මහතා
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු උදයකාන්ත ගුණතිලක මහතා
ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා
ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා

**7. ආර්ථික අර්බුදයේ බලපෑම සමනය කිරීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
ගරු එස්.බී. දිසානායක මහතා
ගරු ධම්මික පෙරේරා මහතා
ගරු ජීවන් තොන්ඩමන් මහතා
ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා
ගරු එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා
ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා

**8. බලශක්ති සහ ප්‍රවාහනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
ගරු නීතිඥ පවිත්‍රාදේවි වන්නිආරච්චි මහත්මිය
ගරු ගාමිණී ලොකුගේ මහතා
ගරු යූ.කේ. සුමිත් උඩුකුඹුර මහතා
ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා
ගරු උදයකාන්ත ගුණතිලක මහතා
ගරු කුමාරසිරි රත්නායක මහතා
ගරු යදාමිණී ගුණවර්ධන මහතා

**9. ආහාර සුරක්ෂිතතාව හා කෘෂිකර්මය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
ගරු චමල් රාජපක්ෂ මහතා
ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා
ගරු කපිල අතුකෝරල මහතා
ගරු මිලාන් ජයතිලක මහතා
ගරු සුදත් මංජුල මහතා
ගරු ඩී. වීරසිංහ මහතා

**10. පරිසරය, ස්වාභාවික සම්පත් හා තිරසර සංවර්ධනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
ගරු සී.බී. රත්නායක මහතා
ගරු අකිල එල්ලාවල මහතා
ගරු නාලක බණ්ඩාර කෝට්ටේගොඩ මහතා
ගරු එච්. නන්දසේන මහතා
ගරු අලි සබ්රි රහීම් මහතා
ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා

**11. අධ්‍යාපනය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
ගරු එස්.බී. දිසානායක මහතා
ගරු විමලවීර දිසානායක මහතා
ගරු සංජීව එදිරිමාන්න මහතා

ගරු කුලසිංහම් තිලීපන් මහතා
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
ගරු චින්තක අමල් මායාදුන්න මහතා
ගරු මංජුලා දිසානායක මහත්මිය

**12. විදෙස් රැකියා සහ ශ්‍රමය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
ගරු රෝහිත අබේගුණවර්ධන මහතා
ගරු කපිල අතුකෝරල මහතා
ගරු මිලාන් ජයතිලක මහතා
ගරු එම්.ඩබ්ලිව්.ඩී. සහන් ප්‍රදීප් විතාන මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා

**13. යුක්තිගරුක සහ නීතිගරුක සමාජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
ගරු ජෝන් සෙනෙවිරත්න මහතා
ගරු වජිර අබේවර්ධන මහතා
ගරු ජනක බණ්ඩාර තෙන්නකෝන් මහතා
ගරු තිසකුට්ටි ආරච්චි මහතා
ගරු ඉසුරු දොඩන්ගොඩ මහතා
ගරු නිතිඥ මධුර විතානගේ මහතා
ගරු ජනාධිපති නීතිඥ ජයන්ත වීරසිංහ මහතා

**14. සෞඛ්‍ය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
ගරු (වෛද්‍ය) ගයාෂාන් නවනන්ද මහතා
ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා
ගරු කුමාරසිරි රත්නායක මහතා
ගරු එම්. රාමේෂ්වරන් මහතා
ගරු සමන්ප්‍රිය හේරත් මහතා
ගරු ලලිත් වර්ණ කුමාර මහතා

**15. ළමුන්, කාන්තාවන් හා ස්ත්‍රී-පුරුෂභාවය පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
ගරු කරුණාදාස කොඩිතුවක්කු මහතා
ගරු මුදිතා ප්‍රිශාන්ති මහත්මිය
ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය
ගරු ඩී. වීරසිංහ මහතා
ගරු මංජුලා දිසානායක මහත්මිය
ගරු ජගත් සමරවික්‍රම මහතා

**16. මාධ්‍ය, තාරුණ්‍යය, උරුමය හා නූතන පුරවැසියා පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
ගරු එස්.එම්.එම්. මුෂාරෆ් මහතා
ගරු ජයන්ත කැටගොඩ මහතා
ගරු සංජීව එදිරිමාන්න මහතා
ගරු නිපුණ රණවක මහතා
ගරු ලලිත් වර්ණ කුමාර මහතා
ගරු ජගත් සමරවික්‍රම මහතා

**17. විවෘත සහ වගකිවයුතු රජයක් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව**
ගරු ජෝන් සෙනෙවිරත්න මහතා
ගරු වජිර අබේවර්ධන මහතා
ගරු (ආචාර්ය) මේජර් ප්‍රදීප් උඳුගොඩ මහතා
ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා
ගරු ගුණතිලක රාජපක්ෂ මහතා
ගරු මර්ජාන් ෆලීල් මහතා

**1. மத விவகாரங்கள் மற்றும் சகவாழ்வு பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**
மாண்புமிகு ஜனக பண்டார தென்னகோன்
மாண்புமிகு நிமல் லான்சா
மாண்புமிகு எச். நந்தசேன
மாண்புமிகு அலி சப்ரி ரஹீம்
மாண்புமிகு உபுல் மஹேந்திர ராஜபக்ஷ
மாண்புமிகு எம். ராமேஷ்வரன்

**2. நல்லிணக்கம் மற்றும் தேசிய ஒற்றுமை பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**
மாண்புமிகு ஏ.எல்.எம். அதாஉல்லா
மாண்புமிகு குலசிங்கம் திலீபன்
மாண்புமிகு இசுரு தொடன்கொட
மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த
மாண்புமிகு சிந்தக அமல் மாயாதுன்ன
மாண்புமிகு (திருமதி) ராஜிகா விக்கிரமசிங்ஹ

**3. தேசிய பாதுகாப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**
மாண்புமிகு சமல் ராஜபக்ஷ
மாண்புமிகு (கலாநிதி) சரத் வீரசேகர
மாண்புமிகு சம்பத் அதுகோரல
மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர
மாண்புமிகு (கலாநிதி) (மேஜர்) பிரதீப் உந்துகொட
மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய

**4. தேசிய பொருளாதார மற்றும் பௌதிகத் திட்டங்கள் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**
மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே
மாண்புமிகு விமலவீர திசாநாயக்க
மாண்புமிகு தம்மிக்க பெரேரா
மாண்புமிகு சுதத் மஞ்சுல
மாண்புமிகு நிபுண ரணவக
மாண்புமிகு குணதிலக ராஜபக்ஷ
மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார

**5. சர்வதேச தொடர்புகள் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**
மாண்புமிகு சட்டத்தரணி நாமல் ராஜபக்ஷ
மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்
மாண்புமிகு அகில எல்லாவல
மாண்புமிகு (திருமதி) கோகிலா குணவர்தன
மாண்புமிகு சட்டத்தரணி சாகர காரியவசம்
மாண்புமிகு யதாமினீ குணவர்தன

**6. பொருட்கள் மற்றும் சேவைகள் ஏற்றுமதியை அதிகரித்தல் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**
மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து
மாண்புமிகு நிமல் லான்சா
மாண்புமிகு சம்பத் அதுகோரல
மாண்புமிகு கருணாதாஸ கொடிதுவக்கு
மாண்புமிகு உதயகாந்த குணதிலக்க
மாண்புமிகு (மேஜர்) சுதர்ஷன தெனிபிடிய
மாண்புமிகு சட்டத்தரணி பிரேம்நாத் சி. தொலவத்த

**7. பொருளாதார நெருக்கடியின் தாக்கத்தினைத் தணித்தல் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**
மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க
மாண்புமிகு தம்மிக்க பெரேரா
மாண்புமிகு ஜீவன் தொண்டமான்
மாண்புமிகு (வைத்திய கலாநிதி) கயாஷான் நவனந்த
மாண்புமிகு எம். டப்ளியு. டீ. சஹன் பிரதீப் விதான
மாண்புமிகு (பேராசிரியர்) ரஞ்சித் பண்டார

**8. வலுசக்தி மற்றும் போக்குவரத்து பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**
மாண்புமிகு சட்டத்தரணி (திருமதி) பவித்ராதேவி வன்னிஆரச்சி
மாண்புமிகு காமினி லொக்குகே
மாண்புமிகு யூ.கே. சுமித் உடுகும்புர
மாண்புமிகு நாலக பண்டார கோட்டேகொட
மாண்புமிகு உதயகாந்த குணதிலக்க
மாண்புமிகு குமாரசிறி ரத்னாயக்க
மாண்புமிகு யதாமினீ குணவர்தன

**9. உணவுப் பாதுகாப்பு மற்றும் கமத்தொழில் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**
மாண்புமிகு சமல் ராஜபக்ஷ
மாண்புமிகு எஸ்.எம். சந்திரசேன
மாண்புமிகு கபில அதுகோரல
மாண்புமிகு மிலான் ஜயதிலக்க
மாண்புமிகு சுதத் மஞ்சுல
மாண்புமிகு டீ. வீரசிங்க

**10. சுற்றாடல், இயற்கை வளங்கள் மற்றும் நிலைபேறான அபிவிருத்தி பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**
மாண்புமிகு சீ.பி. ரத்நாயக்க
மாண்புமிகு அகில எல்லாவல
மாண்புமிகு நாலக பண்டார கோட்டேகொட
மாண்புமிகு எச். நந்தசேன
மாண்புமிகு அலி சப்ரி ரஹீம்
மாண்புமிகு உபுல் மஹேந்திர ராஜபக்ஷ

**11. கல்வி பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**
மாண்புமிகு எஸ்.பி. திசாநாயக்க
மாண்புமிகு விமலவீர திசாநாயக்க
மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன
மாண்புமிகு குலசிங்கம் திலீபன்
மாண்புமிகு (திருமதி) முதிதா பிரிஸான்தி
மாண்புமிகு சிந்தக அமல் மாயாதுன்ன
மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க

**12. வெளிநாட்டுத் தொழில்கள் மற்றும் உழைப்பு பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**
மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே
மாண்புமிகு ரோஹித்த அபேகுணவர்தன
மாண்புமிகு கபில அதுகோரல
மாண்புமிகு மிலான் ஜயதிலக்க
மாண்புமிகு எம். டப்ளியு. டீ. சஹன் பிரதீப் விதான
மாண்புமிகு சமன்பிரிய ஹேரத்

**13. நியாயமான, சட்டத்தை மதிக்கும் சமூகமொன்று பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**
மாண்புமிகு ஜோன் செனவிரத்ன
மாண்புமிகு வஜிர அபேவர்தன
மாண்புமிகு ஜனக பண்டார தென்னகோன்
மாண்புமிகு திஸகுட்டி ஆரச்சி
மாண்புமிகு இசுரு தொடன்கொட
மாண்புமிகு சட்டத்தரணி மதுர விதானகே
மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி ஜயந்த வீரசிங்க

**14. சுகாதாரம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**
மாண்புமிகு (வைத்திய கலாநிதி) கயாஷான் நவனந்த
மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி
மாண்புமிகு குமாரசிறி ரத்னாயக்க
மாண்புமிகு எம். ராமேஷ்வரன்
மாண்புமிகு சமன்பிரிய ஹேரத்
மாண்புமிகு லலித் வர்ண குமார

**15. சிறுவர்கள், பெண்கள் மற்றும் பாலினம் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**
மாண்புமிகு கருணாதாஸ கொடிதுவக்கு
மாண்புமிகு (திருமதி) முதிதா பிரிஸான்தி
மாண்புமிகு (திருமதி) ராஜிகா விக்கிரமசிங்ஹ
மாண்புமிகு டீ. வீரசிங்க
மாண்புமிகு (திருமதி) மஞ்சுலா திசாநாயக்க
மாண்புமிகு ஜகத் சமரவிக்ரம

**16. ஊடகம், இளைஞர், மரபுரிமை மற்றும் புதிய பிரஜைகள் பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**
மாண்புமிகு எஸ்.எம்.எம். முஸ்ஸாரப்
மாண்புமிகு ஜயந்த கெட்டகொட
மாண்புமிகு சஞ்ஜீவ எதிரிமான்ன
மாண்புமிகு நிபுண ரணவக
மாண்புமிகு லலித் வர்ண குமார
மாண்புமிகு ஜகத் சமரவிக்ரம

**17. வெளிப்படையான மற்றும் பொறுப்புக்கூறவேண்டிய அரசாங்கமொன்று பற்றிய துறைசார் மேற்பார்வைக் குழு**
மாண்புமிகு ஜோன் செனவிரத்ன
மாண்புமிகு வஜிர அபேவர்தன
மாண்புமிகு (கலாநிதி) (மேஜர்) பிரதீப் உந்துகொட
மாண்புமிகு ஜகத் குமார சுமித்ராரச்சி
மாண்புமிகு குணதிலக ராஜபக்ஷ
மாண்புமிகு மர்ஜான் பளீல்

**1. Sectoral Oversight Committee on Religious Affairs and Co-Existence**
The Hon. Janaka Bandara Thennakoon
The Hon. Nimal Lanza
The Hon. H. Nandasena
The Hon. Ali Sabri Raheem
The Hon. Upul Mahendra Rajapaksha
The Hon. M. Rameshwaran

**2. Sectoral Oversight Committee on Reconciliation and National Unity**
The Hon. A. L. M. Athaullah
The Hon. Kulasingam Dhileeban
The Hon. Isuru Dodangoda
The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law
The Hon. Chinthaka Amal Mayadunna
The Hon. ( Mrs.) Rajika Wickramasinghe

**3. Sectoral Oversight Committee on National Security**
The Hon. Chamal Rajapaksa
The Hon. (Dr.) Sarath Weerasekera
The Hon. Sampath Athukorala
The Hon. U. K. Sumith Udukumbura
The Hon. (Dr.) (Major) Pradeep Undugoda
The Hon. (Major) Sudarshana Denipitiya

**4. Sectoral Oversight Committee on National Economic and Physical Plans**
The Hon. Mahindananda Aluthgamage
The Hon. Wimalaweera Dissanayake
The Hon. Dhammika Perera
The Hon. Sudath Manjula
The Hon. Nipuna Ranawaka
The Hon. Gunathilaka Rajapaksha
The Hon. (Prof.) Ranjith Bandara

**5. Sectoral Oversight Committee on International Relations**
The Hon. Namal Rajapaksa, Attorney-at-Law
The Hon. S. M. M. Muszhaaraff
The Hon. Akila Ellawala
The Hon. (Mrs.) Kokila Gunawardene
The Hon. Sagara Kariyawasam, Attorney-at-Law
The Hon. Yadamini Gunawardena

**6. Sectoral Oversight Committee on Increasing Export of Goods and Services**
The Hon. Johnston Fernando
The Hon. Nimal Lanza
The Hon. Sampath Athukorala
The Hon. Karunadasa Kodithuwakku
The Hon. Udayakantha Gunathilaka
The Hon. (Major) Sudarshana Denipitiya
The Hon. Premnath C. Dolawatte, Attorney-at-Law

**7. Sectoral Oversight Committee on Alleviating the Impact of the Economic Crisis**
The Hon. S.B. Dissanayake
The Hon. Dhammika Perera
The Hon. Jeevan Thondaman
The Hon. (Dr.) Gayashan Nawananda
The Hon. M. W. D. Sahan Pradeep Withana
The Hon. (Prof.) Ranjith Bandara

**8. Sectoral Oversight Committee on Energy and Transport**
The Hon. (Mrs.) Pavithradevi Wanniarachchi, Attorney-at-Law
The Hon. Gamini Lokuge
The Hon. U. K. Sumith Udukumbura

The Hon. Nalaka Bandara Kottegoda
The Hon. Udayakantha Gunathilaka
The Hon. Kumarasiri Rathnayaka
The Hon. Yadamini Gunawardena

**9. Sectoral Oversight Committee on Food Security and Agriculture**
The Hon. Chamal Rajapaksa
The Hon. S. M. Chandrasena
The Hon. Kapila Athukorala
The Hon. Milan Jayathilake
The Hon. Sudath Manjula
The Hon. D. Weerasingha

**10. Sectoral Oversight Committee on Environment, Natural Resources and Sustainable Development**
The Hon. C. B. Rathnayake
The Hon. Akila Ellawala
The Hon. Nalaka Bandara Kottegoda
The Hon. H. Nandasena
The Hon. Ali Sabri Raheem
The Hon. Upul Mahendra Rajapaksha

**11. Sectoral Oversight** Committee **on Education**
The Hon. S.B. Dissanayake
The Hon. Wimalaweera Dissanayake
The Hon. Sanjeeva Edirimanna
The Hon. Kulasingam Dhileeban
The Hon. (Mrs.) Muditha Prishanthi
The Hon. Chinthaka Amal Mayadunna
The Hon. (Mrs.) Manjula Dissanayake

**12. Sectoral Oversight** Committee **on Foreign Employment and Labour**
The Hon. Mahindananda Aluthgamage
The Hon. Rohitha Abegunawardhana
The Hon. Kapila Athukorala
The Hon. Milan Jayathilake
The Hon. M. W. D. Sahan Pradeep Withana
The Hon. Samanpriya Herath

**13. Sectoral** Oversight **Committee on Just and Law-abiding Society**
The Hon. John Seneviratne
The Hon. Wajira Abeywardana
The Hon. Janaka Bandara Thennakoon
The Hon. Thisakutti Arachchi
The Hon. Isuru Dodangoda
The Hon. Madhura Withanage, Attorney-at-Law
The Hon. Jayantha Weerasinghe, PC

**14. Sectoral Oversight** Committee **on Health**
The Hon. (Dr.) Gayashan Nawananda
The Hon. Jagath Kumara Sumithraarachchi
The Hon. Kumarasiri Rathnayaka
The Hon. M. Rameshwaran
The Hon. Samanpriya Herath
The Hon. Lalith Varna Kumara

**15. Sectoral** Oversight **Committee on Children, Women and Gender**
The Hon. Karunadasa Kodithuwakku
The Hon. (Mrs.) Muditha Prishanthi
The Hon. (Mrs.) Rajika Wickramasinghe
The Hon. D. Weerasingha
The Hon. (Mrs.) Manjula Dissanayake
The Hon. Jagath Samarawickrama

**16. Sectoral** Oversight **Committee on Media, Youth, Heritage and New Citizen**
The Hon. S. M. M. Muszhaaraff
The Hon. Jayantha Ketagoda
The Hon. Sanjeeva Edirimanna
The Hon. Nipuna Ranawaka
The Hon. Lalith Varna Kumara
The Hon. Jagath Samarawickrama

**117. Sectoral** Oversight **Committee on An Open and Accountable Government**
The Hon. John Seneviratne
The Hon. Wajira Abeywardana
The Hon. (Dr.) (Major) Pradeep Undugoda
The Hon. Jagath Kumara Sumithraarachchi
The Hon. Gunathilaka Rajapaksha
The Hon. Marjan Faleel

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආංශික අධීක්ෂණ කාරක සභාවල සභාපතිකම අපි විපක්ෂයට ඉල්ලුවා. මම ඔබතුමාට කලිනුත් කිව්වා, ආණ්ඩුවේ වැඩ ආණ්ඩුවට අධීක්ෂණය කරන්න බැහැ. ඒවා අධීක්ෂණය කරන්න ඕනෑ විපක්ෂය. ඒ කටයුත්ත සාර්ථක වෙන්න නම් විපක්ෂයට සභාපතිකම දෙන්න ඕනෑ. ආණ්ඩුවට බහුතරයක් තියාගත්තාට කමක් නැහැ. ඔබතුමා දන්නවා, පාර්ලිමේන්තුවේ බහුතරය තිබෙන්නේ මේ රජයට බව. කැබිනට් මණ්ඩලය ඒ ගොල්ලන්ගේ. හැම එකම ඒ ගොල්ලන්ගේ. නමුත්, රට බංකොලොත් කළා. මම ඒකයි කියන්නේ, අධීක්ෂණය විපක්ෂයට දෙන්න කියලා. සභාවේ බහුතරය තියා ගත්තාට කමක් නැහැ. මොකද, ආණ්ඩුවට බැහැ නේ ආණ්ඩුව අධීක්ෂණය කරන්න. ඔබතුමා දන්නවා නේ, පසුගිය කාලයේ සිද්ධ වුණ දේවල්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මම ඒ කාරණය පිළිබඳව ගරු කථානායකතුමා දැනුවත් කරන්නම්.

## විගණකාධිපතිවරයාගේ වාර්තාව
## கணக்காய்வாளர் அதிபதியினது அறிக்கை
## AUDITOR-GENERAL'S REPORT

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ සිව්වැනි කාණ්ඩයේ XX කොටස සහ හයවැනි කාණ්ඩයේ XXIV හා XXV කොටස්; සහ
- 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ පළමුවැනි කාණ්ඩයේ XI, XII, XIII, XIV, XV, XVI, XVII, XVIII හා XIX කොටස්, සිව්වැනි කාණ්ඩයේ IX, X, XI, XII හා XIII කොටස් සහ හයවැනි කාණ්ඩයේ I හා II කොටස් ගරු කථානායකතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

## II

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව -

- 2016 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XXIII කොටස;
- 2017 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ නවවැනි කාණ්ඩයේ XXVIII කොටස;
- 2018 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XLIII කොටස, තෙවැනි කාණ්ඩයේ XVII කොටස සහ නවවැනි කාණ්ඩයේ XXXIV කොටස;
- 2019 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XL හා XLI කොටස් සහ නවවැනි කාණ්ඩයේ XXXII, XXXIII හා XXXIV කොටස්;
- 2020 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ XXXV හා XXXVI කොටස්, තෙවැනි කාණ්ඩයේ XVIII කොටස සහ නවවැනි කාණ්ඩයේ XXIV, XXV හා XXVI කොටස්; සහ
- 2021 මුදල් වර්ෂය සඳහා විගණකාධිපතිවරයාගේ වාර්තාවේ දෙවැනි කාණ්ඩයේ VI, VII, VIII, IX, X, XI හා XIII කොටස්, තෙවැනි කාණ්ඩයේ III, IV, V හා VI කොටස් සහ නවවැනි කාණ්ඩයේ III, IV, V, VI හා VII කොටස් ගරු කථානායකතුමා වෙනුවෙන් මම ඉදිරිපත් කරමි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "එකී වාර්තා මුද්‍රණය කළ යුතුය" යි මම යෝජනා කරමි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***වාර්තා මුද්‍රණය කළ යුතුයයි නියෝග කරන ලදී.***
*அறிக்கைகள் அச்சிடப்படக் கட்டளையிடப்பட்டது.*
*Ordered that the Reports be printed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කාරක සභා වාර්තා පිළිගැන්වීම.

කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ වාර්තාව, ගරු ගීතා සමන්මලී කුමාරසිංහ මහත්මිය - *[සභා ගර්භය තුළ නැත.]*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද 2023 මුදල් වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව මම ඉදිරිපත් කරනවා.

මේ වාර්තාවේ වැඩ කටයුතු සඳහා අපට සතියක් පමණයි තිබුණේ. ඉංග්‍රීසි භාෂාවෙන් එම වාර්තාව දැන් සූදානම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අද දවස ඇතුළත අපි එම වාර්තාව සිංහල සහ දෙමළ භාෂාවලිනුත් ඉදිරිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තව ටික වෙලාවක් දෙන්න. මම මේ වාර්තාවේ ඔක්කොම කියවන්නේ නැහැ. I just want to make mention of the main component, Section 2, of the Executive Summary of "The Committee on Public Finance Report on the 2023 Budget - Assessment of the Fiscal, Financial and Economic Assumptions". මෙම වගන්තිය වැදගත්. මොකද, අපේ අය වැය ඉදිරිපත් කරනකොට උපකල්පන සම්බන්ධයෙන් තක්සේරුවක් කරන්න ඕනෑ. මෙම වාර්තාවේ මූලික කොටස විතරක් මම කියවන්නම්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රථම වතාවට අපේ රජයේ මුදල් පිළිබඳ කාරක සභාවට තාක්ෂණික කාර්ය මණ්ඩලයක් පත් කර තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, අය වැය සම්බන්ධයෙන් වන කාර්යාලයක් පාර්ලිමේන්තුවේ ස්ථාපනය කරන්න. අපි මෙය outsource කරන්නේ නැතුව, අපේ කාර්ය මණ්ඩලයෙන්ම තමයි ප්‍රථම වතාවට ඉදිරිපත් කරන්නේ කියන කාරණයත් මම සතුටින් ප්‍රකාශ කරන්න කැමැතියි.

Sir, since the Hon. Prime Minister is also here, I would like to quote the third paragraph of the Executive Summary of this Report:

> "Section 2 discusses the economic and financial assumptions underlying Budget 2023 and the key risk factors associated with these assumptions. The two main macroeconomic assumptions used in the formulation of the Budget are real GDP growth and the inflation rate. Real GDP growth rate for 2023 is assumed to be a negative 3 per cent. Given the current economic crisis, achieving a positive 5.7 percentage point change in real GDP growth from the lowest growth of -8.7 per cent observed for the past several decades may prove challenging. The COPF observes that possible downside risks to the real GDP growth rate assumption can arise from GDP sectoral forecasts and changes in aggregate demand. On the production side, the industry sector is expected to record a subpar performance, particularly given the weak global growth forecast for 2023."

As you know the entire global growth forecast is falling. It further states, I quote:

> "On the demand side, contractionary monetary policy coupled with tight fiscal policy is expected to dampen investment and consumption, posing a risk to the economic recovery."

Here, what we are trying to point out, Sir, is that with interest rates now at 36 per cent on the temporary overdraft and leasing rate at about 40 per cent plus, it is going to be extremely difficult for industrial sector to grow. Then, it also goes on to state, I quote:

> "On inflation, COPF is of the view that an annual average inflation rate of 30 per cent assumed in the Budget 2023 is plausible."

With regard to inflation, the assumption for this year, Sir, is 30 per cent; උද්ධමනය සියයට 30ක් ලෙස තමයි උපකල්පනය කරලා තිබෙන්නේ. අපි විශ්වාස කරනවා ඒක සාධාරණයි කියලා. සමහර විට ඊට වඩා අඩු වෙන්නත් පුළුවන්. නමුත් අපි එක දෙයක් මතක තබාගන්න ඕනෑ. උද්ධමනය සියයට 30ක් ලෙස පුරෝකථනය කරන නිසා තමයි, උපකල්පනය කරන නිසා තමයි ඔබතුමන්ලා බලාපොරොත්තු වන්නේ, බදු ලබාගන්න කොට උද්ධමනය නිසා ලැබෙන බදු ප්‍රමාණය වැඩි වෙනවා කියලා.

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

Then, the Report states, I quote;

> "Although the latest data indicates a deceleration in inflation, global inflationary pressures together with supply chain disruptions, will keep inflation at elevated levels in 2023. This section also looks at other assumptions such as the expected export growth and the profitability of the financial sector underlying the budget estimates.

About Section 3, it states, I quote:

> "Section 3 provides an analysis of the revenue and expenditure estimates in the 2023 Budget and evaluates them against the assumptions underlying these estimates and the policy measures undertaken in the budget. Given that tax revenue increase in line with nominal GDP growth, policy changes and improvements in tax administration, revenue categories are assessed in terms of changes attributed to nominal growth and changes attributed to policy measures and better administration."

So, what we are saying is that because the inflation is so high, there is going to be a natural growth in your revenue, but getting an additional revenue beyond inflation is a question, given the falling growth rates we are expecting.

The next point I want to highlight, Sir, is this.

> "On the expenditure front, although the Budget 2023 maintains recurrent expenditure at current levels, this is mainly driven by the reduction in non-interest recurrent expenditure."

What I am going to quote next is important.

> "Against the backdrop of the economic crisis and high inflation, it may be difficult to maintain certain categories of non-interest recurrent expenditure such as salaries and wages at given levels in 2023. As interest payments are expected to rise considerably, primarily on account of domestic borrowings, COPF is of the view that there is a rollover risk associated with short-term domestic borrowings given the current high yield rates on Treasury Bills. The main risk associated with the foreign interest payment estimate is that it is heavily reliant on the progress of debt restructuring negotiations."

මේක ඉතාම වැදගත්. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට මා කලබල වන්නේ නැතිව මේ කථාව කියන්න ඕනෑ. ඒ තමයි, 2023 ජුනි මාසයේ 30වන දා වනකල්ම අප විදේශ ණය ගෙවීම suspend කරලායි තිබෙන්නේ. ඒ නිසා ඒ දිනය දක්වා ණය ගෙවීමේ අවශ්‍යතාවක් නැහැ. ඊට පසුව ජූලි මාසයේ ඉඳලා දෙසැම්බර් 31වන දා දක්වා ඔවුන් බලාපොරොත්තු වන්නේ විදේශ ණයවලින් සියයට 50ක් ගෙවීමක් විතරයි. එතකොට ඉතිරි සියයට 50 කපා දමන්න තමයි උපකල්පනය කර තිබෙන්නේ.

ගරු සභානායකතුමනි, මෙතැන තිබෙන අනෙක් ප්‍රශ්නය තමයි domestic debts සම්බන්ධ කාරණය. අපි මේ කාරණය highlight කරනවා. හිටපු ජනාධිපතිතුමනි, අපට තිබෙන ලොකුම වියදම තමයි පොලිය. මේ පොලිය, දේශීය පොලිය. දේශීය පොලිය ඉතාම ඉහළ නිසා කෙටි කාලීන -මාස 3- ණය තමයි අප ලබාගන්නේ. ඒ වෙනුවෙනුත් අපි දැන් සියයට 33ක් ගෙවනවා. ඉදිරියේදී මෙය කොච්චර දුරට කරගෙන යන්න පුළුවන්ද කියන එක පිළිබඳව විශාල ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ඒ නිසා තමයි අප කලින් කිව්වේ පොලී අනුපාතය ඉතාම වැඩි නිසා ආර්ථිකය ඉදිරියට ගමන් කිරීම පිළිබඳ ගැටලු මතු වී තිබෙන බව. පොලී අනුපාතය අඩු කරගන්න තිබෙන එක ක්‍රමයක් හැටියට දේශීය ණය පිළිබඳව හිතන්න වෙනවා. ඒ වෙනුවෙන් මොකක්ද කරන්න ඕනෑ කියා අපි කියලා නැහැ. නමුත්, දේශීය ණය ගෙවීම පිළිබඳ ගැටලුවක් මතු වෙමින් පවතිනවා කියන කාරණය සම්බන්ධයෙන් මේ ගරු සභාව දැනුවත් කිරීමට කමිටුව හැටියට අපට වගකීමක් තිබෙනවා. එම නිසා රජය ඒ සම්බන්ධයෙන් ක්‍රියාත්මක විය යුතුයි කියන එක කමිටුව හැටියට මා දැඩිව ප්‍රකාශ කරන්න කැමතියි.

මට කථා කරන්න කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு செஹான் சேமசிங்க - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Finance)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හර්ෂ ද සිල්වා මැතිතුමා කියපු කාරණයට මමත් එකඟ වෙනවා. තවත් ප්‍රධාන කාරණයක් මතු කරන්න මම කැමැතියි. මගේ කථාවේදී ඒ පිළිබඳව පැහැදිලි කරන්නම්. විශේෂයෙන්ම මේ දේශීය ණය සම්බන්ධයෙන් අද විවිධ කාරණා, තොරතුරු හුවමාරු වෙනවා. ගරු මන්ත්‍රීතුමා, that is the main reason why we cannot borrow for about three months. There are so many speculations. People speculate, some, unknowingly and some others, knowingly. So, the moment you speculate, people would not come and invest in bonds for over three months. Your point is taken, but it is also the responsibility of Parliament not to speculate on domestic debt, on which we have not taken a decision yet.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා කියන කථාව හරි. ඒ කියන්නේ විශ්වාසය මත තමයි මූල්‍ය වෙළෙඳ පොළ වැඩ කරන්නේ. බැංකුවක හිටපු ප්‍රධාන නිලධාරියෙකු හැටියටත්, ප්‍රධාන බැංකුවක භාණ්ඩාගාරිකවරයෙකු හැටියටත්, මට තිබෙන අත්දැකීම් අනුව මා දන්නවා, ගෙවන්න පුළුවන්ද, බැරිද කියලා. If you are in the call money market, it is based on perception. මූල්‍ය වෙළෙඳ පොළක මූලිකම අවශ්‍යතාව තමයි විශ්වාසය - confidence - ගොඩනැඟීම. රජය මේ විශ්වාසය ගොඩ නඟන්න අවශ්‍යයි. දැන් මුදල් රාජ්‍ය ඇමතිතුමා කියන්නේ, විශ්වාසය බිඳ වැටීම නිසා; speculate වන නිසා මාස තුනට එහා ආයෝජනය කරන්න පුද්ගලයන් සූදානම් නැහැ කියලායි. එතුමා කියන කාරණය මම පිළිගන්නවා.

නමුත්, ඒක ඔබතුමන්ලාගේ වගකීමක්. ඒ විශ්වාසය ජාත්‍යන්තරව හා දේශීයව ගොඩනඟන එක ඔබතුමන්ලාගේ මූලිකම වගකීමයි, ගරු අගමැතිතුමනි. ඔබතුමන්ලාගේ මූලිකම වගකීම තමයි, නැවතත් මේ ආර්ථිකය පිළිබඳ විශ්වාසය ගොඩනැඟීම. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති විධියට මට වගකීමක් තිබෙනවා, මේ පිළිබඳව දැනුවත් කරන්න. නමුත්, අපි කිසිම විධියකට මේක සම්බන්ධයෙන් speculate කරන්නේත් නැහැ; හරි ද, වැරදි ද කියන්නේත් නැහැ. We are just pointing out, Hon. State Minister of Finance, that you have to make sure that you act on your words, without uttering mere words.

Thank you.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

Hon. Deputy Speaker, I thank the Hon. (Dr.) Harsha de Silva, Chairman of the Committee on Public Finance, for tabling the Report with their observations and making comments on that. We will consider them, definitely.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

අමාත්‍යාංශ නිවේදන, ගරු මනුෂ නානායක්කාර ඇමතිතුමා.

## සංචාරක වීසා මත ඕමාන් සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයට ශ්‍රී ලාංකිකයන් යැවීමේ ජාවාරම: කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමාගේ ප්‍රකාශය
## நுழைவு விசாமூலம் ஓமான், ஐக்கிய அரபு அமீரகம் ஆகிய நாடுகளுக்கு இலங்கையர்களை ஆட்கடத்தல்: தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சரினது கூற்று
## TRAFFICKING OF SRI LANKANS ON VISIT VISA TO OMAN AND THE UAE: STATEMENT BY MINISTER OF LABOUR AND FOREIGN EMPLOYMENT

**ගරු මනුෂ නානායක්කාර මහතා (කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார - தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சர்)
(The Hon. Manusha Nanayakkara- Minister of Labour and Foreign Employment)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මේ අවස්ථාව ලබාදීම පිළිබඳව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

මේ දිනවල විශේෂයෙන්ම කථාබහට ලක්වෙන මාතෘකාවක් සම්බන්ධයෙන් මගේ අවධානය යොමු කරලා තමයි, මෙම අමාත්‍යාංශ නිවේදනය මම ඉදිරිපත් කරන්නේ. එක්සත් අරාබි එමීර් රාජ්‍යය සහ ඕමාන් රාජ්‍යය වැනි ශ්‍රමිකයින් බඳවා ගන්නා ඇතැම් රටවල වීසා ක්‍රියා පටිපාටිය ඉතාම ලිහිල් කිරීම හේතුවෙන් එම රටවල සේවායෝජකයන් විසින් සංචාරක වීසා භාවිත කරමින් පැමිණෙන ශ්‍රමිකයන් සිය සේවා ස්ථාන වෙත පැමිණීමෙන් පසුව එම සංචාරක වීසා රැකියා වීසා බවට පරිවර්තනය කර ඔවුන් රැකියා සඳහා බඳවා ගැනීමත් ඇතැම් අවස්ථාවලදී සිදු කරනු ලබනවා.

සේවායෝජකයන් ඔවුන්ගේ බඳවා ගැනීමේ පහසුව සහ බඳවා ගැනීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම හේතුවෙන් සංචාරක වීසා මත පැමිණෙන ශ්‍රමිකයන් මෙසේ බඳවා ගැනීම සිද්ධ වෙනවා. කෙසේ වුවත්, සමහර ජාවාරම්කාර අතරමැදි නිශ්චිත සේවායෝජකයන් හඳුනා නොගෙන සංචාරක වීසා භාවිත කරමින් ගෘහාශ්‍රිත අංශයේ රැකියා සඳහා කාන්තාවන් බඳවා ගැනීම ආරම්භ කර ඇති අතර, එමඟින් එවැනි කාන්තාවන් රැකියා නියෝජිතායතනවල හෝ ගමනාන්ත රටවල වෙනත් ස්ථානයන්හි අතරමං වී තිබෙනවා. පූර්ව ගිවිසුම්ගත සේවායෝජකයන් නොමැති බැවින්, එහි ප්‍රතිඵලයක් වශයෙන් එවැනි කාන්තාවන්ට අතරමැදි ස්ථානවලදී විවිධ දුෂ්කරතා, හිරිහැරවලට ලක් වීමට සිදුවෙලා තිබෙනවා. තවද, එම රටවල සිටින ශ්‍රී ලංකා රාජ්‍ය තාන්ත්‍රික දූත මණ්ඩලද එවැනි කාන්තාවන් ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම සඳහා සහාය පතන අවස්ථාවලදී වගකිව යුතු බඳවා ගැනීමේ ආයතනයක් හෝ අතරමැදියන් සොයා ගැනීම දුෂ්කර වී තිබෙනවා. සමහර අවස්ථාවලදී ගමනාන්ත රටවල බඳවා ගැනීමේ නියෝජිතයන් හෝ සේවායෝජකයන් විශාල බඳවා ගැනීමේ ගාස්තුවක් අය කරමින් අතරමැදියන් විසින් අදාළ කාන්තාවන් බඳවාගෙන ඇති බැව් අනාවරණ වී ඇත. සමහර කාන්තාවන් එක් රටකට ගෙනැවිත් පසුව දේශ සීමා හරහා වෙනත් අසල්වැසි රටවලට ප්‍රවාහනය කරන බව නිරීක්ෂණය කර ඇත. උදාහරණයක් වශයෙන්, මේ අය ශ්‍රී ලංකාවේ සිට එක්සත් අරාබි එමීර් රාජ්‍යයට රැගෙන ගොස් පසුව ඕමාන් රාජ්‍යය කරා පිටත් කර හැරේ. වර්තමානය වන විට ඕමාන් රාජ්‍යයේ සහ එක්සත් අරාබි එමීර් රාජ්‍යයේ සිටින කාන්තා ශ්‍රමිකයන්, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අදාළ තානාපති කාර්යාල හරහා ක්‍රියාත්මක කරනු ලබන සුරක්ෂා නිවාසවල නවාතැන් ගෙන සිටින අතර, එම අය සඳහා අවශ්‍ය සහාය ලබා දෙන ලෙස විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් මේ වන විට ඉල්ලීම් ලැබී තිබෙනවා. මේ වෙනකොට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වී ඕමානය බලා ගිය 12දෙනෙකුත්, සංචාරක වීසා භාවිත කරමින් වෙනත් කර්තව්‍යයන් සඳහා යන බව ලංකාවේ ගුවන් තොටුපළට හඟවමින් ලංකාවෙන් එළියට ගිය 65දෙනෙකුත් ඇතුළු 77දෙනෙක් ඕමාන් රාජ්‍යයේ සුරක්ෂා නිවාසයේ ඉන්නවා.

විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි වෙලා විදේශගත වුණු 70දෙනෙකුත්, සංචාරක වීසා මඟින් 7දෙනෙකුත් වශයෙන් 77දෙනෙක් ඩුබායි රාජ්‍යයේ ඉන්නවා. ලැබී තිබෙන පැමිණිලි සංඛ්‍යාව සහ සුරක්ෂා නිවාසවල සිටින සංඛ්‍යාව එකතු වුණාම ඔක්කෝම 1,000ක්, 1,500ක්, 2,000ක් පමණ වෙනවා. නමුත්, මේ වෙනකොට ඒක ඉතා අඩු සංඛ්‍යාවක් වෙලා තිබෙනවා. සංචාරක වීසා හරහා යන ප්‍රමාණය තමයි දැන් වැඩි වෙලා තිබෙන්නේ. අනෙක් ප්‍රමාණය ගෙන්වා ගැනීමට සහ ඒ රටවලදී ප්‍රශ්න ඇති වුණාම ඒවා විසඳීමට අපේ තානාපති කාර්යාලවල නිලධාරින් සහ විදේශ සේවා නියුක්ති කාර්යාංශය මැදිහත් වෙනවා. එහෙම නැත්නම් ඒ අය නැවත ගෙන්වා ගැනීමේ කටයුත්ත සිදු කරනවා. නමුත්, එහි රැඳිලා ඉන්න පුද්ගලයන් රැකී රක්ෂා සඳහා යන බව නොපවසා වෙනත් ව්‍යාජ කරුණු පවසා සංචාරක වීසා මත ලංකාවෙන් එළියට ගිය අය නිසා ඒ අය ලංකාවට ගෙන්වා ගැනීමේදී යම් යම් ගැටලුකාරී තත්ත්වයන්ට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා.

සංචාරක වීසා මත ගියාට පස්සේ ඒ අය තමන්ගේ වීසා සීමාව ඉක්මවා ගත කරන හැම දවසකටම ඕමාන් රියාල් 5ක් බැගින් ගෙවන්න ඕනෑ. ඒ අනුව, පුද්ගලයෙකුට සාමාන්‍යයෙන් ඕමාන් රියාල් 500කවත් දඩයක් ගෙවන්න සිදු වෙලා තිබෙනවා. ඒ වාගේම ඔවුන්ගේ ටිකට් පත් සඳහාත් විශාල මුදලක් වැය කරන්න සිදු වෙනවා. ඔවුන් සමහර ආයතනවලින් මුදල් ලබා ගෙන තිබෙන නිසා ඒ එක්කෙනෙක් ගෙන්වා ගැනීම සඳහා සමහර වෙලාවට රුපියල් ලක්ෂ 10ක පමණ මුදලක් ගෙවන්න සිදු වෙනවා. ඒක නිසා මේ තිබෙන තත්ත්වය සැලකිල්ලට අරගෙන අපි කටයුතු කරනවා. මේ වාගේ සිද්ධීන් හරහා අපේ රටේ කාන්තාවන්ට සිදුවන අපහසුතා, රැකියාවක් සොයා ගැනීම සම්බන්ධයෙන් ඇතිවන ප්‍රශ්න වාගේම ජාත්‍යන්තර වශයෙන් රාජ්‍ය තාන්ත්‍රිකව විවිධ ගැටලු පවා මතු වෙනවා. අපේ ශ්‍රමිකයන් විශාල සංඛ්‍යාවක් ඒ රටවල වැඩ කරනවා. එම නිසා අපි මේ පිළිබඳව නොයෙක් නොයෙක් තීන්දු-තීරණ රාශියක් ගන්න කටයුතු කළා. ඒ අනුව, උක්ත රටවල් සඳහා සංචාරක වීසා මත යන අයගේ ලියාපදිංචිය විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් මාසයකට කලින් අත්හිටුවනු ලැබුවා.

[ගරු මනුෂ නානායක්කාර මහතා]

ඒ වාගේම එම රටවල් දෙකට ගෘහ සේවය සඳහා ස්වයං මාර්ගයෙන් යන කාන්තා ශ්‍රමිකයන් සහ අඩු නිපුණතා සහිත රැකියා සඳහා යන කාන්තා ශ්‍රමිකයන් ලියාපදිංචිය අත්හිටුවන්නත් අපි කටයුතු කළා. ඒ වාගේම සංචාරක වීසා මත විදේශගත වන කාන්තාවන් පිළිබඳව ගුවන් තොටුපොළ කාර්යාංශ ඒකකයේ පරීක්ෂා කිරීම් තවදුරටත් වැඩි කිරීම හා අයථා -කූට- ක්‍රම මඟින් විදේශගත වීමට උත්සාහ කරන හා ඒවාට ආධාර උපකාර ලබා දෙන පාර්ශ්වයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීම දැඩි කරන්නත් අපි කටයුතු කළා. මෙම තැනැත්තන් සංචාරක වීසා මත අයථා ක්‍රම මඟින් රැකියා සඳහා විදේශගත කරනු ලබන පාර්ශ්ව හඳුනා ගෙන ඔවුන් සම්බන්ධයෙන් කාර්යාංශ පනත ප්‍රකාරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ විශේෂ විමර්ශන අංශය විමර්ශන කටයුතු සිදු කරමින් පවතින අතර, ඒ අනුව සිද්ධීන් 190ක් පමණ සම්බන්ධයෙන් අධිකරණයට කරුණු වාර්තා කර සැකකරුවන් රාශියක් අත්අඩංගුවට ගෙන ඇත. එසේම වංචනික ලෙස විදේශ රැකියා සඳහා යොමු කිරීම හේතුවෙන් මෙම වර්ෂය තුළදී ස්ථාන 25ක් සාර්ථකව වැටලීම්වලට ලක් කර ඇත. විශේෂයෙන් මෙවැනි සිද්ධීන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා පොලීසියේ අපරාධ විමර්ශන කොට්ඨාසය අඛණ්ඩව පරීක්ෂණ සිදු කරන අතර, පොලීසිය මඟින් ද සැකකරුවන් රාශියක් අත්අඩංගුවට ගෙන තිබෙනවා. මෙලෙස විශාල පිරිසක් විදෙස්ගත කරන්න කටයුතු කරපු පුද්ගලයෙකු අපි පෙරේදා අත්අඩංගුවට ගත්තා. ඒ වාගේම ඊයේ තවත් එකසියඅනූ ගණනක් විදෙස්ගත කරන්න කටයුතු කරපු කාන්තාවක් අත්අඩංගුවට ගන්න පුළුවන්කම ලැබුණා. නමුත් ඔවුන්ට අධිකරණයෙන් ඇප හම්බ වෙලා තිබුණා, අපේ නීතිඥ මහත්වරු ඒ අය වෙනුවෙන් ඉතාම සද්භාවයෙන් ඉදිරිපත් වෙලා කරුණු ඉදිරිපත් කරලා ලංකාවේ කාන්තාවන් පිටරට පටවපු මේ දූෂණයට සම්බන්ධ වෙච්ච අය බේරා ගැනීමට කටයුතු කිරීම නිසා.

කොහොම වුණත්, වර්තමානයේ පවතින තත්ත්වය සැලකිල්ලට අරගෙන, මේ ක්‍රියාමාර්ග සඳහා අපේ අමාත්‍යාංශය ඊයේ දිනයේදී කැබිනට් අනුමැතිය ලබා ගත්තා. මොකද, අපේ අමාත්‍යාංශයට බැහැ, රැකියා සඳහා විදේශගත නොවුණු පුද්ගලයෙක් සඳහා වියදම් කරන්න. එම නිසා ඒ සඳහා විශේෂ කැබිනට් අනුමැතියක් අපි ලබා ගත්තා.

මේ සුරක්ෂා නිවාසවලට පැමිණ සිටින කාන්තාවන් ආපසු අපේ රටට ගෙන්වා ගැනීමට පළමුවෙන්, CID එකේ කණ්ඩායමක් සමඟ අපේ විමර්ශන කණ්ඩායමක් එම රටට යවලා මේ අයගෙන් කට උත්තර අරගෙන ඔවුන්ව කවුද යැව්වේ, කවුද සහයෝගය දුන්නේ, කවුද ගුවන් තොටුපොළේදී උදවු කළේ, කවුද මේ අයගේ තැරැව්කරුවන් වශයෙන් කටයුතු කළේ, එතැනට යන්න කවුද ගුවන් තොටුපොළේදී සහාය දැක්වූයේ ආදී තොරතුරු සියල්ල සොයාගෙන ඒ අයට විරුද්ධව නඩු කටයුතු පටන් ගන්න අපි කැබිනට් අනුමැතිය ලබා ගත්තා. ඒ වාගේම මේ අය සම්බන්ධව නීතිමය කටයුතු පටන් ගන්නවාත් එක්කම ඒ අය නැවත ලංකාවට ගෙන්වා ගැනීම සඳහා අවශ්‍ය මුදල් විදේශ සේවා නියුක්ති කාර්යාංශය හරහා වියදම් කිරීමටත් අවශ්‍ය අනුමැතිය අපි ලබා ගත්තා. ඒ වාගේම මෙවැනි සිද්ධි නැවත ඇති නොවීම සඳහා මේ රටේ ජනතාව දැනුවත් කරන්නත්, මෙවැනි කටයුතු සිදු කරන පුද්ගලයන්ට එරෙහිව කටයුතු කරන නීති-රීති දැඩි කරන්නත් මහජන ආරක්ෂක අමාත්‍යාංශය සහ අපේ අමාත්‍යාංශය එකතු වෙලා විශේෂ වැඩ පිළිවෙළක් ආරම්භ කළා. මේ වෙනකොට, මහජන ආරක්ෂක අමාත්‍යාංශය සහ කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය එකතු වෙලා ඒ සම්බන්ධයෙන් විශේෂ කමිටුවක් පත්කර තිබෙනවා. ඒ වාගේම මේ වෙනකොට විදේශ කටයුතු ඇමතිතුමාත් සියලුම තානාපති කාර්යාල සමඟ එකතු වෙලා පෙරේදාත්, ඊයේත් සාකච්ඡා කිහිපයක් පවත්වා විශේෂ කටයුතු කිහිපයක් සූදානම් කර තිබෙනවා, මෙවැනි සිද්ධි නැවත ඇති නොවන්නට.

ඊට අමතරව බලපත්‍ර - licences - ලබා දීම පවා අපි මේ වෙනකොට අත්හිටුවා තිබෙනවා. විශේෂයෙන්ම නිවැරදි ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම, ලබා ගන්නා මුදල වැඩි කිරීම, ඒ වාගේම හැම පුද්ගලයකු පිළිබඳව ම පූර්ණ පරීක්ෂාවක් සිදු කර licence එකක් පවා සුපරීක්ෂාකාරීව ලබා දෙන ක්‍රමවේදයක් අපි ආරම්භ කර තිබෙනවා. කොහොම වුණත් අපේ කාන්තාවන් විදේශගත කරවීමේදී වංචා සහගත කටයුතු සිදු කරන පුද්ගලයන් අත්අඩංගුවට ගැනීම සඳහා ගන්න තිබෙන සියලු ක්‍රියාමාර්ග රජයක් විධියට අපි ගන්නවා. ඒ වාගේම අපි ඒ දැනුවත් කිරීමේ වැඩ පිළිවෙළත් ක්‍රියාත්මක කරන බව මේ අවස්ථාවේ මා මතක් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ගරු ඇමතිතුමාට මේ කාරණය මතක් කරන්න ඕනෑ. මේ ආර්ථික අර්බුදයට කලින්, හැම තානාපති කාර්යාලයකටම කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරියෙක් සහ විදේශ රැකියා අමාත්‍යාංශයේ නිලධාරියෙක් පත් කළා.

නමුත් මේ ආර්ථික අර්බුදයත් එක්ක ඒ කම්කරු නිලධාරින් ඔක්කෝම දැන් අයින් කරලා. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ නියෝජිතයාත් තානාපති කාර්යාලවල නැහැ. ගරු ඇමතිතුමනි, මේ ගැන පොඩ්ඩක් සොයා බලන්න. *[බාධා කිරීමක්]*

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා කියපු කාරණය මම පිළිගන්නවා. විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය විධියට ඒ රටවල තානාපති කාර්යාලවල 150දෙනෙක් සිටියා. නමුත් පසුගිය කාලයේ ඇති වුණු තත්ත්වය නිසා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ කාර්ය මණ්ඩලය 40යි, සියලුම රටවල් නියෝජනය කරන්න දැනට ඉන්නේ. ඉතින් බොහොම අපහසුතා මැද තමයි ඒ කාර්යාලවල කටයුතු කරගෙන යන්නේ. නමුත් ඉදිරියේදී තවත් 50ක කණ්ඩායමක් තාවකාලිකව ඒ රටවලට යැවීමට කැබිනට් මණ්ඩලයේ අනුමතිය ලබා ගෙන තිබෙනවා.

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මටත් විනාඩියකට අවසර දෙන්න.

ගරු ඇමතිතුමනි, විශේෂයෙන්ම ඕමාන තානාපති කාර්යාලයේ සිද්ධිය සම්බන්ධයෙන් කුෂාන් නමැති තැනැත්තෙකුට විශාල චෝදනාවක් තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ගත්ත ක්‍රියාමාර්ගය මොකක්ද කියලා පාර්ලිමේන්තුව දැනුවත් කරනවා නම් හොඳයි කියලා මම හිතනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මමත් මේ සිද්ධිය ගැන තමයි කියන්නේ. මට අවස්ථාව දෙන්න.

ගරු ඇමතිතුමනි, ඔබතුමා අරගෙන තිබෙන ක්‍රියාදාමය පිළිබඳව ඇත්තටම අපි සතුටු වෙනවා. හැබැයි, ඒ ක්‍රියාදාමය ගැනීමට මුල පිරුවේ මේ රටේ මාධ්‍ය ආයතන. මාධ්‍ය ආයතන

විසින් එම කාරණය පෙන්වා දෙන ලද නිසා තමයි ඒ විධියට ක්‍රියාත්මක වුණේ. එතෙක් අමාත්‍යාංශයේ සහ රටේ වගකිව යුත්තන් කිසිවෙකුගේ අවධානයට මෙය යොමු වුණේ නැහැ. අපේ රටේ ජනතාවට ඉන්න හිටින්න කන්න බොන්න නැති නිසා තමයි ඒ විධියට වීසා අරගෙන හෝ මේ රටින් ඒ අය යන්නේ. ඒ නිසා මම හිතනවා මේ පිළිබඳව අවධානය යොමු විය යුතුයි කියලා.

ගරු හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා සඳහන් කළ එම නිලධාරියා එක්ක සම්බන්ධ වුණු තවත් නිලධාරින් ඉන්නවා. ඔවුන් ඒ රාජ්‍යය තුළ මෙසේ අතවරයට ලක්වුණු පිරිස වෙනත් ආකාරයකින් බිය ගන්වනවා කියන කාරණය තමයි දිගින් දිගටම දැනගන්න තිබෙන්නේ. එක පුද්ගලයෙක් නම් අත්අඩංගුවට අරගෙන නැවත ගෙන්වා ගෙන තිබෙනවා. හැබැයි, මොවුන්ට සම්බන්ධ තානාපති සේවයේ ඉන්නා තවත් නිලධාරින් පිළිබඳව ඔබතුමන්ලා තීන්දු අරගෙන නැහැ.

ඒක බරපතළ කාරණයක්. ඒ හරහා දිගින් දිගටම ඔබතුමා කියන ඔය නිවහනේ ඉන්න බොහෝ දෙනෙකුට විශාල අඩන්තේට්ටම් සිද්ධ වෙනවා. මම හිතනවා, තානාපති සේවයටම දැනෙන්න විශේෂයෙන්ම අනෙක් රටවල ඉන්න අපේ අයටත් මේ ගැන දැනුම් දීමක් කළොත් හොඳයි කියලා. මොකද, අපේ ලාංකීය ජනතාව ආරක්ෂා කරගන්න තමයි ඔබතුමන්ලා, අපි විශාල මුදලක් ගෙවලා ඔවුන් තානාපති සේවයේ යොදවා තිබෙන්නේ. අපේ රටේ ජනතාවට හිංසනයක් වෙනකොට ඔවුන් පිහිට වෙන්නේ නැත්නම් ඒ සඳහා විශේෂ වැඩ පිළිවෙළක් යොදන්න කියලා මම ඉල්ලා සිටිනවා, ගරු ඇමතිතුමනි.

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා මතු කළ කාරණාවෙන් මම පිළිතුරු දෙන්න පටන් ගන්නම්. මමත් මාධ්‍යවේදියෙක් නේ. ඒ වාගේම මාධ්‍ය මඟින් මේ කාරණය පෙන්වා දුන්නා කිව්වාම මටත් පොඩි සතුටක් තිබෙනවා. ඒ වාගේම ඔබතුමාටත් voice-cut එකක් දමා ගන්න පුළුවන්, ගරු මන්ත්‍රීතුමා. හැබැයි, මේ සිද්ධිය සම්බන්ධයෙන් අපි පරීක්ෂණ කරලා, වැඩ පටන් අරගෙන තිබෙන්නේ. සියල්ල සම්බන්ධයෙන් නිරන්තරව වැඩසටහනක් ක්‍රියාත්මක වෙනවා. 2017-2018 කාලයේ මම මේ අමාත්‍යාංශය භාරව සිටිනකොටත් මෙවැනි ක්‍රියාවලට විරුද්ධව දැනුවත් කිරීම්, අත්අඩංගුවට ගැනීම් සිදු වුණා. මේ සියල්ල සිද්ධ වෙන ආපු දේවල්. හැබැයි, මේ visit visa ලියාපදිංචිය අපි අත්හිටුවන්නේ මීට මාසයකට ඉස්සෙල්ලා. එතකොට ඊයේ අත්අඩංගුවට ගත් කාන්තාවට විරුද්ධව අත්අඩංගුවට ගැනීමේ වාරණ නියෝගය ගන්නේ මීට මාසයකට විතර ඉස්සෙල්ලා. මාධ්‍ය සතියකට විතර කලින් මේ පිළිබඳව අවධානය යොමු කළා. අපට ඒකට සතුටුයි. මොකද, මාධ්‍ය අවධානය යොමු කළාම මේ පිළිබඳ අපටත් වැඩි උනන්දුවකින් වැඩ කරන්න පුළුවන්. ඒ වාගේම ඒ සඳහා අපට ලැබෙන සහයෝගයත් වැඩි වෙලා තිබෙනවා. සියලු පාර්ශ්ව මේ වෙනුවෙන් එකතු වෙලා තිබෙනවා. මීට කලින් අපි තනිවම, බොහොම අමාරුවෙන් ගෙන ගිය වැඩ කටයුත්ත කරගෙන යන්න මාධ්‍ය අපට ලොකු හයියක් දුන්නා. කොහොම වුණත් නීති-රීති ක්‍රියාත්මක කිරීම, licence ක්‍රියාත්මක කිරීම අඩු කිරීම, visit visa නතර කිරීම වාගේම තවත් අත්අඩංගුවට ගැනීම් රාශියක් සිද්ධ වෙලා තිබෙන්නේ මාධ්‍ය කිව්වාට පස්සේ නොවෙයි. මේ වෙලාවේ ලබා දෙන දේ සඳහා මාධ්‍යයට දෙන්න ඕනෑ ගරුත්වය අපි දෙනවා. හැබැයි, මාධ්‍ය කියන නිසා නොවෙයි අපි වැඩ කරන්නේ. අපි කරගෙන යන දේ වෙනුවෙන් මාධ්‍ය ලබා දෙන සහයෝගයටත් අපි ස්තුතිවන්ත වෙනවා.

අපේ ගරු මන්ත්‍රීතුමන්ලා එක්තරා පුද්ගලයෙක් ගැන සඳහන් කළා. මේ පුද්ගලයා සම්බන්ධයෙන් චෝදනාවක් තිබෙනවා. මේ චෝදනාව අපට චෝදනාවක් පමණක් වුවත්, මේ වන විට ඔහුගේ තානාපති සේවයේ කටයුතු අත්හිටුවලා -වැඩ තහනම් කරලා- ඔහුව ලංකාවට ගෙන එන්න අවශ්‍ය නීතිමය කටයුතු දැන් ක්‍රියාත්මක කරගෙන යනවා. ඔහු ලංකාවට ආපු ගමන් අත් අඩංගුවට අරගෙන ඉදිරි පරීක්ෂණ කටයුතු ක්‍රියාත්මක කරනවා. හැබැයි, මේක චෝදනාවක්. මේ පැමිණිලි කරන පාර්ශ්වයත් නීත්‍යනුකූල නොවන විධියට විදේශ රටකට ගිහිල්ලා, තානාපති කාර්යාලයේ ඉන්න පුළුවන්කමක් නැති වෙනකොට මේ අය අතර යම්කිසි වචන හුවමාරුවක් සිද්ධ වෙන්න පුළුවන්. ඒ නිසා වැරැද්ද කළේ කවුද, නොකළේ කවුද කියලා අපට පූර්ව නිගමනයකට එන්න පුළුවන්කමක් නැහැ. අපි නිලධාරින් රකින්නෙත් නැහැ. හැබැයි, නියමිත පරීක්ෂණයෙන් පස්සේ නීතිය ක්‍රියාත්මක කරනවා. ඒ නිලධාරියා කවුරු වුණත් දැනටමත් අපි නීතිය ක්‍රියාත්මක කරලා තිබෙනවා. අපි දැනටමත් ඔහුගේ වැඩ තහනම් කරලා තිබෙනවා. ඔහුගේ සේවය නතර කරලා නැවත ලංකාවට කැඳවන්න කටයුතු කර තිබෙනවා. ලංකාවට ආපු ගමන් ඔහු අත් අඩංගුවට ගන්නවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ සම්බන්ධයෙන් පරීක්ෂණයක් කරන්නේ මොනම මාධ්‍යයකටත් යන්න ඉස්සෙල්ලායි. අපට මේ කාරණාව අදාළ නොවන නිසා, ජනාධිපති ලේකම් කාර්යාලයට කරපු ඉල්ලීමක් අනුව ජනාධිපතිතුමා මීට මාස දෙකකට ඉස්සෙල්ලා විශේෂ කණ්ඩායමක් ඕමානයට යවා තිබෙනවා. ඒ යවපු කණ්ඩායම තමයි මේ පරීක්ෂණ කරලා මේ ගැන අනාවරණය කර ගත්තේ. ඊට පස්සේ තමයි මේ පිළිබඳ තොරතුරු මාධ්‍යයට නිරාවරණය වෙන්නේ.

## පාර්ලිමේන්තුවේ කටයුතු
### பாராளுமன்ற அலுவல்
### BUSINESS OF THE PARLIAMENT

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 දරන විෂය පිළිබඳ වැඩ අද දින රැස්වීමේ දී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 8හි විධිවිධානවල හා 2022 ඔක්තෝබර් 18 සහ 2022 නොවැම්බර් 10 යන දිනයන්හි පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රධාන වැඩ කටයුතු. විසර්ජන පනත් කෙටුම්පත - 2023, හත්වන වෙන් කළ දිනය.

විවාදය ආරම්භ කිරීම, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා.

# විසර්ජන පනත් කෙටුම්පත, 2023
## ஒதுக்கீட்டுச் சட்டமூலம், 2023
## APPROPRIATION BILL, 2023

*කල් තබන ලද විවාදය තවදුරටත් පවත්වනු පිණිස නියෝගය කියවන ලදී.*

*ඊට අදාළ ප්‍රශ්නය - [ නොවැම්බර් 14 ]*

*"පනත් කෙටුම්පත දැන් දෙවන වර කියවිය යුතු ය." - [ගරු රනිල් වික්‍රමසිංහ මහතා]*

*ප්‍රශ්නය යළිත් සභාභිමුඛ කරන ලදී.*

*ஒத்திவைக்கப்பட்ட விவாதம் மீளத் தொடங்குதற்கான கட்டளை வாசிக்கப்பட்டது.*

*சம்பந்தப்பட்ட வினா - [நவம்பர் 14]*

*"சட்டமூலம் இப்பொழுது இரண்டாம்முறை மதிப்பிடப்படுமாக." - [மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ]*

*வினா மீண்டும் எடுத்தியம்பப்பட்டது.*

*Order read for resuming Adjourned Debate on Question - [14th November]*

*"That the Bill be now read a Second time."- [ The Hon. Ranil Wickremesinghe]*

*Question again proposed.*

[පූ.භා. 10.01]

**ගරු මහින්ද රාජපක්ෂ මහතා**
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ)
(The Hon. Mahinda Rajapaksa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැය සම්බන්ධයෙන් මේ වන විට බොහෝ පක්ෂ, විපක්ෂ අදහස් පළ වී තිබෙනවා. ඒ අතර බොහෝ සාධනීය අදහස් මතු කර තිබුණා. අපි දන්නවා, රටක් විධියට අප කොතැනද ඉන්නේ කියලා. එතැන සිට මේ දිහා බලන එකයි, මේ දිහා පිටින් බලා ප්‍රතිචාර දක්වන එකයි දෙකක් කියලායි මා විශ්වාස කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජනාධිපතිතුමා, මුදල් අමාත්‍යවරයා වශයෙන් නව ආර්ථිකයක් නිර්මාණය කිරීමට අවශ්‍ය පදනම මේ අය වැයෙන් නිර්මාණය කරන බව පෙන්වා දුන්නා. එවැනි ආර්ථිකයක් බිහි කරන්න නම් අපි ඒ වෙනුවෙන් සම්පූර්ණ කළ යුතු කෙටි කාලීන හා දිගු කාලීන පියවර රැසක් තිබෙනවා. මේ හැම දෙයම අපි තේරුම් ගත යුතු වන්නේ පවතින ගෝලීය ආර්ථික හා දේශපාලන යථාර්ථයන් සමඟයි. එවැනි උපාය මාර්ගික සැලැස්මක ගමන් කළොත් විතරයි, අපට සුබවාදී අනාගතයක් නිර්මාණය කරගන්න පුළුවන් වෙන්නේ. ඒ නිසා සංශෝධනවලට යටත්ව අප සියලුදෙනාගේ සහයෝගය ඒ සඳහා ලබා දීම ඉතා වැදගත්.

අපි මේ තත්ත්වයේ ඉන්නේ ඇයි කියලා කවුරුන් හෝ අහනවා නම් බොහෝදෙනෙක් මෙය ආසන්න හේතුවලින් විග්‍රහ කරන්න යන නිසා හැම දාම ඉතිහාසය පුරා එන සත්‍යය යටපත් වෙනවා. ඔබතුමා දන්නවා, යහ පාලන ආණ්ඩුව ඉතා කෙටි කාලයක් තුළ ඉතිහාසයේ වැඩිම ණය ප්‍රමාණයක් ගත්තාය කියලා. අපට දරන්න බැරි තරම් ණය ගත්තා. එය මේ සභාවටවත්, රටටවත් තවදුරටත් රහසක් නොවෙයි.

අද ආර්ථිකය හදන්න අදහස් ඉදිරිපත් කරන ඇතැම් අය එදා ඒ ආණ්ඩුවේ සිටියාය කියලා අමතක වෙලා වාගේ කථා කරනවා. හැබැයි, වගකීම අරගෙන කරන්න කිව්වාම බැහැයි කියනවා. ඒ අය කැමැතියි, ප්‍රශ්න විචාරය කරන ජනප්‍රිය පැත්තේ ඉඳගෙන හැම දාම වීරයෝ වාගේ කථා කරන්න.

හැබැයි, ජනතාවට අපි මතක් කරනවා, අපට ඒ වාගේ වීරත්වයකින් වැඩක් නැති බව. ප්‍රශ්න, අභියෝගවලදී ඒවාටත් මුහුණ දෙන එක තමයි අපේ ප්‍රතිපත්තිය. ඒ නිසා අපි මේ මොහොතේවත් ජනතාව අතහැර පැනලා ගියේ නැහැ. එහෙම යන්නෙත් නැහැ.

මම කලින් කිව්වා වාගේ, අපි රට භාර ගත්තේ මහා ණය කන්දරාවක් එක්ක. එහෙම භාරගෙන අද වනකල් අපි දුෂ්කරතා මැද රට ඉදිරියට ගෙන යන්න අවශ්‍ය සහාය දීලා තිබෙනවා. ඉදිරියටත් එහි වෙනසක් වෙන්නේ නැති බව මෙම ගරු සභාවට මම මතක් කරන්න කැමැතියි. මේක ලෙහෙසි පහසු වැඩක් නොවෙයි. පාස්කු ප්‍රහාරය, කොවිඩ් වසංගතය නිසා ඇති වූ අර්බුදකාරී තත්ත්වය විසඳා ගැනීමේ කටයුතු අපි ඉතා අසීරුවෙන් කළමනාකරණය කර ගත්තා. **මේ වන විටත්** ඒ සමඟ ඇති වුණු බොහෝ දේවල් නිවැරදි කරමින් අපි ඉදිරියට ඇවිත් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එහෙත් සමහර අවස්ථාවල ජනතාව මත ඒ පීඩනය වැටුණා. ඉවසන්න කිව්වාට ජනතාව තමන්ගේ ප්‍රශ්න එක්ක ඉදිරියට එන එක අහඹුවක් නොවෙයි. හැබැයි, ඇතැම් අය ඒක ඔවුන්ගේ දේශපාලන වාසියට හරවා ගත්තා. ඒ නිසා මේවාට කවදාවත් ජනතාවට දොස් කියන්න එපා. ඇතැම් තීන්දු වැරදියි. ඒ වැරදි තීන්දු ගැන කථා කළා කියලා ඵලක් නැහැ. අපි වැරදුණු තැන් නිවැරදි කරගෙන රට ඉදිරියට ගෙන යන්න අවශ්‍යයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මොන තත්ත්වයක් යටතේ වුණත් එදිනෙදා රජයේ ආදායම්, වියදම් පියවා ගන්න බැරි වනකොට ඒ ඒ රජයන් ණය ගන්නවා. එහෙම ණය ගැනීම තව දවසකදී රටේ අස්ථාවර බවට හේතු වෙනවා. ආණ්ඩු මාරු වුණා කියලා රජයට ණය තියලා මාරු වෙන්න බැහැ. ඒ නිසා අපි දැන් කළ යුතුව තිබෙන්නේ ණය ප්‍රතිව්‍යුහගත කරමින් රජයේ අය වැය හිඟය අඩු කර ගැනීමයි. ඒ සඳහා රාජ්‍ය ආදායම ඉහළ දැමිය යුතුයි. පාඩු ලබන ආයතන ලාභ ලබන තත්ත්වයට පත් කර ගනිමින් කාර්යක්ෂම විදේශ විනිමය ඉපැයිය හැකි ආර්ථික ප්‍රතිසංස්කරණ කළ යුතුයි.

මේ වාගේ අවස්ථාවක විශේෂයෙන් අපනයන ආදායම අපට නිසි පරිදි ලැබෙනවා ද කියා හොයා බලන්න ඕනෑ. ඒ සඳහා වගකිව යුතු ආයතන ඊට ක්‍රියාත්මක වීමයි වැදගත් වෙන්නේ. සති අන්ත ඉංග්‍රීසි පුවත් පතක පසුගියදා මේ සම්බන්ධයෙන් විශාල හෙළිදරව්වක් කර තිබුණා. සාමාන්‍යයෙන් පිළිගන්නේ අපනයනය සිදුවෙලා දින 180කින් ඊට අදාළ මුදල් ලංකාවට ප්‍රේෂණය විය යුතුයි කියලායි. හැබැයි, ඒ වාගේ රෙගුලාසි ක්‍රියාත්මක වෙන්නේ නැත්නම්, ඒ වාගේ දේවල් මඟ හරවන්න රජය වහා පියවර ගත යුතුයි.

ඒ වාගේම, මහ බැංකුවේ දැනට සිදුවන, ඒවායේ අධීක්ෂණ පද්ධතිය තවදුරටත් කාර්යක්ෂම කළ යුතුයි. රේගු පද්ධතියට යොමු කරන අපනයන අංක දත්ත, මහ බැංකුවට යොමු වන අපනයන ප්‍රේෂණ සමඟ පරීක්ෂාවට ලක් විය යුතුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ හැම දේම එක්ක අපනයන ආදායම වැඩි කර ගැනීමට දේශීය අපනයනකරුවන් දිරි ගැන්වීම අවශ්‍යයි. අපනයන ආදායම් රටට ගෙන එමින් ඔවුන් කරන ජාතික මෙහෙවරත් අපි මේ අවස්ථාවේ අගය කළ යුතුයි.

ඒ විතරක් නොවෙයි. රට මුහුණ පා ඇති මේ අර්බුදයෙන් ගොඩ ගැනීමට නම්, ඒ අපනයන ආදායම් විදෙස් ගිණුම්වල තබා නොගෙන අපේ රට ඇතුළට ගේන්න කියලා මා ඔවුන් සියලුදෙනාගෙන් ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමාජ ආරක්ෂණය තහවුරු වන අපනයනය මූලික කරගත් තරගකාරී ආර්ථිකය, පරිසර හිතකාමී නිල හරිත ආර්ථිකය වාගේම ඩිජිටල් ආර්ථිකයත් අපි මීට පෙර ක්‍රියාවට නැංවූවා. එම වැඩ පිළිවෙළ මෙවර අය වැයෙන් නැවත තහවුරු කිරීම රටේ අනාගතය වෙනුවෙන් තැබූ සුබවාදී පියවරක් විධියටයි අප දකින්නේ.

එදා -2020දී- මුදල් අමාත්‍යවරයා වශයෙන් අපි පුළුල් කරපු විද්‍යුත් රාජ්‍ය ප්‍රසම්පාදන - eGP - ක්‍රමය අද රාජ්‍ය ආයතන දෙසියයකට අධික සංඛ්‍යාවක භාවිත කරනවා. මේ ක්‍රමයෙන් රාජ්‍ය ප්‍රසම්පාදන ක්‍රියාවලිය අද වනවිට විනිවිද හා වේගවත් ක්‍රියාවලියක් බවට පත්ව තිබීම සතුටට කරුණක්. ටෙන්ඩර් දැන්වීමේ සිට ලංසු තැබීම, ඇගයීම සහ ප්‍රදානය කිරීම දක්වා රජයේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ සම්පූර්ණ චක්‍රය අන්තර්ජාලය හරහා ගෙන ඒම සඳහා මුදල් අමාත්‍යාංශය දැන් eGP පද්ධතියේ දෙවැනි අනුවාදය හඳුන්වා දීමට සූදානම්. ඒ ක්‍රමය ක්‍රියාත්මක කරන එක කඩිනම් කරන්න කියා මා මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලා සිටිනවා. ඒ වාගේම, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ කර්මාන්තයත් මේ රටේ පහසුවෙන් දියුණු කළ හැකි කර්මාන්තයක්. අපි කාලයක් තිස්සේ එය හඳුනාගෙන ඉදිරියට ආවා. ඒත් ඇතැම් ව්‍යාපෘති අතරමඟ නැවතිලා. ඒවා නැවත ඉදිරියට අරගෙන මෘදුකාංග සමාගම් වාගේ ඒවා දිරිමත් කරලා දේශීය වශයෙන් පවා තිබෙන මෘදුකාංග කාර්ය භාරයන් ඔවුන්ට පවරන්න ප්‍රමුඛත්වය ගන්න කියලා අපි යෝජනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි දන්නවා අය වැය ඉදිරිපත් වුණා කියලා ජනතාවගේ ප්‍රශ්න එක රැයෙන් නිමා වෙන්නේ නැහැ කියලා. අපි සාකච්ඡා කළ යුත්තේ ජනතාව මත වැටෙන ඒ ජීවන බර අවම කරන වැඩ පිළිවෙළක් ගැනයි. එහෙම නැතිව අය වැය විවේචනය කළා කියලා, ජනතාව උසි ගැන්නුවා කියලා මම දන්න තරමින් රටට හෝ ජනතාවට සිදුවන සෙතක් නැහැ.

අද ජීවත් වෙන්න අමාරු තත්ත්වයක් නිර්මාණය වුණු ජනතාවක් ඉන්නවා. එවැනි අඩු ආදායම් ලබන පිරිස ආරක්ෂා කිරීම වෙනුවෙන් අය වැයෙන් විශාල මුදලක් වෙන් කරලාත් තිබෙනවා. ඔවුන්ව තවදුරටත් සුරක්ෂිත කරන්න අපි විසින්ම සමාජ ආරක්ෂණ දැලක් එළිය යුතුයි.

ඒක රටේ හැම පක්ෂයකම ප්‍රමුඛ අරමුණ විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. එහෙම නැතිව ඔවුන්ගේ දුක, කඳුල, ආවේගය තවදුරටත් රටේ දේශපාලන මෙවලමක් විය යුතු නැහැ. ඒ නිසා දිළිඳු හා අවදානම් මට්ටමේ ඉහළ ඉන්න ජනතාව වෙනුවෙන් අය වැයෙන් සැලකිය යුතු මුදලක් වෙන්ව තිබීම සාධනීය තත්ත්වයක් වුණත්, අපි ඔවුන් ගැන තවදුරටත් සොයා බලන්න ඕනෑ.

කෘෂි ආර්ථිකය ශක්තිමත් කිරීමට මෙවර අය වැයෙන් හොඳ තල්ලුවක් දීලා තිබෙනවා. කෘෂිකර්මාන්තයේදී අපි ගොවීන්ගේ ප්‍රශ්නවලට ඇහුම්කන් දීලා මේ ගමන යනවා නම්, මේ රටේ කෘෂිකාර්මික නවෝදයක් වෙනුවෙන් අපට තවත් බොහෝ දේ කළ හැකිව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය ආයතන කිහිපයක්ම ප්‍රතිව්‍යුහගත කිරීම ගැන මෙවර අය වැයෙන් අවධානය යොමු කර තිබෙනවා. ඒ අතර, ලාභ ලබන රාජ්‍ය ආයතනත් තිබෙනවා. පාඩු ලබන රාජ්‍ය ආයතන ලාභ ලැබීමේ තැනට පත් කිරීමට අවශ්‍ය පියවර ගැනීම තමයි අප මුලින් කළ යුතු වන්නේ. ඒ නිසා මොන ආර්ථික අභියෝගයක් යටතේ වුණත්, අපේ රටේ සම්පත් විකුණන එක අපේ ප්‍රතිපත්තිය නොවන බව මා අදත් ඔබට සිහිපත් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සංචාරක කර්මාන්තය කෙරෙහි වාගේම තරුණ ප්‍රජාව නඟා සිටුවීමටත් අවශ්‍ය යෝජනා මෙවර අය වැය තුළ අන්තර්ගතයි. ඒ වාගේම, අධ්‍යාපනය හා ආරක්ෂාව කෙරෙහිත් ප්‍රමුඛතාව ලබා දී තිබෙනවා. හැම පාසලකම දරුවන්ගේ ඉංග්‍රීසි අධ්‍යාපනය ඉහළ නැංවීමට කරන ප්‍රතිසංස්කරණ ඉතා වැදගත්. හැබැයි, දරුවන්ගේ පොත පත ගන්න යන වියදම් අඩු කරන්න ඕනෑ. දරුවෝ කියන්නේ අපේ අනාගතය.

දැන් සමහරු අහනවා, "ආරක්ෂාවට මෙච්චර මුදලක් වෙන් කරලා තිබෙන්නේ ඇයි, අඩු කරන්න තිබුණා නේ?" කියලා. ඒ අයට මම මේ කාරණය කියන්න ඕනෑ. රටේ ආරක්ෂාව තමයි හැම දේකටම බලපාන්නේ. රටේ ආර්ථිකය බැඳිලා තිබෙන්නේ ආරක්ෂාවත් එක්කයි. ඒ නිසා නිදහස් සෞඛ්‍ය සේවාව තහවුරු කරන ගමන් රටේ පවතින තත්ත්වයත් එක්ක ඉදිරියට යන්න නම් ඇතැම් වෙනස්කම් කරන්න අවශ්‍යයි. හැබැයි, විශාල වශයෙන් ජනතාවගේ බෙහෙත්-හේත් වියදම් ඉහළ නොයවා පවත්වාගන්න අවශ්‍යයි. පුළුවන් තරම් දේශීය බෙහෙත් නිෂ්පාදනය ඉහළ දැමීම ගැන අපි සැලකිලිමත් විය යුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඕනෑම ආණ්ඩුවක් බලයට පත්වුණාම මූලිකවම රටේ ජාතික ආරක්ෂාව, සංවර්ධනය හා සමාජ සුබසාධනය කෙරෙහි අවධානය යොමු කරන්න ඕනෑ. ඇතැමෙක් මේ එකක් හෝ දෙකක් කළාට, අපි නම් හැමදාම මේ හැම දේම ගැන අවධානය යොමු කළා. අපි බොහෝ දුෂ්කර කාල වකවානුවල වුණත් ජනතාව වෙනුවෙන් ඒ වගකීම ඉටු කළා. එදා වාගේම කිසි සැකයක් නැතුව හෙටත් අපි ඒ වගකීම ඉටු කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දේත් මම කියන්න ඕනෑ. පසුගිය කාලයේ මේ රටේ අර්බුද උත්සන්න කරන්න උදව් කරපු අය කවුද කියලා ජනතාවට නිරාවරණය වෙලා ඉවරයි. තවත් බොහෝ දේ ජනතාවට ඉදිරියේදී දැනගන්න ලැබේවි, මම කියන්න අවශ්‍ය නැහැ. අපේ රටට නැඟිටින්න අවස්ථාව නොදෙන දේශීය, විදේශීය බලවේග තවමත් ක්‍රියාත්මකයි. පසුගිය කාලයේ අත් දැකීම්වලින් ජනතාව හොඳින් ඒ බව තේරුම් ගත්තා. සමාජ මාධ්‍ය ඇසුරු කරන බොහෝදෙනා දැන් ඒ ගැන දන්නවා. හැබැයි, ඔවුන්ට ලජ්ජාවක් නැහැ. ඔවුන් අදත් කල්පනා කරන්නේ අප ආපහු වට්ටන්නේ කොහොමද කියලායි. පක්ෂ, පාටවලට බෙදිලා ගහ මරාගන්නේ නැතුව අපට අවශ්‍ය වන්නේ, ආණ්ඩු මාරු වුණාට නොවෙනස් වන රාජ්‍ය ප්‍රතිපත්තියක් මේ රට වෙනුවෙන් හදා ගැනීමයි. ඒකට භේද පැත්තකින් තියලා අපි හැමෝම එක් වන්න වුවමනායි කියලා මා විශ්වාස කරනවා. එහෙම නැතුව අරයා වැරැදියි, මෙයා වැරැදියි කිය කියා හිටියොත්, අන්තිමට ජනතාවට ඉතිරි වන්නේ ප්‍රතිපත්තියක් නැති රටක් විතරයි. අපි ඒ ක්‍රමයට තිත තියමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණා ටික මතක් කළේ භූ දේශපාලනික වශයෙන් අපේ රටට තිබෙන වැදගත්කම ලෝකයේ හැම රටකටම දැනෙන බව කියන්නයි. ඒ නිසායි අපේ රටට මේ තරම් ජාත්‍යන්තර අත පෙවීම් වැඩි වෙලා තිබෙන්නේ. ඒ අයගේ රූකඩ තමයි පසුගිය කාලේ නැටවුණේ. ඒ අය සංවිධානාත්මකවයි මේ රටේ ආර්ථිකය වැට්ටුවේ. මේ දේ අපේ රටේ ඉතිහාසයේ අවස්ථා දෙකකදී සිදු වෙලා තිබෙනවා. අපේ රටේ ආර්ථිකයට වෙන්න තිබෙන ලොකුම විනාශය කළේ ඒ අයයි. රටේ ආර්ථිකය ඉහළට යන හැම අවස්ථාවකදීම මෙවැනි දේවල් සිදු වුණා. දැනුත් ඒ දේ සිදු වනවා. බලන්න, සංචාරකයන් මේ රටට එන්න පටන්ගත්තා විතරයි. තේරුමක් නැති විධියට ඇතැමෙක් බොහෝ විරෝධතා ඇති කරන්න පටන්ගත්තා. සමහරුන්ට ඒවායේදී හූ කිව්වා. ඉතින්, ජනතාව කියන දේ මොකක්ද කියලාවත් ඒ අයට තේරෙන්නේ නැහැ.

[ගරු මහින්ද රාජපක්ෂ මහතා]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මාස කිහිපයකට කලින් තිබුණු රට සහ වර්තමානය අතර වෙනසක් ජනතාවට දැනෙනවා. ඇතමෙක් මේ වෙනස දේශපාලනයෙන් නැවත වරක් රත් කරන්න වෙහෙසෙනවා. අපි එකට එකතු වෙලා රටේ අභියෝගය ජය ගෙන ඉදිරියට යා යුතු යැයි ඔවුන් කල්පනා කරන්නේ නැහැ. ඒ නිසා, ජනතාවගේ අපේක්ෂා සියල්ල මෙවර අය වැයෙන් එකවර නියෝජනය නොවුණත් මෙම උපාය මාර්ගික වැඩ පිළිවෙළ රටේ සියලු ජනතාවගේ අනාගතය වෙනුවෙන් තැබූ යෝධ පියවරක් වනු දැකීම අපේ ප්‍රාර්ථනාව බව ඔබ සැමට සිහිපත් කරන්න කැමැතියි.

සමස්ත රට වැසියන්ට සුබ අනාගතයක් වේවා!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ස්තුතියි, ගරු හිටපු ජනාධිපතිතුමනි.

ගරු කබීර් හෂීම් මන්ත්‍රීතුමා. ඔබතුමාට මිනිත්තු 29ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.14]

**ගරු කබීර් හෂීම් මහතා**
(மாண்புமிகு கபீர் ஹஷீம்)
(The Hon. Kabir Hashim)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමාගේ කථාවෙන් පසුව මට කථා කරන්න අවස්ථාව ලැබීම ගැන සතුටක් තිබුණත්, එතුමා කියපු කාරණාවලට මට එකඟ වෙන්න බැරි බව විශේෂයෙන්ම කියන්න ඕනෑ. පසුගිය දශක දෙක තුළ රටක්, ජාතියක් හැටියට අප නිෂ්පාදනයට වඩා පරිභෝජනය කරලා, ආදායමට වඩා වියදම් කරලා තිබෙන බව ඉතාම පැහැදිලියි. ඒ මදිවාට 2020දී ගෝඨාභය රාජපක්ෂ මහත්මයා රාජ්‍ය ආදායම කපා හැරියා. එහි ප්‍රතිඵලයක් වශයෙන් 2021 වනකොට රාජ්‍ය ආදායම රුපියල් බිලියන 1,457ක් වූ අතර, රාජ්‍ය වියදම රුපියල් බිලියන 3,537ක් වුණා. ඒ කියන්නේ ආදායමට වඩා වියදම දෙගුණයකින් වැඩියි. ඒ නිසා මොකක්ද වුණේ? 2021දී ණය පොලී ගෙවීමට පමණක් රුපියල් බිලියන 1,048ක් වෙන් කරන්න අපට සිදු වුණා. ඒ කියන්නේ, 2021දී සෞඛ්‍ය සේවා, අධ්‍යාපන සේවා, සමාජ සුබසාධන සේවාවලට වෙන් කළ මුදලට සමානයි, පොලී ගෙවීමට පමණක් වෙන් කළ මුදල. එතකොට වෙනත් වියදම්වලට මුදල් ඉතිරි වන්නේ නැහැ.

අපි දැන් 2023 අය වැය අරගෙන බලමු. මොකක්ද තත්ත්වය? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම අය වැය මඟින් පුනරාවර්තන වියදම්වලට රුපියල් බිලියන 4,069ක් වෙන් කර තිබෙනවා. එයින් සියයට 50ක්ම යන්නේ පොලී ගෙවන්න. ඒ කියන්නේ, රුපියල් බිලියන 2,193ක්. අධ්‍යාපනයට, සෞඛ්‍යයට, සුබසාධනයට වඩා වැඩි මුදලක් ලබන වසරේ පොලී ටික ගෙවාගන්න යනවා. මේ බර දරන්න වෙන්නේ මේ රටේ මහ ජනතාවටමයි. අනෙක් පැත්තෙන්, මේවා පියවා ගන්න කාලයක් තිස්සේ කඩා වැටිච්ච රාජ්‍ය ආදායම ලබන වසර වනකොට සියයට 69කින් -අධික ලෙස- එකවරම වැඩි කරනවා. ඒ බරත් දරන්න වෙන්නේ මේ රටේ මහ ජනතාවටයි.

මේ වාගේ අය වැයක් ඉදිරිපත් කරන්න, මේ වාගේ තත්ත්වයක් මේ රටේ ඇති කරන්න හේතු වුණේ මොකක්ද කියන ප්‍රශ්නය අද හැමෝම අහනවා. මට පෙර කථා කළ ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාත් ඒ ගැන කිව්වා. හැබැයි, මේ විවිධ දේශපාලන පක්ෂ තමන්ගේ පක්ෂයේ මතය අනුව මතවාදී දෘෂ්ටි කෝණයෙන් මේවාට උත්තර දුන්නා මිසක්, සමහර අය මිථ්‍යා මත පදනම්ව උත්තර දුන්නා මිසක්, විද්‍යාර්ථීකයන්ගේ මතය මොකක්ද කියන එක, විද්‍යාර්ථීකයන් අපක්ෂපාතීව මොකක්ද මේ ගැන කියන්නේ කියන එක පිළිබඳව කල්පනා කළේ නැහැ. මම ඒකට උදාහරණයක් කියන්නම්. ඩබ්ලිව්.ඒ. විජේවර්ධන මහත්මයා කියන්නේ, මහ බැංකුවේ හිටපු නියෝජ්‍ය අධිපතිවරයා. එතුමා කියනවා මේ ප්‍රශ්නයට මුල 2004 කියලා. ඒ වාගේම Institute of Policy Studies කියන්නේ, අර්ධ රාජ්‍ය ආර්ථික පර්යේෂණ ආයතනයක්. ඒ ගොල්ලන්ගේ "Sri Lanka: State of the Economy 2020" වාර්තාවෙන් කියනවා, 2020 වනකොට ගෝඨාභය රාජපක්ෂ මහත්මයා බදු ආදායම කපා හැර මුදල් අච්චු ගැහුවා, ඒ වාගේ සිද්ධිවලින් තමයි මේක බරපතළ අර්බුදයක් බවට පරිවර්තනය වුණේ කියලා.

ආර්ථික ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනාගැනීම සඳහා වූ ජාතික සභා අනුකමිටුව මේ ආණ්ඩුව විසින් පත් කරන ලද පාර්ලිමේන්තු සභාවක්. ඒ වාගේම ඔක්තෝබර් 22වන දා ලෝක බැංකුව නිකුත් කරපු වාර්තාවේ කියන්නේත් මේ ප්‍රශ්නය නිර්මාණය වන්නේ 2004න් පසුව කියලායි. මේක විද්‍යාර්ථීකයන්ගේ මතය. මේ රටේ ඒ වාගේ තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා කියනවා නම්, මහින්ද රාජපක්ෂ මහත්මයා, ගෝඨාභය රාජපක්ෂ මහත්මයා, බැසිල් රාජපක්ෂ මහත්මයා, පී.බී. ජයසුන්දර මහත්මයා, අජිත් නිවාඩ් කබ්රාල් මහත්මයා අපට සලකන්න වෙන්නේ ආර්ථික ඝාතකයන් හැටියටයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වාගේ තත්ත්වයක් තිබියදී අප ඊයේ පෙරේදා දැක්කේ මොකක්ද? අප ඊයේ පෙරේදා ගුවන් තොටුපොළේදී සංදර්ශනයක් දැක්කා. ඒ සංදර්ශනය දිහා බලන කොට පුදුම හිතෙනවා. මේ රටේ අරුම පුදුම දේවල් සිද්ධ වෙනවා අපි දකිනවා නේ. මේ රට තුළ උග්‍ර ආර්ථික ව්‍යසනයක් ඇති වෙලා තිබෙන අවධියක සමාජයේ සීමිත පිරිසකට මේ මහා ආර්ථික හා සමාජයීය විනාශය නිවැරැදිව වටහාගන්න තවමත් නොහැකි වී තිබෙනවා. මේක කනගාටුදායක තත්ත්වයක්. එය, එක්කෝ ඔවුන්ගේ දේශපාලනික අඥානවය; එහෙම නැත්නම් එය තනිකරම ඔවුන්ගේ දුෂ්ට බව, කුහකත්වය. මක්නිසාද, රාජපක්ෂ පාලනය අඛණ්ඩවම එවැනි අඳ බාලයන් පිරිසක් තමන් වෙනුවෙන් නඩත්තු කර තිබෙනවා. මේක තමයි තත්ත්වය. පෙරේදා ගුවන් තොටුපොළේදී අප දැක්කේත් ඒ වාගේ අරුම පුදුම සංදර්ශනයක්. මේ රටේ ආර්ථික ව්‍යසනයට සෘජුවම වගකිව යුතු බැසිල් රාජපක්ෂ මහතා වැනි පුද්ගලයන්හට මල් මාලා දාලා ඔවුන්ගේ පා යුග සිපගන්නවා අපි දැක්කා. ඉතින්, ඒක හරියට එල්ලා මැරීමට නියමිත තැනැත්තා තමන් එල්ලීමට බලා සිටින අලුගෝසුවාට සාදයක් පවත්වනවා වාගේ ක්‍රියාවක්. පුදුම වැඩක්! ඒ වාගේ දේවල් පවා මේ රටේ සිද්ධ වෙනවා. ඔවුන් මේ රටේ මේ වාගේ ව්‍යසනයක් ඇති කරපු මිනිස්සු. සමහර අයට මේක තේරුම් ගන්න බැහැ. ඒ අය අපේ රටේ ආර්ථිකය ඝාතනය කරපු හැටි මම තහවුරු කරන්නම්. නිකම් චෝදනා කරනවා නොවෙයි. මම ඒ ගැන තහවුරු කරන්නම්. පොදු ජනතාව හැම වෙලාවේම දේශපාලනඥයන්ට ඇඟිල්ල දිගු කරනවා; ඉහළ නිලධාරින්ට ඇඟිල්ල දිගු කරනවා. මේ කඩා වැටීම කළේ දේශපාලනඥයන් සහ නිලධාරින් කියන එක ජනතාව හැම වෙලාවේම කියනවා. මේවා වැරැදි ප්‍රතිපත්ති නිසා සිද්ධ වුණා කියනවා. එහෙම නැත්නම් දූෂණය, වංචාව නිසා සිද්ධ වුණා කියනවා. ඒවා බොහෝදුරට ඇත්ත. හැබැයි, විචාරාත්මකව අප කල්පනා කළොත් මේ වගකීමෙන් ජනතාවටත් මිදෙන්න බැහැ. ඒකට එක් උදාහරණයක් මම කියන්නම්. 2001-2003 කාලයේ එක්සත් ජාතික පක්ෂ රජයක් තිබුණේ. ඉතා ශීඝ්‍රයෙන් කෙටි කාලයකින් ඒ ආණ්ඩුව අප්‍රසාදයට පත් වුණා. කොහොමද අප්‍රසාදයට පත් වුණේ? ඒ ආණ්ඩුව තීරණය

කළා අත්‍යවශ්‍ය ප්‍රතිව්‍යුහගත කිරීම් කරන්න ඕනෑ කියලා. ඒ වෙලාවේ ආණ්ඩුවට දැක්මක් තිබුණා, මේ රට යන දිශාව හරි නැහැ කියලා. ඒ ප්‍රතිව්‍යුහගත කිරීමට අදාළව තීරණ ගොඩක් ගත්තා. ජනප්‍රිය දේ වෙනුවට නිවැරැදි දේ කරන්න තීරණය කළා. හැබැයි, ඒ වනකොට රාජ්‍ය සේවයේ ඉන්න සමහර අය අයින් කරන්නත් එක්ක VRS - Voluntary Retirement Scheme - එකක් පටන්ගත්තා.

ඒ වාගේම රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවන්න තීරණය කළා. පාඩු ලබන රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා තීරණ ගත්තා. ඒවා අමාරු තීරණ. හැබැයි 2003 අග භාගයේ මොකක්ද වුණේ? මහින්ද රාජපක්ෂ මහත්මයායි, ජේවීපී එකයි, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය එක්ක එකතු වෙලා මොකක්ද කළේ? ජනතා විමුක්ති පෙරමුණත් එක්ක මහින්ද රාජපක්ෂලා එකතු වෙලා මොකක්ද කළේ? "මේවා විකුණනවා, විදේශ ආක්‍රමණ, රාජ්‍ය සේවය මර්දනය" කියලා ජනප්‍රිය සටන් පාඨ රටට විකිණුවා. ඒ වාගේම, "අපි බලයට ආවා නම් මේ ප්‍රතිව්‍යුහගත කිරීම නතර කරනවා, රාජ්‍ය සේවයේ බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවන චක්‍රලේඛය අවලංගු කරලා නැවත බඳවා ගන්නවා" කියලා ජනප්‍රිය සටන් පාඨ කිව්වා. පාඩු ලබන ආයතන තමන්ගේ ගජ මිතුරන්ට, හිතවතුන්ට හම්බ කරන්න නිදහස් කරලා දෙනවා කියලා පොරොන්දු දුන්නා. ඡන්ද දායකයෝත් ඒ ජනප්‍රියතාවට අහු වෙලා ඡන්දය දුන්නා. ඒක තමයි ප්‍රතිඵලය. ඒ ප්‍රතිඵලයෙන් මොකක්ද වුණේ? 2004-2014 කාලය තුළ රාජ්‍ය සේවයට බඳවා ගැනීම් ලක්ෂ තුනහමාරකින් වැඩි වුණා. අලුතෙන් ලක්ෂ තුනහමාරක් රාජ්‍ය සේවයට බඳවා ගත්තා. එතකොට රාජ්‍ය ආයතනවලට මේ කෙටි කාලය තුළ මොකක්ද වුණේ? රාජ්‍ය ආයතනවල පාඩුව විශාල වශයෙන් - කෝටි ගණනින් - වැඩි වුණා. මම උදාහරණයක් කියන්නම්. 2009-2014 කාලයේ රාජ්‍ය ආයතන 107 සිට 245 දක්වා වැඩි වුණා; අලුත් රාජ්‍ය ව්‍යාපාර ආරම්භ කළා. ඒ වැඩි කළේ තමන්ගේ ගෝල බාලයන්ට කීයක් හරි හම්බ කර ගන්න අවස්ථාව දෙන්න වෙන්න පුළුවන්. ඒවායේ සේවය කරන සංඛ්‍යාව 145,000 සිට 260,000 දක්වා වැඩි කළා. ඒ වාගේම, රාජ්‍ය ව්‍යවසායන් වැඩි කළා. එම කාල පරිච්ඡේදය තුළ, 2006-2020 වෙනකොට මේ රටේ රාජ්‍ය ආයතනවල පාඩුව රුපියල් ට්‍රිලියන 1.2යි. ඒ වෙලාවේ දී, - 2003දී - එම ප්‍රතිව්‍යුහගත කිරීම කරලා තිබුණා නම්, මේ රුපියල් ට්‍රිලියන 1.2 අපට නැති වෙන්නේ නැහැ. ඒ රුපියල් ට්‍රිලියන 1.2 තිබුණා නම් රට බංකොලොත් වෙන්නෙත් නැහැ. බලන්න, රාජ්‍ය ආයතනවල පාඩුව.

අපි IMF එකට ගිහිල්ලා, හතරගාතේ දාලා ඉල්ලන්නේ ඩොලර් බිලියන 2.9ක්. හැබැයි, අද වෙනකොට අපි ගෙවන්න ඕනෑ ශ්‍රී ලංකාවේ සමුච්චිත පාඩුව ලෙස ඩොලර් බිලියනයක්. ඒ කියන්නේ IMF එකෙන් ගන්න මුදලෙන් තුනෙන් එකකින් ශ්‍රී ලංකාවේ පාඩුව පියවා ගන්න වෙනවා. එතකොට ඒකට වග කියන්න ඕනෑ කවුද? ඒ නිසා තමයි මම කියන්නේ, ඒ ගොල්ලෝ ආර්ථික ඝාතකයන් කියලා. එම කාල පරිච්ඡේදය තුළ දූෂණයෙන් සහ වංචාවෙන් රටට වුණු පාඩුව කෝටි ගාණක්.

ඒ කාල පරිච්ඡේදයේ දීම -2004න් පස්සේ- අපේ රටේ අපනයන ආදායම කඩා වැටුණු බව ගරු ජනාධිපතිතුමාම පිළිගනීවි. රටේ නිෂ්පාදන ආදායම කඩා ගෙන වැටුණා; රාජ්‍ය ආදායම කඩා ගෙන වැටුණා. එතකොට රට බංකොලොත් වෙන්නේ නැද්ද? ඒ මදිවාට 2019 දී ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට ඇවිල්ලා, මහජනතාවට තව සිහිනයක් විකුණුවා. "අපි බදු ආදායම් කපා හරිනවා, රාජ්‍ය ආදායම් කපා හරිනවා, ඕනෑ තරම් රස්සා දෙනවා" කිව්වා. මේ රටේ මහලු, වැඩිහිටි, තරුණ, උස, මහත ඔක්කොම -ලක්ෂ හැටනවයක්- එතුමාට ඡන්දය දුන්නා. ඒ නිසා තමයි මා කියන්නේ, ජනතාවටත් මේ වගකීමෙන් මිදෙන්න බැහැ කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අන්තිමට 2021 වනකොට ප්‍රතිඵලය වුණේ මොකක්ද? රාජ්‍ය සේවක වැටුප් ගෙවීම සඳහා රුපියල් බිලියන 845ක් වෙන් කරන්න අපට සිදු වුණා. එය රාජ්‍ය ආදායමින් සියයට 58ක්. 2021 ණය පොලී සඳහා රුපියල් බිලියන 1,048ක් වෙන් කරන්න අපට සිදු වුණා; එය අපේ රාජ්‍ය ආදායමින් සියයට 72ක්. ඒ අනුව රාජ්‍ය සේවකයන්ට වැටුප් සහ ණය පොලී ගෙවන්න විතරක් 2021 රාජ්‍ය ආදායමින් සියයට 130ක් වැය වුණා. එතකොට අනෙක් ගෙවීම් ටික කරන්නේ කොහොමද? ඒවා ගෙවන්න සල්ලි කොහෙන්ද? එතකොට ආපසු ණය ගන්න වෙනවා. මේ තත්ත්වය උදා වෙන්නේ කොහොමද? අප මේ යථාර්ථය තේරුම් ගන්න ඕනෑ. මේ දෙක සඳහා ගෙවන්න ගියාම, අධ්‍යාපන සේවාවලට, සෞඛ්‍ය සේවාවලට, සුබසාධනයට, යටිතල පහසුකම්වලට රටේ සල්ලි නැහැ. එතකොට ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැද්ද?

2022 අතුරු අය වැය ඉදිරිපත් කරන කොට ගරු ජනාධිපතිතුමා මේ ගරු සභාවට ඇවිල්ලා කිව්වා, රජයේ සේවකයන්ගේ වැටුප්, පොලිය සහ සුබසාධනය සඳහා වෙන් කරන මුදල රුපියල් බිලියන 2,746ක් කියලා. හැබැයි, රාජ්‍ය ආදායම ඒ තරම් නැහැ. 2022දීත් තිබුණේ ඒ තත්ත්වය. 2023දී බලාපොරොත්තු වෙන්න සිදු වන්නේත් ඒ තත්ත්වයමයි. අප කොහොමද මේකෙන් ගොඩ එන්නේ? ආර්ථික ඝාතකයන් මේ රටට බොරුව, වෛරය, මුළාව, විජ්ජාව විකුණලා, මේ රට මේ තත්ත්වයට පත් කළා කියලා මා කියන්නේ ඒකයි. මිථ්‍යා මත අනුව වාගේම, එක එක දේශපාලන කෝණ මත නොයෙක් දේවල් කිව්වාට ඇත්ත තත්ත්වය හැටියට විද්‍යාර්ථිකයන් නම් කියන්නේ මේකට මුල 2004 කියලා. මේ මොහොත වනවිට රට වස්තු භංගත්වයට පත් වෙලා තිබෙනවා. ඒ නිසා අපට ප්‍රධාන ඉලක්ක කීපයක් තිබෙන බව අප පිළිගන්නවා. ඒ නිසා මූල්‍ය ස්ථායීකරණය සහ සාර්ව ආර්ථික ස්ථායීකරණය අත්‍යවශ්‍යයි; economic stabilization is essential. අපි ඒක පිළිගන්නවා. රටට ඉතුරු වෙලා තිබෙන විකල්ප මාර්ග ඉතා අඩුයි. ඒ නිසා අපට වැඩ කරන්න ලොකු ඉඩක් නැහැ. මේ මොහොතේ රටක් හැටියට අපි ඒ ගැන හිතන්න ඕනෑ. හැබැයි, ස්ථායීකරණ ප්‍රතිසංස්කරණ ඉතාම වේදනාත්මකයි. ඒවා කරන්න ලෙහෙසි නැහැ.

ජනාධිපතිතුමා මේ ගරු සභාවට ඇවිල්ලා අය වැය ඉදිරිපත් කරන කොට කිව්වා, අපි ජනප්‍රිය දේ වෙනුවට නිවැරැදි දේ වෙනුවෙන් පෙනී හිටින්න ඕනෑ කියලා. ඔව්, අපි එතුමා කියන කාරණය අනුමත කරනවා. අප එකඟ වෙනවා, එතුමා කියපු කාරණයත් සමඟ. අපි විපක්ෂයක් හැටියට නිවැරැදි දේ වෙනුවෙන් පෙනී සිටින්න සූදානම්. හැබැයි, ඒ රජයට ඕනෑ නිවැරැදි දේ වෙනුවෙන් නම් නොවෙයි. මේ රටට ඕනෑ නිවැරැදි දේ වෙනුවෙන් විපක්ෂය පෙනී සිටින්න සූදානම්. ඒ වෙනුවෙන් පෙනී සිටින්න වගකීමක් ඇති විපක්ෂයක් හැටියට සමගි ජන බලවේගය ඕනෑම වෙලාවක සූදානම් බව මම මේ ගරු සභාවට කියන්න කැමතියි. අද රටේ ප්‍රධාන විපක්ෂය හැටියට අපේ භූමිකාව බොහොම සංකීර්ණයි;

අපේ විපක්ෂයේ කාර්ය භාරය ඉතාම අමාරුයි. සාම්ප්‍රදායික විපක්ෂ කණ්ඩායමක් හැටියට අපට හැසිරෙන්න අමාරුයි. මොකද, රට බිඳ වැටිලා තිබෙන අවධියකදී බොහොම වගකීම් සහිතව අපි වැඩ කරන්න ඕනෑ. ඒ නිසා මේ අමාරු භූමිකාව තුළ විපක්ෂයක් හැටියට රට වෙනුවෙන් අපේ කාර්ය භාරය හරියට ඉටු කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ගැලරියට කථා කරලා ඊළඟ මැතිවරණය ඉලක්ක කරනවාද, එහෙම නැත්නම් හරි දේ කථා කරලා ඊළඟ පරම්පරාව ඉලක්ක කරනවාද කියන තැනයි අද විපක්ෂය ඉන්නේ. ඒක අමාරු වුණත්, හරි දේ වෙනුවෙන්, නිවැරදි දේ වෙනුවෙන් පෙනී සිටින්න අපි සූදානම්. ප්‍රධාන විපක්ෂයක් හැටියට අපි හිතනවා, රට ඉල්ලන දේ මේ අය වැය තුළ

[ගරු කබීර් හෂීම් මහතා]

අන්තර්ගත වෙලා නැහැ කියලා. නැත්නම්, ප්‍රමාණවත්ව අන්තර්ගත වෙලා නැහැ. මේ අය වැය තුළ අපේ රට ඉල්ලන දේ ප්‍රමාණවත්ව ආමන්ත්‍රණය කරලා නැහැ කියලා අපි විශ්වාස කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අය වැයවලින් ප්‍රාග්ධන වියදම ගත්තාම සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් අධිවේගී මාර්ගවලට, ගොඩනැඟිලිවලට ආදී වශයෙන් වෙන් කරලා තිබෙනවා. අධිවේගී මාර්ගවලට පමණක් කෝටි 8,400ක් වෙන් කර තිබෙනවා. හැබැයි, අය වැය වාර්තාවේ 36වැනි පිටුවේ ප්‍රධාන සුබසාධන හා සංක්‍රාම ගෙවීම් දිහා බලනකොට 2022යි, 2023යි අතර ඉතාම සුළු වැඩිවීමක් තිබෙන්නේ. සුබසාධන ගෙවීම් සඳහා වෙන් කරන මුදලේ සියයට 10ක වත් වැඩිවීමක් සිදුවෙලා නැහැ. 2022 වර්ෂයේ රුපියල් බිලියන 1,021ක් වෙන් කරලා තිබුණා,. 2023 වර්ෂයේදී ඒ ප්‍රමාණය රුපියල් බිලියන 1,141 දක්වා වැඩි කර තිබෙනවා. ඒ කියන්නේ, 2022 ඉඳලා 2023 වෙනකොට සුබසාධන හා සංක්‍රාම ගෙවීම්වලට වෙන් කරන මුදල් දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් හැටියට ගත්තාම සුබසාධනයට වෙන් කර තිබෙන මුදලේ අඩුවීමක් සිදුවෙලා තිබෙනවා. මේක අපට පිළිගන්න බැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අර්බුද හමුවේ සමාජය තුළ අසමානත්වයක්, ආදායම් අසමානත්වයක් නිර්මාණය වෙලා තිබෙන මොහොතක්, මේක. එහෙම නම් මේ සමාජ අසමානත්වය සහ ආදායම් අසමානත්වය සඳහා මේ අය වැයේ තිබෙන්න ඕනෑ, ආදායම් ප්‍රතිව්‍යාප්තියක් සහ වියදම් ප්‍රතිව්‍යාප්තියක්. ඒක සිදුවෙලා නැහැ. මීටත් වඩා පුළුල් ලෙස මේ ප්‍රතිව්‍යාප්තිය ගැන මේ අය වැය අවධානය යොමු කරන්න තිබුණා කියන එක තමයි අපේ මතය. අපි මේක කියන්නේ හේතු සාක්ෂි ඇතිවයි. මේ රජය අඛණ්ඩ උද්ධමන ක්‍රියා මාර්ගයක් මේ රටේ ඇති කළා. මේ රටේ පුරවැසියන් සතු ධනයෙන් සැහෙන ප්‍රමාණයක් අපරික්ෂාකාරීව මේ රජය අපහරණය කරලා තිබෙනවා. මේ ක්‍රියාදාමය නිසා රටේ බොහෝ දෙනෙක් හිඟමනට පත්වෙලා ඉන්නවා; බහුතරයක් හිඟමනට පත්වෙලා ඉන්නවා. ඒකෙන් අතළොස්සක් පමණක් ධනවතුන් බවට පරිවර්තනය වෙලා තිබෙනවා. මේක ලොකු ප්‍රශ්නයක්. ඒ නිසා 2019දී කරන ලද අන්තිම ගෘහස්ත ආදායම් හා වියදම් සමීක්ෂණය මත මේ රටේ පොහොසත්ම සියයට 20 ගත්තාම, නිවෙස් කණ්ඩායම්වල උපයන මාසික ආදායම 2019 ඒ සමීක්ෂණය අනුව ලක්ෂ දෙකකට ආසන්න මුදලක්.

ඒ වාගේම රටේ දුප්පත්ම සියයට 20 උපයන ආදායම -එම නිවෙස් කාණ්ඩයේ මාසික ආදායම- රුපියල් 17,572ක් පමණයි. අද තිබෙන සියයට 50ක උද්ධමනයත් එක්ක, ඒ රුපියල් 17,572හි ක්‍රය ශක්තිය සියයට 50කින් අඩුවෙලා තිබෙනවා. ඒ කියන්නේ, ඒ අය දරිද්‍රතා රේඛාවෙන් පහළට වැටිලා ඉවරයි. ඒක තමයි ප්‍රශ්නය. ඒක මේ අය වැයෙන් හරියට ආමන්ත්‍රණය කරලා නැහැ.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුවෙන් කරන ලද සමීක්ෂණයක් අනුව ජනගහනයෙන් සියයට 45ක්ම අද දරිද්‍රතා රේඛාවෙන් පහළයි ජීවත් වෙන්නේ. ඒකයි අපේ රටේ තත්ත්වය. ජනවාරි 20, 22 වෙනකොට, ඒ කියන්නේ මේ වසර ආරම්භ වෙනකොට මේ රටේ දුප්පත්ම අය -දරිද්‍රතාවෙන් පෙළෙන අය- සිටියේ ලක්ෂ 30යි. හැබැයි මේ ඔක්තෝබර් මාසය වෙනකොට මේ රටේ දරිද්‍රතාවෙන් පෙළෙන අය ලක්ෂ 96ක් ඉන්නවා. ඒ කියන්නේ දැන් තත්ත්වය භයානකයි. එතකොට ඒ අය සඳහා අපි මොකක්ද කරන්නේ? ඒ නිසායි අපි කියන්නේ, ඒ අය ඉලක්ක කරලා අනිවාර්යයෙන්ම ආදායම් ප්‍රතිව්‍යාප්තියක් සහ වියදම් ප්‍රතිව්‍යාප්තියක් මේ අය වැයෙන් සිදු වෙන්න තිබුණාය කියලා.

ඊළඟට, පෞද්ගලික අංශය දිහා බලන්න. හැම වෙලාවේම කට වචනයට කියනවා, එය රටේ engine of growth කියලා. හැබැයි, ඒක කට වචනයට විතරයි. මොකද, මේ රටේ කුඩා හා මධ්‍ය පරිමාණ අංශය - SME sector එක - ගත්තාම ලංකාවේ ව්‍යාපාරවලින් සියයට 80ක්ම SMEs. ලංකාවේ දළ දේශීය නිෂ්පාදනයෙන් සියයට 52ක දායකත්වය ලබා දෙන්නේ SMEsවලින්. ඒ වාගේම ලංකාවේ රැකියා උත්පාදනයෙන් සියයට 45ක්ම සිදු වෙන්නේ SMEsවලින්. සමස්තයක් හැටියට පෞද්ගලික අංශය ගත්තාම, පෞද්ගලික අංශයේ සිටින කම්කරුවෝ, සේවකයෝ ඇතුළු පිරිස තමයි engine of growth කියන්නේ. ඒ කියන්නේ, වැඩ කරන ජනතාව. අපි රාජ්‍ය සේවයට නොයෙක් විධියට පඩි වැඩි කිරීම් කරනවා, විශ්‍රාම ගෙවීම් කරනවා. හැබැයි, අපි පෞද්ගලික අංශයේ සේවකයන්ට ප්‍රමාණවත්ව සලකන්නේ නැහැ. පෞද්ගලික අංශයේ ඍජුව සේවය කරන ලක්ෂ 35ක් මේ රටේ ඉන්නවා. ඒ වාගේම, අනියම් සේවයේ යෙදෙන, ඒ කියන්නේ ස්වයං රැකියා කරන තවත් ලක්ෂ 27ක් ඉන්නවා. ඔක්කෝම ගත්තොත්, පෞද්ගලික අංශයේ සේවාවල නියුතු ලක්ෂ 62ක් පමණ ඉන්නවා. හැබැයි, ඒ ගොල්ලන්ට කිසිම වෙලාවක කිසිම දීමනාවක් දීලා නැහැ. එම නිසා අද SMEs විශාල ප්‍රමාණයක් කඩාගෙන වැටෙමින් තිබෙනවා. සමහර ඒවා වැහෙනවා, සමහර ඒවා වැහිලා ඉවරයි. ස්වයං රැකියා නැති වෙනවා, අනියම් සේවකයන්ගේ රස්සා නැති වෙනවා. මොකද, අමුද්‍රව්‍ය හිඟය නිසා, පොලී අනුපාතය වැඩි වීම නිසා, උද්ධමනය වැඩි වීම නිසා. මේ හේතූන් නිසා අද ලක්ෂ 20කට වැඩි ප්‍රමාණයකගේ රස්සා අහිමි වීම නිසා ඔවුන් මහ පාරට වැටිලා ඉන්නවා කියන එක ඇස්තමේන්තු කරලා තිබෙනවා. ඒ නිසා ජනාධිපතිතුමාගේ මේ අය වැය ප්‍රකාශයෙන් කිව්වා, රැකියා අහිමි වූ පෞද්ගලික අංශයේ සේවකයන්ට මාස තුනක dole එකක්, එහෙම නැත්නම් යම්කිසි දීමනාවක් ලබා දෙනවා කියලා. එවැනි යෝජනාවක් ඉදිරිපත් කිරීම ගැන අපි ප්‍රශංසා කරනවා. ඒක හොඳයි.

හැබැයි, ඒක මාස තුනකට පමණක් ලබා දීම ප්‍රමාණවත් නැහැ. අපි කියනවා, ඒක මාස හයකටවත් දෙන්න කියලා. ඒක සීමා කරන්න එපා. රැකියා නැතිවෙන අනියම් සේවයේ ඉන්න අයට වාගේම ස්වයං රැකියා කරන අයටත් ඒ දීමනාව දෙන්න, ඔවුන්ගේ නඩත්තුව සඳහා. අග්‍රහාර රක්ෂණයත් පෞද්ගලික අංශයේ සේවකයන්ට ලබා දෙන බව අය වැයෙන් කිව්වා. අපි සතුටු වෙනවා, ජනාධිපතිතුමා කරපු ඒ ප්‍රකාශය ගැන. හැබැයි, මේකත් අපි කියනවා. අනියම් සේවකයන්ටත් ඒ අග්‍රහාර රක්ෂණය ලබා දෙන්න. ඒ වාගේම ස්වයං රැකියා කරන අයටත් ඒ අග්‍රහාර රක්ෂණය ලබා දෙන්න. රට හදන ඇන්ජිම කියන පෞද්ගලික අංශයේ සේවකයන්ට ඒ උපරිම සහයෝගය ලබා දෙන්න කියා සමගි ජන බලවේගය වෙනුවෙන් මා ඉල්ලා සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වර්තමාන අර්බුදය සහ සමාජ අස්ථාවරත්වය අවතක්සේරු කරන්න එපා කියලා මේ රජයේ ඉන්න කණ්ඩායමට අපි කියන්න කැමැතියි. ඒ සම්බන්ධයෙන් රජයේ අවධානය ප්‍රමාණවත්ව යොමු වී නැහැ කියා අපි හිතනවා. ශ්‍රී ලංකාව අද ඉන්නේ වෙනිසියුලාව අවුරුදු දෙක, තුනකට කලින් තිබුණු තැන. වෙනිසියුලාවට මොකක්ද වුණේ? වෙනිසියුලා ආර්ථිකය තුළ අතිඋද්ධමනයක් ඇති වුණා. හියුගෝ චාවේස් කියන හිටපු ජනාධිපතිවරයා යටතේ ජනප්‍රියවාදී දේශපාලනය කරන්න ගිහිල්ලා රට බංකොලොත් වුණා. නිකොලස් මදුරෝගේ කාලය වන විට ඒ ආර්ථිකය කඩාගෙන වැටිලා ඉවරයි. වෙනිසියුලාව අද වෙනකොට වමේ ප්‍රතිපත්තිය අනුගමනය කරලා විනාශ වුණු රටක්. එයට හේතු ලෙස විශේෂඥයන් පෙන්නුම් කරන්නේ, මුදල් අච්චු ගැසීම, ආදායමට වඩා වියදම් කිරීම සහ විදේශ සංචිත නැති කර ගැනීමයි. ලංකාව කරපු හැම දෙයක්ම ඒ රටේ පාලකයිනුත් කළා. එහි ප්‍රතිඵලයක්

වශයෙන් 2020 වර්ෂය වෙනකොට වෙනිසියුලාවේ ලක්ෂ 60කට වැඩි ප්‍රමාණයක් සරණාගතයන් බවට පත් වුණා. ඔවුන් තමන්ගේ රටේත් හැම තැනකටම වාගේ යන්න පටන් ගත්තා, රටින් බැහැරවත් ගියා. ඒ කියන්නේ ඒ සරණාගතයන්ගෙන් සමහර අය විදේශ රටවලට සංක්‍රමණය වුණා. ඒක හරියට අද ලංකාවේ වාසය කරන ජනතාව පාස්පෝර්ට් හදාගෙන රට යනවා වාගේයි. ඒ රටවලින් වාර්තා වෙනවා, පලා යන ඒ කාන්තාවන්, විශේෂයෙන්ම අම්මලා තමන්ගේ දරුවන්ට කන්න දෙන්න බැරි වෙනකොට ගණිකා වෘත්තියට යොමු වුණු බව.

මම මේ වෙලාවේදී ආණ්ඩුවට අවධාරණය කරන්නේ, ශ්‍රී ලංකාව බොහොම අවදානම් තැනක සිටින බවයි. මම කියන්නේ, අපි ප්‍රවේශම් වුණේ නැත්නම් අපේ අම්මලාටත් ඒ වාගේ ඉරණමක් අත්වෙයිද දන්නේ නැහැ කියන එකයි. මම ප්‍රාර්ථනා කරනවා, එහෙම නොවේවා කියලා. එවැනි දේවල් සිදුවීම වළක්වන්න අපි වැඩ කරන්න ඕනෑ. ඒක රජයේ වගකීමක් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝක බැංකුව මේ වසරේ ඔක්තෝබර් මාසයේ නිකුත් කරපු "Sri Lanka Development Update" කියන වාර්තාවේ කියනවා, "මේ රටේ දැනට තිබෙන සහන දෙන සුබසාධන වැඩ පිළිවෙළ තුළින් දරිද්‍රතාව සඳහා සහන බෙදන ක්‍රමවේදය අසාර්ථකයි. සමෘද්ධි වැඩසටහන දේශපාලනීකරණය වුණු වැඩසටහනක්. ඉලක්ක කරපු දුප්පත්ම කණ්ඩායමට ඒ අවශ්‍ය සහන මුදල් යන්නේ නැහැ" කියලා. ඒක ලෝක බැංකුවෙන්ම කියනවා. ඒක වෙනස් කරන්න ඕනෑ කියලා කියනවා. ඒ විශ්වාසය අපට ලබා ගන්න බැරි නම් අපි ජාත්‍යන්තර සමාගම්වලින් සල්ලි ලබා ගන්නේ කොහොමද?

ජනාධිපතිතුමාට බැරි වුණා, මේ අය වැයේදී ඒක ආමන්ත්‍රණය කරන්න. වසම්වල ජීවන උපාය මාර්ග කමිටු පත් කරනවා කිව්වා. හැබැයි, ඒවා පක්ෂපාතී කමිටු. ඒක, දුප්පත්කම බලන්නේ නැතුව පාට බලලා සල්ලි බෙදන වැඩක්. දරුවන් හතර පස් දෙනෙක් ඉන්න, කන්න නැති, ශතයකවත් ආදායමක් නැති පවුල්වලට මේ සුබසාධන කටයුතු සාධාරණ විධියට බෙදී යෑමක් වෙන්නේ නැහැ. ඒ නිසා අපට මේකට එකඟ වෙන්න බැහැ. මේක බරපතළ ප්‍රශ්නයක්. මේ සම්බන්ධයෙන් ලෝකයේ ජාත්‍යන්තර සමාගම් පවා ඇඟිල්ල දිගු කරනවා. Welfare benefits boards කියන ක්‍රමවේදය ක්‍රියාත්මක කරන්න කියලා ලෝක බැංකුවෙන් ඉල්ලා සිටිනවා. හැබැයි, ජනාධිපතිතුමා මේ අය වැයෙන් ඒ කිසි දෙයක් කථා කළේ නැහැ. Institute of Policy Studies කියන අපක්ෂපාතී අර්ධ රාජ්‍ය ආර්ථික පර්යේෂණ ආයතනය විසින් "Sri Lanka: State of the Economy 2022" වාර්තාව නිකුත් කළා. එහි මොකක්ද කියන්නේ? "රටට අහිතකර වැරදි ප්‍රතිපත්ති සහ තීරණ නිසා ආර්ථිකයට සිදුවූ හානිය කොපමණද යන්න සම්බන්ධයෙන් නිවැරදි ගණනයක් කිරීමට කල් යන අතර, ඒ හානිය අතිවිශාලයි" කියනවා. මෙහෙම කියන්නේ IPS එකෙන්. ඊළඟට, කියනවා, "රටේ කීර්තිනාමයට හා විශ්වසනීයත්වයට ඇති වූ හානිය මිල කළ නොහැක" කියලා. අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් විශ්වසනීයත්වය ගැන කථා කළා. කොහේද විශ්වසනීයත්වය තිබෙන්නේ? එය මිල කරන්න බැහැයි කියනවා.

ඊළඟට කියනවා, ආර්ථිකයට ඇති වූ හානිය සහ එහි පාඩුව තවමත් ගණනය කරගෙන යනවා කියලා. ඒ කියන්නේ මේ රටට ඇති වෙච්ච මේ බෙදවාචකය නිසා වූ පාඩුව ඩොලර් බිලියන කොච්චර ප්‍රමාණයක්ද කියලා තවමත් ගණනය කරගෙන යන බව. එතකොට මේක බරපතළ අපරාධයක්. මේ සිදු වෙලා තිබෙන්නේ ආර්ථික අපරාධයක්. මේ IPS Report එක අනුව, සමගි ජන බලවේගය කියනවා, මේකට වගකිව යුතු අයට අධිකරණය ඔස්සේ නිසි දඬුවම් ලබා දීමට කටයුතු කරන්න ඕනෑ කියලා. *[බාධා කිරීමක්]* අනිවාර්යයෙන්ම මේක බරපතළ දෙයක්; ඉතාම භයානක දෙයක්.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පැහැදිලිව කියනවා, මූල්‍ය අංශයේ ප්‍රතිව්‍යුහගත කිරීමක් සිදු වෙන්න ඕනෑ බව. අපි ඒක අවිවාදයෙන් කියනවා. සාර්ව ආර්ථික ස්ථායීකරණය කරන්න ඕනෑ. ඒක නොකර අපට ඉස්සරහට යන්න බැහැ. අපි භය නැහැ, විපක්ෂයේ ඉඳගෙන හරි දේ වෙනුවෙන් පෙනී සිටින්න. හැබැයි, ඒ ස්ථායීකරණය හරහා ක්ෂුද්‍ර ආර්ථිකයට බරපතළ බලපෑමක් සිදු වෙනවා; ක්ෂුද්‍ර ආර්ථිකයට සිදුවන ඒ බලපෑමෙන් ජන සමාජයට ඊට වඩා ලොකු බලපෑමක් සිදු වෙනවා; ජන සමාජය තුළ ඇතිවන ඒ බලපෑමෙන් තමයි මේ රටේ දරිද්‍රතාව වැඩි වෙන්නේ; ඒ රේඛාවට පහළින් තමයි අද බොහෝ පිරිසක් ඉන්නේ; ඒ හරහා සමාජ අසමානත්වය රටේ පැතිරෙනවා; ඒ වාගේම තමයි SMEs, කුඩා සහ මධ්‍ය පරිමාණ ආයතන කඩා වැටෙන්නේ; ස්වයං රැකියා නැති වෙන්නේ; පෞද්ගලික අංශයේ රස්සා නැති වෙන්නේ. ඒ වාගේ තත්ත්වයකදී සිදුවන ඒ ජන සමාජ බලපෑම් නැති කිරීමට අවශ්‍ය පියවර ආණ්ඩුව හරියාකාරව ගත යුතුයි.

ප්‍රශ්නය තිබෙන්නේ මේ අය වැයෙන් ප්‍රමාණවත්ව එය ආමන්ත්‍රණය කර නොතිබීමයි. මම මේක සරලව කියන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ ආණ්ඩුව මොකක්ද කරන්නේ, මේ ආණ්ඩුව මොකක්ද කළේ කියන එක තේරුම් ගන්න මම මෙහෙම කියන්නම්. අපේ රට, දියවැඩියා රෝගියෙක් කියලා හිතාගන්න. එතකොට 2005 වර්ෂයේ සිට මේ රාජපක්ෂ ආණ්ඩුව මොකක්ද කරලා තිබෙන්නේ? මේ රෝගියා සතුටු කරන්න සීනි දුන්නා වාගේ කියලා හිතාගන්න. ඒ නිසා දැන් රෝගය හොඳටම දරුණුයි. දියවැඩියා රෝගියෙකුට හොඳට සීනි දුන්නා වාගේ වැඩක් තමයි 2005 වර්ෂයේ ඉඳලා කළේ. අද වෙනකොට රෝගය හොඳටම දරුණුයි. අතක්, පයක් නොකපා බැහැ. දැන් රෝගියා මරණයෙන් බේරන්න බැරි නිසා අතක්, පයක් කපන්න ඕනෑ. ඒක නිසා තමයි බදු වැඩි කරන්නේ, සුබසාධන කපන්නේ, බඩු මිල වැඩි කරන්නේ.

දැන් මිනිසුන්ට හැම පැත්තකින්ම පහර ගහනවා, නැති වෙන්න. අතක්, පයක් නොවෙයි දැන් මුළු කඳම කපලා වාගේයි. හැබැයි, මෙතැන තිබෙන ප්‍රශ්නය මෙයයි. කොටසක අත, පය කපන්න බලනවා. නමුත්, ආණ්ඩුවේ සිටින පාලකයන්ගේ අතේ මයිල් ගහක්වත් ගලවන්න දෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒක වෙන විධියකට කියනවා නම් මෙහෙමයි. දශක ගණනාවක් කල් දැමූ ප්‍රතිසංස්කරණ වසර දෙකතුනකින් කරන්න ගියාම රටේ ජනතාවට උග්‍ර වේදනාවක් දැනෙනවා. සමාජයට මේකෙන් රිදෙනවා. එවැනි වේදනාකාරී ප්‍රතිසංස්කරණවලට යෑමේදී නිර්ණායක කිහිපයක් තිබෙනවා. එකක් තමයි, රජයේ විශ්වසනීයත්වය. විශ්වසනීයත්වය තිබීම ඉහළින් ම වැදගත්. හැබැයි, මේ රජය කෙරෙහි ඒ විශ්වසනීයත්වය නැහැ. ආණ්ඩුව ආදර්ශවත් වෙන්න ඕනෑ. ජනාධිපතිවරයා රාජ්‍ය ඇමතිවරු 37දෙනෙක් පත් කළා. එතකොට කොහොමද, විශ්වසනීයත්වය ඇති වෙන්නේ? අනික් මිනිසුන්ගේ ඔක්කෝම දේවල් සංකෝචනය කරනවා, කැප වෙන්න කියනවා. හැබැයි, රාජ්‍ය ඇමතිවරු 37දෙනෙක් පත් කරනවා. එතකොට ඒක ගැළපෙන්නේ නැහැ, විශ්වසනීයත්වයට. ඊළඟට, පුළුල් සමාජ සම්මුතියක් ඇති කරන්න ඕනෑ. මහජනතාවත්, ආණ්ඩුවත් අතර සම්මුතියක් ඇති වෙන්න ඕනෑ. රට බේරාගන්න, රට වෙනුවෙන් වේදනා විඳින්න මේ රටේ පුරවැසියෝ සූදානම්. හැබැයි, එය එක් එක්කෙනාගේ වත්කම් මත, හැකියාව මත සිදු විය යුතුයි. එක් එක්කෙනාට බර පටවනකොට සමානුපාතිකව එය සිදුවිය යුතුයි කියා අපි විශ්වාස කරනවා. එක් එක් කාණ්ඩවලට දැරිය හැකි ප්‍රමාණය මතයි එය පදනම් විය යුත්තේ. හැබැයි, ඒක එහෙම සිදු වෙනවාද? එක කොටසකට හෝ පිරිසකට ප්‍රතිසංස්කරණවල

[ගරු කබීර් හෂීම් මහතා]

වේදනාව විඳීමටත්, තව කොටසකට වේදනාවෙන් මිදීමටත් ඉඩ දෙනවා නම් එතැන ජන සම්මුතියක් තිබෙන්න බැහැ. ඒ වාගේම මේ ප්‍රතිසංස්කරණවලින් තෝරා ගත් කණ්ඩායම් අසීමිතව, අසාමාන්‍ය ලෙස ලාභ උපයනවා නම්, රජය ඒ අයට වක්‍රව අනුග්‍රහය දෙනවා නම්, රාජ්‍ය බලය අනිසි ලෙස පාවිච්චි කරනවා නම්, නීති අයින් කර ගන්නවා නම්, රජය සහ මහජනතාව අතර සම්මුතියක් තිබෙන්න බැහැ.

ප්‍රතිසංස්කරණවල ප්‍රතිඵල අද සියලුම ජන කොටස්වලට සමාන්තරව අන්තර්ගත විය යුතුයි කියන එක මම මේ අවස්ථාවේදී මතක් කරන්න ඕනෑ. එහෙම වුණොත් තමයි විශ්වසනීයත්වය සහ ජනතා සම්මුතිය සාර්ථකව හැදෙන්නේ. මම විශ්වාස කරන්නේ නැහැ, අද එහෙම දෙයක් මේ රටේ තිබෙනවා කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැයෙන් ඉලක්කවලට යෑමට අවශ්‍ය ආදායම් ප්‍රතිව්‍යාප්තිය සහ වියදම් ප්‍රතිව්‍යාප්තිය සිදු වෙලා නැහැ කියලා මම හිතනවා. ඒ නිසා ආණ්ඩුවේ ක්‍රියාකලාපය තුළ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණ ආණ්ඩුවට ඒ විශ්වසනීයත්වය දිනා ගන්න බැහැ. ඒ, දේශීය විශ්වසනීයත්වය සහ ජාත්‍යන්තර විශ්වසනීයත්වය දිනා ගන්න බැහැ. එම නිසා මැතිවරණයකින් තොරව ඒ විශ්වසනීයත්වය ලබා ගන්න බැහැ. මේ ප්‍රශ්නයේ බැරෑරුම්කම මේ ආණ්ඩුවට තේරිලාත් නැහැ. ඒ නිසා මේ අය වැයට සහාය ලබා දෙන එක සමගි ජන බලවේගයේ අපට කරන්න බැරි දෙයක් කියන එක මේ අවස්ථාවේදී මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ශෙහාන් සේමසිංහ රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 38ක කාලයක් තිබෙනවා.

[පූ.භා. 10.43]

**ගරු ශෙහාන් සේමසිංහ මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு செஹான் சேமசிங்க - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Shehan Semasinghe - State Minister of Finance)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2023 අය වැය දෙවන වර කියවීමේ විවාදයේ අවසාන දිනය අදයි. විවිධ දේශපාලන පක්ෂ මේ අය වැය සම්බන්ධයෙන් තමන්ගේ තීන්දු-තීරණ ඊයේ මාධ්‍ය වෙත ප්‍රකාශ කර තිබුණා. මේ රටේ ඉතාම අභියෝගාත්මක කාලයක් තුළ ඉදිරිපත් වුණු අය වැය ලේඛනයක් ලෙස අපට මෙය හඳුන්වන්න පුළුවන්.

අපි සාම්ප්‍රදායිකව දැකපු, ඒ වාගේම සාම්ප්‍රදායිකව ඉදිරිපත් වුණු කරුණු මේ අය වැය ලේඛනය තුළ අඩංගු වෙන්නේ නැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. එසේ අඩංගු නොවීමට ප්‍රධාන කාරණය තමයි මේ රටේ ආර්ථිකයේ ඇති වෙලා තිබෙන පසුගාමීභාවය. ඒ නිසා පළමුවෙන්ම මේ රටේ ආර්ථිකය ස්ථාවර කිරීමේ අවශ්‍යතාව තිබෙනවා වාගේම, ජනතාවට අත්‍යවශ්‍ය භාණ්ඩ සැපයීමේ වගකීමත් තිබෙනවා. ආර්ථිකය ස්ථාවර කිරීමෙන් පසුව අපිට ආර්ථික වර්ධනයකට ගමන් කළ හැකියි. ඒ නිසා මේ ආර්ථිකය ස්ථාවර කිරීම වෙනුවෙන් ජනාධිපතිතුමා මේ අය වැය ලේඛනය ඉදිරිපත් කර තිබෙනවා.

මෙම අය වැය ලේඛනය සම්බන්ධයෙන් මත දෙකක් ඉදිරිපත් වෙලා තිබෙනවා. දීර්ඝ කාලීන ස්ථාවරත්වයකට සහ වර්ධනයකට ගමන් කළ හැකි අය වැය ලේඛනයක් හැටියට එක කණ්ඩායමක් මෙය හඳුන්වා දීලා තිබෙනවා.

මීට වඩා සහන සපයන, ඒ වාගේම අතීතයේ අපි දැකපු කාරණා අඩංගු අය වැය ලේඛනයක් බවට මෙය පත් වුණා නම් මීට හොඳයි කියලා තව කණ්ඩායමක් ප්‍රකාශ කරනවා. නමුත්, අද පවතින තත්ත්වය තුළ මූල්‍ය පරාසය ඉතාම සීමාසහිතයි, අතීතයේ ඉදිරිපත් වෙච්ච අය වැය ලේඛන කරා අපට ගමන් කරන්න. ඒ නිසා අපි විශ්වාස කරනවා, 2023 අය වැය යෝජනා ආර්ථිකය ස්ථාවරභාවයට පත් කර ජනතාව මුහුණ දෙන ගැටලු අවම කරලීම සඳහා ගත්ත ප්‍රධාන පියවරක් හැටියට. මේකේ ආරම්භය මීට මාස කිහිපයකට කලින් ඉදිරිපත් කළ අතුරු අය වැය ලේඛනය හරහායි එන්නේ. මේ අය වැය ලේඛනය, මුදල් අමාත්‍යවරයා වන රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද අතුරු අය වැය ලේඛනයේම දිගුවක්. එම අතුරු අය වැය ලේඛනයේ ඉදිරිපත් කළ කරුණුවලට අමතරව තවදුරටත් පුළුල් පරාසයක් තුළ කරුණු ඉදිරිපත් වෙච්ච අය වැය ලේඛනයක් හැටියටයි මා මෙය දකින්නේ. අද අපේ රටේ ආර්ථිකයට බරපතළ ගැටලු කිහිපයකට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙනවා. එකක් තමයි, කොවිඩ් වසංගතය හේතුවෙන් අපේ රටට ඇති වෙච්ච ආර්ථික බලපෑම. ඒ වාගේම අපි ගත්ත යම් යම් තීන්දු-තීරණත් මෙහිදී බලපෑමක් ඇති කර තිබෙනවා.

ලෝකයේ සෑම රටක්ම මේ වන විට ඉහළ උද්ධමනයකට මුහුණ දී තිබෙනවා. උද්ධමනය ඉහළ යෑම පාලනය කරලා යම් ස්ථාවර මට්ටමකට එන්න තවත් මාස 18ක, 24ක පමණ කාලයක් ගත වේවි කියලායි පුරෝකථනය කර තිබෙන්නේ. ඊළඟට, ලෝකයේ සෑම රටකම ජනතාවට ඉහළ පොලී අනුපාතයක් ගෙවීමට සිදු වීම නිසා ඔවුන් අපහසුතාවලට ලක් වෙලා තිබෙනවා. ඒ එක්කම රුසියාව සහ යුක්රේනය අතර ඇති වුණු යුද්ධමය වාතාවරණය නිසාත් සමස්ත ලෝකයටම ආර්ථික වශයෙන් අහිතකර බලපෑම් එල්ල වී තිබෙනවා. තවමත් ඒකේ අවසානයක් අපි දකින්නේ නැහැ.

ලංකාව පැත්තෙන් ගත්තොත්, අද අපේ සංචිත අවම මට්ටමකයි තිබෙන්නේ. අපට පාවිච්චි කළ හැකි සංචිත අවම මට්ටමක පැවතීම ආර්ථික කළමනාකරණයේදී අපි මුහුණ දෙන තවත් ගැටලුවක් බවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා මේ සියල්ල සලකා බලා මෙම අය වැය ලේඛනය ප්‍රධාන කරුණු හතරක් පදනම් කරගෙන තමයි ඉදිරිපත් කළේ. ඉන් පළමුවැනි කාරණය මේකයි. ලෝක බැංකුව සිදු කරන ලද සමීක්ෂණ තුළින් වාර්තා කර තිබෙනවා, අද පවතින අපනයනවලට සාපේක්ෂව අපි තවත් විවෘතව අපනයන පිළිබඳව සොයා බැලුවොත්, වාර්ෂිකව බිලියන 10ක් දක්වා අපේ අපනයන වැඩි කරගන්න පුළුවන් කියලා.

ඒ අනුව, අපනයනය මූලික කරගත් අය වැය ලේඛනයක් තමයි මේ ඉදිරිපත් කර තිබෙන්නේ. අපි ඩිජිටල් ආර්ථිකයක් වෙත ගමන් කරවීමට අවශ්‍ය කාරණාවලට ප්‍රමුඛස්ථානය ලබා දීලා තිබෙනවා, මේ අය වැය තුළින්. අද අපේ රටේ ආදායම් එකතු කිරීම වෙන්න පුළුවන්, රජයේ වියදම් සිදු කිරීම වෙන්න පුළුවන්, මේ සියල්ල කළමනාකරණයකින් යුතුව කරන්න ඕනෑ. මේ කිසිම දෙයකට පූර්ණ පරිගණක ජාල ක්‍රමවේදයක් අපේ රටේ භාවිත වෙන්නේ නැහැ. මේ සියල්ල තවම manually සිදුවෙන්නේ. ඒ නිසා ක්‍රමවත් ජාලගත - digitalized- system එකක් හැදීම මෙවර අය වැය තුළින් අපි බලාපොරොත්තු වෙනවා.

ඊළඟට, අපේ දීර්ඝ කාලීන ඉලක්කයක් තිබෙනවා. ඒ තමයි, ඉහළ කුසලතාවෙන් යුත්, ජාත්‍යන්තර වශයෙන් තරගකාරී ශ්‍රම බලකායක් ඉදිරි වර්ෂ 10ක කාලය තුළ නිර්මාණය කිරීම. අපි දන්නවා, අද රටේ පවතින තත්ත්වය නිසා අපේ සහෝදර සහෝදරියන් විදේශගත වීමේ වැඩි ප්‍රවණතාවක් තිබෙන බව. අපට ඔවුන්ට දෝෂාරෝපණය කරන්න බැහැ. මොකද, ඔවුන්ට අනාගතය පිළිබඳ විශ්වාසයක් ගොඩ නැඟෙන තාක්කල් ඒ

අනාගතය ගොඩ නඟා ගතහැකි කාරණාවලට යොමු වීම සිදු වෙනවා. මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරලා ක්‍රමානුකූලව ඉදිරියට යමින් 2025 වසර වනවිට සියයට 7ක, 8ක ආර්ථික වර්ධන වේගයක් දක්වා ගමන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර වෙළෙඳාම පිළිබඳවත් මම කථා කරන්න ඕනෑ. ජාත්‍යන්තර වෙළෙඳාම තවදුරටත් ශක්තිමත් කරන්න ප්‍රධාන රටවල් කිහිපයක් සමඟ වෙළඳ ගිවිසුම් වෙනුවෙන් අපි සාකච්ඡා ආරම්භ කර තිබෙනවා. නතර වෙලා තිබුණු සාකච්ඡා නැවත ආරම්භ කරලා ඉදිරියට ගෙන යාම මේ වන විට ආරම්භ කර තිබෙනවා. ඒ හරහා ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කර ගැනීමට අවශ්‍ය වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපිට පුළුවන් වේවි කියලා මම විශ්වාස කරනවා. මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන අතරතුර ඒ සඳහා ප්‍රධාන ඉලක්ක දෙකක් තිබෙනවා. එයින් පළමුවැන්න, අපේ ආයෝජන ප්‍රමාණය වැඩි කර ගැනීම. දෙවැන්න, අපේ අපනයන වැඩි කර ගැනීම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආයෝජන සඳහා හිතකර පරිසරයක් අද අපේ රටේ නැහැ.

ඒකට මූලික හේතුව තමයි, අද අපි ණය ගෙවා ගන්න බැරි රටක් හැටියට පැවතීම. ඒ නිසා ණය ගෙවා ගත හැකි රටක් බවට පත් වන තෙක් අපේ රටට ආයෝජන ලැබීම පිළිබඳව විශාල විශ්වාසයක් තබන්න බැහැ. ඒ නිසා දැනට සිදුවන ක්‍රියාවලිය වේගවත් කරලා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහයෝගය ලබා ගෙන ණය ප්‍රතිව්‍යුහගතකරණය කරලා, මේ රට ණය ගෙවා ගත හැකි රටක් බවට පරිවර්තනය කරලා, ආයෝජකයන්ට ඒ මූල්‍ය සහතිකය ලබා දීලා අපේ රට පිළිබඳව විශ්වාසයක් ඇති කිරීමේ වග කීම අපට තිබෙනවා.

අනික් පැත්තෙන්, අද අප මුහුණ දෙන ප්‍රධාන කාරණයක් තමයි, ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් අපේ ආර්ථික තත්ත්වය අනුව අද අපව පහළට දමා තිබීම. ඒ ශ්‍රේණිගත කිරීමේ ආයතනවලට අනුව, ආර්ථික කළමනාකරණය තුළින් විතරයි ඉහළ ආර්ථික මට්ටමකට ක්‍රමානුකූලව අපව අරගෙන යන්න පුළුවන් වන්නේ. එහෙම ගියොත් විතරයි, අර මා කථා කළ ආයෝජකයන්ගේ විශ්වාසය අපට ලැබෙන්නේ. මේ සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ රජය ක්‍රියාත්මක කරලා තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරගෙන යන්න අවශ්‍ය පසුබිම අද නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා තමයි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා අද ඉදිරිපත් කළ කාරණාවලදී මා විශේෂ ඉල්ලීමක් කළේ. මේ රටේ ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳව අද සමහර අය කරුණු දැනගෙන, නොදන්නා සේ කරුණු ඉදිරිපත් කරනවා. අනික් අය කිසිම කරුණක් නොදැන උපකල්පන මත පමණක් පදනම් වෙලා කරුණු ඉදිරිපත් කරනවා. අපි ගොඩනඟාගත් විශ්වාසය මේ තුළින් බිඳ වැටෙනවා. අපි දවස් 10ක් ආපස්සට ගියොත් මොකද වෙන්නේ? එක පැත්තකින්, ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම පිළිබඳව සහ අනික් පැත්තෙන්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලැබීම පිළිබඳව වෙළෙඳ පොළ තුළ විශාල විශ්වාසයක් ගොඩනැඟී තිබුණා. හැබැයි, අද විවිධ අය විවිධ speculations කිරීම තුළින්, විවිධ අනාවැකි පළ කිරීම තුළින් මේ විශ්වාසය යම් තාක් දුරකට බිඳ වැටී තිබෙනවා. මෙය යථා තත්ත්වයට පත් කිරීම අත්‍යවශ්‍ය කාරණයක්.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, අද දිනයේ ඔබතුමා ඉදිරිපත් කළ වාර්තාවේ අඩංගු, අය වැය ලේඛනය ගැන කියන කොට ඔබතුමා සඳහන් කළ පොලී අනුපාතය සම්බන්ධ කාරණය ගැනත් මම පැහැදිලි කරන්නම්. අපි පිළිගන්නවා, මේ වන විට පොලී අනුපාත ඉහළ මට්ටමකයි තිබෙන්නේ කියලා. හැබැයි, රටේ ආදායම අඩුවෙලා තිබෙන අවස්ථාවක, රාජ්‍ය ආදායම ශීඝ්‍රයෙන් කඩාගෙන වැටෙද්දී, නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 8.3ක රාජ්‍ය ආදායමකට අපි හිමිකම් කියද්දී, අපට ආර්ථිකමය වශයෙන් යම් යම් මූල්‍ය කළමනාකරණයන් කරන්න සිදු වෙනවා. පොලී අනුපාතය ඉහළ මට්ටමක පැවතීම තුළ බලපෑමට ලක් වුණු පාර්ශ්ව රාශියක් ඉන්නවා. ඒ අයට යම් සහනයක් ලබා දීලා ඔවුන් බලාපොරොත්තු වන ඉදිරි ගමන ශක්තිමත් කරන්න පුළුවන් වන්නේ රටේ ආර්ථිකය ස්ථාවර වීම තුළ පමණයි.

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, මම කිව්වේ දැන් ඔබතුමා මතු කරපු කාරණය ගැනයි. විශේෂයෙන්ම අද රජය සියයට 30 ඉක්ම වූ ප්‍රමාණයකට තමයි මුදල් රැස් කිරීම කරන්නේ. හැබැයි, ඒක අපට බොහෝ දුරට ලැබෙන්නේ මාස තුනක කාලයක් සඳහා පමණයි. අපි කැමැතියි මාස හයකට හෝ අවුරුද්දක් දක්වා කාලයකට ගමන් කරන්න. හැබැයි, ඒ විශ්වාසය මේ ආයෝජකයන් තුළ තිබෙනවා ද? එයට හේතුව, දේශීය ණය ප්‍රතිව්‍යුහගතකරණය පිළිබඳව, දේශීය ණයවලින් haircut එකක් ගැනීම පිළිබඳව, අද රජයවත් -මහ බැංකුවවත්, එහෙම නැත්නම් මුදල් අමාත්‍යාංශයවත් - සාකච්ඡා නොකරන අවස්ථාවක, තීන්දුවක් නොගෙන ඉන්න අවස්ථාවක මේ කරුණු ඉදිරිපත් කිරීම සාධාරණ වෙන්නේ නැහැ. ඒ තුළ වෙන්නේ රටේ ජනතාව තවදුරටත් අධෛර්යවත් වීම මිසක්, ශක්තිමත් වීම නොවෙයි. ඒ නිසා පොලී අනුපාත විවෘත වෙළෙඳ පොළ තුළ තීන්දු වීම වඩා වැදගත් වෙනවා. මොකද, ඒක අපි artificially තීන්දු කරන්න ගියොත් පසුගිය කාලවල යම් යම් දේවල් කෘත්‍රිමව තීන්දු කිරීම තුළ ඇති වූ අහිතකර බලපෑම්වලට නැවත අපට මුහුණ දෙන්න සිදු වෙයි. හැබැයි, අපට තවදුරටත් අඩු පාඩු සහිතව වැරදි තීන්දු ගැනීමේ හැකියාවක් නැහැ. මොකද, අද අපි නැවත ක්‍රමානුකූලව සෙමින් හිස ඔසවමින් සිටිනවා.

අද අත්‍යවශ්‍ය භාණ්ඩ බෙදා හැරීම සම්බන්ධයෙන්, ආනයනය සම්බන්ධයෙන් අපි යම් ප්‍රගතියක් අත් කරගෙන තිබෙනවා. මම මෙම සභා ගර්භයේදී මීට පෙරත් ප්‍රකාශ කළා, අපි මේ ගෙන යන දැඩි මූල්‍ය ප්‍රතිපත්තිය පිළිබඳව පුළුල් අවධානයක් යොමු නොකර එය වෙනස් කිරීමට උත්සාහ කිරීම නිසා නැවත වාරයක් මාර්තු, අප්‍රේල්, මැයි, ජූනි හා ජූලි මාසවල මේ රටේ තිබුණු තත්ත්වයට වඩා අනිවාර්යයෙන්ම දරුණු තැනකට මේ රට තල්ලු වෙනවා කියලා. ඒ පිළිබඳව අපි සියලුදෙනා අවධානයෙන් කටයුතු කිරීම වැදගත් වෙනවා. රජය හැටියට අපි කැමැතියි, රජය ප්‍රසාදයට පත් වන තීන්දු පමණක් ගන්න. සියලු මහජන නියෝජිතයෝ -ආණ්ඩු පක්ෂයේ වේවා, විපක්ෂයේ වේවා- කැමැතියි, රජයක් ජනප්‍රිය වන තීන්දු ගන්න. මහජන නියෝජිතයෙක් හැටියට තමන් ජනප්‍රිය වන, ජනතා ප්‍රසාදය වැඩි වන තීන්දු ගන්න කැමැතියි. හැබැයි, අවාසනාවකට අද රටේ පවතින ආර්ථික තත්ත්වය අනුව අපට එසේ තීන්දු ගත නොහැකියි. එවැනි කාලයක නොවෙයි, අපි අද ඉන්නේ. හැබැයි, ඒ අවාසනාවන්ත කාලය ඉතාම කෙටි කාලයක් තුළ අවසාන කරන්න අවශ්‍ය පසුබිම තමයි මේ නිර්මාණය වෙන්නේ. ඒ නිසා මේ අය වැය ලේඛනය ගැන අපි දේශපාලන කෝණයකින් බලලා තීන්දු ගන්නවාට වඩා රටේ සමස්ත ජනතාව ගැන කල්පනා කරලා තීන්දුවක් ගැනීම වඩා වැදගත් කියලා මා විශ්වාස කරනවා. මොකද, අපි ගන්න හැම තීන්දුවකම අවසාන වින්දිතයා වෙන්නේ මේ රටේ ජනතාව. මේ රටේ ජනතාව තමයි අපි ගන්න තීන්දු තුළ අවසාන වින්දිතයා බවට පත් වෙන්නේ. ඒ නිසා බදු ප්‍රතිපත්තිය වෙනස් කිරීම, අපේ රටේ ආදායම නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 15 දක්වා ප්‍රමාණයකින් වර්ධනය කර ගැනීම, අපි තවදුරටත් ණය මත යැපෙන රටකට වඩා ආයෝජන ආකර්ෂණය කර ගත හැකි රටක් බවට පරිවර්තනය වීම වාගේ කාරණා රාශියකට අපි ගමන් කිරීමේ අවශ්‍යතාව අද තිබෙනවා. අපි පිළිගන්නවා, මේ ගන්න තීන්දු නිසා ජනතාව අපහසුතාවට හා දුෂ්කරතාවට පත් වන බව. හැබැයි, මම නැවතත් කියනවා, රජය මේ තීන්දු ගන්නේ ජනතාව මුහුණ දෙන අපහසුතා

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

නොසලකා හැර නොවන බව. මේ අපහසු තීන්දු ගනිමින් අවශ්‍ය ප්‍රතිසංස්කරණ අපි මේ මොහොතේ සිදු කරන්නේ අපි මීට මාස පහකට, හයකට කලින් අත් විඳපු තත්ත්වය නුදුරු අනාගතයේදී විතරක් නොවෙයි, කිසිම ආකාරයකට මේ රටේ ඇති නොවන්න. ඒ නිසා මේ පිළිබඳව සැක සංකා ඇති කර ගන්න අවශ්‍ය නැහැ. අපට මෙතැනට ඇවිල්ලා කියන්න පහසුයි, මේ තීන්දු ගැනීම රටේ යහපත වෙනුවෙන් කරනවා කියලා.

හැබැයි, අපි දන්නවා ජනතාව මේ තීන්දු දිහා බලාගෙන ඉන්නවා කියලා. ඔවුන්ට විශාල බරක් පැටවෙනවා. හැබැයි, අපි නැවතත් සහතික කරනවා, අප මේ තීන්දු ගන්නේ රට අද මුහුණ පා තිබෙන තත්ත්වයට යළි කිසිම දවසක කිසිම ආකාරයකින් මුහුණ නොපාන්න අවශ්‍ය ප්‍රතිසංස්කරණ කරන්නයි කියලා. ඒ වෙනුවෙන් දේශපාලන අධිකාරිය -ජනාධිපතිතුමාගේ සිට අපි සියලුදෙනා- කැප වෙලා කටයුතු කරනවා. යම් අඩු පාඩුවක් තිබෙනවා නම්, එහෙම නැත්නම් අප ගන්නා තීන්දුවක් ඊට වඩා හොඳ තීන්දුවක් බවට පරිවර්තනය කරන්න යෝජනා තිබෙනවා නම්, විශේෂයෙන්ම ඒවා පිළිගැනීමට අපි සූදානම්. අනෙක් පැත්තෙන්, මහ බැංකුවේත්, මුදල් අමාත්‍යාංශයේත් නිලධාරින් සියලුදෙනා මේ වෙනුවෙන් ඉතාම කැපවීමෙන් වැඩ කරනවා. ඒ අය වුණත් ගන්නා තීන්දු වෙනස් කළ යුතු නම්, ඒ කරුණු ඉතාම සද්භාවයෙන් අප වෙත ඉදිරිපත් කරන්න පුළුවන් නම් ඒ පිළිබඳව විවෘතව සාකච්ඡා කරන්න අපි සූදානම්. අතීතයේ ක්‍රියාත්මක නොවුණු ආකාරයට අද විවිධ කමිටු ක්‍රියාත්මක වෙනවා. ආණ්ඩු පක්ෂයත්, විපක්ෂයත් සාකච්ඡා කරලා තීන්දුවලට පැමිණීම, -තීන්දුවලට එළඹීම-, ගත් තීන්දු සාධනීයව වෙනස් කිරීම හරහා මේ වනකොට අලුත් සම්ප්‍රදායයක් නිර්මාණය වෙලා තිබෙනවා. මේ අසීරු අඩියක තිබෙන රට ගොඩනැඟීම වෙනුවෙන්, ජනතාව විඳින දුක් ගැහැටවලින් ඔවුන් මුදාගැනීම වෙනුවෙන් මේ රජය සහ නිලධාරින් විවිධ තීන්දු ගන්නවා. හැබැයි, අප අඩු පාඩු සහිත තීන්දු ගන්නවා නම්, ඒ තීන්දු නිවැරැදි කරගෙන ඉදිරියට යෑමේ ශක්තිය ලබා දීම වැදගත් වෙනවා. දේශපාලනඥයන් වන අපට විවිධ තැන්වලින් විවේචන එල්ල වෙන්න පුළුවන්. ඒවා විඳ දරාගැනීමේ හැකියාව අපට තිබෙනවා. හැබැයි, නිලධාරින් මේ ආර්ථිකය ස්ථාවර කිරීමට සහ ආර්ථික වර්ධනය සඳහා ගන්නා ක්‍රියා මාර්ගවලට සියලුදෙනා සහයෝගය ලබා දීම ඉතාම වැදගත් වෙනවා.

වැරැද්ද වුණේ කාගෙන්ද කියන කාරණය අපි පසුව සොයා බලමු, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. 'අරයාගෙන් වැරැද්දක් වුණා', 'මෙයාගෙන් වැරැද්දක් වුණා' කියලා එක එක්කෙනා ප්‍රකාශ කරනවා. අපි ඒ ගැන පසුවට සොයා බලමු. කාගෙන්ද වැරැද්ද වුණේ, ඒ අයට දඬුවම් ලබා දෙන්න මේ රටේ නීති රාමුව තුළ තිබෙන ඉඩ මොකක්ද කියන එක පිළිබඳව අපි සොයා බලමු. හැබැයි, මේ වර්ධනය ප්‍රමාද වන තාක්, ස්ථාවර වීම ප්‍රමාද වන තාක් ජනතාවගෙන් නැඟෙන මැසිවිලිවල අඩුවක් වෙන්නේ නැහැ. ඒවා තවදුරටත් ඉදිරියට යනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාත්‍යන්තර වශයෙන් පිළිගත් වෙනස්කම් රාශියක් අපේ රටේ සිදු කරන්න රජය මේ වනවිට තීන්දු කර තිබෙනවා. ඒ වාගේම පසු විපරම් ක්‍රමවේදය වෙනස් කරන්න රජයක් හැටියට අපි තීන්දු කර තිබෙනවා. විවිධ අය වැය ලේඛන ක්‍රියාත්මක වෙද්දී ඒවායේ ප්‍රගතිය කොතැනද තිබෙන්නේ, බලාපොරොත්තු වන වේගයෙන් ප්‍රගතිය ලැබෙන්නේ නැද්ද, ඒ ඉලක්කගත ප්‍රගතිය අත් කරගන්න ගැටලුසහගත තත්ත්වයන් තිබෙනවාද යන්න පිළිබඳ පසු විපරම් කිරීමේ ක්‍රමවේදයේ බරපතළ දුර්වලතාවක් අපේ රටේ තිබෙනවා. එම දුර්වලතාව නැති කරන්න මේ අය වැය ලේඛනය තුළ කමිටු කිහිපයක්, එහෙම නැත්නම් කොමිෂන් සභා කිහිපයක් පිහිටුවන්න යෝජනා වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ පිහිටුවන කමිටුවල, මේ පිහිටුවන කොමිෂන් සභාවල අරමුණ මේ සිදු කරගෙන යන වැඩ කටයුතු, එහෙම නැත්නම් අනාගතයේදී සිදු කරන්න බලාපොරොත්තු වන වැඩ කටයුතු කිසිම අවස්ථාවක මන්දගාමී කිරීමවත්, නොකර සිටීමට කල් මැරීමේ ක්‍රියාවලියක නියැළීමවත් විය යුතු නැහැ. එසේ නොවන කමිටු සහ කොමිෂන් සභා ක්‍රියාත්මක වීම තමයි අප මේ අය වැය ලේඛනය තුළින් බලාපොරොත්තු වන්නේ.

විශේෂයෙන්, විදේශ වෙළෙඳාම සහ ආයෝජනය සම්බන්ධ නියෝජිත ආයතනයක් පිහිටුවීමට මෙම අය වැයෙන් යෝජනා කර තිබෙනවා. එම ආයතනය පිහිටුවීම වැදගත් වෙනවා. අතීතයේ ඉඳන්ම ආයෝජකයන් ප්‍රකාශ කරන දෙයක් තමයි ඒ අයට හිතකර පරිසරයක් මේ රටේ නැහැ කියන එක. විදේශ වෙළෙඳාම තුළ අලුත් ප්‍රවේශ වෙනුවෙන් ගත යුතු ක්‍රියාමාර්ග මොනවාද, අප යා යුතු වෙළෙඳ පොළවල් මොනවාද, අප සාම්ප්‍රදායික වෙළෙඳ පොළ තුළ ඉන්නවා නම් එහි ඊළඟට නැඟීගෙන එන වෙළෙඳ පොළ මොකක්ද, අපට තිබෙන දක්ෂතාව මොකක්ද, අපට හුවමාරු කරගත හැකි දේ මොනවාද යනාදි කරුණු පිළිබඳ විශේෂ අවධානයක් යොමු කිරීම මෙම නියෝජිත ආයතනය පිහිටුවීමෙන් බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා ආයෝජන මණ්ඩලය, අපනයන සංවර්ධන මණ්ඩලය, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව සහ ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන මණ්ඩලය ඒකාබද්ධ වූ වැඩසටහනකට අපි ගමන් කරනවා.

ජාතික ඵලදායිතා කොමිෂන් සභාවක් පිහිටුවීමටත් මෙම අය වැයෙන් යෝජනා කර තිබෙනවා. ඒ වාගේම, ජාතික සංවර්ධන කමිටුවක් -National Development Committee එකක්- පිහිටුවීමට යෝජනා කර තිබෙනවා. මේ හරහා සිදු වන්නේ, ව්‍යාපෘති, වැඩසටහන් ඇගැයීමට අවශ්‍ය රාජ්‍ය නිලධාරින් සහ පෞද්ගලික අංශයේ ප්‍රවීණයන් මැදිහත් කරගෙන, එම ව්‍යාපෘති කොතෙක් දුරට මේ රටේ ක්‍රියාත්මක කිරීම සුදුසු ද නැද්ද, ඒවා සාර්ථක ද නැද්ද, අපට ගැළපෙනවාද නැද්ද කියන කාරණා පිළිබඳ තීන්දු කිරීමයි. හැම රජයක්ම සද්භාවයෙන් යුතුව සංවර්ධනය වෙනුවෙන් යම් යම් ව්‍යාපෘති රටට ගෙන ආවාට ඒවා සම්බන්ධයෙන් පසු කාලීනව විවිධ විවේචන එල්ල වී තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ ආදායම් ක්‍රමවත් කිරීම, ආදායම් උපයන්න පුළුවන් සෑම තැනකින්ම නිවැරැදිව ආදායම් උපයාගැනීම ආදි කාරණා සම්බන්ධයෙන් අධ්‍යයනය කර නිර්දේශ ලබා දීමට බදුකරණය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවක් පත් කිරීමට යෝජනා කර තිබෙනවා. ඒ යෝජනා පිළිබඳව, අද ඔවුන් හඳුනාගෙන ඇති දුර්වලතා පිළිබඳව සාකච්ඡා කරලා අවශ්‍ය වෙනස්කම් කිරීමට බලාපොරොත්තු වෙනවා. එතකොට අද මේ පාර්ලිමේන්තුව තුළ කථා වන, එළියේ කථා වන ප්‍රශ්න ගොඩකට ස්ථිරසාර විසඳුම් ලබාගන්න අපට පුළුවන් වෙයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ජාතික මෙහෙයුම් මැදිරියක් පිහිටුවීමටත් යෝජනා කර තිබෙනවා. මෙයින් බලාපොරොත්තු වන්නේ රටේ සියලු සංවර්ධන කටයුතු කිරීමේදී ඇති වන ගැටලු නිරාකරණය කරලා, බාධා නිරාකරණය කරලා ඒ සඳහා වූ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සහයෝගය ලබා දීමයි. අපි විශ්වාස කරනවා, මේ පසු විපරම් යන්ත්‍රණය වඩා ශක්තිමත් වීම තුළ අප මේ බලාපොරොත්තු වන ඉලක්ක වෙත ගමන් කරන්න අපට පුළුවන් වේවි කියලා.

අපේ රටේ ආදායම ඇස්තමේන්තු කර තිබෙන්නේ රුපියල් බිලියන 3,415ක් ලෙසයි. හැබැයි, අපේ ඇස්තමේන්තුගත වියදම රුපියල් බිලියන 5,819යි. මේ රුපියල් බිලියන 5,819 තුළ පොලී ගෙවීම් ඇතුළත් වුණාට, ඊට අමතරව අපේ ණය වාරික ගෙවීමට

අවශ්‍ය වියදම ද තිබෙනවා. පොලී සේවාකරණයත්, ණය සේවාකරණයත් වෙනුවෙන් අපට රුපියල් බිලියන 4,218ක වියදමක් දරන්නත් සිදු වෙලා තිබෙනවා. ඒ හින්දා මේ ඇති වෙලා තිබෙන තත්ත්වය මඟ හැර ශක්තිමත් ආර්ථිකයක් වෙත ගමන් කරන්න පුළුවන් පසුබිමක් මේ අය වැය තුළින් නිර්මාණය කිරීම අපේ බලාපොරොත්තුවයි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ අවසරය ඇතිව මා යම් විමසීමක් කරන්න ඕනෑ. වැදගත්ම කථාවක් ඔබතුමා දැන් කිව්වා. ඇත්තටම අපට තිබෙන අර්බුදය තමයි ණය සඳහා රුපියල් බිලියන 2,193 පොලියක් ගෙවන්න තිබීම. අප දැන් විදේශීය ණය සේවාකරණය නවත්වා තිබෙන නිසා ලබන අවුරුද්දේ අපට ගෙවන්න තිබෙන විදේශ ණය පොලිය රුපියල් බිලියන 193යි. හැබැයි, දේශීය ණය පොලිය හැටියට ගෙවන්න තිබෙනවා රුපියල් බිලියන 2,000ක්. ඒ කියන්නේ විදේශීය ණය පොලිය වාගේ 10 ගුණයකටත් වඩා දේශීය ණය පොලිය ගෙවන්න තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමා කියපු ගැටලුව තමයි, දේශීය ණය ගන්න රජයට දැන් සියයට 33ක පොලියක් ගෙවන්න සිදු වෙලා තිබීම. ගරු රාජ්‍ය ඇමතිතුමනි, මම ප්‍රශ්න දෙකක් අහන්නම්. ඔබතුමාට පුළුවන් නම් උත්තර දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු මන්ත්‍රීතුමනි, කාලය ගත වන නිසා ප්‍රශ්න කෙටියෙන් අහන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

විදේශීය ණය ප්‍රතිව්‍යුහගත කිරීම පිළිබඳව ගත්තොත්, ලංකාව කොතැනද ඉන්නේ? ද්විපාර්ශ්වික ණය සහ පෞද්ගලික ණය සම්බන්ධයෙන් චීනය එකඟ වෙලා තිබෙනවාද, ඉන්දියාව එකඟ වෙලා තිබෙනවාද?

අනෙක් කාරණය මෙයයි. ඔබතුමා දිගින් දිගටම කිව්වා, දේශීය ණය පිළිබඳව කිසිම විධියක ප්‍රතිව්‍යුහගත කිරීමක් කරන්නේ නැහැ කියලා. එහෙම නම් රුපියල් බිලියන 2,000ක් වූ දේශීය ණය පොලිය ගෙවීම සඳහා තිබෙන වැඩ පිළිවෙළ මොකක්ද කියලා කරුණාකර පැහැදිලි කරන්න.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு செஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කළේ හොඳ කාරණයක්. විදේශීය ණය, ද්විපාර්ශ්වික ණය ප්‍රතිව්‍යුහගතකරණය පැත්තෙන් ගත්තොත්, කිසිම රටක්, කිසිම පාර්ශ්වකරුවෙක් මේ වන විට ඊට සහයෝගය නොදක්වනවා කියලා නැහැ. මේ වනකොට මහ බැංකුව, මුදල් අමාත්‍යාංශය, ණය ප්‍රතිව්‍යුහගතකරණය සම්බන්ධයෙන් පත් කළ නීති උපදේශකයන් සහ මූල්‍ය උපදේශකයන් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ඒකාබද්ධව සාකච්ඡා පවත්වමින් සිටිනවා. අපට ඉලක්කයක් තිබෙනවා. අපේ ඉලක්කය තමයි දෙසැම්බර් වෙද්දී ඒ සඳහා අනුමැතිය ලබා ගැනීම. ඒක තමයි අපේ ඉලක්කය. ඒ වෙනුවෙන් අපි කටයුතු කරනවා. එතකොට අපට තවදුරටත් කියන්න බැහැ, නිශ්චිත වශයෙන් අපට කොතැනද, - *[බාධා කිරීමක්]* ඔබතුමා අහන්නේ, යම් කිසි ගැටලුවක් තිබෙනවාද කියලා නේ. තවම එහෙම ගැටලුවක් නැහැ. ඉතාම හොඳින් ඒ කරුණු, තොරතුරු - දත්ත- හුවමාරු කර ගැනීම සිදු වෙනවා. ඒ වාගේම රටක් හැටියට අප ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ පිළිබඳත් ඔවුන් දැනුවත් වෙලා තිබෙනවා. ඒ ඉලක්කය වෙත ගමන් කරන්න පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා.

ඊළඟට, පසුගිය දා වාර්තා වුණු කාරණය; financial assurances ලබා දීලා දෙසැම්බර් මාසය වෙද්දීත් අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාව හම්බ වුණේ නැත්නම් මාර්තු දක්වා බලාගෙන ඉන්න ඕනෑය කියන කාරණය මම පිළිගන්නේ නැහැ. මොකද, අපි උත්සාහ කරන්නේ, හැකි ඉක්මනින් ඒ financial assurances ලබා දෙන්නයි. ඒ වාගේම ඒ රටවලුත් ණය ප්‍රතිව්‍යුහගතකරණය නිසා ඔවුන්ට අභ්‍යන්තරිකව ඇති වන තත්ත්වයත්, ඔවුන් තවත් රටවලට මේ ආකාරයට ලබා දීලා තිබෙන මූල්‍ය පහසුකම් පිළිබඳවත් විශ්ලේෂණය කරලා තමයි අපට ඒ financial assurances ලබා දෙන්නේ. අපි විශ්වාස කරනවා, අද පවතින තත්ත්වය තුළ අපට ඒ financial assurances ලබා ගන්න පුළුවන් වෙයි කියලා. අපේ උපරිම උත්සාහය, ලබන දෙසැම්බර් මාසය වෙද්දී අපට අවශ්‍ය ඒ අනුමැතිය ලබා ගැනීමයි.

ඊළඟට ඔබතුමා කියපු domestic debt ගැනත් මම කියන්න ඕනෑ. ඔව්, domestic debt විශාල ප්‍රමාණයක් තිබෙනවා. හැබැයි, domestic debt restructure කරන්න පුළුවන් තැනකද අද අපි ඉන්නේ? ඒ හරහා බැංකු පද්ධතියට ඇති වන බලපෑම, අද පවතින ඉහළ පොලී අනුපාත, ඉහළ උද්ධමනය යන සියල්ල සලකා බලනකොට, අනෙක් පැත්තෙන් සේවක අර්ථසාධක අරමුදලට වන බලපෑම යන සියල්ල දිහා බලනකොට domestic debt restructure කරන්න පුළුවන් තැනකද අපි ඉන්නේ? ඒ නිසා තමයි ද්විපාර්ශ්වික ණයකරුවන් සමඟ කරන සාකච්ඡා අවසන් වන තෙක් අපි ඒ පිළිබඳව තීන්දුවක් නොගන්නේ. නමුත් අපි විශ්වාස කරනවා, මේ වැඩ පිළිවෙළ තුළ අපට domestic debt restructure කිරීමේ අවශ්‍යතාවක් මතු වන එකක් නැහැ කියලා. ඒ විධියට තමයි මේ වනකොට මේ සාකච්ඡා මාලාව පවත්වාගෙන යන්නේ. මොකද, ඒ තුළින් ඇති වන අහිතකර බලපෑම පිළිබඳව මහ බැංකුවත්, මුදල් අමාත්‍යාංශයත් හොඳ අවධානයෙන් කටයුතු කරනවා. ඒ නිසා, මෙතෙක් ආපු ගමන සාර්ථක කර ගෙන, අපට අවශ්‍ය ඉලක්ක වෙත ගමන් කිරීමේ හැකියාව ලැබෙයි කියලා අපි විශ්වාස කරනවා.

සුබසාධනය සම්බන්ධයෙන් වන රජයේ ප්‍රතිපත්තිය ගැන පාර්ලිමේන්තුවේදී දිගටම කථා වුණා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඊයේ දිනයේ දීත් කෙටි පැහැදිලි කිරීමක් කළා. සුබසාධනය සඳහා ලබා දෙන දීමනා අපි කප්පාදු කරන්නේ නැහැ. විපක්ෂ නායකතුමා මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ දීත්, ඊයේ පාර්ලිමේන්තුවේදීත්, දරිද්‍රතාව පිළිබඳව කරනු ලබන සංගණනය ගැන ඇහුවා. 2019 වසරෙන් පසුව ඒ ගැන සංගණනයක් කරලා නැහැ, එහෙම නොකර මේ තීන්දු ගන්නේ කොහොමද කියන කාරණය එතුමා මතු කළා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද මේ මොහොත වන විටත් ඒ සංගණනය මේ රටේ සිදු වෙමින් පවතිනවා. ඒ සඳහා තවත් මාස තුනක විතර කාලයක් ගත වෙයි. නිවැරදි දත්ත පදනම් කරගෙන අපට අවශ්‍ය Social Register එක ක්‍රමානුකූලව සකස් කර ගත්තාට පසුව, මේ රටේ ජනතාවගෙන් නැඟෙන මැසිවිලි ඉදිරියේදී නැඟෙන්නේ නැති වෙයි. දිසාපතිවරු, ප්‍රාදේශීය ලේකම්වරු සහ ක්ෂේත්‍ර නිලධාරීන් ඒ තොරතුරු රැස් කරමින් ඒ සංගණනය මේ වනකොටත් සිදු කරමින් පවතිනවා. ගරු නියෝජ්‍ය

[ගරු ශෙහාන් සේමසිංහ මහතා]

කථානායකතුමනි, සුබසාධන දීමනා -සමෘද්ධි සහනාධාරය වෙන්න පුළුවන්, වැඩිහිටි දීමනාව වෙන්න පුළුවන්; විශේෂ අවශ්‍යතා සහිත -ආබාධිත- ප්‍රජාව වෙනුවෙන් ලබා දෙන දීමනාව වෙන්න පුළුවන්, වකුගඩු රෝගීන් වෙනුවෙන් ලබා දෙන දීමනාව වෙන්න පුළුවන්, පවතින ආර්ථික තත්ත්වය තුළ දුෂ්කරතාවන්ට මුහුණ දී සිටින කණ්ඩායම්වලට ලබා දෙන දීමනාව වෙන්න පුළුවන්- ලබා දීමේදී අපි කිසිම කප්පාදුවක් සිදු කරන්නේ නැහැ.

මේ අවුරුද්දේ දෙසැම්බර් දක්වා මාස හතක කාලයකට ලබා දීපු ඒ අතිරේක දීමනාව අපි ඉදිරි මාස හතරක කාලය සඳහාත් ලබා දෙනවා. ඒ සඳහා විවිධ ආයතන අපට සහයෝගය දක්වා තිබෙනවා. අපේ ආදායමෙන් කොටසකුත් ඒ සඳහා භාවිත කර තිබෙනවා. සාමාන්‍යයෙන් මාසිකව ලැබෙන ප්‍රමාණයට වඩා මේ මොහොතේ අතිරේකව ලබා දෙන ප්‍රමාණය ජනවාරි සිට අප්‍රේල් දක්වා ඒ ආකාරයෙන්ම ගෙවීමට අපි කටයුතු කරනවා. හැබැයි, ඒ ගෙවීම් සිදු කරද්දී විදේශ රටවල් සහ අනෙකුත් ආයතනවලින් අවශ්‍ය මූල්‍ය සහයෝගය අපට ලැබෙන්නේ නැහැ. මොකද, අපට මූල්‍ය සහයෝගයක් ලබා දෙන්න ඔවුන්ටත් බැහැ. අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ එකඟතාව ලබා ගන්නා තෙක්, අපි ණය ගෙවා ගත හැකි රටක් බවට පරිවර්තනය වන තෙක්, අපට සහයෝගයක් ලබා දෙන්න ඔවුන්ටත් බැහැ. ඒ නිසා අතිරේක දීමනාව ලබන සියලු දෙනාටම ලබන අවුරුද්දේ -2023- පළමුවෙනි මාස හතර සඳහා ඒ දීමනාව ලබා දෙන්න කටයුතු කරනවා. පොරොත්තු ලේඛනවල ඉන්න කණ්ඩායමත් ඇතුළත්ව මේ අවුරුද්දේ මාස හතක කාලයකට ලබා දීපු දීමනාව තවත් මාස හතරක කාලයක් සඳහා ලබා දීමට අවශ්‍ය වැඩ කටයුතු කරනවා.

විවිධ අමාත්‍යාංශ පිළිබඳව අදහස් ප්‍රකාශ කරද්දී බොහෝ අවස්ථාවල කියපු කාරණයක් තමයි, ඇයි මේවාට මෙච්චර මුදල් වෙන් කරලා තිබෙන්නේ කියන එක. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වන විට රුපියල් බිලියන 200කට වැඩි මුදලක් රජයට සැපයුම් කරපු කණ්ඩායම්වලට ගෙවන්න තිබෙනවා. මේ අය වැයෙහි අඩංගු ගොඩාක් දේවල් දිහා බැලුවොත්, විශේෂයෙන්ම මාර්ග සඳහා වෙන් කරපු මුදල් ප්‍රමාණය දිහා බැලුවොත් ඒ වෙන් කිරීම සිදු කර තිබෙන්නේ අලුත් ඉදිකිරීම් කරන්න නොවෙයි. මේ වන විට ඉදිකිරීම් කටයුතු සිදු කර ගෙවීම් බලාපොරොත්තුවෙන් ඉන්න කණ්ඩායම් ඉන්නවා. දළ වශයෙන් ගත්තොත්, මහාමාර්ග අමාත්‍යාංශයෙන් සැපයුම්කරුවන්ට බිලියන 86ක් පියවීමට තිබෙනවා. ඒ සැපයුම්කරුවන් දැඩි දුෂ්කරතාවලට මුහුණ දෙනවා. මේ අය වැයෙන් මුදල් වෙන්කර තිබෙන්නේ මෙතෙක් සිදු කර තිබෙන ඉදිකිරීම්වල සැපයුමට අදාළව පියවීම් කටයුතු කරන්න. ඒ නිසා අලුත් ව්‍යාපෘති ඉතාම සීමිතයි. අපි ලබන අවුරුද්ද තුළ අලුත් ව්‍යාපෘති කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපට තිබෙන මේ මුදල් ප්‍රමාණය ඉතාම සීමිතව කළමනාකරණය කර ගැනීම සඳහා තමයි අපි මේ කටයුතු කරන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටේ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරිකයන් අද විශාල ගැටලුවකට මුහුණ පා තිබෙනවා. ඔවුන් විවිධ අවස්ථාවලදී ජනාධිපතිතුමා මුණ ගැසී තිබෙනවා. අදාළ නිලධාරින් මුණ ගැසී තිබෙනවා. මහ බැංකුවේ නිලධාරින් මුණ ගැසී තිබෙනවා. අපි දන්නවා, ඔවුන් අද මුහුණ දී තිබෙන ගැටලුව මොකක්ද කියලා. ඔවුන්ට අද තමන්ගේ ව්‍යාපාර කටයුතු කරගෙන යන්න විධියක් නැහැ. පොලී අනුපාත වැඩියි. ඉල්ලුම අඩු වෙලා තිබෙනවා. ඒ ගැටලු නිසා ඔවුන්ට තම ව්‍යාපාර කටයුතු පවත්වා ගෙන යෑමේ අසීරුතාවක් තිබෙනවා. ඒ නිසායි අපි උත්සාහ කරන්නේ, පොලී අනුපාතය එකවර අඩු කිරීම වෙනුවට ආර්ථික ස්ථායීකරණය ගෙන එන්න. ආර්ථිකය ස්ථාවර වුණාම විවෘත වෙළඳ පොළ තුළ මේ කළමනාකරණය සිදු කරන්න අපට පුළුවන් වේවි. උද්ධමනය අඩු වීම, අපි බලාපොරොත්තු වෙනවා. අපි මේ වන තෙක් ගත් පියවර තුළින් උද්ධමනය අඩු වෙලා තිබෙනවා. උද්ධමනය අඩු වෙන්න පටන් අරගෙන තිබෙනවා. මීට වඩා වැඩි මට්ටමකට උද්ධමනය ගමන් කරයි කියලා අපි විශ්වාස කරන්නේ නැහැ. උද්ධමනය අඩු වීම, රජය ගත් තීන්දුවල හොඳ ප්‍රවණතාවක්. ඒ නිසා තව මාස කිහිපයක් මේ ප්‍රතිපත්තිය තුළ ගමන් කරන්න අපට සිදු වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව මිනිත්තු 3ක කාලයක් තිබෙනවා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මේ දේවල් සීමාවකින් තොරව ලිහිල් කළොත් අපට කළමනාකරණය කර ගැනීම අමාරු වෙනවා. රුපියල අද යම් ස්ථාවර මට්ටමකට ඇවිල්ලා තිබෙනවා. අපේ ආනයන සීමා ක්‍රමානුකූලව අද ලිහිල් වෙනවා. අත්‍යවශ්‍ය භාණ්ඩ හා සේවා සැපයීමට අවශ්‍ය පහසුකම අද නිර්මාණය වෙලා තිබෙනවා.

මේ සියල්ල කරමින්, ලැබෙන සීමිත විදේශ විනිමය තුළ කටයුතු කරන්න අපට සිදු වෙලා තිබෙනවා. අපි මේ මාස 4ක කාලය ගමන් කරන්නේ කිසිදු විදේශ රටකින්, එහෙම නැත්නම් ආයතනයකින් resources ලබා ගන්නේ නැතිව. ඒ හින්දා මේක අසීරු කළමනාකරණයක්. ඒ අසීරු කළමනාකරණය තුළ අත්‍යවශ්‍ය වියදම් සඳහා අපි ප්‍රමුඛතාව ලබා දෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, අත්‍යවශ්‍ය වියදමක් ගැන කථා කළ නිසා මම ඔබතුමාට මේ කාරණය මතක් කරන්න කැමැතියි. 1990 - සුවසැරිය ගිලන් රථ සේවාවට රුපියල් මිලියන 220ක දැඩි අවශ්‍යතාවක් තිබෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, දැන් එම ගිලන් රථ service කරන්න බැහැ, repair කරන්න විධියක් නැහැ. මොකද, එම කටයුතු කරන ආයතනවලට රුපියල් මිලියන 62ක් ගෙවන්න තිබෙනවා. ඊළඟට, shock absorbers දමා ගන්න විධියක් නැහැ, ඒවාට සල්ලි නැහැ. බැටරි දාන්න විධියක් නැහැ; ඒ ආයතනවලට රුපියල් මිලියන දෙකහමාරක් ගෙවන්න තිබෙනවා. BLS bags ඔක්කෝම worn out වෙලා, ඒවා මාරු කරන්න ඕනෑ. එහෙම නැතිව patientsලා ගෙනියන්න බැහැ. Staff එකට safety shoes ගන්න විධියක් නැහැ. ඒ වාගේම, call centre එකේ softwareවලට මාස 4කින් ගෙවලා නැහැ. කුලිය ගෙවලා නැහැ, මාස 5කින්. මේ ආදී වශයෙන් කරන්න බොහෝ ගෙවීම් තිබෙනවා. මෙහෙම ගියොත් අපට මේ සේවාව නවත්වන්න සිද්ධ වෙනවා. ඔබතුමා අත්‍යවශ්‍ය දේවල් කියලා පාරවල් සඳහා ගෙවීම් කරන්න රුපියල් බිලියන 200ක් වෙන් කිරීම ගැන කථා කළා. කරුණාකරලා රුපියල් මිලියන 220ක් සුවසැරියට ලබා දෙන්න. මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, වහාම, අදම මේක approve කරලා දෙන්න කියලා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා මම කියපු කාරණය අහගෙන ඉඳලා නැහැ. රුපියල් බිලියන 200ක මුදල වෙන් කරන්නේ

මාර්ගවලට විතරක් නොවෙයි, මේ රජයට සැපයීම් කළ සියලුදෙනාට අපි කළ යුතු ගෙවීම් සඳහායි එම මුදල වෙන් කරන්නේ. ඔබතුමා ඔය කියපු කාරණය, විශේෂයෙන්ම සෞඛ්‍යයට අපි මේ මොහොතේ ප්‍රමුඛතාව ලබා දීලා තිබෙනවා. 1990 - සුවසැරිය සේවාව ගැනත් අපි විශේෂ අවධානයක් යොමු කරන්නම්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා ඔය කියපු සමහර කාරණාවලට වෙළෙඳ පොළේ භාණ්ඩ හිඟයත් බලපා තිබෙනවා. ඔය හිඟ ගෙවීම් වාගේම වෙළෙඳ පොළේ භාණ්ඩ හිඟයකුත් තිබෙනවා. අපි ඒ සඳහාත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරනවා, ඒ අවශ්‍ය ගෙවීම් ටික කරන්නත් වැඩ කටයුතු කරනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
සුවසැරිය ගිලන් රථ සේවාවෙන් දවසකට 1,000කට වඩා රෝගීන් ප්‍රමාණයක් emergency unitsවලට ගෙනියනවා. මම ඔබතුමාගෙන් බැගෑපත්ව ඉල්ලනවා, කරුණාකර අදම මේ මුදල් approve කරලා, දෙන්න කියලා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා සුවසැරිය සේවාව ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් කළ සේවය අපි නොසලකා හරින්නේ නැහැ. එයින් සිදුවන සේවය පිළිබඳවත් අපි අවධානයෙන් ඉන්නේ. මේ අවස්ථාවේදී සෞඛ්‍ය ක්ෂේත්‍රයට අපි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. සුවසැරිය සේවාව ගැනත් විශේෂ අවධානයක් යොමු කරලා කටයුතු කරන්න කියලා අපේ නිලධාරින්ට මම දන්වන්නම්. ඒ අවශ්‍ය කාරණා ටික මම කරන්නම්. මම රුපියල් බිලියන 200ක් වෙන් කර තිබෙන බව කිව්වේ පාරවල්වලට විතරක් නොවෙයි, අනික් සියලු දේවල් ද ඇතුළුවයි. සියලු අමාත්‍යාංශවලට සැපයුම් කළ අයට කරන්න තිබෙන හිඟ ගෙවීම් කරන්නයි ඒ මුදල වෙන් කර තිබෙන්නේ. ගරු මන්ත්‍රීතුමනි, එහිදී සුවසැරිය පිළිබඳවත් අපි අවධානය යොමු කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාට වෙන් වූ කාලය අවසානයි, ගරු රාජ්‍ය අමාත්‍යතුමා.

**ගරු ශෙහාන් සේමසිංහ මහතා**
(மாண்புமிகு ஷெஹான் சேமசிங்க)
(The Hon. Shehan Semasinghe)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තව විනාඩියකින් මගේ කථාව අවසන් කරනවා.

මේ අය වැය ලේඛනය සමහර විට අපි හිතන ආකාරයෙන්ම නැති වෙන්න පුළුවන්. මේ අය වැය, මේ කරුණු ඉදිරිපත් කරලා තිබෙන්නේ මහජන නියෝජිතයන් හැටියට අපට සතුටු වෙන්න පුළුවන් අවස්ථාවක නොවෙන්න පුළුවන්. නමුත්, රටේ ස්ථාවරභාවය ගොඩනැඟීමට, මාස 4කට කලින් රටේ ඇති වුණු තත්ත්වය යළි ඇති නොවන්නට තමන්ගේ දේශපාලන මතයට වඩා වැඩි වටිනාකමක් ලබා දෙන්න කියලා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

මහජන නියෝජිතයන්ට පුළුවන්, අද ස්වායීනව තමන්ගේ ඡන්දය පාවිච්චි කරන්න. මම විශ්වාස කරනවා, මේ අය වැය ලේඛනය තුළින් බිහි කරන අලුත් ආර්ථික ක්‍රමවේදය අපට මේ රට ගොඩ නැඟීම සඳහා වූ පදනම සකස් කර ගැනීමට වඩා ඉවහල් වෙයි කියලා. රජයක් හැටියට අපි නිසි කළමනාකරණයක් සිදු කිරීමට කැප වෙලා කටයුතු කරන බව ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු අනුර කුමාර දිසානායක මැතිතුමා. ඔබතුමාට මිනිත්තු 49ක කාලයක් තිබෙනවා.

***[මෙම අවස්ථාවේදී ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]***
*[இச்சந்தர்ப்பத்தில் மாண்புமிகு சனாதிபதி ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]*
*[At this stage, the Hon. President Ranil Wickremesinghe entered the Chamber.]*

[පූ.භා. 11.23]

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

මෙම අය වැය ලේඛනය ඉදිරිපත් කරලා තිබෙන්නේ අපේ රට දිගු කාලයක් අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්තියේත්, දේශපාලන ප්‍රතිපත්තියේත් ගැඹුරුම ප්‍රතිවිපාකවලට අපේ රටත්, ජනතාවත් මුහුණ දීලා තිබෙන වෙලාවකයි. විශේෂයෙන්ම පසුගිය දවස්වල පාර්ලිමේන්තුවේදීත්, පිටතදීත් මේ අර්බුදය පිළිබඳව විවිධ අර්ථ කථන ගේනවා මම දැක්කා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ මහ ලේකම්වරයා ප්‍රකාශයට පත් කර තිබෙනවා මා දැක්කා, ජනතා විමුක්ති පෙරමුණ කියලා පක්ෂයක් නැත්නම් මේ අර්බුදය ඇති වෙන්නේ නැහැ කියලා. එතුමාගේ අර්ථ කථනය වුණේ අපි තමයි මේ ප්‍රශ්නය නිර්මාණය කළේ කියන එක. ඒ වාගේම මා දැක්කා, මහින්දානන්ද අලුත්ගමගේ හිටපු අමාත්‍යවරයා එළියෙදි කියා තිබුණා, මේ අර්බුදයට වග කියන්න ඕනෑ, ජනතා විමුක්ති පෙරමුණයි කියලා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
සියලුම පක්ෂ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
සියලුම පක්ෂ නේ. බොහොම ස්තුතියි, මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි.

ඔය පැත්තේ වාඩි වී සිටින ඒ තරම් ගණන් ගත යුතු නැති මන්ත්‍රීවරයකු ප්‍රකාශ කර තිබෙනවා මා දැක්කා, "සියයට 3ට බිය නොවන්න. මේ වෙනුවෙන් දැඩි තීරණ ගන්න" කියලා. ඒ කියන්නේ, "ජනපතිතුමනි, සියයට 3ට බිය නොවන්න, ඔබතුමා වෙනුවෙන් අපි ඉන්නවා" කියන එකයි. "වංචා, දූෂණවලින් තොර රාජ්‍යයක් පිළිබඳ ප්‍රවාදයක් තිබෙනවා. ඒක නිකම් එක ප්‍රවාදයක් විතරයි. ඒක යථාර්ථයක් නොවේ" වාගේ අදහසක් ඔබතුමා අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කර තිබෙනවා මා දැක්කා, ගරු ජනාධිපතිතුමනි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - President, Minister of Defence and Minister of Finance, Economic Stabilization and National Policies)
ගාමිණී වියන්ගොඩගෙන් අහන්න.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ගාමිණී වියන්ගොඩගෙන් අහන්න කියලා එතුමා මට කියනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. හැබැයි, යම් කෙනකු ප්‍රකාශ කර ඇති දෙයකින් යමක් උපුටා දක්වන්නේ අපි ඒකට එකඟ නම් විතරයි. එකඟ නොවන දේවල් අපි උපුටා දක්වන්නේ නැහැ නේ. ඒක තමයි ඔබතුමාත්, මාත් පිළිගන්නා දේ. අවසානයේදී ජනාධිපතිතුමා කියනවා, මේ ආර්ථික ගමන එතුමා දැකපු බවත්, 1977ට පෙර තිබුණු ආර්ථික ගමනත් අසාර්ථකයි කියලා. ඒක අපි කවුරුත් දන්නවා. ඒක සංවෘත ආර්ථිකයක් පමණක් නොවෙයි. ඒක රාජ්‍ය ඒකාධිකාරය, ධනවාදය කියලා අපි ආර්ථික විද්‍යාවේදී හඳුන්වනවා. රජය මැදිහත් වී සියලු භාණ්ඩ හා සේවා වෙළෙඳ පොළ හසුරුවමින් රාජ්‍ය ඒකාධිකාරී ධනවාදයක් පවත්වා ගෙන ගියා. 1977දී නැවත ඒක වෙනස් කිරීමකට භාජන කළ බව ඔවුන් කියනවා. නමුත් ඉතා පැහැදිලිව මේ අය වැය ලේඛනයේදී ජනාධිපතිතුමා ප්‍රකාශයට පත් කරලා තිබෙනවා, "1977 වසරේ නිර්මාණය කෙරුණු ආර්ථික පදනම දැන් වලංගු නැහැ. එය වර්තමානයට ගැළපෙන්නේ නැහැ. එය දැන් කඩා වැටිලා. අපේ රටේ කලක් ක්‍රියාත්මක වූ සංවෘත ආර්ථිකය සේම 1977 නිර්මාණය කළ ආර්ථිකයත් අසාර්ථක වී හමාරයි" කියලා. එතුමා ඉදිරිපත් කළ මේ කාරණය බොහොම වැදගත්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

දීර්ඝ කාලයක් මේ රටේ විකල්ප ආර්ථික ක්‍රමවේදයක් ගැන කල්පනා කරපු කණ්ඩායම් 1977දී අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්තිය දිගු කාලීනව අපේ රටේ ආර්ථිකයට ඇති කරන ලද හානිදායක තත්ත්වය පිළිබඳව අප පාර්ලිමේන්තුවේදීත්, පිටතදීත් කථා කරලා තිබෙනවා. හැබැයි, ජනාධිපතිවරයාටම පිළිගන්න සිදු වී තිබෙනවා, 1977දී නිර්මාණය කළ ආර්ථිකය අසාර්ථක වී හමාර බව. කොට්ට උරයක් මෙන් කණපිට හරවා, අලුත් ඇහැකින් ලෝකය දෙස බැලිය යුතුයි කියා "මරාසාද්" නාට්‍යයේ තිබුණු ප්‍රකාශයක් ජනාධිපතිතුමා අය වැය කථාව අතරතුරේදී උපුටා දක්වනවා. හැබැයි, මේ අය වැය ලේඛනය සලකා බැලුවාම නම් කොට්ට උරයක් අනික් පස හරවා අලුත් ඇසකින් බලන බවක් නම් පෙනෙන්නේ නැහැ. මුළුමනින්ම පරණ වූ, කිලිටි වූ කොට්ට උරය, ජනාධිපතිවරයා විසින් සුවඳවත් යැයි කියා ඒ පැරණි කොට්ට උරයේ ඒ පසම නිදාගෙන ඉන්න බවක් තමයි අපට පෙන්නුම් කරන්නේ. ඇයි, ඒ?

මේ ආර්ථික ගමන ආපු දිශාව ගත්තොත්, එහිදී අපි දීර්ඝ කාලීන අර්බුද දෙකකට මුහුණ දුන්නා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පළමුවන අර්බුදය තමයි, රජයේ වියදම සඳහා රුපියල් උපයා ගැනීමට නොහැකි තත්ත්වයක් නිර්මාණය වීම. දෙවන අර්බුදය, රටට අවශ්‍ය වන ඩොලර් ප්‍රමාණය උපයා ගන්න අසමත් වීම. මෙලෙස අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්තිවලින් අවසානයේදී අපි හිර වී තිබෙනවා. රජයට තමන්ගේ මුදල් වියදම් කර ගැනීම සඳහා අවශ්‍ය වන රුපියල් උපයා ගන්නත් බැරි වී තිබෙනවා; රටකට අවශ්‍ය ඩොලර් ප්‍රමාණය උපයා ගන්නත් අපි අසමත් වී තිබෙනවා. ඒ නිසා මේ අය වැය ලේඛනය කරුණු දෙකකින් සමන්විතයි. පළමුවන කරුණ මෙයයි. මෙම අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කරන සංඛ්‍යා දත්ත ගත්තොත් ඒවා නිවැරදි නැහැ කියා මා හිතනවා. මොකද, අපේ රටේ දත්තත් අද සැබෑ යථාර්ථය වසන් කරන tool එකක්. අපේ රටේ පවතින උද්ධමනය පිළිබඳව අද ඉදිරිපත් කරන දත්ත නිවැරැදි නැහැ. සැබෑ යථාර්ථය වසන් කර ගැනීම සඳහා මේ දත්ත උපයෝගි කර ගන්නවා. මේ අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කර තිබෙන සංඛ්‍යා දත්ත දෙස බැලුවොත් අපි දන්නවා, 2021 වසරේ රජයේ සමස්ත ආදායම වුණේ රුපියල් බිලියන 1,464ක් බව. නමුත්, 2023දී එතුමා අපේක්ෂා කරනවා, රුපියල් බිලියන 3,415ක ආදායමක්. ආසන්න වශයෙන් ගත්තොත් රුපියල් බිලියන 2,000ක -රුපියල් ට්‍රිලියන 2ක- වැඩිවීමක්. කාට හෝ කියන්න පුළුවන්ද, රුපියල් ට්‍රිලියන 2ක වැඩි වීම යථාර්ථවාදීයි කියලා?

දැනට උපකල්පනය කර තිබෙනවා, මේ අවුරුද්දේ ආර්ථිකය සියයට 8ත්, 9ත් අතර සෘණ අගයකට පත් වේවි කියලා. ඒ වාගේම සමහරු උපකල්පන ඉදිරිපත් කරලා තිබෙනවා, ලබන අවුරුද්දේත් අපේ ආර්ථිකය සෘණ 3කින් හැකිළෙනවා කියලා. ආර්ථිකය එසේ හැකිළෙනවා කියද්දී එතුමා කියනවා, 2021දී ලබා ගත්ත ආදායම වාගේ දෙගුණයකටත් වැඩි ප්‍රමාණයක් 2023දී උපයන බව. ඒක අසත්‍යයක්. මේ, සංඛ්‍යා දත්ත මුළුමනින්ම විකෘති කිරීමක් සහ සැබෑ ස්වරූපය වසන් කිරීමක්. 2022 ගත්තොත්, පළමුවැනි මාස 6 තුළ උපයා තිබෙන්නේ රුපියල් බිලියන 900ක් වාගේ ප්‍රමාණයක්. ඉතිරි මාස 6ටත් අපි බිලියන 900ක්, බිලියන 1,000ක් දාමු. ඒත් මොකක්ද වෙන්නේ? මේ දත්ත සත්‍ය ඒවා නොවෙයි.

ජනාධිපතිතුමා අය වැයේ කියලා තිබුණා, පශ්චාත් උපාධි ආයතන 3ක් පිහිටුවීම වෙනුවෙන් රුපියල් මිලියන 60ක් වැය කරන බව. ඒ කියන්නේ, එක පශ්චාත් උපාධි ආයතනයකට රුපියල් මිලියන 20ක්. මේ, දත්තවලින් සමාජයේ සැබෑ ස්වරූපය වසන් කිරීමක්. එතුමා අය වැයේ කියලා තිබුණා, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට වෛද්‍ය පීඨයක් ඉදිකිරීම වෙනුවෙන් රුපියල් මිලියන 200ක් වෙන් කරනවා කියලා. හැබැයි, සබරගමුව විශ්වවිද්‍යාලයේ ළමයි 100ක් සඳහා වෛද්‍ය පීඨයට අදියර 3ක් සඳහා 2018දී හදපු ඇස්තමේන්තුව රුපියල් මිලියන 12,180යි. ඒකට වෙන් කළ මුළු ඇස්තමේන්තු මුදල මිලියන 12,180ක් වෙනකොට, මේ අය වැයේදී රුපියල් මිලියන 200කින් සබරගමුවට වෛද්‍ය පීඨයක් ලබා දෙන බව එතුමා කියනවා. මේ වන විට මොරටුව විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට රුපියල් මිලියන 5,995ක් වැය වෙලා තිබෙනවා. ඒ නිසා මේවා දත්තවලින් කරන වසන් කිරීමක්. මේවා කිසිසේත්ම යථාර්ථවාදී දත්ත නොවෙයි.

ඊළඟට, මේ උපාය මාර්ගය යථාර්ථවාදී ද? මේ උපාය මාර්ගයෙන් මොකක්ද කියන්නේ? මේක කිසිසේත්ම අලුත් උපාය මාර්ගයක් නොවෙයි. එතුමා කිව්වාට, "කොට්ට උරය අනෙක් පස හරවනවා" කියලා, කිසිසේත්ම යළි හැරවීමක් නැහැ. පැරණි උපාය මාර්ගයේම තමයි ගමන් කරමින් තිබෙන්නේ. 1977න් පසුව අපේ රටේ ආර්ථිකය මුහුණ දීපු ප්‍රධානම ගැටලු ටික මොනවාද? අපට අවශ්‍ය රුපියල් ප්‍රමාණය සොයා ගන්න බැරි වුණා; අපට අවශ්‍ය ඩොලර් ප්‍රමාණය සොයා ගන්න බැරි වුණා. අපට අවශ්‍ය වන රුපියල් ප්‍රමාණයයි, ඩොලර් ප්‍රමාණයයි උපයා ගන්න මොකක්ද කළේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි? එකක්, ණය ගැනීම. දෙවැන්න, විකිණීම. අපි මේ වන විට ණය ගන්න පුළුවන් සියලු ආකාරයන්ගෙන් ණය අරගෙන ඉවරයි. අපි බහුපාර්ශ්වීය ලෙස ADB, World Bank, IMF වැනි ආයතන හරහා ණය අරගෙන තිබෙනවා. අපි ද්විපාර්ශ්වීය ලෙස චීනය, ඉන්දියාව, ජපානය වැනි රාජ්‍යවලින් ණය අරගෙන තිබෙනවා. ඒ

වාගේම, අපි ජාත්‍යන්තර වෙළෙඳ පොළේ ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර -ISBs- විකුණලා ණය අරන් තිබෙනවා. බංග්ලාදේශය, ඉන්දියාව, චීනය වැනි රටවලින් අපි අතමාරු අරගෙන තිබෙනවා. ඒ නිසා දිගු කාලයක් තිස්සේ ගමන් කරමින් තිබුණු ආර්ථික මාවතේ ප්‍රධාන ලක්ෂණයක් තමයි, මේ අර්බුදය පියවා ගැනීම සඳහා ණය ගැනීම. දැන් ඒක අත හැරලා තිබෙනවා ද? දැන් එතුමා කිව්වාට, "කොට්ට උරයේ අනෙක් පස හරවනවා" කියලා, හරවලා තිබෙනවා ද? නැහැ. ලබන අවුරුද්දේ ණය ගැනීමේ අපේක්ෂාව රුපියල් ට්‍රිලියන 4.9යි; ආසන්න වශයෙන් ගත්තොත් ට්‍රිලියන 5ක්. ඒ කියන්නේ කොච්චරක් ද? කෝටි 500,000ක් ණය ගන්න අපේක්ෂා කරනවා. කෝටි ලක්ෂ 5න්, කෝටි ලක්ෂ දෙකක්, -ට්‍රිලියන දෙකක්- ඒ කියන්නේ, රුපියල් බිලියන 2,025ක් ණය වාරිකය ගෙවීම සඳහා පාවිච්චි කරනවා. ඒ නිසා අපි අලුතින් ණය ගන්න අපේක්ෂා කරනවා, ආසන්න වශයෙන් ට්‍රිලියන 3ක්. ඒ කියන්නේ, ලබන වසරේ අපේ ණය පංගුවේ වැඩිවීම ට්‍රිලියන 3යි. ඒ කියන්නේ, කෝටි ලක්ෂ 3යි. නිවැරදි දත්ත නැහැ. එම නිසා මුදල් අමාත්‍යාංශයෙන් මම ඉල්ලා සිටිනවා, පුළුවන් නම් අද අපේ රටේ තිබෙන සමස්ත ණය තොගය ගැන මේ පාර්ලිමේන්තුවට කියන්න කියලා. මම හිතනවා, මුදල් අමාත්‍යවරයා ඒක කියයි කියලා.

අපේ රටේ සමස්ත ණය තොගය කොච්චර ද? සමස්ත ණය තොගය ආසන්න වශයෙන් මම හිතනවා ට්‍රිලියන 25කට ආසන්න කරලා ඇති කියලා මධ්‍යම ආණ්ඩුවේ ණය ප්‍රමාණය, දැනට ඩොලරයත් එක්ක අනුපාතය ගළපා බලපුවාම. ඒ නිසා තව ට්‍රිලියන 3කින් අපේ ණය තොගය වැඩි කර ගැනීම සඳහා මෙම අය වැය ලේඛනයෙන් යෝජනා කරමින් ඉන්නවා. මේ ණය අර්බුදය කොතැනටද ආවේ? මේ රාජ්‍ය වියදම් සොයා ගැනීමේ ගැටලුවට විසඳුම් කොහේද තිබෙන්නේ? උදාහරණයක් හැටියට ගත්තොත්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2021 වසරේ ආණ්ඩුවේ මුළු ආදායම බිලියන 1,464යි. වැටුප් හා විශ්‍රාම වැටුප්වලට බිලියන 846ක් වැය කරනවා. ඒ කියන්නේ, වැටුප් හා විශ්‍රාම වැටුප්වලට රජයේ ආදායමෙන් සියයට 58ක් වැය කර තිබෙනවා. ණය පොලිය ගෙවන්න බිලියන 1,048ක් වැය කර තිබෙනවා. ඒ කියන්නේ, 2022දී පොලී වාරිකය සඳහා සියයට 72ක් අපි වැය කළා. එතකොට ණයවලට සියයට 58යි; පොලීවලට සියයට 72යි. ආසන්න වශයෙන් ගත්තොත් සියයට 130යි.

රාජ්‍ය ආදායම හා සංසන්දනය කරලා බලනකොට ණය පොලී වාරිකයත්, ඒ වාගේම රාජ්‍ය සේවක වැටුප් සහ විශ්‍රාම වැටුප් සඳහා අවශ්‍ය ප්‍රමාණයේත් සියයට 130ක වැඩි වීමක් තිබෙනවා. කොහොමද ඒක දරන්නේ? තමුන්නාන්සේලා දිගු කාලයක් තිස්සේ අපේ රටේ රාජ්‍ය ආදායම වැඩි කර ගැනීම සඳහා හදපු සැලසුම් මොනවාද? එන්න එන්නම මේ අර්බුදය තීව්‍ර වෙනවා හැරෙන්න, සමනය වෙන්නේ නැහැ. වියදම් කරන්න රුපියල් නොමැති අර්බුදයකට අද රජය මුහුණ දෙමින් සිටිනවා.

දෙවැනි අර්බුදය මොකක්ද? මේ ආර්ථිකය අනුගමනය කරන ලද ප්‍රතිපත්ති විසින් දෙවනුව නිර්මාණය කරන ලද අර්බුදය තමයි, ඩොලර් හිඟය. ආසන්න වශයෙන් ගත්තොත්, 2022 වසරේ අපේ අපනයන ආදායම ඇමෙරිකානු ඩොලර් බිලියන 12.5යි. අපේ ආනයන වියදම ඇමෙරිකානු ඩොලර් බිලියන 20.6ක් වුණා. ඒ කියන්නේ, ආසන්න වශයෙන් අපට ඇමෙරිකානු ඩොලර් බිලියන 8.1ක ආනයන අපනයන පරතරයක් තිබෙනවා. 1977 දී අපේ වෙළෙඳ ශේෂය ඩොලර් මිලියන 44ක ධන අගයක් වුණා. හැබැයි, 2021 වෙනකොට අපේ වෙළෙඳ ශේෂය ඩොලර් මිලියන 8,100 දක්වා වර්ධනය වෙලා තිබෙනවා. මොකක්ද, හදපු ආර්ථික ප්‍රතිපත්තිය? දිගු කාලයක් අපේ රටේ වෙළෙඳ ශේෂයේ ඇති වී තිබෙන අර්බුදය විසඳීම සඳහා තමුන්නාන්සේලාට සැලසුමක් හදා ගන්න බැරි වුණා. 1977 දී ධන මිලියන 44ක්ව තිබුණු වෙළෙඳ ශේෂය, 2021 වෙනකොට සෘණ මිලියන 8,100ක් වෙලා තිබෙනවා. අපේ ණය පංගුවත් එහෙමයි. ආසන්න වශයෙන් ගත්තොත්, 2022 වසරේ අපේ ණය පංගුව ඇමෙරිකානු ඩොලර් බිලියන 6.7ක් වෙනවා. අපි මේ වසරේ ඩොලර් බිලියන 6.7ක් ගෙවිය යුතුයි. ඒ කියන්නේ ආසන්න වශයෙන් ගත්තොත්, භාණ්ඩ ආනයන වෙනුවෙන් අපට අතිරේක වශයෙන් ඩොලර් බිලියන 8.1ක් අවශ්‍යයි, විදෙස් ණය ගෙවීම වෙනුවෙන් අපට අතිරේකව ඩොලර් බිලියන 6.7ක් අවශ්‍යයි. ඒ කියන්නේ, මේ කාර්යයන් දෙක සඳහා පමණක් ඩොලර් බිලියන 14.8ක් අපට අවශ්‍යයි. භාණ්ඩ ගෙන ඒම සඳහා අතිරික්ත මුදලක් සහ ණය වාරික ගෙවීම වෙනුවෙන් ඩොලර් බිලියන 14.8ක් අපට අවශ්‍යයි. එම මුදල අපි උපයා ගන්නේ කොහොමද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට විදේශගත ශ්‍රමිකයන්ගෙන් ආසන්න වශයෙන් ඩොලර් බිලියන 7ක් විතර ආවා. ඒකත් කඩා වැටෙන්න පටන් ගත්තා. ඊළඟට, 2018 වසරේ සංචාරකයන් මිලියන 2.4ක් ආපු වෙලාවේ සංචාරක ව්‍යාපාරයෙන් අපට ඩොලර් බිලියන 3.8ක වාගේ මුදලක් ලැබුණා. නමුත්, ඒක ශුද්ධ ආදායමක් නොවෙයි. එහෙත්, අපට ගෙඩි පිටින් ඩොලර් බිලියන 5ක විතර හිඟයක් හැම වසරකම තිබෙනවා. එම නිසා, අපේ රටට අවශ්‍ය වන ඩොලර් ප්‍රමාණය උත්පාදනය කරන්න අපි ආර්ථික සැලැස්මක් හැදුවාද? අපට එවැනි සැලැස්මක් තිබුණේ නැහැ. අපි මේ අර්බුද දෙකට මුහුණ දුන්නේ කොහොමද? භාණ්ඩාගාරයට අවශ්‍ය රුපියල් ප්‍රමාණය සොයා ගැනීමේ අර්බුදයටත්, රටට අවශ්‍ය ඩොලර් ප්‍රමාණය උපයා ගැනීමේ අර්බුදයටත් අප මුහුණ දුන්නේ, නැවත නැවත, නැවත නැවත ණය ලබා ගැනීමෙනුයි. ගත හැකි හැම විධියකටම ණය ලබා ගත්තා.

2007න් පස්සේ අපි ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර වෙළෙඳ පොළට ගිහිල්ලා ණය ගන්න පටන් ගත්තා; සියයට 6.7, 7 වැනි ඉතා අධික පොලී අනුපාතිකයන්ට ණය ගන්න අපට සිදු වී තිබුණා. 2015-2019 කාලය ගත්තොත්, අවුරුදු 5, 10 කාල සම්පූර්ණ වන පරිදි සියයට 6, 7 ඉක්මවූ පොලියට ඩොලර් බිලියන 12.5ක වාගේ ජාත්‍යන්තර ස්වෛරීත්ව බැඳුම්කර අපි ණයට අරන් තිබෙනවා. අපට සැලැස්මක් තිබුණේ නැහැ. මේ අර්බුදයෙන් ගොඩ ඒම සඳහා ණය පස්සේ හඹාගෙන යනවා වෙනුවට අපේ ජාතික නිෂ්පාදනය ඉහළ දමන්නේ කොහොමද, අපේ සේවා නිෂ්පාදනයෙන් පංගුවක් අත් පත් කර ගන්නේ කොහොමද, විදෙස්ගත භාණ්ඩ වෙළෙඳ පොළෙන් පංගුවක් අත් පත් කර ගන්නේ කොහොමද, විශේෂයෙන්ම විදෙස්ගත ශ්‍රම වෙළෙඳ පොළෙන් දියුණු වෘත්තීමය පංගුවක් අත් පත් කර ගන්නේ කොහොමද කියලා කිසිම සැලැස්මක් අපට තිබුණේ නැහැ. නමුත්, එදිනෙදා වියදම් සඳහා ණය ගැනීමේ ක්‍රියාවලියකට අවතීර්ණ වී තිබුණා. අවසානයේදී මොකක්ද වුණේ? අවසානයේදී ආණ්ඩුව පසුගිය අප්‍රේල් මාසයේ 12වැනි දා තීරණය කරනවා, අපි විදේශ රටවලින් අරන් තිබෙන ණය ගෙවන්නේ නැහැ කියලා. අනාගතයේ තව සියවස් ගණනාවකට පසු කවුරු හෝ කෙනෙක් ලංකා ඉතිහාසයේ ආර්ථිකය පිළිබඳව ලියනවා නම්, 2022 අප්‍රේල් මාසයේ 12වැනි දා ණය ගෙවාගත නොහැකි රාජ්‍යයක් බවට ලංකාව පරිවර්තනය වුණු බව සටහන් කරනවා. අප්‍රේල් මාසයේ 12වැනිදා අපේ රටට ඉතාම කළු පැල්ලමක් එක් වූ දිනයක්, කළු දිනයක් බවට පත් වෙනවා. ඒ තමයි ඉතිහාසය. නමුත්, ඒකෙන් මොකක්ද සිදු වුණේ? මේ සැප්තැම්බර් මාසයේ 30වැනි දා වෙනකොට අපි ගෙවිය යුතු, නමුත් නොගෙවා ඉතිරි වූ ණය ලෙස ඇමෙරිකානු ඩොලර් බිලියන 3.2ක් තිබෙනවා. හැබැයි, මොකක්ද වෙන්න ඕනෑ? අපි ඩොලර් බිලියන 3.2ක ණය පංගුවක් ගෙව්වේ නැත්නම් අපේ සංචිත ප්‍රමාණය ඩොලර් බිලියන 3.2කින් වැඩි වෙන්න ඕනෑ. නමුත්, එහෙම වැඩිවෙලා නැහැ. ආසන්න වශයෙන් ගත්තොත්, සංචිත ප්‍රමාණය ඩොලර් මිලයන 300කට වඩා වැඩි වීමක් වෙලා නැහැ. එහෙම නම්, මේ ඩොලර් බිලියන 3.2 අපට ගෙවාගත නොහැකි මුදලක්.

[ගරු අනුර දිසානායක මහතා]

ගොඩක් අය කියනවා, - මහ බැංකු අධිපතිවරයාත් කියලා තිබුණා - අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයාත් කිව්වා, අපි ආර්ථිකය යම් ස්ථාවරත්වයකට ගෙනැල්ලා තිබෙනවා කියලා. නමුත්, එහෙම ස්ථාවර තත්ත්වයකට ගෙනැල්ලා නැහැ.

මාර්තු මාසය ගත්තොත්, ණය ගෙවමින් ඉන්න කොට තමයි අපට ඉන්ධන හිඟයක් තිබුණේ; ගෑස් හිඟයක් තිබුණේ; කිරි පිටි හිඟයක් තිබුණේ. දැන් අපට ඉන්ධන යම් ප්‍රමාණයක් තිබෙනවා; ගෑස් යම් ප්‍රමාණයක් තිබෙනවා; කිරි පිටි යම් ප්‍රමාණයක් තිබෙනවා. ඒ, ණය නොගෙවමින්. ඩොලර් බිලියන 3.2ක් අපි ණය ගෙවලා නැහැ. ඒකේ ප්‍රතිඵල තමයි මේ තිබෙන්නේ. ඒක නිසා ආර්ථිකයේ ගන්නා ලද කිසිදු ප්‍රතිපත්තිමය හෝ උපාය මාර්ගික තීන්දුවක ප්‍රතිඵලයක් නිසා නොවෙයි, අද ඉන්ධන ටික තිබෙන්නේ; ගෑස් ටික තිබෙන්නේ; කිරි පිටි ටික යම් ප්‍රමාණයකට හෝ තිබෙන්නේ. අපි ණය නොගෙවා සුද්දා වාගේ අතේ තිබුණු සල්ලි ටික වියදම් කිරීමයි සිදු වී තිබෙන්නේ. ආර්ථිකය සමනය වුණාය කිව්වාට එතැන තිබෙන්නේ, ණය නොගෙවීම නිසා ඉතුරු වුණු සොච්චමෙන් කරන සෙල්ලමක් මිස වෙන කිසිවක් නොවෙයි. මේ අර්බුදය සමනය වෙලා නැහැ. නැවතත් මේ අර්බුදය විසඳීමට යන්න තිබෙන්නේ පැරණි පාරේමයි. ඒ තමයි නැවත ණය ගැනීම. ඒ නිසා තමයි මා කලින් කිව්වේ, 2023 වසරේ අපේ ණය පංගුව ට්‍රිලියන තුනකින් වැඩි වෙනවා කියලා. කෝටි ලක්ෂ තුනකින් අපේ ණය තොගය වැඩි වෙන්න යෝජනා කරනවා. ඒ නිසා රනිල් වික්‍රමසිංහ මහත්මයා මොනවා කිව්වත්, 1977 සිට අනුගමනය කරන ලද ආර්ථික උපාය මාර්ගයේම දිගුවක් තමයි මෙම අය වැය ලේඛනයේ සඳහන් කොට තිබෙන්නේ.

එතුමා අසාර්ථකමයි කියනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ අය වැය ලේඛනය ඉදිරිපත් කිරීම සඳහා මේ රටේ ආර්ථික සහ දේශපාලන තත්ත්වය පිළිබඳව එතුමා ඉදිරිපත් කරන පූර්විකාව විටෙක එතුමාගේ දේශපාලන ජීවිතයේ පාපෝච්චාරණයක්. 1977 සිට අමාත්‍ය ධුර දරපු, අවස්ථා ගණනාවකදී අග්‍රාමාත්‍ය ධුරය දරපු, පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක ධුරය දරපු කෙනෙක්, එතුමා. තමන් පාපෝච්චාරණයක් කරනවා අය වැය ලේඛනයේ පූර්විකාව තුළ. "මෙහෙම සිද්ධ වුණා, මෙතැන වැරදුණා, අද මෙතැනට ඇවිල්ලා තිබෙනවා" කියනවා. හැබැයි, පාපෝච්චාරණයෙන් පසුව සැබැවින්ම තමන් ආපසු හැරී බැලීමේ යෝජනාවක් නැහැ. ඒ පාපෝච්චාරණයට තුඩු දුන් කරුණු මතම තමයි ඔහුගේ මුළු අය වැය ලේඛනය සකස් කර තිබෙන්නේ. ඒ නිසා මේ අය වැය ලේඛනයේ පළමුවැනි පරිච්ඡේදයේ පූර්විකාවට දෙවන පරිච්ඡේදයේ යෝජනා ප්‍රතිවිරුද්ධයි. ඇත්ත ගත්තොත්, රනිල් වික්‍රමසිංහ මුදල් අමාත්‍යවරයාගේ පාපෝච්චාරණයට එරෙහි යෝජනා හැටියට තමයි අය වැය ලේඛනයේ යෝජනා සඳහන් වෙලා තිබෙන්නේ.

දෙවැනි කරුණ තමයි නැවත විකිණීම. මේක අලුත් දෙයක් නොවෙයි. සමහර දේවල්වලදී රජය උපාය මාර්ගිකව, ආර්ථික සංවර්ධන සැලැස්මකට අනුව සියල්ලම කළ යුතුයි කියා අපි විශ්වාස කරන්නේ නැහැ. හැබැයි, රජය මේවා අත්හරින්න යෝජනා කරන්නේ ආර්ථික උපාය මාර්ගයකට අනුවද? හොඳට වාක්‍ය කියවන්න. එතුමා කියන්නේ, ශ්‍රීලන්කන් එයාර්ලයින්ස්, ශ්‍රී ලංකා ටෙලිකොම්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සහ ඊට අනුබද්ධ ආයතන, වෝටර්ස් එජ් හෝටලය, ගලදාරි හෝටලය, හිල්ටන් හෝටලය ඒ සියල්ල විකුණන්නේ විදෙස් සංචිත වැඩි කර ගැනීමේ අරමුණින් කියලායි. එහෙම නැතිව ආර්ථික උපාය මාර්ගයකට නොවෙයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආර්ථික උපාය මාර්ගයකට අනුව නම්, ඔවුන්ම යෝජනා කරන ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය දැන් පෞද්ගලීකරණ ක්‍රියාවලියට ගිහිල්ලා ඉවරයි. ඉතුරු කොටස් ටික විකුණන්නේ මොකටද? ඉතුරු කොටස් ටික විකුණන්නේ ආර්ථික උපාය මාර්ගයේ ප්‍රතිඵලයක් හැටියට නොවෙයි, විදෙස් සංචිත යම් ප්‍රමාණයක් උපාය ගැනීමට. ආර්ථිකය සමහර ධුරාවලින්ගෙන් අත්හැරීම සඳහා වන යෝජනාවක් නොවෙයි මේ. එතුමා ඉතා පැහැදිලිව සඳහන් කරනවා, මෙම ආයතන විකිණීමේ අපේක්ෂාව බවට පත් වී තිබෙන්නේ තමන්ගේ විදෙස් සංචිත වැඩි කර ගැනීමයි කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට මතක් වෙනවා පරණ හාමුලා හිටපු වලව්වලට සිදු වුණු සන්තෑසිය. ඒ වලව්ව ඉතා ප්‍රභාස්වරව තිබුණා. වලව්වේ හාමු ඉතා හොඳින් ඒක කළමනාකරණය කළා. නාස්තිකාර පුතෙක් හිටියා. නාස්තිකාර පුතා මොකද කරන්නේ? වලව්වේ සියල්ල ටිකෙන් ටික විකුණා ජීවත් වෙන්න පටන් ගත්තා. අන්න ඒ නාස්තිකාර පුතෙක් ප්‍රභාස්වරව තිබුණු වලව්වකට අත් කරපු ඉරණම තමයි මේ දිගු කාලයක් අපේ රටේ ජාතික සම්පත් විකිණීම හරහා සිදු කොට තිබෙන්නේ. ඉස්සෙල්ලාම අත තිබ්බේ අපේ පේෂ කර්මාන්තශාලාවලට. තුල්හිරිය, මත්තේගොඩ, පූගොඩ, වෙයන්ගොඩ රෙදි ජනපද තිබුණා. තාක්ෂණය ගත්තොත් දුර්වලයි. හැබැයි, අපට ඒවා වර්ධනය කර ගැනීම සඳහා සැලැස්මක් හදා ගත යුතුව තිබුණා. අපට ඒක කරගන්න බැරි වුණා. අපට ඇඹිලිපිටියේ, වාලච්චේන කඩදාසි කම්හල් තිබුණා. අපි කම්හල් ටික විකුණලා දැම්මා. ඊට පස්සේ කිව්වා, ආර්ථිකය එතැනින් ගොඩ එයි කියලා. හැබැයි, මොකක්ද වුණේ? ඒ කම්හල්වල තාක්ෂණය පැරණියි කියන එක අපි පිළිගන්නවා. ඇඹිලිපිටිය කම්හල 1960 දශකයේ ආරම්භ කළේ. ඒකෙන් නිෂ්පාදනය කළ කඩදාසිවල තීන්ත පැනින් ලිව්වොත් බොඳ වෙනවා. ඒක ඇත්ත. හැබැයි, තාක්ෂණය එකතු කරන්න තිබුණා. නමුත්, විකුණුවා. විකුණලා වහලා දැම්මා. මොකක්ද ප්‍රතිඵලය?

අපි හිඟුරාන සීනි ෆැක්ටරියට මොකක් ද කළේ? කන්තලේ සීනි ෆැක්ටරියට මොකක් ද කළේ? අපි ආර්ථික උපාය මාර්ග හැදුවේ කොහොමද? ක්‍රමානුකූලව අපේ රටේ තිබුණු ආර්ථිකය අපි අත්හැරියා. අත්හරින කොට කිව්වා, උපාය මාර්ගික ලෙස වැදගත් කියලා. එහෙම වැදගත්භාවයක් අත්පත් කරලා දුන්නේ නැහැ. දැනුත් මොකක් ද යෝජනා කරන්නේ? ඇයි මේ ලාභ ලබන ආයතන විකුණන්නේ කියලා අහන කොට, ආණ්ඩුව පැත්තෙන් අමාත්‍යවරයකු දීපු උත්තරය තමයි, "ලාභ ලබන ඒවා තමයි ගන්නේ" කියන එක. ඒකත් ඇත්ත නේ. මොනවා හරි දේපළක් විකුණන්න ඕනෑ ජීවත් වෙන්න. නාටු වුණු පොල්වත්තක් විකුණනවා කිව්වාට ගන්නේ නැහැ. සාරවත් පොල්වත්තක් විකුණන්න ඕනෑ. ඒක හරි. ඵලදාව තිබෙන, ආදායමක් තිබෙන, ආර්ථිකයට ශක්තිමත්භාවයක් දෙන ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව, ශ්‍රී ලංකා ටෙලිකොම් වැනි ආයතන විකුණන්න ඕනෑ. මොකද, ඒවා තමයි ගන්න එන්නේ. ඒ නිසා, මේ මොකක්ද කරන්න හදන්නේ? මේ නව ආර්ථික උපාය මාර්ගයක් නොවෙයි. 1977 සිට අනුගමනය කරන ලද විකුණා ගෙන කෑමේ ආර්ථික උපාය මාර්ගයේම දිගුවක් මේක.

මම දැක්කා, මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා කියනවා, ලාභ ලබන ආයතන විකිණීම ගැන එතුමාගේ ඒ තරම් කැමැත්තක් නැති බව. ඒක හරි. නමුත්, එතුමා කියපු දේ ගැන කියන්න මම දන්නේ නැහැ. මම ඒක ගැන පසුව කියන්නම්. එතුමා එහෙම කියනවා. හැබැයි, මා දන්නවා එතුමා හවසට ඇවිල්ලා අනිවාර්යයෙන්ම මේ අය වැයේ අද පැවැත්වෙන ඡන්ද විමසීමේදී පක්ෂව අත උස්සනවා කියන එක. එතකොට තමන් කියපු දේ සහ තමන්ගේ අත එසවීමයි අතර වෙනස්කමක් තිබෙනවා. ඒ නිසා මම නැවත නැවත කියනවා, මේ අනුගමනය කරමින් තිබෙන්නේ දිගුකාලීන ලෙස අනුගමනය කරපු ආර්ථික ප්‍රතිපත්තියමයි කියන

එක. මම හිතන විධියට මේ ආණ්ඩුවට එහෙම mandate එකක් නැහැ. මම පසුව පැහැදිලි කරන්නම්, ඒ ආර්ථික උපාය මාර්ගයට යන ආකාරය ගැන.

ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට අනුබද්ධවයි Lanka Hospitals තිබෙන්නේ. එතකොට ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විතරක් නොවෙයි, ඒකට අනුබද්ධ Lanka Hospitals තිබෙනවා; ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව විතරක් නෙවෙයි, ඒකට අනුබද්ධ ලිට්රෝ ගෑස් සමාගම තියෙනවා. ඉතින් මේ සියල්ල විකුණන්න යෝජනා කර තිබෙනවා. ඒ කුමක් වෙනුවෙන්ද? ආර්ථික උපාය මාර්ග වෙනුවෙන්ද? එහෙම නැත්නම් අපේ රටේ පෞද්ගලික අංශයේ දායකත්වය ආර්ථිකයට ලබා ගනිමින් ඒ ක්ෂේත්‍රය දියුණු කිරීම, වර්ධනය කිරීම් පිළිබඳ ඉලක්කයක්ද? එහෙම ඉලක්කයක් නොවෙයි, මෙතැන තිබෙන්නේ. මෙතැන තිබෙන්නේ අන් කවරක්වත් නොවෙයි, පැරණි වලව්වක නාස්තිකාර පුතෙක් ඒ වලව්වේ තිබුණු සියලු භවභෝග සම්පත් විකුණමින් ජීවත් වෙන කලාවේ ආර්ථික ප්‍රතිපත්තියයි මෙතැන තිබෙන්නේ. මේකට තමයි මේ ගමන් කරමින් තිබෙන්නේ.*[බාධා කිරීමක්]* ඔව්. ඒක තමයි මේ කරමින් තිබෙන්නේ. ඒ නිසා අපි කියන්නේ අන් කවරක්වත් නොවෙයි, මේ උපාය මාර්ගය වෙනස්විය යුතුව තිබෙනවා. අපේ රට පත්වී තිබෙන මේ ව්‍යසනයේ ප්‍රතිඵල මොනවාද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද අපේ කර්මාන්ත පද්ධතිය විශාල අනතුරකට මුහුණ දෙමින් තිබෙනවා. විශේෂයෙන් අපේ ඇඟලුම් කාර්මාන්තය. ඇඟලුම් කර්මාන්තය ගත්තොත්, 2022 ඔක්තෝබර් මාසයේ අපේ ඇඟලුම්වල ආදායම සියයට 14කින් අඩුවී තිබෙනවා. අද ලෝකයේ වෙළඳපොළ හැකිළෙමින් තිබෙනවා. සාමාන්‍යයෙන් ඇඟලුම් ක්ෂේත්‍රයට ඇණවුම් -orders- එනවා, මාස හයකට කලින්. දැන් ඇවිල්ලා තිබෙන ඇණවුම් අනුව ඔවුන්ට කියන්න පුළුවන්, එළඹෙන ජනවාරි මාසයේ ඉඳන් අප්‍රේල් මාසය දක්වා ලංකාවේ ඇඟලුම් ක්ෂේත්‍රයට ඇවිල්ලා තිබෙන ඇණවුම් ප්‍රමාණය සියයට 32කින් අඩු වෙලා තිබෙන බව. ලක්ෂ තුනහමාරකට ආසන්න ප්‍රමාණයක් රැකියාවේ යෙදෙනවා. තව වක්‍ර රැකියා විශාල ප්‍රමාණයක් තිබෙනවා. ඒ කර්මාන්ත අනතුරේ තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ඉදිකිරීම් කර්මාන්තයේ ලක්ෂ හයකට ආසන්න පිරිසක් සෘජු සහ වක්‍ර රැකියාවල යෙදෙනවා. අද ඉදිකිරීම් කර්මාන්තය කඩා වැටෙමින් තිබෙනවා. සේවකයන් 30, 40 වැඩ කරපු කර්මාන්තශාලා කඩා වැටෙමින් තිබෙනවා. ආණ්ඩු අනුගමනය කරපු ආර්ථික ප්‍රතිපත්තිය හා කරුණු කිහිපයක් මේකට බලපෑවා. එකක්, පොලී අනුපාත ඉහළ ගොස් තිබීමයි. පසුගිය බදාදා භාණ්ඩාගාර බිල්පත් නිකුත් කළ පොලී අනුපාතිකය කීයද? ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සියයට 33යි. සියයට 33 කියන්නේ සාමාන්‍ය අගය. මා දන්නවා, EPF, ETF දැම්මේ කීයටද කියන එක. EPF, ETF සාමාන්‍යයෙන් අඩු පොලී අනුපාතිකයට දානවා; හැබැයි, වැඩි අගයක් ගන්නවා. ඒ නිසා සමහර විට හිතෙනවා, භාණ්ඩාගාර බැඳුම්කරවල ඉහළම ගත්ත කණ්ඩායම සියයට 36 ඉක්මවා යන පොලී අනුපාතිකයක් ලබන්න ඕනෑ කියලා. මේකයි සිද්ධ වෙලා තිබෙන්නේ. ඉතින් ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ බැංකු පොලී අනුපාතික ඉහළ යෑම සාමාන්‍ය ජන ජීවිතයට විතරක් නොවෙයි, කර්මාන්ත පද්ධතිය තුළත් අර්බුදයක් හදලා තිබෙනවා. පොඩි නිෂ්පාදකයා තමන්ගේ සම්පූර්ණ ව්‍යාපාරික සැලැස්මම හදලා තිබුණේ තමන්ගේ මාසික වාරිකය මත. ඒ වාරිකය වැඩි වෙලා තිබෙනවා. ආකාර කිහිපයකින් එය වැඩිවී තිබෙනවා. එකක්, පොලී අනුපාතිකය ඉහළ යාම. දෙක, විදුලි බිල ඉහළ යාම. තුන, ඒ ගොල්ලන්ගේ වෙළඳපොළ හැකිළීම. මේ සාධක තුනම මත අද සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවා අර්බුදයකට පත් වෙමින් තිබෙනවා. නන්දලාල් වීරසිංහ මහත්මයා වැඩිපුර සැලකිල්ලට භාජන කරන්නේ කුමක්ද? නන්දලාල් මහත්මයාගේ වගකීම සහ එතුමා බලා ගන්න උත්සාහ කරමින් තිබෙන්නේ මහ බැංකුවේ ගිණුම්; මහ බැංකුවේ account එක. එතුමා මහ බැංකු account එක balance කරනවා. හැබැයි, මහ බැංකු account එක balance කිරීම හරහා රටේ සාමාන්‍ය ජන ජීවිතයට සිදුවෙමින් තිබෙන්නේ මොකක්ද? එතුමා කියනවා, ආර්ථිකය හැකිළීම තමයි මේකට තිබෙන උපාය මාර්ගය කියලා. මා ඒකෙන් කියන්නේ නැහැ, කබ්රාල්ගේ උපාය මාර්ගය හරි කියලා. කබ්රාල්ගේ උපාය මාර්ගයත් එක ආන්තිකත්වයක් නියෝජනය කරනවා; අද නන්දලාල් මහත්මයාගේ උපාය මාර්ගයත් තව ආන්තිකත්වයක් නියෝජනය කරනවා. මෙහි හරි තැන අප සොයා ගත යුතුව තිබෙනවා. ඔහු කියනවා, ආර්ථිකය හැකිළීම තමයි ඔවුන්ගේ උපාය මාර්ගය කියලා. රටේ මහ බැංකු අධිපතිවරයා අපේ රටේ ආර්ථිකය හැකිළීම පිළිබඳව ඉතාම සද්භාවයෙන් සහ වුවමනාවෙන් කථා කරනවා නම් මොකක්ද අපට ඉතිරි වෙන්නේ?

අපේ රටේ ආර්ථිකය හැකිළීම විසින් විශාල ප්‍රමාණයක් රැකියා අහිමිවීමේ අනතුරට මුහුණ දෙමින් සිටිනවා. ඔක්තෝබර් මාසයේ පළවෙනිදා සිට මේ බදු පැනවීම දරා ගන්න බැහැ. වැට් එක සියයට 8 සිට 15 දක්වා වැඩි කරන්න තමුන්නාන්සේලා යෝජනා කළා. සමාගම් ලාභය මත ගහන බද්ද සියයට 30 දක්වා වැඩි කළා; අපනයන ලාභ මත ගහන බදු සියයට 30 දක්වා වැඩි කරලා තිබෙනවා. ඒ වාගේම, සමාජ ආරක්ෂණ දායකත්ව බද්ද සියයට දෙකහමාරකින් වැඩි කරලා තිබෙනවා. උපයන විට ගෙවීමේ බද්ද වැඩි කර තිබෙනවා. වෘත්තීයවේදීන් විශාල ප්‍රමාණයකට ඒ බද්ද වැඩි කර තිබෙනවා. මේවා දරා ගන්න බැරි බව මතක තබා ගන්න.

අපේ රටේ ශ්‍රම බලකායෙන් සියයට 15යි ඉන්නේ, වෘත්තීමය ශ්‍රමිකයන් ලෙස. අපේ රටේ සියයට 85ක් ඉන්නේ පුහුණු, නුපුහුණු, අර්ධ පුහුණු ශ්‍රමිකයන් ලෙස. අපේ රටේ ශ්‍රම බලකායෙන් cream එක සියයට 15යි ඉන්නේ. මොකක්ද, සිදු වෙමින් තිබෙන්නේ? අද ඒ ගොල්ලෝ රට අත් හැර යනවා. හම්බන්තොට දිස්ත්‍රික්කයේ මා දන්නා කාරණයක් කියන්නම්. එහි ක්ෂේත්‍ර දෙකකට අදාළ විශේෂඥ වෛද්‍යවරයන් එක්කෙනෙකු බැගින් පමණයි සිටියේ. මට එම ක්ෂේත්‍ර දෙක මතක නැහැ. එක ක්ෂේත්‍රයකට සිටියේ එක් විශේෂඥ වෛද්‍යවරයෙක්. අනෙක් ක්ෂේත්‍රයට සිටියේත් එක් විශේෂඥ වෛද්‍යවරයෙක්. ඒ දෙදෙනාම ගියා, ලංකාව දාලා. මේකයි අද සිදු වී තිබෙන්නේ. උදාහරණයක් හැටියට, වෛද්‍යවරුන් 400කට වැඩි පිරිසක් ඊයේ වැඩට ආවා නම්, අද ඒ අය නොදන්වාම විදේශවලට ගිහින් තිබෙනවා. අද සීමාවාසික පුහුණුව ලබන දරුවන් පිරිසකුත් විදේශගත වෙලා සිටිනවා. අපේ රටේ වෛද්‍ය පීඨයෙන් එළියට ඇවිත් අවුරුද්දක සීමාවාසික පුහුණුව ලැබුවාට පසුව තමයි ලියාපදිංචි වෛද්‍යවරයෙකු හැටියට ශ්‍රී ලංකා වෛද්‍ය සභාව පිළිගන්නේ. අද සීමාවාසික පුහුණුවේ සිටින දරුවන් 24 දෙනෙක් මේ රටින් ගිහිල්ලා තිබෙනවා, 'වෛද්‍යවරයෙකු ලෙස පිළිගනිමින් ඔය ගොල්ලෝ දෙන සහතිකයවත් අවශ්‍ය නැහැ' කියලා. මොකක්ද, මේ සිදු වෙමින් තිබෙන්නේ? අපේ රට විශාල බුද්ධි ගලනයකට මුහුණ දෙමින් තිබෙනවා. අද වන විට පෞද්ගලික බැංකුවක ඉහළ කළමනාකාරිත්වයෙන් සියයට 50ක් විදේශගත වෙලා සිටිනවා. ඒක හොඳින් මතක තබාගන්න. අද මොකක්ද, සිදු වෙමින් තිබෙන්නේ?

අපේ රටේ ඉතා ඉහළ වෘත්තිකයන්හට යම් සාධාරණ වැටුප් තලයක පිහිටුවා සාධාරණ වැටුපක් ගෙවන්න ඕනෑ. ඒ ගොල්ලන් ලෝකයේ ඕනෑම රටක සුරක්ෂිත සමාජ ජීවිතයක් සහිතව ඉහළ වැටුප් තලයක ජීවත් වෙන්න පුළුවන් අය. යම් සාධාරණ, සුරක්ෂිත වැටුප් තලයක පිහිටුවීමෙන් විතරයි electrical engineer කෙනෙකු, මෘදුකාංග ඉංජිනේරුවෙකු, විශේෂඥ වෛද්‍යවරයෙකු, බැංකු කළමනාකරුවෙකු අපේ රටේ රඳවාගන්න පුළුවන්කම

[ගරු අනුර දිසානායක මහතා]

ලැබෙන්නේ. ඒ බුද්ධිමය ශ්‍රමයට වටිනාකමක් තිබෙනවා. නමුත්, අද මොකක්ද වෙලා තිබෙන්නේ? මේ උපයන විට ගෙවීමේ බද්ද - PAYE tax එක- හරහා වෘත්තිකයන් විශාල බුද්ධි ගලනයකට යොමු කර තිබෙනවා. මේ ගැන තමුන්නාන්සේලා අය වැය ලේඛනයෙන් ඉදිරිපත් කර තිබෙන අදහස මොකක්ද? ඒ විතරක් නොවෙයි. සාමාන්‍ය ජනතාවත් විශාල පීඩාවකට පත් වී තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔවුන්ට ආහාර නැහැ, බෙහෙත් නැහැ. බෙහෙත් නැතිව ඇඳේ වෙවුල වෙවුලා මිනිස්සු මියැදෙනවා. දරුවෝ ක්ලාන්ත වෙලා වැටෙනවා. දැන් සමාජ අර්බුදයක් නිර්මාණය වෙමින් තිබෙනවා. ආර්ථික තලයේ විතරක් නොවෙයි මේ ප්‍රශ්නය තිබෙන්නේ.

මේ පාර්ලිමේන්තුවේ හැම වෙලාවේම ධන, ඍණ ගැන කථා කරනවා; ගෙවුම් ශේෂ හිඟය ගැන කථා කරනවා; ආදායම් වියදම් ගැන කථා කරනවා; වෙළඳ ශේෂයේ තත්ත්වය ගැන කථා කරනවා. හැබැයි ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ දත්තවලට යටින් සමාජ ජීවිතයේ ඛේදවාචකයක් තිබෙනවා. දැන් මොකක්ද වෙන්න ඕනෑ? මේ සමාජ ජීවිතයේ අප කවුරුත් අත් විඳිමින් තිබෙන ඛේදවාචකය අපි කවුරුත් අපේ ඇස් ඉදිරි පිට අත් දකිමින් තිබෙනවා. දැන් අප කාටත් හඬ නඟා කියන්නේ මොකක්ද? මේ දිගු කාලයක් අනුගමනය කරන ලද ආර්ථික ප්‍රතිපත්තියත්, දිගු කාලයක් අනුගමනය කරන ලද දේශපාලන සංස්කෘතියත්, දිගු කාලයක් අනුගමනය කරන ලද සමාජ මනෝභාවයත් වෙනස් කරන්න ඕනෑ බවයි. අපේ රටට අලුත් පරිවර්තනයක් ඕනෑ. මේක,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

පොහොට්ටුවේ ආණ්ඩුවට ගිහිල්ලා මපට් කෙනෙකු වාගේ උඩින් හිටගන්නවා වැනි එකක් නොවෙයි. ඒවා මොන තරම් පහත් පරිවර්තනද? අපේ රටට අවශ්‍ය වන්නේ ආර්ථික දේහයේ පරිවර්තනයක්. අපේ රටට අවශ්‍ය වන්නේ මේ දේශපාලන සංස්කෘතියේ පරිවර්තනයක්. අපේ රටට අවශ්‍ය වන්නේ සමාජ මනෝභාවයේ පරිවර්තනයක්. අන්න ඒ පරිවර්තනය විතරයි මේ ඇති වී තිබෙන ඛේදවාචකයෙන් ගොඩ ඒම සඳහා තිබෙන මාවත. මම එකින් එකට කියන්නම්.

ජනතාවගේ කැමැත්ත සහිත පාලනයක් අවශ්‍යයි. ඒක පළමුවැන්න. අර්බුදයකින් - crisis එකකින් - ගොඩ එන්න බැහැ, අටවාගන්නා ලද පාලනයකට. මේ ජනතාවගේ mandate එක මොකක්ද? පොහොට්ටුවට තිබෙන mandate එක මොකක්ද? විකුණපු හම්බන්තොට වරාය බලයට ආ හැටියේ පවරාගන්නවා කියන එකට තමයි ජනතාවගේ mandate එක. හැබැයි, අය වැය යෝජනාව මොකක්ද? තිබෙන ඒවාත් විකුණන එක. එහෙම නම් මේ මොකක්ද වෙලා තිබෙන්නේ? පොහොට්ටුවට ලැබුණු mandate එක මොකක් වෙනුවෙන්ද? මහ බැංකු මහා වංචාවේ වංචනිකයන්ට දඬුවම් ලබා දීම. මහින්දානන්ද අලුත්ගමගේ මගේ මිත්‍රයාට මතක ඇති. රනිල් වික්‍රමසිංහ හිරේ දානකල් නින්ද යන්නේ නැහැ කියලා එතුමා පුවත් පතකට කියා තිබුණා, මම දැක්කා. දැන් නිදි ද දන්නේ නැහැ. ඊට පස්සේ මොකක්ද වුණේ? සිංගප්පූරුවට ගිහිල්ලා අර්ජුන මහේන්ද්‍රන්ව කනෙන් ඇදගෙන එනවා කියලා කිව්වා. *[බාධා කිරීමක්]* ඔව්, එහෙම කිව්වා. ගරු මන්ත්‍රීතුමනි, දැන් ඔබතුමාට මතක නැතිව ඇති, 2019 මැතිවරණ වේදිකාවේ කියපු දේවල්. මොකක්ද කළේ? එදා තමුන්නාන්සේලාට තිබුණු mandate එක මොකක්ද? ඒ වංචනිකයන්ට දඬුවම් දීමත්, විකුණන ලද දේපළ නැවත පවරා ගැනීමත් සඳහා තමයි මේ mandate එක ලැබිලා තිබෙන්නේ. මේ ජනවරම තිබෙන්නේ එතැන. හැබැයි, මේ ජනවරමට ප්‍රතිපක්ෂ නායකයෙකු තමුන්නාන්සේලා ජනාධිපති කරගන්නවා.

මෙවැනි අර්බුදයක් තිබෙන වෙලාවක ජනතාවගේ කැමැත්තෙන් යුතු පාලනයක් ගොඩනඟා ගැනීම පළමු සාධකයයි. අපි දන්නවා, මේ අර්බුදයෙන් ගොඩ එන්න නම් තීරණාත්මක තීන්දු තීරණ ගණනාවකට යන්න ඕනෑ බව. අපේ බදු ප්‍රතිපත්තියේ සංශෝධන අවශ්‍ය වෙනවා. ජනතාව යම් දරාගැනීමකට ලක් කරන්න වෙනවා. ජනතාව යම් කැප කිරීමකට ලක් කරන්න වෙනවා. හැබැයි, එය කළ හැකි වන්නේ කාටද? එය කළ හැකි වන්නේ නව ජනවරමක් සහිත ආණ්ඩුවකටයි.

අපි යෝජනා කීපයක් ඉදිරිපත් කරනවා. පළමුවැනි එක, වහාම මැතිවරණයක් පවත්වා මේ අර්බුදයෙන් රට ගොඩ ගැනීම සඳහා ජනතාව විශ්වාස කරන පාලනයක් ගොඩනඟා ගැනීමට අවස්ථාව දිය යුතුයි කියන එක. අන්න ඒ පාලනයට ජනතාව අවුරුද්දක, දෙකක කාල පරිච්ඡේදයක් ලබා දෙනවා. ඒ කාල පරිච්ඡේදය තුළ තමයි මේ අර්බුදයෙන් ගොඩ එන්න පුළුවන්කම ලැබෙන්නේ. මේ විනාශයට ලක් කරන ලද, මේ අර්බුදය ඇති කරන ලද, මේ අර්බුදයට එරෙහි වන ජනවරමක් තිබුණු කණ්ඩායමක් විසින් පාලනය කරන ආණ්ඩුවකට මේ අර්බුදයෙන් ගොඩ එන්න බැහැ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. පළමු අවශ්‍යතාව, ජන වරමක් සහිත ආණ්ඩුවක්. දෙවැන්න? මේ අර්බුදයට හේතු වන ආර්ථික සාධක විතරක් නොවෙයි, තවත් සාධක ගොඩක් තිබෙනවා. ඒවා විසඳීම සඳහා වන පදනම අපි හදාගන්න ඕනෑ.

අපට අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඕනෑ. ඒක, දෙවන අවශ්‍යතාව. මේ විධායක ජනාධිපති ධුරය අහෝසි වන, අමාත්‍ය ධුර සීමා හදන, අමාත්‍ය ධුරවල විෂයයන් නිසි පරිදි බෙදා වෙන් කරන, සිංහල, දෙමළ, මුස්ලිම් කියන සියලු ජනතාවගේ සාධාරණ අයිතීන් නියෝජනය වන, සියලු දෙනා අතර ගැටුම් අවම කිරීම සඳහා අවශ්‍ය වන නීති ප්‍රතිපාදන ශක්තිමත් වන, ජනතාවගේ මූලික අයිතිවාසිකම් තහවුරු වන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඕනෑ.

තුන්වනුව, අපේ රටේ මේ රාජ්‍ය යන්ත්‍රණය කාර්යක්ෂම කරන්න ඕනෑකම තිබෙනවා. අපේ රාජ්‍ය යන්ත්‍රණය පිළිබඳව විශාල විවේචනයක් තිබෙනවා. ඒක ඇත්ත. මා කලින් කිව්වා වාගේ, 2021 වසරේ භාණ්ඩාගාරයට ආපු රුපියලකින් ශත 58ක් වැය කර තිබෙන්නේ රාජ්‍ය සේවක වැටුප් සහ විශ්‍රාම වැටුප්වලට. විශාල රාජ්‍ය සේවයක් තිබෙනවා. මේ රාජ්‍ය සේවය ලොකු වුණේ කොහොමද? රාජ්‍යයේ අවශ්‍යතා මත නොවෙයි. අප ඒ ඒ ආයතනයට ගිහින් බැලුවොත් සොයාගන්න පුළුවන්, ඒ ඒ ආයතනය භාරව හිටපු ඇමති කුමන ප්‍රදේශයේ කෙනෙක්ද කියලා. වරායට ගිහිල්ලා එහි සිටින සේවකයන්ගේ පදිංචිය සොයා බැලුවොත් පෙනෙනවා, මාතර නියෝජනය කරන කෙනෙක් වරාය ඇමති ලෙස ඉඳලා තිබෙන බව. අප අධ්‍යාපන අමාත්‍යාංශයට ගිහිල්ලා ඒ සේවකයන්ගේ පදිංචිය කොහේද කියා සොයා බැලුවොත් පෙනෙනවා, කුලියාපිටියේ කෙනෙක් අධ්‍යාපන ඇමති ලෙස ඉඳලා තිබෙන බව. මේකයි ඇත්ත කථාව. හරිද? මේ රාජ්‍ය ආයතන මොකක්ද කර තිබෙන්නේ? විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ගිහිල්ලා ඒ සේවකයන්ගේ පදිංචිය කොහේද කියා සොයා බැලුවොත් පෙනෙනවා, ඒ ආයතනය භාරව රත්නපුරයේ කෙනෙක් ඇමතිවරයා හැටියට ඉඳලා තිබෙන බව. මේකයි ඇත්ත කථාව. මොකක්ද, මේ වෙලා තිබෙන්නේ?

තමුන්නාන්සේලා ඡන්දය කාලයේ එක වෙලාවක application forms බෙදුවා. රස්සා දෙන්න ඡන්දය කාලයේ application forms බෙදපු මිනිස්සු, මේ. ඒ විධියට මොකක්ද කළේ? අපේ රාජ්‍ය

සේවය පතුලෙන් පළල් කළා; අකාර්යක්ෂම කළා. සමහර ආයතනවල තිබෙන HR Division එක ලොකුයි, ඒ ආයතනයේ අනෙක් කාර්යයන් ඉටු කරන කාර්ය මණ්ඩලවලට වඩා. ඒ, එම ආයතනයට බඳවාගත් කණ්ඩායම පරිපාලනය කරන්න තිබෙන ඒකකය. ජාතික නිවාස සංවර්ධන අධිකාරියට 3,000ක් පිරෙව්වා, සජිත් ප්‍රේමදාස මහත්මයා. 3,000ක් පිරෙව්වා! ඔබතුමන්ලාට මතක ඇති. අන්තිමට ඒ ගොල්ලන් අයින් කළා. දැන් ඒ ගොල්ලන්ට රස්සාවත් නැහැ. ඒ ගොල්ලන්ගේ දරුවන්ට අනාගතයක් නැහැ. මෙහෙම රටක් පාලනය කරන්න පුළුවන්ද? ඒ ආකාරයට අපේ රාජ්‍ය සේවය අකාර්යක්ෂමතාවට පත් කළා.

මේ අය වැය ලේඛනයෙන් රනිල් වික්‍රමසිංහ මහත්මයා යෝජනා කරනවා, රාජ්‍ය සේවයට තවත් ආයතන දෙකක් හදන්න. මම දන්නේ නැහැ, ඇයි කියලා. අපේ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව තිබෙනවා. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ කුරුඳු වගාව පිළිබඳ අංශයක් තිබෙනවා. ඒ තුළින් කුරුඳු වගාව පිළිබඳව ඕනෑ තරම් පර්යේෂණ කර තිබෙනවා; ඕනෑ තරම් පත්‍රිකා ඉදිරිපත් කර තිබෙනවා. ඉතින්, දැන් මොකටද, අධිකාරියක් හදන්නේ? මම දන්නේ නැහැ, මේවා කරන්නේ මොකටද කියලා.

රාජ්‍ය සේවය කාර්යක්ෂම කරන්න ඕනෑ. හැබැයි, ඒ වෙනුවෙන් මේ සිටින අය එකවර නෙරපන්න ඕනෑ කියලා මම හිතන්නේ නැහැ. එහෙම නෙරපන්න බැහැ. කොයි ආණ්ඩුවෙන් කවර කාලයේ මොන වුවමනාව වෙනුවෙන් ගත්තත්, අද ඒ ගොල්ලන්ගේ ජීවිත ගැට ගැහෙන්නේ ඒ රස්සාව නිසා. ඒ වැටුපෙන් තමයි ඔවුන් තමන්ගේ දරුවන්ට උගන්වන්නේ; ඒ අය ජීවත් වෙන්නේ; ඒ වැටුපෙන් තමයි ඔවුන්ගේ අම්මාට තාත්තාට බෙහෙත් අරගෙන දෙන්නේ. ඒ නිසා සේවකයන් එහෙම අයින් කරන්න බැහැ. අපි සැලසුමක් හැදිය යුතුව තිබෙනවා.

විගණකාධිපතිතුමා කෝප් එකේදී කරුණක් ඉදිරිපත් කළා. එතුමා අවුරුද්දකට විගණනය කරනවා කිව්වා, රාජ්‍ය ආයතන 2,200ක්. අපේ ආයතන විශාල ප්‍රමාණයක් තිබෙනවා, එකම කාර්යය කෙරෙන. ඒ නිසා අපේ රටේ මේ රාජ්‍ය සේවය යළි ප්‍රතිව්‍යුහගත කිරීමට ලක් කළ යුතුව තිබෙනවා. මා කියන්නේ සේවය අත් හරින්න කියන එක නොවෙයි. රාජ්‍ය සේවය කාර්යක්ෂම කරන එකයි, සේවය අත් හරින එකයි, දෙකක්. ඔබතුමන්ලා යෝජනා කරන්නේ සේවය අත් හරින්න. "අධ්‍යාපනය විකුණමු" කියනවා. එය, සේවය අත් හැරීමක්. "සෞඛ්‍ය විකුණමු" කියනවා. එයත්, සේවය අත් හැරීමක්. අප යෝජනා කරන්නේ සේවය අත් හැරීමක් නොවෙයි. අප යෝජනා කරන්නේ රාජ්‍යයෙන් ජනතාවට විය යුතු සේවාව වඩාත් කාර්යක්ෂම කරගැනීම සඳහා අවශ්‍ය වන තාක්ෂණය සහ ඉහළ කළමනාකාරිත්වය සහිත වැදගත් මෙහෙයුමක් අවශ්‍යයි බවයි. ඒ නිසා අපි මේ රාජ්‍ය යන්ත්‍රණය හැකිළිය යුතුව තිබෙනවා. එහෙම නැතුව මේ රාජ්‍ය යන්ත්‍රණයට ඉදිරියට යන්න බැහැ; එය නඩත්තු කරන්නත් බැහැ; කළමනාකරණය කරන්නත් බැහැ.

ප්‍රාදේශීය ලේකම් කාර්යාලයක් කළමනාකරණය කරන්න පුළුවන්ද? එහි දොරෙන් ඇතුළු වුණාම ප්‍රාදේශීය ලේකම්තුමා හම්බ වෙන්න නිකම් දාම් පෙතේ යනවා වාගේ යන්න ඕනෑ. හැම තැනම සේවකයෝ පුරවලා. ග්‍රාම නිලධාරි වසම්වල නිලධාරින් කීදෙනෙක් ඉන්නවාද? ඉස්සර, ගම් දුප්පත් කාලයේ, ගම්වල ප්‍රශ්න තිබුණු කාලයේ, උප්පැන්න සහතිකයක් ගන්න ජනතාවගේ පෙලඹීමක් නැති කාලයේ, කසාද බඳින්නේ නැතුව, කසාද සහතිකයක් නැතුව එකට ජීවත් වුණු කාලයේ එක ග්‍රාම නිලධාරි මහත්මයෙක් එම කාර්යයන් ඔක්කෝම කළා. අද ගමකට නිලධාරින් කී දෙනෙක් ඉන්නවාද? මේ ඔක්කෝම දේශපාලනය විසින් ඇති කළේ. ඒ නිසා අපේ රට ගොඩ නහන්න නම්, පළමුව අලුත් ජනවරමක් අවශ්‍යයි; දෙවනුව, නව ව්‍යවස්ථාවක් අවශ්‍යයි; තුන්වනුව, කාර්යක්ෂම රාජ්‍ය සේවයක් අවශ්‍යයි; හතරවනුව, වංචා දූෂණ වැළැක්වීම කළ යුතුයි.

රනිල් වික්‍රමසිංහ මහත්මයා කියනවා, වංචා, දූෂණ නතර කිරීම ප්‍රවාදයක්, වංචා, දූෂණවලට දඬුවම් දීම ප්‍රවාදයක් කියලා. එතුමා ඒක කියන්නේ නැතුව මොකක්ද කියන්න ඕනෑ? එතුමාට කියන්න පුළුවන්ද, වංචා දූෂණ කළ අයට දඬුවම් දෙනවා කියලා? එතුමාට ඒක කියන්න බැහැ. ඒ ගැන කියනවා නම්, තමාම ස්වේච්ඡාවෙන් වැලිකඩ බන්ධනාගාරයට ගිහිල්ලා ජම්පරයක් ඇඳගෙන කූඩුව අස්සට ගිහිල්ලා කියන්න ඕනෑ, "මහ බැංකුවේ වංචනිකයා වන මට ම'විසින් දඬුවම් ලබා දෙන ලදී. අනෙක් අයටත් දඬුවම් ලබා දෙන්න මා විසින් තීරණය කරන ලදී" කියලා. ඕක නේ, එතුමා කියන්න ඕනෑ. එහෙම නැත්නම් කොහොමද, වංචා දූෂණ කළ අයට දඬුවම් දෙනවා කියලා කියන්නේ? ඔයගොල්ලන්ම නේ, එදා ඒ වංචාව ගැන කිව්වේ. මොකක්ද, බන්දුල ගුණවර්ධන ඇමතිතුමා කිව්වේ? ඒ මහ බැංකු බැඳුම්කරය අවුරුදු 30කට නිකුත් කළේ, ඒ නිසා පොලී අනුපාතය සියයට දෙකකින් වැඩි වුණා, අවුරුදු 30ක්, ඒ කියන්නේ 2015 පෙබරවාරි මාසයේ 28වන දා සිට 2045 පෙබරවාරි මාසයේ 28වන දා දක්වා අපේ බැංකු පොලී අනුපාතිකයට මේ වංචාව නිසා විශාල බලපෑමක් ඇති කරනවා කිව්වා.

ඒක අපේ රටේ නිෂ්පාදන පිරිවැය ඉහළ යන්න බලපානවා, අපේ රටේ සාමාන්‍ය කෙනෙක් නිවාසයක් හදනවා නම් ඒ නිවාස වාරිකයේ මිල ඉහළ යනවා, ඒ නිසා මේකට දඬුවම් දිය යුතුයි කියලා කිව්වා. මේක තමයි ලංකාවේ සිද්ධ වෙච්ච මහා අපරාධය කියලාත් කිව්වා. හැබැයි, දැන් ජනාධිපතිතුමා මොකක්ද කියන්නේ? "වංචා දූෂණ නතර කිරීම යනු ප්‍රවාදයකි" කියලා එතුමා කියනවා. එතුමාට ප්‍රවාදයක් කියලා නැතිව වෙන දෙයක් කියන්න බැහැ නේ. ඒක යථාර්ථයක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වංචා, දූෂණ කියන්නේ ඒ වෙලාවේ ගන්න commission එක නොවෙයි. ඒකත් අපරාධයක්. හැබැයි, ඒ වංචා, දූෂණ විසින් ඇති කරන ලද ව්‍යාපෘතිය දිගු කාලීනව අපට හානි කරනවා. ඒ කොමිස් එක මත තමයි ඒ ව්‍යාපෘතිය තීරණය වෙන්නේ. මා දන්නා මේ සමහර අය ෆයිල් එක අත්සන් කරන්නේ නැහැ, commission එක තමන්ගේ බැංකු ගිණුමට ලැබුණු බවට බැංකුවෙන් SMS එක එනකල්. තායිසෙයි සමාගම ඉහළ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා අනුව ගිහිල්ලා හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට පැමිණිලි කළා, තායිසෙයි සමාගමෙන්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

රුපියල් මිලියන 200ක් ඉල්ලුවා කියලා. ඒ නිසා තමයි ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ඔහුට අයින් වෙන්න කිව්වේ. ලංකාවේ වංචා, දූෂණ පිළිබඳව gossips තිබෙනවා. අපි පාර්ලිමේන්තුවේ ඒ ගැන කථා කරලා තිබෙනවා. හැබැයි, කාටවත් අයින් වෙන්න කිව්වේ නැහැ. ඇයි, ගෝඨාභය රාජපක්ෂ ඔහුට අයින් වෙන්න කිව්වේ? එහෙම කිව්වේ වෙන හේතුවක් නිසා නොවෙයි, ඒක රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවක් ඔස්සේ ලැබුණු තොරතුරක් නිසායි. ඊට පස්සේ රනිල් වික්‍රමසිංහ මහත්මයා ආවාම, කුසලා සරෝජිනීගේ මහත්මියගේ ප්‍රධානත්වයෙන් කමිටුවක් පත් කළා, ඒ ගැන හොයන්න. ඊට පස්සේ මොකද වුණේ? මට මතකයි, ඒ කමිටුව පත් කරනකොට රනිල් වික්‍රමසිංහ මහත්මයා කිව්වා,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කුසලා සරෝජිනී මහත්මියව ඒකට පත් කරන්න කියලා ඉල්ලනවා කියලා. ඔන්න, ඇත්ත කථාව. එහෙම තමයි ඒ කමිටුව

[ගරු අනුර දිසානායක මහතා]

පත් කළේ. එහෙම කමිටුවක් පත් කරලා මොකක්ද කළේ? ඊට පස්සේ, කුසලා මහත්මියගේ කමිටුව කියනවා, "එහෙම පැමිණිල්ලක් නැහැ" කියලා. ජපානය රාජ්‍ය තාන්ත්‍රික ලෙස ජනාධිපතිවරයාට ඉදිරිපත් කරපු පැමිණිල්ල ගැන කුසලා මහත්මියට කියනවාද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඒ නම සඳහන් කරන්න එපා. *[බාධා කිරීමක්]*

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
නඩු ද? වෙන මොකක් හරි කියන්නද? *[බාධා කිරීමක්]* ඒ නම අයින් කරන්න. වෙන නමක්,- *[බාධා කිරීමක්]*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, එතුමියගේ නම නොවෙයි. මම කිව්වේ, ඇමතිතුමාගේ නම කියන්න එපා කියලා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
ඒකට මොකක්ද මම කියන්නේ? *[බාධා කිරීමක්]* ඒ නම අයින් කරන්න. *[බාධා කිරීමක්]* නම් ගොඩක් මතක් වෙනවා, මට. ඒක ඊට වඩා හොඳ නැති වෙයි කියලා මම හිතනවා. *[බාධා කිරීමක්]* ඊට පස්සේ මොකක්ද වුණේ? කමිටුවෙන් ඔහුව නිදහස් කරනවා. ඊට පස්සේ මොකක්ද වුණේ? ඊට පස්සේ තායිසෙයි සමාගම අපේ රටින් යනවා. ඒ සමාගම commission එක නොදීම හේතුකොට ගෙන මොකක්ද වෙලා තිබෙන්නේ? අද ගුවන් තොටුපොළට ගිහින් බලන්න. භාගෙට ඉදිකිරීම්; පාරවල් වහලා, තහඩු ගහලා, වැටවල් ගහලා, සිමෙන්ති කඩා වැටෙනවා, එතැන සේවකයන් අනතුරේ. ඇයි, මේ? කප්පම් ඉල්ලීම. මේක අපේ රටේ ආර්ථිකයේ ප්‍රධාන ව්‍යසනයක් නොවෙයිද? රනිල් වික්‍රමසිංහ මහත්මයා ඒක සැහැල්ලුවෙන් ගන්නේ කොහොමද? අපේ රට ගොඩ නඟන්න නම්, මේ වංචා, දූෂණ නතර කළ යුතුයි. වංචනිකයන්ට, දූෂිතයන්ට දඬුවම් ලබා දිය යුතුයි. දඬුවම් ලබා දීම විතරක් නොවෙයි, රනිල් වික්‍රමසිංහ මහත්මයා මේ ගරු සභාවේ හිටියා නම් මම එතුමාගෙන් මේ කාරණයත් අහනවා. ඩුබායි රටේ බැංකුවක ඩොලර් බිලියනයක මුදල් තිබෙනවා කියලා, එතුමා වැලිඅමුණ, දිල්රුක්ෂි ඩයස් සහ රවි විද්‍යාලංකාරව යැව්වේ නැද්ද, ඩුබායිවලට පරීක්ෂා කරන්න. යැව්වේ නැද්ද කියන්න? ඒ ඩොලර් බිලියනය කාගේද? දැන් මෙතුමා ඇවිල්ලා කියනවා, "වංචා දූෂණ නතර කිරීම යනු හිතලුවකි, ප්‍රවාදයකි" කියලා. වංචනිකයන්, දූෂිතයන් කණ්ඩායමකගේ ඔටුන්න අරගෙන එතුමාට කියන්න බැහැ, වංචා, දූෂණ නතර කරනවා කියලා. මේ රට හදනවා නම් වංචා, දූෂණ නතර කිරීම සහ වංචනිකයන්ට, දූෂිතයන්ට දඬුවම් දීම ප්‍රධාන සාධකයක්.

ඊළඟට රාජ්‍ය තාන්ත්‍රික සබඳතා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලෝකයේ කිසිදු රටකට තවදුරටත් හුදකලාව ජීවත් වෙන්න බැහැ. ලෝකයේ රටවල් අතර සබඳතා තිබෙන්න ඕනෑ. වෙළෙඳ පොළ ගනුදෙනු තිබෙනවා, තාක්ෂණික ගනුදෙනු තිබෙනවා, අනෙකුත් රාජ්‍ය තාන්ත්‍රික ගනුදෙනු තිබෙනවා. ලෝකයේ කවර හෝ රටක් මේ වෙලාවේ හුදකලාව තනිවම ජීවත් වෙන්න ඕනෑ කියලා කවුරුන් හෝ කල්පනා කරනවා නම්, ඒක අයිති වෙන්නේ පුරාතන යුගයට. වර්තමාන යුගය ලෝකයත් එක්ක ඉස්සරහට යන්න ඕනෑ. ලෝකයත් එක්ක ඉස්සරහාට යනකොට ප්‍රධාන වශයෙන්ම බලපාන්නේ මොකක්ද? සමහර අය හිතනවා, සුද්දෝ හඳුනනවා නම් ලෝකයත් එක්ක ඉස්සරහට යන්න පුළුවන් කියලා. දැන් සමාජ මතයක් හදනවා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා විදේශිකයන් හඳුනන නිසා එතුමාට විදෙස් සබඳතා ඇති කරගන්න පුළුවන්කම තිබෙනවා කියලා. විදෙස් සබඳතා කියන්නේ සුද්දෝ හඳුනන එක නොවෙයි. විදෙස් සබඳතා කියන්නේ ඒ රටත්, ඒ රටේ රාජ්‍යයත් මොන තරම් කීර්තිමත් රටක් ද; ලෝකය ඉස්සරහා මොන තරම් සාර්ථක ප්‍රතිරූපයක් තිබෙන රටක් ද කියන එකයි වැදගත්. ඒ රටේ ප්‍රතිරූපය තමයි, ඒ රට අනෙකා ගරු කරනවාද, අනෙකා පැමිණෙනවාද කියලා තීරණය කරන එක. එහෙම නැතිව ජනාධිපතිවරයා සුද්දෝ හඳුනන එක නොවෙයි. මම දන්නේ නැහැ, එතුමා හඳුනනවා කියනවා. සුද්දෝ හඳුනනවාද දන්නේත් නැහැ. එතුමා නේ කියන්නේ. එතුමා, "මං හඳුනනවා" කිව්වාට සුද්දෝ කියනවාද දන්නේ නැහැ, "හඳුනන්නේ නැහැ" කියලා. අපි දන්නේ නැහැ, ඉතින්. හැබැයි, සුද්දෝ හඳුනනවා කියන එක රාජ්‍ය තාන්ත්‍රික සබඳතා නොවෙයි. සුද්දෙක් හඳුනනවා නම්, ඔබතුමා ලන්ඩන් ගිය වෙලාවක dinner එකට එක්ක ගෙන යයි. හැබැයි, එතැනින් රාජ්‍ය තාන්ත්‍රික සබඳතා හැදෙන්නේ නැහැ. රාජ්‍ය තාන්ත්‍රික සබඳතා හදන්නේ කොහොමද? බංග්ලාදේශයේ අගමැතිතුමිය මොකක්ද කියන්නේ? ඒ අය අපට දුන්නා, ඩොලර් මිලියන 200ක අත මාරු ණයක්.

හැබැයි, අපට ඒක නිසි පරිදි ගෙවන්න බැරි වුණා. ආයෙත් පොලිය වැඩි කළා. පසුගිය අප්‍රේල්වල දුන්නා, ඊට පස්සේ ඔක්තෝබර් දක්වා වැඩි කළා. නැවත මාස හයකින් වැඩි කළා. දැන් එතුමිය මොකක්ද කියන්නේ? දැන් එතුමිය කියනවා, "ආයෙත් නම් අපි මේ මුදල වැඩි කරන්නේ නැහැ, කරුණාකරලා අපිට අදාළ දිනයට දෙන්න" කියලා. ඔන්න! රාජ්‍ය තාන්ත්‍රික සබඳතා. මේවා ගනුදෙනු. ගනුදෙනු කරන්න නම්, ඒ රට ආර්ථික වශයෙන් මොන තරම් ශක්තිමත් ද, ඒ රටේ කීර්තිය මොන තරම් උසස් ද කියන සාධකය වැදගත් වෙනවා. මේ ගරු සභාවේ සිටින කවුරුන් හෝ මන්ත්‍රීවරයෙකුට කොහේ හෝ රටකට යන්න හිතුණොත් මොකක්ද ඒ රට ගැන ඇඳෙන චිත්‍රය? ඒ රට පිළිබඳව තමන්ගේ ඔළුවේ ඇඳිලා තිබෙන ප්‍රතිරූපය තමයි වැදගත් වන්නේ. කාට හරි හිතෙනවාද, සැම්බියාවට යන්න? කාට හරි හිතෙනවාද, සෝමාලියාවට යන්න? එහෙම හිතෙන්නේ නැහැ. අධ්‍යයන කටයුත්තකට නම් යාවි. හැබැයි, රටකට යන්න මොකක්ද වැදගත් වන්නේ? ඒ රටේ කීර්තිය වැදගත්. අපේ රටේ කීර්තිය මොකක්ද? ලෝකයේ කොතැනක හෝ වංචා, දූෂණයක් පිළිබඳ එළියට එනවා නම්, ලංකාවේ කවුරුන් හෝ ඒ සම්බන්ධව අහුවෙනවා. ඇමෙරිකා එක්සත් ජනපදයේ CIA සංවිධානයේ ඉමාන් සුබේරු අවුරුදු 12කට හිරේ යැව්වා. පරීක්ෂණවලින් හෙළිදරව් වුණා, අජිත් නිවාඩ් කබ්රාල් ඩොලර් මිලියන 6ක් ඉමාන් සුබේරුට දීලා තිබෙනවා කියලා. ප්‍රංශයත්, එංගලන්තයත්, ඇමෙරිකාවත් එකතු වෙලා ප්‍රංශ එයාර් බස් සමාගම ගැන පරීක්ෂණයක් කළා. ඒ පරීක්ෂණයේ දී හෙළිදරව් වුණා, ප්‍රංශ එයාර් බස් සමාගමෙන් එයාර් බස් මිලදී ගන්න කොට ශ්‍රීලන්කන් එයාර්ලයින්ස් සමාගමේ හිටපු ප්‍රධාන විධායක නිලධාරි සී.ඊ. කපිල චන්ද්‍රසේන මහතාට කප්පම් දීලා කියලා. ලංකාව තිබෙන්නේ කොතැනද? මෑතක දී ඕස්ට්‍රේලියාවේ companies දෙකක අධ්‍යක්ෂවරුන් දෙදෙනෙකු අත් අඩංගුවට ගත්තා. ඒ, වෛද්‍ය උපකරණ සපයන සමාගම් දෙකක්. එම අධ්‍යක්ෂවරුන් අත් අඩංගුවට ගත්තේ මොකටද? හම්බන්තොට වරාය ඉදිකිරීමේ දී කප්පම් දීලා. ලෝකයේ කොතැනක හෝ හොරෙක් අහුවුණොත්, මෙන්න ලංකාවේ කෙනෙක් මුල් පුටුවේ ඉන්නවා. ලෝකයේ කවුද මේ රට ගැන සලකන්නේ? මෙහෙම රටක් එක්ක රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඇති වෙනවා ද? Pandora Papers එළියට එනකොට ඒකට සම්බන්ධ වෙලා සිටියේ නිරූපමා රාජපක්ෂ මහත්මියයි. ඊට කලින් ඒ වාගේ

papers එළියට එනකොට ඒකට සම්බන්ධ වෙලා සිටියා ඇමතිවරුන්ගේ ඥාතීන්, යාළුවෝ. මේකයි සිදු වෙලා තිබෙන්නේ. අපරාධයක් පිළිබඳව හෝ වංචා, දූෂණයන් පිළිබඳව සාකච්ඡා වෙන්නේ ලෝකයේ කොතැනද, ඒ සාකච්ඡාවේ කොතැනක හෝ ලංකාව ගැන ලියැවෙනවා. ඒ නිසා කවුද, මේ ලංකාවට ගරු කරන්නේ? කවුද, මේ ලංකාව පිළිබඳව විශ්වාස කරන්නේ? මොකක්ද, අපට ලෝකයේ තිබෙන ප්‍රතිරූපය? එක්සත් ජනපදයේ සෙනෙට් මණ්ඩලයේ විදේශ සබඳතා පිළිබඳ කමිටුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ලියුමක් ලියුවා. ඉතින්, මොකක්ද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියන්නේ? ජාත්‍යන්තර මූල්‍ය අරමුදල කියනවා, "ලංකාවට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ණයක් දෙනවා නම්, හොරකම් නතර කිරීම සඳහා යන්ත්‍රණයක් හදන්න ඕනෑ" කියලා. ඔන්න! ලෝකයේ අපි ගැන තිබෙන කථාව. ලෝක බැංකුව මොකක්ද කිව්වේ? "පොහොර ගෙන්වීම සඳහා ණයක් දෙනවා" කිව්වා. හැබැයි, ඒ ගොල්ලෝ ණය දෙන ගමන් මොකක්ද කිව්වේ? "ඔය ගොල්ලෝ හොරකම් කරනවා ද කියලා බලන්න කට්ටියක් එවනවා" කිව්වා. මොනවාද මේ වෙන්නේ? මෙවැනි රටකද ජාත්‍යන්තර ප්‍රතිරූප හැදෙන්නේ? ජාත්‍යන්තර ප්‍රතිරූප හැදෙන්න, ඒ රටේ රාජ්‍ය පාලනයේ තිබෙන විනිවිදභාවය වැදගත්. හැබැයි, අපට අද විනිවිදභාවයෙන් යුත් රාජ්‍ය යන්ත්‍රණයක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ කාන්තාවන්ගේ අයිතිවාසිකම් මොන තරම් ප්‍රමාණයකට ආරක්ෂා කරන්න අපි සූදානම්ද? ඒක වැදගත්. "පොදු ප්‍රවාහන සේවය පාවිච්චි කරන කාන්තාවන්ගෙන් සියයට 75ක් එක් වරක් හෝ කවර පන්නයේ හෝ ලිංගික අඩන්තේට්ටම්වලට ලක් වී තිබෙනවා" කියලා අද වාර්තාවක් පළ වෙලා තිබුණා, මම දැක්කා. කාන්තාවකට එහෙම අනාරක්ෂිත රටක් කොතැනද පිළිගන්නේ? ළමා ආරක්ෂණය කඩා වැටුණු රටක් කොතැනද පිළිගන්නේ? ඒ නිසා රාජ්‍ය තාන්ත්‍රික සබඳතාවලට ඒ රටේ ප්‍රතිරූපය වැදගත් වෙනවා. අද අපට තිබෙන්නේ මොකක්ද? කළු ප්‍රතිරූපයක්. ලෝකය ඉස්සරහ තිබෙන්නේ කළු ප්‍රතිරූපයක්. රාජ්‍ය තාන්ත්‍රික සබඳතා කියලා කියන්නේ, සුද්දෝ හඳුනන එක නොවෙයි. ඒ රට ආර්ථික වශයෙන් කොච්චර ශක්තිමත්ද, ඒ රටේ රාජ්‍ය පාලනය කොච්චර විනිවිදභාවයෙන් යුතුද, ඒ රටේ ජනතා අයිතිවාසිකම් මොන තරම් තහවුරු වෙනවාද කියන කාරණා තමයි වැදගත් වෙන්නේ. මුස්ලිම් ජනයාට එරෙහිව ආණ්ඩු හදනවා නම් කවුද මේ රට පිළිගන්නේ? වඳ කොත්තු, වඳ දොස්තරලා, වඳ ඇඳුම් ගැන කිව්වා. තමුන්නාන්සේලා මේ රටට මොනවාද නොකළේ? කවුද, එහෙම රටක් පිළිගන්නේ? අනෙකුත් ජන කණ්ඩායම්වලට වෛරය වපුරන ආණ්ඩුවක් තිබෙනවා නම්, ජන කණ්ඩායම් තුළ ක්‍රෝධය, අවිශ්වාසය ගොඩනඟන පාලනයක් තිබෙනවා නම්, එවැනි රටක් පිළිගන්නේ කවුද? ඒ නිසා මේ රට ලෝකයේ කළු පැහැති රටක්. අපි මේ රට ඇතුළේ ජීවත් වෙන නිසා කළු බව පෙනෙන්නේ නැහැ. රටින් එළියට ගියාම පෙනේවි. අපේ රටේ කෙනෙකුට වෙනත් රටකට යන්න ඒ රටින් වීසා එකක් දෙන්නේ නැහැ. මොකද, ගියොත් එන්නේ නැති බව දන්නවා. අපේ ජාතික කණ්ඩායම නියෝජනය කරමින් පොදු රාජ්‍ය මණ්ඩලයට ගිය ක්‍රීඩකයන් 10දෙනෙක් පැනලා ගියා. ඒ අපේ රටේ පදක්කම්ලාභීන්, අපේ රටේ ජාතික ශූරයින්. හැබැයි, ඒ ජාතික ශූරයින් කල්පනා කළා, "පදක්කම බෙල්ලේ එල්ලා ගෙන හිටියාට වැඩක් නැහැ. අපි ජීවත් වෙන්නේ කඩා වැටුණු රටක" කියලා. ඒ නිසා ඔවුන් කල්පනා කරනවා, "මට පදක්කම් වැඩක් නැහැ, මට 'ජාතික ශූරයෙක්' කියන ලේබල් එකෙන් වැඩක් නැහැ, මේ රට දාලා යන්න ඕනෑ" කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තවත් මිනිත්තු 3ක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
හොඳයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අද කොච්චර නම් රූපවාහිනී දැන්වීම් පළ කරනවා ද, "අපේ රටට එන්න එපා, බෝට්ටුවෙන්" කියලා. ඉතින්, මෙවැනි කළු පැහැති රටක් කොහොමද රාජ්‍ය තාන්ත්‍රික සබඳතා හදාගන්නේ? රටකට මේ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා වැදගත්. මේ රට ගොඩ නඟන්න නම්, ඉතා විනිවිදභාවයෙන් යුතුව කාන්තා හා ළමා අයිතිවාසිකම් සුරක්ෂිත වෙන, අනෙක් ජන කණ්ඩායම් අතර සමගිය නිර්මාණය වන නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්, නව නීති පද්ධතියක්, නව සංස්කෘතියක් අපේ රටට අවශ්‍යයි.

ඊළඟට, නව ආර්ථික ප්‍රතිසංස්කරණ ඇති කරන්න ඕනෑ. ඒකට අපි එකඟයි. මම කියන්නේ නැහැ, මේ සියල්ල රාජ්‍යය සතු කරන්න ඕනෑ කියලා. එහෙම කරන්න ඕනෑ නැහැ. හැබැයි, මම විශ්වාස කරනවා 'බලශක්තිය' පිළිබඳව රාජ්‍යය සතු පංගුවක් තිබෙන්න ඕනෑ කියලා.

විශේෂයෙන් මූල්‍ය ක්ෂේත්‍රය ගත්තොත්, මූල්‍ය සමාගම් 40කට ආසන්න ප්‍රමාණයක් අපේ රටේ තිබෙනවා. ලංකා බැංකුව ගත්තොත්, ශාඛා 700කට වැඩි ප්‍රමාණයක් තිබෙනවා. එම ශාඛා 700න්, 200ක් විතර පාඩු ලබනවා. හැබැයි, ඒ පාඩු ලබන බැංකු ඒ සේවාව සපයන්නේ කොහාටද? ගිරාඳුරුකෝට්ටේ ප්‍රදේශයට. ගිරාඳුරුකෝට්ටේ ප්‍රදේශයට ඒ බැංකු සේවාව ගෙන යන්නේ කවුද? ලංකා බැංකුවයි. ඒ සේවාව ගෙන යන්නේ නැහැ, පෞද්ගලික බැංකුවක්. පෞද්ගලික බැංකු අපේක්ෂා කරන්නේ මොකක්ද? ලාභයයි. හැබැයි, සමාජ වගකීම තිබෙන්නේ කාටද? සමාජ වගකීම තිබෙන්නේ ආණ්ඩුවටයි. ඒ නිසා සමාජ වගකීමේ ප්‍රධාන තැන් වන බලශක්තිය, මූල්‍ය වෙළෙඳ පොළ ආදියෙහි රාජ්‍ය පංගුව ආරක්ෂා කර ගත යුතුයි. බලශක්තිය තවදුරටත් නිදහස් කරන්න එපා. පසුගිය දවස්වල මොකක්ද සිද්ධ වුණේ කියලා අපි දැක්කා. LIOC එක තීරණය කළා, ඩීසල් ඇතුළු සියලු ඉන්ධන විකුණන්නේ නැහැයි කියලා. ලාෆ්ස් ගෑස් සමාගම තීරණය කළා, ගෑස් විකුණන්නේ නැහැයි කියලා. ඔවුන්ට තිබෙන්නේ ලාභය පිළිබඳ අපේක්ෂාවක්. මතක තබාගන්න, සමාජ වගකීම් පිළිබඳ අපේක්ෂාවක් ඔවුන්ට නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ආර්ථිකයේ කරුණු 3ක් සම්පූර්ණ වෙන්න ඕනෑ. පළමුවන කාරණය තමයි, භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ඉහළට ගේන්න ඕනෑය කියන එක. භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ඉහළට ගේන්න අපේ ජාතික සම්පත් කොහොමද උපයෝගි කර ගන්නේ? අපේ මානව සම්පත කොහොමද උපයෝගි කර ගන්නේ? ලෝකයේ නව වෙළෙඳ පොළක් තිබෙන්නේ භාණ්ඩවලට නොවෙයි. ලෝකයේ විශාලතම වෙළෙඳ පොළ විවෘත වෙමින් තිබෙන්නේ මොනවාටද? දැනුමටයි, knowledge එකටයි. අද ලෝකයේ සම්පත කියලා කියන්නේ knowledge එකටයි. සවුදි අරාබිය ලෝකයේ ඉන්ධන අපනයනය කරන ප්‍රධාන රටවල් 5න් එකක්. හැබැයි, 2021දී ඉන්ධන අපනයනය කරලා සවුදි අරාබිය හොයාගෙන තිබෙන්නේ ඩොලර් බිලියන 113යි. ඉන්දියාව ITවලින් හොයාගෙන තිබෙනවා, ඩොලර් බිලියන 133ක්. ඒ නිසා අද ලෝකයේ ශක්තිමත් සම්පත මොකක්ද? ලෝකයේ ශක්තිමත් සම්පත ඉන්ධන නොවෙයි, knowledge එකයි. ඒ නිසා අපි සැලසුමක් සකස් කළාද, 2030දී ලෝකයට අවශ්‍ය ශ්‍රමිකයා කවුද, ලෝකයේ වෘත්තීමය වෙළෙඳ පොළෙන් අපි පංගුවක් අත්පත් කර ගන්නේ කොහොමද කියන එක ගැන? අපි සැලසුමක් සකස් කළේ නැහැ. ඒ නිසා තමයි ගණිකා වෘත්තියේ විකිණෙන කාන්තාවන් ඕමාන්වලින් හමු වෙන්නේ. අපි අත්පත් කර ගත්තාද, වෙළෙඳ පොළක්? අපි අත්පත් කර ගත්තේ ශ්‍රම වෙළෙඳ පොළෙන් පහළම ශ්‍රම වෙළෙඳ පොළක්. අපි දියුණු ශ්‍රම වෙළෙඳ පොළක් අත්පත් කර ගත්තේ නැහැ.

[ගරු අනුර දිසානායක මහතා]

2020දී 304,000ක් විදේශගත වෙලා තිබෙනවා. මේ 304,000න් වෘත්තීය රැකියා සඳහා ගිහින් තිබෙන්නේ 9,000යි. 295,000ක් ගිහින් තිබෙන්නේ පුහුණු, නුපුහුණු ගෘහ සේවිකාවන් වශයෙනුයි. මොකක්ද, මේ වෙලා තිබෙන්නේ? අපට බැරි වුණා, හොඳ ශ්‍රමිකයන් බිහි කර ගන්න. අපේ සේවා අංශය අපි හොඳ තත්ත්වයකට ගේන්න ඕනෑ. අපේ භාණ්ඩ හා සේවා නිෂ්පාදනය ඉහළට ගේන්න ඕනෑ. ඒ තමයි, පළමුවන කාරණය.

දෙවන කාරණය, කොළඹ කේන්ද්‍ර කරගත් ආර්ථිකයයි. ආර්ථිකයේ ඉතාම වැදගත් සාධක තමයි, ආර්ථිකයේ වර්ධනය වාගේම ආර්ථිකයේ ප්‍රසාරණය. ආර්ථිකය තල්ලු කරන්න ඕනෑ, ගමට. නමුත්, අද කොහේද ආර්ථිකය තිබෙන්නේ? සමස්ත ජාතික ධනයෙන් සියයට 38ක් නිෂ්පාදනය කරන්නේ බස්නාහිර පළාතයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayaka)
මට තව විනාඩි 2ක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

උතුරු මැද පළාතෙන් ජාතික ආදායමට එකතු වෙන්නේ සියයට 5.9යි. උතුරු පළාතෙන් ජාතික ආදායමට එකතු වෙන්නේ සියයට 4.9යි. ඒ කියන්නේ මොකක්ද? බස්නාහිර පළාත කේන්ද්‍ර කර ගත් ආර්ථිකයක් තිබෙන්නේ. කොළඹ මහ ගොඩනැඟිලි හැදෙනවා. රටට ඒක ප්‍රසාරණය වන්නේ නැහැ. ආර්ථිකය ප්‍රසාරණය කර ගත හැකි වන්නේ කොහොමද? ගමේ ජනතාව ජීවත්වන ආර්ථික ප්‍රභවය මොකක්ද? ඒ ආර්ථික ප්‍රභවය සංවර්ධනය කරන්න ඕනෑ. නව ආර්ථික ප්‍රභව හඳුන්වා දෙන්න ඕනෑ. ආර්ථික වර්ධනය වාගේම ආර්ථික ප්‍රසාරණයත් වැදගත්. ජනතාව ආර්ථිකයට හවුල් වෙන්න ඕනෑ. ආර්ථිකය වර්ධනය වෙන්න ඕනෑ. උත්පාදනය කරන ධනය සාධාරණ ලෙස බෙදෙන්න ඕනෑ. දැන් ඒ ධනය සාධාරණ ලෙස බෙදෙනවාද? නැහැ. අපේ රටේ ඉහළම පන්තියේ සිටින සියයට 10ක් ජාතික ධනයෙන් සියයට 38ක් භුක්ති විඳිනවා. පහළම පන්තියේ සිටින සියයට 10ට ලැබෙන්නේ ජාතික ධනයෙන් සියයට 1.1යි. අපි ජාතික ධනය පාන් ගෙඩියක් කියලා හිතමු. ඒ පාන් ගෙඩිය පෙති 100කට කැපුවොත්, ඉහළම ඉන්න දහදෙනා පාන් පෙති 38ක් භුක්ති විඳිනවා. පහළම ඉන්න දහදෙනාට හම්බ වෙන්නේ පාන් පෙත්තක් සහ තවත් පෙත්තකින් ටිකක් පමණයි. ඒක සාධාරණ නැහැ. මා කියන්නේ නැහැ, ඔක්කෝටම සමානව බෙදන්න කියලා. ඒක බොරුවක්; මිථ්‍යාවක්. එහා ගෙදරත් රොටි. මෙහා ගෙදරත් රොටි. එහෙම වෙන්න බැහැ. මෙහා ගෙදරට කාර් එකක් තිබුණොත්, එහා ගෙදරටත් කාර් එකක් ගන්නවා. මෙහා ගෙදරට ඉඩම් අක්කර දෙකක් තිබුණොත්, එහා ගෙදරට ඉඩම් අක්කරයක් ගන්නවා. මෙහා ගෙදරට තවත් ගෙවල් දෙකක් තිබුණොත්, එහා ගෙදරටත් තව ගෙයක් ගන්නවා. මේවා බොරු. මේ කියන්නේ සමාජ සාධාරණත්වයද? බුදුරජාණන් වහන්සේගේ දේශනා ජනාධිපතිතුමා හැම වෙලාවේම උපුටා දක්වනවා. එතුමා හැම කථාවක්ම කරනකොට මොකක් හෝ සූත්‍ර පිටකයක් ගැන මේ සභාවේදී කියනවා. හැබැයි, මා අහන්නේ එක කාරණයයි. බුදු රජාණන් වහන්සේ දේශනා කළ දහමේ ප්‍රධාන පදනම මොකක්ද? සමානාත්මතාවයි; සමාජ සාධාරණත්වයයි. සමාජ සාධාරණත්වයක් අපේ රටේ තිබෙනවාද? අපේ රටේ ආර්ථිකය වර්ධනය වෙන්න ඕනෑ; ආර්ථිකය ප්‍රසාරණය වෙන්න ඕනෑ; සමාජ සාධාරණත්වය නිර්මාණය වෙන්න ඕනෑ.

අද අපේ රටේ ධනය ඉතා කුඩා කණ්ඩායමක් වටා සංකේන්ද්‍රණය වෙනවා. තමුන්නාන්සේලා පසුගිය කාලයේ බදු ප්‍රතිපත්ති සකස් කළේ සමහර වංචා, දූෂණවලට ඉඩකඩ විවෘත කරමින්. සමහර ආර්ථික උපාය මාර්ග සකස් කළේ මේ ධනය ඉතා කුඩා කණ්ඩායමක්, අතළොස්සක් මත සංකේන්ද්‍රණය වෙන්නයි. ඒ වෙනුවට ජනතාව අතරට ආර්ථිකය ගලාගෙන යන්න ඕනෑ. එතකොට තමයි දුප්පත් දරුවාට අධ්‍යාපනයක් තිබෙන්නේ; වාතාශ්‍රය සහිත නිවාසයක් තිබෙන්නේ; නීරෝගී සම්පන්න ජීවිතයක් තිබෙන්නේ. මානසික සුවයක් සහිත මිනිසුන් ඉන්න සමාජයක් බිහි වී සමාජය යහපත් වෙන්නේ එතකොටයි. අපි මේ රටේ ආර්ථිකය මොන තරම් දියුණු කළත් වැඩක් නැහැ, යහපත් සමාජයක් නැත්නම්. අනිකාට ඇහුම්කන් දෙන, අනිකාට ගරු කරන, අනිකාත් එක්ක ළෙන්ගතුභාවයක් තිබෙන, අනිකාත් එක්ක මානව බැඳීම් තිබෙන සමාජයක් අපට ඕනෑ. අද එහෙම සමාජයක් නැහැ  කියන එක මතක තබාගන්න. ආර්ථිකයේ ප්‍රතිවිපාක ලැබිලා සමාජය යහපත් වෙන්නේ නැහැ. ආර්ථිකයක් කඩා වැටුණු හැම සමාජයක්ම විශාල ව්‍යසනයකට මුහුණ දීලා තිබෙනවා. අද අපට ආර්ථික අර්බුදයක් තිබෙනවා; සමාජ ව්‍යසනයක් තිබෙනවා; දේශපාලන අර්බුදයක් තිබෙනවා. මේ අර්බුදයෙන් මේ රට ගොඩගැනීම සඳහා යම් යථාර්ථවාදී වැඩ පිළිවෙළකට යන්න ඕනෑ. මා නැවතත් කියන්නේ, ඒ වැඩ පිළිවෙළේ මූලික පදනම ජනතාවගේ කැමැත්තෙන් නව පාලනයක් සකස් කර ගන්න ඕනෑය කියන එකයි. අන්න ඒ යෝජනාව ඉදිරිපත් කරමින් මා නතර වෙනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු රනිල් වික්‍රමසිංහ මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය සහ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரணில் விக்கிரமசிங்ஹ - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சரும்)
(The Hon. Ranil Wickremesinghe - President, Minister of Defence and Minister of Finance, Economic Stabilization and National Policies)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එක කාරණයක් මම පැහැදිලි කරන්න ඕනෑ. අපේ යහ පාලන ආණ්ඩුව කාලයේ ජනාධිපති උපදේශක ජේ.සී. වැලිඅමුණ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් කණ්ඩායමක් ඩුබායිවලට ගියා. ඩුබායිවලදී ඒ ගැන හොයා බලා එතුමන්ලා ආපහු ලංකාවට පැමිණියා. ඉන් පසුව ඒ අය තවම පියවරක් ගත්තේ නැහැ. එයට හේතුව, ඒ අයට සාක්ෂි නැහැ කිව්වා. මට ඊට වඩා කරන්න දෙයක් නැහැ. ඒ අය සිටියේත් මා යටතේ නොවෙයි.

ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමනි, බුදුරජාණන් වහන්සේ දේශනා කළේ සමානත්වය ගැන නොවෙයි. චතුරාර්ය සත්‍යයේ තිබෙන්නේ දුක ගැන. දුක නැති කිරීමට ආර්ය අෂ්ටාංගික මාර්ගය අනුගමනය කරන්න කිව්වා. එච්චරයි.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාසමාණික්කම් මන්ත්‍රීතුමා.

**ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා**
(மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம்)
(The Hon. Shanakiyan Rajaputhiran Rasamanickam)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நேற்றைய தினம் நான் இச்சபையில் இல்லாதபொழுது, நான் பிரதிநிதித்துவம் செய்யும் மாவட்டத்தைச் சேர்ந்த சக பாராளுமன்ற உறுப்பினர்

என்னுடைய பெயரைக் குறிப்பிட்டு ஒருசில கருத்துக்களைச் சொல்லியிருந்தார். ஆகையால், அவை தொடர்பில் தெளிவூட்ட விரும்புகிறேன்.

எனக்கு எனது தாயும் தந்தையும் வைத்த பெயர் சாணக்கியன் ராகுல் ராஜபுத்திரன் இராசமாணிக்கம் என்ப தாகும். அது பற்றி அவருக்கு ஏதாவது குழப்பமிருந்தால், என்னிடம் கேட்கலாம். அடுத்து, என்னுடைய பெயரைக் குறிப்பிட்டு காணி அபகரிப்புத் தொடர்பாக ஒரு விடயத்தைச் சொல்லியிருந்தார். அவ்விடயம் தொடர்பில் சந்தேகம் இருந் தால், குழுவொன்றை நியமித்து விசாரணை நடத்துமாறு நான் மாண்புமிகு சனாதிபதி அவர்களைக் கேட்கிறேன். அதற்காக என்னுடைய பெயரிலுள்ள காணிகள் பற்றிய சகல ஆவணங் களையும் நான் தருகிறேன். அதேபோல், சிவநேசதுரை சந்திரகாந்தன் அவர்களுடைய பெயரில் இருக்கும் ஆவணங் களையும் தருகிறேன். அவற்றையும் நீங்கள் விசாரியுங்கள்!

அடுத்து, நான் கனடாவுக்கு ஆட்கடத்தல் செய்வதாகச் சொல்லியிருந்தார். கனடாவுக்கு விசா பெற்று, எப்படிப் போவதென்று தெரியாதென்ற விடயத்தை நேற்று அவரே நிரூபித்திருந்தார். கனடாவுக்கு ஆட்களைக் கடத்தி, காசு உழைக்கவேண்டிய அவசியம் எனக்கு இல்லை. ரவீந்திரநாத் என்ற VC கடத்தப்பட்டார்; பிரேமினி என்ற பெண்மணி கடத்தப்பட்டு, rape பண்ணப்பட்டார்; நடேசன் கடத்தப் பட்டார். இவற்றைப் பற்றியும் விசாரிக்க வேண்டும். அவுஸ்ரேலியாவிற்கு ஆட்களைக் கடத்துவது சம்பந்தமான செய்தியொன்று ABC செய்திச் சேவையில் 2022ஆம் ஆண்டு செப்ரெம்பர் மாதம் 22ஆம் திகதி வெளிவந்திருக்கிறது. அதாவது, அகிலகுமார் சந்திரகாந்தன் என்று அழைக்கப்படும் சிவநேசதுரை சந்திரகாந்தனுடைய சகோதரர் அவுஸ்ரேலி யாவிற்கு ஆட்களைக் கடத்துவதாக அந்தச் செய்தியிலே குறிப்பிடப்பட்டிருக்கிறது. அது தொடர்பான ஆவணத்தை நான் இந்த உயரிய சபையிலே *சமர்ப்பிக்கின்றேன்.

மட்டக்களப்பு மாவட்டத்தில்

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

அவர்கள் காணி அபகரிப்புச் செய்கிறார் என்பதை நான் ஆதாரத்துடன்தான் சொல்கிறேன். மாண்புமிகு சனாதிபதி அவர்களே, இது தொடர்பில் விசாரணை செய்வதற்கு உடனடியாகக் குழுவொன்றை நியமியுங்கள்! எங்களுடைய மாவட்ட அபிவிருத்திக் குழுவின் இணைத்தலைவரின் ஊழலைக் கண்டுபிடிப்போம். என்மீது சுமத்தப்பட்ட அனைத் துக் குற்றச்சாட்டுக்களையும் நான் முழுமையாக நிராகரிக் கின்றேன். நேற்றைய தினம் பாராளுமன்றத்தில் நான் அவருடைய உரையைக் கேட்கவேண்டும் என்றே இருந்தேன். எனினும், முக்கியமானதொரு கூட்டத்துக்குப் போகவேண்டிய சூழ்நிலை எனக்கு ஏற்பட்டது. மாண்புமிகு சனாதிபதி அவர்கள் கட்டாயமாக ஒரு குழுவை நியமித்து, அவருடைய ஊழலைப் பற்றி விசாரிக்க வேண்டும் என்று மீண்டும் கேட்டு, எனது உரையை நிறைவுசெய்கிறேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත ඇමතිතුමා. ඔබතුමාට මිනිත්තු 29ක කාලයක් තිබෙනවා.

**** පුස්තකාලයේ තබා ඇත.***
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[අ.භා. 12.16]

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා (අධ්‍යාපන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த - கல்வி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law - Minister of Education and the Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2023 අය වැය දෙවන වර කියවීමේ විවාදයේ අවසාන දිනයට අපි අවතීර්ණ වෙලා සිටිනවා. 2023 අය වැය ඇස්තමේන්තුව අනුව සමස්ත වියදම රුපියල් බිලියන 7,879යි. ඒ, රාජ්‍ය ණය ආපසු ගෙවීමත් සමඟ. රාජ්‍ය ණය ගැනීම් හැර මුළු ලැබීම් රුපියල් බිලියන 3,456යි. එතකොට මුළු ණය ගැනීමේ අවශ්‍යතාව රුපියල් බිලියන 4,979යි. ණය ආපසු ගෙවීම් රුපියල් බිලියන 2,025 අඩු කළාම, බිලියන 2,954යි. ඒක තමයි සාරාංශය. අපි බලමු, මේ වියදම එන්නේ කොහොමද කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් මූලාසනය සඳහා ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிரா சனத்தினின்று அகலவே, மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* THE HON. SHANAKIYAN RAJAPUTHIRAN RASAMANICKAM *took the Chair.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ සමස්ත වියදමෙන් තුනෙන් එකක් වෙන් වෙන්නේ, ලක්ෂ 15ක් පමණ වන රාජ්‍ය සේවකයන්ගේ වැටුප් හා දීමනා සහ විශ්‍රාම වැටුප් ගෙවීම සඳහා. රජයේ ආදායම බොහෝ වෙලාවට ප්‍රමාණවත් වෙන්නේ නැහැ, වැඩි වියදමක් දැරිය යුතු ආරක්ෂක, අධ්‍යාපන හා සෞඛ්‍ය ක්ෂේත්‍රවල සේවා සැපයීමට. මේ තත්ත්වයට තමයි අද අපි ඇවිත් තිබෙන්නේ. මේ ප්‍රශ්නයට විසඳුම් හොයන්නේ කෙසේද? එක පැත්තකින්, විදේශ සංචාරකයන් zero වුණා, කොවිඩ්-19 වසංගතයත් එක්ක. පසුගිය අවුරුදු දෙකෙන්, අවුරුදු එකහමාරක් විතර විවිධ අවස්ථාවලදී රට වසා දැමුවා. නිෂ්පාදන ඇති වුණේ නැහැ. අපනයනය යම් ප්‍රමාණයකින් අඩාළ වුණා. ලෝකයේම

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

ජාත්‍යන්තර වෙළෙඳාම පසුබෑමකට ලක් වුණා. මේ සියල්ල සාර්ව ආර්ථික ප්‍රශ්න. සියයට 9ක්ව තිබුණු ණය පොලී අනුපාතය මේ වෙනකොට සියයට 30 ඉක්මවා ගිහිල්ලා තිබෙනවා. ඒකට හේතුව ඇහුවාම සඳහන් කරන්නේ මුදල් සංසරණය අඩු කිරීම, ණය ගැනීම අධෛර්යවත් කිරීම හා ඉතුරුම් වැඩි කිරීමයි. මොකද, රට තුළ බැංකුවල ද්‍රවශීලතාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ද්‍රවශීලතා ප්‍රශ්නය විසඳීම සඳහා යම් යම් ක්‍රමෝපාය යොදා තිබෙනවා.

පසුගිය දශක කිහිපය පුරාම ඉදිරිපත් වූ අය වැය ලේඛනවල අන්තිමට අය වැය හිඟය පියවා තිබෙන්නේ, එක්කෝ ජාත්‍යන්තර ආයතනවලින් ලබා ගන්නා වූ විදේශීය ණයවලින්, එහෙම නැත්නම්, දේශීය බැංකුවලින් සහ වෙනත් ක්‍රමෝපාය මඟින් ලබා ගන්නා වූ ණයවලින්. එහෙමත් නැත්නම්, බදු වැඩි කිරීම හා භාණ්ඩ හා සේවා මත අලුතෙන් පනවන බදුවලින්. අපි උදාහරණයක් ගනිමු. ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මැතිතුමා 1973 නොවැම්බර් මස 01වැනි දා තමයි 1974 මුදල් වර්ෂය සඳහා අය වැය ඉදිරිපත් කළේ. මා එහි උපුටනයක් කියවනවා, ඉංග්‍රීසි භාෂාවෙන්.

"I have pleasure in moving the Second Reading of the fourth Appropriation Bill of the United Front Government led by Mrs. Sirima Bandaranaike. I am presenting this Budget in an international atmosphere charged with unmitigated inflation."

ඒ, ජාත්‍යන්තර වශයෙන් ආපු උද්ධමනය.

"The world has been rocked by floating currencies,...."

Currencies float වීම.

"....spiralling prices.."

මිල spiral එකක් හැටියට ඉහළට යෑම.

".. and an unprecedented scarcity of essential foodstuffs."

පෙර නොවූ විරූ ලෙස අත්‍යවශ්‍ය ආහාරවල හිඟයක් ඇති වීම.

"Never has the world witnessed such a period of economic instability."

මම ඒ උපුටා ගැනීම කළේ 1974 වර්ෂයට අදාළ අය වැයෙන්. එම අය වැය ලේඛනයේ තව තැනක මෙන්න මේ විධියට සඳහන් වෙනවා:

"This attitude is belied by the World Bank's most recent thinking. Or is it that the right hand (IMF) does not know what the left hand (World Bank) is doing? "

ඒ වෙලාවේ ලෝක ආර්ථික අවපාතයක් ආවා, ලෝකයේ තෙල් මිල අධික ලෙස ඉහළ ගියා, ආහාර හිඟයකට මුහුණ දුන්නා. මෙවැනි අභියෝග රාශියකට එදා මුහුණ දුන්නා. කොවිඩ්-19 ඇවිත් නොවෙයි. කොවිඩ් ව්‍යසනයක් නැතිව පවා එවැනි අවස්ථාවලට අපි මුහුණ දුන්නා. එතකොට මොකක්ද වුණේ? ඒ වෙලාවේත් ආර්ථිකය සංකෝචනය වුණා. ආනයන සීමා කළා. අපි පාසල් යන කාලයේ jumping fish poplin රෙදි ගන්න සමුපකාරය ගාව උදේ පාන්දර 5.00 ඉඳන් පෝලිමේ ඉන්නවා. එහෙම තත්ත්වයක් තමයි තිබුණේ. සතියකට දින දෙකක් මඤ්ඤොක්කා, බතල තමයි හෝටල්වල කන්න තිබුණේ. ආර්ථිකය සංකෝචනය කරන්න වුණා. හැබැයි, ඒ සීමාවන් කළේ ආනයන සීමා කරන්නයි. ඒ වකවානුව වෙනකොට රෙදිපිළි කර්මාන්තයට, අනෙකුත් අපනයන භාණ්ඩවලට අවශ්‍ය අමු ද්‍රව්‍ය ගෙන ඒම මේ තරම් බරපතළ ප්‍රශ්නයක් වෙලා තිබුණේ නැහැ. අපේ රටේ නිෂ්පාදනය කරන රබර්, කුළු බඩු, පොල්, තේ වැනි අපනයනවලින් තමයි ප්‍රධාන වශයෙන් අපේ ආර්ථිකය රඳා පැවතුණේ. ඒ කාලයේ විදේශ ශ්‍රමිකයන් අපට මුදල් එව්වෙත් නැහැ. ඒ වකවානුව තුළ පැවැති තත්ත්වය තුළ තමයි ඒක කළමනාකරණය කර ගන්න සිද්ධ වුණේ. එම අය වැයෙහි යෝජනා ඉදිරිපත් කරලා තිබෙනවා. මම මේ කියාගෙන ආවේ අය වැය ඉදිරිපත් කරනකොට, ඇති වන තත්ත්වයන්ට කොහොමද මුහුණ දෙන්නේ කියලායි. ඒ Proposals මේකේ සඳහන් කරලා තිබෙනවා: Business Turnover Tax සහ විදේශ විනිමය පරිවර්තනය කරන්න Convertible Rupee Account එකක් හඳුන්වා දුන්නා; taxation of income on a current year basis, ඒ වර්ෂයට අදාළව tax ගෙවීම හඳුන්වලා දුන්නා; Excise Duty on tobacco, නැත්නම් දුම්කොළ බද්ද හඳුන්වා දුන්නා. මෙන්න මෙහෙම තමයි එදා අය වැය පරතරය පියවා ගන්න සාමාන්‍ය විධියට කටයුතු කළේ.

ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මැතිතුමාගේ අය වැය කථාවේ රාජ්‍ය සේවය ගැන කියනවා. එදා ලක්ෂ 6ට අඩු රාජ්‍ය සේවකයන් සංඛ්‍යාවක් හිටියේ. හැබැයි, එතුමා එදා පුරෝකථනය - predict - කළා; මේ විධියට රාජ්‍ය සේවක සංඛ්‍යාව වැඩි වුණොත්, අනාගතයේ යම් දවසක ණය අරගෙන තමයි වැටුප් හා විශ්‍රාම වැටුප් ගෙවන්න වෙන්නේ කියලා. අද අපි එතැනට ඇවිත් තිබෙනවා. ආර්ථික විද්‍යාව පිළිබඳව ආචාර්ය උපාධියක් තිබෙන, වාම දේශපාලනයේ නායකත්වය දරපු ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මැතිතුමා එවැනි අභියෝග රාශියක් මැද්දේ තමයි එදා ඒ අය වැය ඉදිරිපත් කළේ. අපි දැන් එතැනින් මෙපිට අය වැයක් අරගෙන බලමු.

අපි 2000 වර්ෂයේ අය වැය කථාව අරගෙන බලමු. ජනාධිපති සහ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය ගරු චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය වර්ෂ 2000ක් වූ පෙබරවාරි මස 14වැනි සඳුදා තමයි මේ අය වැය ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ අය වැය කථාවේ එතුමිය මෙහෙම කියනවා;

"එහෙත් ජනාධිපතිවරයාගේ කටයුතුවලට අදාළව පවතින සම්ප්‍රදායයන් හේතුවෙන් මගේ අය වැය යෝජනා පෞද්ගලිකවම ඉදිරිපත් කිරීමේ අවස්ථාව මට අහිමි වුණා. මේ කාර්ය ඉතාමත් කාර්යක්ෂම ලෙස ඉටු කිරීමේ කටයුත්ත භාර ගත්තේ බහුශ්‍රැත දැනුමෙන් යුතු මගේ නියෝජ්‍ය මුදල් අමාත්‍යවරයා වන මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමායි."

ඒ අය වැය ඉදිරිපත් කරන අවස්ථාව - 2000 වර්ෂය - වෙනකොට GDP - Gross Domestic Product - එක සියයට 6ක් වෙනවා. ඒ සංඛ්‍යාලේඛන මා සතුව තිබෙනවා.

දැන් අපි ඊළඟ අය වැය බලමු. ඒ අය වැය ඉදිරිපත් කළේ කවුද? ඒ අය වැය ගැනත් මීට දින කිහිපයකට පෙර මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා මේ ගරු සභාවේදී කථා කළා. මහාචාර්ය ජී.එල්. පීරිස් මැතිතුමා මේ අය වැය කථාව ඉදිරිපත් කළේ 2001 මාර්තු මස 08වැනි දා. එතුමා මොකක්ද කිව්වේ? එතුමා මෙහෙම කියනවා;

" මෙම ගෙවී ගිය කාලපරිච්ඡේදය තුළ නොනවත්වාම ජාතික ආරක්ෂාවට තර්ජන එල්ල වීමත්, ආරක්ෂක කටයුතු වෙනුවෙන් අධික වියදමක් දැරීමට සිදුවීමත් අපේ ආර්ථිකය හා මූල්‍ය සැලසුම් මූලෝපායයන් අපේක්ෂිත අයුරින් ක්‍රියාත්මක කිරීමට ඉඩ නොලැබෙන පරිද්දෙන් ජාත්‍යන්තර වශයෙන් දක්නට ලැබෙන ආර්ථික අස්ථාවරභාවයත් ගැන සලකා බලන විට, එක දිගට අයවැය කථා හතක් ඉදිරිපත් කිරීමට ලැබීම අභියෝගයක් බව කිවයුතු නොවේ."

එතුමාගේ හත්වැනි අය වැය තමයි ඒ 2001 වර්ෂයට ඉදිරිපත් කළේ. 2001 මහ බැංකු වාර්තාවේ මම කලින් කියපු මූර්ත නිමැවුම් කියන එකේ දළ දේශීය නිෂ්පාදිතය ඍණ 1.4යි.

කලින් අවුරුද්දේ 5.8ක් ලෙස තිබුණු එක 2001දී සෘණ 1.4යි. එතකොට කොවිඩ්-19 බලපෑමක් තිබුණාද? මේ වාගේ ආර්ථික ප්‍රශ්නයක් තිබුණාද? යුද්ධයක් තිබුණා, ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයක් තිබුණා. හැබැයි, ලෝක ආර්ථික අවපාතයක් තිබුණාද? නැහැ. ජාත්‍යන්තර වෙළෙඳාමේ ප්‍රශ්නයක් තිබුණාද? නැහැ. මෙන්න, 2001 දී ලැබිලා තිබෙන ප්‍රතිඵලය. දළ දේශීය නිෂ්පාදිතය සෘණ 1.4යි. දැන් ඒක සෘණ 8යි. දැන් සෘණ 8ක් වුණේ සිද්ධි ගණනාවක් වෙලා නේ. හැබැයි ඒ මොනවත් නැතිව දළ දේශීය නිෂ්පාදිතය 2001 දී සෘණ 1.4යි. මම මේ කියන්නේ කලින් කලට වෙලා තිබෙන දේ.

ඊළඟට, 2003 වර්ෂය ගනිමු. 2003 මහ බැංකු වාර්තාව ගත්තාම, GDP එක නැවත 5.9යි. ඒ කියන්නේ ඊළඟ අවුරුදු දෙකේදී 5.9ට ගිහිල්ලා තිබෙනවා. කලින් කලට මතු වන්නා වූ ප්‍රශ්නත් එක්ක ඒවාට සාර්ව ආර්ථික වශයෙන් විසඳුම් ලබා නොදෙන තාක්කල් ඇති වන්නා වූ ප්‍රතිඵල තමයි ඉතිහාසය තුළ මේ සංඛ්‍යාලේඛන දත්තවලින් අපට පෙන්වා දෙන්නේ. 2021 නොවැම්බර් මාසයේ 2022 වර්ෂයට අදාළ අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට, සාර්ව ආර්ථික ප්‍රශ්නවලට ක්ෂුද්‍ර ආර්ථික විසඳුම් නැහැයි කියලා මම මේ සභාවේදී කිව්වා. අද ඒක ඔප්පු වෙලා අවසානයි.

Sir, I would like to quote from the 14th Edition of "Economics" by Lipsey and Chrystal.

> "Microeconomics studies how and why basic resources are transformed by producers into all the many goods and services that modern consumers want."

මේවා තමයි ක්ෂුද්‍ර ආර්ථික විසඳුම් යෝජනාවල තිබුණේ. ඊට පසුව සාර්ව ආර්ථිකය පිළිබඳව එහි තවදුරටත් මෙසේ සඳහන් වෙනවා:

> "Macroeconomics studies the amount of activity in the economy as a whole and the role of governments in trying to influence that activity."

මේකෙන් කියන්නේ මොකක්ද? මේකෙන් කියන්නේ රජයේ මැදිහත්වීමක් අවශ්‍යයි කියලා. සාර්ව ආර්ථිකය පිළිබඳව කටයුතු කළ යුතු වන්නේ ආණ්ඩුව බව මේ අධ්‍යයනය තුළින් පැහැදිලි වෙනවා. ක්ෂුද්‍ර ආර්ථිකය මෙහෙයවීම සම්බන්ධයෙන් ආණ්ඩුවට ලොකු වගකීමක් නැහැ. වෙළෙඳ පොළ -markets - පාරිභෝගිකයෝ, සමාගම් -firms- වැඩ කරන්නේ කොහොමද, ඒවායේ තිබෙන තරගකාරිත්වය යන ඒවා තමයි microeconomicsවල කෙරෙන්නේ. සාර්ව ආර්ථිකය -macroeconomics - ගත්තොත්, issues and frameworks, issues and measurements යන කරුණු තමයි ගණනය කරන්න ඕනෑ.

මම දන්නා තරමින් ලංකාවේ රාජ්‍ය විශ්වවිද්‍යාල 17ක් තිබෙනවා. ඒ 17න් සාම්ප්‍රදායික විශ්වවිද්‍යාල ඇතුළු ප්‍රධාන විශ්වවිද්‍යාල හැම එකකම management faculties තිබෙනවා, departments of economics තිබෙනවා. මේ ඔක්කොම තිබෙනවා. අපි සංගණනයක් කරලා බැලුවොත්, මේ විශ්වවිද්‍යාල පද්ධතියට වඩා වැඩියි, මහ බැංකුවේ ආචාර්ය උපාධිය ලබාගෙන තිබෙන සම්පත් දායකයෝ සංඛ්‍යාව. එහෙම නේද Hon. (Dr.) Harsha de Silva? දැන් අපි fail වෙලා තිබෙන්නේ කොහෙන්ද? ආර්ථිකයෙන්.

ඊළඟට අපි කෘෂිකර්මය ගනිමු. පේරාදෙණිය, රුහුණ විශ්වවිද්‍යාලවල ඊට අදාළ faculties තිබෙනවා. හැබැයි ඒවායේ ඉන්න ආචාර්ය, මහාචාර්යවරුන්ට වඩා වැඩියි කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ආයතනවල ඉන්න කෘෂිකර්ම විද්‍යාඥයන්. අපි fail වෙලා තිබෙන අනෙක් තැන තමයි එතැන.

දේශපාලනඥයෙක් යම් ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්නවා නම්, හැබැයි ඒක වැරදියි නම්, වැරැද්ද පෙන්වා දෙන්න ඕනෑ. එහෙම නැත්නම් රටට කියන්න ඕනෑ. කෝ, කිව්වාද? කවුරුවත් කිව්වේ නැහැ. මේ අවුරුද්දේ රට බංකොලොත් කියලා පසුගිය අප්‍රේල් මාසයේදී සඳහන් කළාම මොකක්ද වුණේ? Kuwait Fund, JICA ආදී විවිධ මූලාශ්‍රයන්ගෙන් විශ්වවිද්‍යාල පද්ධතියේ හදපු ගොඩනැඟිලිවල වැඩ කටයුතු එහෙමම නැවතුණා. ඒ බව ප්‍රකාශයට පත් කරන්න කලින් රාජ්‍ය මූල්‍යය පිළිබඳව වගකීම තිබෙන පාර්ලිමේන්තුව දැන ගෙන හිටියේ නැහැ. එතැනයි ප්‍රශ්නය තිබෙන්නේ. ඒ ඔක්කෝම කොහේටද ගෙනාවේ? දෙසිය විසිපස්දෙනාගේ කර මතට. දෙසිය විසිපස්දෙනාම ඒ වගකීමෙන් නිදහස් කරන්න කියලා මම කියන්නේ නැහැ. නමුත්, ඒක නොවෙයි ප්‍රශ්නය.

මම දැක්කා, මේ විවාදයේදී සමහර මන්ත්‍රීවරු විරුද්ධ පක්ෂය පැත්තේ ඉඳගෙන ආර්ථිකය ගැන කරුණු කිව්වා. ඒ අය එදා තීන්දු ගන්න තැන අපි නම් හිටියේ නැහැ. මනමාලිව තෝරලා, පොරොන්දම් බලලා, පෝරුවේ නග්ගලා, අතපැන් වත්කරලා ඔක්කෝම කරපු අය විරුද්ධ පක්ෂය පැත්තට ගිහිල්ලා දැන් කියනවා, මනමාලි හරියට හිටියේ නැහැ ලු. ඒ තෝරපු තැන්වල අපි නම් හිටියේ නැහැ. අපි කියන්න ඕනෑ දේ ප්‍රසිද්ධියේ කිව්වා. එහෙම කියලා අපට යම් යම් ප්‍රශ්නවලට මුහුණ දෙන්න වනකොට කවුරුවත් ඒ ගැන කථා කළේත් නැහැ. හැබැයි, දැන් මොකද වෙලා තිබෙන්නේ?

එදා ග්ලයිෆොසේට් තහනම් කරනකොට ආචාර්යවරු පොත් ගෙනැල්ලා පෙන්නුවා. CKDu - Chronic Kidney Disease of Unknown etiology - ගැන කිව්වා. Still it is unknown. මොකක්ද කළේ? ග්ලයිෆොසේට් තහනම් කළා. WHO එකේවත් නිර්දේශයක් තිබුණේ නැහැ. තේ වගාවේ වල් පැළ ඉවත් කරන්න ක්‍රමවේදයක් නැති වුණා. අපේ ජීවන් තොන්ඩමන් මැතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්නවා. එතුමා ඒ ගැන දන්නවා. අද ඒ කටයුත්ත කරන්න ශ්‍රමය නැහැ. මොකද, වල් පැළ අතින් ගලවලා ඉවත් කරන්නද? ගයන්ත කරුණාතිලක මැතිතුමාත් මේ ගැන දන්නවා. තේවලට මොකද වුණේ? වල් පැළ නිසා production එක අඩු වුණා. Export කරන quantity එක අඩු වුණා. වෙනත් රටවල් අපේ තේ වෙළෙඳ පොළ අල්ලා ගත්තා. දැන් ඒකට කවුද වග කියන්නේ? තීන්දු ගත්ත අය නැහැ.

කාබනික පොහොර භාවිතය ක්‍රමානුකූලව අවුරුදු කිහිපයක් තිස්සේ යම් තෝරා ගත්ත ප්‍රදේශයක ආදර්ශයක් හැටියට, sample එකක් හැටියට අත්හදා බලන්න තිබුණා. නමුත්, එහෙම වුණේ නැහැ නේ. එක තීන්දුවෙන් ඒක වෙනස් කළා. අන්තිමට මොකද වුණේ? සියලුම පාරිභෝගික භාණ්ඩවල මිල ඉහළ ගියා, අපනයන සීමා වුණා, අත්‍යවශ්‍ය භාණ්ඩ ආනයනය වැඩි කරන්න සිදු වුණා. ඔන්න, ලැබුණු ප්‍රතිඵලය.

බොහෝ දෙනා ඒ දවස්වල ඒ පැත්තේ ඉඳගෙන උපදෙස් දීලා, ඒවා හරි කිව්වා. හැන්සාඩ් වාර්තා අරගෙන බලන්නකෝ, නැද්ද කියලා. නමුත්, මම පසුගිය අය වැය විවාදයේදීත් මෙතැන ඉඳගෙනයි කිව්වේ, සාර්ව ආර්ථික ප්‍රශ්නවලට ක්ෂුද්‍ර ආර්ථික විසඳුම් නැහැ කියලා. අද ඒක සනාථ වෙලා තිබෙනවා. දැන් සමහරු කියනවා, "අපි ඕවාට වග කියන්නේ නැහැ. අපි ඔතැන නැහැ." කියලා. එහෙම කියලා හරියන්නේ නැහැ. එහෙම කියන්න පුළුවන් ඒ කාලයේ සිටම විපක්ෂයේ සිට අයට. හැබැයි, අනෙක් අයට එහෙම කියන්න බැහැ. දැන් මොකක්ද කරන්න තිබෙන්නේ? මේ ප්‍රශ්නය තේරුම් අරගෙන ඉස්සරහට යන්න ඕනෑ. මම මේ පෙන්නුවේ, ඉතිහාසයේ ඒ වකවානුවල කොහොමද අය වැය ඉදිරිපත් වුණේ, කොහොමද කටයුතු කළේ කියන එකයි.

[ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා]

අද වනකොට කරන්න තිබෙන්නේ මොකක්ද? ඉස්සෙල්ලාම සාමාන්‍ය ජනතාවට ජීවත් වෙන්න පුළුවන් තත්ත්වය හදන්න ඕනෑ. දැන් එතැනත් ප්‍රශ්නයක් මතු වෙලා නේ. මමත් ඒ ගැන ප්‍රශ්න කළා. පොලිය සියයට 36ට ගියාම ව්‍යාපාරිකයා ණය ගන්නේ කොහොමද? අද බැංකුවෙන් TOD එකක් ගන්න බැහැ. ඒ සම්බන්ධයෙන් කොහේවත් සාකච්ඡාවක් වුණේ නැහැ. රජයේ මුදල් පිළිබඳ කමිටුවේ -Committee on Public Financeහි - සාකච්ඡා වුණේත් නැහැ නේ. පාර්ලිමේන්තුවට තමයි රාජ්‍ය මූල්‍යය පිළිබඳ අයිතිය තිබෙන්නේ. දැන් කමිටු ගණනාවක් පිහිටුවන්න යෝජනා කර තිබෙනවා: Committee on Ways and Means, Committee on Banking and Financial Services and Committee on Economic Stablilization. රාජ්‍ය ව්‍යවසායයන් 424ක් තිබෙනවා. එයින්, business enterprises 52ක් තිබෙනවා. 1961 Esso, Shell, Caltex ජනසතු කරලා තමයි ඛනිජ තෙල් නීතිගත සංස්ථාව හැදුවේ. 1980 දශකයේ අග වෙනකල් තෙල් සංස්ථාව ලාභ ලැබුවා. කොහොමද, ඒ ආයතනය පාඩු වුණේ? පාඩු වුණේ, ජනප්‍රිය තීන්දු ගත්ත නිසායි. අපිත් ඒ තැන්වල හිටියා.

තෙල් මිල වැඩි කළේ නැහැ; price formula එක ක්‍රියාත්මක වුණේ නැහැ. තෙල් වැඩි මිලට ගෙනාවා. හැබැයි, අඩු මිලට දුන්නා. රුපියල් 52ක්ව පැවැති දැවි තෙල් - by-product එක - ලීටරය 2012දී ලංකා විදුලිබල මණ්ඩලයට දුන්නේ රුපියල් 27ටයි. ඒ නිසා හැම ලීටරයකින්ම රුපියල් 25ක් පාඩු වුණා. දවසකට ටොන් 3,000ක් දුන්නා විදුලිය නිෂ්පාදනය කරන්න. ගණන් හදලා බලන්න, පාඩුව කොපමණද කියලා. මේ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් වන ප්‍රතිපත්තිමය තීන්දු නිසියාකාරයෙන්, නිසි වෙලාවට නොගැනීම ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ග්ලයිෆොසේට් තහනම ඉවත් කර තිබෙනවා. හැබැයි, යූරියා ගෙන්වනවා. මඩ පොහොරත් එනවාය කියනවා. කොහොම නමුත්, අපි මහ කන්නය සාර්ථක කර ගනිමු. ලෝක ආහාර හිඟයක් ගැන පුරෝකථනය කර තිබෙද්දී ඒකට විසඳුමක් දෙන්න අපට එතැනට යන්න වෙනවා. ඒ නිසා තමයි ආණ්ඩුව ඒ පියවර ගත්තේ.

කොවිඩ්- 19 වසංගතය කාලයේ විදෙස් සංචාරකයන්ගේ පැමිණීම zero වෙලා තිබුණා. දැන් ඒක ක්‍රමානුකූලව වැඩි වෙමින් පවතිනවා. සංචාරක කර්මාන්තයේ, හෝටල් කර්මාන්තය, restaurants ආදී ව්‍යාපාරවල සෘජු හා වක්‍ර වශයෙන් ලක්ෂ 6ක් පමණ රැකියාවේ යෙදී සිටියා. ඒ ක්ෂේත්‍ර බින්දුවටම වැටුණා. ණය ගත්ත අයට ණය ගෙවා ගන්න බැරි වුණා. හැබැයි, දැන් ක්‍රමානුකූලව ඒ අය නැඟිටිනවා. ඒ තත්ත්වය වැඩි කර ගන්න අපට තවදුරටත් පියවර ගන්න සිද්ධ වෙනවා.

ඊළඟට, විදේශ වෙළඳාම - foreign trade - ගැන අපි බලමු. 2019 අග භාගයෙන් ආරම්භ වුණාම 2020, 2021 වසර දෙකේම ජාත්‍යන්තර වෙළඳාම සම්පූර්ණයෙන්ම පසුබෑමකට ලක් වුණා. එහෙම වුණේ අපේ රටේ විතරක් නොවෙයි. නියමිත ආකාරයෙන් අපනයන කටයුතු කරන්න බැරි වුණා. ආනයන කටයුතු සීමා කළා. එහෙම කළේ අපි විතරක් නොවෙයි. විදේශ විනිමය ඉතුරු කර ගැනීම සඳහා ආනයනික භාණ්ඩ අපි සීමා කරනකොට අනෙක් රටවලුත් ඒ පියවරම ගන්නවා. ඒ නිසා එතැන ඒ ප්‍රශ්නය ඇති වුණා.

දැන් අපට මොකක්ද කරන්න වෙලා තිබෙන්නේ? ණය ප්‍රතිව්‍යුහගතකරණය - debt restructuring. දේශීය ණය ප්‍රතිව්‍යුහගත කරන්නේ කොහොමද? ඒක විශාල අභියෝගයක්. ඒක කරන්න ගියොත් මොකද වෙන්නේ? මම ඒ ගැන කියන්න යන්නේ නැහැ. ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමාත් මේ වෙලාවේ සභාවේ ඉන්නවා. එතුමාත් දන්නවා එහෙම කරන්න ගියොත් මොකක්ද අපේ බැංකු පද්ධතියට වෙන්නේ කියලා. අපේ බැංකු පද්ධතිය ලබා දී තිබෙන ණය කපා හරින්න ගියොත්, ප්‍රතිව්‍යුහගත කරන්න ගියොත් මොකක්ද වෙන්නේ? බැංකුවල ද්‍රවශීලතාව අඩු වෙනවා; එදිනෙදා සේවා පවත්වා ගෙන යන්න අමාරු වෙනවා; ගනුදෙනුකරුවන්ට අමාරු තත්ත්වයක් ඇති වෙනවා. අපි ඒක තේරුම් ගන්න ඕනෑ. එහෙම නම් විදේශ ණය ප්‍රතිව්‍යුහගත කරන්න ඕනෑ. ඒක රාජ්‍ය තාන්ත්‍රික සබඳතා තුළ, තාක්ෂණික ක්‍රමවේද අනුවයි කරන්න ඕනෑ. ප්‍රධාන ණයකරුවන් එක්ක සාකච්ඡා කරලා ප්‍රතිව්‍යුහගත කිරීම කරන්න ඕනෑ. ඒකට තමයි අද අපි අවතීර්ණ වෙලා තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, IMF එකෙන් අපි ගන්නේ ආර්ථිකය ස්ථායීකරණය කිරීම සඳහා වූ ණය මුදලක්. ඒ විධියට අපි දහසය වතාවක් IMF එකෙන් ණය අරගෙන තිබෙනවා. 2009 යුද්ධය අවසන් කරනකොට අපේ රටේ සංචිත තිබුණේ කීයද? සති හතරටයි අපේ රටේ සංචිත තිබුණේ. ඊට පස්සේ මොකක්ද වුණේ? IMF එකට ගියා. Stand-by Arrangement එකකින් US Dollars 2.5 billion ගත්තා. ඒක දැම්මා සංචිතයට. එතකොට අපට පුළුවන්කම ලැබුණා, හුස්මක් ගන්න; නැවත වතාවක් ඉදිරියට එන්න.

ණය අරගෙන විතරක් මේ ප්‍රශ්නය විසඳන්න බැහැ. ණය ආපසු ගෙවන්න ඕනෑ නේ. ඉතිහාසයේත් වුණේ ඒකයි. එහෙම නම් අපි කරන්න ඕනෑ මොකක්ද? ආයෝජන ආකර්ෂණය කරගන්න ඕනෑ. ආයෝජන ආකර්ෂණය කර ගැනීමට නම් රට තුළ විශ්වාසයක් ගොඩනැඟෙන්න ඕනෑ. බොහෝ වෙලාවට අපි දකිනවා, mandate එකක් නැහැ කියනවා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා ජනාධිපතිතුමා වුණේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව. තවත් හිටියා නේ contendersලා දෙන්නෙක්. ඒ ඩලස් අලහප්පෙරුම මැතිතුමායි, අනුර දිසානායක මැතිතුමායි. හොඳයි, ඩලස් අලහප්පෙරුම මැතිතුමා දිනුවා නම්, එතකොටත් කියන්න වෙන්නේ ඕකම නේ. ජන වරමක් නැහැ කියලා නේ කියන්න වෙන්නේ. අනුර කුමාර දිසානායක මැතිතුමා දිනුවත් කියන්න වෙන්නේ ජන වරමක් නැහැයි කියලා නේ. එතකොට ජන වරම කොහොමද අර්ථ නිරූපණය කරන්නේ?

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
Sir, I rise to a point of Order.

ගරු ඇමතිතුමනි, එතැන පොඩි වෙනසක් තිබෙනවා නේ. ඩලස් අලහප්පෙරුම මැතිතුමා ඡන්දය ඉල්ලුවේ පොහොට්ටුවෙන්. එතකොට පොහොට්ටුවට ජන වරමක් ලැබුණා නේ. ඩලස් අලහප්පෙරුම මැතිතුමා කියන්නේ, පොහොට්ටුව නියෝජනය කරන අපේක්ෂකයෙක් නේ. රනිල් වික්‍රමසිංහ මැතිතුමාට පාර්ලිමේන්තු මැතිවරණයේදී ඇඩ්සුත් නැහැ නේ. ඒ නිසා එතැන පොඩි වෙනසක් තිබෙනවා. ඒක ඔබතුමා පිළිගන්න එපා යැ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔව්, වෙනසක් තිබෙනවා. නමුත්, අපි දන්නේ නැහැ නේ කවුද අගමැති වෙන්නේ කියලා. සජිත් ප්‍රේමදාස මැතිතුමා අගමැති වුණොත් එතැනත් ජන වරමක් නැහැ නේ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඒ වෙලාවේ ඉල්ලුවේ සර්ව පාක්ෂික ආණ්ඩුවක් නේ. ඒ දෙදෙනා අතරින් ජන වරම ගැන සංසන්දනය -

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔබතුමාට තර්කයක් මතු කරන්න පුළුවන්. එතැන තර්කය වන්නේ එකම පක්ෂයේ අය ඉන්න ඕනෑ කියන කාරණය. ඒක නොවෙයි මා කියන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කොහේවත් කියලා නැහැ ජනවරම ලැබුණු පක්ෂයේ කෙනෙකු ජනාධිපතිවරයා ලෙස ඡන්දයෙන් තෝරා පත් කරන්න ඕනෑ කියලා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඒක දේශපාලන චුවමනාව නේ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
පොඩ්ඩක් ඉන්න. මම කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදනය.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මම කිව්වේ, ජනවරම අනුව.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ජනවරම ගත්තොත්,- *[බාධා කිරීමක්]* අනෙක් අතට, අනුර දිසානායක මන්ත්‍රීතුමා පත් වුණා නම් මොකද වෙන්නේ? එතකොටත් ඔය තර්කය අදාළයි නේ.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
අනුර දිසානායක මැතිතුමාට ජනවරමක් තිබෙනවා නේ, රනිල් වික්‍රමසිංහ මහත්මයා එක්ක සංසන්දනය කරන කොට. රනිල් වික්‍රමසිංහ මහත්මයාගේ පක්ෂය පරාදයි; ඇඩුසුත් නැහැ. එක් මන්ත්‍රීවරයකුවත් පාර්ලිමේන්තුවට තේරී පත් වෙලා ආවේ නැහැ.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඒක ඔබතුමාගේ මතය. නමුත්, මා කියන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ප්‍රතිපාදන අනුව බලනවා නම්, ජනවරම තිබුණු අය එතුමාව ජනාධිපති හැටියට පත් කර තිබෙනවා. එච්චරයි. *[බාධා කිරීමක්]* ඔව්, පොහොට්ටුවේ බහුතරයක් නොතිබුණා නම් එතුමා පත් වෙන්නේ නැහැ නේ. *[බාධා කිරීමක්]*

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ව්‍යවස්ථානුකූලව හරි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔව්, ව්‍යවස්ථානුකූලවත් හරි. ජනවරම අනුව ගත්තත් පොහොට්ටුවෙන් තමයි වැඩිපුර ඡන්ද ප්‍රමාණය හම්බ වුණේ. ජනවරම දුන්නේ කොහොමද? *[බාධා කිරීමක්]* තනි තනිවත්, පක්ෂ හැටියටත් ඡන්ද හම්බ වුණා. ඒ ඒ පක්ෂයට තිබුණු ජනවරම අනුව තමයි ව්‍යවස්ථානුකූලව ජනාධිපතිවරයා පත් කරගෙන තිබෙන්නේ. මම කියන්නේ එච්චරයි.

මේ සභාවේදී කියැවුණා 1977න් මෙපිට ගැන. එහෙම නම් 1970 ඉඳන් 1977 වනකල්ම ගන්න පුළුවන්නේ. හැබැයි, 1970-1977 ආණ්ඩුව කරන්න ගන්න කොට මොකද වුණේ? 1971 කැරැල්ල ආවා. එදා මොකක්ද වුණේ? 10,000ක් මිය ගියා, 12,000ක් පුනරුත්ථාපනය කළා. එතකොට ආර්ථිකය පසුබැස්සේ නැද්ද? ඒක හරි නම්, ඒ හරි දේට බාධා වුණේ කොහොමද? අපට 1971දී සාමාන්‍ය පෙළ විභාගය ලියන්න වුණේ කල් ගිහින්. ඊළඟට, 1988, 1989, 1990 කාලය අරගෙන බලන්න. අද බොහෝදෙනා මිලේච්ඡ ලෙස කථා කරනවා. ඒ කාලයේ හදිසි නීතිය යටතේ, - ඔබතුමා දන්නවා, ගරු ඩිලාන් පෙරේරා මන්ත්‍රීතුමා - වෙනම panel එකක් තිබුණා. Bail application එක දාලා panel එකට යන්න ඕනෑ, උසාවියට කලින්. එතැනින් අනුමැතිය දෙනකල් හදිසි නීතිය යටතේත්, - PTA යටතේ නොවෙයි - ඇප දුන්නේ නැහැ. මෙහේට බෝම්බ ගහපු නඩුවේ විත්තිකාරයෝ 5දෙනා නිදහස් වුණා. නිදහස් වුණාට පස්සේත් අවුරුදු දෙකහමාරක් DO ගහලා රිමාන්ඩ් එකේ තිබ්බා. ඒ නිසා අපි පොඩ්ඩක් ඉතිහාසය ගැනත් සඳහන් කරන්න ඕනෑ. ඒවා හරි කියන එක නොවෙයි මා කියන්නේ. දැන් Counter Terrorism Bill එක ලැහැස්තියි. *[බාධා කිරීමක්]* ඉතින්? ඇයි, මේ වාසුදේව නානායක්කාර මැතිතුමාත් හිටියේ. ඒ වකවානු තුළ ඒවා සිදු වෙලා, දැන් ඒ වකවානු පහු කරලා ඇවිත් තිබෙන්නේ. මම ඒ පෙන්වා දුන්නේ ඉතිහාසයේ ආර්ථිකයේ වෙනස්කම් වුණේ කොහොමද කියලා.

දැන් මේ තිබෙන ප්‍රශ්නයෙන් ගොඩ යන්න නම් අපට සිද්ධ වෙනවා යම් නිශ්චිත කාල සීමාවක් දක්වා ප්‍රතිපත්තිමය තීන්දු අරගෙන, ඒ ප්‍රතිපත්තිමය තීන්දු මත ආර්ථිකය ස්ථාවර කරගන්න. එසේ ආර්ථිකය ස්ථාවර කරගැනීමෙන් තොරව වෙනත් ක්‍රියා මාර්ගවලට ගියොත් අවසාන ප්‍රතිඵලය විධියට අද තිබෙන දේත් අපට නැති වෙනවා.

අවසාන වශයෙන් මම තව එක කාරණයක් සඳහන් කළ යුතුයි. මම හැම දේකටම "Yes" කියන්නේ නැහැ. ඒක මගේ ප්‍රතිපත්තිය. මම එදාත් කිව්වා වැරදි දේ වැරදියි කියලා. අදත් මගේ මතය තමයි, මේ තරම් ඉහළට පොලී අනුපාතය ගෙන යෑම ගැන මම එකඟ නැහැ කියන එක. මොකද, ආර්ථික විද්‍යාවේ මොකක් හරි දෙයක් අපිත් දන්නවා නේ. මම ඒකයි එහෙම කිව්වේ. මේ හැම දෙයක් ගැනම බලන්න ඕනෑ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. පහළ මට්ටමේ ඉන්න ජනතාව කොහොමද ජීවත් වෙන්නේ? එම ජනතාව ආහාර සපයාගන්නේ කොහොමද, රැකියාවට යන්නේ කොහොමද, එදිනෙදා ජීවත් වෙන්නේ කොහොමද? මේ ප්‍රශ්නත් එක්ක තමයි ප්‍රතිපත්තිමය තීන්දු ගන්න ඕනෑ. ඒ නිසා මේ ගැන සාකච්ඡා කරන්න හොඳම තැන මේ ගරු සභාව. හැකි ඉක්මනින් මේ පොලී අනුපාතය පහළට ගෙන එන්න ඕනෑ. මුදල් ගලා යන්න සලස්වන්න වෙනවා. හැබැයි, යම් කාලයක් අවශ්‍ය නම්, මාස දෙකතුනක් ගන්න පුළුවන්. ඒ කාල සීමාව තුළ ජනතාවට ඒ පීඩනය දරාගෙන ඉන්න වෙනවා. හැබැයි, දරාගෙන ඉන්න පුළුවන් සීමාවක් තිබෙනවා. අපි ඒක තේරුම් ගන්න ඕනෑ. මේක ආර්ථික විද්‍යා න්‍යායෙන් පමණක් කරන්න බැහැ. මේක දේශපාලන වශයෙන් සමාජයේ, ජනතාවගේ මනෝභාවයන් තේරුම් ගෙන යන්න ඕනෑ ගමනක්. එහෙම නැති වුණොත් මීටත් වඩා විනාශයකට යන්න ඉඩ තිබෙනවා. ස්තුතියි.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
ගරු අධ්‍යාපන ඇමතිතුමනි, මට පැහැදිලි කරගැනීමක් අවශ්‍යයි. ගුරුවරුන්ට සුදුසු සහ පහසු ඇඳුමකින් පාසල් ඒමට ඉඩ දිය යුතුය කියා NGO වෘත්තීය සමිති නායකයෙක් යෝජනාවක් කරලා තිබුණා. ඔබතුමා ඉතා දැඩිව කියා තිබුණා, ඒකට කිසිසේත් ඉඩ දෙන්නේ නැහැ කියලා. නමුත් ඊයේ මාධ්‍ය හෙළිදරව් කරනවා අපි දැක්කා, ගුරුවරුන් කීපදෙනෙකු - මා දන්නේ නැහැ, ඒ අය ගුරුවරුද, ගුරුහොරුද කියලා - දැනට භාවිත කරන ඇඳුම වෙනුවට වෙනත් ඇඳුමකින් සැරසී පාසලට ඇවිල්ලා හිටපු බවක්. ගරු ඇමතිතුමනි, විශේෂයෙන් NGO බත් බැලයෙකු වන ජෝසප් ස්ටාලින් කියපු කාරණය ගැන ඔබතුමා නැවත නැවත කී කථාව මේ මුළු පාර්ලිමේන්තුවම අනුමත කළා කියලායි අප විශ්වාස කරන්නේ. ඒකට කවුරුවත් විරුද්ධ වුණේ නැහැ. ඒ වෙනුවෙන් හැමෝම එකඟතාව පළ කළා. මහා සංඝ රත්නය,-

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ඔබතුමා කියන කාරණය මට තේරෙනවා, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජයන්ත සමරවීර මහතා**
(மாண்புமிகு ஜயந்த சமரவீர)
(The Hon. Jayantha Samaraweera)
ගරු ඇමතිතුමනි, ඔබතුමා පාර්ලිමේන්තුවේදී දැඩිව කිව්වා, එම ඇඳුම වෙනස් කරන්න කිසිසේත් ඉඩ දෙන්නේ නැහැ කියලා. ඔබතුමා කී ඒ කථාවට කිසිම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු මේ ගරු සභාවේදී විරෝධය පළ කළේ නැහැ. ඒ කියන්නේ, ඔබතුමා කියපු කාරණයට මේ සියලුදෙනා එකඟයි කියන එකයි. ඒක පාර්ලිමේන්තුවම කියපු දෙයක්. නමුත්, NGO බත් බැලයෙකු වෙච්ච ජෝසප් ස්ටාලින් තම යෝජනාව ගැන දැන් නැවත නැවත කියමින් ගුරුවරුන් මේ තත්ත්වයට පත් කිරීමට ප්‍රයත්නයක් දරනවා. ගුරුවරයෙකු, දෙන්නෙකු ඒ කීමට හසු වෙලා තිබෙනවා. මා හිතන්නේ නැහැ, ඒ අය ගුරුවරු කියලා. ඒ, ගුරුහොරු. ඒ අයට විරුද්ධව ඔබතුමා ගන්නා ක්‍රියා මාර්ගය ගැන පැහැදිලි කරන්න පුළුවන් නම් හොඳයි.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
මා ඉතා පැහැදිලිව මේ කාරණය කියන්න ඕනෑ. මේ කාරණය පිළිබඳව හැම තිස්සේම වාගේ සඳහන් කරන්නේ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 5/2022 අනුවයි. ඒ කියන්නේ, කොවිඩ්-19 වසංගතය තිබුණු කාලයේදී රාජ්‍ය සේවකයන්ට පහසු ඇඳුමක් ඇඳගෙන රැකියාවට එන්න කියා තමයි ඒ චක්‍රලේඛයේ තිබුණේ. රාජ්‍ය සේවකයන් කියන්නේ කාර්යාල සේවකයන්. ඒක පැහැදිලි කරගන්න ඕනෑ. ඒක තමයි චක්‍රලේඛයේ තිබෙන්නේ. පහසු ඇඳුමකින් එන්න පුළුවන් කියන කාරණයේදී මේ චක්‍රලේඛය තමයි ඉස්සරහට ගන්නේ.

හැබැයි, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයට වාගේම ගරු අගමැතිතුමාට මා දැනුම් දුන්නා, මේ චක්‍රලේඛය නිසියාකාරව නැවත සකස් කරන්න කියලා. මොකද, මේ චක්‍රලේඛයේ තිබෙන්නේ 'රාජ්‍ය සේවකයන්ට' කියලා නේ. රාජ්‍ය සේවකයන් කිව්වාම ගුරුවරුත් රාජ්‍ය සේවකයෝ.

අධ්‍යාපන අමාත්‍යාංශයේ චක්‍රලේඛයක් තිබෙන්නේ ආචාර ධර්ම ගැනයි. හැබැයි, නිල ඇඳුම ගැන එහෙම සඳහනක් නැහැ. ඒ නිසා මා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයේ අවධානයට යොමු කළා, ඒ අවශ්‍ය සංශෝධනය සහ පැහැදිලි කිරීම කරන්න කියලා. එතකොට ඒ කාරණය පිළිගන්නවා.

මා නම් දැකපු හැටියට -බැලූ බැල්මට- ඒ රූප රාමු, පාසල්වල රූප රාමු නොවෙයි. නමුත්, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඒ චක්‍රලේඛය ගැන පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. ඉන් පස්සේ ඇති වන තත්ත්වය මොකක්ද කියා අපි බලමු.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කියන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)
ඇත්තටම ප්‍රශ්නය තිබෙන්නේ ගුරුවරියන් සාරිය අඳිනවාද, නැද්ද කියන එක ගැන නොවෙයි, ගරු ඇමතිතුමා. ඊළඟ අවුරුද්දේ ළමයින්ට පාසල් යන්න අවශ්‍ය ඇඳුම් ටිකයි, පොත් ටිකයි අරගෙන දීම සම්බන්ධයෙනුයි ප්‍රශ්නය තිබෙන්නේ. ගුරුවරියන්ගේ සාරිය පිළිබඳ ප්‍රශ්නය නොවෙයි අද අධ්‍යාපනය සම්බන්ධයෙන් තිබෙන ලොකුම ප්‍රශ්නය. දරුවන්ට පොත් ටික අරගෙන දෙන්නේ කොහොමද? අද පෑනක් කීයද? Exercise book එකක් කීයද? School bag එකක් කීයද? ඒවා තමයි තිබෙන ප්‍රශ්න.

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
අප ඒ ප්‍රශ්නය කෙරෙහි අවධානය යොමු කර තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා. නිල ඇඳුම් ටික අනිවාර්යයෙන් නොමිලේ ලබා දෙනවා. පෙළ පොත් ටික මුද්‍රණය කිරීම ආරම්භ කර තිබෙනවා, පෞද්ගලික අංශය සහ රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව විසින්.

විශේෂයෙන්ම මා කැබිනට් මණ්ඩලයට note එකක් ඉදිරිපත් කර තිබෙනවා, සෙස් බද්ද හා සම්බන්ධ කාරණයට අදාළව. එය ලබන අවුරුද්දේ ගන්නවා. මොකද, හැම අභ්‍යාස පොතකටම අවශ්‍ය කොළ ගෙන්වන්න වෙන්නේ ඉන්දියාවෙන්. ඒවා මෙහේ හදන්නේ නැහැ. සෙස් බද්දක් පනවන්නේ රටේ කරන නිෂ්පාදනවලට දෙන රැකවරණයක් හැටියට. හැබැයි, මේ ඔක්කොම අභ්‍යාස පොත් හදන්නේ කඩදාසි ආනයනය කරලා. මෙහේ ඒ කොළ නිෂ්පාදනය කරන්නේ නැහැ නේ. ඇඹිලිපිටියේ, වාලච්චේනේ කර්මාන්තශාලාවල කොළ නිෂ්පාදනය කරන්නේ නැහැ, අභ්‍යාස පොත් සකස් කරන්න. මා ඒ කාරණය කෙරෙහි අවධානය යොමු කර තිබෙනවා.

සමෘද්ධි විෂයය අදාළ ඇමතිතුමා එක්ක සාකච්ඡා කරලා, අඩු ආදායම්ලාභීන්ට සහනයක් ලබා දෙන්න වාගේම පොදුවේ මේ සෙස් බද්ද පිළිබඳව අවධානය යොමු කරලා කටයුතු කරන්නත් මා බලාපොරොත්තු වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12.49]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ වත්මන් ජනාධිපතිතුමා පොහොට්ටු ආණ්ඩුවේ මුදල් අමාත්‍යවරයා ලෙස පොදුජන එක්සත් පෙරමුණ ආණ්ඩුවේ තුන්වන අය වැය ඉදිරිපත් කරද්දී මට මතක් වුණා, හරියටම මීට වසර තුනකට පෙර නොවැම්බර් මාසයේ මේ වාගේ කාලයකදී ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති වෙලා විශ්වය පුරා පොදුජන ජය රාවය විහිදී ගිය හැටි. මා හිතන්නේ ඔබතුමාටත් ඒ වදන් හොඳට මතක ඇති, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශ්වය පුරා විහිදී ගියා, පොදුජන ජය රාවය. නමුත්, අවුරුදු තුනක් පිරෙන කොට රාජපක්ෂ පාලනයේ ප්‍රතිඵලය හැටියට අපේ රටින් විශ්වය පුරාවටම විහිදී යන්නේ මිනිසුන්ගේ අඳෝනා පිරුණු දුක් ගිනි රාවයයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම මට මතක් වෙනවා, මීට අවුරුදු තුනකට ඉස්සෙල්ලා ජනාධිපතිවරණය වෙලාවේදී කියපු දේවල්. "ඡන්දය දෙන්න යනකොට ගෙදර ඉන්න දරුවන්ගේ මුහුණු බලලා ගිහිල්ලා, ඒ දරුවන්ගේ අනාගතය වෙනුවෙන් පොහොට්ටුවට කතිරය ගහන්න" කිව්වා. නමුත්, එහෙම පොහොට්ටුවට කතිරය ගහපු මිනිස්සු දැන් අවුරුදු 3කට පස්සේ දරුවන්ගේ මුහුණු දිහා බල බලා පසුතැවෙන හැටි තමයි රට පුරාම අපට අහන්න, දකින්න ලැබෙන්නේ. මේ අය වැය ලේඛනය පොදුජන පෙරමුණ ආණ්ඩුවේ අසාර්ථකත්වය විස්තර කෙරෙන තවත් පරාජිත ප්‍රකාශයක් විධියටයි අපි දකින්නේ. තනි මන්ත්‍රී ධුරයක් ගත්ත පක්ෂයකට මුවාවෙලා, තමන් අතින් රටටත්, අනාගත පරම්පරාවටත් වෙච්ච බරපතළ වැරදි ගැන සිහිපත් කරමින් පශ්චාත්තාප වෙනවා හැරෙන්න, අඩු තරමින් අය වැය කථාව පුරාවටම අතරින් පතරවත් අත්පුඩියක් ගහන්න බැරිව අන්ත අසරණ වෙලා බලාගෙන ඉන්න ආණ්ඩු පක්ෂයක් තමයි අපිට අය වැය කථාව වෙලාවේදී දකින්න ලැබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා මෙදා තුර ඉතිහාසයේ රටක් හැටියට ඉතාම බරපතළ අර්බුදකාරී අවස්ථාවකට මේ රජය විසින් අපේ රටේ ජනතාව ඇද දමා තිබෙන මොහොතක, අඩු තරමින් මේ වාගේ වෙලාවකදීවත් අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට ඒක යථාර්ථය පිළිබිඹු කරන ශාස්ත්‍රීය ලේඛනයක් වෙයි කියලායි රට බලාගෙන හිටියේ. නමුත්, මෙවරත් ඉදිරිපත් කළේ සුපුරුදු පරිදිම රචනාවක් විතරයි. මේ වාගේම රචනාවක් මීට මාස කිහිපයකට ඉස්සෙල්ලා අතුරු අය වැය කියලාත් මේ සභාවට ඉදිරිපත් කළා අපට මතකයි. හැබැයි, ඒ රචනාවේ තිබුණු යෝජනා මේකේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඇත්ත වශයෙන්ම මේ අය වැය රචනාව තුළ තිබෙන්නේ අතීත විලාප සහ අනාගත මනෝ රාජ්‍යයක් විතරයි. වර්තමානයේ ජනතාව මුහුණ දෙන දැවෙන ප්‍රශ්නවලට විසඳුම් කිසිවක් මේ අය වැයේ නොතිබීම ගැන අපි කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය පොතේ 9වැනි පිටුවේ "සාර්ව රාජ්‍ය මූල්‍ය රාමුව" ගැන කරපු විග්‍රහය දෙස බලන්න. එතැනදී කියනවා, රාජ්‍ය ආදායම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 15ක් දක්වා වැඩි කරනවා කියලා. හැබැයි, ඒක කරන්නේ 2025 වසරේදී ලු. ඊළඟට කියනවා, සියයට 2කට වැඩි ප්‍රාථමික අතිරික්ත දළ දේශීය නිෂ්පාදිතයෙන් අත්පත් කර ගන්නා බව. ඒක කරන්නේත් 2025දී ලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් මේ අය වැය ඉදිරිපත් කරපු ජනාධිපතිතුමාගේ ධුර කාලය තිබෙන්නේ 2024 වෙනකම් විතරයි කියලා ඔබතුමාත් දන්නවා. ඒ වාගේම, 2025 වෙනකොට අද මේ ඉන්න ඇමතිවරු සහ මේ රජයේ ඉන්න මන්ත්‍රීවරුන්ගෙන් හතරෙන් එකක්වත් මේ ඉලක්ක සපුරා තිබේ දැයි ප්‍රශ්න කරන්න මේ සභාවේ ඉන්න එකකුත් නැහැ. එතකොට මේ ඉලක්ක සපුරා තිබේ දැයි ප්‍රශ්න කරන්න වෙන්නේ මේ අයගේ ගෙවල්වලට ගිහිල්ලාද? 2025දී වත්, 2048දී වත් බිහි වන මනෝ රාජ්‍යය ගැන නොවෙයි ජනතාව බලාගෙන සිටියේ. තමන්ගේ දැවෙන ප්‍රශ්නවලට 2023 වසරේ දී මේ අය වැයෙන් ලබාදෙන විසඳුම් මොනවාද කියලායි මහජනයා බලාගෙන හිටියේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආණ්ඩුවට මිනිස්සු මුහුණ දෙන ප්‍රශ්න ගැන අවංක හැඟීමක් තිබුණා නම්, බැංකු ණය ගෙවා ගන්න බැරිව සිටින මිනිස්සුන්ට කුමන හෝ සාධාරණ ක්‍රමවේදයක් සලසන්න යුතුකමක් තිබුණා. අපි දන්නවා, ණය අරගෙන ආණ්ඩුවට වෙච්ච දේම තමයි, අද විවිධ හේතු මත ණය ගත්ත ජනතාවටත් සිද්ධ වෙලා තිබෙන්නේ කියලා. වාහනයක් මිලට ගන්න, ව්‍යාපාරයක් කරන්න, ගෙයක් දොරක් හදාගන්න, දරුවන්ට උගන්වන්න ණයක් ගත්තා නම්, අද ඒ මිනිස්සුන්ටත් සිදු වෙලා තිබෙන්නේ ආණ්ඩුවට වෙච්ච දේම තමයි. රජය ණය ගෙවා ගන්න බැරිව ලෝකය වටේට වැඳ වැටෙනවා; මේ ණය ප්‍රතිව්‍යුහගත කර ගන්න කථා කරනවා. මේ රජයේ වැරදි ආර්ථික ප්‍රතිපත්ති නිසා, වංචා දූෂණ නිසා සහ හිටු කියලා සල්ලි අච්චු ගහපු නිසා ජනතාවගේ සියලුම ආදායම් මාර්ග මේ ආර්ථික අර්බුදය හමුවේ අද ඇන හිටලා තිබෙනවා. රජයේ සියලුම පව්වලට ජනතාවට කර ගහන්න සිදු වෙලා තිබෙනවා. ඒ නිසා ජනතාවගේ ව්‍යාපාර කඩා වැටිලා; ආදායම් මාර්ග ඇන හිටලා; ණය උගුලක මිනිස්සු හිරවෙලා තිබෙනවා. ආණ්ඩුවට වාගේම ජනතාවටත් ණය ගෙවා ගන්න බැරි නිසා තමන්ගේ ණය ප්‍රතිව්‍යුහගත කර ගන්න ක්‍රමයක් ජනතාව බලාපොරොත්තු වුණා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ජනතාව ආණ්ඩුවක් පත් කර ගන්නේ තමන්ට තනිවම කර ගන්න බැරි වැඩ කර ගන්නයි. හැබැයි, ඒවා අද ආණ්ඩුව පැත්තෙන් ජනතාවට ඉටු වෙන්නේ නැහැ. ණය ගන්නකොට තිබුණු පොලියට වඩා තුන්හතර ගුණයක් පොලිය වැඩි කර තිබෙනවා.

ආණ්ඩුවට නම් අඩු ගණනේ උද්ධමනය ජනතාව පිට පටවලා සල්ලි අච්චු ගහන්න හෝ පුළුවන්කමක් තිබෙනවා. නමුත්, ජනතාව මොකක්ද කරන්නේ? ගෙදර සල්ලි අච්චු ගහන්නද? සල්ලි ගස්වලින් කඩන්නද? සල්ලි අච්චු ගහන එක ගැන විවිධ විශාරදයෝ, වර්තමානයේ ආර්ථික ඝාතකයෝ හැටියට රට හඳුනාගෙන තිබෙන උදවිය මේ සභාවේ කථා කරපු හැටි අපට මතකයි. සල්ලි අච්චු ගහන එකෙන් ආර්ථිකයට කිසිම බලපෑමක් වෙන්නේ නැහැ කියලා එදා ඒ ආර්ථික ඝාතකයෝ මේ සභාවේ කියපු හැටිත් මට මේ වෙලාවේ මතක් වෙනවා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

ගරු මන්ත්‍රීතුමා, ආර්ථික ඝාතකයෝ දැන් පොත් ලියනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)

ඔව්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලක්ෂ 14ක් පමණ වූ රාජ්‍ය සේවකයෝත් බලාගෙන සිටියා, මෙවර අය වැයෙන් තමන්ගේ අමාරුකම්වලට යම් සහනයක් ලැබෙයි කියලා. හැබැයි, රාජ්‍ය සේවකයන් සහ විශ්‍රාමිකයන් ගැන වචනයක්වත් කථා කරන්නේ නැතුව, ඒ අපවාදයෙන් මිදෙන්න විතරක් රාජ්‍ය සේවකයෝ ගැන යම් හැඟීමක් තිබෙන බව පෙන්වන්න උත්සාහ කළා. "ප්‍රවාහන වියදම ඉහළ යෑම, විදුලිබල හා ජල ගාස්තු වැඩි වීම හා අධික ආහාර උද්ධමනය හේතුවෙන් මාසික වැටුප තුළ වියදම් කළමනාකරණය කර ගැනීමේ දී, රජයේ සේවකයන් හා

[ගරු ගයන්ත කරුණාතිලක මහතා]

විශ්‍රාමිකයන් ඉතා අසීරු තත්ත්වයකට පත්ව සිටින බව මා හොඳින් අවබෝධ කර ගෙන සිටිනවා" කියන වාක්‍යය විතරක් අර අපවාදයෙන් මිදෙන්න අය වැය ලේඛනයට ඇතුළත් කරලා තිබෙනවා. ඒ වාගේම තමයි පෞද්ගලික අංශයත්. පෞද්ගලික අංශයේ හැටදෙලක්ෂයක් විතර පිරිසක් සේවය කරනවා. දැන් ඔවුන්ගෙන් ලක්ෂ 20කගේ විතර රැකියා නැතිවෙලා තිබෙනවා. ඔවුන් අන්තිම අසරණ තත්ත්වයට වැටිලා තිබෙනවා.

අය වැයේදී විශ්‍රාමිකයන්ව අමතක වුණා. තමන්ට තිබෙන අපහසුතා ගැන, තමන්ට සිදු වන අසාධාරණකම් ගැන වැඩ වර්ජන කරන්න, පෙළපාළි යන්න හැකියාවක් නැති, ගෙවල්වලට වෙලා තමන්ගේ ජීවිතයේ සැඳෑ සමය ගත කරන, මේ රටට සුවිශාල සේවයක් ඉෂ්ට කළ පිරිසක් වන එම විශ්‍රාමිකයන් ගැන රජයට අමතක වුණා. විශේෂයෙන්ම ජනාධිපතිතුමා පෞද්ගලිකව දන්නා කාරණයක් තමයි, 2016 ජනවාරි 01වැනිදා ඉඳලා 2019 දෙසැම්බර් 31 දක්වා විශ්‍රාම ලැබූ 100,869ක් විශ්‍රාමිකයන්ට යහ පාලන රජය විශ්‍රාම වැටුප් ප්‍රදාන පත්‍රයකින් ප්‍රදානය කරපු වැටුප, 2020 ජනවාරි 01වැනිදා ඉඳලා ඔවුන්ට ලබා දෙන්න එතුමා අගමැති හැටියට කටයුතු කරනකොට අතුරු සම්මත ගිණුමෙන් පවා මුදල් වෙන් කළ බව. හැබැයි, මේ ආණ්ඩුව ඇවිල්ලා කැබිනට් පත්‍රිකාවකින් ඒක අත්හිටෙව්වා. ඒකෙන් මේ විශ්‍රාමික පිරිසට විශාල අසාධාරණයක් සිදු වෙලා තිබෙනවා. සමහරු 2020 දී විශ්‍රාම වැටුප වැඩි වෙයි කියලා හිතාගෙන ණයත් ගත්තා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශ්‍රාමිකයන් කිව්වාම බොහොම ගෞරවාන්විතව සිටින පිරිසක් බව තමුන්නාන්සේ දන්නවා. ඒ අය බෙහෙත් ටික ගන්න, කෑම බීම ටික ගන්න, වන්දනා ගමනක් යන්න, දරුවන්ට උගන්වන්න, දරුවන්ට යුතුකම් ඉටු කරන්න, පිනක් දහමක් කර ගන්න විශ්‍රාම වැටුප තමයි පාවිච්චියට ගන්නේ. අද තිබෙන තත්ත්වය යටතේ විශ්‍රාමිකයන්ට බෙහෙත් ටික ගත්තොත් ආහාර ටික ගන්න බැහැ. ආහාරවලට වියදම් කළොත්, බෙහෙත් ටික ගන්න බැහැ. මේ දෙකෙන් එකක් හෝ නැති වුණොත් ජීවත් වීමේ ප්‍රශ්නයක් තිබෙනවා. වර්තමාන ජනාධිපතිවරයා අගමැති හැටියට සිටි කාලයේ තමයි මෙම විශ්‍රාම වැටුප් වැඩි කිරීම සිද්ධ කළේ. නමුත්, එතුමා අද ජනාධිපති විතරක් නොවෙයි, මුදල් ඇමතිවරයා වෙලාත් අය වැය ඉදිරිපත් කරනකොට ඒක අමතක වීම ගැන අපි කනගාටු වෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආර්ථික අර්බුදය අපේ දරුවන්ටත් විශාල බලපෑමක් කරනවා. ළමා මන්දපෝෂණයෙන් අපි ලෝකයේ 6වැනි තැනට ඇවිල්ලා. ආර්ථික අර්බුදය නිසා පීඩා විඳින මානුෂීය ආධාර අවශ්‍ය කරන පිරිස ලක්ෂ 57ක් කියලා UNICEF සංවිධානය පෙන්වා දෙනවා. දරුවන් පනස් හත්ලක්ෂයක් දෙනාගෙන් විසි දෙලක්ෂයක්ම මන්දපෝෂණයෙන් පෙළෙන බවත්, ඒ අතරින් හදිසි ප්‍රතිකාර ලැබිය යුතු දරුවන් සංඛ්‍යාව 56,000ක් බවත් එම සංවිධානය පෙන්වා දී තිබෙනවා. මේක බරපතළ ප්‍රශ්නයක්. මන්දපෝෂණය තුරන් කිරීම සඳහා මිලියන 500ක් ලබා දෙනවා කිව්වා. ජාතික පෝෂණ වැඩසටහනට මේ අය වැයෙන් රුපියල් මිලියන 12,275ක් වෙන් කර තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ මේ බරපතළ ප්‍රශ්නය ඉලක්කම්වලට, කථාවලට සීමා කරන්නේ නැතුව කඩිනම් වැඩ පිළිවෙළකුත් එක්ක මේ කටයුත්ත ආරම්භ කිරීම අත්‍යවශ්‍යයි කියන එකයි.

මේ ගරු සභාවේදීත් කියැවුණා වාගේ, දරුවන්ගේ පාසල් උපකරණවල මිල තුන් ගුණයකින් විතර වැඩිවෙලා තිබෙනවා. පාසල් දරුවන් රුපියල් 5,000ට ගත් පොත් ලැයිස්තුව සඳහා දැන් රුපියල් 15,000ක් ගෙවන්න ඕනෑ. අභ්‍යාස පොත්, CR පොත්, පෑන්, පැන්සල්, සපත්තු කුට්ටම්, පාසල් බෑග්වල මිල අද දරාගන්න බැහැ.

දරුවෝ දෙන්නෙක්, තුන්දෙනෙක් ඉන්න ගෙවල්වලට ඒ මිල වැඩි වීම ඉතා ලොකු ප්‍රශ්නයක්. ඒක නිසා රජය ඒවාට විසඳුම් ලබා දිය යුතුව තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රජය බලයට ආපු දවසේ ඉඳලාම පීඩාවට පත් වුණු පිරිසක් තමයි, ජනතාවට බත සපයන ගොවි ජනතාව. මේ රජය ගත් - දැන් සභානායකතුමාත් ඒ ගැන කිව්වා - අදූරදර්ශී ක්‍රියාමාර්ග නිසා, විශේෂයෙන් රසායනික පොහොර ආනයනය එක රැයකින් තහනම් කරපු තීරණය නිසා ගොවි ජනතාව අන්ත අසරණ වුණා. අදටත් ඒ අය ඒකෙන් පීඩා විඳිනවා. ගොවි පවුල් ලක්ෂ 18ක් වී වගාවේ නිරතව සිටින රටක්, ශ්‍රී ලංකාව. පොහොර ප්‍රශ්නය නිසා වී වගාවේ විශාල පසුබෑමක් ඇති වුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වී නිෂ්පාදනය දිහා බැලුවොත් කොච්චර නිෂ්පාදන ප්‍රමාණයක් අඩු වුණාද කියලා අපට බලාගන්න පුළුවන්. 2020/2021 මහ කන්නයේ විතරක් මෙට්‍රික් ටොන් මිලියන 3.1ක්ව තිබුණු වී නිෂ්පාදනය, 2021/2022 මහ කන්නය වෙනකොට මෙට්‍රික් ටොන් මිලියන 1.9කට අඩුවෙලා තිබෙනවා. ඒ කෙටි කාලය ඇතුළත විතරක් වී නිෂ්පාදනයේ සියයට 36.9ක අඩුවීමක් තිබෙනවා. තවමත් නිසි වෙලාවට, නිසි පරිදි පොහොර නැහැ. ඇමතිවරුන්ගේ කථාවලයි, රාජ්‍ය මාධ්‍යයේයි පොහොර තිබුණාට වැඩක් නැහැ. ගොවි ජනතාව අතරට, ගොවිපොළට පොහොර යන්න ඕනෑ. ඒක නිසා අපි ආණ්ඩුවට කියනවා, පොහොර අඛණ්ඩව ලබා දීමට ක්‍රමවත්, විධිමත් වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. පොහොර ලබා දීම සඳහා 2023 වර්ෂයේවත් ඒ වැඩ පිළිවෙළ ඇති කරයි කියා අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunatilleka)
අමතරව මට තව විනාඩි දෙකක් ලබා දෙන්නම් කියා ලක්ෂ්මන් කිරිඇල්ල මන්ත්‍රීතුමා කිව්වා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනෙකුත් ක්ෂේත්‍ර දිහා බැලුවත් ඒ වාගේම තමයි. ධීවරයෝ ගැන, වතු කම්කරුවෝ ගැන, අපේ ප්‍රදේශයේ සිටින කුඩා තේ වතු හිමියෝ ගැන බැලුවත් ඔවුන්ට මේ අය වැයෙන් මොකුත් ලැබිලා නැහැ. විපක්ෂ නායකතුමාත් නිතරම කියනවා වාගේ දැන් සිමෙන්ති මිල ඉතා අධිකයි. යකඩවල මිලත් දවසින් දවස වැඩි වෙනවා. ඒක නිසා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශාල කඩා වැටීමක් තිබෙනවා. මේ වෙනකොට බොහෝ පිරිසකගේ රැකියා අහිමි වීම නිසා ආදායම් නැති වෙලා තිබෙනවා. පෙදරේරුවන්, කම්කරුවන්, කුඩා ලොරි රථ හිමියන්, ට්‍රක් රථ හිමියන් කියන මේ කිසිවෙකුටත් සැලකිය යුතු විසඳුමක් රජය පැත්තෙන් ලැබිලා නැහැ.

මේ අය වැයෙන් ජනාධිපතිතුමා කුරුඳු වගාව ගැන විශේෂයෙන් සඳහන් කිරීම ගැන මම බොහොම සන්තෝෂ වෙනවා. මම නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කය තමයි ලංකාවේ වැඩියෙන්ම කුරුඳු වගාව සහ කුරුඳු නිෂ්පාදනය කරන ජනතාව ඉන්නේ. එයිනුත් කරන්දෙණිය, බටපොල, මීටියාගොඩ, අම්බලන්ගොඩ, ඇල්පිටිය වැනි ප්‍රදේශවල බහුලව මේ වගාව සිදු වෙනවා. ජනාධිපතිතුමා සඳහන් කළා, කරන්දෙණිය ප්‍රදේශය මුල්

කරගෙන කුරුඳු වගාව සඳහා වෙනමම දෙපාර්තමේන්තුවක් ආරම්භ කරන්න රුපියල් මිලියන 200ක් වෙන් කරනවා කියලා. ඒක හොඳ යෝජනාවක්.

මට මතකයි, මේ සභාව නියෝජනය කරපු ඒ ප්‍රදේශයේ හිටපු මන්ත්‍රීතුමකු වන ජයන්ත ජයවීර මහතා මීට අවුරුදු ගණනාවකට ඉස්සෙල්ලා ඉල්ලීමක් කළා, කුරුඳු සඳහා වෙනම අධිකාරියක් පිහිටුවන්න කියලා. ඉතින්, මමත් ජනාධිපතිතුමාගෙන් ඒ ඉල්ලීම කරනවා. ජනාධිපතිතුමා කුරුඳු වගාව ගැන අවධානය යොමු කිරීම ගැන අපි සතුටු වෙනවා. විශේෂයෙන්ම දෙපාර්තමේන්තුවකට වඩා බලයක් තිබෙන විධියට, වැඩක් කරන්න පුළුවන් විධියට, කාර්යක්ෂම සේවාවක් සපයන්න පුළුවන් විධියට කුඩා තේ වතු හිමියන්ට කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පිහිටෙව්වා වාගේ, පොල් වගාකරුවන්ට පොල් සංවර්ධන අධිකාරිය පිහිටෙව්වා වාගේ කුරුඳු සංවර්ධන අධිකාරියක්ම පිහිටුවනවා නම් හොඳයි කියා මම එතුමාට යෝජනා කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තේ ගහ කියන්නේ, වසර 150කට වැඩි කාලයක් තිස්සේ මේ රටට ඩොලර් උපයා දීපු ගහක්. තේ කර්මාන්තයටත් මීට වඩා අවධානයක් යොමු කළ යුතුව තිබෙනවා. අලුතෙන් ඩොලර් ගැන හිතලා ත්‍රෛලෝක විජය පත්‍ර වගා කරන්න පෙර ඩොලර් ගහ රැක ගැනීමටත් කටයුතු කරන්න කියා මම ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ලංකාවේ ඉතිහාසය ගැන පර්යේෂණ කරන්න අලුත් ආයතනයක් හදන්න රුපියල් මිලියන 50ක් වෙන් කළා ලු. ඉතිහාසය ගැන පර්යේෂණ කරන්න ආයතන හදන්න ඉස්සෙල්ලා මෑත ඉතිහාසයේ අපේ රට බංකොලොත් කරලා රටේ ජනතාව අගාධයේ පතුලටම තල්ලු කරපු -ඇද දමපු- වත්මන් ආර්ථික ඝාතකයන් ගැන අනාවරණය කරන්න ආයතනයක් පිහිටුවනවා නම් හොඳයි කියලාත් අපි මතක් කරනවා. ඒ වාගේම විශ්වවිද්‍යාල 11ක වෛද්‍ය විද්‍යාල පවත්වාගෙන යනවා වාගේ ඌව-වෙල්ලස්සටත් නව වෛද්‍ය පීඨයක් ලබා දීමට රුපියල් මිලියන 200ක මුදලක් වෙන් කරලා තිබෙනවා. ඒ ගැනත් අපේ ප්‍රසාදය පළ කරනවා. ඇත්ත වශයෙන්ම ඒ මුදල ගැන වාද-විවාද, තර්ක-විතර්ක තිබුණත්, ඒ යෝජනාව මම අගය කරනවා. මොකද, අපේ රටේ සිටින රෝගීන් සංඛ්‍යාවට සරිලන වෛද්‍යවරුන් සංඛ්‍යාවක් නැහැ. වෛද්‍යවරුන්ගේ ලොකු හිඟයක් තිබෙනවා. වෛද්‍යවරුන් ඉන්නේ 18,000ක් වාගේ ප්‍රමාණයක්. මේ රටේ තිබෙන ආර්ථික අර්බුදය නිසා දිනපතා, සතිපතා, මාස්පතා වෛද්‍යවරු රට හැර යනවා. ඒක නිසා ඒ යෝජනාවත් අපි අගය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ මොන රචනා ඉදිරිපත් කළත්, අපට පෙනෙන විධියට ජනාධිපතිතුමාගේ න්‍යාය පත්‍රයේ මුලින්ම තිබෙන්නේ මේ රටට මේ තරම් වින්නැහියක් කරපු ආර්ථික අපරාධකරුවන් රකින එකයි.

අය වැය කථාවේදීත් කිව්වා, මේ සොර මුළේ කාටවත් දඬුවම් දෙන්න සූදානම් නැති බව. ඇත්ත වශයෙන්ම අපට ඒ වෙලාවේ සිහිපත් වුණේ අපේ හිටපු ජනාධිපතිතුමෙකු වූ මහින්ද රාජපක්ෂ මහත්මයා, කළුතරට ගිහිල්ලා යළි නැඟිටින්න කියලා කරපු කථාව. එතුමා කිව්වා, රනිල් දැන් අපේ පැත්තට ඇවිත් ඉන්නේ, දැන් අපට ඕනෑ විධියට හදාගෙන තිබෙන්නේ කියලා. ඒ කථාව තමයි මට ඒ වෙලාවේත් මතක් වුණේ. අපි ජනාධිපතිතුමාට මතක් කරනවා, එතුමාගේ පක්ෂය බින්දුවට වැටුණත්, එතුමා යම් ප්‍රතිරූපයක් තිබෙන, අපි ගරු කරන නායකයෙක් කියලා. ඒ නිසා ප්‍රතිරූපය නැති කර ගත්ත ආණ්ඩුවක් සහ ප්‍රතිරූපය විනාශ කර ගත්ත පිරිසක් රකින්න ගිහිල්ලා තමන්ගේ වටිනා ප්‍රතිරූපය විනාශ කර ගන්න එපා කියන එකත් එතුමාට මතක් කරමින්, දක්ෂ පිරිසිදු කණ්ඩායමක් එක්ක වැඩ කරන්න, පැහැදිලි අලුත් ජන වරමක් මේ සභාවට ලබා ගන්න අවශ්‍ය පසුබිම සකස් කරන්න කියන ඉල්ලීමත් කරමින්, මට වැඩිපුර විනාඩියක් දෙකක් ලබා දීම ගැන ඔබතුමාටත් ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් ප්‍රකාශ කිරීම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. *[බාධා කිරීමක්]*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට වැඩිපුර වෙලාව දෙනවා කිව්වේ ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා.

Next, the Hon. Jeevan Thondaman. You have eight minutes.

Order, please! Before he starts, will an Hon. Member propose the Hon. Imran Maharoof to the Chair?

**ගරු අනුප පස්කුවල් මහතා (සමාජ සවිබලගැන්වීම් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுப பஸ்குவல் - சமூக வலுவூட்டுகை இராஜாங்க அமைச்சர்)
(The Hon. Anupa Pasqual - State Minister of Social Empowerment)
Sir, I propose that the Hon. Imran Maharoof do now take the Chair.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

***විසින් ස්ථිර කරන ලදී***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ෂාණක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சாணக்கியன் ராஜபுத்திரன் இராசமாணிக்கம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. SHANAKIYAN RAJAPUTHIRAN RASAMANICKAM *left the Chair, and* THE HON. IMRAN MAHAROOF *took the Chair.*

[1.07 p.m.]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
*சாமி சரணம்!*

Hon. Presiding Member, first, I would like to clarify to the House that I am not protesting against the Government or any particular individual by being in this black attire. I have already written to the Hon. Speaker, the Chief Government Whip and the Chief Opposition Whip that I am making a pilgrimage to Sabarimala and that this would be the attire that is necessary for it.

2023ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்டம் சம்பந்தமாக ஆளும்தரப்பினராலும் எதிர்த்தரப்பினராலும் பல்வேறு கருத் துக்கள் முன்வைக்கப்பட்டன. அதேபோல், இலங்கைத் தொழிலாளர் காங்கிரஸினுடைய நிலைப்பாட்டையும் இங்கு வெளிப்படையாகச் சொல்லவேண்டிய தேவை இருக்கிறது.

[ගරු ජීවන් තොණ්ඩමන් මහතා]

முதலாவதாக, ஓர் இலங்கையராக நான் இந்த வரவு செலவுத் திட்டத்தை வரவேற்கிறேன். நீண்டகாலமாக மேற் கொள்ளப்படாமல் இருந்த பொருளாதார ரீதியான சீர்திருத்த முன்மொழிவுகள் இந்த வரவு செலவுத்திட்டத்தில் உள்ளடக்கப் படுமென நாங்கள் எதிர்பார்த்தோம். அதேமாதிரி நடந்திருக் கின்றது. எனினும், மலையகத் தமிழர் என்ற வகையில், எனக்கு இந்த வரவு செலவுத்திட்டம் வருத்தத்தைத்தான் தருகிறது. மூத்த தலைவர்கள் உட்பட அனைத்து மலையகப் பிரதிநிதி களும் சொன்ன மாதிரி இதில் எங்களுடைய மக்களுக்கு எந்தவித நிவாரணமோ, பாதுகாப்பு வலையோ கிடையாது. நாங்கள் இது சம்பந்தமாக மாண்புமிகு சனாதிபதி அவர்களைச் சந்தித்துப் பேசியதோடு, அவரிடம் எங்களுடைய வருத்தத்தை யும் தெரிவித்திருந்தோம்.

பொருளாதார சீர்திருத்தங்கள்மூலம் நாட்டைக் கட்டி யெழுப்புவதற்கு 6-7 மாதங்கள் தேவைப்படும். இக்காலப் பகுதிக்குள் நாட்டைக் கட்டியெழுப்ப முடியுமென்ற நம்பிக்கை மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு இருக்கிறது. ஆனால், அடுத்த 6-7 மாதங்களுக்கு எங்களுடைய மக்கள் உயிர் வாழ்வார்களோ என்ற பயம் எங்களுக்கு இருக்கின்றது. அவர்களுக்குப் பாதுகாப்பு இருந்தாக வேண்டும். அவ்வாறு இல்லாமல், இந்த நாட்டின் பொருளாதாரத்தைக் கட்டி யெழுப்புவதென்பது மிகவும் சிரமமான காரியமாகும். உதாரணத்துக்கு, 'கொவிட்' தொற்றுக் காலத்தில் அந்தந்தத் தோட்டங்களில் இருந்த துரைமாருக்குத் தடுப்பூசி வழங்கினார் கள். ஆனால், அங்கு வேலைசெய்த தொழிலாளர்களுக்கு வழங்கவில்லை. இவ்வாறு ஒவ்வொரு விடயத்திலும் எங்களுடைய மக்களைப் புறக்கணித்துக்கொண்டே போனால், நாளை எங்களுக்கே சந்தேகம் வரும், நாங்கள் இலங்கையர் களா? இல்லையா? என்று.

நான் இந்த இடத்தில் இன்னுமொரு விடயத்தையும் சொல்லியாக வேண்டும். இன்றைய பொருளாதார நெருக்கடி காரணமாக, வறுமைக் கோட்டுக்குக்கீழ் இருக்கின்ற மக்களில் - கிராமங்களில் இருக்கின்ற மக்கள், தோட்டங்களில் இருக்கின்ற மக்கள் - அதிகமானோர் வெளிநாடுகளுக்கு வேலைவாய்ப்புத் தேடிச் சென்றுகொண்டிருக்கிறார்கள். தற்பொழுது, எங்க ளுடைய நாட்டுப் பெண்கள் ஓமான் நாட்டில் அவதிப்படுவது பற்றி எல்லோரும் கேள்விப்பட்டிருப்பீர்கள். ஆகையால், நான் சிறியதொரு வேண்டுகோளை முன்வைக்கிறேன். அதாவது, தயவுசெய்து, யாரும் brokersமூலமாக வெளிநாட்டு வேலை வாய்ப்பைத் தேடிப் போகவேண்டாம். அப்படிப் போனால், நிச்சயமாகப் பிரச்சினை வரும்! ஓமானிலுள்ள இலங்கைத் தூதரகத்தால் நிர்வகிக்கப்படும் பாதுகாப்பான இல்லத்தில் தற்போது தடுத்துவைக்கப்பட்டுள்ள 77 பெண்களில் 12 பேர் மாத்திரமே Sri Lanka Foreign Employment Bureau - இலங்கை வெளிநாட்டு வேலைவாய்ப்புப் பணியகத்தில் register ஆகியிருக்கிறார்கள். ஏனைய 65 பேரும் unregistered. So, இதிலும் பிரச்சினை இருக்கிறது. ஆகையால், இது தொடர்பான விழிப்புணர்வை மக்களிடம் கட்டாயம் ஏற்படுத்த வேண்டும். தற்பொழுது, இங்கே வெளிநாட்டு அலுவல்கள் அமைச்சர் கௌரவ அலி சப்ரி அவர்கள் இருக்கிறார். இவ்விடயம் தொடர்பில் நாங்கள் அவருடனும் பேசியிருக் கிறோம். அதற்கு அவர் தனது முழுமையான ஒத்துழைப்பை வழங்கி வருகிறார். அதேபோன்று, கௌரவ அமைச்சர் மனுஷ நாணாயக்கார அவர்களும் ஒத்துழைப்பை வழங்கி வருகிறார். அவர்கள் விரைவில் அந்நாட்டுக்கு ஒரு குழுவை அனுப்பி, இப்பிரச்சினைக்கு நிரந்தரத் தீர்வைப் பெற்றுக்கொடுப்பார்கள் என்று நான் நம்புகிறேன்.

இந்த வரவு செலவுத்திட்டம் சம்பந்தமாக எங்களுக்குள் பல்வேறு கருத்து முரண்பாடுகள் இருந்தபோதிலும், நாங்கள் அது தொடர்பில் மாண்புமிகு சனாதிபதியுடன் கதைத்ததன் விளைவாக, அடுத்த வாரம் அது தொடர்பான கலந்துரையாடல் ஒன்றை அவர் ஏற்பாடு செய்திருக்கிறார். மலையகத்தைப் பிரதிநிதித்துவப்படுத்துகின்ற அனைத்துத் தரப்பினரும் இதில் கலந்துகொள்வார்கள் என நான் நம்புகிறேன்; எதிர்பார்க்கி றேன். மேலும், இந்த வரவு செலவுத்திட்டத்தின்மூலம் மலையக மக்களுக்கு எவற்றைச் செய்யலாம், அவர்களுக்கு எவ்வாறு பாதுகாப்புக் கவசத்தை உருவாக்கிக் கொடுக்கலாம் என்பது பற்றி எதிர்வருகின்ற வியாழக்கிழமை நாங்கள் Treasury அதிகாரிகளைச் சந்தித்துப் பேச இருக்கிறோம். அதற்கு அடுத்த நாள் மாண்புமிகு சனாதிபதி அவர்களைச் சந்தித்து, அவரிடம் எங்களுடைய நிலைப்பாட்டைத் தெளிவுபடுத்த இருக்கிறோம்.

எமது நாடு பொருளாதார ரீதியாக வீழ்ச்சியடைந்ததற்குப் பலரும் பல்வேறு காரணங்களை முன்வைக்கிறார்கள். அவை அனைத்தும் எங்களுக்கும் புரிகிறது. நாங்கள் ஒன்றும் குருடர்கள் அல்லர். ஏன் இந்த நாடு இந்த நிலைமைக்கு வந்தது என்று எங்களுக்கும் தெரியும்! அதாவது, வரியைக் குறைத் தமை, இரசாயன உர இறக்குமதியை நிறுத்தியமை போன்ற பிழையான முடிவுகளை எடுத்ததனால்தான் இந்த நாடு இந்த நிலைமைக்கு வந்திருக்கிறது. நேற்று glyphosateஇற்கான தடையை lift பண்ணியிருக்கிறார்கள். அது வரவேற்கத்தக்க விடயம். ஆனால், அதன் தடையால் ஏற்பட்ட இழப்பை எங்களால் ஈடுசெய்ய முடியாது. அதாவது, glyphosate இன்மை யால் கிட்டத்தட்ட 24 சதவீதமான தேயிலைத் தோட்டங்களின் அறுவடை வீழ்ச்சியடைந்திருக்கின்றது. அதனை எங்களால் சரிசெய்ய முடியாது. ஏனென்றால், இன்றைக்குப் பல தோட்டங் கள் காடாக மாறியிருக்கின்றன; அவற்றில் குப்பைகள் நிறைந்து கிடக்கின்றன. அங்கு தோட்டத்தொழிலாளர்கள் வாழ்கிறார்களோ இல்லையோ, சிறுத்தைகள் வாழுகின்றன. இவை அனைத்துக்கும் தோட்டக் கம்பனிகள் சொல்கின்ற ஒரேயொரு காரணம், முன்னாள் சனாதிபதி இரசாயன உர இறக்குமதியைத் தடைசெய்தமை என்பதாகும். இரசாயன உர இறக்குமதியை நிறுத்தியதால் மட்டும் இந்த நிலை ஏற்பட வில்லை. கடந்த 10 வருடங்களாகத் தோட்டக் கம்பனிகள் தோட்டங்களை ஒழுங்காகப் பராமரிக்காததும் இந்த நிலை ஏற்பட ஒரு காரணமாகும்.

இன்றைக்கு ஊவா மாகாணத்திலுள்ள அக்கரப்பத்தனைப் பெருந்தோட்ட நிறுவனத்துக்கு எதிராக நாங்கள் தொழிற்சங்க நடவடிக்கையை ஆரம்பித்திருக்கிறோம். அங்கிருந்து ஒரு கிராம் தேயிலையைக்கூட, வெளியே கொண்டுசெல்லவிடாமல் தடுத்து நிறுத்தியிருக்கிறோம். அக்கரப்பத்தனைப் பொருந் தோட்ட நிறுவனம் எங்களுக்குச் சரியான பதிலைத் தரவில்லை என்றால், இந்தத் தொழிற்சங்க நடவடிக்கையை கட்டாயம் நுவரெலியா மாவட்டத்திலும் மேற்கொள்வோம். அதில் எந்தவித மாற்றுக் கருத்தும் கிடையாது. இந்த விடயத்தில் தொழிலாளர்கள் அனைவரும் ஒற்றுமையாக இருப்பார்கள் என்று நாங்கள் நம்புகிறோம். முன்பு நாங்கள் எப்படி அனைத்துத் தொழிற்சங்கங்களிடமும் இதற்கான ஆதரவையும் ஒத்துழைப்பையும் வழங்குமாறு கேட்டோமோ, அதேபோல, இம்முறையும் நான் இந்தச் சபையினூடாகக் கேட்கிறேன். அந்த வகையில், இதற்கு ஆதரவு தருகின்ற அனைவருக்கும் எனது நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். சாமி சரணம்!

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

நன்றி, கௌரவ உறுப்பினர் அவர்களே! அடுத்ததாக, கௌரவ மனோ கணேசன் அவர்கள்! உங்களுக்குப் 14 நிமிடங்கள் இருக்கின்றன.

[பி.ப. 1.13]

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! 2023ஆம் ஆண்டுக்கான வரவு செலவுத்திட்ட யோசனைகளை மாண்புமிகு சனாதிபதியும் நிதி அமைச்சருமான ரணில் விக்கிரமசிங்ஹ அவர்கள் இந்தச் சபையிலே முன்வைத்த அன்றைய தினமே அது சம்பந்தமான தமிழ் முற்போக்குக் கூட்டணியின் நிலைப்பாட்டை நாங்கள் ஊடகங்களுக்குத் தெளிவாக அறிவித்திருந்தோம். அதுமட்டுமல்லாமல், அன்றே நான் மாண்புமிகு சனாதிபதி அவர்களை நேரடியாகச் சந்தித்து, இது சம்பந்தமாக தெளிவாகக் கூறியிருந்தேன்.

இந்த வரவு செலவுத்திட்டத்திலே நிவாரணங்கள் வழங்கப் படவில்லை என்பது எல்லோருக்கும் தெரியும்! எனினும், இலங்கையின் சமூக அடுக்கில் மிகவும் பின்தங்கிய மக்களாகக் கருதப்படக்கூடிய, அறிவிக்கப்பட்டிருக்கின்ற பெருந்தோட்ட மக்கள் தொடர்பில் அவதானத்தைச் செலுத்துவதற்கு நிதி யமைச்சராக இருக்கின்ற மாண்புமிகு சனாதிபதி அவர்கள் தவறிவிட்டார். இதனை நாங்கள் கடுமையான அலட்சியப் போக்காகவே கருதுகிறோம்.

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இலங்கையின் வறுமை நிலை 26 சதவீதம் என்று உலக வங்கி சொல்கின்றது. தேசிய ரீதியாகப் பார்த்தால், பெருந்தோட்டத் துறையிலே அது 53 சதவீதமாகக் காணப்படுகின்றது. உணவின்மையானது நகரப் பகுதிகளில் 43 சதவீதமாகவும் கிராமப் பகுதிகளில் 33 சதவீதமாகவும் இருக்கின்றபொழுது, பெருந்தோட்டப் பகுதிகளில் அது 51 சதவீதமாக இருக்கிறது. எப்படிப்பார்த்தாலும், இலங்கை நாட்டில் பின்தங்கிய, நலிவுறு நிலையில் இருக்கக்கூடிய மக்களாகப் பெருந்தோட்ட மக்களே அடையாளப்படுத்தப்படுகிறார்கள்.

நாட்டின் பொருளாதார நிலைமை காரணமாக அவர் களுக்கு நிவாரணம் வழங்க முடியாவிட்டாலும்கூட, நாட்டின் தலைவர், அரசாங்கத்தின் தலைவர் - the Head of the State, the Head of the Government - என்ற அடிப்படையிலாவது மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு ஒரு கடப்பாடு இருந்திருக்க வேண்டும். அதாவது, நான் உங்களுடைய பிரச்சினைகளை அறிந்திருக்கிறேன்; உணர்ந்திருக்கிறேன்; என்னை நம்பியிருங்கள் என்றாவது அம்மக்களுக்கு நம்பிக்கை அளித்திருக்க வேண்டும். ஆனால், வரவு செலவுத்திட்ட உரையிலே எந்தவோர் இடத்திலும் பெருந்தோட்ட மக்கள் தொடர்பாக, குறிப்பாக இன்று உலகமே ஏற்றுக்கொண்டி ருக்கக்கூடிய, அறிந்திருக்கக்கூடிய மிகவும் பின்தங்கிய மக்கள் சம்பந்தமாக எதுவுமே சொல்லவில்லை என்பதை நான் அவருடைய முகத்துக்கு நேராகவே சொன்னேன். அவர் என்னுடைய முகத்தைப் பார்த்துக்கொண்டிருந்தாரே தவிர, பதில் எதுவும் சொல்லவில்லை என்பதை நான் இந்த இடத்திலே பதிவுசெய்ய விரும்புகிறேன்.

In his Budget Speech, the Hon. President was referring to the reforms he proposes to bring to the plantation industry. They are fine. But, I must tell the President that unless and until you take the all important human element - the plantation workers - into account, you cannot bring any reform to that industry. So, that is important.

தோட்டத் தொழிற்றுறையில் இருக்கக்கூடிய தேயிலையாக இருக்கலாம்; இறப்பராக இருக்கலாம்; காணியாக இருக்கலாம்; தொழிற்சங்கங்களாக இருக்கலாம், அவை அனைத்துமே உயிரற்ற பொருட்களாக இருக்கும்போது, உயிருள்ள, இரத்தமும் சதையும்கொண்ட ஓர் அங்கம்தான் உழைக்கும் மக்களான தோட்டத்தொழிலாளர்கள்! 2023ஆம் வருடத்தில் 200ஆவது வருடத்தை நிறைவுசெய்யக்கூடிய நிலையில் இருக்கக்கூடிய இந்தப் பெருந்தோட்ட மக்கள் சம்பந்தமாக இந்த வரவு செலவுத்திட்டத்தில் சனாதிபதியும் நாட்டின் தலைவரும் அரசாங்கத்தின் தலைவருமானவர் எதுவுமே சொல்லவில்லை என்பதற்கான கண்டனத்தை நான் இந்த இடத்தில் வலிமையாகத் தெரிவித்துக்கொள்ள விரும்புகிறேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දැක්කා මේ දවස් ටිකේ අපේ ගරු ජනාධිපතිතුමා කරුණු දෙකක් ගැන වැඩියෙන් ම කථා කරනවා. ඉන් පළමු කාරණය මේකයි. පළාත් පාලන ඡන්දය නැවත පවත්වනවා කියමින්, සීමා නිර්ණය සම්බන්ධව සොයා බලන්න කියලා කමිටුවක් නම් කරලා තිබෙනවා. අනික් කාරණය තමයි, ජාතික ප්‍රශ්නයට විසඳුම් ලබා දෙනවා කියලා එතුමා කියනවා. 75වැනි නිදහස් සැමරුමට තව මාස කිහිපයයි තිබෙන්නේ. රටේ ජනවාර්ගික ප්‍රශ්නවලට විසඳුම් ලබා දෙනවා කියලා එතුමා කියනවා. එතුමා ඊයේ පෙරේදා උතුරේත් ගිහිල්ලා ඇවිල්ලා තිබෙනවා. ඒක හොඳයි. ජනවාර්ගික ප්‍රශ්නය ගැන පසුව බලමුකෝ. පළාත් පාලන මැතිවරණය සම්බන්ධයෙන් පත් කරපු ඒ සීමා නිර්ණය කමිටුවට එතුමා පස්දෙනෙක් නම් කරලා තිබෙනවා.

ගරු ජනාධිපතිතුමා තමයි පසුගිය වකවානුවේ අපේ අගමැතිතුමා විධියට සිටිමින් අද පවතින මේ පළාත් පාලන ක්‍රමය ගෙනෙන්නට නායකත්වය දුන්නේ. එතුමා ළඟම මම සිටියා. මොකද, එතැන ප්‍රධාන කරුණක් තිබුණා. අපේ රටේ කාන්තා නියෝජනය සියයට 25 දක්වා වැඩි කිරීමෙන් කාන්තාවන්ට දේශපාලන නියෝජනය ලබා ගන්නා අවස්ථාව වැඩිදියුණු කරලා දුන්නා. ඒක ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට සිදු වුණා. ඒක රනිල් වික්‍රමසිංහ මැතිතුමා ලබපු විශාල ජයග්‍රහණයක් කියලා මම හිතනවා. නමුත්, දැන් එතුමා හිටපු ගමන් කියනවා, 8,000ක පළාත් පාලන සභික සංඛ්‍යාව 4,000ක් කරන්න ඕනෑ කියලා. ඒක හොඳයි. ජනප්‍රිය කථාවක් ඒක. නමුත් ඒ 8,000ක ප්‍රමාණය 4,000 වුණොත් කැපෙන්නේ වෙන කවුරුවත් නොව, කාන්තා නියෝජනය. අපේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරියන්ගේ කාන්තා සංසදය තිබෙනවා. ඒ සඳහා දෙපාර්ශ්වයේම මන්ත්‍රීවරියන් ඉන්නවා. මේ ගැන ඒ අයගේ ස්ථාවරය මොකක්ද කියලා මම දන්නේ නැහැ. ඒ ගැන හොයලා බලන්න ඕනෑ.

අනෙක් කාරණය, එතුමා විවිධත්වය ගැන කථා කරනවා. විවිධත්වය කියන්නේ ස්ත්‍රී, පුරුෂ බව පමණක් නොවෙයි. ප්‍රධාන විවිධත්වය තමයි, ජනවාර්ගික ප්‍රශ්නය තිබෙනවා. මේ රටේ ජන වර්ග තිබෙනවා. සිංහල සහෝදරවරුන්, උතුරේ දෙමළ සහෝදරවරුන්, මුස්ලිම් සහෝදරවරුන් ඔබතුමා නියෝජනය කරනවා. ඒ වාගේ කඳුකරයේත් දෙමළ ජනයා ජීවත් වෙනවා. මේ ජනවාර්ගික ගැටලු තිබෙනවා. ජන වර්ග ඔක්කොම එකතු වෙනකොට තමයි ශ්‍රී ලාංකිකත්වය ඇති වෙන්නේ. එතකොට මේ 8,000ක ප්‍රමාණය 4,000 වුණා නම්, උතුරු-නැගෙනහිරින් පිට මධ්‍යම පළාතේ, බස්නාහිර පළාතේ, ඌව පළාතේ, සබරගමු පළාතේ ජීවත් වන දමිළ බස කථා කරන දෙමළ, මුස්ලිම් ජනතාවගේ නියෝජනය සම්පූර්ණයෙන් කැපිලා යනවා. මේකට එතුමාගේ විසඳුම මොකක්ද කියා මම දන්නේ නැහැ. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමනි, මට කියන්න විසඳුම මොකක්ද කියලා. ඔබතුමා තමයි ගිය සැරේ අපිත් එක්ක එකතු වෙලා අත්වැල් බැඳගෙන මේ ක්‍රමය ගෙනාවේ. ඔබතුමා එක්ක මමත් හිටියා. දැන් ඒ ක්‍රමය නැහැ කියනවා. ඒ වාගේම ජනවාර්ගික ප්‍රශ්න පිළිබඳව දැන් එළියේ කථාබහ වෙනවා, මම කලින් කියපු විධියට. හොඳයි. ප්‍රශ්නයක් නැහැ.

[ගරු මනෝ ගනේසන් මහතා]

தேசிய இனப் பிரச்சினையைத் தீர்ப்பதற்கு மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு மக்கள் ஆணை இருக்கிறதா, இல்லையா? என்று நான் கேட்க விரும்பவில்லை. ஆனால், ஒருசிலர் கேட்க முயற்சிக்கிறார்கள். தேர்தல் முறைமை மாற்றம் உட்பட ஏனைய பிரச்சினைகளைத் தீர்ப்பதற்கு அவருக்கு மக்கள் ஆணை இல்லாவிட்டாலும்கூட, தேசிய இனப் பிரச்சினையைத் தீர்ப்பதற்கு மக்கள் ஆணை இருக்கிறது. ஏனெனில், இந்த நாட்டில் சனாதிபதியாகப் பதவி வகிக்கும் எவருக்கும் அதற்கான மக்கள் ஆணை இருக்கிறது. அது முன்னாள் சனாதிபதிகளாக இருக்கலாம், இந்நாள் சனாதிபதியாக இருக்கலாம், நாளை சனாதிபதியாக வருவதற்குக் கனவு காண்பவர்களாக இருக்கலாம். அந்த அடிப்படையில், நாங்கள் அவருக்கு ஒத்துழைப்பு வழங்குவதற்குத் தயாராக இருக்கிறோம்.

தேசிய இனப் பிரச்சினை என்பது, வடக்கில் வாழும் தமிழ் மக்களுக்கு மாத்திரமல்ல, கிழக்கில் வாழும் தமிழ் மக்களுக்கும் இருக்கிறது. அது தொடர்பில் அவர்களுடைய பிரதிநிதிகளுடன் பேச்சுவார்த்தை நடாத்தி, தீர்வைக் காணுங்கள்! யுத்தத்தால் சொல்லொணாத் துன்பங்களை அனுபவித்த மக்கள் அந்தப் பகுதிகளிலே வாழ்ந்து கொண்டிருக்கிறார்கள். அதேபோல, வடக்கு, கிழக்கு உட்பட நாடு முழுவதும் முஸ்லிம் மக்களும் வாழ்ந்துகொண்டிருக்கிறார்கள். அவர்களுடைய பிரதிநிதிகளுடனும் பேச்சுவார்த்தை நடத்த வேண்டும். அதேபோல, தென்னிலங்கையில் மலையகத்தை மையமாகக் கொண்டு இந்திய வம்சாவளியினரான மலையகத் தமிழர்கள் வாழ்ந்து கொண்டிருக்கிறார்கள். அவர்களுடைய பிரதிநிதிகளாகிய எங்களுடனும் பேச்சுவார்த்தை நடத்த வேண்டும். தேசிய இனப் பிரச்சினையை வடக்கு மக்களுடன் தொடர்புடைய பிரச்சினை என்று மாத்திரம் சொல்ல வேண்டாம். வடக்கு, கிழக்கு வாழ் தமிழ், முஸ்லிம் மற்றும் மலையகத் தமிழர்களுடைய பிரதிநிதிகளுடன் பேச்சுவார்த்தை நடத்தினால்தான், பிளவுபடாத நாட்டுக்குள்ளே சிங்களச் சகோதரர்களுடன் நாங்கள் எப்படி வாழப் போகிறோம் என்பது சம்பந்தமாகக் கலந்துரையாடி, தீர்வு காணலாம் என்று நான் நினைக்கின்றேன். அதை மாண்புமிகு சனாதிபதி அவர்கள் புரிந்துகொள்ள வேண்டும்.

மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு இருக்கின்ற மக்கள் ஆணை தொடர்பில் இந்தச் சபையில் வாதப் பிரதிவாதங்கள் இடம்பெற்றன. கௌரவ அமைச்சர் சுசில் பிரேமஜயந்த அவர்கள் பேசும்போது, மாண்புமிகு சனாதிபதி அவர்களுக்கு மக்கள் ஆணை இருப்பதாகச் சொன்னார். பரவாயில்லை! ஆனால், 2019ஆம் ஆண்டு நடைபெற்ற சனாதிபதித் தேர்தலிலே வெற்றிபெற்ற முன்னாள் சனாதிபதி கோட்டாபய ராஜபக்ஷ அவர்களின் மக்கள் ஆணையை அவர் கடன் வாங்க முடியாது. ஏனெனில், அவர் அந்த நேரத்தில் எதிரணியிலே இருந்தார். அப்பொழுது, அவருக்குக் கிடைத்த மக்கள் ஆணை வேறு. அதாவது, கோட்டாபய ராஜபக்ஷ அவர்களுக்குக் கிடைத்த மக்கள் ஆணைக்கு எதிரானதொரு மக்கள் ஆணைதான் அவருக்குக் கிடைத்தது. அதனைச் சிங்களத்தில் 'ප්‍රතිපක්ෂ ජනවරම' என்று சொல்வார்கள். அவர் இம்முறை பிரதமராவதற்கு முதல் எனக்குப் பக்கத்திலுள்ள ஆசனத்திலேதான் இருந்தார். அதாவது, நான் இருக்கும் ஆசன இலக்கம் 12. அவர் 13ஆம் இலக்க ஆசனத்திலே இருந்தார். பின்னர், பிரதமராகப் பதவியேற்று அந்தப் பக்கம் சென்றார். ஆகையால், அவருக்குக் கிடைத்த மக்கள் ஆணையானது, ஸ்ரீ லங்கா பொதுஜன பெரமுன கட்சிக்குக் கிடைத்த மக்கள் ஆணையுடன் சம்பந்தமில்லாதது.

தற்பொழுது, அவர்தான் Head of Stateஆகவும் Head of Governmentஆகவும் இருக்கிறார். அவருக்கு இருக்கின்ற மக்கள் ஆணை என்பது மட்டுப்படுத்தப்பட்டது. அவர் தேசிய இனப் பிரச்சினை பற்றிப் பேசலாம்; பிரச்சினையில்லை! நிவாரணம் வழங்கலாம்; பிரச்சினை இல்லை! ஆனால், அவர் தனக்குள்ள அதிகாரத்தைப் பயன்படுத்தி, விரைவிலே பாராளுமன்றத்தைக் கலைத்து, புதிதாக மக்கள் ஆணையைக் கோருவதற்குத் தேர்தலுக்குச் செல்ல வேண்டும். அதுதான் எங்களுடைய கோரிக்கையாகவும் இருக்கிறது. அப்படி அவர் செய்ய மாட்டாரென்று கௌரவ சஜித் பிரேமதாஸ அவர்கள் சொன்னார். அப்படியல்ல! உண்மையிலேயே அவர் அதைச் செய்ய வேண்டும். மாண்புமிகு அநுர திஸாநாயக்கவோ, மாண்புமிகு டலஸ் அழஹப்பெருமவோ வெற்றிபெற்றிருந்தால், என்ன செய்திருப்பார்கள்? என்ற கேள்வி எழுந்தபோது, மாண்புமிகு தான் வெற்றி பெற்றிருந்தால், பாராளுமன்றத்தைக் கலைத்து, புதியதொரு தேர்தலுக்குச் செல்வதற்காகத் தனக்குள்ள அதிகாரத்தை நிச்சயமாகப் பயன்படுத்தியிருப்பேன் என்பதாக அநுர திஸாநாயக்க அவர்கள் கூறியிருந்தார். அதேபோல், மாண்புமிகு டலஸ் அழஹப்பெரும அவர்களுக்கு வாக்களிக்கும் போது நாங்கள் தெளிவாக இருந்தோம். அதாவது, அவர் வெற்றிபெற்றால், நிச்சயமாக எதிர்வரும் மார்ச் மாதமளவில் அவர்மூலமாகப் பாராளுமன்றத்தைக் கலைத்து, புதியதொரு தேர்தலுக்குச் செல்லவிருந்தோம். ஏனெனில், பாராளுமன்றம் மக்கள் ஆணையை இழந்துவிட்டது. அதாவது, 2019 மற்றும் 2020இல் கிடைத்த மக்கள் ஆணை இப்பொழுது செல்லுபடியாகாது.

2019දීත්, 2020දීත් ලබාගත් ජනවරම අවලංගු වෙලා හමාරයි. මොකද, එතුමාට බැරි වුණා එතුමාගේ පැත්තේ ඉන්න කවුරුහරි කෙනෙක් අගමැති කරන්න, ජනාධිපති කරන්න. රනිල් වික්‍රමසිංහ මහත්මයා නිකම් කෙනෙක් නොවෙයි, රාජ්‍ය නායක; ආණ්ඩුවේ නායක - the Head of State and the Head of Government. නැවත වතාවක් මම ඒක කියනවා. එතුමාගේ ජනවරම දැන් සීමාවෙලා තිබෙනවා. ඒ නිසා ඕනෑ ඕනෑ දේවල් කරන්න බැහැ. අපට ඉඩදෙන්න බැහැ ඒකට. රටේ පවතින අර්බුදය නිසා ජනතාවට උදවු උපකාර කරන්න පුළුවන්. ඒ අයට සහනාධාර ලබා දෙන්න පුළුවන්. ඒ වාගේ ජාතික ප්‍රශ්න පිළිබඳ කථාබහ කරන්න පුළුවන්. ප්‍රශ්නයක් නැහැ ඒ ගැන. අපි සහයෝගය දෙනවා, ප්‍රශ්නයක් නැහැ කාටවත්. ස්ථිරව තිබෙන ජනවරම ඒක. නමුත්, මේ ජනවරම පාවිච්චි කරලා ඡන්ද ක්‍රම වෙනස් කරන්න හදන්න එපා කියලා එතුමාට අපි කියනවා. මේක පාවිච්චි කරලා වෙන වෙන දේවල් කරන්න හදන්න එපා. එහෙම කරන්න පුළුවන්කමක් තිබෙන එකම ස්ථානය තමයි අලුත් පාර්ලිමේන්තුව -නව පාර්ලිමේන්තුව. ඒ නිසා මැතිවරණයකට යමු අපි. අපි ලෑහැස්තියි. සමගි ජනබලවේගය හැටියට; සමගි ජනබලවේග සන්ධානය හැටියට අපි නැවත ඡන්දයකට මුහුණ දීලා අලුත් පාර්ලිමේන්තුවට යන්න ලෑහැස්ති වෙලා ඉන්නවා.

මොකද, ඒ වනතුරු විශ්වාසයක් ඇති වන්නේ නැහැ. දැන් බලන්න, මේ රට ගැන ලෝකයටම විශ්වාසයක් නැහැ කියනවා. ඒක අපි දන්නවා. ඊට පෙර කියන්න ඕනෑ තව කාරණයක් තිබෙනවා. මැද පෙරදිග ජීවත් වෙන ශ්‍රී ලාංකිකයන් ඉන්නවා. ඒ අය තමයි රටට විදේශ සංචිත විශාල ලෙස ලබා දෙන්නේ. නමුත්, ඒ අය ලංකාවට මුදල් එවන්නේ නැහැ. මොකද, විශ්වාසය නැහැ. බැංකුවලට යවන මුදල් කාටවත් හොරකම් කරන්න බැහැ. ඒක දන්නවා. නමුත්, ඒ අයගේ මතයක් තිබෙනවා. ඇයි? කවුරු ගැනවත් විශ්වාසයක් නැහැ. ඒ නිසා මුදල් යවන්නේ නැහැ. ඇයි? අපේ රටේ අපේ පුරවැසියන්ට, අපේ ශ්‍රී ලාංකිකයන්ට අපි ගැන විශ්වාස නැත්නම් කොහොමද විදේශිකයන් අපි ගැන විශ්වාසය තබන්නේ? ඒ නිසා මේක හදන්න ඕනෑ නම්, වෙනස් කරන්න ඕනෑ නම්, එකම මාර්ගයයි තිබෙන්නේ. There is no shortcut.

The only way out is elections; dissolve Parliament and go for elections. ඒක කරන්න ඕනෑ. ඒ තැනට ජනාධිපතිතුමා එන්න ඕනෑ. ඒක අපේ ඉල්ලීමක්. මම කියන්න කැමැතියි, මේ අවස්ථාවේදී-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)
හොඳයි.

මම අහගෙන හිටියා, මහින්ද රාජපක්ෂ මැතිතුමා උදේ කථා කළා. ඒ ගැන මතක් කරන්න කැමැතියි. මහින්ද රාජපක්ෂ මැතිතුමා 2009දී යුද්ධය අවසන් කළාට පසුව වතාවක් මට කථා කළා. මට ඒ පිළිබඳව අද වාගේ මතකයි. මම එතුමාට කිව්වා, "රනිල් වික්‍රමසිංහ මැතිතුමා අද අපේ විපක්ෂ නායක, - එදා එතුමා අපිත් එක්ක හිටියේ - එතුමා මේ රටේ ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් ලෙස දිස්ත්‍රික් සභාවක් දුන්නත්, සිංහල ජනතාව එය පිළිගත්තේ නැහැ. එතුමා රට විකුණනවා කියලා එතුමාට චෝදනා කරයි, රට බෙදලා දෙනවා කියලා චෝදනා කරයි" කියලා. ඒ වාගේම, මම එතුමාට කිව්වා, "ඔබතුමා එහෙම නැහැ, ඔබතුමා සිංහල ජනතාවගේ විශ්වාසය ලබා ගත් නායකයෙක්, ඔබතුමා රට බෙදලා දුන්නත්, අපේ නායකයා මොනවා හරි කාරණාවකට කරන්නේ කියලා පිළිගනීවි, සිංහල ජනතාව තුළ ඔබතුමාට ඒ වාගේ පිළිගැනීමක් තිබෙනවා, ඒ නිසා කරුණාකරලා යුද්ධය අවසන් කරපු විධියට ජනවාර්ගික ප්‍රශ්නය අවසන් කරන්න" කියලා. එතුමාට මම එහෙම යෝජනා කළා. එතුමා යුද්ධය අවසන් කරපු විධිය ගැන මම එකඟ නැහැ. වැරදි විධියට කළා කියලා දන්නවා. නමුත්, එතුමා යුද්ධය අවසන් කළ එක ගැන සතුටු වෙනවා. මම එතුමාට ඉහත යෝජනාව කළා. එතුමා පිළිගත්තේ නැහැ.

ළඟදී මම දැන ගත්තා කාරණයක්. එතුමා එක්ක හිටපු ඇමතිවරයෙක් මට ඒ කාරණය කිව්වේ. මේ වෙලාවේ එතුමා මේ සභාවේ නැහැ. ඩිංගකට කලින් නම් හිටියා. එතුමා මට කිව්වා, මහින්ද රාජපක්ෂ මැතිතුමා සම්පන්දන් මහත්මයා එක්ක සාකච්ඡා කරලා, අනිකුත් පක්ෂ නායකයන් සමඟ සාකච්ඡා කරලා ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් ලබා දෙන්න ලැහැස්ති වෙලා හිටියා, නමුත් ගෝඨාභය රාජපක්ෂ මහත්මයා ඒකට ඉඩ දුන්නේ නැහැ කියලා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා 2009ට පෙර ආරක්ෂක ලේකම් ධුරයේ ඉඳලා බලවත් චරිතයක් හැටියට ඒ ආණ්ඩුවේ හිටපු නිසා එතුමා ඉඩ දුන්නේ නැහැ. අන්තවාදී තැනක හිටියා. එහෙම ඉඳලා තමයි එතුමා ජනපති වුණේ. නමුත්, අනා ගත්තා; ඔක්කෝම ඉවරයි. ඒවා ඉතිහාසයට භාරදීලා දැන් මේ තත්ත්වය වෙනස් කරන්න ඕනෑ නිසා රනිල් වික්‍රමසිංහ මැතිතුමා භාර ගත්තා.

ජනාධිපතිතුමා ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුම් ලබා දෙනවා නම්, ඒකට පොදුජන පෙරමුණේ නායක හැටියට මහින්ද රාජපක්ෂ මැතිතුමා සහයෝගය ලබා දෙයි කියලා මම හිතනවා. මොකද, ඉතිහාසයට අනික් ඔක්කෝම භාරදීලා ඉස්සරහට යන්න ඕනෑ කාලය එළඹිලා තිබෙනවා. නමුත්, ජනවාර්ගික ප්‍රශ්නයට විසඳුමක් ලබා දීමේදී මම නැවත මතක් කරන්න කැමැතියි, එය උතුරට පමණක් සීමා කරන්න එපා කියලා. උතුර, නැඟෙනහිර දෙමළ ජනයා ඉන්නවා; මුස්ලිම් ජනයා ඉන්නවා; දකුණේ කඳුකර දෙමළ ජනයා ඉන්නවා. හැමෝම එකතු වෙලා, සිංහල ජනතාව සමඟ එකතු වෙලා අපි නව ශ්‍රී ලංකාවක් නිර්මාණය කරමු. ප්‍රශ්නයක් නැහැ. හැබැයි, ඒකට එතුමා කියනවා, ලබන නිදහස් දිනය පෙබරවාරි මාසයේ 04 වෙනිදා එනවා කියලා. එහෙම නේද? මම හිතන්නේ එතුමා එහෙම කියන්නේ නැහැ. ලබන අවුරුද්ද කියන්නේ 75 වන නිදහස් සංවත්සරය අපි සමරන වසර. මම එතුමාට මේ කාරණය කියන්න කැමැතියි. ඔබතුමා මුළු අවුරුද්දම ගන්න, මුළු අවුරුද්දම අරගෙන ජනාධිපතිවරණයට යනවා නම් හොඳයි. එහෙම නැත්නම් ඊට පෙර මහ මැතිවරණයට යනවා නම් හොඳයි. ඒකට අපි ලැහැස්තියි. අපි අනිවාර්යයෙන් ලැහැස්තියි. එච්චරයි මට කියන්න තිබෙන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 26ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.29]

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යවරයා හැටියට ඉදිරිපත් කරන ලද මේ අය වැය, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ මේ රටේ 77 වන අය වැය ලේඛනයයි. නිදහසින් පසු මේ රටේ මුදල් අමාත්‍යවරුන් ඉදිරිපත් කළ අය වැය අතරින් රටක් හැටියට අපි බරපතළ ආර්ථික, සමාජයීය, දේශපාලන අර්බුදයකට මුහුණ දී තිබෙන වෙලාවක තමයි එතුමා මේ අය වැය ඉදිරිපත් කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැයක් ගෙන එනකොට සාමාන්‍යයෙන් පුරුද්දක් විධියට අපේ රටේ මිනිසුන් බලාපොරොත්තු වන්නේ සහන. අය වැයක් ළං වන කොට, පත්තරවල පිටුවල ලොකුවට ලියන්නේ සහන ගැන. මිනිස්සු අය වැයකින් බලාපොරොත්තු වන්නේ සහනාධාර. රාජ්‍ය සේවකයා බලාපොරොත්තු වනවා, වැටුප් වැඩිවීමක්. එහෙම තමයි හැම දාම වුණේ. ඉතිහාසයේ හැම දාම වාගේ අය වැයකින් රාජ්‍ය සේවකයන්ගේ වැටුප් වැඩි වුණා; සහන දුන්නා. එතකොට තමයි පත්තරේ පොල් අකුරුවලින් ලියන්නේ, මේ මේ සහන ටික ලැබුණා කියලා. හැබැයි, මුදල් අමාත්‍යවරයා හැටියට ජනාධිපතිවරයාට මේ අය වැයෙන් එහෙම සහන දෙන්න, රාජ්‍ය සේවයේ වැටුප් වැඩි කරන්න හැකියාවක් නැහැ. ඊට මූලික හේතුව අපි දන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රාජ්‍ය සේවකයාගේ වැටුප් වැඩි කිරීමවත්, සහනාධාර දීමවත් නොවෙයි, මේ ආර්ථික අර්බුදයෙන් ගොඩ එන්නේ කොහොමද කියන කාරණා තමයි එතුමාට මේ අය වැය තුළින් ඉදිරිපත් කරන්න සිද්ධ වෙලා තිබෙන්නේ.

මෙතෙක් කල් අපි සහන දීලා තිබෙන්නේත්, වැටුප් වැඩි කරගෙන තිබෙන්නේත් ණයට අරගෙන. ණයට අරගෙන සහන දීලා, ණයට අරගෙන වැටුප් වැඩි කරගෙන දිගටම ආව නිසා අද වනකොට අපි ඉතාම අමාරු තැනකට ඇවිත් තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ආර්ථිකය ගත්තොත්, අද අපේ රටේ ණය දළ දේශීය නිෂ්පාදනයට සාපේක්ෂව සියයට 110ක් වනවා. අපේ ආහාර උද්ධමනය සියයට 87ක්. අපට විදේශ සංචිත නැහැ. අපට ණය ගෙවාගන්න බැහැ. ඒ නිසා ඉතාම බරපතළ ආර්ථික අර්බුදයක් හමුවේ තමයි රටක් හැටියට අපි ඉන්නේ සහ ගරු මුදල් ඇමතිවරයා මේ අය වැය ඉදිරිපත් කරන්නේ. ඒ නිසා මේ වෙලාවේ පාර්ලිමේන්තුවේ සිටින අපි 225දෙනාම කළ යුත්තේ 2019දී ජනාධිපති ධුරයට පත් වෙලා අවුරුදු දෙකහමාරක් රට පාලනය කළ ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට බණින එකවත්, වත්මන් ජනාධිපති රනිල් වික්‍රමසිංහ

[ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා]

මහත්මයාට දොස් කියන එකවත් නොවෙයි. මේ වෙලාවේ අපි ඔක්කෝම එකට එක්කාසු වෙලා මේ රට ගොඩ නඟන්න පුළුවන් වැඩ පිළිවෙළක් පිළිබඳව මේ පාර්ලිමේන්තුව තුළ සංවාදයක් ඇති කරගෙන කටයුතු කළ යුතු බවයි මා විශ්වාස කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා හිතන විධියට රට මේ අර්බුදයකට පත් වෙන්න එක පැත්තකින් කොවිඩ් වසංගතයත්, යුක්රේන යුද්ධයත් බලපෑවා. ඊට එහාට ගිහින්, නිදහසින් පස්සේ මේ රට පාලනය කළ සෑම රජයක් අතින්ම සිදු වුණු වැරදිත් මේ අර්බුදයට බලපෑවාය කියන එක අපි පිළිගන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ සිටින 225 දෙනාගෙන් කවුරු හරි කියනවා නම්, "මේ ආර්ථික අර්බුදයට අපි දායක වුණේ නැහැ" කියලා, සමඟි ජන බලවේගය අත සෝදාගන්න හදනවා නම්, "අපි මේක දන්නේ නැහැ. අපි බබ්බු" කියලා, ඒක විහිළුවක්. මොකද, එහෙම කියලා ඒගොල්ලන්ට මිදෙන්න බැහැ. සමඟි ජන බලවේගය කියන්නේ පරණ එක්සත් ජාතික පක්ෂය. ඒ නිසා මේ රට පාලනය කරපු සියලු දේශපාලන පක්ෂ මෙයට වග කිව යුතුයි. දැන් ජනතා විමුක්ති පෙරමුණේ අය, එහෙම නැත්නම් ඊඑන්ජ් එකේ අය කියන්න පුළුවන්, "අපි ආණ්ඩුවේ හිටියේ නැහැ." කියලා. ආණ්ඩුවේ ඇමතිකම් නොදැරුවාට, ඒ අය ආණ්ඩුවේ පාර්ශ්වකරුවන් වුණා; ආණ්ඩුව වෙනුවෙන් ඡන්දය දුන්නා. ඒ නිසා මේ පාර්ලිමේන්තුවේ ඉන්න 225දෙනාම, මේ පාර්ලිමේන්තුව නියෝජනය කළ සියලු දේශපාලන පක්ෂ මේ ආර්ථිකය කඩා වැටීමට වග කියන්න ඕනෑ කියන එකයි මා නම් විශ්වාස කරන්නේ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒකයි මා කිව්වේ මේ රට බරපතළ ආර්ථික අර්බුදයකට වැටී තිබෙන මේ වෙලාවේවත් අපි පිල් බෙදෙන්නේ නැතුව එකට එක්කාසු වෙලා ජාතික වැඩසටහනක් හදාගෙන මේ රට ගොඩ ගන්න එක තීන්දුවක් ගනිමු කියලා.

පසුගිය කාලයේ සිදු වුණු අරගළයත් අපේ ඇස් ඇරෙව්වා. ඒ නිසා හිටපු ජනාධිපතිවරයා, අගමැතිවරයා ඉවත් වුණා; බරපතළ දේශපාලන වෙනසක් ඇති වුණා. මා හිතන විධියට මේ සියල්ල එක්ක අපි කාගේත් ඇස් ඇරුණා. අපි අතින් වුණු වැරදි ගැන අපි අද ස්වයං විවේචනයක් කරනවා. එහෙම නම්, පරණ වැරදි ගැනම කියමින් සෝද සෝදා මඩේ දමන්නේ නැතුව අපි ඔක්කෝම එකට එක්කාසු වෙලා කටයුතු කරමු. අනුර දිසානායක මන්ත්‍රීතුමා එකම සින්දුව හැම දාම කියනවා. එකම දේ කියන එක නොවෙයි, අපි කළ යුත්තේ. මේ අර්බුදයෙන් ගොඩ ඒමට සුදුසු ක්‍රියා මාර්ගයක් පිළිබඳ සංවාදයක් අපි මේ අය වැය විවාදය තුළ ඇති කරගත්තා නම් එය ඉතා වැදගත් කියලායි මා විශ්වාස කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය බදු ආදායම සම්බන්ධයෙන් මා දරන මතය ගැන මම පාර්ලිමේන්තුවේදී දිගින් දිගටම කිව්වා. මිනිසුන්ට සහනාධාර දෙන්න නම්, බදු එක්කාසු කරන්න ඕනෑ. ලෝකයේ ඕනෑම රටක් එහෙමයි. නමුත්, ආණ්ඩුව බදු වැඩි කළාම විපක්ෂය බණිනවා. අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා, "බදු වැඩි කිරීම තුළ අපේ මිනිස්සු රට හැර යනවා, බුද්ධිගලනයක් වෙනවා" කියලා. එතුමා බදු වැඩි කරනවාට විරුද්ධයි කියනවා. විපක්ෂය කියනවා, බදු වැඩි කරනවාට විරුද්ධයි කියලා. එහෙම කියලා, සහනාධාර නැහැ කියලාත් කියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි කියන්නේ මේ රටේ සියලුදෙනාගෙන් බදු අය කරන්න කියලා නොවෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 2021 වසරේ සංඛ්‍යාලේඛන බැලුවාම, 2021.12.31 වනකොට මිලියන 22ක් ඉන්න මේ රටේ ආදායම් බදු ලිපිගොනු තිබෙන්නේ 292,305යි. ඒවා අතරින් returns එවලා තිබෙන්නේ 51,461යි. ශතයක් හෝ බදු ගෙවන්නේ 25,462 යි. මිලියන 22ක ජනතාවක් ඉන්න අපේ රටේ බදු ගෙවන්නන් ඉන්නේ 25,462යි! අපේ රටේ සමාගම් 105,000ක් පමණ තිබෙනවා. ඒ අතරින් Returns එවලා තිබෙන්නේ 17,782යි. අපේ රටේ ශතයක් හෝ බදු ගෙවන සමාගම් තිබෙන්නේ 10,151යි. මෙන්න, මේවා ගැන තමයි අපි කියන්නේ. විශාල පිරිසක් බදුවලින් හැංගිලා ඉන්නවා.

මා පාර්ලිමේන්තුවේ මේ ගැන කථා කළාම ගරු රංජිත් සියඹලාපිටිය රාජ්‍ය ඇමතිතුමා මේ පාර්ලිමේන්තුවට උත්තරයක් දීලා තිබෙනවා. දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධාරින් එතුමාත් කඩේ යවලා වාර්තාවක් හදා දීලා තිබෙනවා. ඒ නිලධාරින් කියනවා, අපට මේක නැහැ, මේක නැහැ, ඒ නිසා කරගන්න බැරි වුණා. බදු එකතු කරගන්න බැරි වුණා කියලා. අපේ රටේ බදු ගෙවන ක්‍රමය මොකක්ද? අපේ රටේ බදු ගෙවන ක්‍රමය, හරියට ගැටඹේ පන්සල ළඟින් යනකොට පඬුරක් දමනවා වාගෙයි. අපට හිතෙන ගණනක් ගෙවනවා. අපේ රටේ බදු නොගෙවන්නන්ට බලපාන නීතිය මොකක්ද? සාමාන්‍ය නීතිය? ලෝකයේ හැම රටකම බදු නොගෙවන්නන්ට ක්‍රියාත්මක වන්නේ අපරාධ නීතිය. අර්ජුන් ඇලෝසියස් බිලියන ගණනක් බදු ගෙව්වේ නැහැ කියලා උසාවියට දැම්මා. ඔහු ශරීර ඇප දෙකක් මත - සාමාන්‍ය ඇප දෙකක් මත - නිදහස් කළා. ඔහු මිලියන 700 ගණනක් බදු ගෙව්වේ නැහැ. මෙන්න මේවා ගැන අපි කථා කරන්න ඕනෑ. මේ නීති වෙනස් වෙන්න ඕනෑ. බදු ගෙවන්නේ නැත්නම් ලෝකයේ අනෙක් රටවල වාගේ ඒ අයට විරුද්ධව අපරාධ නීතිය ක්‍රියාත්මක කරන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ එක පුද්ගලයෙකුගේ ගිණුමකට එක අවුරුද්දකට රුපියල් බිලියන 35ක් ඇවිල්ලාත් ශතපහක්වත් බදු ගෙවන්නේ නැහැ! Casino සහ race-by-race ව්‍යාපාර කරන අය බිලියන ගණන් සල්ලි හම්බ කරනවා. ඒත් ඒ ගොල්ලන් බදු ගෙවන්නේ නැහැ. ඒ ගොල්ලන් ගෙවන්නේ licence fee එක විතරයි. එහෙම නම් අපි කියන්නේ, තිබෙන අයගෙන් අරගෙන රාජ්‍ය බදු ආදායම ශක්තිමත් කරන්න කියලායි. ඍජු බදු වැඩි කරන්න, වක්‍ර බදු අඩු කරන්න. අද වක්‍ර බදු සියයට 80යි; ඍජු බදු සියයට 20යි. ඒ නිසා අපි කියන්නේ තිබෙන අයගෙන් ගන්න කියලායි.

දැන් හැම වෙලාවේම වාගේ කථා කරනවා, මුදල් හොරකම් කිරීම් ගැන. හොරකම් කරන එක වැරදියි. ඒවා ගැන හොයන්න. හැබැයි, මේ තිබෙන කටයුතු ටික අපට කළමනාකරණය කරගන්න බැරි ඇයි? බදු ගන්න පුළුවන් අයගෙන් බදු ගන්න. මම කිව්වා, ඒක මේ පාර්ලිමේන්තුවෙන් පටන්ගන්න කියලා. පාර්ලිමේන්තුවේ අපි 150දෙනකු විතර බදු ගෙවන අය ඉන්නේ. එහෙම නොගෙවන අයට ලිපිගොනුවක් හදන්න. දැන් බලන්න, අපි අපේ වැටුපෙන් ආණ්ඩුවට යම් බද්දක් ගෙවනවා. නමුත්, ලංකා බැංකුවේ එක සේවකයෙක්වත් බදු ගෙවනවාද? මහජන බැංකුවේ එක සේවකයෙක්වත් බදු ගෙවනවාද? විදුලිබල මණ්ඩලයේ එක සේවකයෙක්වත් බදු ගෙවනවාද? මහජන බැංකුවේ DGMsලා ගෙවන බද්දත් බැංකුවෙන්මයි ගෙවන්නේ. ඒ Tax එක ගෙවන්නේත් බැංකුවෙන්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි හරියාකාරව බදු කළමනාකරණය කරගන්න ඕනෑ. වත්මන් ජනාධිපතිවරයා අය වැයෙන් යෝජනා කරලා තිබෙනවා, ඒ සඳහා බදුකරණය පිළිබඳ ජනාධිපති කොමිෂන් සභාවක් පිහිටුවනවා කියලා. එය පිහිටුවා දේශීය ආදායම් දෙපාර්තමේන්තුව, Excise Department -සුරාබදු දෙපාර්තමේන්තුව- Sri Lanka Customs එක කියන ආයතන තුන විතරක් හරියාකාරව කළමනාකරණය කරගත්තොත් ඒක ලොකු ජයග්‍රහණයක්. මම එදාත් ඉඳපු තැන තමයි, අප ලෝකය වටේ ගිහිල්ලා හිඟාකන්න, අඬන්න ඕනෑ නැහැ කියන එක. තිබෙන මිනිසුන්ගෙන් අරගෙන සැහෙන වැඩ කොටසක් කරගන්න අපට පුළුවන්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට, අපි රාජ්‍ය ආයතන ගැන කථා කරමු. ගරු ජනාධිපතිතුමා කිව්වා, මේ ප්‍රධාන ආයතන 54ක පාඩුව විතරක් රුපියල් බිලියන 86ක් කියලා. අපිත් කියනවා, "මේවා විකුණන්න හොඳ නැහැ, මේවා විකුණන්න එපා, මේවා ප්‍රතිව්‍යුහගත කරන්න එපා" කියලා. හැබැයි, රටේ මිලියන 22ක් මිනිසුන්ගෙන් බදු එක්කහු කරලා අපි මේ ආයතන ටික නඩත්තු කරනවා. ඒවායේ පාඩුව රුපියල් බිලියන 86යි. මගේ ළඟ තිබෙනවා, ඒ පාඩු ලබන ආයතන ලැයිස්තුව. 2021 වසරට පාඩුව රුපියල් බිලියන 86යි. අපි කොහොමද මේවා පවත්වාගෙන යන්නේ? එක්කෝ මේවා ලාභ ලබන ආයතන බවට පත් කරන්න ඕනෑ. එහෙම නැත්නම් මේවා ප්‍රතිව්‍යුහත කරලා හෝ රජයට බරක් නොවන විධියට පවත්වාගෙන යන්න ඕනෑ. අපි පිළිගන්නවා, අපේ රටේ ප්‍රධාන ආයතන පෞද්ගලීකරණය කළ යුතු නැහැ කියලා. හැබැයි, පවත්වාගෙන යන්න බැරි, මිනිසුන්ගේ බදු මුදලින් නඩත්තු වෙන ආයතන පිළිබඳව ආණ්ඩුව හැටියට දැන් තීරණයක් ගන්න අපේ ඇස් ඇරෙන්න ඕනෑ කාලය ඇවිල්ලා තිබෙනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ සංචාරක ව්‍යාපාරය දෙස බලන්න. අපේ රටේ සංචාරක ව්‍යාපාරය අපි හරියට පවත්වාගෙන යනවාද? මම පසුගිය සතියේ අපේ රැස්වීමක් සඳහා - රාජකාරි වැඩකට- තායිලන්තයට ගියා. තායිලන්තයට එක දවසකට සංචාරකයන් ලක්ෂයක් එනවා. තායිලන්තයට අවුරුද්දකට මිලියන හතළිහක් සංචාරකයන් ඇවිල්ලා තිබෙනවා. ථෙරවාදී බුදු දහම අදහන්න චීනයෙන් සංචාරකයන් මිලියන 10ක් තායිලන්තයට එනවා. තායිලන්තයෙන් ඉන්දියාවට සංචාරකයන් මිලියන තුනක් යනවා. නමුත් නියම බෞද්ධ ආගම තිබෙන්නේ අපේ රටේ. දළ දා මාලිගාව තිබෙන්නේ අපේ රටේ. නියම බෞද්ධ වැඩසටහන් තිබෙන්නේ අපේ රටේ. සොළොස්මස්ථාන තිබෙන්නේ අපේ රටේ. හැබැයි, තායිලන්තයේ බෞද්ධයෝ අපේ රටට ඇවිල්ලා තිබෙන්නේ 10,000යි. බෞද්ධාගම අදහන්න, බෞද්ධ ආගමික ථෙරවාදී බුදුදහම අධ්‍යයනය කරන්න සංචාරකයන් මිලියන 10ක් චීනයෙන් තායිලන්තයට එනකොට, Thailandවලින් අපේ රටට එන්නේ සංචාරකයන් 10,000යි. ඒ නිසා, අපිට අපේ රටේ market කර ගන්න පුළුවන් දේවල් තිබෙනවා. අපිට සංචාරක ව්‍යාපාරය හරහා විශාල ආදායමක් ලබා ගන්න පුළුවන්. ඩොලර් 200ක්වත් වියදම් කරන විදේශිකයෝ අපේ රටට එන්නේ නැහැ.

2020දී අපේ රටට ඇවිල්ලා තිබෙන විදේශිකයන් ප්‍රමාණය ගත්තොත්, වැඩියෙන්ම ඇවිල්ලා තිබෙන්නේ ඉන්දියාවෙන් - 89,357ක්. 2021දීත් ඉන්දියාවෙන් - 56,262ක්. 2022ත් ඉන්දියාවෙන් - 68,761ක්. ඉන්දියාවෙන් තමයි වැඩිම සංචාරකයන් ප්‍රමාණයක් අපේ රටට ඇවිල්ලා තිබෙන්නේ. පසුගිය අවුරුදු හතරේම ඉන්දියාවෙන් සංචාරකයෝ ලංකාවට ඇවිල්ලා තිබෙනවා. ඉන්දියාවෙන් සංචාරකයන් එන එක හොඳයි. හැබැයි, ඒ අය වැඩිය වියදම් කරන්නේ නැහැ. ඒ නිසා අපි බටහිර රටවල විදේශිකයෝ ගෙනැල්ලා, ඒ අයට අවශ්‍ය පහසුකම් සලසලා, දිනකට ඩොලර් 200ට වඩා වියදම් කරන්න පුළුවන් විදේශිකයෝ ලංකාවට ගෙන එන වැඩසටහනක් හදන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සංචාරක ව්‍යාපාරය තුළින් පමණක් අපට විශාල ආදායමක් ලබා ගන්න පුළුවන්.

පසුගිය කාලය තුළ එක් එක් රටවල්වලට සංචාරයට ගිය විදේශිකයන් ප්‍රමාණය ඇතුළත් ලේඛනයක් මගේ ළඟ තිබෙනවා. උදාහරණයක් ලෙස කියනවා නම්, ශ්‍රී ලංකාවට 2000දී විදේශිකයන් ඇවිල්ලා තිබෙන්නේ ලක්ෂ හතරයි. 2020දී අපේ රටට ඇවිල්ලා තිබෙන විදේශිකයන් ප්‍රමාණය ලක්ෂ පහයි. 2018දී නම්, සංචාරකයන් මිලියන 2.3 ක් ඇවිල්ලා තිබෙනවා. හැබැයි, අපි අනෙක් රටවල් ගත්තාම, 2000 වසරේ තායිලන්තයට සංචාරකයන් ඇවිල්ලා තිබෙන්නේ මිලියන 9.5යි. 2018 වෙනකොට සංචාරකයන් මිලියන 38ක් ඇවිල්ලා තිබෙනවා. අවුරුදු 18කින් මිලියන 9, මිලියන 38 දක්වා වැඩි වෙලා තිබෙනවා. හැබැයි, අපට මේ අවුරුද්දේ සංචාරකයන් මිලියනයක් ගෙන්වා ගන්න තවමත් නොහැකි වෙලා තිබෙනවා. ලෝකයේ අනෙකුත් රටවල සංචාරක ව්‍යාපාරය ගැන කියනවා නම්, සිංගප්පූරුව, මැලේසියාව යන රටවල් පසුගිය අවුරුදු 10 ක කාලය තුළ සංචාරක ව්‍යාපාරය මොන තරම් වර්ධනය කරගෙන තිබෙනවාද? සංචාරක ව්‍යාපාරය වර්ධනය කරලා සංචාරකයන් ගෙන එන වැඩසටහන් මොන තරම් හදලා තිබෙනවාද? හැබැයි, අපි එකිනෙකාට බැණ ගන්නවා. අපි එකිනෙකා රණ්ඩු වෙනවා. පාරට බැහැලා ගහ ගන්නවා. කඳුළු ගෑස් ගහ ගන්නවා. හැබැයි, මේ පාර්ලිමේන්තුව ඇතුළේ මේ පිළිබඳ සංවාදයක් ඇති කරගෙන, සංචාරක ව්‍යාපාරය දියුණු කිරීම සඳහා අපේ රටට සංචාරකයන් ගෙන්වාගන්න පුළුවන් ක්‍රම මොනවාද, ඒ සඳහා අපේ ජාතික වැඩසටහන මොකක්ද කියලා අපි කථා කරන්නේ නැහැ. අපි හැම දාම හොඳ ප්‍රතිපත්ති වෙනුවෙන් කථා කළේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මොන තරම් සුන්දර මුහුදක්ද අපට තිබෙන්නේ? අපේ සතා සිවුපාවා ගත්තත්, අපේ පූජනීය, සංස්කෘතික, ආගමික ස්ථාන ගත්තත්, අපේ රටේ ආකර්ෂණීය බව පෙන්වලා විකුණන්න පුළුවන් මොන තරම් දේවල් තිබෙනවාද? අපි හැම කෙනාම දේශපාලන කෝණයෙන් බලලා කටයුතු කරනවා මිසක්, රට ගැන හිතලා කටයුතු කරලා නැහැ. මේ දේවල් පිළිබඳව අපේ අවධානය යොමු වෙලා නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඊළඟට, අපනයනය පිළිබඳවත් අපි කථා කළ යුතුයි . 2013 වෙනකොට අපේ රටේ අපනයනය යූඑස් ඩොලර් බිලියන 10යි. 2020දී තිබුණේත්, යූඑස් ඩොලර් බිලියන 10යි. වියට්නාමය ගත්තොත්, 2018 යූඑස් ඩොලර් බිලියන 232යි. 2020 වෙනකොට අපනයනය යූඑස් ඩොලර් බිලියන 282ක්. බලන්න, ඒ වාගේ රටවල් අපනයන - exports - වෙළෙඳ පොළ හදාගෙන තිබෙන හැටි. බංග්ලාදේශයේ 2013 වෙනකොට තිබුණේ යූඑස් ඩොලර් බිලියන 29.3යි. 2020 වන විට යූඑස් ඩොලර් බිලියන 39.05යි. ඒ නිසා ලෝකයේ අනෙක් රටවල් ගත්තාම ඒ රටවල් අපනයන ආදායම හදා ගෙන තියනවා. ශ්‍රී ලංකාව අවුරුදු 10කට පෙර හිටපු තැනම තමයි අද වෙනකොටත් ඉන්නේ. අපටත් හොඳ අපනයන වෙළෙඳ පොළක් හදා ගන්න පුළුවන්. අපි ඒ පිළිබඳව අවධානය යොමු කරනවාද? අපේ නිෂ්පාදන මොන තරම් අපනයනය කරන්න පුළුවන්ද? හැබැයි, ඒ පිළිබඳව අපේ අවධානය යොමු වෙලා නැහැ.

ඊළඟට, කර්මාන්ත ක්ෂේත්‍රය ගැන කියන්නම්. අපේ විමල් වීරවංශ හිටපු කර්මාන්ත ඇමතිතුමා මේ අවස්ථාවේ සභාවේ ඉන්නවා. එතුමා කර්මාන්ත අමාත්‍යවරයා වශයෙන් හිටපු කාලයේ කර්මාන්ත ක්ෂේත්‍රය නඟා සිටුවන්න උත්සාහ කළා. මොනවා වුණත් මා පිළිගන්න ඕනෑ, හිටපු ජනාධිපති ප්‍රේමදාස රණසිංහ මැතිතුමාගේ කාලයේ අපේ රටේ කර්මාන්ත ක්ෂේත්‍රයේ දියුණුවක් ඇති වුණා කියලා. එතුමා ඇඟලුම් කර්මාන්තශාලා ඉදි කරලා කර්මාන්ත ක්ෂේත්‍රයට හයියක් දුන්නා. එතැනින් එහාට මේ රටේ කර්මාන්ත ක්ෂේත්‍රය ශක්තිමත් කරන්න කිසි කෙනෙක් කටයුතු කළේ නැහැ. වියට්නාමය අලුතින් රෙදිපිළි, ඇඟලුම්, mobile phones වැනි දේවල් නිෂ්පාදනය කරලා විදේශ වෙළෙඳ පොළට යවනවා. අපි ඒ ඔක්කොම අපේ රටට ගෙනෙනවා.

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

අපේ කර්මාන්තකරුවන් වෙනත් රටවල ආයෝජනය කරනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

Yes. That is what I am telling. ඒක තමයි අපි කියන්නේ. මනෝ ගනේසන් මන්ත්‍රීතුමා කියනවා වාගේ අපේ ඇඟලුම් නිෂ්පාදකයෝ ගිහින් අනෙක් රටවල ආයෝජනය කරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ අවධානය යොමු කළ යුත්තේ මෙන්න මේ කාරණා කෙරෙහි.

ඒ විතරක් නොවෙයි. පාඩු ලබන අපේ ආයතන ගැන මං කිව්වා. ඒ වාගේම අපනයනය ගැන, සංචාරක ව්‍යාපාරය ගැන කිව්වා. අපි තවමත් යැපුම් ආනයන ආර්ථිකයක ඉන්නේ. අපි නිෂ්පාදන ආර්ථිකයකට යන්න ඕනෑ. අපේ රටේ වගා කළ හැකි බොහෝ දේවල් තිබෙනවා. ඒවා වගා කරන්න අපට පුළුවන්. අපි දවසකට යූඑස් ඩොලර් බිලියනයක කිරි පිටි ආනයනය කරනවා. අපට අවශ්‍ය කිරි පිටි ටික මේ රටේ නිෂ්පාදනය කර ගන්න අපට පුළුවන්. එදා අපේ රටේ සියයට 100ක් මිරිස් වැව්වා. අද අපි මිරිස් සියයට 100ක් පිට රටින් ගෙනෙනවා සියයට 65ක් අල ගෙනෙනවා; සියයට 65ක් ලූනු ගෙනෙනවා. මේවා යාපනයේ, දඹුල්ලේ, මාතලේ වවන්න පුළුවන් දේවල්. අපට අවශ්‍ය අල ටික අපේ රටේ වවා ගන්න පුළුවන්. හැබැයි, අපි තනිකර යැපුම් ආනයන ආර්ථිකයකට පුරුදුවෙලා. අපි ඒවා සඳහා බිලියන ගණනක් විදේශ රටවලට දෙනවා. ඒ නිසා අපි යැපුම් ආනයන ආර්ථිකයෙන් අයින්වෙලා නිෂ්පාදන ආර්ථිකයකට යන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ වෙලාවේ අපි නිෂ්පාදන ආර්ථිකයකට යෑම තමයි කළ යුත්තේ කියලා අපි විශ්වාස කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අරගළය අපේ ඇස් ඇරියා. ආර්ථික ආර්බුදය අපේ ඇස් ඇරියා. ඒ නිසා අපේ පෞද්ගලික දේවල් පැත්තකට දමලා අපි ඔක්කොම එකට එකතුවෙලා ජාතික වැඩසටහනක් සකස් කරන්න ඕනෑ. අනුර දිසානායක මන්ත්‍රීතුමා දිගින් දිගටම කිව්වේ මොකක්ද? එතුමා කාරණා තුනක් කිව්වා. මනෝ ගනේසන් මන්ත්‍රීතුමාත් ඒක කථා කළා. එතුමන්ලා නව ජන වරමක් අවශ්‍යයි කිව්වා. දැන් ජන වරමක් දුන්නොත් මේ ප්‍රශ්නය විසඳෙයිද? මැතිවරණයකට ගියොත් මේ ප්‍රශ්නය විසඳෙනවාද කියන්න. මැතිවරණයකට ගියොත් මේ ප්‍රශ්න විසඳෙනවා නම් අපි ඔක්කොම ඒකට පක්ෂව අත උස්සන්නම්. හෙට සිට බඩු මිල අඩු වෙනවා නම්, ඩොලර් එනවා නම්, අපි ඒකට අත උස්සලා පාර්ලිමේන්තු මැතිවරණයකට යමු. එතුමන්ලා කියනවා, නව ජන වරමකට යන්න ඕනෑ කියලා. ජන වරමකට ගිහිල්ලා මොන ඉලව්වක් කරන්නද?

ජනතා විමුක්ති පෙරමුණ ගත්තොත්, ඒ පක්ෂයෙන් ඉස්සෙල්ලාම මේ පාර්ලිමේන්තුවට ආවේ එක මන්ත්‍රීවරයායි. ඒ නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. විමල් වීරවංශ මන්ත්‍රීතුමාට ඒ ගැන මතක ඇති. මුලින්ම එතුමන්ලාගේ පක්ෂය නියෝජනය කරමින් පාර්ලිමේන්තුවට පත් වුණේ එක මන්ත්‍රීවරයායි. ඊට පස්සේ මන්ත්‍රීවරුන් 10දෙනෙක් වුණා. ඊට පස්සේ මන්ත්‍රීවරුන් 16දෙනෙක් වුණා. ඊට පස්සේ මන්ත්‍රීවරුන් 43දෙනෙක් වුණා. අවසානයේ 43 සංඛ්‍යාව 3කට බැස්සා. ජන වරමකට ගිහිල්ලා එතුමන්ලාට තිබුණු මන්ත්‍රී ධුර 43 බේරා ගන්න බැරි වුණා. මේ රටේ මිනිස්සු ජනතා විමුක්ති පෙරමුණෙන් මන්ත්‍රීවරුන් 43දෙනකු පාර්ලිමේන්තුවට එව්වා. මන්ත්‍රීවරුන් 43දෙනකු පාර්ලිමේන්තුවට එවලා, ජනතා විමුක්ති පෙරමුණ ගැන ඔවුන් මහත් බලාපොරොත්තු තියා ගත්තා. අන්තිමට මොකක්ද වුණේ? මැතිවරණයෙන් පස්සේ මන්ත්‍රී ධුර සංඛ්‍යාව 3කට බැස්සා. 40දෙනෙක් ආ ගිය අතක් නැති වුණා. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව ජනතා විමුක්ති පෙරමුණ ජයග්‍රහණය කළා. ඊට පස්සේ ජනතා විමුක්ති පෙරමුණ හම්බන්තොටට ගිහිල්ලා කිව්වා, තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව ලංකාවේ ආදර්ශවත්ම ප්‍රාදේශීය සභාව කරනවා කියලා. එහෙම කියලා අවුරුදු 5කින් මැතිවරණයකට ගියා. ජනතා විමුක්ති පෙරමුණ නියෝජනය කළ සියලු මන්ත්‍රීවරු ඒ මැතිවරණයෙන් පරාජයට පත් වුණා. ඔබතුමන්ලාට සුරංගනා කථා කියන්න පුළුවන්; ලස්සණට කියන්න පුළුවන්. නමුත් ප්‍රාදේශීය සභාවක් පවත්වාගෙන යන්න බැරි වුණා. මන්ත්‍රී ආසන්න 43ක් තියා ගන්න බැරි වුණා. ඒ විතරක් නොවෙයි. අනුර දිසානායක මන්ත්‍රීතුමාට එදා රටේ කෘෂිකර්ම ඇමති ධුරය දුන්නා. එය මං හිටපු අමාත්‍යාංශයයි. වැව් දසදහසක් හදනවා කියලා එතුමා කිව්වා. තවත් දේවල් කරනවා කිව්වා. ඒ නිසායි මං කියන්නේ, "කියන්න පුළුවන්, කරන්න ගියාම තමයි අමාරු" කියලා.

අනුර දිසානායක මැතිතුමා කිව්වා, නව ජන වරමක්, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක්, නව රාජ්‍ය සේවයක් අවශ්‍යයි කියලා. එතුමාගේ කථාවේදී එතුමා කිව්වා, රාජ්‍ය සේවකයන් ප්‍රමාණය වැඩියි කියලා. හැබැයි, ඊට පස්සේ නැවතත් කියනවා, මේ රාජ්‍ය සේවකයන් අයින් කරන්න එපා කියලා. මොකක්ද මේ විහිළු කථාව? රාජ්‍ය සේවකයන් වැඩි නම් අයින් කරන්නේ නැතුව මොනවාද කරන්නේ? එතුමා හිතනවා, රාජ්‍ය සේවකයන් අයින් කළොත් එතුමාගේ ඡන්ද ටික කැඩෙයි කියලා. එතුමා කියනවා, රාජ්‍ය සේවකයන් ප්‍රමාණය වැඩියි, රාජ්‍ය සේවය ප්‍රතිව්‍යුහගත කරන්න ඕනෑය කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලා කියන දේ ප්‍රායෝගිකව කරන්න බැහැ. ජන වරමකට ගිහිල්ලා වෙන පිරිසකට බලය දුන්නා කියලා මේවා කරගෙන යන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමා ඉල්ලන්නේම මැතිවරණයක්. මේ සියලුදෙනාම දඟලන්නේ බලය ගන්නයි. එතුමන්ලා උත්සාහ කරන්නේ බලය ගන්නයි. බලය අරගෙන රට පවත්වාගෙන යන්නේ කොහොමද කියලා කියන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලා කියනවා, බදු අය කරන්න එපා කියලා. බදු නැතුව රටක් පවත්වාගෙන යන්නේ කොහොමද? එහෙම නම් සජිත් ප්‍රේමදාස විපක්ෂ නායකතුමාත්, අනුර දිසානායක මන්ත්‍රීතුමාත් කියන්න ඕනෑ, "අපි IMF එකට යන්නේ නැහැ. අපි බදු වැඩි කරන්නේ නැහැ. අපි රාජ්‍ය සේවය කප්පාදු කරන්නේ නැහැ. අපි පඩි වැඩි කරනවා. මෙන්න මේවා තමයි ඒවාට විසඳුම්" කියලා. නමුත් එහෙම වැඩ පිළිවෙළක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒකයි මම කියන්නේ මේ වෙලාවේ අපි සියලුදෙනා එකට එකතු වෙමු කියලා. මිනිස්සු පාරට බැහැලා අපේ ඇස් ඇරවපු වෙලාවේ, අපි සියලුදෙනාම එකට එක්කහු වෙලා ජාතික ප්‍රතිපත්ති ටික හදමු. අවුරුදු හැත්තෑ ගණනක් ගතවෙලාත් අපට අපේ බදු ටික හරියට එකතු කර ගන්න බැරිවෙලා තිබෙනවා. අපි දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ වෙනම ඒකකයක් හදලා තිබෙනවා, බදු ටික එකතු කරන්න. RAMIS එක හදලා අවුරුදු හතක් වෙනවා. තවම ඒ පද්ධතියෙන් වාර්තාවක් ලබා ගන්න බැහැ. ඒ ඇයි? ඒ වාර්තා එළියට දාපු ගමන් හොරකම් ටික එළියට එනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කියන්නේ මේකයි. මේ වෙලාවේ අපි ඔක්කෝම එකට එකතුවෙලා නිෂ්පාදන ආර්ථිකයකට යෑම සඳහා ජාතික වැඩසටහනක් හදමු. ඒ වාගේම ජනතා බදුවලින් පවත්වාගෙන යන පාඩු ලබන ආයතන ටික ආණ්ඩුවට බරක් නොවන විධියට පවත්වාගෙන යන්න එම ආයතන ප්‍රතිව්‍යුහගත කරන්න කටයුතු කරමු. ඒ වාගේම අපේ

සංචාරක ව්‍යාපාරය දියුණු කරලා, අඩු ගණනේ මිලියන හතක හෝ දහයක සංචාරකයන් ප්‍රමාණයක් ලංකාවට ගෙන්වා ගන්න කටයුතු කරමු. ඒ සඳහා හොඳම උදාහරණය තායිලන්තය. තායිලන්තයට දවසකට පැමිණෙන විදෙස් සංචාරකයන් ප්‍රමාණය ලක්ෂයයි. අපට අවුරුද්දටම ලක්ෂ 10යි. අපි දවස් 365ට ගේන ගණන ඒගොල්ලෝ දවස් 10ට ගේනවා. COVID-19 වසංගතයට කලින් තායිලන්තයට විදේශ සංචාරකයන් මිලියන 400ක් ඇවිල්ලා. අපේ සංචාරක ව්‍යාපාරය ශක්තිමත් කර ගන්න, අපනයන - exports - වැඩි කර ගන්න, කර්මාන්ත ක්ෂේත්‍රය ශක්තිමත් කර ගන්න අපට පුළුවන් නම්, අපේ ආර්ථිකය ශක්තිමත් කර ගත හැකියි.

ගරු විමල් වීරවංශ මැතිතුමාත් දන්නවා, අපේ කර්මාන්තකරුවන් විශාල ප්‍රමාණයක් අද වියට්නාමයේ, මැලේසියාවේ, තායිලන්තයේ කර්මාන්තශාලාවල ආයෝජනය කර තිබෙන බව. ඒ සෑම රටකම ඉන්න අපේ කර්මාන්තකරුවන් ලංකාවට ගෙන්වා, අපේ රටේ ආයෝජන අවස්ථා ඇති කරලා, කර්මාන්ත ක්ෂේත්‍රය ශක්තිමත් කරන්න පුළුවන් නම්, අපට අපනයන වෙළෙඳ පොළ ආක්‍රමණය කරන්න පුළුවන්. මම උදාහරණයකට කිව්වා, වියට්නාමය ගැන. වෙන මොකුත් ඕනෑ නැහැ. ඩොලර් බිලියන 232 සිට 282 දක්වා වියට්නාමයේ exports වැඩිවෙලා තිබෙනවා. ඒ වාගේම ලෝකයේ අනෙක් රටවල් ගත්තාමත්, අපනයන වෙළෙඳ පොළ වැඩිවෙලා තිබෙනවා. අපි අවුරුදු 10ක් ආපස්සට බැලුවොත්, 2010දී අපේ අපනයන ප්‍රමාණයත්, අද ප්‍රමාණයත් සමානයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තිබෙන්නේ තව විනාඩි 2ක කාලයක් පමණයි.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණය කියලා මම කතාව අවසන් කරනවා.

මේ වෙලාවේ රටක් හැටියට අපි කළ යුත්තේ, මැතිවරණයකට යෑම නොවෙයි, ජන වරමකට යෑම නොවෙයි. අපි මැතිවරණයකට යමු. හැබැයි, මේ වෙලාවේ කළ යුත්තේ මැතිවරණයකට වියදම් කිරීම නොවෙයි. මැතිවරණයකට ගියොත් එක්කෝ දිනයි, නැත්නම් පරදියි. ඒ ගැන ප්‍රශ්නයක් නැහැ. හැබැයි, රටේ ජනතාව ඉල්ලන්නේ මැතිවරණයක් නොවෙයි, මිනිස්සු ඉල්ලන්නේ ජන වරමක් නොවෙයි. මිනිස්සු ඉල්ලන්නේ, ඒ අයට ජීවත් වෙන්න හයිය දෙන්න කියලා. මිනිසුන්ට ජීවත් වෙන්න හයිය දෙන්න නම්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගිහිල්ලා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ සහන ටික අරගෙන, අපේ ණය ටික ප්‍රතිව්‍යුහගත කරලා, නැවත ණය ගෙවිය හැකි රටක් බවට අපේ රට පත් කර ගත යුතුයි. නිෂ්පාදන ආර්ථිකයක් කරා රට අරගෙන ගිහිල්ලා, අපේ සංචිත ටික ශක්තිමත් කරලා, අපේ බදු ආදායම වැඩි කරගෙන, පාඩු ලබන ආයතන ටික ප්‍රතිව්‍යුහගත කර ගත යුතුයි. ඒ සඳහා අපි සියලුදෙනාටම ජාතික වැඩසටහනකට, ජාතික වැඩ පිළිවෙළකට එකතු වෙන්න පුළුවන් නම්, ඒක තමයි මේ වෙලාවේ අපට කරන්න පුළුවන් එකම දේ.

මම ජනතා විමුක්ති පෙරමුණට දොස් කියනවා නොවෙයි. මම එදාත් කිව්වේ, එතුමන්ලාට ඕනෑ තරම් අවස්ථාව දීලා තිබෙන බවයි. මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රී ආසන 225න්, 43ක් ජේවීපී එකට ඒ අවස්ථාවේ දීලා තිබෙනවා, රටට වැඩ කරලා පෙන්වන්න කියලා. Double cab එකක ගියා කියලා, පොල්අතු කඩෙන් තේ බිව්වා කියලා ආණ්ඩු හදන්න බැහැ, විමල් වීරවංශ මැතිතුමනි. Double cab එකක ගියාට, permit එක නොගත්තාට-

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
මටද කියන්නේ?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඔබතුමාට නොවෙයි, ඔබතුමා හිටපු පක්ෂයට මම කියන්නේ. අපි ආදර්ශවත් කියලා රටට පෙන්වන්න පුළුවන්. හැබැයි, එහෙම ආණ්ඩු හදන්න බැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ආදායම් බදු වැඩි කිරීමට යෝජනා කරලා තිබෙනවා. මසකට රුපියල් ලක්ෂයකට වැඩි ආදායමක් ලබන අයත් මේ බද්දට අයත් වනවා. මම යෝජනාවක් හැටියටත් කිව්වා, ගරු ජනාධිපතිතුමාට පෞද්ගලිකවත් කිව්වා, මේ තිබෙන ආර්ථික අර්බුදය නිසා පුළුවන් නම් ඒ සීමාව ලක්ෂ එකහමාර දක්වාවත් වැඩි කරන්න පුළුවන් නම් හොඳයි කියලා. ඒ කාරණයට මුදල් අමාත්‍යවරයා හැටියට එතුමාගේ අවධානය යොමු කරමින්, මම නිහඬ වනවා.

බෙහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විමල් වීරවංශ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 11ක කාලයක් තිබෙනවා.

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 12ක් තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
විනාඩි 11යි.

[අ.භා. 1.53 ]

**ගරු විමල් වීරවංශ මහතා**
(மாண்புமிகு விமல் வீரவங்ஸ)
(The Hon. Wimal Weerawansa)
ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා වැඩිපුර ගත්ත කාලය අපෙන් අඩු කරන්න එපා. ඒ කාලය සජබ මන්ත්‍රීවරුන්ගේ වෙලාවෙන් අඩු කර ගන්න. අපේ විනාඩි 12 අපට දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට පෙර අදහස් දක්වපු මහින්දානන්ද අලුත්ගමගේ මැතිතුමා අපේ රටේ දියුණුව වෙනුවෙන් කළ යුතු යැයි හිතෙන බොහෝ අදහස් ඉදිරිපත් කළා. එතුමා කර්මාන්ත ක්ෂේත්‍රය ගැන විශේෂයෙන් සඳහන් කරපු නිසා එතැනින්ම මගේ කතාව පටන් ගැනීම සුදුසුයි කියා මා හිතනවා.

මම කර්මාන්ත ඇමති වෙලා හිටපු කාලයේ පුත්තලම සිමෙන්ති කම්හලට අයිති වෙලා තිබුණු, චන්ද්‍රිකා මැතිනියගේ කාලයේ පෞද්ගලීකරණය කරපු, INSEE කියන සිමෙන්ති නිෂ්පාදන සමාගමෙන් එක දවසක් මට කථා කරලා පැමිණිල්ලක් කළා. ආණ්ඩු පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක් -එක කාලයක රාජ්‍ය ඇමතිවරයෙක්- ඒ සමාගමට බලපෑම් කරලා තිබෙනවා මත් ද්‍රව්‍ය පාවිච්චි කර කර හිටපු සේවකයන් පිරිසක් අයින් කළා කියලා. ඒ සේවකයන් එතුමාගේ ගෝලයෝ බව

[ගරු විමල් වීරවංශ මහතා]

පවසා, ඔවුන් නැවත සේවයට ගන්න කියලා තමයි බලපෑම් කරලා තිබෙන්නේ. අන්තිමට ඒ සමාගමට මේ අර්බුදය විසඳා ගන්න ආණ්ඩු පක්ෂයේ ඒ මන්ත්‍රීවරයාට සිමෙන්ති කොට්ට 1,000ක්, 2,000ක් පරිත්‍යාග කරන්නත් සිද්ධ වුණා. ඒ පැමිණිල්ල රටේ ජනාධිපතිවරයාට පවා ආවා. මෙහෙම කර්මාන්ත පවත්වාගෙන යන්නේ කොහොමද කියලා කියන්න මට? ඒ මන්ත්‍රීතුමා කපුටා පිළිගන්න ගුවන් තොටුපොළටත් ගිහින් ඉන්නවා මම දැක්කා. මේ, කපුටාටම ගැළපෙන අය. ආණ්ඩු පක්ෂයේ බලය පාවිච්චි කරලා, තමන්ට තිබෙන හයිය පෙන්වා, "මට මේක දීපන්, අරක දීපන්" කියලා ඒ සමාගමට බලපෑම් කරනවා. ඒ සමාගමට සේවකයන් ගේන බස් රථ ටිකත් ඒ මන්ත්‍රීවරයාගෙන් ගන්න කියලා කියනවා. එවැනි දේශපාලන සංස්කෘතියක් තමයි මේ රටේ තිබෙන්නේ.

කර්මාන්තයක් පටන් ගන්නකොට මුලින්ම පගාව දෙන්න වෙන්නේ ප්‍රාදේශීය සභාවට. එහෙම නැත්නම් නගර සභාවට. ඊළඟට, මධ්‍යම පරිසර අධිකාරියෙන් ඇවිත් කෙකර ගානකොට එතැනටත් දෙන්න වෙනවා. අපේ රටේ හදලා තිබෙන්නේ කර්මාන්තකරුවා දිරිගන්වන සංස්කෘතියක් නොවෙයි. කර්මාන්තකරුවා කරමින් ඉන්න කර්මාන්තයත් එපා කරවලා, මේ රටත් එපා කරවන විධියේ තත්ත්වයක් තිබෙන්නේ. අපි මේ පාර්ලිමේන්තු සභා ගැබ මැද්දේ කොයි තරම් බරසාරෙට කථා කළත්, මහ පොළොවේ තිබෙන ඒ අපරාධ ස්වභාවය වෙනස් කරන්න ප්‍රායෝගික මැදිහත්වීමක් නැත්නම් කවදාවත් අපේ රටේ කර්මාන්ත සංස්කෘතියක් ඇති වෙන්නේ නැහැ. තමුන්නාන්සේලා කියපු වියට්නාමය වෙන්න පුළුවන්, වෙනත් රටක් වෙන්න පුළුවන්, ඒ හැම රටකම පවතින නීති-රීති කාටත් එකයි. ප්‍රාදේශීය දේශපාලනඥයන් සතුටු කරන්න දොළ පිදේනි දෙන්න ඒ කර්මාන්තකරුවන්ට බැහැ. මේ දේශපාලන සංස්කෘතිය යට ඉඳන් උඩට හදලා තිබෙන්නේ එන මිනිහා මරාගෙන කාලා හරි තමන්ගේ කුට්ටිය කඩා ගැනීමේ පෙරේතකමට. ඒ නිසා අපි එතැනින් පටන් ගන්න ඕනෑ.

ජනාධිපති රනිල් වික්‍රමසිංහ මහත්මයා මුදල් ඇමති විධියට මේ අය වැය ඉදිරිපත් කරලා කියනවා, "අපි ආපු ගමනේ වැරැදි තිබෙනවා. අපි ජනප්‍රිය දේවල් පස්සේ ගියා. අපි නිවැරැදි දේවල් කළේ නැහැ." කියලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බියගම තිබුණු පොහොර ෆැක්ටරියට වෙච්ච වැඩේ මට මතක් වුණා. මගේ මතකය අනුව එතුමා කර්මාන්ත ඇමති වෙලා හිටපු කාලයේ ඒ බියගම පොහොර කර්මාන්තශාලාවේ මේ රටට වුවමනා යූරියා ප්‍රමාණය නිෂ්පාදනය කළා. අපි සමහර වෙලාවට ඒ යූරියා අතිරික්තය පාකිස්තානයට පවා විකුණලා තිබෙනවා. එහෙම තිබ්බ කර්මාන්තශාලාවක් තමයි පිට රට සමාගමකට කුණුකොල්ලෙට දුන්නේ. ඒගොල්ලන් ඒ ඔක්කෝම යන්ත්‍ර සූත්‍ර ටික ගලවාගෙන යන්න ගියා. ඊට පස්සේ ඒකේ වධකාගාරයක් දාගත්තා. අන්න, කර්මාන්තවලට කරපු දේ! මේ රටේ ගොවියාට වුවමනා කරන යූරියා ටික නිපදවපු පොහොර සමාගම පාඩු ලබන මට්ටමට බලෙන් ඇද වට්ටලා, ඊට පසුව පාඩුයි කියලා පෙන්වලා විදේශ සමාගමකට දුන්නා. ඒ අය ඒ යන්ත්‍ර සූත්‍ර ගලවාගෙන යන්න ගියා. එහෙම ඉතිහාසයකින් බැට කාපු, තුට්ටු දෙකේ තීරණ අරගෙන මේ රට මේ වළට ඇද දැමූ භාවිතා ඕනෑ තරම් පේන්න තිබෙන රටක, අවුරුදු 20ක් විතර ගියාට පස්සේ ඒ රනිල් වික්‍රමසිංහ මහත්මයාම ජනාධිපති හැටියට ඇවිල්ලා කියනවා, "අපේ වැරැදි තිබිලා තිබෙනවා" කියලා. හරි, ඒ වැරැද්ද අද දකිනවා නම්, ඒක නිවැරැදි කරන උපාය මාර්ගික සැලැස්මක් මේ අය වැයේ තිබෙන බවක් පේනවාද?

කුරුඳු නිෂ්පාදනය බලගන්වන්න යම් කිසි මැදිහත්වීමක් කරන්න නම් යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ වාගේ යෝජනා එකක්, දෙකක් හැරුණාම, සරලව ගත්තොත් මෙතැනදීත් බලන්නේ මෙන්න මෙච්චරයි. ලාභ ලබන ආයතන ටිකේ ලැයිස්තුව දාලාම තිබෙනවා. ඒවා ඩොලර්වලට විකුණනවා. විකුණලා විදේශ සංචිතය ඩොලර් බිලියන තුනක්, හතරක් හදාගන්නවා. ඩොලර් බිලියන තුන හතරක සංචිතයක් හදාගත්තාම ආයෙත් ratingවලින් පොඩ්ඩක් අපි උඩට එනවා. Ratingsවලින් පොඩ්ඩක් උඩට ආවාම ආයෙත් කවුරු හරි හෙට්ටියෙක් ළඟට ගිහින් ණය ගන්න පුළුවන්කම ලැබෙනවා. ආයෙත් ණය ගන්න පුළුවන්කම ලැබුණාම, ණයට අරන් සැපට කාලා ජොලියේ ඉන්නවා. ඒ ආර්ථික දර්ශනය හැරෙන්න වෙන දර්ශනයක් මට නම් මේ අය වැයේ පේන්නේ නැහැ.

රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා අය වැය කථාවෙන් පරිබාහිරව පාර්ලිමේන්තුවෙන් පිටතදී කරපු කථාවකත් කියනවා, "මම සංවේදී ඔය ආයතන ගැන නොවෙයි, ඒ ගොඩනැඟිලි ගැන නොවෙයි. මම සංවේදී කුස්සිය ගැන. ඒ ටික විකුණලා ඩොලර් බිලියන 3ක්, 4ක් හදා ගත්තොත් අපේ සංචිතය ශක්තිමත් වෙනවා" කියලා. එතැනින් කථාව නවත්වනවා. මේවා ටික විකුණලා සංචිතය ශක්තිමත් කරගන්න ඩොලර් බිලියන තුන හතරක් සොයා ගන්නවා කියන්නේ මොකටද? ඒ නැවතත් පරණ track එකට වැටෙන්නයි. සංචිතය පෙන්වලා ratingsවලින් ඉහළට ගියාම, නැවත ණය ගන්න පුළුවන්; අධික පොලියට නැවත ණය ගන්නවා.

දැන් මෙතැන කථා කරපු කවුරුවත් මේ කාරණය කිව්වේ නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය අවුරුදු හතරහමාර -යහපාලන ආණ්ඩුවේ අවුරුදු හතරහමාර- තුළ අපේ මුළු විදේශ ණය බර ඩොලර් බිලියන 52ක්. අපි ගත්ත වාණිජ ණයත් ඒ තුළ තිබෙනවා. ඒ කියන්නේ ISB ණය. සියයට හයට වඩා වැඩි පොලියට ගත්ත ජාත්‍යන්තර ස්වෛරී බැඳුම්කර ණය ඔක්කොම තිබෙනවා, ඩොලර් බිලියන 17ක්. ISB ණය, අධික පොලියට ගත්ත වාණිජ ණය ඇතුළු ඩොලර් බිලියන 17න් ඩොලර් බිලියන 12.5ක්ම ගත්තේ යහපාලන අවුරුදු හතරහමාරේ. ඒ ISB ණයවල වාරිකය එක පාරට ගෙවන්න වුණාම තමයි ණය කළමනාකරණය කර ගැනීමේ අර්බුදයක් මතු වන්නේ. ඒ අවුරුදු හතරහමාර තුළ ඩොලර් බිලියන 12.5ක් සියයට 6, 7, 8, 9 පොලියට ගැනීමත් අද මේ තිබෙන අර්බුදයට ප්‍රධාන හේතුවක්. ඒ හේතුකාරකයම අද අපිට ඇවිල්ලා කියනවා, "අපෙන් වැරදි වෙලා තිබෙනවා. අපි ඒවා හදාගෙන යමු" කියලා. එක පැත්තකින් බියගම පොහොර ෆැක්ටරි එක පාඩු කරවලා, විකුණලා එතැන වධකාගාරයක් පවත්වාගෙන ගිය කෙනා; අනෙක් පැත්තෙන් අවුරුදු හතරහමාරකදී අර ඩොලර් බිලියන 17න් ඩොලර් බිලියන 12.5ක වැඩිම පංගුවක් ණය බරට එකතු කරපු කෙනා. ඒ නිසා ඒ වැදි බණවලින් මේ අභියෝගය ජයගන්න පුළුවන් කියලා අපි විශ්වාස කරන්නේ නැහැ.

අද මට තිබෙන සරලම ප්‍රශ්නය මේකයි. තමුන්නාන්සේලා විදේශ විනිමය පනත සංශෝධනය නොකරන්නේ ඇයි? පසුගිය අවුරුදු හතරහමාර තුළ සිටි රවි කරුණානායක හිටපු මුදල් ඇමතිවරයා මේ රටේ එතෙක් තිබ්බ විදේශ විනිමය පනත සංශෝධනය කළා. ඊට කලින් තිබ්බ නීතිය අනුව නිශ්චිත කාලයක් තුළ ලංකාවට විදේශ විනිමය ගෙන ආ යුතුමයි. එසේ නොගෙනාවොත් එය අපරාධමය වරදක්. ඒ නිසා අපේ නිෂ්පාදකයෝ තමන් උපයපු විදේශ විනිමය ප්‍රමාණය මාස දෙකකට හෝ තුනකට හෝ වරක් ලංකාවට ඇතුළට ගෙනෙනවා. නොගෙනාවොත්, නඩු පවරන්න මහ බැංකුවට බලය තිබුණා. රවි කරුණානායක එදා ඒ නඩු පැවරීම සම්බන්ධයෙන් ඒ පනතේ තිබුණු ඔක්කොම වගන්ති අයින් කරලා විදේශ විනිමය මාස 6ක් ඇතුළත ගෙන ආ යුතුයි කියලා බොරුවට සඳහන් කළා. නොගෙනාවොත් මොකක්ද කරන්නේ? ඒකට කරන දෙයක්

නැහැ. ඒ නිසා මේ රටේ නිෂ්පාදකයෝ අවුරුදු ගණනක් තිස්සේ විදේශ වෙළෙඳපොළේ නිෂ්පාදන අළෙවි කරලා උපයන මුළු ඩොලර් ආදායම අපට එන්නේ නැහැ. ඩොලර් බිලියන 35කට වැඩි ප්‍රමාණයක් රටින් එළියේ 'පාක්' කරලා තිබෙනවා. ඒවා ගෙන්වන්න විදේශ විනිමය පනත සංශෝධනය කරලා පෙර තිබුණු තත්ත්වයට ගෙනෙන්න බැරි නම්, එතැනට අවධානය යොමු කරන්න බැරි නම් මේ බලාපොරොත්තු වන්නේ මොකක්ද?

තමුන්නාන්සේලා පාසල් දරුවෝ ගෙනියන පොත් බෑග් එකේ, සපත්තු කුට්ටමේ, පොත් ටිකේ මිල තුන් හතර ගුණයකින් වැඩි කර කර බදු අය කරනවා. නමුත් මේ රටට විදේශ විනිමය ප්‍රමාණය ගෙනෙන්න ඕනෑ නීති සංශෝධනය කරන්නේ නැහැ. ඒක කරන්න ඕනෑකමක් නැහැ කියන්නේ, තමුන්නාන්සේලා මේ ප්‍රශ්නය මුලින් අල්ලාගෙන නොවෙයි විසඳන්න හදන්නේ. එහෙම නොවී මේ ප්‍රශ්නයේ හිසෙන් අල්ලන්න ඕනෑ. ඒ නිසා තමුන්නාන්සේලා තවදුරටත් කරන්නේ බොරුව. ඒ පියවරට නොගිහින් වෙන වෙන දේවල් කථා කර කර කරන්නේත් බොරුව. අපි අහන්නේ මෙච්චරයි. තමුන්නාන්සේලා තේරුම් ගත්තා නම් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයාටත් තනතුර දාලා පලා යන්න සිද්ධ වුණේ ඇයි කියලා, ඒ යථාර්ථයට කෙළින් මුහුණ දීලා, තීරණ අරගෙන ඒ පිළිබඳ මහජනයා දැනුවත් කරන්න තිබුණා. එහෙම සාකච්ඡාවකින් මේ අභියෝගයට මුහුණ දෙන්න උපාය මාර්ගික සැලැස්මක් තමුන්නාන්සේලාට තිබ්බේ නැහැ. දැන් මෙතැනදීත් එහෙම කිසිම සැලැස්මක් නැතුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මොකක්ද එක දිහා විතරක් බලාගෙන දවස කළමනාකරණය කරනවා. අපි ණය ප්‍රතිව්‍යුහගත කිරීමට විරුද්ධයි කියලා කිසියම් රටක් හෝ රටවල් දෙකක් හෝ කිහිපයක් කිව්වොත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ මුළු ක්‍රියාවලියම ඒ මත යැපෙනවා, ඒ මුළු සැලැස්මම ඒ මත බිඳ වැටෙනවා. ඒ සැලැස්ම සාර්ථක වුණත්, හම්බ වෙන්නේ වාරික 4කට ඩොලර් බිලියන 2.9යි.

අපේ මුළු ණය ප්‍රමාණය ඩොලර් බිලියන 52ක්. ඩොලර් බිලියන 52ක ප්‍රශ්නයකට ඩොලර් බිලියන 2.9කින් කරන්න පුළුවන් කොංගෙඩිය මොකක්ද කියලා තමුන්නාන්සේලාට පැහැදිලියි. මෙතැන වෙන්නේ, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ බෙහෙත් වට්ටෝරුව දිහා විතරක් බලාගෙන, ඒ බෙහෙත තමයි එකම බෙහෙත, හොඳම බෙහෙත, ඒ බෙහෙත පෙව්වාම තමයි මේ ලෙඩේ හොඳටම සනීප වෙන්නේ කිය කියා ඉස්සරහට යනවා. අන්තිමට දොස්තර මහත්මයා කියයි, "ප්‍රතිව්‍යුහගත කරන වැඩේ ඔයගොල්ලන්ට කර ගන්න බැරි වුණා, ඒක අපේ බෙහෙතේ ප්‍රශ්නයක් නොවෙයි, ඔයගොල්ලන්ගේ ප්‍රශ්නයක්." කියලා. අන්න එතැනටයි මේ පාර කපමින් තිබෙන්නේ. ආජන්ටිනාව 1980 ගණන්වල ඉඳලා අදටත් ආර්ථික අර්බුදයේ ගිලුණු රටක්; පස් වතාවක් default වුණු රටක්. ලංකාවත් එහෙම දීර්ඝ කාලීන අර්බුද සමයකට ඇදගෙන යැම පමණයි තමුන්නාන්සේලා මේ අනුගමනය කරන ප්‍රතිපත්ති හා අරගෙන තිබෙන තීරණවලින් සිද්ධ වන්නේ කියලා අපට බොහොම පැහැදිලියි. ඒ නිසා මේ අය වැය, මේ අභියෝගය ජය ගැනීම සඳහා පුරෝගාමී බලපෑමක් නොකරන අය වැයක් හැටියට සලකා අපේ මතය අපි ඉදිරිපත් කරනවා.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිමල් ලාන්සා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි දහනවයක කාලයක් තිබෙනවා.

[අ.භා.2.05 ]

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අය වැය දෙවන වර කියවීමේ විවාදයේ අවසාන දිනයේ අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

අපේ පාර්ලිමේන්තු ඉතිහාසය තුළ අය වැය ලේඛන ඉදිරිපත් කරපු අවස්ථාවලින් අතිදුෂ්කර සහ අමාරුම අවස්ථාවක ඉදිරිපත් කළ අය වැය ලේඛනය තමයි, මුදල් අමාත්‍යවරයා විධියට ගරු ජනාධිපතිවරයා 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කළේ. ඒ ප්‍රශ්න සියල්ල කළමනාකරණය කරගෙන ගරු ජනාධිපතිතුමා මුදල් අමාත්‍යතුමා විධියට මෙවර අය වැය ලේඛනය ඉදිරිපත් කිරීම පිළිබඳව මාගේ ස්තුතිය පිරිනමන්න ඕනෑ.

මේ අය වැය ලේඛනය පිළිබඳව පසු ගිය සතියේම විපක්ෂයේ ගරු මන්ත්‍රීවරු කථා කළා. අය වැය ලේඛනයක් ඉදිරිපත් කළාම සාම්ප්‍රදායිකව ආණ්ඩු පක්ෂය එහි ගුණ වයනවා, විපක්ෂය එහි අගුණ දකිනවා. හැබැයි, එහෙම කරන්න පුළුවන් කාලයක නොවෙයි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරලා තිබෙන්නේ. තමුන්නාන්සේලා-අපි සියලුදෙනා දන්නවා, මේ රට ඉතාම අමාරු තැනක තිබෙන බව. මේ රටේ ආර්ථිකය ඉතාම අමාරු තැනක තිබෙන්නේ. එහෙම අවස්ථාවක ඉදිරිපත් කළ මේ අය වැය ලේඛනයට වඩා එහා ගිය, මීට වඩා රටට වැඩදායී, මීට වඩා ක්‍රමවත් වැඩ පිළිවෙළක් තිබෙනවා නම්, තමුන්නාන්සේලා ඒ පිළිබඳ අදහස් දැක්වුවා නම්, සාධනීය පියවරක් විධියට අපට ඒක දකින්න පුළුවන්. හැබැයි, හැම දාම කරනවා වාගේ සාම්ප්‍රදායානුකූලව මොකක් හරි එකක් අල්ලාගෙන නිකම්ම අය වැය ලේඛනයට විරුද්ධ වීම නොවෙයි, විපක්ෂය කරන්න ඕනෑ.

විපක්ෂය ඉතාම පැහැදිලිවම දැන ගන්න ඕනෑ, අය වැය ලේඛනය කියන්නේ මොකක්ද කියලා. අය වැය ලේඛනයකින් කියන්නේ ආදායම සහ වියදම. අපේ රටට ලැබෙන ආදායම ප්‍රමාණවත් වෙන්න ඕනෑ, මේ රටේ ජනතාවගේ එදිනෙදා කටයුතු ටික ඉටු කරලා, ඉතුරු වැඩ ටික කර ගන්න. හැබැයි, අපේ ආදායම ප්‍රමාණවත් නැහැ, ඒ වියදම් ටික cover කර ගන්න. ඒ නිසා විපක්ෂයේ පක්ෂ සියල්ල කටයුතු කරන්න ඕනෑ, ආදායම වැඩි කර ගන්න පුළුවන් ආකාරයේ යෝජනා ඉදිරිපත් කිරීමටයි. එහෙම නැතුව නිකම් කටට එන පළියට විවිධ දේවල් දෙඩවීම නොවෙයි කරන්න ඕනෑ. තමුන්නාන්සේලා-අපි සියලුදෙනා දන්නවා, අපේ රටට ලැබෙන ආදායමින් වැඩි ප්‍රමාණයක් යන්නේ මේ රටේ රාජ්‍ය සේවකයන්ට පඩි ගෙවන්න, විශ්‍රාම වැටුප් ගෙවන්න සහ සුබසාධන කටයුතු සඳහා බව. ඒ නිසා හෙට කවුරු බලයට ආවත්, හෙට කවුරු බලයේ හිටියත්, මේ සරල ප්‍රශ්නය අපි තේරුම් ගන්න ඕනෑ. මොකක්ද මේ සරල ප්‍රශ්නය? රජයට ලැබෙන ආදායම මදි. රාජ්‍ය පවත්වාගෙන යැම සඳහා ලැබෙන ආදායම මදි. එහෙම නම්, ඒ ආදායම වැඩි කරන්න ඕනෑ. ආදායම වැඩි කරන ගමන් වියදම අඩු කරන්න ඕනෑ.

හැබැයි, අද විපක්ෂය මොකක්ද කියන්නේ? විපක්ෂය කියන්නේ, "බදු වැඩි කරලා ආදායම වැඩි කරන්න යන එක වැරදියි. රාජ්‍ය සම්පත් -පාඩු ලබන රාජ්‍ය ආයතන- විකුණන එක වැරදියි. ජනතාවට දීලා තිබෙන සුබසාධන දීමනා මදි." කියලා. ජනතාවට අරවා කරන්න ඕනෑ, ජනතාවට මේවා කරන්න ඕනෑ කියලායි කියන්නේ. මොළය පොඩ්ඩක් හරි තිබෙනවා නම්, මොංගල් ගතියක් නැත්නම්, ලැබෙන ආදායම වියදම් කරන්නත් මදි නම්, තව වැඩිපුර ගෙවන්නේ කොහොමද කියලා කියන්න බලන්න.

[ගරු නිමල් ලාන්සා මහතා]

ඒ නිසා අද අය වැයට විපක්ෂව ඡන්දය දෙන මන්ත්‍රීවරු කියන්න ඕනෑ, මේ රටට ලැබෙන ආදායම මදි නම් ඒ ආදායම වැඩි කරගන්නා ක්‍රම ගැන, වියදම අඩු කර ගන්නා ක්‍රම ගැන නේ කියන්න ඕනෑ. එහෙම නැතුව කට තිබ්බ පළියට මෙතැනට ඇවිල්ලා එක එක ඒවා කිව්වාට වැඩක් නැහැ. විපක්ෂයේ කිසිම මන්ත්‍රීවරයෙක් මේ අය වැය ලේඛනය සම්බන්ධයෙන් සාධනීය කාරණාවක් ඉදිරිපත් කළේ නැහැ. ආදායම් වැඩි කරන ක්‍රමය මොකක්ද කියලා කරුණු ඉදිරිපත් කළේ නැහැ. අද අපි බලයේ ඉන්න පුළුවන්, හෙට තව කවුරු හරි බලයේ ඉන්න පුළුවන්. නමුත්, කවුරු ආණ්ඩු කළත්, කවුරු බලයේ හිටියත් ඒ ඕනෑම කෙනෙකුට මේ රට කර ගෙන යන්න නම් මේ රටේ ආදායම -රාජ්‍ය ආදායම- වැඩි වෙන්න ඕනෑ. ඒ ආදායම වැඩි කරගන්න අපි උදව් කරන්නත් ඕනෑ. රාජ්‍ය ආදායම වැඩි වුණොත්, රාජ්‍යය ශක්තිමත් වුණොත් තමයි ජනතාවත් ශක්තිමත් වෙන්නේ. ඒ නිසා පළමුව මම ඒ කාරණය කියන්න කැමැතියි.

ආණ්ඩුවකට බැහැ මැජික්වලින් සල්ලි හොයන්න. ඇලඩින්ගේ පුදුම පහන නැහැ ආණ්ඩුවට සල්ලි මවන්න. ඒ වාගේම, ගස්වලින් සල්ලි කඩන්නත් බැහැ. රාජ්‍ය ආදායම වැඩි කරගන්න ආණ්ඩුවට කරන්න පුළුවන් කාර්යය ටිකයි තිබෙන්නේ. විපක්ෂය පසුගිය කාලය තුළ විවිධ පෙළපාළි, උද්ඝෝෂණ සංවිධාන කළා. මොකටද ඒ? උද්ඝෝෂණ, පෙළපාළි කරන්නේ මොකටද? ඒ සාමකාමීව තිබෙන රටට විවිධ ප්‍රශ්න ඇති කරලා නැවත වතාවක් විනාශ කරන්නයි. මේ රටේ ආර්ථිකය විනාශ කරන්නයි.

පාඩු ලබන ආයතන ගැන අපි කථා කළොත්, තමුන්නාන්සේලා සියලුදෙනාම දන්නවා මේ රටේ අහිංසක මිනිස්සුන්ගේ බදු මුදල් කෝටි-ප්‍රකෝටි ගණනින් විනාශ කරන ආයතන ටිකක් තිබෙනවා කියලා. ලංකා විදුලිබල මණ්ඩලය ගත්තොත්, කෝටි-ප්‍රකෝටි ගණනක් පාඩුයි, මේ රටේ මිනිස්සුන්ගේ සල්ලි කාබාසිනියා කරනවා. Ceylon Petroleum Corporation එක, කෝටි ගණනින් මේ රටේ මිනිස්සුන්ගේ සල්ලි කාබාසිනියා කරනවා. SriLankan Airlines ගත්තොත් කෝටි ගණනින් මේ රටේ මිනිස්සුන්ගේ සල්ලි කාබාසිනියා කරනවා. ඉතින්, මේවා කරන්න ඉඩ දීලා හැම දාම බලාගෙන ඉන්නද කියන්නේ? මේ ආයතන ටික හෙට ඉදන් පෞද්ගලීකරණය කළොත්, අඩුම තරමින් මේ රටේ මිනිස්සු හාල්මැස්සන් ගනිද්දී ගෙවන බදු ටිකවත් අඩු කරන්න ආණ්ඩුවට පුළුවන් වෙනවා. මෙවැනි ආයතන හතරක්, පහක් පවත්වා ගෙන යන්න මිලියන 22ක් වන මේ රටේ මිනිස්සු සල්ලි දෙනවා. අද මහා ලොකුවට දේශපාලනය ගැන කථා කරන ප්‍රධාන වෘත්තීය සමිති ටික තිබෙන්නේ මේ කියන ආයතන හතර පහේ. මේ වෘත්තීය සමිති ටික අද මොකක්ද කරන්නේ? මේ රටේ මිලියන 22ක් වන ජනතාවගෙන් බදු අරගෙන මෙවැනි ආයතන නඩත්තු කරන්න ගිහිල්ලා අද මුළු රටම විනාශයට පත් කරලා තිබෙනවා. ඒ නිසා කවුරු කොහොම කිව්වත් ගරු ජනාධිපතිතුමා කියනවා වාගේ මේ රටේ පාඩු ලබන ආයතන සියල්ල පෞද්ගලීකරණය කරන්න ඕනෑ.

එදා විධියට නොවෙයි අද මිනිස්සු කල්පනා කරන්නේ. ජනතාවගෙන් සියයට හැටකට වඩා වැඩි පිරිසක් ඒ තීරණයට කැමැතියි. තවමත් ගතානුගතිකව හිතන, ලෝකයත් එක්ක ගනුදෙනු කරන්න බැරි, ලෝකය ගැන දන්නේ නැති අය මේ යෝජනා ගැන විවේචනාත්මකව කථා කළාට, ජනතාව අතිබහුතරයක් මේකට කැමැතියි. පසුගිය කාලයේ පෙට්‍රල් ටික ගන්න බැරුව ගියාම, ඩීසල් ටික ගන්න බැරුව ගියාම ජනතාවට තේරුණා, ඒ පාඩු ලබන ආයතන නිසා තමයි අපට මේ දේවල් සිද්ධ වුණේ කියලා. ඒ නිසා මේක ඉතාම හොඳ අවස්ථාවක් කියා මා හිතනවා. සමහර අය කිව්වා, ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ලාභ ලබනවා කියලා. ටෙලිකොම් එක ලාභ ලබන්නේ නැහැ. හරියට මූල්‍ය වාර්තා පරීක්ෂා කරලා බලන්න, ටෙලිකොම් එකෙන් පාඩුයි.

පසුගිය කාලය තුළ රටේ පැවැති ආර්ථිකය ගැන මේ ගරු සභාවේ සමහර අය කථා කළා. ඒ සමහර අය ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට ගේන්න විශාල වැඩ කොටසක් කරලා, එතුමාට එදා වැඩකටයුතු කර ගෙන යන්න උපදෙස් දුන්නු අය. හැබැයි, අද එතුමාට විතරක් චෝදනාව දාලා ඒ අය නිර්දෝෂීයි වාගේ හැසිරෙන්න හදනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! The Hon. Deputy Chairman of Committees will now take the Chair.

***අනතුරුව ගරු ඉම්රාන් මහරූෆ් මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු අංගජන් රාමනාදන් මහතා] මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு இம்ரான் மஹ்ரூப் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு அங்கஜன் இராமநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. IMRAN MAHAROOF *left the Chair and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. ANGAJAN RAMANATHAN] *took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, please continue with your speech.

**ගරු නිමල් ලාන්සා මහතා**
(மாண்புமிகு நிமல் லான்சா)
(The Hon. Nimal Lanza)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ කාලයේ වාගේම, ඊට ඉස්සෙල්ලාත් ඇමතිකම් කරපු අය අද විපක්ෂයට ගිහිල්ලා මොනවාද කියන්නේ? ආර්ථිකය හදන්න පුළුවන්ලු. ඒ ආණ්ඩුව නැති වෙනකම් තනතුරුවල ඉඳලා, ඒ ආණ්ඩුව නැති කරන්න ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට උපදෙස් දුන්නා. ගෝඨාභය රාජපක්ෂ ගෙනාවේ අපි නොවෙයි නේ.

ගෝඨාභය රාජපක්ෂ ගේන්න කියලා වෙනත් හඬක් ආවා. ඒ හඬ ආව නිසා තමයි අපටත් සිද්ධ වුණේ ගෝඨාභය රාජපක්ෂට වැඩ කරන්න. එතුමා බලයට පත් වුණාම එතුමාට උපදෙස් දුන්නු න්‍යායාචාර්යවරු අද ස්වාධීන වෙලා කියනවා, ආර්ථිකය හදන්න පුළුවන්ලු. අද ආර්ථිකය හදන්න පුළුවන් නම් ගෝඨාභය සර් ගෙනාවා වාගේම, ගෝඨාභය සර්ට කියලා ඒ කටයුතු ටික කරන්න තිබුණානේ. ගෝඨාභය සර්ට ලණු දුන්නේ ඒ මිනිස්සු තමයි. ගෝඨාභය සර්ට දේශපාලනය තේරෙන්නේ නැහැ. දේශපාලනය නොතේරෙන කෙනෙක් දේශපාලනයට ගෙනාපු එක තමයි පළමුවෙනි වරද. දෙවෙනි වරද, උගත්තු, වියත්තු කියන අය කාබනික පොහොරවලට මාරු වෙන්න කියපු එක; බදු අඩු කරන්න කියපු එක.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පැහැදිලිව කියන්න ඕනෑ ගෝඨාභය රාජපක්ෂගේ වරදක් නැහැ කියලා. ගෝඨාභය රාජපක්ෂ පැහැදිලිවම කියලා තිබුණා දේශපාලනයට එන්න බැහැ,

එතුමාට තේරෙන්නේ නැහැ කියලා. එතුමා ගෙනාපු අය තමයි පළමුවෙනි වරද කළේ. දෙවෙනි වරද කළේ එතුමාට උපදෙස් දුන්නු අය. මොකද, ඒ සැම තනතුරකටම දැම්මේ ඔය කියන වියත්තු. ඒ වියත්තු තමයි ගෝඨාභය සර් නැති කළේ.

මට භය නැතිව මේ ගරු සභාවේදී එක කාරණයක් කියන්න පුළුවන්. ඒ තමයි, ගෝඨාභය රාජපක්ෂ හොරෙක් නොවෙයි කියන එක. මම වෙන කාටවත් එහෙම සහතික දෙන්නේ නැහැ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ failure එක වුණේ ප්‍රතිපත්තිමය තීන්දු මත ඇති වූ තත්ත්වය නිසායි. විශේෂයෙන් බදු අඩු කිරීම සහ කාබනික පොහොර ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ගත්ත තීරණය තමයි එතුමාට තනතුර දාලා යන්න වුණු හේතු. හැබැයි, එතුමා සත පහක් හොරකම් කළ නායකයෙක් නොවෙයි. එතුමා පැහැදිලිව පෙන්වූවා ජනාධිපතිවරයකු වියදම් අඩු කරලා කටයුතු කරන්නේ කොහොමද කියලා. එතුමා අපේ මන්ත්‍රීවරුන්ට තීරුබදු රහිත vehicle permit එකක්වත් දුන්නේ නැහැ, Working Directorsලා පත් කරන්න දුන්නේ නැහැ; වියදම් අඩු කළා. එතුමාට වැරදුණේ කොතැනද? කරන්න බැරි දේශපාලනයකට එතුමා ගෙනැල්ලා එතුමාට වැරදි උපදෙස් දුන්නු නිසායි. කුමාර වෙල්ගම මන්ත්‍රීතුමා විතරයි කිව්වේ ගෝඨාභය රාජපක්ෂට ජනාධිපති ධුරයේ කටයුතු කරන්න බැහැ කියලා. අද ඒක සනාථ වෙලා තිබෙනවා. අපි මේ වෙලාවේ ඒක මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි පැහැදිලිව කියන්නේ මේකයි. මන්ත්‍රීවරයෙක් යම් පාර්ශ්වයක් නියෝජනය කරද්දී ඒ පැත්තේ තිබෙන හොඳ, නරක දෙකෙදීම පෙනී සිටින්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මම තමයි ආණ්ඩු පක්ෂයේ ඉඳලා ඉස්සෙල්ලාම ස්වාධීන වුණේ. අනෙක් අයට, ඔය කෑ ගහන අනෙක් අයට ගහලා දොට්ට දානකම් හිටියා. ඒ අය ගහලා දොට්ට දානකම් ඇමතිකම්වල හිටියා. මම තමයි පළමුවෙන්ම ආණ්ඩුවෙන් එළියට ආපු කෙනා. මම ආණ්ඩුවෙන් එළියට ඇවිල්ලා සාකච්ඡාවට ගිහින් ඉද්දී ඔය කථා කරපු විද්වතෙක් ඒ රැස්වීමට ඇවිල්ලා කථා කරලා ගිහිල්ලා, ඊළඟ දවසේ කැබිනට් අමාත්‍ය ධුරයක් ගත්තා. මොන ලජ්ජා නැති වැඩක්ද? ඊට පස්සේ මුළු රටම අගමැතිට, කැබිනට් මණ්ඩලයට අයින් වෙන්න කියපු දවසේ තමයි අයින් වුණේ. අද සභාවට ඇවිල්ලා රට හදන්න කථා කරනවා. පිස්සුනේ! ඒ අය හින්දා තමයි අපටත් අවුරුදු 30ක් තිස්සේ කළ දේශපාලනය නැති වුණේ. අපි අවුරුදු 30ක් තිස්සේ අපේ දේශපාලන ගමන් මහ ගොඩ නඟා ගත්තේ ඉතා අමාරුවෙන්. පසුගිය අවුරුදු එකහමාරේ වියත්තු කියලා කොටසක් ඇවිල්ලා, ඒ සමහර අය ගෝඨාභය රාජපක්ෂට වැරදි උපදෙස් දීපු නිසා අපේ අවුරුදු 30ක් තිස්සේ කළ දේශපාලනයත්, තාත්තලා සීයලා හම්බ කළ දේත්, අපි හම්බ කළ දේත් නැති වුණා. ඒ නිසා ගෝඨාභය රාජපක්ෂ නොවෙයි වැරදි, ගෝඨාභය රාජපක්ෂ බැහැ කියද්දී එතුමා ජනාධිපති කරලා, එතුමාට වැරදි උපදෙස් දීලා මුළු රටම මේ තත්ත්වයට පත් කළ ඒ වියත්තු ටික තමයි වැරදි.

ඊයේ-පෙරේදා මේ සභාවේදී පළාත් පාලන ඡන්දය ගැන කථා කරලා තිබුණා. මේ ඔක්කෝම කියන්නේ ආණ්ඩුව පළාත් පාලන ඡන්දය කල් දාන්න යනවා කියලා. ඇයි, අපට මොකක්ද තිබෙන වුවමනාව පළාත් පාලන ඡන්දය කල් දාන්න? අපි කොතැනදීවත් කියලා තිබෙනවාද පළාත් පාලන ඡන්දය කල් දානවා කියලාඵ? අපට ඡන්දය කල් දාන්න ඕනෑත් නැහැ, ඡන්ද වේලාසනින් තියන්න ඕනෑත් නැහැ. පළාත් පාලන ඡන්දය කල් දාන්න යනවා කියන අයම වේලාසනින් පාර්ලිමේන්තු මැතිවරණය ගේන්න කියනවා. එතකොට ඒක ප්‍රජාතන්ත්‍රවාදීද, ඒක ව්‍යවස්ථානුකූලද? අපි කොයිම වෙලාවකවත් ඡන්දය කල් දාන්න උත්සාහ කරන්නේ නැහැ. හැබැයි, මේ මැතිවරණ ක්‍රමය විකෘතියක්. මේ සභාවේ ඉන්න මොළය තිබෙන එක්කෙනෙක් හරි කියන්න ප්‍රාදේශීය සභා ඡන්ද ක්‍රමය විකෘතියක්ද, නැද්ද කියලා? මේ 225දෙනාම පිළිගන්නවා පළාත් පාලන මැතිවරණ ක්‍රමයේ කොට්ඨාස වැඩියි, ඒවාට පත් වෙන ක්‍රමය වැරදියි, මේක විකෘතියක් කියලා. හැබැයි, ඒ විකෘතිය තියන්න කියනවා! පුදුම වැඩක්නේ. මේ අය එක්කෝ මෝඩයෝ වෙන්න ඕනෑ, එක්කෝ පිස්සෝ වෙන්න ඕනෑ. මේ විකෘති ක්‍රමයටම මැතිවරණය තියන්න කියන අය එක්කෝ මෝඩයෝ වෙන්න ඕනෑ, එක්කෝ විකෘති මානසිකත්වයෙන් පෙළෙන අය වෙන්න ඕනෑ. මොකද, මේ 225දෙනාම ඡන්දය ඉවර වෙලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වානේ මේ ක්‍රමය හරියන්නේ නැහැ, මේ ක්‍රමය වැරදියි කියලා. ඒ කියපු අයම කියනවා විකෘතියක් හරි කමක් නැහැ, මැතිවරණය තියන්න කියලා. එහෙම කියන්න පුළුවන් මානසික ලෙඩෙකුට විතරයි. ඒ නිසා අපි පැහැදිලිවම කියන්නේ, ඒ මැතිවරණ කොට්ඨාස අඩු කිරීම විතරක් නොවෙයි මේ මැතිවරණ ක්‍රමයම වෙනස් කරන්න ඕනෑ කියන එකයි. මම හොඳම උදාහරණයක් දෙන්නම්කෝ.

මා නියෝජනය කරන මීගමුව ආසනය උදාහරණයකට ගන්න කෝ. පළාත් පාලන ඡන්දය තිබ්බාම මගේ ආසනය ජයග්‍රහණය කළේ එක්සත් ජාතික පක්ෂය. හැබැයි, නගරාධිපති වුණේ කවුද? පොහොට්ටුවෙන් ඉල්ලලා පැරදුණු මගේ මල්ලී! කොහොමද එහෙම වුණේ? එහෙම වුණේ මේ විකෘති මැතිවරණ ක්‍රමය නිසා. ඒකට මීට වඩා හොඳ උදාහරණයක් ඕනෑද? මීගමුවේත් එහෙමයි, වත්තලත් එහෙමයි. අපි ඒ සභාවල බලය පිහිටෙව්වේ, පැරදිලා. විකෘති මානසිකත්වයෙන් පෙළෙන සමහර මන්ත්‍රීවරුන් මේ විකෘති ක්‍රමයට මැතිවරණ ඉල්ලනවා. අපි හිතමු, මැතිවරණය තියලා පළාත් පාලන ආයතනවලට නියෝජිතයන් පත් වුණා කියලා. නමුත්, ඊළඟ දවස වනකොට මේ රටේ බඩු මිල අඩු වනවාද? මේ රටේ ඉන්න මිලියන 22ට තිබෙන ප්‍රශ්න ඔක්කොම ඉවර වනවාද? එහෙම වෙන්නේ නැහැ. ඒ නිසා අප සත්‍ය අවබෝධ කරගන්න ඕනෑ බවයි මා පැහැදිලිවම කියන්නේ. අපි යථාර්ථයට මුහුණ දෙන්න ඕනෑ. අපි පාර්ලිමේන්තුවට ඇවිල්ලා, මේ අය වැය ලේඛනයට විරුද්ධ වෙලා, ඒ පිළිබඳව දෝෂාරෝපණය කරලා, අඩු පාඩු හොයලා, ඒවා ගැන කියලා විතරක් වැඩක් නැහැ. කවුරු රටේ ජනාධිපති වුණත්, කවුරු අගමැති වුණත්, කවුරු ආණ්ඩු කළත්, ඒ ආණ්ඩුව පවත්වාගෙන යන්න අපි උදවු කරන්න ඕනෑ. එතකොට තමයි මේ රට දියුණු වෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පොඩ්ඩක් කල්පනා කර බලන්න, මීට මාස හතරපහකට ඉස්සෙල්ලා, මේගරු ජනාධිපතිතුමා පත් වෙන්න ඉස්සෙල්ලා මේ රට තිබුණේ කොහොමද කියලා. හැම තැනම ගෑස් පෝලිම් තිබුණේ නැද්ද? පෙට්‍රල් පෝලිම් තිබුණේ නැද්ද? ඉන්ධන පෝලිම් තිබුණේ නැද්ද? කිරි පිටි පෝලිම් තිබුණේ නැද්ද? පැය දහය, දොළහ විදුලිය කැපුවේ නැද්ද? ගමනාගමනය හරියට ක්‍රියාත්මක වුණාද? ඉස්කෝල වහලා තිබුණේ නැද්ද? හැබැයි, එතුමා පත් වෙලා ඉතා ටික කාලයක් තුළ ඉන්ධන ටික දුන්නා; පොහොර ටික දුන්නා; බෙහෙත් ටික දුන්නා. ඒ වාගේම, අද කිරි පිටි පෝලිම් නැහැ; ගෑස් පෝලිම් නැහැ; පෝලිම් මොකුත් නැහැ. මේක පොඩ්ඩක් හරි හොඳ ක්‍රමයක් කියලා මේ පාර්ලිමේන්තුවේ ඉන්න විපක්ෂයේ කාටවත් පෙනෙන්නේ නැද්ද? හැබැයි, රටේ මිනිසුන්ට නම් තේරෙනවා, මේක හොඳ ක්‍රමයක් කියලා. රටේ මිනිස්සු කියනවා, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා වැඩ පටන්ගත්තාට පස්සේ යම් සාධනීය වැඩ පිළිවෙළක් රට තුළ වනවා කියලා.

ඒ නිසා අපි ඉතා පැහැදිලිව කියන්න ඕනෑ, එතුමා පටන්ගත් කටයුතු දැන් ක්‍රියාත්මක වන බව. අද වනකොට අපේ රටට සංචාරකයන් එනවා; ආපු නැති flights දැන් එනවා; ආයෝජන

[ගරු නිමල් ලාන්සා මහතා]

එනවා. ඉන්දියාවේ අදානි සමාගම, ලංකා විදුලිබල මණ්ඩලය සමඟ එකතු වෙලා, මෙගාවොට් 500ක -මිලියන ගණනක- සූර්යබල ව්‍යාපෘතියක් සඳහා අත්සන් කරනවා අපි දැක්කා. වරාය සංවර්ධනය කිරීම සඳහා මිලියන 700ක ව්‍යාපෘතියකට අත්සන් කළා. Port City එක වැනි විවිධ ව්‍යාපෘති සඳහා ආයෝජකයන් දැන් අපේ රටට එනවා. ඒ නිසා ටිකෙන් ටික අපේ රට දියුණු වනවා; රටේ මිනිස්සු සාමාන්‍ය තත්ත්වයට පත් වෙනවා. හැබැයි, කාගේ ඇස්වලටද කටු ඇනෙන්නේ? කටු ඇනෙන්නේ විපක්ෂයේ ඇස්වලට. මොනවාද ඔවුන්ට ඕනෑ? මොනවා හෝ කරලා මේ වැඩ කටයුතු කඩාකප්පල් කරන්න ඕනෑ. ඒ නිසා තමයි සියලු පක්ෂ හා සියලු වෘත්තීය සමිති එකතු වෙලා උද්ඝෝෂණයක් ආරම්භ කළේ. ඒ වෘත්තීය සමිති, රට කාපු වෘත්තීය සමිති. මේ රටේ මිනිසුන්ගේ සල්ලි කාපු වෘත්තීය සමිති. උද්ඝෝෂණයක් ආරම්භ කරලා මොකද කළේ? අන්තිමට විපක්ෂ නායකතුමාටත් හූ කිව්වා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මහ ලේකම්තුමාටත් හූ කිව්වා. තමන් ගිහිල්ලා හිටගන්න ඕනෑ, තමන් එක්ක යන්න පුළුවන් කණ්ඩායමක් එක්ක. පෙරට්ටුවෝ එක්ක යන්න පුළුවන්ද? ගෙවල් ගිනි තියන, මංකොල්ල කන පෙරට්ටුවෝ, ජේවීපීකාරයෝ එක්ක ප්‍රධාන විපක්ෂයට වාගේම අනෙක් පක්ෂවලට ගමනක් යන්න පුළුවන්ද? යන්න බැහැ. එහෙම නම් අපි හිටගන්න ඕනෑ, අපිත් එක්ක යන්න පුළුවන් කණ්ඩායමක් එක්ක. එහෙම නැතිව ගිහිල්ලා හිටගෙන තමයි එතුමන්ලා පාඩම් ඉගෙනගත්තේ.

අද රට යම් තැනකට එනවා. රටේ මිනිස්සු ඒක කියනවා. විපක්ෂයට මේවා දිහා බලාගෙන ඉන්න බැහැ. ඒ නිසා ඔවුන්ට ඕනෑ මොනවා හෝ කඩාකප්පල් ක්‍රියාවක්, විරෝධතාවක් කරන්න. ඒක තමයි මේ විපක්ෂය කරන්නේ. එහෙම නැත්නම් මේ අය වැය ලේඛනයට විරුද්ධ වෙන්න මොකක්ද තිබෙන හේතුව? මේ වෙලාවේ මීට වඩා හොඳ අය වැය ලේඛනයක් තිබෙනවා නම් ඉදිරිපත් කරන්න කෝ. ඕනෑම පනත් කෙටුම්පතක් ඉදිරිපත් කළාම සංශෝධන ගෙනෙන්න පුළුවන් නේ. ඇයි මේකට සංශෝධන ගෙනෙන්නේ නැත්තේ? මීට වඩා සංශෝධන ගෙනෙන්න බැහැ. මොනවා කරන්නද සංශෝධන ගෙනෙන්න වෙන්නේ? ආදායම් වැඩි කරන්න බදු පනවන්න වෙනවා. වෙන මොනවාද කරන්න පුළුවන්? ආදායම අඩු කරන්න සංශෝධන ගෙනෙන්න පුළුවන්ද? පඩි ටිකවත් ගෙවන්න සල්ලි නැති රටේ ආදායම අඩු කරන්න සංශෝධන ගෙනෙන්න පුළුවන්ද? ඒ නිසා සංශෝධන ගෙනෙන්නේ නැහැ. හැබැයි, බොරුවට කියනවා, "අපි මේකට විරුද්ධයි. මහ ජනතාවට සහන නැහැ. මහ ජනතාවට මීට වඩා සහන දෙන්න ඕනෑ. ගුරුවරුන්ගේ වැටුප් වැඩි කරන්න ඕනෑ" කියලා. මෙතුමන්ලාට මොළේ පොඩ්ඩක්වත් තිබෙනවාද? මොළය පොඩ්ඩක්වත් තිබෙනවා නම් මේ වාගේ මෝඩ කථා කියනවාද කියලායි මට අහන්න වෙන්නේ.

අපි අය වැයක් ගෙනැල්ලා තිබෙන්නේ යම් මට්ටමකට හෝ මේ රට ස්ථාවර කරන්න. ඒ නිසා අප පැහැදිලිවම කියන්න ඕනෑ, රට තිබුණු තත්ත්වයෙන් අද යම් මට්ටමකට ගොඩ ගෙන තිබෙන බව. අපට පෙනෙනවා, මේ විධියට ගියොත් රටේ මිනිසුන්ට තිබෙන ප්‍රශ්න එන්න එන්න අඩු කරගන්න පුළුවන් වෙයි කියලා. ඒ නිසා මා අද විපක්ෂයටත් ඉතා පැහැදිලිව කියනවා, නිකම් විරුද්ධ වෙන්නන් වාලේ විරුද්ධ වන්නේ නැතිව, මේ අය වැය යෝජනාවලට වඩා හොඳ අය වැය යෝජනා තමුන්නාන්සේලාට තිබෙනවා නම්, ඒ යෝජනා ඉදිරිපත් කරන්න කියලා. ඒ ඉල්ලීම ඉතා බැගෑපත්ව කරමින් මා නිහඬ වනවා.

සියලුදෙනාට ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Kanchana Wijesekera. You have 26 minutes.

[අ.භා. 2.24]

**ගරු කංචන විජේසේකර මහතා (විදුලිබල සහ බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - மின்சக்தி மற்றும் வலுசக்தி அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - Minister of Power and Energy)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි.

අය වැය දෙවනවර කියැවීමේ විවාදයේදී කරුණු කිහිපයක් ඉදිරිපත් කරන්න අවස්ථාව ලැබීම පිළිබඳව මම සතුටට පත් වෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය 14වන දා මේ පාර්ලිමේන්තුවට අය වැය ඉදිරිපත් කිරීමෙන් පසුව ගත වුණු සතියක පමණ කාලය තුළ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු ඒ පිළිබඳ කරුණු කාරණා රාශියක් ඉදිරිපත් කළා. විශේෂයෙන්ම විපක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරු අදත් මේ අය වැයට චෝදනා එල්ල කළත්, එතුමන්ලාගේ විකල්ප වැඩ පිළිවෙළ මොකක්ද කියලා මේ පාර්ලිමේන්තුවට, රටට කියන්න අපොහොසත් වෙලා තිබෙනවා. අය වැය දෙවැනි වර කියවීමේ විවාදය පැවැත්වෙන පසු ගිය දින හයේම ඔවුන් මේ අය වැයට විවේචන එල්ල කළා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි කවුරුත් දන්නවා, මේ අය වැය ඉදිරිපත් කරන්නේ ඉතාම අභියෝගාත්මක අවස්ථාවක බව; රටට අපහසුම අවස්ථාවක බව. අපි දන්නා ඉතිහාසය තුළ මීට පෙර මෙවැනි අසීරු අවස්ථාවක් පිළිබඳ අත්දැකීමක් අපට නැහැ. යුද්ධය අවස්ථාවේත් ආර්ථිකමය වශයෙන් මීට වඩා ශක්තිමත් තැනක තිබුණු අපේ රට, අද ඊටත් වඩා අමාරු අභියෝගාත්මක තැනක තිබියදී තමයි අපි මේ අය වැය ඉදිරිපත් කළේ. මේ අය වැය ජනප්‍රිය අය වැයක් නොවුණත්, ආණ්ඩු පක්ෂය, විපක්ෂය වැඩිය අත් පුඩි ගහන අය වැයක් නොවුණත්, මේ රටේ ඉදිරි අනාගතය ශක්තිමත් කරන ආර්ථික වැඩ පිළිවෙළට ප්‍රවේශයක් ලැබෙන, අඩි තාලමක් වැටුණු අය වැයක් හැටියට තමයි අපි මේ අය වැය දකින්නේ.

විපක්ෂය නියෝජනය කරන බොහෝ මන්ත්‍රීවරුන් පසුගිය අවුරුදු දෙකහමාරේ අපේ ආණ්ඩුවට චෝදනා එල්ල කරමින් අපේ ආර්ථිකය විනාශ කරන්න බලපෑ ප්‍රධාන හේතු ලෙස දැක්වූයේ, බදු අඩු කිරීමේ ප්‍රතිපත්තිය, ආර්ථික කළමනාකරණයේ තිබෙන දුර්වලතා, රාජ්‍ය සේවයට බඳවාගැනීම්, ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක නොකිරීම, ආයෝජනවලට අවස්ථාව නොලැබීම ආදියයි. විශේෂයෙන්ම මේවා තමයි විපක්ෂය පසුගිය කාලයේ එල්ල කළ චෝදනා. හැබැයි, ඒ චෝදනා එල්ල කරපු පිරිසට අපි කියන්න ඕනෑ, එතුමන්ලා දරන මතවලින් යම් කොටසක් හෝ මේ අය වැයට ඇතුළත් කර තිබෙන බව. නමුත් අඩුම තරමින් ඒ ඇතුළත් කරපු කොටසටවත් සහයෝගය නොදක්වන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා.

මෙම අය වැයට සමඟි ජන බලවේගය විරුද්ධ වන බව, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය විරුද්ධ වන බව කියා තිබෙනවා මම දැක්කා. ඒ අය කියා තිබෙනවා, මේ අය වැයට විරුද්ධයි කියලා. *[බාධා කිරීමක්]* ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් දැන් ඔය පැත්තේ ඉන්නේ මන්ත්‍රීවරු තුන්දෙනායි. ඇත්තටම කනගාටුයි. අය වැය විවාදය ඉවර වනකොට ඒ තුන්දෙනාගෙනුත්

කීදෙනෙකු ඉතිරි වෙයිද දන්නේ නැහැ. *[බාධා කිරීමක්]* මම ගණන් හොඳට දන්නවා. *[බාධා කිරීමක්]*

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ගණන් fail ද?

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගණන් fail නැහැ. තනතුරු දෙකතුනක් දුන්නා නම්, ඔය තුනත් නැති වෙනවා. ඉල්ලපු තනතුරු නොලැබිච්ච නිසා ඔය පැත්තේ තුන්දෙනෙක් ඉන්නවා. ඒක තමයි ඇත්ත කථාව. ඉල්ලපු තනතුරු ටික දුන්නා නම්, ඔය පැත්තේ ඉන්නේ නැහැ. *[බාධා කිරීමක්]* ඉල්ලපු තනතුරුත් මොනවාද කියලා අපි දන්නවා. *[බාධා කිරීමක්]* නමුත් මම ඒ ගැන කියමින් පැටලෙන්න යන්නේ නැහැ. ඔබතුමන්ලාට තව සතියකින් විතර මේ පැත්තට එන්න වෙයි. ඒ නිසා වැඩිය මොනවත් කියන්න යන්න එපා. ඒ කියන ඒවාට ඔබතුමන්ලාටම උත්තර දෙන්න වෙයි, මේ පැත්තට ඇවිල්ලා. *[බාධා කිරීමක්]* අපි දැක්කා නේ. 2015දීත් ඔය වාගේම තමයි, ගරු මන්ත්‍රීතුමා. ඔබතුමා අපිත් එක්ක නේ හිටියේ. 2015දී අපිත් එක්ක එකට වාඩි වෙලා ඉඳලා, නියෝජ්‍ය ඇමතිකමක් ගත්තා. දූරකථන ඇමතුමකින් තමයි අපි දැනගත්තේ නියෝජ්‍ය ඇමතිකමේ දිවුරුම් දුන්නා කියලා. එදා ඔබතුමා අපිත් එක්ක නේ හිටියේ.

**ගරු සාරතී දුෂ්මන්ත මහතා**
(மாண்புமிகு சாரதீ துஷ்மந்த)
(The Hon. Sarathi Dushmantha)
මම නම් කවදාවත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂය දාලා ගිහිල්ලා නැහැ. *[බාධා කිරීම්]*

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ඔබතුමා තොප්පිය දාගන්න එපා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අය වැය ඉදිරිපත් කරලා තිබෙන මේ අවස්ථාවේ අපි විශේෂයෙන්ම විපක්ෂය නියෝජනය කරන පිරිස්වලට කියනවා, අය වැය සම්බන්ධයෙන් ඔබතුමන්ලාගේ අදහස් ලබා දෙන්න කියලා. මේ අය වැය ගැළපෙන්නේ නැත්නම්, ඔබතුමන්ලා මේ අය වැයට යෝජනා කරන්නේ මොනවාද කියන්න. නමුත්, යෝජනා දෙන්නේ නැහැ. හැබැයි, අය වැයේ හැම දෙයක්ම වැරැදියි කියනවා. බදු වැඩි කරන කොටත් වැරැදියි කියනවා. බදු අඩු කරපු එක වැරැදියි කියලා ආණ්ඩුවෙන් එළියට බහිනවා. ආර්ථිකය කළමනාකරණය කළේ නැහැ කියලා ආණ්ඩුවෙන් එළියට බහිනවා. ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට ගියේ නැහැ, සාකච්ඡා කළේ නැහැ කියලා ආණ්ඩුවෙන් එළියට බහිනවා. හැබැයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලත් එක්ක ගනු දෙනු කරගෙන යනකොට, ඒ ප්‍රවේශය ගන්න කොට, "නැහැ, ඒක කරන්න එපා." කියනවා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ප්‍රතිපත්තියක් තිබෙන්න ඕනෑ, මොන දේ කරන්නත්. ඒ ප්‍රතිපත්තිය මොකක්ද කියන එක හුඟක් දෙනෙකුට අද අවබෝධ වෙලා නැහැ. අද අපි ඉතාම අභියෝගාත්මක අවස්ථාවක ඉන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මීට මාස 6කට පෙර මොකක්ද මේ රටේ තිබුණු ප්‍රශ්නය? ආර්ථික ප්‍රශ්නයත් එක්ක තිබුණේ මොකක්ද? ජනතාව දින 4ක්, 5ක් සිටියේ පෝලිම්වල. ඉන්ධන පෝලිම්වල සිටියා, ගෑස් පෝලිම්වලට සිටියා, පොහොර ගන්න පෝලිම්වල සිටියා. හැම දේම ගන්න පෝලිම්වල හිටියේ. එතකොට විපක්ෂයට තිබුණු සටන් පාඨය මොකක්ද? "ආණ්ඩුවට ආර්ථිකය කළමනාකරණය කර ගන්න බැහැ, ජනතාව ඉන්නේ පෝලිම්වල, අත්‍යවශ්‍ය ආහාර ටික දෙන්න බැහැ, අත්‍යවශ්‍ය සේවා ටික සපයන්න බැහැ, ජනතාව මැරෙනවා, රෝගී වෙනවා, ඒ සඳහා විසඳුමක් දෙන්න" කියන එක තමයි සටන් පාඨය.

ඒ විසඳුම දීලා අද වන විට යම් කළමනාකරණයක් කරලා තිබෙනවා. මම කියන්නේ නැහැ, ඒ අවශ්‍යතාවලින් සියයට 100ක් සම්පූර්ණ කරලා තිබෙනවා කියලා. හැබැයි, අපට තිබෙන සීමිත සම්පත් ටික කළමනාකරණය කරලා ඉන්ධන පෝලිම්, ගෑස් පෝලිම්, පොහොර පෝලිම්, අත්‍යවශ්‍ය ආහාර වෙනුවෙන් තිබෙන පෝලිම් අද අවම කරලා තිබෙනවා. ජනතාවට අද විශාල බරක් තිබෙන බව අපි පිළිගන්නවා. ජීවන වියදම ඉහළ ගිහිල්ලා තිබෙන්නේ. ඒක අපි සියලුදෙනාම වගකීමක් ගන්න ඕනෑ කාරණාවක්, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මේක මාස 6කින්, අවුරුද්දකින්, එහෙම නැත්නම් ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා නිසා සිදු වුණු දෙයක් නොවෙයි. අවුරුදු ගණනාවක් තිස්සේ අපි ආනයනය කරපු මිලට නොවෙයි බොහෝ දේවල් ජනතාවට දුන්නේ. භාණ්ඩ ආනයනය කරන්න යන වියදමට වඩා අඩු මුදලකට තමයි අපි කාලයක් තිස්සේ ජනතාවට භාණ්ඩ දුන්නේ.

ලංකා විදුලිබල මණ්ඩලය පාඩු වෙන්න හේතුව මොකක්ද? එහි අතිරික්ත සේවකයන් කියන එක එක්තරා කාරණයක් පමණයි. ඒක, එක කොටසක් විතරයි. අකාර්යක්ෂමතාව කියන එකත් එක කොටසක් පමණයි. හැබැයි, ඒ දෙකටම වැඩිය තිබෙන්නේ, අපට වැය වන වියදමට වඩා අඩු මුදලකට ජනතාවට එම සේවාව ලබා දීමයි. 2013 ඉඳලා විදුලි බිල සංශෝධනය වෙලා තිබුණේ නැහැ. ඒක එකවර සංශෝධනය වුණු නිසා තමයි ජනතාව මත අද විශාල බරක් පැටවිලා තිබෙන්නේ. අවුරුද්දෙන් අවුරුද්ද, මාස හයෙන් හයට ක්‍රමානුකූලව ඒ කටයුත්ත සිද්ධ වුණා නම්, ඒ බලපෑම විශාල වශයෙන් ඇති වෙන්නේ නැහැ. ආදායම වැඩි වෙනකොට ඒ අදායමට සරිලන ආකාරයට වියදමත් වැඩි වෙනවා.

ඉන්ධන ගැන කථා කළොත්, පසුගිය ජනවාරි මාසයේ ඩීසල් ලීටරයක මිල වුණේ රුපියල් 119යි. රුපියල් 119, රුපියල් 435ට ගියා. සමහරු හිතනවා, මේ ගණන තව අඩු කරන්න ඕනෑ කියලා. මිල අඩු කරන්න, අපේ රට ඉන්ධන නිෂ්පාදනය කරන රටක් නොවෙයි. අපේ රටට අවශ්‍ය සියලු ඉන්ධන අපි ආනයනය කරනවා. විපක්ෂයේ සමහරු හිතාගෙන ඉන්නවා, මේ මුදලට ඉන්ධන ගන්න පුළුවන්, මේ මුදලට විකුණන්න පුළුවන් කියලා. ඒ අය හිතාගෙන ඉන්නේ, අපේ රට තිබෙන්නේ සාමාන්‍ය තත්ත්වයක කියලා. බැංකුවක ණයවර ලිපියක් විවෘත කරන්න බැරි නම්, ණය සහතිකයක් දෙන්න බැරි නම්, මහා භාණ්ඩාගාරයෙන් සහතිකයක් දෙන්න බැරි නම්, මහා බැංකුවෙන් සහතිකයක් දෙන්න බැරි නම්, බැංකු පද්ධතිය ඇතුළෙන් සහතිකයක් දෙන්න බැරි නම්, ඒ සමාගම්වලින් සහතිකයක් දෙන්න බැරි නම්, අපි බංකොලොත් කියලා අපි තීරණය කරලා තිබෙනවා නම් අපි සාමාන්‍ය තත්ත්වයක නොවෙයි ඉන්නේ. හැබැයි, සමහරු හිතනවා සාමාන්‍ය තත්ත්වයක ඉන්න රටක් විධියට අපට ගනු දෙනු කරන්න පුළුවන් කියලා. අපට එහෙම කරන්න බැහැ. නමුත්, මම එකක් කියන්න ඕනෑ, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. මාස 6කට කලින් තිබුණු තැන ඉඳලා අපි අද යම් කිසි ආකාරයක වර්ධනයක් ලබාගෙන තිබෙනවා. ඒ ගමනේදී මම නියෝජනය කරන විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයේ යම් වර්ධනයක් ලබාගෙන තිබෙනවා.

පසුගිය කාලයේ අපි ඉන්ධන ආනයනය කරන්න ඇමෙරිකානු ඩොලර් මිලියන 600ක් පමණ වියදම් කළා. අපට ඒ මුදල දරාගන්න බැරි නිසා අපි ඒක ඩොලර් මිලියන 250කට, 300කට

[ගරු කංචන විජේසේකර මහතා]

කළමනාකරණය කර ගත්තා. ඒ ඩොලර් මිලියන 250, 300 සොයා ගත්තේත් හරි අමාරුවෙන්. හැබැයි, දැන් අපේ අවශ්‍යතාව වන ඩොලර් මිලියන 200, 250 සොයා ගන්න පුළුවන් ක්‍රමයක් නිර්මාණය වෙලා තිබෙනවා.

මේ රටේ රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත විය යුතුමයි. කවුරු හරි කියනවා නම්, "මේක අපේ ජාතික සම්පතක්, ඒ නිසා අපි මේක තියාගෙන ඉන්න ඕනෑ, මේක තියාගෙන තමයි අපි ගොඩනැඟෙන්න ඕනෑ" කියලා, ඒක තමයි මේ රටේ ජනතාව පත් කරන මුලාව. ත්‍රිකුණාමලයේ තිබෙන අපේ තෙල් ටැංකි 100 පිළිබඳව අවුරුදු 70ක්, 80ක් තිස්සේ කථා කරනවා. මොනම ආණ්ඩුවකටවත් පුළුවන් වුණාද, ඒවා පාවිච්චි කරලා ප්‍රයෝජනයක් ගන්න? හැමෝම ආණ්ඩු කරලා තිබෙනවා නේ. ජනතා විමුක්ති පෙරමුණත් ආණ්ඩුවක සිටියා නේ. සිටියේ නැහැයි කියන්න බැහැනේ. ජනතා විමුක්ති පෙරමුණත් සිටියා, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් සිටියා, එක්සත් ජාතික පක්ෂයත් සිටියා, සමගි ජන බලවේගයත් - සමගි ජන බලවේගයත් ආණ්ඩුවේ ඉන්නවා නේ? මේ ඉන්නේ.

**ගරු මනුෂ නානායක්කාර මහතා (කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார - தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சர்)
(The Hon. Manusha Nanayakkara- Minister of Labour and Foreign Employment)
ඔව්, මම සමගි ජන බලවේගයේ.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ඩයනා ගමගේ මන්ත්‍රීතුමියත් ඉන්නවා නේ. මේ හැමෝම ආණ්ඩුවල ඉඳලා තිබෙනවා. හැබැයි, ත්‍රිකුණාමලයේ තිබුණු තෙල් ටැංකි පිළිබඳව කථා කළා හැරෙන්න වෙන කිසි දෙයක් කරන්න බැරි වුණා. අපි තේරුම් ගන්න ඕනෑ, අපට ආයෝජනය කරන්න බැහැ කියලා.

මීට අවුරුදු 50කට, 60කට කලින් ඒවායින් ප්‍රයෝජනයක් ගත්තාට, දැන් කලාපයේ රටවල තිබෙන තාක්ෂණයත් එක්ක තරග කරන්න බැරි නම්, අපි ඒවා ගොඩ නැඟුවා කියලා වැඩක් තිබෙනවාද? මට ඇහුණා කියනවා, "වැහිලා ගිය කර්මාන්ත අපි අටවා ගෙන නැවත පටන් ගත්තා" කියලා. ඒවා පටන් ගන්න එක හොඳයි. හැබැයි, පටන් ගත්තාට වැඩක් නැහැ, අපි ඒකට මුදල් ආයෝජනය කරලා නිසි තාක්ෂණය යෙදෙව්වේ නැත්නම් කලාපයේ රටවල් එක්ක තරග කරන්න බැහැ. සමහරු කියනවා, "අපේ රට සිංගප්පූරුව, ඩුබායි වාගේ වෙන්න ඕනෑ, අපට එහෙම තමයි තීන්දු-තීරණ ගන්න වෙන්නේ. ඒ රටවල ඒකාධිකාරයක් තිබෙන්නේ" කියලා. ඒ රටවල ඒකාධිකාරයක් තිබෙනවා. මොකද මැතිවරණ නැහැ. එකම පාලනය තමයි දිගටම පවත්වාගෙන යන්නේ. පාලනය වෙනස් වෙන්නේ නැති නිසා, ඒ රටවල් තීන්දු-තීරණ වෙනස් කරන්නේ නැහැ. එකම ප්‍රතිපත්තියක දිගටම යන්නේ. එක්සත් එමීර් රාජ්‍ය ගත්තත්, සිංගප්පූරුව ගත්තත් උඩින්ම ඉන්න නායකයෝ එකම ප්‍රතිපත්තියක් තමයි ක්‍රියාත්මක කරගෙන යන්නේ. උඩ ඉන්න නායකයෝ වෙනස් කරන්න ඔවුන්ට මැතිවරණ ක්‍රමයක් නැහැ. ඒ විධියට ප්‍රතිපත්ති ක්‍රියාත්මක වෙන නිසා ඒ අයට පුළුවන් රාජ්‍ය ආයතන හැටියට ඒවා තියාගෙන, ඒවාට අවශ්‍ය මුදල් ටික පොම්ප කරලා, ඒ තීන්දු අරගෙන ඉදිරියට යන්න.

හැබැයි, කවුරු මොනවා කිව්වත්, මම පෞද්ගලිකව විශ්වාස කරන දෙයක් තමයි මේ රටේ බලශක්ති ක්ෂේත්‍රය ප්‍රතිව්‍යුහගත කළ යුතුමයි කියලා. ඒක ප්‍රතිව්‍යුහගත නොකළොත්, ඒ බරත් දරන්න වෙන්නේ මේ රටේ සිටින ජනතාවටමයි. මොකද ඒ ආයතන සේවය ලබා දෙන ආයතන බවට පත් වෙන්න ඕනෑ. ඒ සේවය අඛණ්ඩව දෙන්න නම්, සේවය ජනතාවට සාධාරණ විධියට දෙන්න නම් ඒ ආයතන ප්‍රතිව්‍යුහගත කරන්න ඕනෑ. අපි ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය ගැන කථා කරනවා නේ. ශ්‍රී ලංකා ටෙලිකොම් මීට පෙර තිබුණු තත්ත්වයයි, දැන් තිබෙන තත්ත්වයයි බලන්න. ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය තව වැඩි දියුණු කරන්න පුළුවන්. ඉස්සර අපට දුරකථනයක් ගන්න අවුරුදු හයක්, හතක් පෝලිමේ ඉන්න සිදු වුණා. හැබැයි, ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම ඇති කළාට පස්සේ ශ්‍රී ලංකා ටෙලිකොම් සමාගම දුරකථන සම්බන්ධතාව දෙන්න පාරිභෝගිකයා සොයාගෙන යන තැනට පත් වෙනවා. එතැන තරගයක් තිබෙනවා. සේවාව සැපයීමට අවශ්‍යතාවක් තිබෙනවා. ඒක විය යුතුයි.

Lanka IOC සමාගම ආරම්භ කරනකොට, පසුගිය කාලයේ අපි නියෝජනය කරපු මතවාදයේ ඉඳගෙන අපිත් එයට විරුද්ධ වුණා. Lanka IOC සමාගම ඒ කරපු වැඩ කොටසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට යම් තරගයක් දුන්නා. මීට මාස හතරකට ඉස්සෙල්ලා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට තෙල් ගෙන්වන්න සල්ලිත් නැහැ, පඩි ගෙවන්න සල්ලිත් නැහැ, වැඩ කරන්න විධියකුත් නැහැ. වසා දමලා තිබුණේ. හැබැයි, යම් මිල සංශෝධනයක් කරලා කාර්යක්ෂමතාව වැඩි කළාට පස්සේ, දැන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව අලාභ නැතුව දුවන තත්ත්වයට පත් වෙලා තිබෙනවා. හැබැයි, අලාභ නැතුව දුවන තත්ත්වයක් තිබෙනවා කිව්වාට, පැරණි අලාභය අපට තවම ආවරණය කර ගන්න බැහැ. ට්‍රිලියන එකක ණය තිබෙනවා. අපට ඉන්ධන අලෙවි කරලා ලැබෙන මුදල්වලින් ඒ ණය පියවා ගන්න තව අවුරුදු 100ක් විතර බලාගෙන ඉන්න වෙයි. එහෙම කරන්න බැහැ. මේවාට හවුල් ව්‍යාපාර එන්න ඕනෑ. විපක්ෂය නියෝජනය කරන බොහෝ දෙනෙක් ආණ්ඩුවේ සිටියදී මේ මතයේ හිටියා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, කනගාටුවට කරුණ තමයි, මේවාට සංශෝධන ගෙනෙන කොට, ප්‍රතිව්‍යුහගත කරන කොට, අණපනත් වෙනස් කරලා මේ රටේ ජනතාවට අවශ්‍ය සේවාව ලබා දීමට ඉඩ ප්‍රස්ථාව ලබා දෙනකොට සමහරු ඒකට විරුද්ධ වීමයි. මම ඇත්තටම පුදුම වුණා, ඛනිජ තෙල් නිෂ්පාදන (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත ගෙනැල්ලා සංශෝධනය කරන අවස්ථාවේ සමගි ජන බලවේගය කිව්වා, ඒකට විරුද්ධයි කියලා. හැබැයි, බොහෝ දෙනෙක් ඒ ඡන්දයට ආවේ නැහැ. ඡන්දය දෙන්නේ නැතුව එළියේ හිටියා. හැබැයි, "මේ ප්‍රතිව්‍යුහගත කිරීම් අවශ්‍යයි. මේක වෙන්න ඕනෑ. මෙහෙම වුණොත් තමයි රට අනාගතයට යන්න පුළුවන්" කියලා කථා කරපු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා ඇවිල්ලා පනතට විරුද්ධව ඡන්දය දුන්නා. ඒක තමයි තිබෙන පුදුමය. මම අද දැක්කා, එතුමා ඉදිරිපත් කරලා තිබෙන වාර්තාවක්. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට එතුමාගේ තක්සේරුව ඉදිරිපත් කරලා තිබුණා. මම දන්නේ නැහැ, කොහොමද ඒ තක්සේරුව කළේ කියලා. මේ සභාව ඇතුළේ කථා කරනවා, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති පිළිබඳව. එතුමාගේ වාර්තාවේ තිබෙනවා, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති වෙනුවෙන් සූර්ය පැනල හදන්න අවශ්‍ය දේවල්වල බදු ඉවත් කිරීම සමහර විට අවාසිසහගත තත්ත්වයක් වෙයි කියලා. මට තේරෙන්නේ නැහැ, අවාසිසහගත තත්ත්වය ඇති වෙන්නේ කොහොමද කියලා. ඒ අවාසිසහගත තත්ත්වය ඇති වෙන්නේ අපේ තිබෙන ඒ නීති- රීති දැඩි කළොත් පමණයි. ඒවා අද ලිහිල් කරලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය වැය තුළින් ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා අඩිතාලමක් දානවා වාගේම, ඉදිරි කාලය තුළ දී මේ ආයතන ශක්තිමත් කිරීම සඳහා

ප්‍රතිපත්තිමය වශයෙන් ඒ ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ ඉදිරිපත් කරන්නට අපි බලාපොරොත්තු වෙනවා. විපක්ෂය දේශපාලන වශයෙන් මොන මතය දැරුවත්, ඔබතුමන්ලාගේ දේශපාලන පක්ෂවල තිබෙන ප්‍රතිපත්ති ප්‍රකාශන තුළින් ඉදිරිපත් කර ඇති කරුණු අනුව නම්, මේ අය වැය ලේඛනයට විරුද්ධව ඡන්දය දෙන්න නම් පුළුවන්කමක් ඔබතුමන්ලාට නැහැ කියලා මම දන්නවා.

ප්‍රතිපත්තියේ තියෙන්නේ එකක්. හැබැයි, මෙතැනට ඇවිල්ලා කියන්නේ තව එකක්. ඔබතුමන්ලා තමයි වැඩියෙන්ම කෑ ගැහුවේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්න කියලා. විපක්ෂයට ගිහිල්ලා ඉන්න මන්ත්‍රීවරු කිහිප දෙනෙක් ඉන්නවා. ඒ අය අපේ ආණ්ඩුවේ ඉන්නකොට කිව්වේ මොකක්ද? ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට - IMF එකට - ගියොත්, ආණ්ඩුවෙන් ඉවත් වෙනවා කිව්වා; ආණ්ඩුව පෙරළනවා කිව්වා. අන්න ඒ අය මේ අය වැයට විරුද්ධ වුණාට ගැටලුවක් නැහැ. හැබැයි, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලට යන්නේ නැත්තේ ඇයි, බදු අඩු කරලා තිබෙන්නේ ඇයි, බදු අඩු කරපු නිසා රාජ්‍ය ආදායම අඩු වෙලා තිබෙනවා, රාජ්‍ය වියදම වැඩි වෙලා තිබෙනවා කියලා කියපු අයට මේ අය වැයට විරුද්ධ වෙන්න පුළුවන්කමක් නැහැ. මොකද, අපට මීට වඩා රාජ්‍ය වියදම වැඩි කරන්න බැහැ.

මම දන්නේ නැහැ, විපක්ෂ නායකතුමා සහ විපක්ෂය නියෝජනය කරන අනික් මන්ත්‍රීවරු අතර මත ගැටුමක් තිබෙනවාද කියලා. මොකද, හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා කියන එක නොවෙයි, විපක්ෂ නායකතුමා කියන්නේ. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාගේ කථාවේ සමහර තැන්වල කියන දේවල් සහ විපක්ෂ නායකතුමාගේ කථාවේදී කියන දේවල් බැලුවාම යම් පරස්පරයක් තිබෙනවා. විපක්ෂ නායකතුමා කියනවා, පඩි වැඩි කරන්න, මෙන්න මේ බදු අඩු කරන්න, මෙන්න මේවා ටික කරලා දෙන්න කියලා. හැබැයි, අනික් අතට කියනවා, රාජ්‍ය වියදම අඩු කර ගන්න ඕනෑ, ආදායම වැඩි කර ගන්න ඕනෑ කියලා. මට කියන්න, බදු වැඩි කරන්නේ නැතුව ආදායම වැඩි කර ගන්න පුළුවන් ක්‍රමයක්. ඉතින් ආදායම වැඩි කරන ක්‍රමයක් කියන්නේත් නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටට ආදායම ලැබෙන, විදේශ විනිමය ලැබෙන ප්‍රධාන ක්ෂේත්‍ර තුනක් තිබෙනවා. ඒ තමයි, අපේ ශ්‍රමිකයන්ගෙන් ලැබෙන විදේශ මුදල්, සංචාරක කර්මාන්තය සහ අපනයන කර්මාන්තය. හැබැයි, අවාසනාවට පසුගිය අවුරුදු දෙකේ සංචාරක කර්මාන්තය සහ ශ්‍රමිකයන්ගෙන් ලැබිච්ච ප්‍රේෂණ ප්‍රමාණය හීන වෙලා තිබුණේ; ඉතාම අඩු මට්ටමක තිබුණේ. කොවිඩ් වසංගතයත් එක්ක ඔවුන්ගේ රැකියා අහිමි වුණා. ගමනාගමන දුෂ්කරතා ඇති වුණා. ඒ රටවල් පවා ආර්ථික අර්බුදවලට මුහුණ දුන්නා. ඒ නිසා ඒ රටවල ජනතාවට රැකියා ලබා දීමට ඉඩ ප්‍රස්ථා ලබා දුන් නිසා බොහෝ ශ්‍රී ලාංකිකයන්ට රැකියා අහිමි වුණා. එතකොට ඒ අයට රටට මුදල් එවන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. අපට තිබුණේ අපනයන ආදායම විතරයි.

ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාගේ ආණ්ඩුව ඇතුළේ එක දෙයකින් අපි සමත් වුණා. අපේ අපනයන ආදායම සහ ආනයන වියදම අතර අපි යම් පරතරයක් ඇති කර ගත්තා. ඒ, අවුරුදු ගණනාවකට පස්සේ සිදු වූ දෙයක්. ඒක අපි ඉදිරියට ගෙනියන්න ඕනෑ. අපේ අපනයන ආදායම වැඩි කරන්න නම්, අපි කලාපයේ රටවල් එක්ක තරග කරන්න ඕනෑ. අපි හිතාගෙන ඉන්නවා නම්, අපේ කෘෂි කර්මාන්තය මේ විදියටම කරලා අපට දියුණු වෙන්න පුළුවන් කියලා, වැවිලි කර්මාන්තය මේ විදියටම කරලා අපට දියුණු වෙන්න පුළුවන් කියලා, ඒක කරන්න බැහැ. ඒකට ආයෝජන අවශ්‍යයි; තාක්ෂණය අවශ්‍යයි. කවුරු හරි බලාපොරොත්තු වෙනවා නම්, මොන ආණ්ඩුවක් පත් වුණත් ආයෝජකයෙක් ඇවිල්ලා මේ තියෙන වටපිටාව තුළ මේ රටේ ආයෝජනය කරයි කියලා, ඒක එහෙම වෙන්නේ නැහැ. මොකද, ඒ ආයෝජකයාට අවශ්‍ය පහසුකම් ටික දෙන්න ඕනෑ. ආයෝජකයෙක් එනකොට ගහලා පන්නන්න බැහැ.

බලශක්ති ක්ෂේත්‍රයේ ආයෝජනයක් වෙනුවෙන් අදානි සමාගම එනකොට කියනවා, "ඔන්න මේ රටේ විදුලියත් පිට රටට ගෙනියන්න එක්කෙනෙක් එනවා" කියලා. අපේ ආණ්ඩුව වෙලාවේ නැඟෙනහිර පර්යන්තයට ආයෝජනය කරන්න අදානි සමාගම ආවා. එතැනින් තමයි මේ දේවල් පටන් ගත්තේ; ගහලා එළෙව්වා; ආයෝජනයත් නැති වුණා. අවසානයේ වරායේ තියෙන අපේ හොඳම කොටස ඒ ආයෝජනය හැටියට දෙන්න සිද්ධ වුණා. දැන් ඒකේ වැඩ යනවා. මට හිතෙනවා, මේ යන විදියට තව ටික දවසක් යනකොට බටහිර පර්යන්තයේ වැඩ ඉක්මන් වෙයි වාගේ නැඟෙනහිර පර්යන්තයට වැඩිය. අපි මේවා තියාගෙන හිටියාට වැඩක් නැහැ. මේක අපේ පොළොවේ කෑල්ලක්, මේකට ආයෝජකයන්ට එන්න දෙන්නේ නැහැ කියලා තියාගෙන හිටියාට වැඩක් වෙන්නේ නැහැ. එතකොට ඒක සංවර්ධනය වෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ගිහිල්ලා බලන්න, ඩුබායි රට සංවර්ධනය වෙන්නේ කොහොමද කියලා. අද ඔවුන් ආයෝජකයන්ට අවශ්‍ය පරිසරය නිර්මාණය කරලා දෙනවා. ශ්‍රී ලාංකිකයෝත් ගිහිල්ලා ඩුබායිවල ආයෝජනය කරනවා. ඇයි? ආයෝජනය සඳහා අපට වැඩිය පහසුකම් ඒ රටවල දෙනවා.

අනුර කුමාර දිසානායක මැතිතුමා උදේ කිව්වා, මේ රටේ ඉන්න මිනිසුන් දැන් මේ රට අත්හැරලා යන තත්ත්වයට පත් කරලා තියෙන්නේ කියලා. ඇත්තටම එතුමන්ලා තමයි ඒකට වග කියන්න ඕනෑ. මේ රටේ ඉන්නේ නැතුව රට අත්හැරලා යන තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ, මේ රටේ රැකියා නැතුව, කන්න බොන්න නැතුව නොවෙයි. එහෙම යන බහුතරය කවුද? කන්න, බොන්න තියෙන, මේ රටේ ආයෝජන කරලා තියෙන හොඳ ව්‍යාපාරිකයෝ තමයි අද එහෙම යන්නේ. ඇයි ඒ? ඔවුන්ගේ ආරක්ෂාව නැති වෙලා තිබෙනවා; ස්ථාවරභාවය නැති වෙලා තිබෙනවා.

සංචාරක කර්මාන්තය දියුණු වෙයිද, හෝටලයක් තියෙන මිනිහෙකුට දියුණු වෙන්න හිතන්න පුළුවන්ද, මේ තිබෙන තත්ත්වය අනුව? සංචාරක කර්මාන්තය නැඟගෙන එනකොට උද්ඝෝෂණ දෙක තුනක් කරලා, වට කරලා ගහලා, පොලිසිය එක්ක ගැටුම් ඇති කරගෙන ලෝකයට දෙන මතය මොකක්ද? මොකක්ද දෙන මතය? රටේ මානව හිමිකම් උල්ලංඝනය වෙලා කියනවා. එහෙම නේ කියන්නේ. ව්‍යාපාරිකයෝ වට කරනවා. උද්ඝෝෂණ කරලා ව්‍යාපාරිකයන්ට බලපෑම් කරනවා. කිසිම ආයෝජකයෙකුට එන්න දෙන්නේ නැහැ. ඒක නිසා තමයි විශාල පිරිසක් අද රට අතහැර යන තත්ත්වයට පත් වෙලා තියෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒක පාර්ලිමේන්තුව සොයා බැලිය යුතු ම කාරණාවක්. රැකියාවලට රටින් එළියට යන ප්‍රමාණයට වැඩිය මේ රටේ හොඳට ජීවත් වෙන්න පුළුවන් වෘත්තිකයෝ, ව්‍යාපාරිකයෝ -හොඳ ව්‍යාපාර තිබෙන පිරිස්- වැඩි වශයෙන් මේ රටින් යන්න පටන් අරගෙන තිබෙනවා. ඒ ඇයි? ඔවුන්ට පේනවා, මේ රට දේශපාලන වශයෙන් අස්ථාවර කරනවා කියලා. මේ රට දේශපාලන වශයෙන් අස්ථාවර කරනවා පමණක් නොවෙයි, ඔවුන්ගේ ආරක්ෂාව පවා අද නැතිවෙලා තිබෙනවා, ඉලක්ක කරගෙන ඔවුන්ට ප්‍රහාර එල්ල කරනවා කියලා ඔවුන්ට පේනවා. ඇති නැති පරතරය පෙන්වලා අද සමහරුන් කෙරෙහි වෛරයක් -ක්‍රෝධයක්- ඇති කරලා තිබෙනවා. ඉතිහාසයේත් අපි දැක්කා, සමහර තැන්වල මේවා සිද්ධ වුණා. අද ඒක තවතවත් වේගයෙන් සිද්ධ වෙමින් තිබෙනවා.

[ගරු කංචන විජේසේකර මහතා]

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, තව ටික දවසක් යනකොට ඔබතුමාගෙනුත් ඉල්ලීමක් කරයි, සැහැල්ලු ඇඳුමකින් සැරසිලා පාර්ලිමේන්තුවටත් එන්න ඉඩ දෙන්න කියලා. මේ පාර්ලිමේන්තුවටත් ඒක එන්න ඉඩ තිබෙනවා, තව ටික දවසක් යනකොට. එහෙම වුණොත් මම නම් පුදුම වෙන්නේ නැහැ. ඉදිරියේදී පාර්ලිමේන්තුවේත් ඒ තත්ත්වය ඇති වෙයි. සමහර වෙලාවට මේවා trend එකක් කර ගන්නවා නේ. අද සමහරු වැරදි පූර්වාදර්ශ trend එකක් කරගෙන තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය වැය ඇතුළේ තියෙන්නේ අපහසු කාරණා, අමාරු කාරණා. අපේ සමහර මන්ත්‍රීවරු වුණත් බැලුවේ විමධ්‍යගත අරමුදල් ගන්න පුළුවන්ද, වැඩි වශයෙන් අපේ ආසනයට, දිස්ත්‍රික්කයට වැඩ කරන්න පුළුවන්ද කියලායි. නමුත් ජනාධිපතිතුමා පැහැදිලිව කිව්වේ, එහෙම වෙන් කරන්න, ඒ කටයුතු කරගෙන යන්න මුදල් නැහැ කියලායි. අපේ ආර්ථිකය ශක්තිමත් වුණාට පස්සේ අපට ඒ කටයුත්ත කරන්න පුළුවන්. කෘෂි කර්මාන්තය, ධීවර කර්මාන්තය, වැවිලි කර්මාන්තය වැනි අපි ප්‍රමුඛතාව ලබා දීලා තිබෙන කාරණා කිහිපයක් තිබෙනවා. මේ අර්බුදය තුළ අපි උත්සාහ කරන්න ඕනෑ, මේ තිබෙන වැඩ පිළිවෙළ ශක්තිමත්ව ඉදිරියට ගෙන යන්නයි. මැතිවරණ තියන වෙලාවට ඕනෑ කෙනෙකුට ආණ්ඩුව පිහිටුවා ගන්න පුළුවන්.

සමහරු දැන් විපක්ෂයේ ඉඳගෙන ඉල්ලනවා, ඉක්මනින් ඡන්දයක් පවත්වන්න කියලා. ඔබතුමන්ලාට මතක ඇති, 2018 ඔක්තෝබර් මාසයේ මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිතුමා පාර්ලිමේන්තුව විසුරුවා හැරියා නේ. පාර්ලිමේන්තුව විසුරුවා හැරියාම ඡන්දය තියන්න එපා කියලා නඩුත් දැම්මා නේ; එහෙමත් නඩු දැම්මා. ඒ වෙලාවේත් පළාත් පාලන මැතිවරණය කල් දැම්මා. අවසාන මොහොතේත් පළාත් පාලන මැතිවරණ පනතට සංශෝධන ගෙනාවා. පළාත් සභා මැතිවරණය අදටත් පවත්වලා නැහැ නේ. එදා විපක්ෂයේ ඉන්නකොට අපි කිව්වේ පළාත් සභා මැතිවරණය කලින් තියන්න කියලා නොවෙයි, කලට වෙලාවට තියන්න කියලා. එදා ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ එක්සත් ජාතික පක්ෂය එකටයි ආණ්ඩු කළේ. හැබැයි, ඒ වෙලාවේ බලය තියාගන්න ඕනෑ නිසා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ අයත් කිව්වා, ඒ වෙලාවේ ඡන්දයකට ගියොත් පළාත් සභාවේ මහ ඇමතිකම නොවෙයි, මන්ත්‍රීකමක්වත් ගන්න බැහැ කියලා. ඒ නිසා 50:50 ගෙනාවා. ඒ විධියට එදා විකෘති මැතිවරණ ක්‍රමයක් ගෙනාවා. එදා ඒ විකෘති මැතිවරණ ක්‍රමයට පිතෘත්වය දීපු අය තමයි දැන් කියන්නේ මැතිවරණය කලින් තියන්න කියලා. පාර්ලිමේන්තු මැතිවරණය වෙලාවට තියයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පාර්ලිමේන්තු මැතිවරණයක් අවශ්‍ය නම්, ඒක කරන්න අමාරුත් නැහැ නේ.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is the point of Order?

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
වැරදි, දන්නේ නැති දේවල් එක්කෝ නොකියා ඉන්න ඕනෑ. මොකද, මේ පරාජයට පත් වුණේ Delimitation Commission එක.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, that is not point of Order.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
හරි, හරි. *[බාධා කිරීම්]* දන්නවා ඇති, *[බාධා කිරීම්]* මගේ නම කිව්වා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Dayasiri Jayasekara, let us not make this a debate.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
මේ පරාජයට පත් වුණේ Delimitation Commission එක. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ Delimitation Commission එකට අගමැතිතුමා විසින් මාස දෙකක් ඇතුළත වෙන යෝජනාවක් ඉදිරිපත් කරන්න තිබුණා. නමුත්, ඒක ඉදිරිපත් කළේ නැහැ. ඒක ඉදිරිපත් කළේ නැත්තේ ඔබතුමන්ලාගේ දැන් ඉන්න ජනාධිපති. *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, thank you for the clarification. Hon. Minister, please continue.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒක කියපු එක හොඳයි. ඒ වෙලාවේ කවුද පළාත් සභා හා පළාත් පාලන ඇමති? ෆයිසර් මුස්තාපා. එතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, එතුමාත් ඒකට විරුද්ධව ඡන්දය දෙනවා කියලා. එතුමා දැන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ උපසභාපති. ඒ කාලයේ එතුමා පළාත් සභා හා පළාත් පාලන ඇමති. එතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වේ, එතුමාත් විරුද්ධ වෙනවා කියලායි. දැන් මේ බයිලා කථා කරනවා.

**ගරු දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு தயாசிறி ஜயசேகர)
(The Hon. Dayasiri Jayasekara)
ඒක තමයි මම කිව්වේත්. තේරුම් ගන්නේ නැති එකේ ප්‍රශ්නයනේ තිබෙන්නේ. ඇමතිගේ ප්‍රශ්නයක් නොවෙයි, මෙතැන තිබෙන්නේ. අගමැතිතුමා ඒ යෝජනාව ගෙනාවේ නැහැ. අපේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමා ඒක හොඳට දන්නවා. ගරු දිනේෂ් ගුණවර්ධන මැතිතුමනි, ඔබතුමා අගමැතිතුමා විධියට ආපසු ඒ යෝජනාව ගේන්න කෝ. පුළුවන් නම් ගේන්න කෝ. මාස දෙකෙන් ඒක කරන්න පුළුවන්.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Thank you. Hon. Minister, please let us not make this a debate. Please continue with the speech.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මාරුවෙන් මාරුවට, ඉක්මනට ඉක්මනට ආණ්ඩුවෙයි විපක්ෂයේයි දෙසැරයක් තුන්සැරයක් ඉන්නකොට, ඒ වෙලාවේ හිටපු ඇමති කවුද කියලාත් අමතක වෙනවා. ඒ වෙලාවේ ආණ්ඩුවේ හිටියේ කවුද, ඒ වෙලාවේ හිටපු ඇමති කවුද කියන එකත් අමතක වෙලා තිබෙන්නේ. ඒක තමයි වෙන්නේ, මාස දෙක-තුනක් ඇතුළත ආණ්ඩුවෙයි, විපක්ෂයේයි දෙපැත්තේ, තුන්පැත්තේ ඉන්නකොට. ඒක තමයි මේ වෙන්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දැන් ඉන්න උපසභාපතිවරයා, ෆයිසර් මුස්තාපා මැතිතුමා එදා ඇමතිවරයකු විධියට සිටියදී මේ පාර්ලිමේන්තුවේදී මම ඇහුවාම, "ඇමතිතුමා, ඔබතුමා මේ පනත් කෙටුම්පතට ඡන්දය දෙනවාද" කියලා, "නැහැ, අපි දෙන්නේ නැහැ, මම දෙන්නේත් නැහැ, අපේ පක්ෂය දෙන්නේත් නැහැ" කිව්වා. ඒ වෙලාවේ කියපු දේවල් - *[බාධා කිරීම්]*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Minister, please wind up.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ඒ වෙලාවේ පළාත් සභා මැතිවරණය නැවැත්වූවා, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. ඡන්දයක් ඕනෑ නම් කිසි ප්‍රශ්නයක් නැහැ, ඔබතුමන්ලා අත්සන් කරන්න, "පාර්ලිමේන්තුව විසුරුවන්න" කියලා. එහෙම අත්සන් කරන්න, අත්සන් කරලා දෙන්න. ඒක කරන්නේ නැහැ. එහෙම කරන්නේ නැහැ. *[බාධා කිරීම්]* මේ පාර්ලිමේන්තුව විසුරුවන්න කියලා අත්සන් කරන්නේ නැහැ. ඒ නිසා බලනවා, ප්‍රාදේශීය සභා මැතිවරණයෙන් මොකක් හරි කරගන්න පුළුවන්ද කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි අවසාන වශයෙනුත් කියන්නේ මේකයි. මේ අභියෝගාත්මක අවස්ථාවේ මේ පාර්ලිමේන්තුව නියෝජනය කරන සියලුදෙනාටම වගකීමක් තිබෙනවා, මේ රටේ ආර්ථික ක්‍රමය නැවත වතාවක් යථා තත්ත්වයට පත් කිරීමට ප්‍රවේශයක් ගන්න. ඒ ප්‍රවේශය සඳහා කවුරු ආවත් එකයි. සමහර විට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලින් පමණක් අපට විසඳුම් නොලැබෙන්න පුළුවන්. මෙතැන ඉන්න සජිත් ප්‍රේමදාස මහත්තයා බලයට ආවා කියලා වෙන කවුරුවත් එන්නේ නැහැ, අපට උදව් කරන්න. ඒ අයම තමයි එන්නේ. සජිත් ප්‍රේමදාස මහත්තයාට තව ජාත්‍යන්තර අරමුදලක් නැහැ, උදවු කරන්න. ඒ නිසා මේ ක්‍රමය තමයි ක්‍රියාත්මක කරගෙන යන්න වෙන්නේ. *[බාධා කිරීමක්]* හර්ෂණ රාජකරුණා මන්ත්‍රීතුමාත් ඒක කියන එක හොඳයි. පසුගිය දවසක එතුමා ගිහින් තිබුණා, බලශක්ති සමුළුවකට. අපි ඉදිරිපත් කළ බලශක්ති පනතට විරුද්ධ වෙලා, එතුමා බලශක්ති සමුළුවට ගිහින් තිබුණා.

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)

ලජ්ජයි.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය වැය වෙනුවෙන් අවශ්‍ය සහයෝගය ලබා දෙන්න කියන ඉල්ලීමත් කරමින්, අපි ආණ්ඩුවක් හැටියට පුළුවන් තරම් මේ අය වැය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරමින් රටේ ජනතාවට අවශ්‍ය පහසුකම් ලබා දීම සඳහා අවස්ථාව උදා කරගන්නා බවත් මතක් කරමින්, මගේ කථාව අවසන් කරනවා.

**ගරු ජගත් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு ஜகத் சமரவிக்ரம)
(The Hon. Jagath Samarawickrama)

Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Member, what is the point of Order?

**ගරු ජගත් සමරවික්‍රම මහතා**
(மாண்புமிகு ஜகத் சமரவிக்ரம)
(The Hon. Jagath Samarawickrama)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මනම්පිටියේ නිමල් ජයරත්න මාධ්‍යවේදී මහතා අද -2022.11.22- "ලංකාදීප" පුවත් පතේ සඳහන් කර තිබෙනවා, පොළොන්නරුව වැලිකන්ද, ත්‍රිකෝණමඩු රක්ෂිතයට මායිම්ව පිහිටි සූරියවැව රක්ෂිතයේ, NLDB Farm එකට අයත් කොටස යම්කිසි කණ්ඩායමක් විසින් වගා කටයුතු සඳහා ඩෝසර් කරනවා කියලා. ඒ නිසා කෘෂිකර්ම අමාත්‍යතුමාට මම යෝජනා කරනවා, තාවකාලිකව -

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

Hon. Member, it is not a point of Order.

**ගරු මහින්ද අමරවීර මහතා (කෘෂිකර්ම අමාත්‍ය සහ වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த அமரவீர - கமத்தொழில் அமைச்சரும் வனசீவராசிகள் மற்றும் வனவளங்கள் பாதுகாப்பு அமைச்சரும்)
(The Hon. Mahinda Amaraweera- Minister of Agriculture and Minister of Wildlife and Forest Resources Conservation)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එතුමා ඉදිරිපත් කළ කාරණාවට අපි අවධානය යොමු කරනවා. අද පුවත් පත්වල මේ පිළිබඳව පළ වෙලා තිබුණා. අපි කිසිසේත්ම මේ කැලෑව එළි කරන්න ඉඩ දෙන්නේ නැහැ. එහෙම සිද්ධියක් වෙලා තිබෙනවා නම්, ඒක වහාම නතර කරන්නත්, ඊට විරුද්ධව කටයුතු කරන්නත් අපි සූදානම් වෙනවා. ඒ වාගේම ක්‍රමානුකූලව සිදු කරන වගා වැඩ පිළිවෙළකට මිසක්, පරිසරය විනාශ කරන කටයුතුවලට අපි ඉඩ දෙන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)

The next speaker is the Hon. Rishad Bathiudeen. You have nine minutes.

[பி.ப. 2.53]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)

*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ பிரதித் தவிசாளர் அவர்களே, இந்த வரவு செலவுத்திட்ட விவாதத்திலே பேசச் சந்தர்ப்பம் தந்தமைக்காக நன்றி கூறுகின்றேன். எமது நாடு சுதந்திரம் பெற்றபொழுது பொருளாதார அந்தஸ்திலே ஆசியாக் கண்டத்திலே ஜப்பானு

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

க்கு அடுத்ததாக இரண்டாவது இடத்தைப் பெற்றிருந்தது. இந்த நாட்டின் முன்னைய ஆட்சியாளர்கள் தாம் ஆட்சிக் கதிரையிலே அமரவேண்டும் என்பதற்காக மக்களை மடையர்களாக்கி, தங்களுடைய விருப்பத்திற்கேற்பச் செயற்பட்டு, இந்த நாட்டின் பொருளாதாரத்தை நாசமடையச் செய்தார்கள். நாட்டின் பொருளாதாரத்தைப் பற்றிச் சிந்திக்காது தங்களுடைய இருப்பைப் பற்றி மாத்திரம் சிந்தித்து அவர்கள் எடுத்த பிழையான முடிவுகளாலும் செயற்பாடுகளாலும் இன்று இந்த நாடு வங்குரோத்து நிலையை அடைந்த நாடாக, உலகத்திலே கறுப்புப் புள்ளியிடப்பட்ட நாடாக மாற்றப்பட்டிருக்கின்றது. அவ்வாறான இக்கட்டான ஒரு சூழலிலேதான் இந்த வரவு செலவுத்திட்டம் சமர்ப்பிக்கப்பட்டிருக்கின்றது.

சில மாதங்களுக்கு முன்னர் நாட்டின் முன்னாள் ஜனாதிபதி அவர்கள் நாட்டு மக்களால் விரட்டப்பட்ட வரலாறு இங்கே இருக்கின்றது. மக்களுடைய அதிகபட்ச ஆதரவைப் பெற்ற ஒரு சனாதிபதிக்குத் தன்னுடைய பதவிக் காலத்தைக்கூட நிறைவு செய்ய முடியாமற்போனதொரு நிலைமை ஏன் ஏற்பட்டது? இந்த நாட்டை இவ்வளவு மோசமான நிலைக்குக்கொண்டு வரும் வகையில் அவரது செயற்பாடுகள் அமைந்ததனால் அவர் இந்த நாட்டைவிட்டு ஓடுமளவுக்குச் சூழ்நிலைகள் மாற்றமடைந்தன. ஒரு திட்டமிடல் இல்லாத செயற்பாடாக அவர் தான் நினைத்தவாறு வரியை இரவோடிரவாகக் குறைத்ததனூடாக, 2020ஆம் ஆண்டு 600 - 700 பில்லியன் ரூபாய் வருமானம் இழக்கப்பட்டது. அதேபோல, ஒரு பாரம்பரிய விவசாய நாடான எமது நாட்டில் organic farming systemஐ நடைமுறைப்படுத்துவதற்காக, எந்தவிதத் திட்டமிடலும் இல்லாமல், விவசாயத்தில் தங்கியிருக்கின்ற 40 சதவீதமான விவசாயிகளினதோ அல்லது அது தொடர்பான நிபுணர்களினதோ ஆலோசனையைப் பெறாமல், இரவோடிரவாக உர இறக்குமதி தடைசெய்யப்பட்டதனால் விவசாயிகள் மோசமான பொருளாதார நிலைமைக்கு உள்ளாக்கப்பட்டார்கள். அந்த அரசாங்கம் ஆட்சிக்கு வந்த காலத்திலிருந்து அவ்வாறான பல முடிவுகளை எடுத்து, தங்களுக்கு ஆணை வழங்கிய நாட்டு மக்களைத் திருப்திப்படுத்துவதைவிட, நாட்டை அதல பாதாளத்திற்குக் கொண்டுபோகக்கூடிய செயற்பாடுகளான இனவாதத்தையும் மதவாதத்தையும் விதைத்தமையே இன்று இந்த நாடு இவ்வளவு மோசமான வங்குரோத்து நிலையை அடையக் காரணமாக அமைந்தது.

இன்று நமது நாட்டைப் பார்க்கின்றபொழுது, மிகவும் வேதனையாக இருக்கின்றது. நமது நாட்டிலுள்ள புத்திஜீவிகள், வைத்தியர்கள், வைத்திய நிபுணர்கள் எனப் பலரும் நாட்டைவிட்டு வெளியேறிக்கொண்டு இருக்கிறார்கள். இன்று அரசாங்க வைத்தியசாலைகளிலே மருந்துகள் இல்லாமல் மக்கள் மிகவும் கஷ்டப்படுகிறார்கள். மருந்துகளை வைத்தியசாலைக்கு வெளியே பெற்றுக்கொள்வதற்குப் பணம் இல்லாமல் கஷ்டப்படுகிறார்கள். இன்று எத்தனையோ பேர் வைத்தியசாலைகளிலே அவர்களுக்கான சரியான வைத்தியம் கிடைக்காமலும் மருந்துகள் கிடைக்காமலும் நோயாளிகளாக மரணித்துக் கொண்டிருக்கிறார்கள். அவ்வாறானதொரு இக்கட்டான நிலையில், இன்று வைத்தியர்களும் வைத்திய நிபுணர்களும் நாட்டைவிட்டு வெளியேறித் தொழிலுக்காக வெளிநாடுகளுக்குச் செல்வதென்பது, நமது நாட்டை இன்னும் பெரும் ஆபத்தை எதிர்நோக்கக்கூடிய அதிர்ச்சிகரமான நிலைமைக்குத் தள்ளிவிடுமோ என்ற பயத்துடன் நாங்கள் இருக்கிறோம்.

நமது நாட்டில் பாடசாலைக் கல்வி இலவசக் கல்வியாக இருந்தாலும், பிள்ளைகளுக்குத் தேவையான பாடசாலை உபகரணப் பொருட்களை வாங்குவதற்குப் பெற்றோர்கள் மிகவும் சிரமப்படுகிறார்கள். இன்று நான் காலையில் முன்னாள் இராணுவ வீரர் ஒருவரைச் சந்தித்திருந்தேன். அப்போது, பிள்ளைகளின் தந்தை என்றவகையில் அவர் சொன்னார், "இன்று பிள்ளைகளுக்குத் தேவையான பாடசாலை உபகரணங்களைப் பெற்றுக்கொள்வதென்பது இயலாத விடயமாக இருக்கின்றது" என்று. அன்று பாடசாலை உபகரணங்களை வாங்குவதற்கு ஒரு பிள்ளைக்கு ரூபாய் 5,000 தேவையென்றால், இன்று ரூபாய் 20,000 தேவையாக இருக்கின்றது. அப்பியாசக் கொப்பிகள் போன்ற பாடசாலை உபகரணங்களின் விலை இன்று நானூறு வீதம் அதிகரித்திருக்கின்றது. இதனால் ஏழை மாணவர்களால் கல்வியைத் தொடர முடியவில்லை. சாதாரண குடிமக்களான அவர்களது பெற்றோர் இந்தச் செலவுகளை ஈடுசெய்ய முடியாமல் திண்டாடுகின்ற ஒரு துர்ப்பாக்கிய நிலை இருக்கின்றது. இந்த விடயத்திலே ஒரு திட்டமிடல் இல்லாமல் அரசாங்கம் செயற்படுகிறது.

இன்று பொருட்களின் விலை அதிகரிப்பென்பது கேட்பாரற்ற நிலையில் காணப்படுகின்றது. அதாவது, எமது நாடு இன்று கேட்பார், பார்ப்பார் இல்லாத நாடாக மாறியிருக்கிறது. கடந்த காலங்களிலே நான் அதற்குப் பொறுப்பான அமைச்சராக இருந்தபொழுது, அந்த விடயங்களில் மிகக் கவனஞ்செலுத்தி, அதற்கான அதிகாரிகளைப் பயன்படுத்தி மாவட்ட ரீதியாக, கிராம ரீதியாக, பிரதேச ரீதியாக மதிப்பாய்வுகளைச் செய்து, தவறு செய்யும் வர்த்தகர்களைக் கைது செய்வதற்கான நடவடிக்கைகளை எடுக்கின்ற திட்டங்கள் இருந்தன. அன்று பொருட்களின் விலைகளைத் தீர்மானிப்பது அரசாங்கமாக இருந்தது. ஆனால், இன்று எல்லாப் பொருட்களின் விலைகளையும் வியாபாரிகள் தீர்மானிக்கின்ற அளவுக்கு நாட்டை மிகமோசமான நிலைமைக் குக் கொண்டு வந்திருக்கிறார்கள்.

அது மாத்திரமல்ல, அண்மையிலே இங்கிருந்து ஓமான் நாட்டுக்கு வேலை தேடிச் சென்ற பெண்கள்மீது மிகமோசமான செயற்பாடுகள் இடம்பெறுவதை நாங்கள் அறியக்கூடியதாக இருக்கின்றது. அங்கு பெண்கள் பிழையான தொழிலுக்காக - விபச்சார நடவடிக்கைகளுக்காகப் பயன்படுத்தப்படுகிறார்கள். அங்கு சென்றவர்கள் அடிக்கடி எங்களுடன் தொலைபேசியில் தொடர்பு கொள்கிறார்கள். அவர்கள் திரும்பவும் எமது நாட்டுக்கு வரமுடியாது கஷ்டப்படுகிறார்கள். இந்த விஷயத்திலே அரசாங்கம், குறிப்பாக Ministry of Foreign Affairs மிகவும் கவனம் செலுத்தவேண்டும். இந்த நாட்டுக்கு அதிக அந்நியச் செலாவணியைப் பெற்றுத்தருகின்ற தொழிலாக வெளிநாட்டு வேலைவாய்ப்புகள் இருந்தன. இன்று அது பிழையாகப் பயன்படுத்தப்படுகின்றது. ஆகவே, அந்த நாட்டி லேயிருக்கின்ற எமது தூதரகம் அவர்களுடைய விடயத்திலே அக்கறை செலுத்தவேண்டும். அரசாங்கம் பராமுகமாக இருந்து விட முடியாது. அரசாங்கம் அதற்கான பொறுப்பை எடுத்து, அவ்வாறானவர்களைக் காப்பாற்றி நாட்டுக்குக் கொண்டுவருகின்ற நடவடிக்கைகளை மேற்கொள்ள வேண்டும். இதற்குப் பின்னால் இருக்கின்ற சக்திகளை அடையாளங்கண்டு அவர்களுக்குத் தண்டனை வழங்குவதனூடாக இவ்வாறான செயற்பாடுகள் எதிர்காலத்திலே நடந்துவிடாமல் தடுத்து, வேலைவாய்ப்புக்காகச் செல்கின்றவர்களைப் பாதுகாக்க முடியுமென்று நாங்கள் எண்ணுகின்றோம்.

அதுமாத்திரமல்ல, அம்பாறை மாவட்டத்திலே பொத்துவில், அதேபோல அக்கரைப்பற்றுப் பகுதியிலே இருக்கின்ற வட்டமடு போன்ற இன்னோரன்ன பிரதேசங்களில் உள்ள பல்லாயிரக் கணக்கான காணிகளை விவசாய நடவடிக்கை

களுக்குப் பயன்படுத்த முடியாமல் அந்த விவசாயிகள் பாதிக்கப்பட்டிருக்கிறார்கள். அண்மையிலே மாண்புமிகு ஜனாதிபதி அவர்கள் வவுனியாவுக்கு வந்தபொழுதும் நாங்கள் இந்த விஷயத்தை எடுத்துச் சொன்னோம். அதேபோல, கடந்த 2 வருடங்களாக இந்தச் சபையிலும் பலமுறை நாங்கள் சொல்லி வருகிறோம். நாட்டிலே விவசாயத்தை அதிகரிக்க வேண்டும், உற்பத்தியைப் பெருக்கவேண்டுமென்று சட்டங் களை இயற்றி அதற்கான முயற்சிகளை எடுக்கின்றபொழுது, அவர்களுடைய சொந்தக் காணிகள் - யுத்தத்தின் காரணத்தி னால் செல்லமுடியாதிருந்த அந்த விவசாய பூமி - இன்று வனவளத் திணைக்களத்திற்கும் வனசீவராசிகள் திணைக்களத் திற்கும் சொந்தமானதாக gazette பண்ணப்பட்டு இருப்பதனால், அங்கே விவசாயம் செய்தவர்கள் தங்களுடைய விவசாய நடவடிக்கைகளைச் செய்ய முடியாத துர்ப்பாக்கிய நிலைக்குத் தள்ளப்பட்டுள்ளார்கள். இதன் காரணமாக இன்று அவர் களுடைய பொருளாதாரம் மிக மோசமான நிலையில் இருக் கின்றது. இதுசம்பந்தமாக நாங்கள் பலமுறை இதற்குப் பொறுப்பான அமைச்சரிடத்திலும் அமைச்சுசார் ஆலோச னைக் குழுக் கூட்டங்களிலும் - Consultative Committee Meetings மற்றும் இன்னோரன்ன பல இடங்களில் சொல்லியும் அதற்கான தீர்வுகளைப் பெற்றுக்கொடுக்கின்ற அல்லது அந்தக் காணிகளை அவர்களிடத்திலே ஒப்படைக்கின்ற நடவடிக் கைகளை அரசாங்கம் செய்யாமல் இருப்பது, விவசாய உற்பத்தியை அதிகரிக்கவேண்டுமென்ற கொள்கைக்கு நேர் மாறானதாக, சொந்தக் காணிகளிலே சொந்தமாக அவர்கள் விவசாயம் செய்வதைத் தடைசெய்கின்ற ஒரு செயலாகவே இருக்கின்றது.

கடந்த 1977 - 1983 காலப்பகுதியிலே இந்த நாட்டினுடைய 40 சதவீதமான உளுந்து உற்பத்தியை வழங்கிய ஒரு மாவட்ட மாக வவுனியா மாவட்டம் இருந்தது. இன்று அங்குள்ள பல்லாயிரக்கணக்கான ஏக்கர் காணிகளை வனவளத் திணைக் களம் தனது உடைமையாக்கியிருக்கின்றது. அதாவது, 1983இன் கலவரங்களுக்குப் பின்னர் கொழும்பில் இருந்து கொண்டு GPSஇனூடாக எல்லைகளையிட்டு இந்தக் காணிகளையெல்லாம் அரச காணிகளாக - வனவளத் திணைக்களத்திற்கும் வனசீவராசிகள் திணைக்களத்திற்கும் சொந்தமான காணிகளாகக் கையகப்படுத்தியதன் காரணமாக இன்று தமது சொந்தக் காணிகளிலே விவசாயம் செய்ய முடியாமல் அந்த விவசாயிகள் மிகவும் மோசமான ஒரு நிலைக்குத் தள்ளப்பட்டிருக்கிறார்கள். இவ்வாறான விஷயங் களை இங்கு பலமுறை சொல்லியும் அவர்களுக்கு நிவாரண த்தை வழங்குவதற்கோ அல்லது இந்தப் பிரச்சினையைத் தீர்ப்பதற்கோ எந்தவித நடவடிக்கையையும் நீங்கள் எடுக்கா மல் இருப்பதைப் பார்க்கின்றபோது மிகவும் வேதனையாக இருக்கின்றது.

இன்று பல கைத்தொழிற்சாலைகள் மூடப்பட்டுக் கொண்டிருக்கின்றன. இந்த நாட்டிலே தனியார் துறையிலே வேலைசெய்கின்ற 30 இலட்சத்திற்கு மேற்பட்ட தொழிலாளர் களைப் பொறுத்தவரையிலே, இன்று பொருட்களுடைய விலை 200 - 300 சதவீதமாக அதிகரித்திருக்கின்ற வேளையிலும், அவர்களுடைய வருமானத்தில் எந்தவித மாற்றத்தையும் காணமுடியவில்லை. அதுபோல், சுயதொழில்களைச் செய் கின்றவர்கள் மிகவும் கஷ்டப்படுகிறார்கள்; SME sector இன்று வீழ்ச்சியடைந்து கொண்டிருக்கின்றது. இவ்வாறான ஒரு மோசமான நிலையிலே நாங்கள் இருந்து கொண்டிருக் கின்றோம். எனவே, எதிர்காலத்திலாவது இந்த நாட்டிலே வருகின்ற ஆட்சியாளர்கள் இனவாதம், மதவாதங்களுக்கு அப்பால், பொருளாதார நிபுணர்களை வைத்து இந்த நாட்டினுடைய நலனுக்கான திட்டங்களைக் கொள்கை ரீதியாக வகுத்து, ஆட்சிக் கதிரைகள் மாறுகின்றபோது கொள்கைகளில் மாற்றம் செய்யாமல் செயற்படுகின்ற ஒரு நல்ல நிலை வரவேண்டுமென்று பிரார்த்தித்து, விடைபெறுகின்றேன். நன்றி.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Dilan Perera. You have 14 minutes.

[අ.භා. 3.02]

**ගරු ඩිලාන් පෙරේරා මහතා**
(மாண்புமிகு டிலான் பெரேரா)
(The Hon. Dilan Perera)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය වැය, මම මේ පාර්ලිමේන්තුවේ පිට පිට කථා කරන 28වන අය වැය. මම ආණ්ඩු පක්ෂයේ හිටියා; විපක්ෂයේ හිටියා. මේ මම කථා කරන 28වන අය වැය. පසුගිය අය වැය 27ම දිහා නැවත හැරිලා බලනකොට මට හිතන්නේ අපි කථා කරලා තිබෙන්නේ ඉලක්කම් ටිකක් ගැන විතරයි, අය වැයක් ගැන නොවෙයි කියලායි. ඒක තමයි ඇත්ත කතන්දරය. මෙවර අය වැයේදීත් පක්ෂ විපක්ෂ අය එකතු වෙලා තිබෙනවා. අපට හුරු පුරුදු පොහොට්ටුව ආණ්ඩු පක්ෂයේ, UNP එක විරුද්ධ පක්ෂයේ කියන කතන්දරය වෙනස් වෙලා, පොහොට්ටුව සහ UNP එක එකතු වෙලා, සජබ අයත් ඒකට එකතු වෙච්ච වෙලාවක මම හිතුවා, මට කියන්න පුළුවන් වෙයි කියලා මේ අය වැය පසුගිය අය වැය 27ට වඩා වෙනස්, ඉලක්කම් විජ්ජාවක් නැති අය වැයක් කියලා. නමුත්, මේ යන්නේත් ඒ පාරේම තමයි කියන එක කනගාටුවෙන් වුවත් කියන්න වෙනවා.

අපි 1965දී "වගා සංග්‍රාම" ගැන කථා කළා. 1970දී "ජනතා රජය" ගැන කථා කළා. 1977දී "ධර්මිෂ්ඨ සමාජය" කිව්වා. 1994දී "සාමය හා සමෘද්ධිය" කිව්වා. 2004දී "යළි පුබුදමු ශ්‍රී ලංකා" කිව්වා. 2005දී "සුබ අනාගතයක්" කිව්වා. 2010දී "ආසියාවේ ආශ්චර්යය" කිව්වා. මනුෂ නානායක්කාර ඇමතිතුමනි, 2015දී අපි "යහපාලනය" කිව්වා. 2019දී "සෞභාග්‍යයේ ඉදිරි දැක්ම" කිව්වා. ඒවායේ ප්‍රතිඵලය, 2022දී බංකොලොත් රටක්! මම කෙටියෙන් මේ ගැන කිව්වේ, අපි කොහේටද ගියේ, කොහේටද ආවේ කියන එක පොඩ්ඩක් මතක් කරන්න ඕනෑ නිසායි. ඊට වඩා මම ඒ ගැන කියන්න යන්නේ නැහැ. අර කියපු ඔක්කෝම පහුකරගෙන ඇවිල්ලා දැන් අපි ඉන්නේ, බංකොලොත් රටක් කියන තැන. දැන් මේ බංකොලොත් රටින් එළියට එන්න වර්තමාන ජනාධිපතිතුමා මුදල් ඇමතිතුමා හැටියට ඉදිරිපත් කළ මේ අය වැයට පුළුවන්ද?

මේ අය වැයත් ඉලක්කම් විජ්ජාවක් කියලා මම මුලින් කිව්වේ ඇයි? එතුමා මේ අය වැයේ කියනවා, ඊළඟ අවුරුද්දේ අපේ ආර්ථික වර්ධන වේගය සියයට 7ක් කියලා. හැබැයි, මුදල් පිළිබඳව ගනුදෙනු කරන, මත විමසන ජාත්‍යන්තර ආයතන අපේ රට පිළිබඳව කියලා තිබෙන්නේ ඊළඟ අවුරුද්දේ අපේ රටේ ආර්ථිකය සියයට 9කින් සංකෝචනය වනවා කියලායි. එතුමා ඒක දන්නවාද දන්නේ නැහැ. ඒ ආර්ථික අනාවැකි පළ කරන අය කියන දේ අපට පිළිගන්න වෙනවා. ඇයි ඒ? ශ්‍රී ලංකාවේ මහ බැංකු අධිපතිතුමා මූල්‍ය අර්බුදයෙන් ගැලවෙන්න ආර්ථිකය සංකෝචනය කරන බව තමයි කියන්නේ. ඒ වාගේම, කරන ක්‍රියාවලියෙන් පෙනෙන්නේත් ඒකමයි. ආර්ථිකයක් සියයට 9කින් සංකෝචනය වනකොට මට හිතාගන්න බැහැ, සියයට 7ක ආර්ථික වර්ධන වේගයක් බලාපොරොත්තු වෙන්නේ කොහොමද කියලා. කොහොමත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව වැනි ආයතන ලෝකයේ හැම රටකම ඊළඟ අවුරුද්දේ ආර්ථික තත්ත්වය පිළිබඳ පුරෝකථනයක් කරනවා. ඒ කරන ලද පුරෝකථන අනුව ඒගොල්ලන් කියන්නේ, ඉන්දියාව හැර

[ගරු ඩිලාන් පෙරේරා මහතා]

වෙනත් කිසිම රටකට සියයට 6ක, 7ක ආර්ථික වර්ධනය වේගයක් තියා ගන්න බැරි වෙච්චි කියලායි. ඇමෙරිකාව, ජර්මනිය, එංගලන්තය වාගේ රටවල පවා ආර්ථික වර්ධන වේගයේ ඉලක්කය විධියට ඒ ගොල්ලන් පුරෝකථනය කර තිබෙන්නේ below 5 per cent. So, even though the forecast or the prediction of our President, as Minister of Finance, is for a 7 per cent growth, I do not think it is realistic. Looking at what is happening on the ground and looking at the plans of the Central Bank, we can say that you could never achieve that.

ආර්ථිකය ප්‍රසාරණය නොකර, ආර්ථිකයේ ක්‍රියාකාරකම් වැඩි නොකර, ආර්ථිකය සංකෝචනය වන තත්ත්වයක් තුළ, මම දන්නේ නැහැ, ආර්ථික වර්ධනයේ ඒ ඉලක්ක අපි ළඟා කරගන්නේ කොහොමද කියලා.

ඊළඟට, මගේ ඇහැ ගිය තවත් කාරණයක් මේ අය වැයේ තිබෙනවා. රනිල් වික්‍රමසිංහ මහත්තයා ටිකක් ප්‍රසිද්ධයි, එතුමාගේ පක්ෂය ඇතුළේ වාගේම, ආණ්ඩු කරන විටත් විවිධ වූ කමිටු සහ කොමිෂන් සභා හදන්න. ලංකාවේ වැඩියෙන්ම කමිටු සහ කොමිෂන් සභා හදපු නායකයා තෝරා ගත්තොත්, ඒ රනිල් වික්‍රමසිංහ මැතිතුමා. එතුමා ඒ සුපුරුදු ක්‍රියාවලිය මේ අය වැයේදීත් කරලා තිබෙනවා. එතුමා මෙවර විදේශ වෙළඳාම හා ආයෝජනය සම්බන්ධ නියෝජිතායතනයක් හදන්න රුපියල් මිලියන 100ක් වෙන් කිරීමට යෝජනා කරනවා. ඊළඟට, ජාතික ඵලදායීතා කොමිෂන් සභාවක් පිහිටුවීමට යෝජනා කරනවා. ඊළඟට, එතුමා ඩිජිටල් තාක්ෂණය පිළිබඳ වෙනම කමිටුවක් හදන්න යෝජනා කරනවා. ඒ වාගේම, ශ්‍රී ලංකාවේ ඛනිජ සම්පත් ජාතික සංවර්ධනයට ඵලදායී ලෙස යොදා ගැනීම සම්බන්ධයෙන් වන කමිටුවක් හදන්න යෝජනා කරනවා. කුරුඳු කර්මාන්තය සඳහා නව දෙපාර්තමේන්තුවක් පිහිටුවීමට යෝජනා කරනවා. ඊළඟට, ජාතික සංවර්ධන කමිටුවක් - National Development Committee එකක් - පත් කරන්න යෝජනා කරනවා. Steering Committee එකක් හදන්න යෝජනා කරනවා. ඒ වාගේ committees ගණනාවක් හදන්න යෝජනා කරලා තිබෙනවා. ඒ committees සඳහා රුපියල් මිලියන 100ක් බැගින් වෙන් කළාම එතැනම රුපියල් බිලියනයක් තිබෙනවා. ඒ committees සහ ඵලදායීතා කොමිෂන් සභාව පත් කිරීමට බිලියනයක් පමණ වෙන් කරන්න යෝජනා කරනවා. නමුත් ගරු සුදර්ශන දෙනිපිටිය මන්ත්‍රීතුමනි, මෙවර අය වැයේ මම වඩාත්ම ආසා කරන යෝජනාව වන, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයට අදාළ යෝජනාවට වෙන් කරන්න යෝජනා කරන්නේ රුපියල් මිලියන 200යි! මම දන්නේ නැහැ, මිලියන 200කින් ඉස්කෝලයක විද්‍යාගාරයක්වත් හදන්න පුළුවන්ද කියලා.

මේ කමිටු පත් කරන එකෙන් මොකද වෙන්නේ? අපි කියනවා, සෘජු විදේශ ආයෝජන ගෙනෙන්න ඕනෑ, වැඩිපුර investments ඕනෑ කියලා. අපි වැඩිපුර investments ගෙනෙන්න ඕනෑ නම්, අපි red tape නවත්තන්න එපායැ? දැන් අපේ රටට ආයෝජන ඒමේදී තිබෙන ලොකු ප්‍රශ්නයක් තමයි, red tape. ආයෝජකයෙක් එනවා නම්, ආයතන තිස් ගණනකට යන්න ඕනෑ, අවසර ගන්න. දැන් තවත් කොමිෂන් සභා, තවත් කමිටු, තවත් අධීක්ෂණ, තවත් සමාලෝචන පිළිබඳ ආයතන දැම්මාම ඒ ආයතන තිස් ගණන, ආයතන 37, 38, 39, 40 වෙනවා. ඒ නිසා මේ කරන්නේ තවත් red tape වැඩි කරන එක. ඒ විතරක් නොවෙයි. මේ විධියට ආයතන හැදුවාම ඒවාට සභාපතිවරු ඇතුළු නිලධාරින් පත් කරන්න ඕනෑ. ඒවාට තවත් වියදම් යනවා. දැන් වෙලා තිබෙන්නේ ඒ red tape අඩු කරනවා වෙනුවට, red tape වැඩි කිරීමක්.

මේ අය වැය දිහා බැලූ බැල්මටම පෙනෙන්නේ ලාභ ලබන ආයතන විකුණලා සල්ලි හොයන්න හදනවා කියන එකයි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, එවැනි ආයතන දෙකක් පිළිබඳව අපි උසාවි ගිහිල්ලා තිබෙනවා. වර්තමාන අධිකරණ අමාත්‍ය ගරු විජයදාස රාජපක්ෂ මැතිතුමා COPE එකේ සභාපතිතුමා හැටියට කටයුතු කරන කාලයේ PERC ආයතනය ඒ කමිටුවට කැඳෙව්වා. එතකොට PERC එකේ සභාපති පී.බී.ජයසුන්දර මහත්මයා. රනිල් වික්‍රමසිංහ මැතිතුමා තමයි අගමැති. PERC එකෙන්, ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණය කළා. ඒ පෞද්ගලීකරණය කරපු විධිය වැරදියි. එතැනදී තක්කඩිකමක්, හොරකමක් වෙලා තිබෙනවාද කියලා හොයන්න COPE එකෙන් පත් කළා, අනුකමිටුවක්. ඒකේ සභාපති මම. හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රී හුසේන් බයිලා මහත්තයා ඒ අනුකමිටුවේ සාමාජිකයෙක්. අපි ඒ අනුකමිටුවෙන් COPE එකට වාර්තාවක් දුන්නා, රක්ෂණ සංස්ථාව පෞද්ගලීකරණය කිරීම සම්පූර්ණයෙන් හොරකමක් කියලා. ඒ වාර්තාව අරගෙන තමයි වාසුදේව නානායක්කාර මහත්තයායි, අමරසේකර මහත්තයායි උසාවි ගියේ. ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දු කළා, ඒ පෞද්ගලීකරණය කිරීම වැරදියි කියලා. ඒ අනුව එය නැවත රජයට පැවරුවා. ඒ රජයට පැවරූ ආයතනයට ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුවෙන් පසු පත් කරපු සභාපතිතුමා තමයි, වර්තමාන පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නාලක ගොඩහේවා මහත්තයා.

ඊළඟට, වෝටර්ස් එජ් හෝටලය. වෝටර්ස් එජ් හෝටලය හැදුවේ පෞද්ගලික එක්කෙනෙක්. උසාවියෙන් තීන්දු කළා, ඒ සිද්ධ වුණු ගනුදෙනුව වැරදියි කියලා. ඒ නිසා ඒක ආපහු ආණ්ඩුවට ගත්තා. මට දැන් සැකයක් තිබෙනවා, ඒ පෞද්ගලීකරණය කිරීම වැරදියි කියලා උසාවියෙන් පවා තීන්දු ලබා දී තිබෙන මේ ආයතන නැවත වරක් පෞද්ගලීකරණය කරන්න යන්නේ, උසාවියෙන් එපා කියපු දේ වෙනත් පාරකින් කරන්නද කියලා. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ අය වැය දිහා බැලුවාම වර්තමානයේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නවලට විසඳුමක් හොයනවා වෙනුවට, වෙන වෙන පාරවල්වල යන බවක් තමයි පෙනෙන්න තිබෙන්නේ.

ඊළඟට කියලා තිබෙනවා, වරාය අධිකාරිය, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වාගේ ආයතන විසින් අරගෙන තිබෙන්නා වූ ණය රාජ්‍ය ණයට එකතු වෙලා නැහැ. ඒ නිසා ඒවා රජයේ ණයට එකතු කරන එක හොඳයි කියලා. ඒක අවංකව කරන වැඩක් නම් හොඳයි. හැබැයි, මේ වැඩ පිළිවෙළ පිටුපස ඉන්න සමහර අය දිහා බැලුවාම මට හිතෙන්නේ, ඒ ණය ටික ඒ ආයතනවලින් ගලවලා ආණ්ඩුවට අරගෙන, ණය නැති ඒ ආයතන ටික කුණුකොල්ලෙට යාළුවන්ට විකුණන්න හදනවා ද දන්නෙත් නැහැ කියලායි. මොකද, ඒ ආයතනවල ණය තිබෙන කොට, ඒ ණය ආණ්ඩුවට එකතු වෙන්නේ නැහැ. ඒ නිසා ආණ්ඩුවට තිබෙන ණයක් හැටියට ශේෂ පත්‍රයට දාන එක හොඳයි. හැබැයි, ඒ පිටුපස තිබෙන්නේ ආණ්ඩුව ඒ ණය බරට කර ගහලා, ණය නැති ඒ ආයතන ගෙඩි පිටින් තමන්ගේ යාළුවන්ට, තමන්ගේ හෙංචයියන්ට විකුණන්න හදන වැඩ පිළිවෙළද දන්නේත් නැහැ. ඒ සැකය මට මතු වන්නේ, මේ ආණ්ඩුවේ ඉන්න සියලුදෙනා දිහා බැලුවාම නොවෙයි. ඒ සැකය මට මතු වන්නේ, සමහර ගනු දෙනු කරපු අය ආණ්ඩුව තුළ තවමත් ඉන්න නිසා සහ ඒ ගනු දෙනු පිටුපස හිටපු අය පිට රට ගිහින් නැවත ලංකාවට එමින් සිටින නිසාත්. ඒ කාරණා දිහා බැලුවාම තමයි ඒ සැකය මතු වන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද අපට අවශ්‍ය වෙලා තිබෙන්නේ, මේ ඇති වෙලා තිබෙන ප්‍රශ්නයට විසඳුමක් සොයන්නයි. හැබැයි, ප්‍රායෝගික නැති ඉලක්කම් පෙන්වලා, ආර්ථික වර්ධන වේගය පිළිබඳව ප්‍රායෝගික නැති පුරෝකථන කරලා මේ වැඩේ කරන්න බැහැ. මේ ඇති වෙලා තිබෙන

ප්‍රශ්නයට ප්‍රායෝගිකව විසඳුමක් සෙවීම සඳහා වැඩ පිළිවෙළක් මේ අය වැය තුළ නැහැ කියන කාරණය කියන්න ඕනෑ. කෙනෙකුට තර්ක කරන්න පුළුවන්, "හරි, එහෙම නම්, මොකක්ද තමුසෙලාගේ විසඳුම?" කියලා. ඒ නිසා තමයි අපි දිගින් දිගටම කිව්වේ, මේ ප්‍රශ්නයෙන් ගොඩ ඒමට අපේ රටට තනියම වැඩ කරන්න බැහැ, ලෝකයේ වෙනත් රටවල් එක්ක ද්විපාර්ශ්වික ගිවිසුම් හරහා අපට උදවු ඕනෑ, multinational organizationsවල උදවු ඕනෑ කියලා. ඒ ගොල්ලෝ උදවු කරන්නේම අපේ රටේ ස්ථාවර ආණ්ඩුවක් තිබෙනවා නම් පමණයි. ඒ ස්ථාවර ආණ්ඩුව ඇතුළේ සියලු පක්ෂ නියෝජනය වන්නා වූ වැඩ පිළිවෙළක් එක්ක තමයි යා යුතු වන්නේ. එහෙම නැතුව, අටවාගත්ත ආණ්ඩුවක් එක්ක සියලු පක්ෂ නියෝජනය කරනවාය කියන කාරණය කියලා හරි යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපේ රටට මූලිකම චෝදනා කීපයක් තිබෙනවා. පළමුවැනි එක, ස්ථාවර ආණ්ඩුවක් නැතිකම. දෙවැන්න, වංචාව, දූෂණය හා හොරකම. මා දන්නවා, ආණ්ඩු පක්ෂය පැත්තේ වංචාවට, දූෂණයට, හොරකමට විරුද්ධ අය ඉන්නවා කියලා. මනුෂ නානායක්කාර, හරින් ප්‍රනාන්දු, රමේෂ් පතිරණ මහත්මයාලා මේ ආණ්ඩුවට කඩේ ගියාට, මම දන්නවා, එතුමන්ලා හොරකමට කඩේ යන්නේ නැහැ. හොරකමට කඩේ යන්නේ නැති තවත් මන්ත්‍රීවරු ගණනාවක් ඔය පැත්තේ ඉන්නවා. එතුමන්ලා ආණ්ඩුවට කඩේ යයි; හොරකමට කඩේ යන්නේ නැහැ. බයික් අරගෙන, ලයිට් ගහගෙන, මල් මාලා දමාගෙන හොරුන් වටේ එකතු වෙන්න පුළුවන් නම්, හොරකමට විරුද්ධව අපට එකතු වෙන්න බැරි ඇයි? පක්ෂ පාට භේදයකින් තොරව හොරකමට, වංචාවට, දූෂණයට එරෙහිව අපට එකතු වෙන්න බැරි ඇයි? මල් මාලා දමාගෙන, බයික් අරගෙන හොරු වටේ කට්ටිය එකතු වෙනවා නම් හොරකමට විරුද්ධ අපට එකතු වෙන්න බැරි ඇයි? එහෙම එකතු වුණොත් විතරයි, "ලංකාවේ ඉන්නේ හොරු, ලංකාවේ ඉන්නේ වංචනිකයෝ, ලංකාවේ ඉන්නේ කොමිස්කාරයෝ, පගාකාරයෝ, ලංකාවේ දේශපාලනඥයෝ හොරු, පාර්ලිමේන්තුව හොර ගුහාවක්" කියන ලේබලය ගලවන්න පුළුවන් වන්නේ.

ඒ නිසා විරුද්ධ පක්ෂයේ සියලුදෙනාගෙනුත්, හොරකමට විරුද්ධව නැඟී සිටින ආණ්ඩු පක්ෂයේ සියලුදෙනාගෙනුත් මා ඉල්ලා සිටිනවා, අය වැය කියලා ඉලක්කම් ටිකක් විතරක් පෙන්වන මේ වෙලාවේදීවත්, අතීතයෙන් පාඩම් ඉගෙනගෙන, හොරකමට, වංචාවට එරෙහිව නැඟිටිනවා කියලා අපි අධිෂ්ඨාන කරගනිමු කියලා. එහෙම නැතිව, විරුද්ධ පක්ෂයේ ඉන්න කොට ආණ්ඩු පක්ෂයට "හොරු" කියන එකත්, ආණ්ඩු පක්ෂයේ ඉන්න කොට විරුද්ධ පක්ෂයට "හොරු" කියන එකත් නවත්වලා, ආණ්ඩු පක්ෂයේ සහ විරුද්ධ පක්ෂයේ ඉන්න අපි ඔක්කොම හොරකමට විරුද්ධව නැඟිටිනවා කියන මතයේ සිටියොත්, මා හිතනවා, ඒකම ජයග්‍රහණයක් වෙයි කියලා. මා දන්නවා, හොරකමට විරුද්ධව නැඟිටින අය ආණ්ඩුවේ ඉන්න බව; හොරකමට විරුද්ධව නැඟිටින විශාල පිරිසක් විරුද්ධ පක්ෂයේත් සිටින බව. ඒ පිරිසවත් එකතු වෙන්න මේ අවස්ථාවේදී අධිෂ්ඨාන කරගනිමු.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ රටේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කළා ඇති. දැන් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඕනෑ; we need a new Constitution. I am very happy to talk about a new Constitution when you are in the Chair, Sir. We need a new Constitution so that it could address not only the problems of the Sinhalese, the Tamils and the Muslims, but also of the LGBTQ community. Today, we are in a world where the LGBTQ community is also getting all their rights. But, what are we doing in Sri Lanka? We are looking down upon that community. So, let us include the LGBTQ community also as a community which has lost its rights. When discussing about a new Constitution, let us see that all the religions and all the communities, including the LGBTQ community, get their rightful place in the society.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අවසාන වශයෙන් මා තවත් කාරණයක් කියන්න ඕනෑ. පිරිමි හැටියට අපේ ශරීරය පිළිබඳ සම්පූර්ණ අයිතිය අපට තිබෙනවා. හැබැයි, කාන්තාවන්ගේ ශරීරය පිළිබඳ අයිතිය ඒ ගොල්ලන්ට දෙන්නේ නැහැ. මම මේ කියන්නේ ගබ්සාව - abortion - ගැන. පිරිමි හැටියට අපේ ශරීරයේ අයිතිය ගැන අපි කියනවා. ඒ සම්බන්ධයෙන් අපට ඕනෑ දේ අපි කරනවා. හැබැයි, කාන්තාවට අපි කියනවා, "නැහැ, නැහැ. උඹට ඕනෑ විධියට උඹේ ශරීරය සම්බන්ධයෙන් වැඩ කරන්න ඉඩ දෙන්න බැහැ. සමහර අවස්ථාවලදී උඹේ ශරීරය පිළිබඳ අයිතිය අපිට ඕනෑ" කියලා. That is wrong. Just as a man has a right to his body, the woman must also have the same right to her body. එතකොට තමයි සියලුදෙනාට සාධාරණ වුණු ව්‍යවස්ථාවක් නිර්මාණය කරන්න ඉඩ ලැබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අපි අවුරුදු ගණනක් තිස්සේ අයිසින් දානවා වාගේ එක එක වචන දමමින් කරපු මේ බොරු වැඩේ නවත්වමු. මේ අය වැය වෙලාවේදීවත් හොරකමට, වංචාවට විරුද්ධව අපි ඔක්කොම පෙරමුණක් සේ නැඟිටිනවාය කියන අධිෂ්ඨානය ඇති කරගනිමු. සියලුදෙනාට සමාන අයිතිවාසිකම් දෙන නව ව්‍යවස්ථාවකට මඟ පාදාගන්නට අපි සියලුදෙනා අරමුණු කරගනිමු කියා යෝජනා කරමින්, මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
The next speaker is the Manusha Nanayakkara. You have 27 minutes.

[අ.භා. 3.17]

**ගරු මනුෂ නානායක්කාර මහතා (කම්කරු හා විදේශ රැකියා අමාත්‍යතුමා)**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார - தொழில் மற்றும் வெளிநாட்டு வேலைவாய்ப்பு அமைச்சர்)
(The Hon. Manusha Nanayakkara- Minister of Labour and Foreign Employment)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඩිලාන් පෙරේරා මැතිතුමා සියලු පක්ෂවලට එකතු වන්න කියලා කතා කළා. අදත් අපි ආරාධනා කරනවා, එන්න එකතු වෙමු කියලා. ඒ කාටවත් කඩේ යන්න නොවෙයි, රට වෙනුවෙන් කඩේ යන්න මේ වෙලාවේ අපි එකතු වෙමු. අපේ පක්ෂ, පාට, කණ්ණාඩි ගලවා දමලා, අපේ හිත් ඇතුළේ තිබෙන දේශපාලන මතවාද පැත්තකට දමලා, අප තුළ තිබෙන දේශපාලන ideologies පැත්තක තියලා රට ගොඩ නඟන්න එකතු වෙමු. අවුරුදු 74ක් තිස්සේ බැණ බැණ ඉන්න අපි ඉදිරියටත් -තව අවුරුදු 25කින් පස්සේත්- බැණ බැණ ඉන්න ඉඩ නොතැබිය යුතුයි. ඒ සඳහා අපි හැමෝම මේ වෙලාවේ එකතු වෙමු. ඩිලාන් පෙරේරා මැතිතුමා අවසානයේ කියපු කාරණා ටිකට අපි හදවතින්ම එකඟයි. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමන්ලා ඇතුළු මේ ගරු සභාවේ වාඩිවෙලා ඉන්න බොහෝ දෙනෙක් මේ අය වැය ලේඛනයත් එක්ක, මෙහි තිබෙන දර්ශනයත් එක්ක එකඟයි. හැබැයි, ඒකට එකතු වෙන්න බැරි පුංචි පුංචි කාරණා මතු කරනවා. අපි කියන්නේ, ඒ පුංචි පුංචි කාරණා පැත්තක තියලා පොදු අරමුණ, රටේ අරමුණ, අපේ ඊළඟ පරම්පරාවේ අරමුණ

[ගරු මනුෂ නානායක්කාර මහතා]

වෙනුවෙන් අපි හැමෝම එකට එකතු වෙන්න ඕනෑ කියලායි. අප ඒකරාශී වෙන්න ඕනෑ එතැනට බව මම මේ වෙලාවේ කියනවා.

2014 අවුරුද්දේ ආපු "Getúlio" කියන සිනමා පටයේ "People almost never request something for the country. They always ask for something for someone" කියන දෙබස අපි අහලා තිබෙනවා. පසුගිය දවස්වල මෙය අපි අත් දැකපු දෙබසක්. මිනිස්සු කවදාවත් රට වෙනුවෙන් දෙයක් ඉල්ලුවේ නැහැ. මිනිස්සු හැම වෙලාවේම යම් යම් දේවල් ඉල්ලුවේ, තවත් කෙනෙකු වෙනුවෙන්. දැන් මේ හන්දි ගානේ ඇවිදින, හන්දි ගානේ කෑ ගහන අය ඉල්ලීම් කරන්නේ රට වෙනුවෙන් ද? නැහැ. තවත් කාගේ හෝ උසි ගැන්වීමකට, තවත් රටක අවශ්‍යතාවකට, තවත් කාගේ හෝ දේශපාලන වුවමනාවකට තමයි පාරට බැහැලා කෑ ගහන්නේ. දැන් පාරට බැහැලා කෑ ගහන අය, ඒ වෙනුවෙන් මූලිකත්වය ගන්නා අය, අවුරුදු ගණනක් දේශපාලනයේ හිටියා. හැබැයි, එක දවසකවත් ඡන්දය ඉල්ලලාවත් නැහැ. ඒ වුණාට හැම දාම රට අවුල් කරන්න වැඩ කරනවා; රටට කරදර කරනවා. අපට තිබෙන කනගාටුව, දුක ඒ වාගේ කණ්ඩායම් එක්ක ප්‍රධාන විපක්ෂයත් අද අත්වැල් බැඳගන්න කටයුතු කිරීමයි.

නැති බැරි මිනිස්සු ඇති හැකි අය කරන්න 1977දී විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දුන්නා. මේ රටේ තිබුණු සංවෘත ආර්ථිකය වෙනුවට විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නාම, ඒ පිළිබඳව වාමාංශික පක්ෂ, මාක්ස්වාදී පක්ෂ ඇතුළු වෙනත් වෙනත් පක්ෂ විවේචන ඉදිරිපත් කළත්, ලාභය දිරි ගැන්වීමක් විධියට ජේ.ආර්. ජයවර්ධනය මහත්මයා 1977දී විවෘත ආර්ථික ක්‍රමය මේ පොළොවේ පැළ කළා. අද විවෘත ආර්ථිකයේ උදාහරණයක් විධියට ගන්නේ එංගලන්තය. එංගලන්තයවත් 1977 විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දීලා තිබුණේ නැහැ. 1979දී තමයි මාග්‍රට් තැචර් එංගලන්තයේ අගමැති ධුරයට පත් වෙලා ඒ රටට විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දුන්නේ. ඒ වනකොට චීනයවත් විවෘත ආර්ථික ක්‍රමයට ගිහින් තිබුණේ නැහැ. අපේ රටට විවෘත ආර්ථික ක්‍රමය හඳුන්වා දෙනකොට ඉන්දියාවේ නරසිංහ රාඕ, බ්‍රිතාන්‍යයේ මාග්‍රට් තැචර් පවා විවෘත ආර්ථිකයට යොමු වෙලා තිබුණේ නැහැ. අඩුම තරමින් ජර්මනියේ බර්ලින් තාප්පයවත් බිඳ වැටිලා තිබුණේ නැහැ. සෝවියට් දේශය බිඳ වැටිලා තිබුණේ නැහැ. සෝවියට් දේශය ගැන අපි දන්නවා.

ජේ.ආර්. ජයවර්ධන අනාගතවාදී නායකයකු විධියට තමයි එදා විවෘත ආර්ථිකය මේ රටට හඳුන්වා දුන්නේ. හැබැයි, 1977ට කලින් තිබුණ සංවෘත ආර්ථික ක්‍රමය නිසා වැහිලා තිබුණ ජන ජීවිතය නිරාවරණය කරන්න විවෘත ආර්ථික ක්‍රමයට පුළුවන් වුණා. ඒ හේතුවෙන් මිනිසුන්ට ව්‍යාපාර කරන්න, වාහනයක් ගන්න, දියුණු වෙන්න පුළුවන්කම ලැබුණා; අද මේ තිබෙන තාක්ෂණය මේ මට්ටමට එන තැනට පත් කරන්න පුළුවන් වුණා. හැබැයි, අප හැමෝම පිළිගන්නවා වාගේම, විවෘත ආර්ථික ක්‍රමය ගැන විවේචනත් තිබෙනවා. අද රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා සඳහන් කළා, විවෘත ආර්ථික ක්‍රමයේ අඩු පාඩු තිබෙනවා, මෙකේ වෙනස්කම් සිදු කළ යුතු තැන් තිබෙනවා කියලා. ඒ නිසා තමයි විවෘත ආර්ථික ක්‍රමය වෙනුවට සමාජ ආරක්ෂණ විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් නිර්මාණය කරන්න මේ අය වැය මූල බීජ පැළ කිරීම ආරම්භ කළේ.

මේ පාර්ලිමේන්තුව ඇතුළේ සහ එළියේ කරන කථා බැලුවාම, මේ අය වැය පිළිබඳව බිල්ලෙක් මවනවා කියලා අපට පෙනෙනවා. අපි නැවත මතක් කරනවා, මිනිස්සු කෑගහන්නේ තමන් වෙනුවෙන්, රට වෙනුවෙන් ඕනෑ දේ ගැන නොවෙයි කියන එක. තවත් කෙනෙකුට ඕනෑ දේ වෙනුවෙන් තමයි මිනිස්සු කෑගහන්නේ. මිනිස්සු දන්නේ නැහැ, මේ අය වැය කොතැනටද කේන්ද්‍රගත වෙලා තිබෙන්නේ, කොතැනටද දිශාගත වෙලා තිබෙන්නේ කියන කාරණාව. මේක රට විනාශ කරන යෝජනාවක්, රට විකුණන්න යෝජනා කරනවා කියලා තමයි මුල ඉඳලා කථා කරන්නේ. නමුත් මේ අය වැය ඇතුළේ තිබෙන හරය, ඒකේ තිබෙන අනාගතවාදී බව පෙන්නුම් කරන්නේ නැහැ. හැබැයි, අපි මේ වෙලාවේ මතක් කරලා දෙනවා, ගරු ජනාධිපතිතුමා භාර ගත්තේ කවුරුත් භාර ගැනීම කර ඇරපු රටක් කියන එක.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Order, please! Will an Hon. Member propose the Hon. Weerasumana Weerasinghe to the Chair?

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (වැවිලි කර්මාන්ත අමාත්‍ය සහ කර්මාන්ත අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - பெருந்தோட்டக் கைத்தொழில் அமைச்சரும் கைத்தொழில் அமைச்சரும்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Plantation Industries and Minister of Industries)
Sir,I propose that the Hon.Weerasumana Weerasinghe do now take the Chair.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES *left the Chair, and* THE HON. WEERASUMANA WEERASINGHE *took the Chair.*

**ගරු මනුෂ නානායක්කාර මහතා**
(மாண்புமிகு மனுஷ நாணாயக்கார)
(The Hon. Manusha Nanayakkara)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ දවස්වල හන්දි හන්දි ගානේ ගිහින් කෑගහන අය භාර ගන්න බැහැ කියපු රට තමයි අපි භාර ගත්තේ. සමහර අය භාර ගන්න ළඟට ගිහින් හැරිලා ආවා; සාකච්ඡා දෙකක්, තුනක් තියලා හැරිලා ආවා; මේකේ අමාරුව දැනගෙන භාර ගන්න බැහැ කියලා හැරිලා ආවා. දැන් කෑගහන අය භාර ගන්න බැහැ කියපු රට තමයි අපි මේ භාර ගත්තේ.

සමහර අය දැන් විපක්ෂයට ගිහිල්ලා එක පාරට ඉපදුණා වාගේ කෑගහනවා. තෙල් පිරිපහදුව වහපු ඇමතිතුමා දැන් තෙල් පිළිබඳ ප්‍රශ්න ගැන කථා කරලා කෑගහනවා. තෙල් පිළිබඳ ප්‍රශ්නයක් ඇති කරපු ඇමතිතුමා ඒ ආණ්ඩුවේ ඉඳගෙන අවුරුදු ගණනක් එකට වැඩ කරනකොට, මේ කියන විනාශය සිද්ධ වුණා නම්, ඒ විනාශය ඇස් දෙකෙන් බල බලා කැබිනට් එකේ වාඩි වෙලා ඉඳලා දැන් විපක්ෂයට ගිහිල්ලා කෑගහනවා. දශක දෙකක් විතර ඒ අය එක්ක එකට ඉඳලා, දැන් එළියට බැහැලා කෑගහනවා, "මේ කරන වැඩේ වැරදියි, කරපු වැඩේ වැරදියි" කියලා.

සමහර වෙලාවට චරිත හේරත් මන්ත්‍රීතුමන්ලාත් COPE එකට ඇවිත් අලුත ඉපදුණා වාගේ කථා කරනවා. අපි අහනවා, මොකක්ද මේ වෙලා තිබෙන්නේ කියලා. මේ අර්බුදයට වග

කියන්න ඕනෑ මිනිස්සු එළියට බැහැලා, අපි අලුතින් අර්බුදයක් නිර්මාණය කළා වාගේ කථා කරනවා. ඒ අය මේ වගකීම් භාර ගන්න බැරිව කර ඇරිය වෙලාවක තමයි ජනාධිපතිතුමා මේ වගකීම භාර ගත්තේ. ඒ වාගේම මාත්, හරින් ප්‍රනාන්දු ඇමතිතුමාත්, මේ ඉන්න ඇමති මණ්ඩලයත් මේ වගකීම භාර ගත්තේ මේ රට වැටිච්ච තැන ඉඳලා නිවැරදි තැනට ගෙන එන්නයි. ඒ අභියෝගය අපි භාර ගත්තා. රට තිබුණු තැන ඉඳලා යම් තැනකට ගොඩ නඟන්න අපට හැකි වුණා. අද වෙනකොට මිනිස්සුන්ට කාලා, බීලා, ඇඳලා, යන්තම් හරි තෙල් ටික ගහගෙන, යන්තම් ජීවත් වෙන්න පුළුවන් තැනට මේ රට ඇවිත් තිබෙනවා. රට තිබුණු අගාධයෙන් යම් තැනකට ගොඩ ගෙන, රටේ නීතිය ස්ථාපිත කරන්න පුළුවන්කම ලැබුණා. හැමෝම පුද්ගලික දේශපාලනය කරද්දී, ආණ්ඩුවක් විධියට ආණ්ඩු පක්ෂයේ සිටි හැමෝම දහසකුත් එකක් අඩු පාඩු මැද වුණත් කොන්දේසි විරහිතව රට ගැන හිතලා මේ අභියෝගවලට මුහුණ දුන්නා.

පුද්ගලික දේශපාලනය පැත්තකින් තියලා ආපු නිසා තමයි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ණය ලැබෙන්නත් කලින් විදේශ රටවල සහාය අරගෙන මේ රට මේ තත්ත්වයෙන් ගොඩ ගන්න පුළුවන් තැනට අපි කටයුතු කළේ. අපට IMF එකේ ණය තවම ලැබුණේ නැහැ. හැබැයි, අපි නොයෙක් නොයෙක් සහයෝග අරගෙන මේ රටේ පෝලිම් නැති කළේ IMF එකෙන් සල්ලි අරගෙන නොවෙයි. ගෑස් පෝලිම් ටික නැති කළා. ඉස්පිරිතාලවලට බෙහෙත් ටික දෙන්න පුළුවන් වුණා. හැබැයි, මේවාට IMF එකෙන් සල්ලි ලැබුණේ නැහැ. විදුලි කප්පාදුව අඩු කළා. මේ සියල්ල කරන්න පුළුවන් වුණේ කැපවීම සහ නිවැරදි නායකත්වය තුළ පුද්ගලික අභිප්‍රායවලට, පුද්ගලික ඉලක්කවලට යන්නේ නැතිව කණ්ඩායමක් විධියට රටේ න්‍යාය පත්‍රයට අනුව රට වෙනුවෙන් මේ ටික කාලය වැඩ කරපු නිසා කියන කාරණාව මම මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, 1977දී අපි ආර්ථිකය විවෘත කළාට පස්සේ, මාග්‍රට් තැචර් 1979දී එංගලන්තයට විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නා. එදා එංගලන්තයේ තිබුණේ අද අපේ රටේ තිබෙනවා වාගේම තත්ත්වයක්. ඒ වනවිට එංගලන්තයේ වාර්ෂික උද්ධමනය සියයට 18ක්. ඉතිහාසයේ කවදාවත් නොවුණු විධියට පවුම අවප්‍රමාණ වුණා. කම්කරුවන්, වෛද්‍යවරුන්, දුම්රිය සේවකයන් රට පුරාම වැඩ වර්ජනය කරමින් සිටියා. රාජ්‍ය ව්‍යාපාර සියල්ලම වාගේ පාඩු ලබන තැනකට ඇද වැටිලා තිබුණා. රාජ්‍ය අංශය අකාර්යක්ෂමයි. හරියට අපේ වගේමයි. ඒ වනවිට හිටපු දේශපාලනඥයන් මේ තත්ත්වය වෙනස් කරන්න ඕනෑ කියලා තේරුම් අරගෙන තිබුණත්, ඔවුන් ඒවා වෙනස් කරන්න බය වුණා. ඒවා වෙනස් කළොත්, තමන්ගේ දේශපාලන අනාගතය විනාශ වෙයි කියන බය තිබුණා. හැබැයි, මාග්‍රට් තැචර් ආපු ගමන් පාඩු ලබමින් තිබුණු රාජ්‍ය ආයතන වහලා දැම්මා. 1979 සිට 1985 වනවිට එතුමියගේ ධුර කාලයේ පළමු අවුරුදු හය ඇතුළේ පාඩු ලබමින් තිබුණු පතල් වහලා දැම්මා. තවත් නොයෙක් වෙනස්කම් කළා. ඒ විතරක් නොවෙයි, ආයතන පෞද්ගලීකරණය කරන්න පටන් ගත්තා. British Aerospace, British Airways පෞද්ගලීකරණය කළා.

මේ රටේ නම්, ගුවන් යානයකටවත් නැඟලා නැති මිනිස්සු ඒවාට බදු ගෙවමින් සිටිද්දී අපි තවම ඒ ආයතන පවත්වාගෙන යනවා. හැබැයි බ්‍රිතාන්‍යය එදා ඒ තීන්දුව අරගෙන, එතැනින් එහාට රෝල්ස් රොයිස්, බ්‍රිටිෂ් ටෙලිකොම්, බ්‍රිටොයිල් කියන රාජ්‍ය ව්‍යාපාර සහ විදුලි ජල සැපයුම් සියල්ල පෞද්ගලීකරණය කළා. ඉන් පස්සේ ඒවා සමාගම් විධියට ලාභ ලබන්න පටන් ගත්තා. ඉන්ධන ක්ෂේත්‍රයේ ලෝකයේ තරගකාරී සැපයුම්කාරයෙක් බවට පත් වෙන්න ඔවුන්ට පුළුවන්කම ලැබුණා. ඒ විතරක් නොවෙයි, ඔවුන් බදු පොලී අනුපාත ඉහළ දැමුවා. 1981 වන විට ආර්ථික විශේෂඥයන් සහ ආර්ථික ප්‍රවීණයන් 364දෙනෙක් එක්ව තැචර් නෝනාට ලිපියක් ලියමින් කියනවා, "මේක මහා විනාශයක්, වහාම නවත්වන්න" කියලා. හැබැයි ඒ කිසිවක් ගණන් ගන්නේ නැතුව රට ඉතා වේගයෙන් ඉස්සරහට ගිහිල්ලා "රජය, රජය, රජය, ජාතික සම්පත්" කියමින් විනාශ කරමින් තිබුණු විශාල මුදල් ප්‍රමාණයක් ඉතුරු කරගන්න බ්‍රිතාන්‍යයට පුළුවන්කම ලැබුණා. එදා පතල් වැහුවාම කම්කරුවන්ගේ රැකියා අහිමි වුණා. විරැකියාව ඉහළ ගියා. ලක්ෂ 30කට රැකියා අහිමි වුණා. සමස්ත රාජ්‍ය දේපළවලින් තුනෙන් එකක් පෞද්ගලික අංශයට ලබා දුන්නා. ලාභ නොලබපු පෞද්ගලීකරණය නොකළ සියලු රාජ්‍ය ව්‍යාපාර සඳහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපාදන ලබා දෙන එක නතර කළා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එවැනි ආකාරයේ දුර්වලතා තමයි අපි හඳුනාගත්තේ. අපි දන්නවා, ආර්ථිකයේ බොහොම ප්‍රශ්න සහගත තත්ත්වයක් තිබෙන බව. අපි අද වෙනතුරු රාජ්‍ය සේවකයන්ගේ රැකී-රක්ෂා අහිමි කරලා නැහැ. තැචර් කළා වාගේ වෘත්තීය සමිති මර්දනය කරලා නැහැ. හැබැයි සමාජ ආරක්ෂණ විවෘත ආර්ථික ප්‍රතිපත්තියක් හරහා ඒ වැඩ පිළිවෙළ ඉතා නිවැරදි මාර්ගයක් ඔස්සේ ක්‍රියාත්මක කිරීම තමයි මේ අය වැය හරහා අපි බලාපොරොත්තු වන්නේ කියන එක මතක් කරන්න කැමැතියි. අද මේ ජනතාව වෙනුවෙන් කිඹුල් කඳුළු හෙළන, පාරේ කෑ ගහන සමහර උදවිය දැන් රට රටවල යන්න පටන් අරගෙන. ඔවුන් රට රටවල යන්නේ මොකටද? අපේ විදේශගත ශ්‍රමිකයෝ මේ දවස්වල රටට සල්ලි ටිකක් එවනවා. තමන්ගේ අම්මාට බෙහෙත් ටික ගන්න, වාහනයට තෙල් ටික ගහගන්න සල්ලි ටිකක් එවනවා. රටේ තෙල් පෝලිම් ටික නැති කරන්න කටයුතු කරගෙන යන මේ වෙලාවේ, කට්ටියක් රට රටවල ගිහිල්ලා "එතෙරට, මෙතෙරට" කියමින් රැස්වීම් සංවිධානය කරමින්, ඒ රටවලින් එවන සල්ලි ටික නීත්‍යනුකූලව එවන්න එපා, උණ්ඩියල් ක්‍රමයට එවන්න කියමින් මේ රටට සල්ලි ටික එවන එකත් නතර කරන්න කටයුතු කරමින් ඉන්නවා. අපිට ලජ්ජයි. ආර්ථිකය පිළිබඳව, නොයෙක් දේ පිළිබඳව බිල්ලෝ මවමින් රටේ ආනගතය විනාශ කරන්න රට රටවලට කේලම් කියමින් යන මේ ඇතැම් කණ්ඩායම් පිළිබඳව අපි අපේ දැඩි විරෝධය මේ වෙලාවේ පළ කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ වාගේම 1977 අපේ රටට විවෘත ආර්ථිකය හඳුන්වා දෙනකොට ඒ සඳහා ආදර්ශය විධියට අපිට බලන්න තිබිච්ච එකම රට විලී රාජ්‍යය. හැබැයි ඒ රටේත් තිබුණේ හමුදා පාලනයක්. හැබැයි අපි විවෘත ආර්ථිකය හඳුන්වා දුන්නාට පස්සේ එංගලන්තයත්, චීනයත් හඳුන්වා දුන්නා. චීනයත් එදා ලංකාවට ඇවිල්ලා ලංකාවේ විවෘත ආර්ථිකය පිළිබඳව අධ්‍යයනය කරලා ගිය බව අපි මතක් කරන්න ඕනෑ. මීට අවස්ථා තුනකට ඉස්සෙල්ලා චීනයේ හිටපු ජනාධිපතිවරයා ඒ කාලයේ ලංකාවට ඇවිල්ලා විවෘත ආර්ථිකය පිළිබඳව අවබෝධ කරගෙන ගියා. හැබැයි අපට හරියට මේ විවෘත ආර්ථිකය ක්‍රියාත්මක කරන්න බැරි වෙච්ච නිසා චීනය අද අපට ණය දෙන තත්ත්වයට පත් වෙලා, අපේ රට චීනයේ මහා ලොකු ණයකාරයෙක් බවට පත් වෙලා තිබෙනවා.

එය ක්‍රියාත්මක කරන්න බැරිවීමට දේශපාලනික සාධක වාගේම අපේ රාජ්‍ය තන්ත්‍රයේ බරපතළ ප්‍රශ්නයකුත් බලපෑවා. අපේ රාජ්‍ය තන්ත්‍රයේ සිටින සේවකයෝ බහුතරයක් හොඳ මිනිස්සු. මේ බහුතරය හොඳද, නරකද කියන තර්කය සමහර වෙලාවට තිබෙනවා. බහුතරය කාර්යක්ෂමද, තීන්දු-තීරණ ගන්න කැමැතිද, අකමැතිද කියන ප්‍රශ්නය තිබෙනවා. වැටුප් ලැබෙනවා නම්, විශ්‍රාම වැටුප හම්බ වෙනවා නම්, වාහනය හම්බ වෙනවා නම්, අපේ ඉහළ නිලධාරින්ට දරුවෝ ටික ඉස්කෝලේ යවාගන්න වාහනය හම්බ වෙනවා නම්, ඉතා විශාල වැටුප් හම්බ වෙනවා නම් සමහර අයට ඒ වැඩේ කරනවාද නැද්ද කියන එක අදාළ නැහැ. මිනිස්සු පෝලිම්වල ඉන්නවාද, මිනින්සු දුක් විඳිනවාද කියන ඒවා

[ගරු මනූෂ නානායක්කාර මහතා]

ගැනත් ප්‍රශ්නයක් නැහැ. ඒ ප්‍රශ්නය තිබෙන්නේ මේ දේශපාලනඥයන්ට.රාජ්‍ය සේවකයෝ ඒ පිළිබඳව සමහර වෙලාවට උඩ බලාගෙන ඉන්නවා. අපි මේ පිළිබඳව චෝදනා මුඛයෙන් කථා කරනවා. අපි දේශපාලනඥයන්ට විතරක් කොච්චර ඇඟිල්ල දිගු කළත්, රාජ්‍ය සේවකයාගේ තිබෙන අකාර්යක්ෂමතාව, තීන්දු-තීරණ නොගැනීම, තීන්දු තීරණ ගන්න කල් මැරීම -මේ සියල්ල- මේ තත්ත්වයට බලපා තිබෙනවා කියන එක මම මේ වෙලාවේ මතක් කරනවා.

ඒ වාගේම, මේ කාරණයත් අපි මතක් කරන්න ඕනෑ. "Zootopia" කියලා කාටූන් චිත්‍රපටයක් තිබුණා. ඒකේ ඉන්නවා Slothsලා. Slothsලා කියන්නේ ලෝකයේ ඉතා හෙමින් ගමන් කරන සත්තු ජාතියක්. අපේ සමහර රාජ්‍ය ආයතනවලට ගියාම අපේ සමහර රාජ්‍ය සේවකයෝත් Slothsලා වාගේද වැඩ කරන්නේ කියලා හිතෙනවා. අපේ සමහර රාජ්‍ය ආයතනවලට වැඩක් කරගන්න ගියාම, ඒ වැඩේ කරගන්න කී වතාවක් පස්සෙන් ගිහිල්ලා කථා කරන්න ඕනෑද, කී වතාවක් මතක් කරන්න ඕනෑද? ජනතාව වෙනුවෙන් යම් කර්තව්‍යක් කරගන්න සමහර අමාත්‍යාංශවලට ගියාම, ඇමතිවරයකු විධියට එක කර්තව්‍යයක් කර ගන්න පහළොස් වතාවක්, විසි වතාවක් විතර ඒ අමාත්‍යාංශවල ලේකම්වරුන්ට කථා කරන්න ඕනෑ. ඒක තමයි අද රටේ තිබෙන තත්ත්වය. දැන් අරගළය කොතැනටද යන්න ඕනෑ? මේ රාජ්‍ය සේවකයන් දිහා බලන්නේ නැද්ද?

සමහර දේශපාලන නායකයන් ඒ පිළිබඳව කථා කරන්න බයයි. ඇයි, ඡන්ද නිසා. රාජ්‍ය සේවකයන්ගේ ඡන්ද දාහත්ලක්ෂයක් තිබෙනවා. ඒ ඡන්ද ටික ගන්න ඕනෑ නිසා ඒ ගැන කථා කරන්න බයයි. ඒ විරෝධතාවල වැරැදි පිළිබඳව කථා කරන්න බයයි. රාජ්‍ය සේවකයන්ගේ ඵලදායීතාව පිළිබඳව කථා කරන්න බයයි. නමුත්, අපි ඒ දේවල් පිළිබඳව බය නැතුව කථා කරනවා. අපට දේශපාලන අරමුණක් නැහැ. අපට තිබෙන ඉලක්කය, රටේ ඉලක්කයයි. වැරැදි සියල්ල නතර කර දැන් තිබෙන තත්ත්වය වෙනස් කර ගන්න ඕනෑ නිසා අපි ඒ පිළිබඳව කථා කරනවා. ඒ වාගේම තමතමන්ගේ වැටුප් වෙනුවෙන් කථා කළාට, වෙනත් නොයෙක් දේ පිළිබඳව කථා කළාට, තමන්ගේ පැත්තෙන් වෙන්න ඕනෑ වැඩ ටික ගැන කල්පනා කරන්නේ නැහැ.

අපි දන්නවා, සමහර ආයතන එහෙමයි. අපේ රටේ මුදල් අමාත්‍යාංශය ගත්තත් එහෙමම තමයි. මුදල් අමාත්‍යාංශයේත් විශාල ඒකාධිකාරයක් තිබෙනවා. තුනෙන් එකක් වැඩියෙනුත් වැටුප් ලබනවා. හැබැයි, නීතියක් ක්‍රියාත්මක කර ගන්න ගියාම මොකක්ද තත්ත්වය? අද කථා කරන්නේ අය වැය ගැන; මුදල් අමාත්‍යාංශයේ විෂයය. නමුත්, වැඩක් කර ගන්න ගියාම අමාරුයි. අද වනකොට විදේශගත ශ්‍රමිකයන්ට වැඩියෙන් වරප්‍රසාද දෙන්න, ඒ හරහා වැඩි ඩොලර් ප්‍රමාණයක් ලංකාවට ගෙන්වා ගන්න යෝජනා කරලා තිබෙනවා. එය ක්‍රියාත්මක කරන්න ගියාම මොකක්ද වුණේ? යල් පැන ගිය පරණ නීතියක් තිබෙනවා, luxury tax කියලා. ඒ අනුව පුංචි වාහනයටත් දැන් luxury tax එකක් වදිනවා. ඒ නීතිය සංශෝධනය කරන්න ඕනෑය කියලා එතුමන්ලා පිළිගන්නවා. නමුත්, කරන්නේ නැහැ. ඒක කරන්න පරක්කු වෙන්න-පරක්කු වෙන්න ලංකාවට ගෙන්වා ගන්න තිබෙන ඩොලර් ප්‍රමාණය අඩු වෙනවා; ඩොලර් ගෙන්වා ගන්න කල් ගත වෙනවා. හැබැයි ඒ නීතිය වෙනස් කරන දවස කවදාද කියලා කියන්නත් බැහැ. විදේශගත ශ්‍රමිකයන්ට තීරු බදු සහන දීමට අදාළ යෝජනාව කැබිනට් මණ්ඩලයෙන් අනුමත කරලා මාස දෙකක් වෙනවා. නමුත් මුදල් අමාත්‍යාංශයටත්, මහ බැංකුවටත් ඒ සඳහා වන යාන්ත්‍රණය හදලා දෙන්න තවම බැරි වුණා. බැංකු ටික එකතු කරලා system එකක් හදලා දෙන්න තවම බැරි වුණා.

දේශපාලනඥයන් තීන්දු ගන්නවා. කැබිනට් මණ්ඩලය ඒ තීන්දු අනුමත කරනවා. හැබැයි, ක්‍රියාත්මක කරන්නේ කවුද? ඒ නිලධාරින්. කෝ, ඒවා තවම ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඉතින් කොහොමද අපි මිනිසුන්ට සහන දෙන්නේ? එතැන තමයි ප්‍රශ්නය තිබෙන්නේ. දේශපාලනඥයන්ටත් මැදිහත් වෙන්න පුළුවන් සීමාවක් තිබෙනවා. ඒවාට රාජ්‍ය සේවකයන්ගෙනුත් සහයෝගය ඕනෑ. මම මේ චෝදනාවක් නොවෙයි කරන්නේ. මේ රට ගොඩ නඟන්න මේ වෙලාවේ හැමෝගේම සහයෝගය, ශක්තිය ඕනෑ කරනවා. දේශපාලනඥයන් විවිධ ප්‍රතිපත්ති ගෙනාවා. "අපි වවමු - රට නගමු" කිව්වා, "Regaining Sri Lanka" කිව්වා. නොයෙක් අවස්ථාවල නොයෙක් ප්‍රතිපත්ති ගෙනාවා. හැබැයි, ඒ හැම අවස්ථාවකදීම ඒ ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්න බැරි වුණේ, ප්‍රායෝගිකව ඒවා ක්‍රියාත්මක කරගෙන යන්න අවශ්‍ය සහයෝගය පහළින් නොලැබුණු නිසායි.

ඒ වාගේම අපි මතක් කරන්න ඕනෑ, ඒ වැඩ කරගෙන යද්දී හැම තැනකදීම විගණනය ඉස්සරහට එන බව. විගණනයට නිලධාරින් එනවා. විදුලිය පිළිබඳව විගණනය කරන්න එන්නේ විදුලිය පිළිබඳව මෙලෝ හසරක දැනුමක් නැති නිලධාරින්. Buildings පිළිබඳව විගණනය කරන්න එන්නේ engineering පිළිබඳව මෙලෝ දැනුමක් නැති නිලධාරින්. විෂයට අදාළ දැනුම නැතුව විගණනය කරනවා. ඉතින් රාජ්‍ය නිලධාරින් තීන්දුවක් ගන්න බයයි. ඒ අයගේ පැත්තෙනුත් ප්‍රශ්නයක් තිබෙනවා. හැම පැත්තම හිර කරගෙනයි වැඩ යන්නේ. මොනවා හරි දෙයක් ප්‍රසම්පාදනය කරන්න ගියාම, procure කරන්න ගියාම, නීති රාශියක් තිබෙනවා. එතකොට වැඩ කරන්න ගතවන කාලය වැඩියි. විදේශ විනිමය එවන්න කියලා විදේශගත ශ්‍රමිකයන්ට දැන්වීමක් පළ කරන්න පසුගිය ජුනි මාසයේදීයි අපි කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගත්තේ. තව වෙනකල් ඒ advertisement එකක් පළ කර ගන්න බැරි වුණා. ඇයි? Procurement Guidelines නිසා. ඒවාත් එක්ක මිනිස්සු වැඩ කරන්න බයයි. එම නිසා මේ දේවල් ප්‍රායෝගිකව ක්‍රියාත්මක කරන්න බැහැ. කොහොමද, රටක වැඩක් ඉස්සරහට යන්නේ? හැම දාම ඒක ඒ විධියටම නම් වෙන්නේ, රටක් විධියට අපි කොහොමද ඉස්සරහට යන්නේ? ඒක තමයි ප්‍රශ්නය. ඒ නිසා මේ දේවල්වලදී වෙනස් වෙන්න ඕනෑ දේශපාලනඥයා විතරක් නොවෙයි. මේ system එක, රාජ්‍ය සේවකයාගේ ඉඳලා අපි හැමෝම වෙනස් වෙන්න ඕනෑ බව අපි මතක් කරනවා.

සමෘද්ධි ව්‍යාපාරය ගැනත් මම කියන්න ඕනෑ. "පුංචි මිනිස්සු ගැන බලන්නේ නැද්ද " කියලා අපෙන් අහනවා. ලංකාවේ පවුල් පනස්හතරලක්ෂයක් ඉන්නවා. ඒ ප්‍රමාණයෙන් දහසයලක්ෂයක් සමෘද්ධි සහනාධාරය ගන්නවා. පවුල් දහසයලක්ෂයක් අවුරුදු ගණනාවක් තිස්සේ සමෘද්ධි සහනාධාරය ගන්නවා. සමෘද්ධියේ ඵලදායීතාව මොකක්ද? ඵලදායීතාව තමයි සමෘද්ධියෙන් ඉවත් වීම. කොච්චර කාලයක් ඇතුළත, සමෘද්ධිලාභීන් කොපමණ සංඛ්‍යාවක් සවිබල ගන්වා තිබේද? නමුත් එහෙම එකක් නැහැ. දේශපාලන අවශ්‍යතාව නිසා හරි, වෙන මොකක් හරි නිසා හැම දාම සමෘද්ධි සහනාධාරය ලබනවා. හබරාදුව ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේදී මම මේ පිළිබඳව ඒ නිලධාරින්ගෙන් ඇහුවාම, අපේ ඵලදායීතා නිලධාරිතුමිය පැහැදිලි කළා, ඒ මිනිස්සු සමෘද්ධියෙන් අයින් වෙන්නේ නැත්තේ ඇයි කියලා.

සමෘද්ධිය ලබන කෙනා විදුලිය ගන්න ගියාම අඩු ගණනට හම්බ වෙනවා; වතුර ගන්න ගියාම අඩු ගණනට හම්බ වෙනවා; අරකට මේකට කියලා සහන රාශියක් හම්බ වෙනවා. වාහන තිබෙන කෙනා, ඉඩම් තිබෙන කෙනා, රස්සාවක් තිබෙන කෙනා - හැම කෙනාම- සමෘද්ධිය කියන්නේ ආඩම්බරයක්, ආභරණයක් කියලා හිතාගෙන සමෘද්ධියෙන් අයින් වෙන්න කැමැති නැහැ. සමෘද්ධියෙන් අයින් කළොත්, අයින් කරපු දවසට මන්ත්‍රීවරයා

ළඟට යනවා, ප්‍රාදේශීය ලේකම්වරයා ළඟට යනවා, හිතවත් කෙනෙක් ළඟට යනවා, සමෘද්ධිය කපන්න එපා කියලා කියනවා. එතකොට මේ ජනතාව සව්බල ගැන්වීමේ කටයුත්ත ඉවර කරන්නේ කවදාද? සමෘද්ධිය දෙන්න ඕනෑ අයට දෙන්න ඕනෑ. දිය යුතු සියලුදෙනාට, හිමි විය යුතු සියලුදෙනාට මීටත් වඩා වැඩියෙන් හරි දීලා, යම් කාල සීමාවක් දීලා, සමෘද්ධියෙන් ඉවත් වෙන්න පුළුවන් තැනට ඒ අය පත් කරන්න ඕනෑ කියලා මම යෝජනා කරනවා.

එහෙම නැතුව හැම දාම සමෘද්ධිය ලබා දෙන, හැම දාම සහයෝගය ලබා දෙන තත්ත්වය වහාම නතර කළ යුතුයි. කෙසේ නමුත්, දුප්පත් මිනිස්සු සියලුදෙනා ආරක්ෂා කර ගැනීමේ වැඩ පිළිවෙළක් අපි ක්‍රියාත්මක කළ යුතුයි. බොහොමයක් ප්‍රශ්න අතරේත් සියලුදෙනාගේ රැකියා මේ වෙනකොට අපි සුරක්ෂිත කර තිබෙනවා. රැකියාව ආරක්ෂා කර ගැනීම වෙනුවෙන් අපි අනාගතවාදී වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කර තිබෙනවා. කම්කරුවන් ඇතුළු පෞද්ගලික අංශයේ සියලුදෙනාගේ රැකියා ආරක්ෂා කරන වැඩ පිළිවෙළක් මේ අය වැය හරහා අපි යෝජනා කරලා තිබෙනවා.

ඔබතුමන්ලාගෙන් මම ප්‍රශ්නයක් අහන්න කැමැතියි. විශ්වවිද්‍යාල පද්ධතිය තුළ ආර්ථික උපාධිධාරීන් කොච්චර ඉන්නවාද? ආර්ථික විද්‍යාව හදාරපු අය කොච්චර ඉන්නවාද? විද්‍යාඥයන්, විශේෂඥ වෛද්‍යවරු කොච්චර බිහි වෙලා තිබෙනවාද? ජනාධිපතිතුමා අවස්ථා කිහිපයකදීම කිව්වා, මේ රට වැටී තිබෙන ආගාධයෙන් ගොඩ ගන්න ඔබතුමන්ලාගේ වැඩ පිළිවෙළ ඉදිරිපත් කරන්න කියලා. කෝ, ඉදිරිපත් කළාද? එහෙම කරන්නේ නැහැ. බදු මුදලින් ඉගෙන ගෙන, ලලිත් ඇතුලත්මුදලි මහත්තයා හඳුන්වා දීපු මහපොළත් අරගෙන, ඒ සේරම කරගෙන අද පිට රටට ගිහිල්ලා Facebook එකෙන් රට හදන්න උපදෙස් දෙනවා. හැබැයි, අපි කියන්නේ මෙකයි. රට හදන්න දෙන්න තිබෙන උපදෙස දෙන්න. මේ රට ගොඩ නහන්න අවශ්‍ය සහයෝගය මේ වෙලාවේ දෙන්න. රටේ බදු සල්ලිවලින් ඉගෙන ගෙන පිට රටට ගිය ඔබතුමන්ලා සියලුදෙනා -ලෝකයේ එහා කෙළවරේ ඉන්න අයත්- ලංකාවට මේ වෙලාවේ උදව් කරන්න. ඔබතුමන්ලා ඉගෙන ගත්තු විශ්වවිද්‍යාල ටික ශක්තිමත් කරන්න; අපේ ඊළඟ පරම්පරාව හදන්න.

ඉන්දියාවත් මේ වාගේම වැටිච්ච වෙලාවේ Overseas Indians ඇතුළු සියලු ඉන්දියානු ජාතිකයෝ එකතු වෙලා ඉන්දියාව ගොඩ නහන්න උදව් කළා. ඒ වෙලාවේ ඒ රටට ඩොලර් එවන්න එපා කිය කියා තැන් තැන්වල යන්න "එතෙර මෙතෙර" වාගේ සංවිධාන තිබුණේ නැහැ. හැබැයි, ඉන්දියානුවෝ විධියට ඔවුන් එකතු වුණා. අද අපි ශ්‍රී ලාංකිකයන්ටත් කියන්නේ, සියලු ශ්‍රී ලාංකිකයෝ එකතු වෙලා ලංකාව ගොඩ නහන්න ඕනෑ කියලායි. විදේශගතව ඉන්න අය, දේශීය වශයෙන් ඉන්න අය ඇතුළු අපි සියලුදෙනා මේ වෙලාවේ රට ගොඩ නහන්න එකතු වෙන්න ඕනෑ. එහෙම නැතිව කුඩුකේඩුකම් කරමින්, කුහකකම් කරමින්, අරයාගේ වැරැද්ද, මෙයාගේ වැරැද්ද තැන් තැන්වල කිය කියා, වගකීම් භාර ගන්න බැරිව, කොන්ද පණ නැති, ආසයි-බයයි ප්‍රතිපත්ති ක්‍රියාත්මක නොකර ඉන්න කියලා අපි හැම කෙනාගෙන්ම ඉල්ලනවා.

මේ දවස්වල හැමෝම කියනවා, රාජ්‍ය ආයතන ප්‍රතිව්‍යුහගත කරනවා, එහෙම කරන එක අපරාදයක් කියලා. හැබැයි, ජාතික සම්පත් නම්, රටට සම්පත් වෙන්න ඕනෑ. රුපියල් කෝටි ගණන් රටේ මුදල් වියදම් කර කර ඒ ආයතන ආරක්ෂා කරන්න පුළුවන්කමක් නැහැ. රටේ මිනිස්සු රැක බලාගන්න නම්, විශේෂයෙන් පුංචි මිනිස්සු බලාගන්න නම්, ඒ පුංචි මිනිස්සු බලාගන්න තිබෙන සල්ලි planeවලට ගෙවන්න වියදම් කරනවා නම්, පුංචි මිනිස්සු බලා ගන්න තිබෙන සල්ලි තවත් පිරිසකගේ වැටුප් සහ overtimeවලට ගෙවන්න වියදම් කරනවා නම්, ඒක වැරැදියි. ඒක වහාම නතර කරලා ඒවා අලුත් ව්‍යාපාර විධියට ඉදිරියට අරගෙන යන්න ඕනෑ. ඒ වාගේම ආයෝජන, අපනයන දිරි ගන්වන්න තමයි අපි මේ අය වැය ඉදිරිපත් කළේ. මේ අය වැය ඉදිරිපත් කරද්දි සමහරු කියනවා, පඩි වැඩි වුණේ නැහැ කියලා. තවත් නොයෙක් නොයෙක් ප්‍රශ්න කියනවා. අපටත් වෙන අය වාගේම සල්ලි අච්චු ගහලා පඩි වැඩි කරන්න පුළුවන්. නමුත්, එහෙම කරන්න අපට වුවමනාවක් නැහැ. මේවා ජනප්‍රියවාදී තීන්දු නොවෙයි. මේවා ටිකක් අමාරු තීන්දු. හැබැයි, ඒ අමාරු තීන්දු ටික ගන්නේ හෙට දවසේ මේ රට යහපත් රටක් කරන්න ඕනෑ නිසායි. මේ අය වැය ජනප්‍රිය, හැමෝම හුරේ දාන, කිසිවෙක් හොඳ අය වැයක් කියන එකක් නොවෙයි.

හැබැයි, මේ අය වැය අනාගතය ගැන දකින අය වැයක්. සල්ලි අච්චු ගහන්නේ නැතිව, රුපියල් ලක්ෂයකට වඩා වැඩි ආදායමක් ලබන අයට අපි බද්දක් ගැහුවා; ව්‍යාපාරිකයන්ට බද්දක් ගැහුවා. හැබැයි, වැන්දඹුව, ආබාධිතයා, වකුගඩු රෝගියා, වැඩිහිටියා, දරුවා ආදී මේ සියලුදෙනා ආරක්ෂා කර ගන්න තමයි ඒ බදු ගැහුවේ. එහෙම නැතිව සල්ලි අච්චු ගහමින් මේ අය ආරක්ෂා කරලා රට විනාශ මුඛයට ගෙනියන්න නොවෙයි. මේ අය වැය හරහා රාජ්‍ය ආයතන පෞද්ගලීකරණය කරනවාය කියලා විපක්ෂය චෝදනා කරනවා නම්, අපි එතුමන්ලාට මතක් කරනවා විවෘත ආර්ථිකය උත්කර්ෂයට පත් වෙන්නේ 1993දී කියලා. ඒ කියන්නේ, ප්‍රේමදාස මහත්තයා ජනාධිපති වුණාට පස්සේ. ඒ වෙලාවේ තිබිච්ච අවශ්‍යතාව හැටියට එතුමා තමයි රාජ්‍ය ස්කාගාර සංස්ථාව හැරී ජයවර්ධනට විකිණුවේ. තුල්හිරිය වෙනුවට අද තිබෙන්නේ MAS Holdings ආයතනය. MAS Holdings ආයතනය අද වෙද්දි මේ රටේ තරුණ තරුණියන් කී දාහකට රැකියා දී තිබෙනවාද? විනිමය කොයි තරම් උපයා තිබෙනවාද? ලංකාවේ සන්නාමය කොයි තරම් දුරට ජාත්‍යන්තරයට ගෙනියලා තිබෙනවාද? ඒක නිසා බොහොම ගැඹුරෙන් මගේ පියාණෝ-පියාණෝ කිය කියා ඉන්නේ නැතිව, පියාණෝ කරපු කියපු දේවල් පිළිබඳවත් යම් අවබෝධයක් ලබා ගෙන, ඒ අනුව කටයුතු කරන්න කියන එකත් අපි මේ වෙලාවේ මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය සේවකයා ගැනවත්, අපේ කකුලෙන් අදින වෙනත් කවුරුවත් ගැන අපට පෞද්ගලික අමනාපයක් නැහැ. ඒ අයගේ අදහස් අත්තනෝමතිකව වාරණය කරන්නත් අපට කිසිම අවශ්‍යතාවක් නැහැ. මාග්‍රට් තැචර් එදා මේ ක්‍රමය දරුණු විධියට මර්දනය කළා. නමුත්, ප්‍රජාතන්ත්‍රවාදය විශ්වාස කරන අය විධියට අපි මේවා මර්දනය කරන්නේ නැහැ. අපි ප්‍රජාතන්ත්‍රවාදය විශ්වාස කරන අය. අපි එදා ඉඳලාම ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පෙනී හිටපු අය. අපට ගල් මුල් ගහව්, විවේචනය කරාව්, අද අපි රටට පිළිලයක් විධියට පෙන්නාව්.

අපි පක්ෂ දේශපාලනය, පෞද්ගලික දේශපාලනය පැත්තකින් තියලා කවුරුත් නොකියන තිත්ත ඇත්ත තමයි රටේ අනාගතය වෙනුවෙන් කථා කරන්නේ. ඒ වාගේම මේ වෙලාවේ අපි හැමෝගේම එකම අපේක්ෂාව වන්නේ වැටිලා තිබෙන රට නැඟී සිටුවන්නේ කොහොමද කියන එකයි. එහෙම නැතිව මට තිබෙන්නේ හෙට පාර්ලිමේන්තු එන්නේ කොහොමද කියන ඒ වුවමනාව නොවෙයි. "පාර්ලිමේන්තු එන්නේ කොහොමද, බලය ලබා ගන්නේ කොහොමද, මම ජනාධිපති වෙන්නේ කවදාද, මම අගමැති වෙන්නේ කවදාද?" කියන සිහින තියා ගත්තොත් මේ රට හදන්න බැහැ. තමන්ගේ පටු පරමාර්ථ, පටු ඉලක්ක පැත්තකට දාලා ඉස්සරහට ඇවිල්ලා, තැන් තැන්වල පවතින පොඩි පොඩි දේශපාලනය පැත්තකට දාලා පොදු විධියට හිතන්න ඕනෑ. අපි නිදහස ලබලා අවුරුදු 74ක් වෙනවා. හැම තිස්සේම ආපස්සට හැරිලා බලන, උසුළුවෙන් විසුළුවෙන් කථා කරන, අවුරුදු 74ක් තිස්සේ අපි අනාථයි, අපට කර ගන්න බැරි වුණා කියන එක නතර

[ගරු මනූෂ නානායක්කාර මහතා]

කරන්න. ඒක මන්තරයක් වාගේ කියන එක නතර කරලා, අද ඉඳලා තවත් අවුරුදු 25කින් පස්සේ අපි රට හරි තැනට ගෙනාවා කියලා රටේ පැත්තෙන් ඉඳගෙන, රටේ කණ්ණාඩියෙන් බලන්න මුල් ගල් තියන අය වැයක් මේක. ඒකට තමුන්නාන්සේලා සියලුදෙනාගේම සහයෝගය බලාපොරොත්තු වෙනවා, මේ රටේ දරුවන්ගේ ඉදිරි අනාගතය වෙනුවෙන්.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු බුද්ධික පතිරණ මැතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.42]

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවර අය වැය මුදල් ඇමතිවරයා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා පවත්වන දවස් 7ක විවාදයේ අන්තිම දවස වෙනකොට, මේ අය වැයේ තරමත්, ගිය අය වැයේ තරමත්, මේ අය වැයේදී විපක්ෂය ඉදිරිපත් කළ කරුණු සහ කථිකයන්ගේ කථා - සමහරු එහේ මෙහේ, කොහේ වාඩි වෙලා හිටියත්- ආණ්ඩුවේ සහ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට මම ආරාධනා කරනවා, ශ්‍රවණය කරන්න පුළුවන් අය ශ්‍රවණය කරන්න, කියවන්න පුළුවන් අය කියවන්න, කටින් කියවන එකට අමතරව හදාරන්න කියලා. එතකොට ඔබතුමන්ලාට පේනවා බොහෝදෙනෙකු කථා කරලා තිබෙන්නේ කටින්ද එහෙම නැත්නම් වෙනත් කටකින්ද කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රටක සාර්ව ආර්ථිකයේ, කුටුම්භ සහ ආයතනවල, ක්ෂුද්‍ර ආර්ථිකයේ ඊළඟ වර්ෂයට අදාළ වැඩ පිළිවෙළ, ඒ සඳහා මුදල් වෙන් කරන ආකාරය, ඒ වාගේම ශ්‍රී ලංකා ජනරජය වෙනුවෙන් පවතින ආණ්ඩුව රටේ සල්ලි කළමනාකරණය කරන්නේ කොහොමද කියන එක පිළිබඳ කැඩපත තමයි අය වැය ලේඛනය කියන්නේ. හැබැයි, මේ අය වැය ලේඛනයට කලින් කසකාරයෝ වාගේ බදු ප්‍රතිපත්තිය එළියට ආවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ පිළිබඳව හොඳ කියවීමක් මට ඊයේ කියවන්න ලැබුණා. මම ඉගෙන ගත්ත කැලණිය විශ්වවිද්‍යාලයේ ජන සන්නිවේදන අධ්‍යයන අංශයේ විශ්‍රාමික මහාචාර්ය ආරියරත්න ඇතුගල මහත්මයා, "ජනයි - ප්‍රියයි" නමින් තිබෙන YouTube නාලිකාවේ "රජ වැසියෝ" කියන විනාඩි 6යි තත්පර 35ක පොඩි video segment එක ගැන හොඳ කියවීමක් දාලා තිබුණා. එතුමා කියලා තිබුණා, මෑත වකවානුවේ මා දුටු බලසම්පන්නම ප්‍රහසනය, ඊයේ පෙර්දා "ජනයි-ප්‍රියයි" දෙන්නා එකතු වෙලා කළ "රජ වැසියෝ" කියලා. කොමිස් සහ බදු රටේ අහිංසක මිනිසුන්ගේ ඔළු මත පැටවෙන්නේ කොයි විධියටද කියන එකත්, ඒ වාගේම දේශපාලකයා, -ඉස්සර විධියට ගත්තාම රජා- සහ නිලධාරි කාටලය කොයි ආකාරයටද තමුන්ගේ සියලු අපේක්ෂා, පීඩකත්වයේ ආයුධ පාවිච්චි කරලා සාමාන්‍ය ජනයා මත හෙළන්නේ කියන කාරණයත් අපට හරි පැහැදිලිව ඒකෙන් දකින්න පුළුවන්. ඒ නිසා මම රටේ සියලුදෙනාට ආරාධනා කරනවා, නොදැකපු අයත්, නොබලපු අයත් චමල් රත්නායක සොයුරාත්, රංග ජයකොඩි සොයුරාත් ඉදිරිපත් කළ විනාඩි 6යි, තත්පර 35 "රජ වැසියෝ" video segment එක බලන්න කියලා.

පසු ගිය අය වැය ලේඛනත් එක්ක බලනකොට මේ අය වැය ලේඛනය ගැන මම සතුටු වෙනවා. මොකද, පසු ගිය අය වැය ලේඛනවල මුදල් ඇමතිවරයා ආණ්ඩුව පැත්තේ වාඩි වෙලා කථා කළේ විපක්ෂය පැත්තට. උපදෙස් දුන්නේ, අවවාද අනුශාසනා කළේ විපක්ෂයට. හැබැයි, රනිල් වික්‍රමසිංහ මුදල් ඇමතිතුමාගේ මේ අය වැය ලේඛනයේදී, -එතුමා අපේ පැත්ත බලාගෙන කථා කළත්- සියලු අවවාද, අනුශාසනා, පෙරහුරු, ආදර්ශ සියල්ල දීලා තිබුණේ කාටද? විශේෂයෙන් මම හැම කෙනෙකුට කියනවා එතුමාගේ අය වැයේ පළමුවෙනි පිටු 6 කියවන්න එපා, හදාරන්න කියලා. පළමුවෙනි පිටු 6 හදාරන්න, කියවන්න එපා.

මේ පළමුවන පිටු හය කියෙව්වොත් මේ කාරණය ඔළුවට ගන්න බැහැ. ඒ නිසා ඒ පිළිබඳව මනසින් -සිහි කල්පනාවෙන්- හදාරන්න. ඒ සියල්ලම කියන්නේ ගෝත්‍රිකවාදී අදහස් තිබෙන අයට පමණයි. ඒ වාගේම මා සතුටු වනවා, මනූෂ නානායක්කාර මැතිතුමා කළ කථාව ගැනත්. එතුමාගේ මුළු කථාවම වැදගත් වෙන්නේ විපක්ෂයේ අපට නොවෙයි. ඒකත් අඩු-වැඩි වශයෙන් අදාළ වෙන්නේ ගෝත්‍රිකවාදී අදහස් තිබෙන අයට පමණයි.

මුදල් ඇමති රනිල් වික්‍රමසිංහ මැතිතුමා කියපු විධියටම 1950 වනකොට ජපානයයි, අපියි ආසන්න වශයෙන් ඒක පුද්ගල ආදායමින් සමාන මට්ටමක හිටියා. ඉන් පසුව ජපානය අපට වඩා බොහෝ දුර ගියා. එහෙත් අපි 1965 විතර වනකොට කොරියාවට, සිංගප්පූරුවට වඩා ඉදිරියෙන් හිටියා. නමුත්, ඒ රටවල් අප අබිබවා ගියා. ඒත් බංග්ලාදේශය, ඉන්දියාව වාගේ දකුණු ආසියානු කලාපයේ අනික් රටවලට වඩා අපි ඉදිරියෙන් හිටියා. අද වනකොට ඒ සියලුදෙනාට පහළින් අපි ඉන්නවාය කියන මේ සන්දර්භය ඇතුළත් දේශන මාලා විපක්ෂයේ අපට නම් බොහෝ කාලයක් තිස්සේ රනිල් වික්‍රමසිංහ මුදල් ඇමතිතුමාගෙන් අහන්න ලැබිලා තිබෙනවා. අපට සතුටු වෙන්න පුළුවන්කම තිබෙන්නේ, අද අත්පුඩි ගහමින්, තලු මරමින් ආණ්ඩු පක්ෂයේ අයට -අපෙන් ගිය අයට ඒ කාරණය අදාළ නැහැ, අනික් අය- 'ඒහි පස්සිකෝ' කියමින් ඒ නීරස යථාර්ථය භක්ෂණය කරන්නට වීම නිසායි. එය ඉතිහාසයේ සරදමකට වඩා යථාර්ථය පිළිගැනීමක්.

මගේ මතකයේ විධියට ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා 1996 නොවැම්බර් මාසයේ 01වන දා තමයි ජීවිතයෙන් සමු ගත්තේ. එතුමාගේ උපන්දිනය සැප්තැම්බර් මාසයේ 17. මා කාලයක් ටීඑන්එල් රූපවාහිනී නාළිකාවේ වැඩසටහන් කළා. මා ජේ.ආර්. ජයවර්ධන මැතිතුමාගෙන් සම්මුඛ සාකච්ඡාවක් ඉල්ලුවා. ප්‍රේමරත්න මාපිටිගම හිටපු ලේකම්තුමා තමයි මට ඒ සඳහා අවස්ථාව සලසා දුන්නේ. අද ජීවතුන් අතර නැති වුණත් මා කෘතවේදීව ප්‍රේමරත්න මාපිටිගම මැතිතුමා සිහිපත් කරනවා. ඒ සම්මුඛ සාකච්ඡාවට ගියාම මට කිව්වා, cameraman සහ make-up artist නැතිව ඇතුළට එන්න කියලා. ඒ සම්මුඛ සාකච්ඡාවේදී ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා, මනූෂ නානායක්කාර මැතිතුමා කියපු ටිකම -චීනයේ වෙච්ච දේවල්- කියලා මෙහෙමත් කිව්වා. "මා විවෘත ආර්ථිකය හඳුන්වා දෙන කොට මට ගොඩක් අය දොස් කිව්වා; බැන්නා. හැබැයි, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය 1994දී විවෘත ආර්ථිකය පිළිගත්තා විතරක් නොවෙයි, ඒ සඳහා මානුෂීය මුහුණුවරකුත් දෙනවා කිව්වා. මම ගෙන ගිය ක්‍රමයට වඩා වෙනසක් වෙලා තිබෙන බව මේ තරුණයාට පෙනෙනවාද?" කියලා මගෙන් ඇහුවා. මට මතක විධියට 1996 අගෝස්තු මාසයේ දවසක එහෙම ඇහුවා. මම කිව්වා, "මට එහෙම වෙනසක් පෙනෙන්නේ නැහැ" කියලා. "එහෙනම් මගේ ක්‍රමයම නේද යන්නේ" කියලා මගෙන් එතුමා ඇහුවාම මා කිව්වා, "ඔව්, හිටපු ජනාධිපතිතුමනි" කියලා. එතකොට එතුමා කිව්වා, "මගේ ව්‍යවස්ථාව අනුව හිටපු ජනාධිපතිවරු කියලා ජාතියක් නැහැ. මම අදත් ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන" කියලා. එහෙම කියන ගමන් එතුමා කිව්වා, "එහෙනම් 1977 මම ඒක කරන කොට, 'ඒක

ගැළපෙන්නේ නැහැ' කියපු දේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියත්, චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනියත් අවුරුදු 17කට පස්සේ පිළිගත්තා. මේ තරුණයා හිතා ගන්න, මගේ මොළයට වඩා ඒ දෙන්නාගේම මොළය තිබෙන්නේ අවුරුදු 17ක් පස්සෙන්" කියලා. එතුමා තව බොහෝ දේවල් කිව්වා. ඒවා කියන්න මගේ සීමිත කාලය තුළ ඉඩ නැහැ.

මීට කලින් අය වැය ලේඛන දෙකකදීත් මා මේ කථාව කිව්වා. අපි අය වැය ලේඛන පිළිබඳව ප්‍රශංසාවෙන්වත් අප්‍රසාදයෙන්වත් මිනුම් දඬු ගන්න ඕනෑ, දැන් නොවෙයි, අවුරුද්දකට පසුවයි කියලා. ඒ නිසා තමයි මා පුන-පුනා ඉල්ලන්නේ අය වැය කථාවෙන් පසුව දීර්ඝ විවාදයක් පවත්වන්නේ නැතිව ඒ සඳහා වෙන් කරන කාලය අඩු කරලා, පුළුවන් නම් පූර්ව අය වැය විවාදයක් තියන්න කියලා. මා අවුරුදු තුනක් තිස්සේ අය වැය විවාදවලදී ඒ කාරණය මතු කරලා තිබෙනවා. ඒ වාගේම රුපියල් 10කින් Cut එක move කරන එකට -රුපියල් 10ක් කපන්න කියන එකට- විරුද්ධව මා අවුරුදු දෙකක් තිස්සේ කථා කරලා තිබෙනවා. මොකද, විපක්ෂය යෝජනා කරන්න ඕනෑ, රුපියල් 10කින් කපා හරින්න කියලා නොවෙයි, රුපියල් 10කින් වැඩි කරන්න කියලායි. මා හිතන විධියට මේක නොවෙයි, අද රටේ ජනතාවගේ -විශේෂයෙන් තාරුණ්‍යයේ- හද ගැස්ම. මේ කුණුහරුප නොවෙයි, රටේ තාරුණ්‍යය ඉල්ලන්නේ. අද ගෝල්ෆේස් භූමියේ අරගළය නැති වුණත් හදවත් තුළ අරගළය ඉල්ලන්නේ ඒක නොවෙයි. ඒ නිසා රටේ සාතිශය බහුතරයක් ඉල්ලන දේ මේ කිසිදු ලියවිල්ලක් තුළින් ගම්‍ය වෙන්නේ -පෙන්නුම් කරන්නේ- නැති බව මා මේ රටේ ජනතාවට කරන සාධාරණයක් වශයෙන් සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම, ඉතා පැහැදිලිව රටේ නව පරම්පරාවේ අභිලාෂ, අපේක්ෂා වෙනුවෙන්, ඒ අය වෙනුවෙන් දිගුකාලීන සහ මධ්‍යකාලීන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වසරේ කරන්න බලාපොරොත්තු වෙන කාර්යභාරය මේ අය වැය ලේඛනය තුළ පිළිබිඹු වන්නේ නැහැ කියන කාරණය මම සඳහන් කරන්න ඕනෑ.

ඒ වාගේම මහා පරිමාණ කර්මාන්තකරුවන්ගේ, මාත් කටයුතු කරපු ක්ෂේත්‍රයක් වන කර්මාන්ත අමාත්‍යාංශය යටතට ගැනෙන සුළු හා මධ්‍ය පරිමාණ කර්මාන්තකරුවන්ගේ, සාම්ප්‍රදායික කර්මාන්තකරුවන්ගේ, මේ රටේ එදා වේල හොයාගෙන ජීවත් වෙන දෛනික කම්කරුවන්ගේ -මේ සියලුදෙනාගේ- අභිලාෂ මේ අය වැය තුළින් ඉෂ්ට කර ගන්න පුළුවන්කමක් නැහැ කියන එක විශේෂයෙන් කියන්න ඕනෑ. රජයේ පඩි වැඩිවීම් පිළිබඳ කාරණා වෙනම සංවාදයකට අරගෙන අපි කථා කරමු. නමුත්, මම මේ සඳහන් කළ කිසිදු පිරිසකගේ අභිලාෂ මේ රජයේ බදු ප්‍රතිපත්තිය තුළින්වත්, මේ අය වැයේ කථා කරන සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය තුළින්වත් ඉෂ්ට කර ගන්න පුළුවන්කමක් නැහැ කියන කාරණය ඉතා කනගාටුවෙන් සඳහන් කරන්න ඕනෑ.

ඒ අතර, මෙතැන ලියැවිල්ලක් ඉදිරිපත් කරලා තිබෙනවා, මොකක්ද විපක්ෂයට තිබෙන විකල්පය කියලා අහලා. විවිධ දේශපාලන පක්ෂවල සංයුතියක් විධියට ක්‍රියාත්මක වන විපක්ෂයේ ඒ ඒ දේශපාලන ව්‍යාපාර විසින්, -සමගි ජන බලවේගය පමණක් නොවෙයි, විපක්ෂයේ අනෙකුත් දේශපාලන ව්‍යාපාර විසින්- විකල්පය විධියට ඔවුන්ගේ ප්‍රතිපත්ති සමුදාය ඉදිරිපත් කළාය කියන එක මම ඉතා පැහැදිලිව සඳහන් කරන්න ඕනෑ. මට සමගි ජන බලවේගයේ විකල්ප වැඩ පිළිවෙළ ගැන එක සහතිකයක් දෙන්න පුළුවන්. අපි මේ රටේ ආණ්ඩු බලය ගත්ත අවස්ථාවක ක්‍රියාත්මක කළ යුතු කෙටි කාලීන, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන වැඩ පිළිවෙළ පිළිබඳව අපි මේ වන විටත් සැහෙන්න දුරට සාක්ෂාත් කරමින්, කෙටුම්පත් කරමින් ඉන්නවා. ඉතිහාසයේ පළමු වරට, විපක්ෂ නායකතුමාගේ ඊයේ කථාව තුළත් පෙන්වා දුන්නු ආකාරයට, මත් වතුර සහ දුම්වැටි පිළිබඳව අපි වැදගත් ක්‍රියාමාර්ග ගන්න බලාපොරොත්තු වනවා. මට මතක් වෙනවා, ගිය පාර කැප්ස්ටන් කියන සිගරැට්ටුවක බදු අඩු කරපුවාම, මම විපක්ෂයේ අන්න අර පුටුවේ එදා ඉඳගෙන ඒ ගැන කථා කළාම, එදා ආණ්ඩුවේ ඉස්සරහා පේළියේ තුන්වැනි මේසයේ හිටපු මුදල් ඇමතිතුමා නැඟිටලා "හක්, හක්" ගාලා හිනාවෙලා වාඩි වුණු හැටි. ගිය අවුරුද්දේ හිටපු මුදල් ඇමතිතුමා තමයි එහෙම කළේ. මම එදා ඇහුවා, ඇයි සිගරැට්ටුවක මිල අඩු කළේ කියලා. දැන් අද බීඩියක මිල බද්දට යටත් කර තිබෙනවා. ගිය පාර බීඩියේ බද්ද අයින් කරන්න කියලා, සිගරැට්ටුවේ මිල අඩු කළා. හැම දාම එකම ඔළුගෙඩි ටිකක් ඉන්න ආණ්ඩු පක්ෂයක, -ඕනෑ නම් එක්කෙනෙක් දෙදෙනෙක් වෙනසක් වෙලා ඇති- ආණ්ඩු පක්ෂයේ හිටපු පිරිසක් විතැන්වෙලා විපක්ෂයට ඇවිල්ලා තිබෙන මොහොතක, ඉතා පැහැදිලිව අපිට පෙනෙන දේ තමයි, මේ අය ඒකමතිකත්වයෙන් තොරව ගමන් කරන බව.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිදහස ලබා අවුරුදු 74ක් ගත වෙලාත්, මේ රටට ඕනෑ විධායක ජනාධිපති ක්‍රමයක් ද, නැත්නම් අගමැති ක්‍රමයක් ද කියලා තවමත් සංවාද කරමින් ඉන්න ලෝකයේ එකම රට අපේ රට වෙන්න පුළුවන්. ඉන්දියාවේ පවතින ක්‍රමය වෙනස් කිරීමක් පිළිබඳව දැන් ඉන්දියාව සංවාද කරනවා ද? නැහැ. ඒක 1950 වෙනකොට තීන්දු කරලා ඉවරයි. මැතිවරණ ක්‍රමය පිළිබඳවත් තවම සංවාදයක් යනවා. නිදහස ලබාගෙන අවුරුදු 74ක් ගත වෙලා තිබියදී, මැතිවරණ ක්‍රමය පිළිබඳව තවමත් සංවාද කරන ලෝකයේ එකම රට අපි වෙන්න පුළුවන්. කොටින්ම කියනවා නම්, පාසලකට දරුවෙක් ඇතුළත් කිරීමේ ක්‍රමය පිළිබඳවත් තාමත් සාකච්ඡාවක් යන ලෝකයේ එකම රට අපේ රට. එහෙම නම් අපට වැරදිලා තිබෙන්නේ අපි වෙනස් වෙන ප්‍රතිපත්තියක ගමන් කිරීමයි.

දැන් ලංකාව ගත්තොත් දැන් බඩු මිල වැඩි වෙනවා. හැබැයි, බඩු මිල වැඩිවීමේ pattern එකට වඩා සිගරැට්ටුවේ මිල වැඩිවීමේ pattern එක වෙනස්. සිගරැට්වලින් ලැබෙන බදු මුදල වෙනස්. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මේ තත්ත්වය තුළ මුදල් අමාත්‍යාංශයට සල්ලි හොයන්න ඕනෑ නම්, ඒ සම්බන්ධ කාරණා කෙරෙහි වැඩි අවධානය යොමු කරන්න වෙනවා. මේ කථා කළ කරුණු කාරණාවලට අදාළ ලේඛන 3ක් මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා. මීට කලින් මම මේ කරුණු කාරණා ගැන පාර්ලිමේන්තුවේ කථා කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමාට නියමිත කාලය දැන් අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பத்திரண)
(The Hon. Buddhika Pathirana)

මම කථාව අවසන් කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට තව සුළු කාලයක් දෙන්න.

මත් වතුර බෝතලයේ ස්ටිකරය ඇලවීම පිළිබඳ කාරණය ගත්තොත්, අන්න ඒක හොරට අච්චු ගහලා. ඒකට සුරාබදු දෙපාර්තමේන්තුවේත් සමහරු සම්බන්ධයි. ඒ පරීක්ෂණ යට

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු බුද්ධික පතිරණ මහතා]

ගහලා. හේතුව ඇයි? සුරාබදු කොමසාරිස් ජනරාල් පුටුවට එන්න කෙළ හලන අයයි, පුටුව රැක ගන්න කටයුතු කරන අයයි ඒක යට ගහලා. ඒ ස්ටිකරය හොරට අච්චු ගහලා දැන් ඒ පරීක්ෂණය යට ගහගෙන ඉන්නවා. දැන් හොර සල්ලි අච්චු ගැහුවොත් ඒ සම්බන්ධ පරීක්ෂණ යට ගහගෙන ඉන්නවාද? නැහැනේ. කෙසේ හෝ මේ ආකාරයට සුරාබදු දෙපාර්තමේන්තුවෙන්, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවෙන් ලබා ගන්න තිබෙන ආදායම ලබා ගැනීමට නොහැකිවීමේ ඛේදවාචකයකට අපි මුහුණ දීලා තිබෙනවා.

ඒ නිසා මම අවසාන වශයෙන් මේ කාරණයත් කියනවා. සමගි ජන බලවේගය විධියට අපි මේ මොහොත වෙනකොට සතියේ සෑම සඳුදා දිනයකම, සෑම අඟහරුවාදා දිනකම පැය 6ක් මේ රටේ සෑම ක්ෂේත්‍රයකටම අදාළ ප්‍රතිපත්ති සකස් කිරීම තමයි සිදු කරන්නේ.

මේ රටේ ප්‍රතිපත්ති සම්පාදනයේදී විකල්ප මොනවාද කියලා අහලා ඒ ඔස්සේ, ජනතාවාදී විකල්ප, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය මත පදනම් වූ විකල්ප ඔස්සේ, සමාජ වෙළෙඳ පොළ ක්‍රමයක් ඔස්සේ, සෑමට සාධාරණය ඉෂ්ට කිරීමේ ක්‍රමය ඔස්සේ, අලුත් ගමනක්, අලුත් වැඩ පිළිවෙළක් ගෙන යන දේශපාලන ව්‍යාපාරයක් විධියට අපි මේ අය වැයට විරුද්ධ වෙන්නේ, මේ අය වැය අයිසිං තවරපු සුන්දර කේක් ගෙඩියක් බඳු අය වැයක් නිසායි. හැබැයි, නයි විස කවලා, ඒක උඩ පිච්ච මල් ටිකක් ලස්සනට පෙනෙන්න තියලා, ඒක තුළින් සුවඳ හමනවාය කියලා බලාපොරොත්තු වෙනවා. හැබැයි එන්නේ, කිඩාරම් මල් සුවඳ විතරයි. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 8ක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.57]

**ගරු (මහාචාර්ය) තිස්ස විතාරණ මහතා**
(மாண்புமிகு (பேராசிரியர்) திஸ்ஸ விதாரண)
(The Hon. (Prof.) Tissa Vitarana)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි සියලුදෙනාම දන්නවා, අපේ රට දරුණු විදේශ විනිමය හිඟයකට මුහුණ දීලා තිබෙන බව. ඒ හේතුවෙන් දැන් රජයේ රෝහල්වල බෙහෙත් හේත් නොමැති තත්ත්වයට පත්වෙලා තිබෙනවා. මම වෛද්‍යවරයකු හැටියට ඒ ගැන කනගාටු වෙනවා. ලෙඩ්ඩුන්ට ෆාමසිවලට ගිහිල්ලා ගිනි ගණන් මුදල් ගෙවලා ඒ බෙහෙත් ලබා ගන්නයි සිද්ධවෙලා තිබෙන්නේ.

එක පැත්තකින් අපේ රටට ඇමෙරිකානු ඩොලර් බිලියන 52කට වැඩි ණයක් ගෙවීමට සිදු වී ඇති නිසා තමයි මේ විදේශ විනිමය හිඟය ඇතිවෙලා තිබෙන්නේ. අවුරුදු පතා ඩොලර් බිලියන 7කට වැඩි ගණනක් ගෙවන්න සිද්ධවෙලා තිබෙනවා. මේ තත්ත්වයෙන් ගොඩ යෑම සඳහා මේ අය වැය තුළ කිසිම සැලැස්මක් නැහැ. ඒ ගැන කිසිදු විධිමත්, සංවිධානාත්මක පියවරක් ඉදිරිපත් කරලා නැහැ.

අනෙක් අතට පිට රටවලින් එන නැව්වලට ප්‍රමාද ගාස්තු වශයෙන් විශාල ප්‍රමාණයක් වැය කරමින් ඩොලර් විශාල ප්‍රමාණයක් නාස්ති කරනවා. ඒ පිළිබඳව මම කනගාටු වෙනවා. මෙන්න මෙවැනි තත්ත්වයකට තමයි මේ රට ගෙනැල්ලා තිබෙන්නේ. අපේ ඩොලර් හිඟය මේ ආකාරයට වැඩිවෙලා ගියොත්, මම කලින් කිව්වා වාගේ බෙහෙත් වැනි අත්‍යවශ්‍ය දේවල් වුණත් අපට පිට රටින් ලබාගන්න නොහැකි තත්ත්වයකට එනවා.

මෙම විදේශ විනිමය හිඟය ඇති වුණේ ණය ගත්ත නිසා. තව තව ණය ගන්නයි යන්නේ. IMF එකට යනවා, ලෝක බැංකුවට යනවා, ආසියානු සංවර්ධන බැංකුවට යනවා. ඉතින්, මේ රට තවත් ප්‍රපාතයෙන් ප්‍රපාතයට වැටෙනවා. මේකද අපි යන ගමන? ඒ ගමන වෙනස් කිරීමට මෙම අය වැය තුළ කිසිම වැඩ පිළිවෙළක් නැහැ.

ඒත් එක්කම දැන් අපි සාමාන්‍ය ජනතාවගේ තත්ත්වය බලමු. බඩු මිල අහසට නඟිනවා. වෙළෙන්දන්ට ඕනෑ ගණනක් අය කරලා පොහොසත් වීම සඳහා මාර්ගයක් ඇති කරලා තිබෙනවා. එක පැත්තකින් මැද පන්තියේ අය ගසා කෑම සිදු වෙනවා. ගොවියාට සහ නිෂ්පාදකයාට නියම මිල ලැබෙන්නේ නැහැ, ඔවුන්ට පහර වදිනවා. අනෙක් පැත්තෙන් බඩු ගන්න පාරිභෝගිකයාට විශාල මුදලක් වැය කරන්න වෙලා තිබෙනවා. මේ තත්ත්වය උඩ අපේ රටේ ජනතාවගේ ආදායම වැඩි වෙලාත් නැහැ, පඩි වැඩි කිරීමකුත් නැහැ. මේ හරහා ජනතාවට මොනවාද සිද්ධවෙලා තිබෙන්නේ? මම කියන්න කනගාටුයි, වෛද්‍ය පර්යේෂණායතනයේ සමීක්ෂණයක් තුළින් පෙන්වලා තිබෙනවා, සමස්ත පවුල්වලින් සියයට 65කට වඩා දරිද්‍රතා රේඛාවට පහළ මට්ටමේ ඉන්න අඩු ආදායම්ලාභීන් බව.

ඒ ගොල්ලන්ට නියම ආහාර ප්‍රමාණයක් ලැබෙන්නේ නැහැ. දැන් මන්දපෝෂණය වැඩි වෙලා තිබෙනවා. ඒ ප්‍රමාණය සියයට 20 පනින තත්ත්වයට ඇවිල්ලා තිබෙනවා. අවුරුදු පහට අඩු වයසේ දරුවන් පස්දෙනෙකු ගත්තොත්, එක්කෙනෙක් මන්දපෝෂණයෙන් පෙළෙනවා. අනාගත පරම්පරාවලටත් මේක බලපානවා. ඒ ළමයාගේ ශාරීරික දියුණුව හරියාකාරව නොවෙනවා පමණක් නොවෙයි, මානසික දියුණුවත් ඇති වන්නේ නැහැ. ඒක අනෙක් ළමයින්ටත් යම් ප්‍රමාණයකින් බලපානවා. මොන වාගේ අනාගත පරම්පරාවක්ද නිර්මාණය වෙන්න යන්නේ අපේ රටේ? මේ ආකාරයට බැලුවාම බඩගින්න වැඩි වෙනවා. මන්දපෝෂණය වැඩි වෙනවා. මේ තත්ත්වයත් එක්ක වැඩි කාලයක් යන්න පෙර අප රටේ ජනතාව සාගින්නෙන් මිය යන තත්ත්වයකුත් ඇති වෙයි. මේ ප්‍රශ්න විසඳන ආකාරය ගැන මේ අය වැය ලේඛනයේ වචනයක්වත් නැහැ. මේවා තමයි දරුණු ප්‍රශ්න. මේ දරුණු ප්‍රශ්නවලට විසඳුම් සෙවීම කරා ගමන් කිරීමක්වත් මේ අය වැය ලේඛනයේ පෙනෙන්නට නැහැ. අපි

රටක් හැටියට මෙවැනි තත්ත්වයකට මුහුණ දුන්නාම මොන වාගේ අනාගතයක් ද ඇති වන්නේ? අවුරුදු 10ක්, 20ක්, 40ක් යනකොට ඇති වන සෙත ගැන රසවත් වචන පාවිච්චි කරමින් කථා කරනවා පමණයි. අද තිබෙන තත්ත්වය ගැන හිත යොමු කරලා, මේ දරුණු තත්ත්වයෙන් අපි ගොඩ එන්නේ කොහොමද, මේ ආර්ථික අර්බුදයෙන් අපේ රට බේරාගන්නේ කොහොමද කියන ප්‍රශ්න ගැන නිසි වැඩ පිළිවෙළක් මේ අය වැයේ දකින්න නැහැ. අපේ රටේ ජනතාවගේ බඩ ගින්න වැඩි වීම, මන්දපෝෂණය වැඩි වීම, රෝගීන්ට බෙහෙත් නැතිකම ආදි ප්‍රශ්නවලට හිත යොමු කරලා, ඒවා විසඳන යෝජනා මොකවත් මේ අය වැය ලේඛනයේ සඳහන් කරලා නැහැ. ඒ ප්‍රශ්නවලින් ගැලවීමේ මාර්ගයක්වත් පෙන්වලා නැහැ. ඒ ගැන මගේ කනගාටුව ප්‍රකාශ කරනවා.

මේ අය වැයෙන් අපට කියනවා, අලුත් ගමනක් යන්න දැන් මාවතක් නිර්මාණය කරනවා කියලා. නමුත්, මේකෙන් සිද්ධ වන්නේ රටක් හැටියට, ජනතාවක් හැටියට අප තවතවත් වැටෙන එකයි. ඒ ගැන කනගාටුව ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

The next speaker is the Hon. M.A. Sumanthiran. You have 17 minutes.

[4.05 p.m.]

ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)

Hon. Presiding Member, the Debate on the Second Reading of the Budget presented by the Minister of Finance, who also happens to be the President, is ending today. I have consistently recorded my opposition to President being the Minister of Finance. From 2010 onwards, in this House, whenever the President, in his capacity as Minister of Finance, has presented a Budget, I have recorded that protest and I wish to record that today as well. When a person who is not a Member of this House presents the Budget or is the Minister of Finance, that seriously curtails this House's ability to be in total control of public finance, as the Constitution stipulates in Article 148.

This also exposes another thing this time. That is, there is a Twenty First Amendment to the Constitution that was brought in and said to be going back to the Nineteenth Amendment - that is, doing away with the Twentieth Amendment - which, as we pointed out during that Debate, does not really do that. Under the Nineteenth Amendment to the Constitution, the President could not hold any Ministries, not even the Ministry of Defence. Only for the tenure of the President at that time - personal to President Maithreepala Sirisena- three named Ministries were permitted in the Transitional Provisions. Thereafter, the President could not hold any Ministries. But now, the President actually can hold any number of Ministries; in fact, he can hold all the Ministries. So, this is another occasion on which we can expose that lie to the country, that some reform was made, that Executive powers were curtailed through the Twenty First Amendment, but no, no such thing was done. Even the one positive thing that is being touted is the re-establishment of the Constitutional Council. That also, we pointed out, is a political body, that it is not the Constitutional Council under the Seventeenth Amendment, that more of its Members are from this House, which makes it political, and that body is tasked with the appointment of, amongst others, Independent Commissions.

In the last couple of days, we found how the supposed Independent Commissions' Chairmen had behaved. We saw the Charman of the National Police Commission going to the VIP lounge to receive a person who was chased out of this country for fraud and large-scale corruption. Who else, but the Chairman of the National Police Commission was there bowing to him and welcoming him back! A few days before that, we heard the Chairman of the Office on Missing Persons saying that only a few people went missing and all of them are living abroad.

That very Office was established to investigate into missing persons. All of the Government Commissions, there were many, had reported that over 20,000 people had gone missing; that is a conservative number. But, the Chairman of the Office that was appointed to go into that, supposedly an independent office, says nobody has gone missing. Then, the Hon. Minister of Justice, Prison Affairs and Constitutional Reforms explains saying, "No, he is wrong because he has not understood the Government's priority. The Government has prioritized reconciliation measures which must deal with the issue of disappearance also and unfortunately, this Chairman does not seem to know that." That creates another problem. Why should a Chairman of an independent office know what the Government's priorities are, if he is independent? Why should he comply with what the Government wants to do today? The Government would not want to do that tomorrow; the Government changes its mind day to day. If it is an independent office, he has been tasked, by law, to make investigations into the tens of thousands of disappearances in the country, but that is what its Chairnan says. So, the Twenty First Amendment was just an eyewash and really did not make anything independent in this country nor did it strip the President of any Executive powers.

That said, let me turn to the Budget Proposals. I want to concentrate on one matter and that is with regard to the EPF. The EPF is Sri Lanka's single largest fund. That fund has been dipped into and there are serious allegations of fraud and corruption in the way investments have been made out of this fund. There had been five forensic audits conducted, but no action has been taken to date. The last Annual Report of this Fund published was for 2016. Forensic audits had revealed massive frauds into the earnings and savings by the working force of this country, and not a muscle has been moved; nothing, to date, has happened with regard to taking action on that. I am highlighting this because the economic crisis we are facing in this country is primarily due to corruption and that is why the IMF, in its Report, said there are corruption susceptibilities and that is one of the challenges for the IMF's implementing of its programme in this country. The President or the Minister of Finance, in his Budget Speech, said that that - corruption issues - will be dealt with. But, where? Nothing has been done.

The other issue is with regard to the office of the Attorney-General, who advises the Government, appears on behalf of the Government and defends the Government. Even when the Right to Information Commission orders the Central Bank to divulge certain information, the Central Bank appeals and the Attorney-General appears for them.

All these are public funds, monies of the people of this country. There is absolutely no transparency. Evidently, large-scale corruption and fraud, all that is covered up by the Government, the Central Bank, the EPF and the Attorney-General gives absolute sanction to cover it up. With that background, how do we get out of this economic crisis? The Government pays lip service, but every action of the Government demonstrates the opposite.

[ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා]

Earlier this morning, the Hon. Anura Dissanayaka cited the case of a Minister who asked an Ambassador for a bribe. That was reported; he was suspended from the Cabinet; he got a committee of his choice appointed, which exonerated him, and he is back in the Cabinet. To add insult to injury, that very Minister has been appointed as the President's nominee on the Constitutional Council! The Constitutional Council, which is supposed to appoint independent Commissions, hand-picked him because there is no one who is up to that mark in the Cabinet, who has the brass to go and ask an Aambassador for a bribe! I suppose the other Ministers are a little less corrupt. So, you have to pick the most corrupt to appoint to the Constitutional Council. Then, you have a convicted extortionist as

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

So, how do we tell either the IMF or anyone else that we are dealing with corruption? The Government has really no intention of doing any of that sort; the President, too, has no intention. Those are President's appointments. So, you say one thing, but do just the opposite.

There is a book written by Mr. V.P. Vittachi on President J.R. Jayewardene's conduct, a small blue colour book which I have read some time ago. It is called "Sri Lanka: What Went Wrong?" Mr. Vittachi coins a word and calls it "plonking". He says, "President Jayewardene will say, 'I am turning right; this is the right way to go. I am turning right, now' and he will turn left". While travelling left, all the time he insists, "No, no, I am travelling right". That is "plonking". The incumbent President learned his political lessons from President Jayewardene and one wonders whether that is what he is now practising saying, "We are dealing with corruption", but doing the very opposite to what will eradicate corruption.

The Tamil National Alliance Parliamentary Group met today and took certain decisions with regard to this Budget. We have highlighted various shortcomings and matters that are contrary to the well-being of this country, particularly the high percentage of allocation to the defence sector. The country's economy is contracting; various fundamental service sectors are contracting and reducing whilst, in the last two years, the allocation to the defence sector has increased by 12 per cent!

That is not just salaries and Recurrent Expenditure which is necessary. You must visit one of the camps to see the high life that goes on there. To test it out, a few days ago, I went with the Hon. President and had lunch at the Air Force Base, Vavuniya. The lunch was of a standard that is higher than what you can get in a seven-star hotel; nothing has come down. No one wants to touch that; the ceramic ware, food and everything, nobody wants to touch. But, you are telling the country to reduce expenses. Seventy per cent of our people have dropped one meal and 50,000 children are in danger of malnutrition! The Government might deny it, but those are the real facts. And, you want to keep the military happy; you do not want to upset them so that you could suppress dissent and the people who protest that they do not have food to eat. So, all of that is there.

And, at a time like this, one would have expected a programme through this Budget to lift this country out of the economic crisis, but that is not there. So, we are opposed to this Budget. But, for one reason, we took a decision today not to cast our vote in opposition.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Hon. Member, please wind up now.

**ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා**
(மாண்புமிகு எம்.ஏ. சுமந்திரன்)
(The Hon. M.A. Sumanthiran)
I am concluding, Sir.

That is, due to the reason that the President has, in the last couple of days, repeatedly said that he is taking steps to resolve the long-standing Tamil national question. Although we are sceptical - it is not because we trust it - we do not want to be blamed for opposing a President when he says, "I want to solve this. Come, let us sit down and talk". So, for that very reason, we will, today, not cast our vote against this Budget. Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මැතිතුමා. ඔබතුමාට විනාඩි 14ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.22]

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ, නිදහස් ලංකාවේ 77වන අය වැය; බංකොලොත් ලංකාවේ පළමුවෙනි අය වැය. ලංකාවේ අය වැය කියවන කිසිම වාරයක ජනතාවගේ සන්නිවේදනයට, සැලකිල්ලට පාත්‍ර නොවුණු, පළමුවෙනි අය වැය අද අපි ඉදිරියේ තියනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සාමාන්‍යයෙන් වෙන දා අය වැය කියවනකොට මිනිස්සු ඒ ගැන උනන්දුයි. රේඩියෝ එකක් ළඟ, ටීවී එකක් ළඟ, මිනිසුන් බලාගෙන ඉන්නවා, මොනවාද ලැබෙන සහන, මොනවාද අභිමි වෙන්නේ කියලා. එහෙම නැත්නම් පහුවදා පුවත් පතකින් හෝ බලනවා, ලැබී තිබෙන සහන සහ අහිමි වී ඇති දේවල් මොනවාද කියලා. එහෙම කිසිම අරමුණක්, සැලසුමක්, උනන්දුවක් නැති අය වැය විවාදයකට තමයි අද අපි සහභාගි වෙලා ඉන්නේ.

රට වටේම මුහුද තියෙන, ආගන්තුක සත්කාර අතින් ඉතාම විශිෂ්ට තැනක ඉන්න, අධ්‍යාපනය අතින් ලෝකය පුරා ඉමහත් කීර්තියක් තියාගෙන හිටපු, විවිධාකාර විධියට ඉස්සරහින් හිටපු

ජනතාවක් ඉන්න ඉන්දියන් සාගරයේ මුතු ඇටය, අද කාලකණ්ණි ඇටයක් බවට පත් වෙලා තියෙනවා. එවැනි අවස්ථාවක විකෘති ආණ්ඩුවක, විකෘති අය වැයක් පිළිබඳවයි අපි සාකච්ඡා කරමින් ඉන්නේ.

එතකොට මේ අය වැයේ අරමුණු විය යුතු වන්නේ මොනවාද? බංකොලොත්භාවයෙන් රට මුදා ගන්නේ කොහොමද කියන කාරණා ගැන මේ අය වැය ලේඛනය තුළින් අපි කථා කළ යුතු වෙනවා. ඊළඟට, ආර්ථිකය හැකිළීම, සංකෝචනය වීම වළක්වන්නේ කොහොමද කියන කාරණා පිළිබඳව අපි මේ අය වැය විවාදය තුළ අපේ අවධානයට යොමු කරන්න ඕනෑ. ඒ වාගේම ජන ජීවිතය යළි ගොඩනඟන්නේ කොහොමද කියන කාරණා ගැන අපි කථා කරන්න ඕනෑ. හැබැයි, මේ අය වැය ලේඛනය තුළ එවැන්නක් අපි දකින්නේ නැහැ. මේ විකෘති ආණ්ඩුවේ, විනාශ වෙච්ච ආර්ථිකයක් තුළ ඉදිරිපත් කළ මේ අය වැය ලේඛනය සාම්ප්‍රදායික ලියවිල්ලක් හැටියට විතරයි අපි දකින්නේ. මූලාසනයේ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැයේ ඉලක්කම් අඩුයි. හුදෙක් සංකල්පනාවලින් පිරුණු, මනසට ඇති වෙච්ච සිතුවිලි ටිකක් තමයි මෙහි තිබෙන්නේ. අවුරුද්දෙන් අවුරුද්ද දමන සංකල්පනාත්මක ලියවිල්ලක් හැටියට තමයි අපි මේ ලේඛනය දකින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආයෝජන අවස්ථා ගැන කථා කරනවා. අපි දන්නවා, මේ වෙනකොට ඩීසල් පරිභෝජනය සියයට 50කින් අඩු වෙලා. ගෑස් පරිභෝජනය සියයට 25කින් අඩු වෙලා. මේ අය වැය තුළින් රට යථා තත්ත්වයට එනවා කියලා තමයි සමහරු උදම් අනන්නේ. නමුත්, එහෙම නැහැ. දැන් ඩීසල් ගන්න, ගෑස් ගන්න, පෙට්‍රල් ගන්න මිනිසුන්ට සල්ලි නැහැ. මිනිසුන්ගේ ආර්ථිකය සංකෝචනය වෙලා. ඉතින් ශුභවාදී පැත්තක්, ධනවාදී පැත්තක් කියලා මේ අය වැයට ප්‍රශස්ති ගයනවා නම්, ඒකත් අපේ අවාසනාවක් බව මම කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අනුර කුමාර දිසානායක මහත්තයා අද උදේ කථා කෙරුවා. 77 ආර්ථික ක්‍රමය ගැන එතුමා විශාල දෝෂාරෝපණයක් කළා. ආර්ථික ප්‍රතිසංස්කරණ ඕනෑ කියලා කිව්වා. රාජ්‍ය තන්ත්‍රය හකුළන්න ඕනෑ කියලා කිව්වා. ඔව්, ඕනෑ තමයි, අපි කියන්නේත් ඕනෑ තමයි. හැබැයි, අපට තියෙන ප්‍රශ්නය මේකයි. එහෙම කථා කරලා ඒ රාජ්‍ය ප්‍රතිසංස්කරණ කරන්න ඕනෑය කියලා, වෘත්තීය සමිති තුළිනුත්, හැම තැනකින්ම මහජනතාව අතරට ගිහිල්ලා ඒ අදහස් විවේචනය කරනවා. මේ ප්‍රශ්නවලට තිබෙන විසඳුම් එතුමා කියන්නේ නැහැ. ඒ එක්කම එතුමා කියනවා, සමාජය වෙනස් විය යුතුයි ලු. ආකල්පමය වෙනසක් ඇතිවිය යුතුයි ලු. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ක්ෂණිකව විසඳුම් අවශ්‍යව තියෙන තත්ත්වයට දශක ගණනාවක් ගතවන ව්‍යාපෘති යෝජනා කරලා හරි යන්නේ නැහැ. මම ඒකත් කියන්න ඕනෑ. මාස හයකින් ආර්ථිකය හදනවා කියලා කියපු අනුර කුමාර දිසානායක මහත්තයා දශක ගණනාවකින් ආකල්ප වෙනස් වෙන්න ඕනෑ කියනවා. ප්‍රතිපත්ති වෙනස් වෙන්න ඕනෑ කියනවා. දීර්ඝ කාලීන -දශක ගණනාවක් සඳහා වන- ප්‍රතිපත්ති ගැන කථා කරනවා. ඉතින් ඒවාටත් අපි විශේෂයෙන් අවධානය යොමු කරනවා. ඒවාත් නොවෙයි, විසඳුම් කියන කාරණය අපි කියනවා. ඇත්තටම අපි එකඟ වෙනවා, ආර්ථික ප්‍රතිසංස්කරණ අවශ්‍යයි, reforms කළ යුතුයි කියා. හැබැයි, ඒ ආර්ථික ප්‍රතිසංස්කරණවලින් බිඳ වැටෙන, ඒ හරහා කඩා වැටෙන ප්‍රජාවට, කම්කරුවන් ඇතුළු සියලු සේවකයන්ට සහන ලබා දීමේ යම් වැඩ පිළිවෙළකුත් අපට අවශ්‍යයි.

හැබැයි, මේ තුළ එහෙම දේවල් සිද්ධ වෙන්නේ නැහැ. ඊජිප්තුව වාගේ රටවල පෙට්‍රල් මිල වැඩි කරනවා නම්, ඒ හරහා බිඳ වැටෙන, අසරණභාවයට පත්වන අයට subsidy එකක් දීලා තමයි ඒ මිල වැඩි කරන්නේ. එතකොට ඒ හරහා ධීවරයන්ට යම්කිසි ගැටලුවක් වෙනවා නම්, ඒ අයට අවශ්‍ය සහයෝගය දීලා තමයි ඒ මිල වැඩි කරන්නේ. අපේ බදු ක්‍රමයේ හැටියට V8 එකක් පාවිච්චි කරන පුද්ගලයෙක් ඩීසල් ලීටර් 300ක් ගහනවා නම්, ඒ ඩීසල් ලීටර් 300න් ඔහුට ලීටරයකට රුපියල් 100 ගණනේ ලාභයක් ලැබෙනවා නම්, ඔහු රුපියල් 30,000ක ලාභයක් ගන්නවා. මෝටර් බයිසිකලයක් පාවිච්චි කරන පුද්ගලයෙක් පෙට්‍රල් ලීටර් 3ක් ගහනවා නම්, ඔහුට ලැබෙන්නේ ඒ ලාභයෙන් රුපියල් 300යි. ධනපතියන්ට වැඩි ලාභයක් සලසන, දුප්පත් අහිංසකයන්ට අඩු ලාභයක් සලසන මේ බදු ප්‍රතිපත්ති වෙනස් කළේ නැත්නම්, අපට ඉස්සරහට කටයුතු කරගෙන යන්න බැහැ කියන කාරණය අපි කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ එක්කම දත්ත බොරු කිරීමේ කලාව ගත්තාම, පී.බී. ජයසුන්දර, අජිත් නිවාඩ් කබ්රාල් වැනි අයගේ කාලයේ ඉඳලාම ඒක බොහොම ප්‍රසිද්ධ කලාවක්. මහ බැංකු වාර්තාවල සඳහන් ආර්ථික වර්ධන වේගය, දළ ජාතික නිෂ්පාදනය පිළිබඳව හැම දාම අපට බොරු කරමින්, සත්‍ය දත්ත යට ගහමින් තමයි කටයුතු කළේ. අදටත් කියනවා, මේ ආර්ථිකය නැවතත් පණ ගහනවා ලු, නැඟිටිනවා ලු. දැන් මේ ආර්ථිකය යථා තත්ත්වයට පත් වෙමින් තිබෙනවා කියලා ඔය මනූෂ නානායක්කාර ඇමතිතුමා එහෙම කියනවා. ඒ, කුලියට කවි කියන්න ගිහිල්ලා ඉන්න කවියෝ. ඒවා වැඩක් නැහැ.

ලෝක බැංකුව කියනවා, 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ ආර්ථිකය සියයට 9.2කින් සංකෝචනය වෙනවා කියලා. ආසියානු සංවර්ධන බැංකුව කියනවා, මේ වසරේ ආර්ථිකය සියයට 8.8කින් සංකෝචනය වෙනවා කියලා. භාණ්ඩ හා සේවාවල මිල වැඩිවෙලා විශාල උද්ධමනයකට අපට යන්න වෙනවා කියනවා. හැබැයි, මෙතුමන්ලා කියනවා, දැන් මේ ආර්ථිකය යහපත්, මේකෙන් නැඟිටිනවා කියලා. මොන පිස්සුද? මේ තත්ත්වය නිකම් නිශ්චල වෙච්ච අහසක් වාගේයි. නිශ්චල වෙච්ච අහස භයානකයි. කොයි වෙලාවේ වහීවිද, කොයි වෙලාවේ අකුණු ගහයිද, කොයි වෙලාවේ හෙණ පුපුරයිද කියන්න බැහැ. මේ තත්ත්වය නිශ්චල මුහුදක් වාගේයි. නිසල ජලය ගැඹුරුයි කියලා කියනවා. ඒක භයානකයි.

මේ වෙනකොට බැංකුවල ණය පොලිය සියයට 30ට ඉහළ ගිහිල්ලා තිබෙනවා. ලීසිං වාරිකල සියයට 40 දක්වා ඉහළ ගිහිල්ලා තිබෙනවා. කොහොමද, එතකොට මේ ආර්ථිකය ප්‍රසාරණය වෙන්නේ? එතකොට මිනිහෙක් lease එකක් ගන්නේ නැහැ, අවශ්‍ය ණය මුදලක් ගන්නේ නැහැ. කොහොමද එතකොට ආයෝජනයක් සිද්ධ වෙන්නේ? ලෙබනනය කියන්නේත් මේ වාගේම බංකොලොත් වුණු රටක්. ලෙබනනයේ මේ වෙනකොට විශාල බැංකු ප්‍රමාණයක් වහලා. මිනිසුන්ගේ accountsවල සල්ලි තිබෙනවා. හැබැයි, ඒ accountsවලින් සල්ලි ගන්න බැහැ. බැංකු වහලා, බැංකුවල සල්ලි නැහැ. ATM cards දමලා හෝ සල්ලි ගන්න බැහැ. Machines තිබෙනවා, නමුත් ඒවායෙන් සල්ලි එන්නේ නැහැ. ඒ රටේ නිසි පාලනයක් නැහැ. සම්පූර්ණයෙන් ආර්ථික යාන්ත්‍රණය කඩා වැටිලා. අගාධයේ ඉන්න ගමන් තවත් බොරු ආටෝප-සාටෝප යොදමින් අපි යන්නේත් එතැනටද කියන භයානක කාරණය මේ අවස්ථාවේදී අපි මතක් කරන්න ඕනෑ.

එතකොට මේගොල්ලෝ කියනවා, ඒ අයට සහාය දෙන්න ලු. අපි අහනවා, මොනවාටද අපි සහාය දෙන්නේ? කෝ, මන්දපෝෂණය වෙනුවෙන් විසඳුම්? පාසල් දරුවන්ගේ ආහාර වේලට වියදම් කරන මුදල තවමත් රුපියල් 60යි නම්, කෝ, මන්දපෝෂණය සඳහා අවශ්‍ය වන විසඳුම්? කෝ, උද්ධමනය

[ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා]

පාලනය කිරීම සඳහා අවශ්‍ය වන විසඳුම්? කෝ, අධ්‍යාපනයට ලබා දෙන විසඳුම්? දැන් මහා ලොකුවට කෑ ගහනවා, ගුරුවරියෝ අඳින්න ඕනෑ සාරියක් ද, රෙද්දක් ද කියලා. රෙද්දේ නොවෙයි අධ්‍යාපනය තිබෙන්නේ කියලා මම කියන්න කැමැතියි. අධ්‍යාපනය තිබෙන්නේ ගුරුවරයාගේ කැපවීම මත. ඒ නිසා අපි රෙදි ගැන කථා කරලා වැඩක් නැහැ. අධ්‍යාපනයට අවශ්‍ය පහසුකම් ටික සපයන්නේ නැතිව, ගුරුවරියන්ට සුදුසු සාරිය ද, රෙද්ද ද කියන දේ ගැන කථා කරලා වැඩක් නැහැ කියන කාරණයත් මම මේ අවස්ථාවේ කියනවා. කෝ, සෞඛ්‍ය සඳහා අවශ්‍ය වන විසඳුම්? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේවාට විසඳුම් නැතිව අපි මේ අය වැයට සහාය දෙන්නේ කොහොමද කියන ප්‍රශ්නය අපි මේ වෙලාවේ අහන්න ඕනෑ.

වියදම් කළමනාකරණය කරන්න ලු. ඒක හොඳ දෙයක්. වියදම් කළමනාකරණය කළ යුතුයි. හැබැයි, මෙහෙම කියන්නේ කවුද? මේ රටේ වියදම් වැඩි කරපු, තමන්ගේ ගොන් තීන්දු නිසා මේ රටේ ආදායම් අඩු කර ගත්ත කණ්ඩායම් තමයි අපට කියන්නේ වියදම් කළමනාකරණය කරන්න කියලා. එතකොට අනවශ්‍ය විධියට රාජ්‍ය ආයතනවලට සේවකයන් පුරවන්න කිව්වේ අපිද? අතිවිශාල වශයෙන් පාඩු පිට පාඩු ලබන විධියට රාජ්‍ය ආයතන සේවකයන්ගෙන් පුරවන්න කිව්වේ අපිද? එතකොට, මත්තල ගුවන් තොටුපොළ, හම්බන්තොට වරාය, නෙළුම් කුලුන, නෙළුම් පොකුණ, හම්බන්තොට සම්මන්ත්‍රණශාලාව වාගේ ඵලක් නැති, සුදු අලි වැනි ව්‍යාපෘති ක්‍රියාත්මක කරන්න කිව්වේ අපිද කියලා මා අහනවා.

ගජ මිතුරන්ට සහන දෙන්න ඕනෑ නිසා අපේ රටේ බදු ආදායම අහිමි කරගත්තේ අපිද? සීනිවලට, පොල්තෙල්වලට සහන දීලා බදු ආදායම අඩු කරගත්තේ අපිද කියලා අපි අහනවා. හැබැයි, දැන් අපිට කියනවා ආදායම් වැඩි කර ගන්න, වියදම් අඩු කර ගන්න කියලා. අපට මෙහෙම උපදෙස් දෙන අය, මේ වෙලා තිබෙන කිසිම දේකට වගකීමක් ගන්නේ නැතිව, මේ කිසිම දේකට වග කියන්නේ නැතිව, මේ ආර්ථික ක්‍රියාවලිය නිසා විනාශයට, අගතියට පත් වෙලා සිටින ජනතාවගෙන් බදු ගහන්න හදනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ-පෙරේදා ආර්ථික ඝාතකයෙක් කටුනායක ගුවන් තොටුපොළින් ආවා අපි දැක්කා. කවුද ආවේ? බැසිල් රාජපක්ෂ ශ්‍රීමතාණෝ. රට, ජාතිය, ආගම ගැන උන්මාදයකින් කථා කරන, සිංහ සෙයියාවෙන් කථා කරන මේ ආණ්ඩු පක්ෂය නියෝජනය කරමින් ඉන්න මැති-ඇමතිවරු විශාල පිරිසක්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

වාගේ ගිහිල්ලා අර ද්විත්ව පුරවැසියාට වැඳපු හැටි, ආයුබෝවන් කියපු හැටි, කථා කරපු හැටි, දෙකට නැමුණු හැටි අපි දැක්කා. ඒක මහ ලොකු හපන්කමක් හැටියට ඒ අය දකිනවා නම්, ඒ අයගේ බුද්ධිය ගැන අපට කනගාටුයි. දැන් රටේ ජනතාව යම්තම් සන්සුන් වෙලා ඉන්නවා. දැන් අපට අර "කපුටු කාක්, කපුටු කාක්" සද්දය ඇහෙන්නේ නැහැ. බැසිල් රාජපක්ෂ කියන ඒ චෞරයා ගැන දැන් රටේ ජනතාවට අමතක වෙලා තිබෙන්නේ. ඒ වුණාට, මිහිඳු හාමුදුරුවෝ වැඩියා වාගේ, මහ කුසලානයක් අරගෙන රටට ජයග්‍රහණයක් අරගෙන මහ වීරයෙක් රටට බැස්සා වාගේ මේ හාදයෝ ටික කටුනායක ගුවන් තොටුපොළට ගිහිල්ලා බැසිල් රාජපක්ෂ වන්දනා කරන හැටි අපි දැක්කා. *[බාධාකිරීම්]* එතකොට මේ ආර්ථිකය විනාශ කරපු - *[බාධාකිරීම්]* තමුන්නාන්සේ කට පියා ගෙන ඉන්න. මේ ආර්ථිකය විනාශ කරපු, මේ ආර්ථිකය ඝාතනය කරපු, මේ රටේ ජනතාවට යන එන මං නැති කරපු, ළමයින්ට කිරි පිටි ටික, බෙහෙත් ටික නැති කරපු, හුස්ම ගන්න බැරි කරපු ආර්ථික ඝාතකයා ළඟට ගිහිල්ලා මෙතැන මේ ඉන්න අය වැඳ වැටුණු හැටි අපි දැක්කා. ආර්ථිකය ඝාතනය කරපු අයට මල් මාලා දමා පුද පූජා කරනවා. අපේ අහිංසක ජනතාවගේ කරපිටට බදු පිට බදු ගහනවා. මේවාටද, අපි සහාය දෙන්න ඕනෑ කියලා අපි අහනවා.

ඊයේ මහින්ද රාජපක්ෂ මැතිතුමා කිව්වා, යහපාලන ආණ්ඩුවෙන් ගත්ත ණය නිසාලු, මේ ආර්ථිකය බංකොලොත් වෙලා තිබෙන්නේ. ඉතින් දෙයියනේ, මහින්ද රාජපක්ෂ මහත්තයා ඒක අපට කියලා හරියනවාද? ඒක මහින්ද රාජපක්ෂ මහත්තයා කිව යුත්තේ තමුන්නාන්සේලා සියලුදෙනාම එකතු වෙලා පත් කරගත්ත රනිල් වික්‍රමසිංහ මහත්තයාට නේ. රනිල් වික්‍රමසිංහ මහත්තයා නේ, යහපාලන ආණ්ඩුවේ හිටපු අගමැතිවරයා. සජිත් ප්‍රේමදාස කියන්නේ ඒ යහපාලන ආණ්ඩුවේ හිටපු ඇමතිවරයෙක් විතර නේ. සජිත් ප්‍රේමදාස මහත්තයා රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ආණ්ඩුවේ වරප්‍රසාද ලැබූ ඇමතිවරයෙක් නොවෙයි. රනිල් වික්‍රමසිංහ මහත්තයාගේ ආණ්ඩුවේ කුඩම්මාගේ සැලකිලි ලැබූ, පැත්තකට වෙලා බැට කාපු ඇමතිවරයෙක් එතුමා. *[බාධාකිරීම්]* එතුමා මේකට වග කියන්න ඕනෑ ද? එහෙම නම්, ඉතින් මහින්ද රාජපක්ෂ මහත්තයා ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉඳලා නේ, පොහොට්ටුවට ගියේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය කරපු වැඩ පොහොට්ටුවට ගියාට පස්සේ පිළිගන්න ඕනෑද? එහෙම නම් ඉතින් මහින්ද රාජපක්ෂ මහත්තයාගේ තාත්තා, ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා, බණ්ඩාරනායක මහත්තයා යනකොට එතුමාගේ පිටුපසින් ගියා නේ. එහෙම නම් ඉතින් ජනතා විමුක්ති පෙරමුණ හැම පක්ෂයකම පිටුපසින් ගියා නේ. එතකොට තමන් කලින් ලැගපු තැන, කලින් හිටපු තැන සිටි අයගේ වැරදිවලට අනෙක් පැත්තට ආවාම වගකියන්න ඕනෑද? ඒ නිසා මහින්ද රාජපක්ෂ මහත්තයාට ප්‍රශ්නයක් තිබෙනවා නම්, කරුණාකර ඒ ගැන එතුමාගේ ජනාධිපතිවරයා වන රනිල් වික්‍රමසිංහ මහත්තයාගෙන් අහන්න කියන එකත් මම මේ අවස්ථාවේදී කියනවා.

දැන් ටිකකට කලින් අපි දැක්කා, මෙතැන තිබුණු හොඳම විහිළුව. අපේ මනූෂ නානායක්කාර ඇමතිතුමා සහ හරින් ප්‍රනාන්දු ඇමතිතුමා අර පිටුපස තිබෙන පුටු පේළියේ බොහොම ආරූඪ සම්පන්නව ඉඳගෙන ඉන්නවා. අනේ අර රෝහිත අබේගුණවර්ධන මහත්තයලා එහෙම එතැන හිටගෙන ලියුම් වගයක් අත්සන් කර ගත්තා. මීට පැය භාගයකට පමණ ඉස්සර වෙලා අපි දැකපු සිද්ධියක්, ඒක. ඒගොල්ලන් හදපු ආණ්ඩුව, මේක. මහත් බලාපොරොත්තු ඇතිව 69 ලක්ෂයක් ඡන්දය දීලා පත් කරපු ආණ්ඩුව, මේක. දැන් මේ පත් කළ ආණ්ඩුවේ ඉන්න මනූෂ නානායක්කාරලා, හරින් ප්‍රනාන්දුලා කියන්නේ අපේ අය. දැන් ඒ අය ළඟ හිටගෙන ලියුම් අත්සන් කර ගන්නවා!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි. කථාව අවසන් කරන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

තව එක දෙයයි මම කියන්නේ. මට තව තත්පර තිහක් දෙන්න, මම කථාව අවසන් කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය දෙවැනිවර කියවීමේ විවාදයට අදාළ ඡන්ද විමසුමේදී සමහර වෙලාවට අද

මෙය ජයග්‍රහණය කරයි. හැබැයි, මේ අය වැය ජයග්‍රහණය කරවන්නේ තමන්ගේ මන්ත්‍රීකම් ටික බේරා ගන්නයි, තමන්ගේ ඇමතිකම් ටික බේරා ගන්නයි. මේ අය වැයට පක්ෂව ඡන්දය දෙන්නේ අද හෙට ගෙදර යන්න අකමැති පිරිසක්. මේ රටේ ජනතාවට මොන දේ වුණත්, මොන විධියට වැරදුණත් තමන්ගේ මන්ත්‍රීකම බේරා ගන්න, තමන්ගේ ඇමතිකම බේරා ගන්න කටු ලෙවකන ටිකකගේ ඡන්දයෙන් අද මේ අය වැය දෙවැනිවර කියවීමේ විවාදය ජයග්‍රහණය කරයි. ඒකට කමක් නැහැ. අපි පැරදුණත් කමක් නැහැ, අපි ජනතාව වෙනුවෙන් ඉන්නවා කියමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හරින් ප්‍රනාන්දු මැතිතුමා. ගරු ඇමතිතුමනි, ඔබතුමාට විනාඩි 27ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 4.36]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා (සංචාරක හා ඉඩම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஹரின் பர்னாந்து - சுற்றுலாத்துறை மற்றும் காணி அமைச்சர்)
(The Hon. Harin Fernando - Minister of Tourism and Lands)
මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මගේ මිත්‍රයා, තුෂාර ඉඳුනිල් මැතිතුමා කිව්වා වාගේ ලංකාවේ පළමුවෙනි වතාවට බංකොලොත් වෙච්ච රටක අය වැයක් තමයි ජනාධිපතිතුමාට ඉදිරිපත් කරන්න සිදු වුණේ. ඒක ඇත්ත. ඒ ගැන තර්කයක් නැහැ. බංකොලොත් රටක අය වැයක් ඉදිරිපත් කරන්න එතුමාට කොන්දක් තිබ්බාය කියන එක ඉස්සෙල්ලාම මතක තබා ගන්න. බංකොලොත් වෙච්ච රටක!

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
ජය වේවා!

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මොකද, අඩ ගහලා අතට දීපු වෙලාවේ, "හා එන්නම්; තව ටිකකින් එන්නම්; වෙලාව බලා එන්නම්; නැකැත් බලා එන්නම්" කියමින් ඇඹරෙන්න ගිය මිනිහෙක් නොවෙයි, එතුමා. මගේ මිත්‍රයා, තුෂාර ඉඳුනිල් මැතිතුමා දැන් කථා කළා.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, ඉතිහාසය පුරාම නොවැම්බර් මාසයේ අය වැයක් ගෙනෙනවා. විපක්ෂය අය වැය වැරදියි කියනවා, ආණ්ඩු පක්ෂය අය වැය හොඳයි කියනවා. ආණ්ඩු පක්ෂය අය වැය දිනනවා, විපක්ෂය පරදිනවා. ඊට පස්සේ තේ මේසයට ගිහිල්ලා තේ බොනවා. හොඳට විහිළු කරගන්නවා; ෆොටෝ ගහනවා; ගෙදර යනවා. මෙන්න, මේක තමයි අය වැයේ ඉතිහාසය. හැබැයි, මහ බැංකුවේ සල්ලි නැති කොට, මේ රටේ ආර්ථිකය බින්දුවටම වැටිලා තිබෙන කොට අය වැයක් ඉදිරිපත් කරනවා කියන්නේ තුෂාර ඉඳුනිල් මැතිතුමනි, ඔබතුමා ඔය කියන වාචාල කථා වාගේ ලේසි දෙයක් නොවෙයි. අන්න, ඒකයි වෙනස. මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මුදල් තියාගෙන හදපු අය වැයක් නොවෙයි, මේක. මේක ණය ගෙවා ගන්න බැරුව හදපු අය වැයක්.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
Sir, I rise to a point of Order. මගේ නම කිව්වා

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
නම කියපු පළියට point of Order එකක් ඉල්ලනවා නම් බොළඳයි. කමක් නැහැ. *[බාධා කිරීමක්]* දෙන්න, දෙන්න. කමක් නැහැ, මගේ මිත්‍රයා නේ, පරණ යාළුවා නේ, මයික් එක දෙන්න. අහන්න, එතුමාගේ point of Order එක මොකක්ද කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු තුෂාර ඉඳුනිල් මැතිතුමා, නම කියපු පළියට නොවෙයි, point of Order එකක් ඉල්ලන්න ඕනෑ.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමනි, ඔබතුමා මට කිව්වා, වාචාල කට කියලා. [බාධා කිරීමක්] ඔබතුමා අපේ පක්ෂයේ ඉඳලා කෑ ගහනකොට ඒක වාචාලකමක් නොවෙයිද? [බාධා කිරීමක්]

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ඉඳගන්න, ඉඳගන්න. ඔබතුමා ඔහොම කරලා හරි කමක් නැහැ, පොඩ්ඩක් ගොඩයන්න බලන්න. කමක් නැහැ.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මම පුංචි උදාහරණයක් කියන්නම්. අපි රස්සාවකට ගිහිල්ලා පළමුවෙනි වැටුපෙන් credit card එකක් ගන්නවා. ඒ credit card එකට අපි ණය ගෙවන්නේ නැහැ. එතකොට අපි CRIB list එකට වැටෙනවා. CRIB list එකට වැටුණාට පස්සේ ආයේත් කවදාවත් අපට ණයක් ගන්න බැහැ. දැන් ලංකාව ඒ තත්ත්වයේ ඉන්නේ. ලංකාවට ණයක් ගන්න බැරිව, ලංකාව ණය ගෙවන්නේ නැතිව, අපට හිතාගන්න බැරුව ඉන්න මොහොතක තමයි මේ අය වැය ඉදිරිපත් කළේ. අපට හිනා වෙනවා, අපි වාසියකට ආණ්ඩුවට ගියා කියලා. *[බාධා කිරීමක්]* නැහැ. නැහැ, අභියෝග භාර ගන්න භය නැති නිසායි අපි ගියේ. අපි අභියෝග භාර ගන්න භය නැති නිසායි ගියේ කියන එක හොඳට මතක තබා ගන්න.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, රනිල් වික්‍රමසිංහ මහත්මයා තනි මන්ත්‍රීවරයෙක්. එතුමාගේ කකුලෙන් අදින අයත් ඉන්නවා. නැතිව නොවෙයි. ඒත් මේ ගේම ගහනවා කියන එක මේ ගොල්ලන්ට හිතාගන්නවත් බැරි දෙයක්. මේ විපක්ෂයෙන් මම එක දෙයක් අහනවා. මගෙන් පස්සේ කථා කරන්න ඉන්න මගේ මිත්‍ර නලින් බණ්ඩාර ජයමහ මැතිතුමා මේ අය වැයේ අවසාන කථාව කරනවා නම් විසඳුමක් දෙන්න, මේ අය වැය මෙහෙම නොවෙයි හදන්න ඕනෑ, මේ අය වැය අපි හදන්න ඕනෑ මෙහෙමයි, ලාභය ගෙනෙන්න ඕනෑ මෙහෙමයි, වෙළෙඳ ශේෂය ඉහළ නංවන්නේ මෙහෙමයි, අපේ මුදල් සංචිත වැඩි කරගන්නේ මෙහෙමයි කියලා. කියන්නකෝ උත්තරයක්. උත්තරයක් නැතිව පුංචි කොනක් අල්ලාගෙන ඒකේ එල්ලීගෙන කෑ ගහනවා නම්, ඇත්තටම ලජ්ජයි. රනිල් වික්‍රමසිංහ මහත්මයා පාරේ යනකොට පාර වටේ ඉන්න නරි හූ කිව්වාට, බල්ලෝ බුරාගෙන පැන්නාට එතුමා හැරිලා ගල් ගහන්නේ නැහැ. භාරගත් අභියෝගය ඉදිරියට අරගෙන යන්න එතුමා කටයුතු කරනවා.

මූලසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මේ කණ්ඩායමත් එක්ක අපිත් යහපාලන ආණ්ඩුවේ හිටියා. විපක්ෂයත් ඇතුළුව මේ රටේ අපි ඔක්කෝම මේ ප්‍රශ්නවලට වග කියන්න ඕනෑ. අපිත් ආණ්ඩු කළා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ඇයි, අපි?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
නලින් බණ්ඩාර මන්ත්‍රීතුමනි, ඔබතුමා කළේ නැතිව ඇති. ඔබතුමා හිටියේ මලික් සමරවික්‍රමත් එක්ක උඩ නේ. ඒ නිසා ඔබතුමා ආණ්ඩු කරලා නැතිව ඇති.

**ගරු පියල් නිශාන්ත ද සිල්වා මහතා (ධීවර රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு பியல் நிஷாந்த த சில்வா - கடற்றொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Piyal Nishantha De Silva - State Minister of Fisheries)
උඩ හිටියා කියන්නේ ඉතින් හිතාගන්න පුළුවන්.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
නැහැ, උඩ හිටියා කියලා මම කිව්වේ, World Trade Centre එක උඩ. වෙන කොහේවත් නොවෙයි. සාමාන්‍යයෙන් එහෙම චරිතයක් නොවෙයි. *[බාධා කිරීමක්]* එහෙම නැහැ.

මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, අපේ අවසාන ජයග්‍රහණය වෙන්න ඕනෑ මේකයි. අපි ණය ගෙවන රටක් බවට පත් වෙන්න ඕනෑ. අපි පළමුවෙනි වාරිකය ලබන අවුරුද්දේ ගෙවන්න ඕනෑ. ඒ වාරිකය ගෙවන්න පුළුවන් වන විධියට රට නිර්මාණය කිරීමයි අපේ යුතුකම වෙන්නේ. ඒ නිසා 225ම මේකට වග කියන්න ඕනෑ. මේක එක්කෙනෙකුගේ පිටින් දමන්න බැහැ. මූලසුන හොබවන ගරු මන්ත්‍රීතුමනි, රනිල් වික්‍රමසිංහ මහත්මයා මොනවාද කළේ කියලා අහනවා.

මම මේ සජබ මන්ත්‍රීවරුන්ගෙන් අහනවා, රනිල් වික්‍රමසිංහ මහත්මයා අගමැති විධියට දිවුරුම් දෙනකොට අපි නොම්මර 30, මාකස් ප්‍රනාන්දු මාවතේ පිහිටි කාර්යාලයේ දවස් පහක් හම්බ වෙලා මොනවාද කථා කළේ කියලා හෘදය සාක්ෂියට අත තියලා අහන්න කියලා? නිකමට කවුරු හරි එක්කෙනෙක් බලය අරගෙන තෙල් පෝලිම නවත්තලා, ගෑස් ටික දුන්නොත් ආයේත් අපට "බඩුම" තමයි කියලා අපි කිව්වේ නැද්ද? අපි එහෙම කථා කළේ නැද්ද? හෘදය සාක්ෂියට එකඟව තට්ටු කරලා අහන්න. *[බාධා කිරීමක්]* අපි එදා ඒක කිව්වා ද නැද්ද කියලා ඔබතුමන්ලා අවංකව හෘදය සාක්ෂියෙන් අහන්න.

"අපි මේකට කර තියන්නේ නැතිව ඉඳලා, රනිල් වික්‍රමසිංහ මහත්තයා ආණ්ඩු බලය අරගෙන තෙල්, අරවා මේවා දුන්නොත් අපි විනාශයි" කියලා අපි කිව්වේ නැද්ද? අපි අවංක වෙලා බලමු. ඊට පස්සේ අපි අපේ නායකයාට කිව්වා, "අපි ඕනෑ නැහැ. සහයෝගය දෙන්න අපේ පස් දෙනෙක් දෙන්න, මේක රට වැටිලා තිබෙන වෙලාවක්" කියලා. මම ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට එහා පැත්තේ ඉඳලා අපි මේ ආණ්ඩුව විවේචනය කළා. ඒත්, රට විවේචනය වෙලා රට වැටෙන්න දෙන්න බැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දසුන් ශානක ලංකාවේ ක්‍රිකට් කණ්ඩායමේ නායකයා. මම හිතනවා, එයා හොඳයි කියලා. මනූෂ නානායක්කාර අමාත්‍යතුමා හිතනවා, එයා හොඳ නැහැ කියලා. තේනුක විදානගමගේ රාජ්‍ය ඇමතිතුමා හිතනවා, එයා හොඳයි කියලා. තවත් කෙනෙක් හිතනවා, එයා හොඳ නැහැ කියලා. හැබැයි, ලංකාව නියෝජනය කරලා ලෝක කුසලානයට තරග කරනකොට ඔහු ලංකා ක්‍රිකට් කණ්ඩායමේ නායකයා කියලා අපි පිළිගන්නවා. අන්න! රටකට ආදරේ නම්, රටක් ඇතුළේ වැඩ කටයුතු වෙන්න ඕනෑ එහෙමයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම තවත් එකක් කියන්නම්. රනිල් වික්‍රමසිංහ මහත්තයා පුංචි පුංචි දේවල්වලට කථා කරන්නේ නැහැ. පොලිසියේ කවුරුන් හෝ කාගේ හෝ බෙල්ලෙන් ඇල්ලුවොත් ඒකට උත්තර දෙන්න ඕනෑ රනිල් වික්‍රමසිංහ මහත්තයා නොවෙයි. එතුමා යම් ක්‍රමයක් හදනවා. රටට ප්‍රතිපත්තියක් හදනවා; රාමුවක් හදනවා. මේ experience එක මේ පාර්ලිමේන්තුවෙන්ම තිබෙන්නේ එතුමාට විතරයි කියලා මුළු ලෝකයම පිළිගන්නවා. ඒ නිසා අපි මේ වෙලාවේ කරන්න ඕනෑ රටට පොඩ්ඩක් හුස්ම ගන්න ඉඩ දෙන එකයි. හුස්ම ගන්න ඉඩ දෙන්නේ නැතිව පෙරේතකමින් "ඡන්දයක්, ඡන්දයක්, ඡන්දයක්" කියන්නේ ඇයි? ඇයි ඒ? රටට ආදරේ නිසා ද? එහෙම නැත්නම්, තනතුර ඉක්මනට ලබා ගෙන ඒ තනතුරේ වැජඹෙන්න ද? මට නම් ලොකු විශ්වාසයක් තිබෙනවා, හෙට විපක්ෂයට ආණ්ඩුව දුන්නොත් කරගන්න බැහැ කියලා; කරගන්න විධියක් නැහැ. එහෙම අදහසක් නැහැ. එහෙම අදහසක් තිබුණා නම්, ඒ අභියෝගය එදා භාර ගන්නවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපි හැමතැනම කියනවා, ලංකාවට system change එකක් අවශ්‍යයි කියලා. මම කියනවා, ඒක වැරදියි කියලා. System change එකක් අවශ්‍ය නැහැ, ලංකාවට. සුද්දා හදපු ක්‍රමය තමයි අද අපේ රටේ තිබෙන්නේ. ග්‍රාම නිලධාරිගේ ඉඳන් ජනාධිපතිවරයා දක්වා යන සියලු කොටස් නියමාකාරයෙන් ඒ ක්‍රමය තුළ තිබෙනවා. ඒ ක්‍රමය තුළ අපේ රට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවලට බෙදලා, වසම් 14000කට අධික ප්‍රමාණයකට බෙදලා තිබෙනවා. ටෙන්ඩර් පටිපාටි, අරවා මේවා තිබෙනවා. ඒ ක්‍රමය හරි. ඒ නිසා මිනිස්සු තමයි change වෙන්න ඕනෑ. දේශපාලඥයා තමයි change වෙන්න ඕනෑ. අරගළය වෙනුවෙන් කෑ ගහන ගමන් හාඩ්වෙයාර් එකේ මුදලාලි රුපියල් 1,200කට ගන්න සිමෙන්ති කොට්ටය රුපියල් 3,500ට විකුණනවා නම්, ත්‍රීවිල් එකේ මනුස්සයා අරගළයට ගිහිල්ලා කෑ ගහන ගමන් පෙට්‍රල් හොරකම් කරලා ලීටරයක් රුපියල් 1,500ට විකුණනවා නම්, system change කියන්නේ ඒකද? ඒ නිසා අපේ change එකක් වෙන්න ඕනෑ. දේශපාලඥයා change වෙන්න ඕනෑ. අපි හිතන විධිය වෙනස් වෙන්න ඕනෑ. රජයේ සේවකයා වෙනස් වෙන්න ඕනෑ. පෞද්ගලික අංශයේ සේවකයා වෙනස් වෙන්න ඕනෑ. අපි අවුරුදු 74කට පස්සේ මෙතැනට වැටුණේ system change එකක් නැති නිසා නොවෙයි, අපේ change එකක් නැති නිසායි. අපි ජාති විධියට, ආගම් විධියට, කුල විධියට ඒ හැම විධියකටම බෙදිලා. ඒ බෙදුණු නිසායි මේ ප්‍රශ්නය තිබෙන්නේ. අපි අපේ ආකල්පය වෙනස්කර ගන්නා තෙක් මේක හරියන්නේ නැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

අපේ විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට ඕනෑ තරම් මේ රජයට සහයෝගය දෙන්න තිබුණා, හරි. අපි අවුරුද්දකින් මේ රට ගොඩ දාමු. ඊට පස්සේ අපි ඡන්දයකට යමු කියලා. එච්චරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දෙන්න බැහැ කියපු තෙල් දැන් දෙන්නෙ නැද්ද? දෙන්න බැහැ කියපු ගෑස් දැන් දෙන්නේ නැද්ද? මම සංචාරක කර්මාන්තය භාර ගත්තේ ලංකාවේ හිටපු අන්තිම සුද්දත් ලංකාවෙන් යන වෙලාවක. මතකයේ තියා ගන්න, ඒ වෙලාවේ ලංකාවට එන flights cancel වෙලා සුද්දෝ Airport එකට පැනලා දුවන තත්ත්වයකයි රට තිබුණේ; සුද්දෝ ලංකාවෙන් ගියා.

මාස 3ක් ගතවුණා. ඒ මාස තුනේදී අමාරුම විධියට ලංකාව ගොඩ දමාගෙන ආවා. ඇත්තටම, සංචාරක කර්මාන්තයෙන් විතරක් ලංකාව ගොඩ දමන්න පුළුවන්. අපේ රට දූපතක්. අපේ රට

වටේම තිබෙන්නේ මුහුද. සියයට 33ක් තිබෙන්නේ අපේ වනාන්තර. අපේ රටේ national parks 26ක් තිබෙනවා; river bodies 109ක් තිබෙනවා. අපේ රට සශ්‍රීක රටක්; ලෝකයට පෙන්වන්න පුළුවන් රටක්. රනිල් වික්‍රමසිංහ මැතිතුමා මේ අය වැය ලේඛනයේ මොනවාද කිව්වේ කියලා අහනවා. තේරෙන්නේ නැති ගුරුවරුත් මේ සභාවේ ඉන්නවා. පවු, ගුරුවරයෙක් වුණාට තේරෙන්නේ නැහැ.

ඩිජිටල් ආර්ථිකයක් එනවා කියන්නේ මොකක්ද? ඒ තුළින් වියදම් සම්පූර්ණයෙන් කැපෙනවා. ලෝකයේ ඕනෑම රටක ඉන්න සුද්දෙකුට මේ රටට ඇවිල්ලා මෙහේ ඉඳගෙන ඩිජිටල් විධියට ව්‍යාපාර කරන්න පුළුවන්. මොකක්ද ඩිජිටල් කියන්නේ? ඇඟිලිවලින් කරන -ලස්සන පරිසරයක් ඉස්සරහ කොම්පියුටරයක් තියාගෙන Internet එකට ගිහිල්ලා තමන්ගේ බිස්නස් එක ඇඟිලිවලින් කරන ක්‍රමයක්.

මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, ප්‍රතිපත්ති තේරෙන්නේ නැති මිනිසුන්ට මේ අය වැය තේරෙන්නේ නැහැ. රනිල් වික්‍රමසිංහ මැතිතුමා පැහැදිලිව කිව්වා, මේ රට සංවර්ධනය වෙනවා දකින්න මම ජීවත් වෙන්නේ නැහැ කියලා. ඒ කියන්නේ, මේ සංවර්ධනය කරන්නේ අනාගත පරපුර වෙනුවෙන්. හැබැයි, ඒ වෙනස අපි අවුරුදු 74ක් තිස්සේ කරලා නැහැ. දේශපාලනඥයා දන්නේ විවේචනය කරන්න විතරයි. අනික් අය දන්නේ හූනු ගාන්න විතරයි. එහෙම නේ කියන්නේ. මිනිසුන්ට දේශපාලනය තිත්ත වෙලා තිබෙන්නේ.

මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, visionary leader කෙනෙක් වෙන්නේ WhatsApp Groupsවලින් නොවෙයි. ඒක කිව්වේ කාටද කියලා තේරෙයි. මනුෂ නානායක්කාර ඇමතිතුමා නම් හිනාවෙනවා. Visionary leader කෙනෙක් වෙන්නේ vision එකක් තිබෙන කෙනෙක්. Vision එකක් නැති, අභියෝගයක් භාර ගන්න බැරි කෙනෙක් visionary කෙනෙක් වෙන්නේ නැහැ. Visionary කෙනෙක් වෙන්න නම් ඉස්සෙල්ලාම අභියෝගය භාර ගන්න ඕනෑ. ඒකට හොඳම නිදසුන තමයි, රිෂි සුනක්. ඉන්දියානු සම්භවයක් තිබෙන මනුස්සයෙක් සුද්දාගේ රට, එංගලන්තය පාලනය කරනවා. එතුමා ඒ අභියෝගය භාර ගත්තා. චාල්ස් කුමාරයාගෙන් තමයි අගමැති ධුරය භාර ගත්තේ. අපටත් ඉන්නේ කුමාරයෙක් තමයි. ඒ අගමැතිතුමාට පුළුවන් වුණා, ඒ අභියෝගය භාර ගන්න. මේ ගැනත් හොඳට කල්පනා කරලා බලන්න ඕනෑ.

මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැයේ ප්‍රධාන කරුණු 3ක් සඳහන් වෙනවා. පළමුවන කාරණය ආර්ථික අර්බුදයෙන් මිදීම. දෙවන කාරණය, වේගවත් සංවර්ධන යෝජනාවලට අවශ්‍ය පදනම සකස් කිරීම. තුන්වන කාරණය, ශුභ සාධනය තුළින් ආර්ථික ක්‍රියාවලියේ මහ හැරෙන කොටස් හඳුනා ගැනීම. ඒ කියන්නේ, මේ අය වැය ලේඛනයෙන් දුප්පත් මිනිසුන් අමතක කරලා නැහැ කියන එක. ඒ මිනිසුන්ට කෙරෙන්න ඕනෑ දෙයත් අපි සොයලා තිබෙනවා. වේගවත් සංවර්ධනය කියන්නේ infrastructure එක. විදේශිකයන් ගෙන්වන්න infrastructure ඕනෑ නැහැ. ලංකාවේ ඒවා හැදිලායි තිබෙන්නේ. හැබැයි, අපි ඒ සඳහා positive message එකක් දෙන්න ඕනෑ.

මරු වැඩක් වුණා. අර නැවක් ආවා නේ. ඒ නැව ආපු වෙලාවේ ඒ නැවේ සිටි විදේශිකයන් ඔක්කොම three-wheelersවලට නංවලා, ඒවායේ ශ්‍රී ලංකා කොඩිය ගහලා, ඔවුන් ලංකාව වටේ ගෙන ගියා. කාළකණ්ණි සෙට් එකක් එදා පාරවල් 5කින් විතර කොළඹට ආවා. ඒ ගොල්ලන්ට කඳුළු ගෑස් ගහනකොට ඒ විදේශිකයන් අපි ගැන මොනවා හිතන්න ඇද්ද? ඒ සෙට් එකේ ඉන්නේ රටට ආදරය කරන මිනිස්සුද? රටට ආදරයක් තිබෙන මිනිස්සු නම් ඉඳලා ඉඳලා පළමුවන වතාවට ආපු නැවේ හිටපු විදේශිකයන් ලංකාව වටේ ගෙන යන වෙලාවේ එතැනට ගිහිල්ලා ඒකත් කඩාකප්පල් කරන්න හදයිද? ලජ්ජයි. ඒ වාගේ මිනිස්සුත් එක්ක එකට ලැග්ගා නේ! ඒ මිනිස්සු එක්ක එකට පෙළපාළි ගිහින් අන්තිමට "හූ" කියවා ගත්තා නේ. කල්පනා කරලා බලන්න.

මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මා එක කාරණයක් කියන්නම්. සජිත් ප්‍රේමදාස මැතිතුමා මා ආදරය කරන නායකයෙක්. මා බොරු කියන්නේ නැහැ. මේ ප්‍රශ්නය එද්දීත් රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගැන මා කියලා තිබෙනවා, රනිල් වික්‍රමසිංහ මැතිතුමා කියන්නේ ගුරුවරයෙක්, පියෙක් වාගේ කෙනෙක් කියලා. සජිත් ප්‍රේමදාස මැතිතුමා සහෝදරයෙක්. *[බාධා කිරීම්]* ඔබතුමන්ලා කාටත් වඩා හොඳින් මා එතුමා ආශ්‍රය කරලා තිබෙනවා. ඒ නිසා මගෙන් අහගන්න එපා. *[බාධා කිරීම්]* ඔබතුමන්ලාට වඩා හොඳින් මා එතුමා ආශ්‍රය කරලා තිබෙනවා. දැන් මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමායි, අපේ මිත්‍ර එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමායි 11වන දා හොඳ රැලියක් පවත්වනවා නේ. ඒ රැලිය පවත්වලා පෙන්වන්නකෝ.

මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, මා ඒ පක්ෂයේ සිටියා නම් සජිත් ප්‍රේමදාස මැතිතුමා අරගළකරුවෙක් කියලා position කරන්නේ නැහැ. ඕනෑම දෙයක් තිබෙන්නේ positioningවල. නායකයෙක් position කරන්න ඕනෑ. සජිත් ප්‍රේමදාස මැතිතුමා මේ රටේ අනාගත ජනාධිපති හැටියට පෙන්වන්න ඕනෑ නම්, මා අද එතුමා position කරන්නේ, කුස්සිය දිනවන, දුප්පත් මිනිහා දිනවන, දුප්පත් මිනිහාගේ ප්‍රශ්න දිනවන නායකයා හැටියට. අනේ අර සෙට් එක එතුමා එක්කගෙන ගිහින් අරගළයට දැම්මා. එතුමා අරගළකරුවකු කරන්න ගියා. සජිත් ප්‍රේමදාස මැතිතුමා අරගළකරුවෙක් නොවෙයි. අපේ දේශපාලනයේ එහෙම එකක් තිබුණේ නැහැ. අපට රට ගැන හිතන්න වෙනවා. අන්තිමට මොකක්ද වුණේ? හැම දාම නවක වදය කරන සෙට් එකක් එක්ක එතුමා දැම්මා. මාර positioning. මාර මිනිස්සු ඉන්නේ මේක ඇතුළේ.

මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි, කලින් ලංකාවට ආපු නැති Emirates ගුවන් සේවය, පසුව flights දෙකක් එවලා, අද දවසේ එය flights තුනක් දක්වා වැඩි කළා. Swiss International Air Lines ලංකාවට එනවා. Condor Airlines අලුතින් එනවා. Azur Air එනවා. තව නැවක් සංචාරකයෝ 3,000ක් අරගෙන 29වන දා ලංකාවට එනවා. හැබැයි, සමහරුන්ට මේවා දකින්න බැහැ. ඔවුන්ට මේවා කොහොම හරි වට්ටන්න ඕනෑ. ඇයි? ඉක්මනට election එකකට ගිහිල්ලා බලය ලබා ගැනීමේ සිහිනයක් තිබෙනවා. රට භාර දුන්නු වෙලාවේ භාර ගත්තේත් නැහැ. එයින් පැහැදිලිව පෙනෙන්නේ, ඊර්ෂ්‍යාව, ක්‍රෝධය, රටට ආදරය නැති තුච්ඡ දේශපාලනයයි, මූලාසන හොබවන ගරු මන්ත්‍රීතුමනි. අපෙන් අහනවා, අපි මේ පැත්තට ඇවිල්ලා ඉන්නේ කොහොමද කියලා. අපි ආණ්ඩු පක්ෂයට ආවේ, පක්ෂයක් ගැන හිතනවාට වඩා රට පැත්තෙන් හිතලායි. රට භාර ගත්ත මනුස්සයාට සහයෝගයක් දෙන්න කියලා අපි පක්ෂයට කියද්දීත් දුන්නේ නැති නිසා. මම ආයෙත් කියනවා, නායකයෙක් position කරන්න ඕනෑ. අපි හිටපු නායකයකුගේ වැරදි පෙන්වලා නායකයෙක්ව position කළාම, ඔහු ඒ position එක ලැබුණාම භාර ගන්න ඕනෑ. නායකයෙකුට ඒ දක්ෂකම තිබෙන්න ඕනෑ. නායකයෙකුට ඒක ගන්න බැරි වුණොත්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කවදාවත් බලයට එන්න බැහැ.

මම මේ විපක්ෂය ගැන තව එකක් කියන්නම්. මම දැක්කා හැමෝම වාගේ සිංදුවක් කියනවා. මගේ අදරණීය රෝහිණී අක්කත් මේ සිංදුව කිව්වා. ඒ තමයි, "ත්‍රෛලෝක විජය පත්‍ර පවන් සලන ලෝකේ වෛවර්ණ හීන පේනවා" කියන සිංදුව. ඔබතුමන්ලා දන්නවා ද දන්නේ නැහැ, ඒකේ තේරුම.

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

ත්‍රෛලෝක කියලා කියපු ගමන්, ඔබතුමන්ලා හිතුවා, හරි, අර ගහන එක තමයි මේ කියලා. ඉතින්, ඔක්කෝම එකතු වෙලා රනිල් වික්‍රමසිංහ මැතිතුමා ගෙනාපු ත්‍රෛලෝක විජය පත්‍ර යෝජනාව කියලා ඒකට ගැහුවා. හැබැයි, මේ සිංදුව කියපු නිසායි මම මෙය කියන්නේ. කවුරුත් මේ සිංදුවේ තේරුම දැනගෙන කිව්වේ නැහැ. මේ සිංදුව මගේ හොඳ මිත්‍රයකු වන මංජුල වෙඩිවර්ධන ලිව්වේ. මම ලොකු සහයෝගයක් ලබා දෙන Line One කියන සංගීත කණ්ඩායමේ - band එකේ- ෂේන් සින්ග් සහ ජනා සින්දුව කිව්වේ. ඒ සිංදුව මෙයයි.

"ත්‍රෛලෝක විජය පත්‍ර පවන් සලන ලෝකේ -
වෛවර්ණ හීන පේනවා
ත්‍රෛරෝදේ කැරකෙන මේ වෛතාල යාමේ -
සන්සුන් හීන බිඳෙනවා
ජාති ජාති පතන් ආව ආදරේ ගීතේ -
ත්‍රෛරෝදේ ඇඳිලා තියෙනවා
සංසාරේ දකින දැස ගීතෙකින් ඇහැරේ -
අපි එක තැන කැරකෙනවා

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ "ත්‍රෛරෝදේ" කියන්නේ ත්‍රිරෝද රථවලට. ඒ රථයට රෝද තුනක් නැතුව දුවන්න බැහැ. එක රෝදයක් නැතුව ගමන් කරන්න බැහැ කියන්නේ, සිංහල, දෙමළ හා මුස්ලිම් කියන ජාතීන්වලින් එකක් හෝ මහ හැරලා, අමතක කරලා, අත හැරලා, මේ සමාජයේ ඉදිරියට යන්න බැහැ කියන එකයි ඒ සිංදුවේ තේරුම. නමුත් මේ ගොල්ලන් අල්ලා ගත්තේ, අර "පවන් සලන ලෝකේ" කියන කොටස. ඒක කිව්වාම ආ, මේ ගැන සිංදුවකුත් තිබෙනවා කියලා ආතල් වුණා. අපේ රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමාත් මේක කිව්වා. රෝහිණී විජේරත්න මන්ත්‍රීතුමියත් කිව්වා. ඒකේ තිබෙනවා හොඳ තේරුමක්. "ජාති ජාති පතන් ආව ආදරේ ගීතේ" මොකක්ද ඒකේ තේරුම? සිංහල, දෙමළ හා මුස්ලිම් කියන මේ ජාතීන් ආදරය පතාගෙන ආපු අය. ඒ ජාතීන් එකට බැඳිලා ජීවත් වෙන්න ඕනෑ කියලායි කියන්නේ. සිංදුවේ අන්තිමට කියනවා, "ත්‍රෛරෝදේ ඇඳිලා තිබෙනවා" කියලා. ඒ කියන්නේ, ත්‍රි රෝදවල පිටුපස ලියා තිබෙනවා කියන එකයි. මේ ගීතයේ තේරුම දන්නේ නැතුව කියනවා. ඊළඟට තිබෙනවා, "සංසාරේ දකින දැස ගීතෙකින් ඇහැරේ - අපි එක තැන කැරකෙනවා" කියලා. ඒ කියන්නේ, මේ සංසාරේ ජාතීන් එකතුවෙලා සමගියෙන්, සමාදානයෙන් මේ සමාජයේ ඉදිරියට යන්න ඕනෑ කියලා. එහෙම නැති වුණොතින් අපි හැම දාම එක තැන කැරකෙනවා. අද ලංකාවට වෙලා තිබෙන්නෙත් ඒකයි. එක තැන කැරකෙනවා. අපි ජාතීන් වශයෙන් බෙදිලා, ආගම් වශයෙන් බෙදිලා ජීවත් වෙන්නේ. අද බණ කියන්න ඕනෑ මිනිස්සු දේශපාලනය කරනවා. දේශපාලනය කරන්න ඕනෑ මිනිස්සු බණ කියනවා. පැවිද්දෝ ගිහියෝ වනවා. ගිහියෝ පැවිදි වනවා. ඇත්තටම අද ලංකාව කැරකිලා තිබෙන්නේ. මේ රටේ මිනිස්සුන්ට තමන්ගේ මේ රට ගැනවත්, රටේ අනාගත පරපුර ගැනවත් වුමනාවක් නැහැ. වුවමනාවක් නැහැ!

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
දේශපාලනඥයන්ගේ හදවත තමයි කතා කරන්නේ.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මම දැන් ගීතයක් කිව්වා. මම දන්නවා, දැන් සජබයේ ඉතුරු වෙලා ඉන්නේ මෙච්චරයි. ඔබතුමන්ලා පොඩ්ඩක් සද්දෙ දැම්මාට කමක් නැහැ. ඔහොම යමු. මගේ කිසිම විරුද්ධත්වයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ ඉල්ලීම මෙයයි. අපි එකට වැඩ කළා. එකට මහන්සි වුණා. අපි ආණ්ඩුවක් එළවන්න ගොඩක් වැඩ කළා. හැබැයි, මේ රටට හුස්ම ගන්න තව පොඩි කාලයක් ඕනෑ කියලා තවම තේරෙන්නේ නැත්නම්, ඔබතුමන්ලාගේ දේශපාලනය පිළිබඳ පොඩ්ඩක් හිතන්න වනවා. ඔය පැත්තේ ඉඳලා මේ ආණ්ඩුව පෙරළා ගෙනම ඇමති කෙනෙක් වීම ද හොඳ. මම එදා හිතුවේ එක දෙයයි. රටක් වැටිලා, බිංදුවටම වැටිලා, ඇඹරිලා, කැරකිලා තිබෙනකොට මම ඒ ආණ්ඩුවේ ලොකු ඇමති කෙනෙක් වෙලා වැඩක් තිබෙනවා ද කියලා. මට හෘදය සාක්ෂියක් තිබෙනවා. මගේ හෘදය සාක්ෂියත් එක්ක තමයි කතා කළේ. මනුෂ නානායක්කාර ඇමතිතුමාගේ හෘදය සාක්ෂිය, මගේ හෘදය සාක්ෂිය දැක්කා. මම එතුමා එක්ක කතා කළා, ඔබතුමන්ලා එක්කත් කතා කළා. ඔබතුමන්ලා කීප දෙනෙකුත් එකතු වුණා. ඔබතුමන්ලාට ඒක නැහැ කියන්න බැහැ. අපි සටන් කළා. නමුත්, ඔබතුමන්ලාට අභියෝගය භාර ගන්න බැරි වුණා. මට ඒ අභියෝගය භාර ගන්න හයියක් තිබුණා. මගේ දේශපාලන ගමන ගැන හිතලා මම මේ තීරණය ගත්තේ නැහැ. මම තීරණය ගත්තේ රට කොහේද යන්නේ, මට මෙතැන ප්‍රශ්න තිබෙන්නේ කාගෙත් එක්ක ද කියන දේවල් ගැන හිතලා නොවෙයි. එහෙම නොවෙයි මම හිතුවේ. වගකීමක් ගන්නවා, වගකීම අරගෙන වැඩ කරනවා, වැඩ කරලා පෙන්වනවා කියලායි මම හිතුවේ. ලෙඩා මැරුණත් බඩ සුද්දයි කියලා කියමනක් තිබෙන්නේ. ඒ අනුව තමයි මම මේ තීරණය ගත්තේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මිනිසුන්ට ජීවිතේ ඉලක්ක - targets - තිබෙන්න ඕනෑ. ඒ ඉලක්කය, ඇමති කෙනෙක් වීම නොවෙයි. මගේ කෙස් සුදුවෙලා, අවුරුදු 70දි විතර ගෙදරට වෙලා ඉන්නකොට, මගේ රට කඩා වැටිලා තිබුණු වෙලාවක, මම රට වැටෙන්න දුන්නේ නැහැ, මම අභියෝගයක් ගත්තා කියන සතුට මගේ හදවතේ තියේවි කියන විශ්වාසය මට තිබෙනවා. ගරු මන්ත්‍රීවරුනි, ඔබතුමන්ලාට මගේ විෂය පැත්තෙන් මෙය කියන්නේ. අරගළය තිබෙනකොට රටේ හිටපු විදෙස් සංචාරකයෝ එළවා දමද්දි කෑ ගහපු ඔබතුමන්ලා දැන් සංචාරකයෝ එන එකට විරුද්ධයි.

එහෙම නැත්නම් ගිහින් අරගළය උඩ නැඟගෙන දෙකයි පනහේ සිල්ලර වැඩ කරන්නේ නැහැ, අනාගත ජනාධිපති. අනාගතයේ ජනාධිපති වෙන්න ඉන්න මිනිහා මේ රටට දියුණුවක් වෙනවාට අකමැති නම්, ඒ මිනිහා සිල්ලර නායකයෙක්. ඒක මතක තියාගන්න. *[බාධා කිරීම්]* මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා, මට ගහන්න කියලා ඔයගොල්ලන්ට සිය පාරක් කියනවා කියලා මම දන්නවා. ඔයගොල්ලන්ට කැමති විදියට ඔය ගොල්ලන් ගහන්න. *[බාධා කිරීම්]* ඔබතුමාගේ කථාවේ කියන්න. ළඟදී ආපු වණ්ඩි වෙන්න එපා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, *[බාධා කිරීම්]* මේවාගේ එවුන්ව බැඳලා තියන්න ඕනෑ. හරි. මේවාගේ එවුන්ව බැඳලා තියන්න ඕනෑ ඇත්තටම. කථා කරන්න දෙයක් නැහැ. සජිත් ප්‍රේමදාසව අරගළයට ගෙනිච්චේ මේ ගොල්ලන්. සජිත් ප්‍රේමදාසව අරගළයට ගෙනියලා හූ කියෙව්වේ මේ ගොල්ලන්. ඒකයි වරද.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සවුදි අරාබිය ගන්න. සවුදි අරාබිය දියුණු වුණේ ඒ රටට තෙල් තිබුණු නිසා. අපි ඉන්දියාව ගනිමු. ඉන්දියාවේ ඕනෑම airport එකකට යන්න. *[බාධා කිරීමක්]* Airport එකෙන් එළියට ගියාම හරක් ඉන්නවා වෙන්න පුළුවන්. මම කියන්නේ කකුල් හතරේ හරක්. අපේ පාර්ලිමේන්තුවේ නම් ඉන්නේ කකුල් දෙකේ හරක්. ඔය පැත්තේ කෑගහන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉන්දියාවේ airports ඔක්කෝම පෞද්ගලීකරණය කරලා තිබෙන්නේ. අදානි කොම්පැනියට අයිති airport කිහිපයක් තිබෙනවා. BP එකට අයිති airports කිහිපයක්

තිබෙනවා. හැබැයි, airport එකකට ගියාම නිව්යෝක්වලට ගියා වාගේ. අපේ Airports එක කොහොමද? මේ ළඟදී Airport එකේ කරන්ට් ගිහිල්ලා. අපි ඉන්නේ කොතැනද? රනිල් වික්‍රමසිංහ මහත්මයා මේ ඔක්කොම විකුණන්න යනවා කියනවා. රජයක් කියන්නේ බිස්නස් කරන එක නොවෙයි. දේශපාලන ප්‍රතිපත්ති හදන එක. දැන් ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය මොකක්ද? ඔබතුමන්ලාගේ දේශපාලන ප්‍රතිපත්තිය මොකක්ද කියලා කියන්න. සජබයට දේශපාලන ප්‍රතිපත්තියක් තිබෙනවාද? අපි centre-right party එකක් නම්, රනිල් වික්‍රමසිංහ මහත්මයා නියෝජනය කළේ එතැන නම්, එතුමා දකින දේශපාලන දැක්මක් තිබෙනවා. ඒ දැක්ම ඔබතුමන්ලා ළඟ නැහැ. ඔබතුමන්ලාගේ නායකයාට නැහැ. ඔබතුමන්ලා ඔතැන ඉඳන් කෑගැහුවා කියලා වැඩක් වෙන්නේනැහැ. අපි දේශපාලන ප්‍රතිපත්තිය මොකක්ද කියලා පක්ෂය ඇතුළේ කථා කළා. දේශපාලන ප්‍රතිපත්තියක් නැහැ, අපට. පෙරටුගාමියාගේ ඇඟේ නැහලා හරි, JVP කෙනාගේ ඇඟේ නැහලා හරි සෙනඟ ටිකක් පෙන්වලා, අත් දෙකම ඔසවන එක තමයි අපේ දේශපාලනය. ඒකයි අපි මෙතැනට ආවේ. ඒක මතක තියාගන්න.

ඒක නොවෙයි දේශපාලනය. ප්‍රතිපත්ති රාමුවක් ඇතුළේ ඉන්න. ප්‍රතිපත්ති රාමුව මොකක්ද? මේ වෙලාවේ ආයතන පෞද්ගලීකරණය කරන්නේ ඇයි? පෞද්ගලීකරණය කරන්නේ මේ රටේ සංචිත වැඩි කර ගන්න, ඩොලරයේ වටිනාකම අඩු කර ගන්න, ලංකාව නැවතත් බිස්නස් කරන රටක් කියලා ලෝකයට පෙන්වන්න. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සුද්දෙක්ව ලංකාවට ගෙන්වා ගන්න මොන තරම් අමාරුද? අපේ ලංකාවේ කන්න තිබෙනවාද කියලා අහනවා. අපේ ලංකාවේ මිනිස්සු මැරෙනවාද කියලා අහනවා. තෙල් තිබෙනවාද කියලා අහනවා. ඒ ඔක්කොමත් හරි. සුද්දෝ ටිකක් එනකොට ආයේත් ගිහින් උද්ඝෝෂණයක් කරනවා! මොකක්ද මේ දේශපාලනය? ඔබතුමන්ලාට තවම ප්‍රතිපත්තියක් හඳුනා ගැනීමට බැරි වීම ගැන මම ලජ්ජා වෙනවා. දැන් ලොකු ටෝක්! ලොරි ටෝක් නේ දෙන්නේ. ලොරි ටෝක් කෝටියක් දෙනවා. එහෙම නම් මේ අය වැයට, උත්තරයක්, විසඳුමක් දෙන්න.

ජනතා විමුක්ති පෙරමුණ ගත්තොත්, පාර්ලිමේන්තුවේ පැය එකහමාරක් විතර කථා කළා. ඉතින්, විකල්ප අය වැයක් ඉදිරිපත් කරන්නකෝ, දෙයියනේ! විපක්ෂය හැටියට විකල්ප අය වැයක් ගෙනැල්ලා, විකල්ප අය වැයක් ඉදිරිපත් කරන්න. මෙන්න අපේ අය වැය, අපි භාර ගත්තා නම් මෙච්චරයි කරන්නේ, මෙන්න මෙච්චරයි තිබෙන්නේ, මෙහෙමයි කරන්නේ කියලා ඉදිරිපත් කරන්න. කෝ නායකයෝ? නායකයෝ කරන්නේ එහෙමයි. නායකයෙක් මේ ප්‍රශ්නවලට විකල්පයක් දෙන්න ඕනෑ. විකල්පයක් දෙන්න බැරි නායකයෙක් යටතේ ඉඳලා ඔබතුමන්ලා ආණ්ඩුවක් ගත්තොත් ඔබතුමන්ලාට බුදු සරණයි.

මම නැවත වතාවක් කියනවා. නායකයා ඉස්සරහට තල්ලු කරන්න ඕනෑ, ඒ පක්ෂයේ ඉන්න සාමාජිකයෝ, මන්ත්‍රීවරු. "එහෙයි සර්", “Yes, Sir", "No, Sir” කියලා ඒක කරන්න වෙන්නේ නැහැ. අපි එහෙම කථා කරන්න ගිහිල්ලා තමයි අන්තිමට බෙලි කැපිලා එළියට ආවේ. ඒක මතක තියාගන්න. අපි හරි දේට හරි කිව්වා, වැරදි දේට වැරදි කිව්වා. ඒක කියන්න බැරි නම් ඔබතුමන්ලා මගේ ඇඟේ එල්ලිලා වැඩක් නැහැ. මගේ දේශපාලනය මම තීරණය කළේ රට ගැන හිතලා. රට, ආර්ථිකය, වැටුණු වෙලාවක අපි ඒකට උදවුවක් කරන්න ඕනෑ. මොකද, අපිත් මේ රටේ ජීවත් වෙන්න ඕනෑ, අපේ දරුවෝ ජීවත් වෙන්න ඕනෑ කියලා හිතපු නිසා. ඔබතුමන්ලාට එහෙම හිතෙන්නේ නැත්නම් ඒ පිළිබඳව -

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
මම කාගේවත් නමක් කිව්වේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඇමතිතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු ඇමතිතුමනි,- *[බාධා කිරීමක්]* Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Point of Order එකක්ද? මොකක්ද? ඇමතිතුමා අවසරය දෙනවාද?

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
කමක් නැහැ, විනාඩියක් දෙන්න.

**ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා**
(மாண்புமிகு துஷார இந்துனில் அமரசேன)
(The Hon. Thushara Indunil Amarasena)
ගරු ඇමතිතුමනි, ඔබතුමා වෙලාවකට කියනවා රට වෙනුවෙන් ආණ්ඩුවට ගියා කියලා. දැන් කියනවා නායකයා නිසා ගියා කියලා. හැබැයි, අපි දන්නේ ඔබතුමා ජාතික ලැයිස්තුවෙන් ගියා කියන එක. ඒ ආකාර තුනෙන් කොයි එකෙන්ද ගියේ ඔබතුමා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු හරින් ප්‍රනාන්දු ඇමතිතුමා කථාව අවසාන කරන්න.

**ගරු හරින් ප්‍රනාන්දු මහතා**
(மாண்புமிகு ஹரின் பர்னாந்து)
(The Hon. Harin Fernando)
ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මන්ත්‍රීතුමා ඒ ප්‍රශ්නය අහපු එක ගැන මම ස්තුතිවන්ත වෙනවා. අපි සෙට්වෙලා මේක ඇහුවේ. මම මොකටද ජාතික ලැයිස්තුවෙන් ආවේ කියලා ඇහුවා. මම ජාතික ලැයිස්තුව ගත්තේ, පක්ෂය මට කොච්චර බිල් ගෙවන්න තිබෙනවාද කියලා අහන්න, ඒ පක්ෂයෙන්.

මට ඒ බිල් ගෙව්වේ නැහැ. ඒ නිසා මට ඒ මන්ත්‍රීකම දුන්නා වෙන්න පුළුවන්. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා නොදන්න කරුණක් ගැන මගෙන් ඇහුවේ. ඔබතුමා දන්නේ නැත්නම් ඒකත් අද මගෙන් අහගන්න.

[ගරු හරින් ප්‍රනාන්දු මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම බදුල්ල දිස්ත්‍රික්කයෙන් ඡන්දය ඉල්ලපු හැම අවස්ථාවේම මනාප ලැයිස්තුවේ පළමුවැනියා. නමුත් මට ගම්පහ දිස්ත්‍රික්කයට යන්න ඕනෑ වුණු නිසාත්, බදුල්ලේ මිනිසුන්ගේ ඡන්දය අරගෙන ගම්පහට යන්න බැරි නිසාත් - ඒ වෙලාවේ අපි විපක්ෂයට ගිහිල්ලා ඔබතුමන්ලාගේ නායකයා විපක්ෂ නායක කර ගත්තා. ඉන්පසු මේ මන්ත්‍රීවරු ටිකට පාර්ලිමේන්තුවට එන්න හෝ ඒ පක්ෂයේ සම්පූර්ණ campaign එක කළේ, ඒ රැස්වීම් පැවැත්වූවේ කවුද කියලා ඔය ගොල්ලන්ගේ ලොක්කාගෙන් අහගන්න. ඒ නිසා, මම එතැනින් එහාට ඒ ගැන කථා කරන්නේ නැහැ.

මම ඔබතුමන්ලාගෙන් ඉල්ලීමක් කරනවා. අපි අතර වාද භේද තිබෙන්න පුළුවන්. හැබැයි ඒ ගැන හදවතින් අහලා බලන්න. මේ වෙලාවේ මේ රටට මීට වඩා විකල්ප අය වැයක් ඉදිරිපත් කරන්න අපට පුළුවන්ද කියලා කල්පනා කරලා බලන්න. ඒ නිසා, මේ රට ගැන හිතලා මාස 6ක්, මාස 8ක් රටට යන්න දෙන්න. මේ රටට හුස්ම ගන්න දෙන්න. රටේ ආර්ථිකය කැරකෙන්න දෙන්න. ණය ගෙවන්න පුළුවන් මට්ටමට පත් වෙන්න දෙන්න. එතකොට ඡන්දයකට යන්න පුළුවන්. ඒ ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.03]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, හරින් ප්‍රනාන්දු ඇමතිතුමා දීර්ඝ විග්‍රහයක් කළා. අපිට ඉතින් නොයෙක් දේවල් හිතෙනවා. බලනකොට එතුමා ජාතික ලැයිස්තුවට ගිහිල්ලා තිබෙන්නේ පක්ෂයට වියදම් කරලා, සල්ලි දීලා වාගේ අදහසකුත් එතුමාගේ කථාවෙන් ප්‍රකාශයට පත් වුණා. මම ඒක විග්‍රහ කරන්න යන්නේ නැහැ. බදුල්ලේ මිනිස්සු අහනවා, එතුමා, බදුල්ලෙන් ඡන්දෙ ඉල්ලුවා නම් මොකද වෙන්නේ කියලා. ගම්පහ මිනිස්සු අහනවා, එතුමා, ගම්පහින් ඡන්දේ ඉල්ලුවා නම් මොකක්ද වෙන්නේ කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මහාචාර්ය අමින්ද මෙත්සිල මැතිතුමා ඊයේ-පෙරේදා පැවති රූපවාහිනී වැඩසටහනකදී මේ අය වැය බොහොම සරලව විග්‍රහ කළා. එතුමා කිව්වා, "අපේ ගෙදර කෙසෙල් කැන කපාගෙන ගියාට පස්සේ උසාවියෙන් අපිටම දඩ ගහනවා වාගේ වැඩක් තමයි මේ අය වැයෙන් වුණේ" කියලා. ඒ කියන්නේ හොරාට නොවෙයි දඬේ ගැහුවේ. උසාවිය දඬේ ගැහුවේ කෙහෙල් කැනේ අයිතිකාරයාට. ඒ වාගේ අය වැයක් තමයි රනිල් වික්‍රමසිංහ මහත්මයා මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ.

2019 එතුමන්ලාගේ ශ්‍රීමතාණන් වන ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ අය වැය තුළින් රජයේ ආදායම අඩු කරගත්තා. රජයේ ආදායම අඩු කළාට පස්සේ ඒකේ වාසිය ගත්තේ වෙන කවුරුවත් නොවෙයි, මහා ජාවාරම්කාරයන් පිරිසක්. ඒ ජාවාරම්කාරයෝ පිරිස ඒ වාසිය ගත්තා. අද ඒකේ වේදනාව විඳින්න සිදු වෙලා තිබෙන්නේ රටේ ජනතාවට. ඒක තමයි ඇත්ත කතන්දරය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අය වැය ලේඛනය දිහා බැලුවාම, මේ වියදම් තාර්කික නැහැ කියලා අපිට බොහොම පැහැදිලියි. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමාගේ සුරංගනා කථා කීපයක් මේ අය වැයේ තිබෙනවා. මේ අය වැය තාර්කික නැහැ කියන්න මම ගොඩක් උදාහරණ ගන්නේ නැහැ. මම එක උදාහරණයක්, දෙකක් කියන්නම්.

මෙම අය වැය වාර්තාවේ දහවැනි පිටුවේ අංක 6 යටතේ නව ආර්ථික කලාප ඇති කිරීමට යෝජනා කර තිබෙනවා. ඒක බොහොම හොඳයි. අපි ප්‍රතිපත්තිමය වශයෙන් ඒකට එකඟයි. අපි හම්බන්තොට ආර්ථික කලාප ඇති කරන්න යන වෙලාවේ ගල් ගහපු අය කවුද කියලා අපට මතකයි. ඒ ආර්ථික කලාපය ආරම්භ කරද්දී ගල් ගහපු අය තමයි අද ආණ්ඩුව පැත්තේ ඉඳගෙන ඉන්නේ. නව ආර්ථික කලාප ඇති කරන්න කියලා රුපියල් මිලියන 300යි වෙන් කරලා තිබෙන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි බිංගිරියේ හදපු අපනයන සැකසුම් කලාපයේ යටිතල පහසුකම් ටික හදන එක අද නතර වෙලා තිබෙනවා. ඒ වෙලාවේ වියදම් කරන්න අපි වෙන් කරලා තිබුණු රුපියල් බිලියන 2ක මුදලින් භාගෙට කරපු වැඩ ටිකවත් ඉස්සරහට අරගෙන යන්න මේ රුපියල් මිලියන 300 ප්‍රමාණවත් නැහැ. ඒ පිවිසුම් මාර්ගය හදන්නවත් මේ රුපියල් මිලියන 300 ප්‍රමාණවත් නැහැ. "නව ආර්ථික කලාප" කියන වචන ටික ලස්සනයි. නමුත් රුපියල් මිලියන 300 කියන සොච්චමෙන් අද කාලයේ සිල්ලර කඩයක්වත් දාන්න බැහැ.

ඊළඟට, නව ආර්ථික කලාපවලට අමතරව, විශ්වවිද්‍යාල අධ්‍යාපනය වෙනුවෙන් රුපියල් මිලියන 200ක් වෙන් කර තිබෙනවා. රුපියල් මිලියන 200න් ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලයේ දැනට තිබෙන ගොඩනැඟිලි ටිකේවත් වැඩ ඉවර කරන්න බැහැ. වයඹ විශ්වවිද්‍යාලයේ, සබරගමුව විශ්වවිද්‍යාලයේ දැනට හදලා තිබෙන ගොඩනැඟිලි ටිකේ වැඩ ටිකවත් මේ රුපියල් මිලියන 200 වියදම් කරලා ඉවර කරන්න බැහැ. කුලියාපිටියේ ශික්ෂණ රෝහලේ මහාචාර්ය ඒකකය සහ අනෙකුත් ගොඩනැඟිලිවල වැඩ කටයුතු අවසන් කරන්න විතරක් රුපියල් බිලියන 40ක් අවශ්‍යයි. ඒ නිසා මේ වියදම් තාර්කික නැහැ කියලා බොහොම පැහැදැලිව අපට කියන්න පුළුවන්.

අපේ රටට ආයෝජන අවශ්‍යයි; අපනයන අවශ්‍යයි. ආයෝජන අවශ්‍ය නම්, අපනයන අවශ්‍ය නම් ආයෝජන ප්‍රවර්ධනය වෙනුවෙන් මුදල් වෙන් කරන්න ඕනෑ. හැබැයි ආයෝජන ප්‍රවර්ධනය වෙනුවෙන් රුපියල් බිලියන 7යි මේ අය වැයෙන් වෙන් කරලා තිබෙන්නේ. ඊට වඩා බුද්ධශාසන අමාත්‍යාංශයට මුදල් වෙන් කරලා තිබෙනවා. ඊට වඩා ජනමාධ්‍ය අමාත්‍යාංශයට මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ නිසා මේ අය වැය තාර්කික නැහැ කියලා අපට පැහැදිලිවම කියන්න පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි මහපොළ උසස් අධ්‍යාපන ශිෂ්‍යත්ව භාර අරමුදල ගැන කථා කරන්නම ඕනෑ. අපි දන්නවා, මහපොළ ශිෂ්‍යාධාරය ලබපු අය මෙතැන ඉන්නවා. එදා රුපියල් දෙදහස් පන්සියයේ මහපොළ ශිෂ්‍යාධාර මුදලින් මාසයක් ජීවත් වෙලා, ගෙදරටත් මුදලක් යැව්වා. හැබැයි, අද මොකද වෙලා තිබෙන්නේ? අද මහපොළ ශිෂ්‍යාධාරය කප්පාදු කරලා. අද මහපොළ ශිෂ්‍යාධාර මුදලින් අද ශිෂ්‍යයෙකුට මාසයක් තියා සතියක්වත් ජීවත් වෙන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. ඒකයි ඇත්ත කතන්දරය.

ආර්ථික ප්‍රතිසංස්කරණ ගැන කථා කරද්දී ඔබතුමන්ලා කියනවා, විපක්ෂයේ අපි ආර්ථික ප්‍රතිසංස්කරණවලට විරුද්ධයි කියලා. අපි ආර්ථික ප්‍රතිසංස්කරණවලට විරුද්ධ නැහැ. අපි කියන්නේ නැහැ, ආර්ථික ප්‍රතිසංස්කරණවලට විරුද්ධයි කියලා. ආර්ථික ප්‍රතිසංස්කරණවලට විරුද්ධ අය තමයි ඔය පැත්තේ ඉන්නේ. මහින්ද රාජපක්ෂ මන්ත්‍රීතුමා අද උදේ කිව්වා,

"විකුණනවාට විරුද්ධයි" කියලා. ඊළඟට කිව්වා, "ලාභ ලබන්න ට්‍රයි කරන්න ඕනෑ" කියලා. ලාභ ලබන ආයතන විකුණනවාට විරුද්ධයි කියලා එතුමා කිව්වා. එතකොට අද ඔබතුමන්ලා ඡන්දය දෙන්නේ මහින්ද රාජපක්ෂ මහත්මයා කියපු විකිණීමට විරුද්ධවද, එහෙම නැත්නම් රනිල් වික්‍රමසිංහ මහත්මයා කියපු ලාභ ලබන ආයතනත් විකිණීමට පක්ෂවද? ඔබතුමන්ලා පොඩ්ඩක් අත උස්සලා මට කියන්න, ඒක කොහොමද කරන්නේ කියලා? ඔබතුමන්ලා විකුණනවාට විරුද්ධව මහින්ද රාජපක්ෂ මහත්මයාට පක්ෂවද ඡන්දය දෙන්නේ, විකුණනවාට පක්ෂව රනිල් වික්‍රමසිංහ මහත්මයාට පක්ෂවද ඡන්දය දෙන්නේ? මහින්ද රාජපක්ෂ මහත්මයා මොනවා කිව්වත් තව ටිකකින් ඇවිල්ලා මේ අය වැයට පක්ෂව ඡන්දය දෙනවා. අපි ඒක දන්නවා. නොදන්නවා නොවෙයි. ඒ වුණාට ඒක තමයි ඇත්ත. මේ අය වැය පිළිබඳව අපට විශ්වාසයක් නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තවත් කරුණු කාරණා කිහිපයක් කියන්න තිබෙනවා. අද අපේ ආර්ථිකය හැකිළිලා තිබෙන්නේ. ඊයේ-පෙරේදා මා නියෝජනය කරන බිංගිරිය ආසනයේ මානෙලෙම්බුව ග්‍රාම නිලධාරි වසමේ රැස්වීමක් තිබුණා. මම මේ ආර්ථිකයේ හැකිළීම ගැන කථා කරනකොට, ගමේ මනුස්සයෙක් කිව්වා, "මහත්තයෝ, ඕකට අපි කියන්නේ, ගෝලෙ බෝලෙ කරනවා කියලායි" කියලා. ආර්ථිකය හැකිළීමට කියන්නේ, "ගෝලෙ බෝලෙ කරනවා" කියලා ලු. අද ගමේ මිනිසුන්ටත් තේරිලා තිබෙනවා, මේ ආණ්ඩුව කරලා තිබෙන්නේ ගෝලෙ බෝලෙ කරන එක කියලා. පැහැදිලිවම අද ආර්ථිකය හැකිළිලා තිබෙන්නේ. පෙට්‍රල් පෝලිම්, ඩීසල් පෝලිම් නැහැ කියන්නේ, ඩීසල් ටිකක්, පෙට්‍රල් ටිකක් ගහ ගන්න මිනිසුන්ට මුදල් නැහැ කියන එකයි. රටේ කර්මාන්ත දුවන්නේ නැහැ. ප්‍රවාහන - transport - පද්ධතිය නතර වෙලා, මිනිසුන්ගේ ජීවන රටාව -චක්‍රය- නතර වෙලා. හරින් ප්‍රනාන්දු ඇමතිතුමා කියන විධියේ සුරංගනා ලෝකයක් නිර්මාණය වෙලා නැහැ. අද මිනිසුන්ට තුන්වේල කන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා; දෙවේල කන්න බැරි තත්ත්වයක් උදා වෙලා තිබෙනවා. පාසල් පොත්වල මිල ගණන් වැඩි වෙලා. රුපියල් දහයට තිබුණු පෑන රුපියල් හතළිහයි; මකන කෑල්ල රුපියල් හතළිහයි. ඒ මිල ගණන් හතර ගුණයකින් වැඩි වෙලා තිබෙනවා. අද ආර්ථිකය හැකිළිලා, මිනිස්සුන්ට ජීවත් වෙන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඩීසල්, පෙට්‍රල් මිල ඉහළ ගිහිල්ලා තිබෙනවා. මිනිස්සු කොහොමද පෙට්‍රල් ගහගෙන යන්නේ? ආර්ථික එන්ජින් එක ක්‍රියාත්මක වෙන්නේ නැහැ. ඉන්ධන භාවිතය තුනෙන් එකකින් අඩු වෙලා තිබෙන නිසා තමයි අද පෙට්‍රල්, ඩීසල් පෝලිම් නැත්තේ. මහා උජාරුවෙන් කථා කරනවා. හැබැයි, දින පනස් ගණන්වලට-හැට ගණන්වලට අපි ඉන්ධන නැව්වලට ප්‍රමාද ගාස්තු ගෙවනවා. ඒවා ගැන වචනයක්වත් කථා කරන්න හරින් ප්‍රනාන්දු ඇමතිතුමා ඇතුළු ඔබතුමන්ලාට අවබෝධයක් නැහැ, ඔබතුමන්ලාට ඒවා පෙනෙන්නේ නැහැ කියන එක තමයි කියන්න තිබෙන්නේ.

අද ආණ්ඩුව මරණ පිළිබඳ සංඛ්‍යාලේඛන හංගනවා. මම ඒ තොරතුරු දැන ගන්න උත්සාහ කළා. අපේ රටේ සාමාන්‍යයෙන් වසරකට මරණ එක්ලක්ෂ පනස්දහසක්, එක්ලක්ෂ හැටදහසක්, එක්ලක්ෂ හැත්තෑදහසක් වාගේ සංඛ්‍යාවක් සිද්ධ වෙනවා. අද ඒ මරණ සංඛ්‍යාව සියයට දහයක, පහළොවක ප්‍රමාණයකින් වැඩි වෙලා තිබෙනවා. මොකද හේතුව? අපේ රෝහල්වල අත්‍යවශ්‍ය බෙහෙත් නැහැ. ඔබතුමන්ලා පුරසාරම් දොඩනවා. අඩු ගණනේ ඇමොක්සිලින් පෙත්තක් නැහැ, පැනඩෝල් පෙත්තක් නැහැ, වමනයට දෙන ඩොම්පෙරිඩොන් පෙත්තක් නැහැ. සංකූලතාවලින් ජනතාව මැරෙනවා. වසරකට වැඩිපුර සියයට දහයක් මැරෙනවා කියන්නේ, බෙහෙත් නැති නිසා වසරකට තව පහළොස්දහසක් විතර මැරෙනවා. ක්ලිනික් එකට යන්නේ ගමේ දුප්පත්ම මිනිහා. ඒ මිනිහාට අවශ්‍ය බෙහෙත් ටික නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අඩුම ගණනේ ECG එකක් ගන්න අවශ්‍ය paper rolls නැහැ, hospitalsවල. ඒ මරණවලට මේ ආණ්ඩුව වග කියන්න ඕනෑ. බෙහෙත් හිඟය නිසා වසරකට පහළොස්දහසකට වැඩි සංඛ්‍යාවක් මැරෙනවා. ඒ වාගේම අපේ රටේ ජනතාවගේ ආයු අපේක්ෂාව අඩු වෙනවා. මොකද, නිදන්ගත රෝග තිබෙන අය බෙහෙත් නැහැ කියලා පහුව දාට එක පාරටම මැරෙන්නේ නැහැ. ඒ අයගේ ආයු අපේක්ෂාව අඩු වෙනවා. ඒක තමයි ඇත්ත කතන්දරය. මේ ආණ්ඩුව පුරසාරම් දොඩනවා. හක්කේ නම් තිබෙන්නේ බුදු රැස්. හැබැයි, බොක්කේ දඩ මස්. බෙහෙත් ටිකක් නැතුව මිනිස්සු රෝහල්වල දුක් විඳින විධිය ගිහිල්ලා බලන්න ඕනෑ. වෛද්‍යවරු කියනවා, අද සිල්ලරට සතියකට තමයි බෙහෙත් ටික ලැබෙන්නේ කියලා. රෝහල්වල අවශ්‍ය උපකරණ ටික, බෙහෙත් ටික නැහැ. ඒක තමයි ඇත්ත කතන්දරය.

දැන්, මේ තත්ත්වයට වග කිව යුත්තන් ගැන කථා කරනවා. මේ රට මෙතැනට ඇදලා දැම්මේ කවුද? 1994දී අපි වියට්නාමයට, බංග්ලාදේශයට අපනයනවලිනුත් - ඩොලර් බිලියන හතරක විතර - සමානව හිටියේ. Foreign Direct Investmentsවලිනුත් සමානව හිටියේ.

1994 සිට අද වෙනකම් මේ රට පාලනය කරපු අයත් එක්ක එකට ලැග ගෙන, ලජ්ජා නැතුව අද හරින් ප්‍රනාන්දු, මනූෂ නානායක්කාර වැනි අය මේ රට හදන හැටි අපට කියලා දෙන්න හදනවා. 1994 සිට මේ දක්වා වන වසර 28න් වසර 25ක්ම පාලනය කරපු අය එක්ක ඉඳගෙන රට හදන හැටි අපට කියලා දෙන්න හදනවා.

1965දී සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය මේ රටේ තිබුණු කැල්ටෙක්ස් සමාගම සහ එසෝ සමාගම එළවා දැම්මා. ඒ එළවපු සමාගම් අද සිංගප්පූරුවේ තෙල් ඒකාධිකාරය ලබාගෙන ලෝකයේ වෙළඳ පොළ බවට සිංගප්පූරුව පත් කර ගෙන තිබෙනවා. තෙල් බින්දුවක් නැති රට අද oil market එක බවට පත් කර ගෙන තිබෙනවා. එදා ඉඳන් වැරැදි ආර්ථික න්‍යායන් ක්‍රියාත්මක කරපු පිලකුත් එක්ක තමයි අද රනිල් වික්‍රමසිංහ මහත්තයා ලැග ගෙන ඉන්නේ. විදුලිබල හා බලශක්ති ඇමති කංචන විජේසේකර මහත්තයා කිව්වා, තෙල් ටැංකි LIOC එකට දුන්න එක හොඳයි ලු! ඒ දවස්වල ඒ හිස් තෙල් ටැංකි දුන්නාම අපේ රටේ දේපොළ, අපේ රටේ සම්පත් ටික කිය කියා අඬපු පිළේ අය දැන් ඒ කරපු ඒවායේ හොඳ කියනවා. හර්ෂ ද සිල්වා මහත්මයාලා -අපි- ඒවා අද ඊයේ නොවෙයි කිව්වේ. අපි එදා ඉඳන්ම ඒවා කිව්වා. මේ ප්‍රතිපත්තිවලට තිබෙන විරෝධතාවක් නොවෙයි අපට තිබෙන්නේ. මේ ක්‍රමයට තිබෙන විරෝධතාවක් තමයි අපට තිබෙන්නේ. මේ අය වැයට අපි විරුද්ධ ඒකයි. මේ ක්‍රමය පිළිබඳ ප්‍රශ්නයක් මිසක්, ප්‍රතිපත්ති පිළිබඳ ප්‍රශ්නයක් නොවෙයි අපට තිබෙන්නේ.

එතැනදී අපි සලකා බලන්න ඕනෑ කාරණා ගණනාවක් තිබෙනවා. රත්තරන් බිජු දමන කිකිළියෝ විකුණනවාද, අලාභ ලබන ආයතන විකුණනවාද කියන එක පිළිබඳ අපට විවාදයක් තිබෙනවා. රත්තරන් බිජු දමන කිකිළියෝ වික්කාට පස්සේ මාස දෙකක්, තුනක් අපි ඒ සල්ලිවලින් ජීවත් වෙයි. හැබැයි, හැම දාම ලැබුණ රත්තරන් බිත්තරය අපට නැති වෙනවා. ඉතින්, ඒ වාගේ ආයතන විකුණනවාද කියන එක ගැන අපට ප්‍රශ්නයක් තිබෙනවා. ඒ ගැන අපේ කතිකාවක් තිබෙනවා. ඒ නිසා මේ හැම දේකටම එකඟ වෙන ආර්ථික ප්‍රතිපත්ති අපි ක්‍රියාත්මක කරන්නේ නැහැ.

දැන් ඔබතුමන්ලා අපෙන් අහනවා, බදු අය කර ගැනීම සඳහා ඔයගොල්ලන්ගේ විසඳුම් මොනවාද කියලා. මම එක දෙයක් මතක් කරනවා. අපේ රටේ තිබෙනවා යකඩ සමාගම් 21ක්. ඒ

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

යකඩ සමාගම්වලින් හරියට බදු අය කර ගන්න ඕනෑ. අපේ රට පුරාම ඉන්නවා, යකඩ එකතු කරන දුප්පත් මිනිස්සු ලක්ෂයකට වැඩි ප්‍රමාණයක්. ගෙවල් ගානේ ගිහිල්ලා යකඩ එකතු කරන අය රට පුරාම ඉන්නවා. ඒ යකඩ එකතු කරන අයට රිසිට් එකක්වත් දෙන්නේ නැහැ. හර්ෂ ද සිල්වා මැතිතුමනි, මේ යකඩ සමාගම්වල inputs එන්නේ නැහැ. ඒ ගොල්ලන්ගෙන් VAT අය කරනකොට ඒවායේ inputs එන්නේ නැහැ. එතකොට ඒවා අත්පත් කර ගැනීමේ ක්‍රමයක් නැහැ. IRD එකට ක්‍රමයකුත් නැහැ. ලොකු ලොකු අය අල්ලා ගෙන, IRD එකත් අල්ලා ගෙන, ඒ අයට සල්ලි දීලා මේ දේවල් වසා තිබෙනවා. යකඩ උණු කිරීම හරහා වසරකට රුපියල් බිලියන 20ත්, 30ත් අතර ප්‍රමාණයක් අපට අත්පත් කර ගන්න පුළුවන්. මේ සමාගම් විසින් නොගෙවන වැට් එක, සෙස් බදු, පැල් බදු අය කර ගැනීමෙන් විශාල ආදායමක් අපට ලබන්න පුළුවන්. මම ඒ සඳහා -ගණන් හදා ගන්න විධිය- ක්‍රමයකුත් කියලා දෙන්නම්. මේ යකඩ සමාගම්වල පාවිච්චි වෙන විදුලි බිල ගණනය කරගෙන, වාර්ෂිකව නිෂ්පාදනය කරන යකඩ ප්‍රමාණය සොයා ගෙන ඒ තුළින් ඔවුන්ට tax එක ගහන්න පුළුවන්; VAT එක ගහන්න පුළුවන්. පුළුවන්නම් ඒවා ක්‍රියාත්මක කරන්න. ඒක තමයි බදු අය කර ගන්නා ඕනෑ ක්‍රමය. ඒ වෙනුවට පොඩි ගණන් අරගෙන IRD එකේ නිලධාරීනුයි, හයිය තිබෙන මහ අයයි අල්ලා ගෙන, මැති ඇමතිවරු අල්ලා ගෙන ඒ කොම්පැනි ටිකේ ඒ files වසා දමා තිබෙනවා. ඒක තමයි ඇත්ත කතන්දරය.

ඊට අමතරව මම මේ කාරණය අහනවා. දැන් හරින් ඇමතිතුමා, මනූෂ ඇමතිතුමා වැනි අය කියනවා මේ රට බංකොලොත් වුණා තමයි කියලා. එතකොට, මේ රට බංකොලොත් කරපු අය දැන් කෝ? මට ඔබතුමන්ලා ඒක කියන්න. හර්ෂ ද සිල්වා මැතිතුමනි, ඔබතුමාද මේ රට බංකොලොත් කළේ? තලතා අතුකෝරල මැතිනියනි, ඔබතුමියද මේ රට බංකොලොත් කළේ? අපි නොවෙයි මේ රට බංකොලොත් කළේ. 2019 වෙනකොට මේ රට බංකොලොත්භාවයට ගමන් කරමින් හිටපු රටක් නොවෙයි. මේ රට බංකොලොත්භාවයට ඇද දාපු පිරිස තමයි ඔය පැත්තේ ඉන්නේ. මම අහන්නේ මේකයි. මේ රට බංකොලොත්භාවයට ඇද දැමූ එකට වරදකරුවන් වන්නේ මේ රටේ දුප්පත් මිනිස්සුද, මේ රටේ ගොවියාද, කම්කරුවාද, මේ රටේ සුළු ව්‍යාපාරිකයාද, මධ්‍යම පාන්තිකයාද, රජයේ සේවකයාද? පෞද්ගලික අංශයේ ලක්ෂ 8ක් ඉන්නවා. ඒ මිනිස්සු ද පළි මේ රට බංකොලාත්භාවයට ඇද දැමීමට? මේ රට බංකොලොත්භාවයට ඇද දැමීමේ වගකිවයුත්තන්ට දඬුවම් දෙන්න ඕනෑ. රනිල් වික්‍රමසිංහ මහත්තයා ළඟ ඒකට ක්‍රියාමාර්ගයක් තිබෙනවාද? 2020 ඉඳන් අපි ඒ ගැන කියනවා. නමුත්, ඒකට වගකිවයුතු මිනිස්සුන්ට දඬුවම් දීමේ ක්‍රියාමාර්ගයක් තවමත් අරගෙන නැහැ.

ඩබ්ලිව්.ඩී. ලක්ෂ්මන් කෝ? අජිත් නිවාඩ් කබ්රාල් කෝ? පී.බී. ජයසුන්දර කෝ? හිටපු මුදල් ඇමතිතුමෙකු වූ මහින්ද රාජපක්ෂ මහත්තයා මේකට වගකිව යුතුයි. ඉතින්, දඬුවම් දෙනවාද? බැසිල් රාජපක්ෂ ගිය අවුරුද්දේ හති දදා මෙතැනදී අය වැය කියෙව්වේ. හති දදා කියපු ඒ අය වැයේ ප්‍රතිඵල කෝ? මේකට වග කිවයුතු ගෝඨාභය රාජපක්ෂ කෝ? පොහොර ප්‍රතිපත්ති ගැන වැදි බණ දොඩපු පාදෙණිය දොස්තර මහත්තයා කෝ? රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමනි, ඒ අයට දඬුවම් දෙන යාන්ත්‍රණය කෝ? ඒවාට උත්තර දෙන්න. රටේ මිනිස්සු ඒකයි කියන්නේ. ව්‍යාපාරිකයා, රජයේ සේවකයා, පෞද්ගලික අංශයේ සේවකයා කියනවා, අපි බදු ගෙවන්නම්. හැබැයි, අප මෙතැනට ඇදලා දාපු එවුන්ට දඬුවම් දෙන්න කියලා. ඒකයි ඇත්ත කතන්දරය. අපි බදු ගෙවන්නම් කියලා ඒ ගොල්ලන් කියනවා. ඒ ගොල්ලන් සූදානම් බදු ගෙවන්න; ඒ ගොල්ලන් මේ බර භාර ගන්න සූදානම්; කැප කිරීම් කරන්න සූදානම්.

හැබැයි, සීනි බදු වංචාවෙන් හොරකම් කරපු අයට දඬුවම් දීපල්ලා, VAT එකෙන් හොරකම් කළ අයට දඬුවම් දීපල්ලා කියනවා. ඒ ක්‍රියාමාර්ග ගන්න අද කවුරුත් ක්‍රියාත්මක වෙන්නේ නැහැ. රනිල් වික්‍රමසිංහ මහත්තයා ඒකට ක්‍රියාමාර්ග ගන්නේ නැහැ. මම දැක්කා, අනුර දිසානායක මහත්තයාගේ ප්‍රශ්නයකට රනිල් වික්‍රමසිංහ මහත්තයා මරු කථාවක් කියනවා. හරින් ප්‍රනාන්දු ඇමතිතුමා පුළුවන් නම් මේකට උත්තර දෙන්න. රනිල් වික්‍රමසිංහ ජනාධිපතිතුමා කිව්වා, "හොරකම් ගැන ගැන හොයන්න අපි කට්ටියක් ඇරියා, ඩුබායිවලට; සාක්ෂි නැහැ" කියලා. මංගල සමරවීර මැතිතුමා අද ජීවතුන් අතර නැතත්, එතුමා අපට කියලා තිබෙනවා සාක්ෂි තිබෙනවා කියලා.ඒ පරීක්ෂණවලට ගියේ වැලිඅමුණ මහත්තයා විතරක් නොවෙයි, දිල්රුක්ෂි වික්‍රමසිංහ මහත්මියත් ගියා, පොලීසියේ නිලධාරීන් ගියා, CID එකේ නිලධාරීන් ගියා. රුපියල් බිලියනයකට ආසන්න ප්‍රමාණයක් ඩුබායිවලට අස්ථානගත කරලා තිබෙනවා, හොරකම් කරලා තිබෙනවා කියලා හඳුනාගෙන තිබුණා. ඒ අය මොකක්ද කිව්වේ? "උඹලා නඩු දාපල්ලා, නඩු දාලා වැරදිකාරයා කරලා මෙහේට වරෙල්ලා අපි ඒ සල්ලි උඹලාට දෙන්නම්" කියලා තමයි කිව්වේ. ඒක තමයි ඇත්ත කතන්දරය. පුළුවන් නම් කවුරු හරි ඒක නැහැ කියලා කියන්න. මංගල සමරවීර මැතිතුමා අද ජීවතුන් අතර නැහැ. එතුමා අපි ගරු කරන කෙනෙක්. එතුමා බොහොම පැහැදිලිව කිව්වා මේ තොරතුරු තිබෙනවා කියලා, ඒ රටේ. ඒ ගිය කණ්ඩායමට ඒක කියලා තිබෙනවා. අද වැදි බණ දොඩන අය දන්නේ නැහැ මේකේ ඇත්ත කතන්දරය.

මම හරින් ප්‍රනාන්දු ඇමතිතුමාට කියනවා වෙන මොකුත් ඕනෑ නැහැ, හරියට නීතිය ක්‍රියාත්මක කරපු ශානි අබේසේකර බේරලා දෙන්නකෝ, එයා නැවත සේවයේ පිහිටුවන්නකෝ. ඒ මනුස්සයා හරියට නීතිය ක්‍රියාත්මක කරලා, හොරුන්ට දඬුවම් දෙන්න ගිහිල්ලා, රාජපක්ෂවරුන්ට දඬුවම් දෙන්න ගිහිල්ලා තමයි කණෙන් ඇදලා එළියට දැම්මේ. අද "සොනික්, සොනික්" ගැන කථා කරන්න දෙයක් නැහැ. ඒ ගැන කථා කරලා වැඩක් නැහැ, අද "සොනික් සොනික්" නැහැ.

අපි පැහැදිලිවම දන්නවා මේ ආණ්ඩුව ඉස්සරහට යන්නේ නැත්තේ, මේ රටට පිළිගැනීමක් නැත්තේ වෙන මොකුත් හින්දා නොවෙයි, රට බංකොලොත්භාවයට ඇද දාපු වග කිව යුත්තෝ ගැන සොයා බැලීමක් නැති නිසා බව. ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමාට අපි කියනවා, පුළුවන් නම් මේවා හොයන්න ජනාධිපති කොමිසමක් දාන්න. අපි කිව්වා මුදල් සම්බන්ධව සොයන්න විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා. ඒවාට මොකද වුණේ? ඒවාට වෙච්ච දෙයක් නැහැ. බොහොම පැහැදිලිව අද ඒවා හමස් පෙට්ටියට දාලා තිබෙනවා. ඒ වෙන මොකුත් හින්දා නොවෙයි, ඒවා හෙව්වොත් ඉස්සරහට යන්න බැහැ කියලා දන්න නිසා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ ලක් මාතාව ලෙඩ ඇඳේ ඉන්නේ. අද ලක් මව හුස්ම ගන්නේ බොහොම අමාරුවෙන්. අද අපේ ලක් මව මරණාසන්න තත්ත්වයට පත් වෙලා තිබෙනවා. ඒ තත්ත්වයට පත් කළේ කවුද? මේ අප්පොච්චිලා ටික තමයි අපේ ලක් මව ඒ තත්ත්වයට පත් කළේ. ඒ අප්පොච්චිලා ටික තමයි 2019න් පස්සේ ලක් මව විනාශ කරලා, ලක් මව බංකොලොත් භාවයට ඇද දැම්මේ. ඒ අප්පොච්චිලා ටික අරගළයෙන් එළවලා දැම්මා. දෙවෙනි අප්පොච්චි, ගෝඨාප්පොච්චි අරගළයෙන් එළවලා දැම්මා. ලක් මව විනාශ කළ අප්පොච්චිලා අරගළයෙන් එළවලා දැම්මාම මේ අප්පොච්චිලා කවුරුද තෝරා ගත්තේ? කුඩප්පච්චියෙක් හොයා ගත්තා; සුළු පියෙක් හොයා ගත්තා. සුළු පියෙක් සොයාගෙන සුළු පියාට භාර දුන්නා මේක කරගෙන යමන් කියලා. හැබැයි, ඒ අප්පොච්චිලා ටික තමයි අපේ ලක් මව දූෂණය කළේ, විනාශ කළේ, ගිලන් තත්ත්වයට පත් කළේ. මේ

අප්පොච්චිලා ගැන කථා කරද්දී කියන්න තව කාරණයක් තිබෙනවා. මේ ලක් මවගේ සහෝදරයෝ ටිකකුත් ඉන්නවා. එතකොට ඒ සහෝදරයෝ මොකද කරන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි 2ක කාලයක් තිබෙනවා ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට තව විනාඩි දෙක තුනක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ සහෝදරයන්ට හොඳ කොම්පැනියක් තිබෙනවා. ඒ සහෝදරයන්ට ලාභ ලබන කොම්පැනියක් තිබෙනවා. ඒ සහෝදරයෝ මේ අප්පොච්චිලා යනකම් ලක් මව ගැන හිතන්නේ නැහැ; පැනඩෝල් පෙත්තක්වත් අරගෙන දෙන්නේ නැහැ. රුපියල් බිලියන 8ක් විතර තිබෙනවා කියනවා ඒ සහෝදරයින්ගේ ගිණුම්වල, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. කොම්පැනිය ලාභයි. හැබැයි, ලක් මවට පෙනඩෝල් පෙත්තක්වත් අරගෙන දෙන්නේ නැහැ. ඒ සහෝදරයෝ එහෙමයි. ඒ ගොල්ල බලය අරගෙන තමයි කොරන්න බලාගෙන ඉන්නේ. හැබැයි, මේ ලක් මවට පුතෙක් ඉන්නවා. හොඳ පුතෙක් ඉන්නවා ලක් මව දිහා බලන. ඒ පුතාණෝ හැම දාම මේ ලක් මව දිහා බලාගෙන ඉන්නවා. ඒ පුතාණෝ මේ ලක් මව සුවපත් කරන්න පුළුවන් හැම දේම කරනවා. ඒ "හුස්ම" වැඩසටහනෙන් වෙන්න පුළුවන්, "සක්වල" වැඩසටහනෙන් වෙන්න පුළුවන්. ඒ පුතාණෝ මේ ලක් වම සූරාගෙන කන්නේ නැහැ. ඒ පුතාණෝ බලය නැතත් ලක් මව වෙනුවෙන් කරන්න පුළුවන් හැම දේම කරනවා. ඒක තමයි පුතාණෝගේ වෙනස.

ඒ නිසා පැහැදිලිවම අපි මේ රටේ මිනිස්සුන්ට කියනවා ඒ පුතාණෝ scan කරලා බලන්න. ඒ පුතාණෝ දිහා උඩින් බලන්න එපා, යටින් බලන්න එපා, විචක්ෂණව බලන්න කියලා කියනවා. මොකද, ඒ පුතාණෝට තමයි මේ වැඩේ කරන්න පුළුවන්. ඒ වාගේම මේ රටේ දුප්පත් මිනිස්සු බලාගෙන ඉන්නවා ඒ පුතාණෝ තුන් වේල කන්න දෙන්න එනකම්, බෙහෙත් ටික දෙනකම්. දෙමළ, සිංහල, මුස්ලිම් දරුවෝ බලාගෙන ඉන්නවා ඒ පුතාණෝ මේ රට ගොඩ දානකම්. ඒ නිසා මේ රට ගොඩ දාන්න පුළුවන් වෙන කාටවත් නොවෙයි පුතාණෝට කියන එක බොහොම පැහැදිලිව කියනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටට අවශ්‍ය වෙන්නේ ඒ වාගේ රටට ආදරය කරන පුතෙක්. මේ රට ගොඩ දාන්න පුළුවන් ඒ පුතාට විතරයි. ඒ පුතාට මේ රට බාර දෙන්න, මේ රටේ දුප්පත් මිනිස්සු, කඳුකරයේ මිනිස්සු, යාපනයේ, නැඟෙනහිර, බස්නාහිර මිනිස්සු, හැම දිශාවකම මිනිස්සු, රටේම මිනිස්සු බලාගෙන ඉන්නවා.

මේ වෙලාවේ රටේ මිනිසුන්ට කෑම ටිකක් කාලා, බෙහෙත් ටික ලබා ගෙන අඩුම ගණනේ ජීවත් වීමේ අයිතියවත් ලබා දෙන්න පුළුවන් පුතාණෝ කෙනෙක් තමයි හොයන්නේ. ඒක නිසා අපි මේ රටේ ජනතාවට කියනවා, පුතාණෝ කියවන්න, හරියට බලන්න කියලා. මඩගහලා, මඩගහලා විනාශ කරන්න හදන්නේ මේ රට ගොඩ දාන්න පුළුවන් මිනිහාය කියන එක අපි මතක් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට නියමිත කාලය අවසානයි, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් ලබා දෙන්න.

හරින් ප්‍රනාන්දුයි, මනුෂ නානායක්කාරයි කිව්වා, "අපි කරන්නේ නැහැ. අපි ආසයි, බයයි" කියලා. මම මේක කියලා මගේ කථාව අවසන් කරනවා. එතුමා ඇයි බැහැ කිව්වේ කියලා මේකෙන් තේරෙයි.

"සබඳ අපි කුදු නොවෙමු - රාජපක්ෂට නැවෙන
එඩිතරව පෙරට එමු - හොරු රැලම බිම හෙළන
කිසිම බුරුලක් නොදෙමු - ජඩයන්ට හයිය දෙන
ජනතාව වෙත හැරෙමු - මළ කඳන් වී වැටෙන
නපුරු දඬුවම් නොදෙමු - අරගළය හඹා යන
සොඳුරු උත්තර සොයමු - ඇත්ත පිළිතුරු ලැබෙන"

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.යූ.එම්. අලි සබ්රි ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 22ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.23]

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා (විදේශ කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி - வெளிநாட்டு அலுவல்கள் அமைச்சர்)
(The Hon. M.U.M. Ali Sabry, PC - Minister of Foreign Affairs)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව ඉවර කරනතුරු මට වෙලාව ඕනෑ. පිළිතුරු කීපයක් දෙන්න ඕනෑ නිසා මට කාලය අවශ්‍යයි. මම ඒ ගැන කථා කරලා තිබෙන්නේ.

අපි සියලුදෙනාම දන්නවා, ලංකාව ආර්ථික වශයෙන් ඉතා අසීරු තත්ත්වයක තිබෙන පසුබිමක තමයි මේ අය වැය ලේඛනය ඉදිරිපත් කරලා තිබෙන්නේ කියන එක. ඒ පිළිබඳව අලුතින් කථා කරන්න දෙයක් නැහැ. සියලුදෙනාම දන්නවා, ඒකට විවිධ හේතු රාශියක් බලපා තිබෙන බව. විවේචනය කරන එක තරම් පහසු දෙයක් තවත් නැහැ. හතර අතට විවේචනය කරනවා. හැබැයි, ඒ විවේචන වෙනුවෙන් විකල්ප විසඳුමක් ලබා දෙන්නේ නැහැ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොවිඩ් වසංගතය සහ විශේෂයෙන්ම යුක්රේන යුද්ධය නිසා ඇමෙරිකානු ඩොලර් 45ට තිබුණු petroleum product එක ඇමෙරිකානු ඩොලර් 100ට, 120ට ගිහිල්ලා, අද වනකොට ඇමෙරිකානු ඩොලර් 80 දක්වා පහත වැටී තිබෙනවා. ගල් අඟුරු කිලෝවක් ගන්න ඒ කාලයේ අපට වියදම් වුණේ රුපියල් 24යි. අද වනකොට ගල් අඟුරු කිලෝවක් වෙනුවෙන් රුපියල් 117ක් වියදම් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. පස් ගුණයක් වැඩියි. රුපියල් 5,000කට අඩුවෙන් මිලදී ගත්ත පොහොර මිටිය අද ජාත්‍යන්තර වශයෙන් රුපියල් 20,000ට මිලදී ගන්න සිද්ධ වෙලා තිබෙනවා. අපි ආණ්ඩු කළාද, විපක්ෂය ආණ්ඩු කළාද කියලා මේවායේ වෙනසක් නැහැ. මේ අභියෝගයට අපට මුහුණ දෙන්න සිද්ධ වෙලා තිබෙනවා. එම නිසා අපි සලකා බලන්න ඕනෑ, 2023 වර්ෂය සඳහා ඉදිරිපත් කර තිබෙන ආදායම් සහ වියදම් වාර්තාව පිළිබඳව.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Order, please! මේ අවස්ථාවේදී ගරු කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

*අනතුරුව ගරු වීරසුමන වීරසිංහ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* **ගරු කථානායකතුමා** *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு வீரசுமன வீரசிங்ஹ அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. WEERASUMANA WEERASINGHE *left the Chair, and* THE HON. SPEAKER *took the Chair.*

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)

ගරු කථානායකතුමනි, 2023 වර්ෂය සඳහා ඇස්තමේන්තු කර ඇති රජයේ සම්පූර්ණ ආදායම රුපියල් බිලියන 3,415යි. සම්පූර්ණ වියදම රුපියල් බිලියන 5,819යි. ණය ගැනීමේ අවශ්‍යතාව රුපියල් බිලියන 4,979යි. එයින් ණය ආපසු ගෙවීම රුපියල් බිලියන 2,025ක් ලෙස දැක්වෙනවා.

ගරු කථානායකතුමනි, මේ වියදම් කරන මුදල් අපට අඩු කර ගන්න පුළුවන් වන්නේ කොහොමද කියලා අපි බලන්න ඕනෑ. අපි සතුව තිබෙන 2022 සංඛ්‍යාලේඛනත්, 2023 සංඛ්‍යාලේඛනත් පුරෝකථනය කළ සංඛ්‍යා ලේඛන. නමුත්, අවසාන වශයෙන් අපට සැබෑ දත්ත තිබෙන්නේ 2021 වර්ෂයේ. 2021 වර්ෂයේ සංඛ්‍යාලේඛන අනුව, අපේ සම්පූර්ණ ආදායම රුපියල් බිලියන 1,464යි, ගරු කථානායකතුමනි. සම්පූර්ණ වියදම රුපියල් බිලියන 3,522යි. ඒ කියන්නේ, රුපියල් 100,000ක ආදායමක් ලබන කොට අපට සිද්ධ වෙලා තිබෙනවා, රුපියල් 240,000ක් වියදම් කරන්න. මේක ට්‍රිලියනවලට පරිවර්තනය කළොත්, ට්‍රිලියනයක ආදායම ලැබෙන කොට ට්‍රිලියන 2.4ක් වියදම් කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේක එක රැයකින් වෙච්ච දෙයක් නොවෙයි. මේක කාලාන්තරයක් තිස්සේ වෙච්ච දෙයක්.

ගරු කථානායකතුමනි, ප්‍රධාන වශයෙන් වියදම් දිහා බැලුවොත්, 2021 වර්ෂයේ ආදායමින් පුනරාවර්තන වියදම් විතරක් රුපියල් මිලියන 2,748ක්. වියදම අඩු කර ගන්න ඕනෑ, ආදායම වැඩි කර ගන්න ඕනෑ කියලා අපි පහසුවෙන් කිව්වාට, කවුරුවත් ඒ සඳහා වන ක්‍රමයක් ගැන කියන්නේ නැහැ. ප්‍රායෝගිකව මේ වියදම අඩු කර ගන්න පුළුවන්ද? වියදම ප්‍රධාන වශයෙන් කරුණු තුනක් මත පදනම් වෙලා තිබෙනවා. ඒ කරුණු තුන තමයි, පුනරාවර්තන වියදම, ණය පොලී ගෙවීම සහ ණය වාරික ගෙවීම. ණයවලට පොලී වශයෙන් ගෙවන්න තිබෙන මුදල, මුළු ණය ආපසු ගෙවන කොට අඩු කරන්න පුළුවන්ද? තාවකාලිකව අපි අත්හිටුවීමක් කරලා තිබෙනවා. නමුත් හැම දාම ණය නොගෙවා ඉන්න පුළුවන්ද? දෙවනුව, ණය වාරික ගෙවන්න ඕනෑ. තුන්වනුව, පඩි නඩි ගෙවන්න ඕනෑ.

පුනරාවර්තන වියදම් ප්‍රධාන වශයෙන් යොදා ගන්නේ රාජ්‍ය සේවකයන්ගේ වැටුප් ගෙවන්නට, විශ්‍රාම වැටුප් ගෙවන්නට, දීමනා ගෙවන්නට, සමෘද්ධිය සහ පොහොර සහනාධාරය වැනි සමාජ ආරක්ෂණ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීමටයි. නිදහස් අධ්‍යාපනය හා නිදහස් සෞඛ්‍ය පවත්වාගෙන යන්නට. පුනරාවර්තන වියදම අඩු කළ යුතුයි යන්න ජනප්‍රිය සටන් පාඨයක් වුණත් ගරු කථානායකතුමනි, ප්‍රායෝගිකව ගත් කළ මේවා අඩු කර ගැනීමේ විශාල ප්‍රශ්නයක් තිබෙනවා. ඒක කියන තරම් ලේසි නැහැ. එසේ නම් අපි අවධානය යොමු කළ යුත්තේ මේ පුනරාවර්තන වියදම් අඩු කර ගැනීම සඳහා හෝ එසේ අඩු කරන්නේ නම් කුමන කොටසට අඩු කළ යුතු ද යන්න පිළිබඳව විමසා බලන්නටයි.

විශාල රාජ්‍ය සේවයක් අපට තිබෙනවා. අපි සියලුදෙනාම ඒක දන්නවා. දැනට ලක්ෂ 15ක පමණ රාජ්‍ය සේවකයන් ප්‍රමාණයක් ඉන්නවා. ලංකාව නිදහස ලබා ගන්නා විට පුද්ගලයන් 100කට එක රාජ්‍ය සේවකයායි අපට හිටියේ. අද පුද්ගලයෝ 14 දෙනෙකුට එක රාජ්‍ය සේවකයෙක් ඉන්නවා. මේ වාගේ රටකට මේක දරා ගන්නට බැහැ. 1994 අපිට තිබුණු රාජ්‍ය සේවයේ විශාලත්වය ලක්ෂ හයහමාරයි. පසුගිය අවුරුදු 28 ඇතුළත රාජ්‍ය සේවය 650,000 ඉඳලා 1,500,000 දක්වා වැඩිවෙලා තිබෙනවා. ගරු කථානායකතුමනි, රජය සතු ව්‍යවසායන් 420ක් පමණ අපට තිබෙනවා. 2022 වර්ෂයේ පළමුවැනි මාස 4ට පමණක් එකී ආයතනවල ශුද්ධ අලාභය බිලියන 859ක් වෙනවා. විශාල වශයෙන් පාඩු ලබන්නේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, ලංකා විදුලිබල මණ්ඩලය හා ශ්‍රීලන්කන් ගුවන් සමාගමයි. ඒ නිසා මේ ආයතන තවදුරටත් මේ රටේ මිනිස්සුන්ගේ බදු මුදලින් අපි නඩත්තු කළ යුතු ද කියන ප්‍රශ්නය මතු වෙනවා.

2021 වර්ෂයේ සංඛ්‍යාලේඛන අනුව, අපගේ සම්පූර්ණ වියදම බිලියන 4,879යි. එයින් බිලියන 1,700ක් පමණ පුනරාවර්තන වියදම් වෙනවා. පොලිය ගෙවන්නට බිලියන 1,000ක් පමණ වියදම් වෙනවා. ණය වාරිකවල මුල් මුදල වශයෙන් බිලියන 1,300ක් පමණ වියදම් වෙලා තිබෙනවා. නමුත්, පුනරාවර්තන වියදම අඩු කිරීමට කියලා අපට එකවරම රාජ්‍ය සේවය අඩු කිරීමේ හැකියාවක් නැහැ. ඒක ප්‍රායෝගික නැහැ. ඒක ක්‍රමානුකූලව හා උපාය මාර්ගිකව කළ යුතු දෙයක්.

එම නිසා අපට සිද්ධ වෙනවා, දිගින් දිගටම ණය නොගෙවා ඉන්න බැරි හින්දා වියදම් අඩු කළ හැකි තැන් මොනවාද කියලා බලන්න. පළමුවැනි පියවර හැටියට අපි cost-reflective pricing කියන සම්මතය උඩ, වියදමට සරිලන මුදලක් අයකර ගැනීම සඳහා තෙල් මිල සූත්‍රයක් හඳුන්වලා දීලා තිබෙනවා. ඒ හා සමානවම විදුලි බලයටත් අපිට ඒ දේ කරන්න සිද්ධ වෙනවා. නැත්නම් ඒක ගෙවන්නට සිද්ධ වෙන්නේ පොදුවේ මේ රටේ සිටින සාමාන්‍ය මිනිස්සුන්ගේ බදුවලින්. ඒක අපි තේරුම් ගන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, ඒ හා සමානවම ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවත්, ශ්‍රී ලංගමත් විශාල ලෙස පාඩු ලබමින් තමයි අද වන විටත් ක්‍රියාත්මක වෙන්නේ. ඒවායේත් තත්ත්වය උසස් කරලා වඩාත් හොඳ සේවාවක් ලබා දෙන්නට නම්, වියදමට සරිලන ගාස්තු නියම කිරීමේ හැකියාවක් තිබිය යුතු වෙනවා.

ගරු කථානායකතුමනි, පාර්ලිමේන්තුව හා අමාත්‍යවරු නඩත්තු කිරීමට තමයි මේ හැමදේම යන්නේ කියලා බොරු මතයක් හදාගෙන තිබෙනවා. මම ඒ සංඛ්‍යාලේඛන බැලුවාම, මේ පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් 225වත්, ඔවුන්ගේ කාර්ය මණ්ඩලවලටත්, අමාත්‍යවරුන් ඇතුළු සියලුදෙනාම එකතු කරලා බැලුවාම, ඒ සටන් පාඨය ලස්සන වුණාට, සම්පූර්ණ රජයේ වියදමින් සියයට 0.67යි ඒ අයට යන්නේ. සියයට එකක්වත් නැහැ. 0.67යි යන්නේ. ඒ නිසා සුරංගනා කථා කියලා, මිනිස්සුන් කුලප්පු කරලා මේකෙන් සම්පූර්ණ ප්‍රශ්නය විසඳා ගන්න පුළුවන් කියලා හිතන්න එපා. වියදම් අඩු කරන්න ඕනෑ නම් අඩු කරන්න ඕනෑ. නමුත්, ඒකෙන් මේ ප්‍රශ්නය දශමයක්වත් අඩු වෙන්නේ නැහැ කියන ඇත්ත සත්‍ය අපි වටහා ගන්නට ඕනෑ.

ගරු කථානායකතුමනි, අපි අනිවාර්යයෙන්ම නාස්තිය හා දූෂණය අවම කර ගත යුතුයි. ඒ හා සමානවම කාර්යක්ෂමතාව වැඩි කර ගැනීම සඳහා විදුලිය, වතුර, ගමනාගමනය හා තෙල් සඳහා වඩාත් කාර්යක්ෂම සේවාවක් හඳුන්වා දිය යුතුයි. විශේෂයෙන්ම පුනර්ජනනීය විදුලිය නැතිව අපට අනාගතයක්

නැහැ. ඒ සඳහා අවශ්‍ය අපි නීති මේ වන විටත් වෙනස් කරලා තිබෙනවා. තවදුරටත් ඒ නීති වෙනස් කළ යුතුයි. අපි විදුලි ඒකකයකට රුපියල් 130ක්, 140ක් ඩීසල් මාෆියාවට ගෙවනවාට වැඩිය, රුපියල් 20ට, 22ට පුනර්ජනනීය විදුලි බලය ලබා දෙන්න අපට පුළුවන් නම්, ඒ පනත ගේනකොට ඒකටත් විරුද්ධ වෙනවා. මහා ලොකුවට කථා කිව්වාට ඒකටත් විරුද්ධ වෙනවා.

ගරු කථානායකතුමනි, එම නිසා කුහක නොවී මේවා කරන්න ඉඩ දෙන්න, උදව් කරන්න. මේවා කරනකොට කකුලෙන් අදින්න එපා කියන එක අපි කියන්නට ඕනෑ. මොකද, පුනර්ජනනීය විදුලි බලය නැතුව රටකට ඉදිරියට යන්නත් බැහැ, අපනයනය ප්‍රමුඛ කර ගත් ආර්ථිකයක් ගොඩනහන්නටත් අපට හැකියාව ලැබෙන්නේ නැහැ, ගරු කථානායකතුමනි.

2022 වර්ෂයේ අප්‍රේල් මාසයේ අපි ණය අත්හිටුවන විට, මේ අවුරුද්දට තව දුරටත් ගෙවිය යුතු විදේශ ණය පමණක් ඇමෙරිකානු ඩොලර් මිලියන 4,330ක් තිබුණා. ඉතින්, ඒක අපට ගෙවන්න පුළුවන්ද? Moody's, S&P, ඒ හා සමානවම Fitch Ratings අපේ ණය ගෙවීමේ හැකියාව සම්පූර්ණයෙන්ම පහළට දමලා තිබුණා. අපේ ණය sustainable නැහැ කියලා IMF එකෙන් තීරණය කරලා තිබුණා. එවැනි අවස්ථාවක් තුළ අපට වෙනත් විකල්පයක් තිබුණේ නැහැ, ගරු කථානායකතුමනි. මේ වෙලාවේ හැටියට ණය අත්හිටුවලා, තිබෙන දේවල්වලින් ජීවත් වීමේ හැකියාවක් තමයි අපට තිබෙන්නේ. ඒ හින්දා තමයි අපි ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා IMF එක ඇතුළු සියලු අය එක්ක සාකච්ඡා කරමින් යන්නේ. මේ තිබෙන තත්ත්වය තුළ තිබෙන දෙයින් අඩු කිරීමේ හැකියාවක් ප්‍රායෝගිකව නැහැ.

එහෙම නම්, ඊළඟට කරන්න තිබෙන දේ මොකක්ද? ඊළඟ දේ තමයි ගරු කථානායකතුමනි, අපනයන ප්‍රමුඛ ආර්ථිකයක් ගොඩ නැඟීම, කාර්යක්ෂමතාව වැඩි කිරීම සහ යම් ප්‍රමාණයකින් බදු අය කර ගන්නට සිද්ධ වීම. 2021 වර්ෂයේ ලංකාවේ බදු ප්‍රතිශතය කෙරෙහි මම මේ අවස්ථාවේ ඔබතුමාගේ අවධානය යොමු කරවනවා. එය දළ ජාතික නිෂ්පාදනයේ කොටසක් හැටියට තිබෙන්නේ. එම ප්‍රමාණය සියයට 8.3යි. අපි ඉන්නේ ලෝකයේ 7වැනි තැනට. අඩුවෙන් බදු අය කරන අපට වඩා උඩින් තිබෙන රටවල් තමයි, සෝමාලියාව, වෙනිසියුලාව, යේමනය, හයිටි රාජ්‍යය සහ නයිජීරියාව. නයිජීරියාව සහ වෙනිසියුලාව ගත්තොත්, ඔවුන්ට තෙල් තිබෙනවා. ගරු කථානායකතුමනි, මෙවැනි රටක් අපට පවත්වාගෙන යන්න බැරි නිසා තමයි, *[බාධා කිරීමක්]* ගරු හර්ෂ මන්ත්‍රීතුමනි, ඔබතුමා ඉස්සෙල්ලා කථා කළානේ. පොඩ්ඩක් වාඩි වෙන්නකෝ. මම උත්තර දෙනවානේ.

ගරු කථානායකතුමනි, ඒ නිසා තමයි අපට tax වැඩි කරන්න සිද්ධවෙලා තිබෙන්නේ. දැන් tax වැඩි කරන්න එපා කියලානේ කියන්නේ. ගරු කථානායකතුමනි, ඒ විධියට tax වැඩි කිරීම හැර අපට වෙනත් විකල්පයක් තිබෙනවාද? ඒ නිසා තමයි අපට tax වැඩි කරන්නට සිද්ධ වෙන්නේ. එහෙම වැඩි කළත්, දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට ගත්තොත් සුබසාධනය පවා අපට වඩා tax අය කර ගන්නවා. ගරු කථානායකතුමනි, මැලේසියාව දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 16ක බදු ප්‍රතිශතයක් අය කරනවා, වියට්නාමය දළ ජාතික නිෂ්පාදනයෙන් සියයට 18.6ක බදු ප්‍රතිශතයක් අය කර ගන්නවා, එක්සත් රාජධානියේ විශාල ප්‍රශ්නයක් තිබියදීත් ඔවුන් සියයට 33ක බදු ප්‍රතිශතයක් අය කර ගන්නවා. එහෙම නම්, අපේ රටේත් යම් ප්‍රමාණයකින් බදු අය කර ගැනීමට සිද්ධ වෙනවාය කියන එක අපි හැමෝටම තේරෙනවා.

ඉස්සර වැරැද්දක් කරලා තිබෙනවා නම්, ඒක ඔයාද කළේ, මෙයාද කළේ කියමින් එකිනෙකාට බෝලය පාස් කරලා වැඩක් නැහැ. මම දන්නවා, දැන් විපක්ෂයේ ඉන්න මන්ත්‍රීවරු මේ පැත්තේ ඉන්නකොට කියනවා, සල්ලි අච්චු ගැහුවාට උද්ධමනයක් ඇති වෙන්නේ නැහැ කියලා. මේ පැත්තේ ඉන්න අයත් ඒකම කියනවා. ආණ්ඩුවේ ඉන්නකොට එක මතයකුත්, විපක්ෂයේ ඉන්නකොට තව මතයකුත් ඉදිරිපත් කරනවා. මේක කරන්න කියලා ඒ ගොල්ලන්ට භාර දුන්නාම, භාර අරගෙන කරන්නේත් නැහැ, දුවනවා. ඉතින්, භාර ගත්ත අයට එකතුවෙලා වැඩ කරන්න දෙන්නේත් නැහැ.

ගරු කථානායකතුමනි, අපි කීපදෙනෙකුටම කථා කළා. මහ බැංකුවේ අධිපතිතුමායි, මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමායි යවලා, වාඩිවෙලා කථා කරලා, තොරතුරු ටික දීලා කිව්වා, "මේක භාරගෙන කරන්න, අපි උදව් කරන්නම්" කියලා. "අපෝ! අපට භාර ගන්න බැහැ" කිව්වා. කරන මිනිහාට කරන්න දෙන්නේත් නැහැ. මොකක්ද කරන්න කියන්නේ? මේ රට විනාශ කරන්න දෙන්නද කියන්නේ? *[ඝෝෂා කිරීම්]* ගරු කථානායකතුමනි, මේ අය නිකම් බොරුවට දොඩවනවා. කතිනවා විතරයි. ඔහේ දොඩවනවා.

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවේ වක්‍ර බදු ප්‍රතිශතය සියයට 80යි, ඍජු බදු ප්‍රතිශතය සියයට 20යි. *[ඝෝෂා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. ගරු මරික්කාර් මන්ත්‍රීතුමා, නිශ්ශබ්ද වෙන්න.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
අහගෙන ඉන්න, අහගෙන ඉන්න. ඉන්දියාව ගත්තොත්, වක්‍ර බදු ප්‍රතිශතය සියයට 46යි, ඍජු බදු ප්‍රතිශයත සියයට 54යි. ඉතින්, අපිත් තිබෙන මිනිස්සුන්ගෙන් බදු ටිකක් ගත්තාට මොකක්ද වෙන්නේ? අපට මොනවාද කරන්න කියන්නේ?

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)
ඒකට කැමති නැහැ.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ඒකට කැමැති නැහැ. මේ අය කෑ ගහලා මහ ලොකුවට මොනවාද කියන්නේ? බදු ගන්න එපා කියලාද කියන්නේ? බදු ගන්න එපා කියන්නේ, ඍජු බදු ගන්න එපා කියන එකයි. ඍජු බදු ගන්න එපා කියන්නේ, සල්ලි තිබෙන මිනිහාට කරදර කරන්න එපා, පහළ මිනිහාගෙන් තවත් සූරාගෙන කන්න කියන එකයි. ඒක කරන්නද කියන්නේ? (18th start)

ඒක තමයි කියන්නේ! *[බාධා කිරීම්]* ගරු කථානායකතුමනි, වියට්නාමය ගත්තොත් ජනගහනයෙන් සියයට 34ක් බදු ගෙවනවා. මැලේසියාවේ ජනගහනයෙන් සියයට 7.1ක් බදු ගෙවනවා. ඉන්දියාවේ ජනගහනයෙන් සියයට 4.2ක් බදු ගෙවනවා. ගරු කථානායකතුමනි, ලංකාවේ සම්පූර්ණයෙන්ම -

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මට ප්‍රශ්නයක් අහන්න පුළුවන් ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඉඳගන්න. ඔබතුමා කථාවක් කළා නේ.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ලංකාවේ register වෙලා තිබෙන income tax files තිබෙන්නේ, 507,000යි. ඒක ජනගහනයේ ප්‍රතිශතයක් හැටියට සියයට 2.4යි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ගරු කථානායකතුමනි, මට ප්‍රශ්නයක් අහන්න පුළුවන් ද?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇමතිතුමා එකඟ නම්, ඔබතුමාට අහන්න පුළුවන්. නමුත් මේ වෙලාවේ එතුමා පිළිතුර කථාව නේ කරන්නේ. කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ඔබතුමා කථා කළා නේ. කරුණාකරලා වාඩි වෙන්න. *[බාධා කිරීම්]* මේ මගේ අවස්ථාව. වාඩි වෙන්න. කථා කළා නේ, වාඩි වෙන්න. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඇමතිතුමා පිළිතුරු කථාව කරන්නේ.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ඔබතුමා පැයක් විතර කථා කළා නේ. *[බාධා කිරීම්]* පැයක් විතර කථා කළා; විසඳුමක් දෙන්නේ නැහැ. බණිනවා. හැම එකකම වැරැදියි කියනවා. කාට ද ඒක කියන්න බැරි.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
ඔබතුමාගෙන් මේකත් අහන්න ඕනෑ. ගෝඨාභයට advice දුන්නේ කවුද?

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ලංකාවේ income tax files 507,000ක් තිබෙනවා. බදු ගෙවලා තිබෙන්නේ, 30,000යි. ඉතින් එහෙම තිබෙන කොට අපි කොහොම ද මේ රට ඉදිරියට ගෙන යන්නේ?

ගරු කථානායකතුමනි, මම විශේෂයෙන්ම කියන්නට ඕනෑ මේ ළඟදී දේශීය ආදායම් බදු (සංශෝධන) පනත් කෙටුම්පත - Inland Revenue (Amendment) Bill එක - අභියෝගයට ලක් කළා. "මේ බදු වැඩියි, අසාධාරණයි. ඒ නිසා බදු වැඩි කිරීම නැති කරන්න" කියලා තමයි අධිකරණයෙන් ඉල්ලුවේ. ඔබතුමා එහි නිරීක්ෂණ මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළා. එහිදී Supreme Court එකෙන් ඉතා හොඳ ප්‍රතිපත්ති තීන්දු දෙකක් ලබා දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මම ඒ තීන්දුව ප්‍රකාශ කරන්නම්. In page 28 of its Determination, the Supreme Court states, I quote:

"In fact, the learned DSG drew the attention of Court to the proposed tax structure and submitted that the proposed tax rates appear excessive only because the Petitioners sought to compare it against the reduced tax rates introduced in 2021."

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
So, who did it?

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ඉන්නකෝ ඒක කියන්නවත් දෙන්නේ නැහැ නේ. අයියෝ! මොකක් ද මේ? පහේ පන්තියේ ළමයිවත් කරන්නේ නැති දේවල් නේ මේ කරන්නේ. හොඳ ඉස්කෝලවලට ගියා කියලා වැඩක් නැහැ, මේක තේරෙන්නේ නැත්නම්. එහි තවදුරටත් කියනවා,

"We are not privy to the reasons for the introduction of the reduced tax rates in 2019 and 2021. Nevertheless, they have been identified as a grave error that has eroded government revenues. It is wrong to assess the constitutionality of the proposed tax system on the basis of a prior tax system that has proven to be economically flawed."

ගරු කථානායකතුමනි, එතුමන්ලා දැනුත් කිව්වා, වැරැදියි කියලා. වැරැදි තමයි. එහෙම නම් වැරැද්ද නිවැරැදි කර ගන්නේ නැද්ද? ඒ වැරැද්ද තවදුරටත් වැඩි කරනවා ද? ශ්‍රේෂ්ඨාධිකරණය කියන්නේ පමා වෙලා හරි මේ වැරැද්ද නිවැරැදි කර ගන්න කියලා. *[බාධා කිරීම්]*

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
එච්චර කල් මොනවා ද කළේ?

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
ගරු කථානායකතුමනි, ඊට පස්සේ ශ්‍රේෂ්ඨාධිකරණය ඉතා හොඳ නිරීක්ෂණයක් සහ example එකක් ලබා දීලා තිබෙනවා. ගරු කථානායකතුමනි, මහාධිකරණ විනිශ්චයකාරවරුන් සහ දිසා විනිසුරුවරුන්ගේ සංගම් ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා කිව්වා, "ඔවුන්ගෙන් ගන්න tax එක වැඩි කරන්න එපා. ලැබෙන ප්‍රමාණයට වඩා tax වැඩි කළාම ඒක අධිකරණයේ ස්වාධීනත්වයටත් බලපාන්න ඉඩ තිබෙනවා" කියලා. නමුත් ශ්‍රේෂ්ඨාධිකරණය ඒක පිළිගත්තේ නැහැ. ඒක ඉතා වැදගත් දෙයක්. ඔවුන් විසින්ම ඔවුන් පිළිබඳ හොඳ පණිවුඩයක් දෙනවා.

The Determination further states, I quote:

"In a welfare state, public finances must sustain free public services such as education and health and other subsidized services. We are of the view that there is no logical reason as to why judges should not be called upon to contribute on a non-discriminatory basis, directly or indirectly, to the State coffers along with other members of the public despite the differences identified above. These

differences do not have a rational relationship to the purpose of taxation, which is to increase government revenues. The public services provided through public funds are available to all judicial officers."

Then again, it also goes on to state, I quote:

"We are of the view that the reasoning in the above cases is logical and instructive on the issue of taxes on the salaries of judges. When a tax is applied across the board, as in this case, without directly or indirectly targeting the judges, it cannot be said to be an intrusion into the independence of the judiciary. Taxes are one of the main revenues generating measures to enhance public finance. Public services such as free health and free education in this country are run with public finance. They are open to all citizenry including judges of the superior courts and Judicial Officers within the meaning of Article 111 M of the Constitution. In fact, the decision of this Court in Chathurika Silva is premised on the legitimate expectation that judges have of admitting their children to State schools. Hence there is no logical reason to exempt judges from making their contribution to the public coffers along with the other members of the community. To that extent, the classification is Judges should have the same obligations as other citizens on taxing matters."

එතකොට judgesලාට ඉතා හොඳ පණිවුඩයක් දෙනවා. මම හිතනවා, මේක තේරුම් අරගෙන කටයුතු කරාවි කියලා. Judgesලාගේ පඩිය ආණ්ඩුවෙන් ගෙවන්නේ. අඩු කරන්න බැහැ; under-invoice කරන්න බැහැ. ඔවුන් සියලුදෙනාම මේක එක හා සමානව රජයට ගෙවිය යුතුයි; එහෙම තමයි නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය පවත්වාගෙන යන්න පුළුවන් කියලා ශ්‍රේෂ්ඨාධිකරණය කියනවා. එහෙම නම්, මේකෙන් අපි පාඩමක් ඉගෙන ගන්නට ඕනෑ. හැම professional කෙනෙක්ම, හැම businessman කෙනෙක්ම තමන්ගේ යුතුකමත් ඒ හා සමානවම ඉෂ්ට කරලා රටේ tax ටික ගෙවලා මේ රටේ නිදහස් අධ්‍යාපනයයි, නිදහස් සෞඛ්‍ය සේවයයි ආරක්ෂා කර ගන්න කියන එක තමයි මේ නොකියා කියන්නේ. ව්‍යතිරේකයකින් තොරව ඒ වගකීම දරන්න කියන එකයි මේ කියන්නේ.

ගරු කථානායකතුමනි, 2021 වර්ෂය වෙනකොට අපි අල්ලස හා දූෂණය පැත්තෙන් 102 වන තත්ත්වයට පත්වෙලා තිබෙනවා. ඉතාම පහළට ගිහිල්ලා තියෙනවා. ඒක එක තැනකට සීමා වුණු දෙයක් නොවෙයි. ඒක දේශපාලනඥයාට විතරක් සීමා වෙච්ච දෙයක් නොවෙයි. ගරු කථානායකතුමනි, ඉතාම වැදගත් දෙයක් කියන්න ඕනෑ. අපි පුරුද්දක් කරගෙන තිබෙනවා, එකිනෙකාට ඇඟිල්ල දිගු කර ගන්න එක. ඔය විධියට ඇඟිල්ල දිගු කරගෙන කරගෙන ගිහිල්ලා අවසාන වශයෙන් ඇඟිල්ල දිගු කරයි කුවේණිට. ලංකාවට විජය කුමාරයා ආවේ නැත්නම් මේ ප්‍රශ්න මොකුත් නැහැ කියයි. ගරු කථානායකතුමනි, මේ ඇඟිල්ල දිගු කිරීමෙන් අපේ ප්‍රශ්නවලට උත්තර ලැබෙන්නේ නැහැ. මේ තියෙන්නේ ඒ වාගේ එක කර්තව්‍යයක්. ගරු කථානායකතුමනි, *[බාධා කිරීම්]* අහගෙන ඉන්න කෝ.

ගරු කථානායකතුමනි, 2022 වර්ෂයේ නොවැම්බර් මාසයේ 1වෙනි දා "Daily FT" පත්‍රයේ පළවුණු වාර්තාවක් මම උපුටා දක්වනවා. ඒ වාර්තාවට අනුව, under-invoice කරලා Sri Lanka Customs එක අල්ලාගෙන, ලංකාවෙන් පිටට යවලා තියෙන මුදල්වල ප්‍රමාණය Global Financial Integrity එකෙන් ගණන් හදනවා, පසුගිය අවුරුදු නවයට -2009 - 2017ට- ඇමෙරිකානු ඩොලර් බිලියන 36ක් කියලා! මේක මේ දේශපාලනඥයන් කරන දෙයක් විතරක් නොවෙයි. ඒ හින්දා එකිනෙකාට ඇඟිල්ල දිගු කරන එක නොවෙයි කරන්න ඕනෑ. මේකට වගකිව යුතු සියලුදෙනාම ශ්‍රී ලාංකිකයෝ හැටියට, පුරවැසියෝ හැටියට තමන්ගේ යුතුකම ඉෂ්ට කරන්න ඕනෑ. අර judgesලා දීපු උදාහරණය හැටියට තමන්ගේ ශක්ති ප්‍රමාණයෙන් tax ගෙවනතුරු අපට මේ රට ගොඩදාන්න බැහැ කියන එක තමයි මේකෙන් අපට ගන්න පුළුවන් පණිවුඩය. ගරු කථානායකතුමනි, මම මේ ලේඛනය **සභාගත*** කරනවා. කවුරුවත් කියන දෙයක් නොවෙයි මෙය, Global Financial Integrity එකෙන් කරපු finding එකට අනුව 2009-2017 වෙනතුරු unofficially under-invoice කරලා පිටරටවල ඩොලර් තියා ගත්ත අයගේ මුදල්වල එකතුව ඇමෙරිකානු ඩොලර් බිලියන 37යි.

ගරු කථානායකතුමනි, අපි හැමෝටම බණිනවා. අද අපි මොනවාද කරන්නේ? විශ්වවිද්‍යාලයකට තරුණ ප්‍රජාව ආපු ගමන් මොකද කරන්නේ? ලංකාවේ ඉන්න හොඳම දරුවෝ ටික තමයි විශ්වවිද්‍යාලයට තෝරා ගන්නේ. ඒ දරුවෝ ටික විශ්වවිද්‍යාලයට ආපු ගමන්ම ඔවුන්ට මුල ඉඳලාම තෙල් බෙදනවා. ඔවුන්ට ඉංග්‍රීසියෙන් ඉගෙන ගන්න දෙන්නේ නැහැ. කම්පියුටර් එකක් අල්ලන්න දෙන්නේ නැහැ. Library එකකට ගිහිල්ලා පාඩම් කරන්න දෙන්නේ නැහැ. Research එකක් කරන්න දෙන්නේ නැහැ. ඔවුන් අල්ලාගෙන ඔවුන් පාරට බස්සනවා. පාරට බස්සලා හැම දාම පෙළපාළි. හැම දාම උද්ඝෝෂණ. ඊට පස්සේ කට පාඩම් කරලා මොනවා හරි course එකක් කරලා එළියට යනවා, degree එකක් අරගෙන. විශ්වවිද්‍යාලයේ අවුරුදු තුනක් ඉන්න අය අවුරුදු 6, 7ක් ඉඳලා තමයි එළියට යන්නේ, ජාතික සම්පත් විනාශ කරලා. එළියට ආවාට පස්සේ ඔවුන්ට රස්සාවක් හොයා ගන්නට බැහැ. ඊට පස්සේ ඔවුන්ම හදා ගන්නවා රැකියා විරහිත උපාධිධාරි සංගමය කියලා එකක්. ඊට පස්සේ බලහත්කාරයෙන් මිනිස්සුන්ට කථා කරලා ආණ්ඩුවේ රස්සාවලට පුරවනවා; දරා ගන්න බැරි මිනිස්සු සංඛ්‍යාවක් ආණ්ඩුවේ රැකියාවලට යනවා. ඊට පස්සේ වැඩක් නැතිකොට ඒ ගොල්ලන් unions හදාගන්නවා. Unions හදාගෙන මොකද කරන්නේ? කළ යුතු වෙනස්කම් වත් කරන්න දෙන්නේ නැහැ. මේකට හැමෝම වග කියන්න ඕනෑ. මේ සියලු දෙනාම වග කියන්න ඕනෑ. කිහිප දෙනෙකුට විතරක් මේ වගකීම පවරලා මේ වැඩේ කරන්නට බැහැ.

ගරු කථානායකතුමනි, මා කියපු ආකාරයට වියදම් අඩු කරගන්න ක්‍රමවේදයක් අපට නැත්නම් ආදායම වැඩි කරනවා මිස වෙන මොනවාද කරන්න තිබෙන්නේ? මේකට විරුද්ධව තිබෙන විකල්පය මොකක්ද? කියන්නකෝ විකල්ප. එක එක වාර්තා ඉදිරිපත් කරනවා මමත් දැක්කා. හැම වාර්තාවකම කරුණු කියනවා; මතය ප්‍රකාශ කරනවා. කවුරුහරි කියනවාද මේකට විරුද්ධව වෙනත් විකල්පයක්? කිසිම විකල්පයක් නැහැ. විකල්ප නැතිකොට දැන් කියනවා, "ක්‍රමය හරි, vision එක හරි. නමුත්, ක්‍රියාදාමය පිළිබඳ ප්‍රශ්නයක් තියනවා" කියලා. ක්‍රියාදාමය හදලා කරන්න ඉඩ දෙන්නකෝ. ගරු කථානායකතුමනි, මේක සිනිබෝල විකුණන, අයිස්ක්‍රීම් බෙදන අය වැයක් නොවෙයි. හැමෝටම පඩි වැඩි කරලා, බඩු මිල අඩු කරලා, උද්ධමනය වැඩි කරපු අය වැයක් වෙනුවට යථාර්ථවාදී අය වැයක් ඉදිරිපත් කර තිබෙනවා.

බ්‍රිතාන්‍යයේ නව අගමැතිවරයා වන රිෂී සුනාක් මහත්මයා මෑතකදී කියපු කාරණයක් මා කියන්නම්. He said,

"Leadership is not selling fairy tales, it is confronting challenges and that is what the public will get from this government."

This is also a Budget brought to confront the challenges, not to sell fairy tales. That is exactly what this Budget is about.

ගරු කථානායකතුමනි, ලෝකයේ අනෙක් රටවල මෙන්ම අපනයනය මත පදනම් වුණු ආර්ථිකයක් ගොඩ නැඟීම පිළිබඳව

---

* **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා]

අප අවධානය යොමු කළ යුතු වෙනවා. බොහෝ කලාප දියුණු වන්නේ එකට. උදාහරණයක් හැටියට ආසියානු කලාපය එකට දියුණු වුණා; Middle East, එකට දියුණු වුණා; උතුරු ඇමෙරිකාව එකට දියුණු වුණා; යුරෝපය එකට දියුණු වුණා. අපි ඒ බව දන්නවා. අප පිළිගත්තත්, නැතත් දැන් ඉන්දියාව විශාල දියුණුවකට පත් වෙමින් යනවා. ඉන්දියාව මේ අවුරුද්දේ ලෝකයේ හයවැනි විශාලතම ආර්ථිකය. එය ලබන අවුරුද්දේ ලෝකයේ පස්වැනි විශාලතම ආර්ථිකය වෙනවා, බ්‍රිතාන්‍ය පරදවා. 2030 වනකොට ලෝකයේ තුන්වැනි විශාලතම ආර්ථිකය වෙනවා. එහෙම නම්, අපි ඉන්දියාවත් එක්ක ගනු දෙනු කළ යුතුයි. ලංකාවේ පුනර්ජනනීය විදුලි බලය නිපදවීමේදී ඉන්දියාවේ සහය ලබාගත යුතුයි. World Bank එක වාර්තාවක් ඉදිරිපත් කරමින් සඳහන් කර තිබෙනවා, දකුණු ආසියානු කලාපය තුළ විදුලිබල ක්ෂේත්‍රයේ ඉන්දියාවේ ඉහළ දායකත්වය සම්බන්ධයෙන්. ඉන්දියානු කලාපය තුළ එම ක්ෂේත්‍රයෙන් අතිවිශාල දායකත්වයක් ඉන්දියාව ලබා දෙනවා. ලංකාව ද බලශක්ති ක්ෂේත්‍රයේ ඉදිරියට ගෙන යෑම සඳහා මෙම අය වැයෙන් විශාල උනන්දුවක් දක්වා තිබෙනවා.

ඒ හා සමානවම අපට සිද්ධ වෙනවා අපනයන මත පදනම් වුණු ආර්ථිකයක් ගොඩ නඟන්නට. ගරු කථානායකතුමනි, 2001 වර්ෂයේදී ලංකාවේ ආර්ථිකයෙන් දළ ජාතික නිෂ්පාදනයේ ප්‍රතිශතයක් හැටියට අපනයනය සියයට 33ක් තිබුණා. අද වනකොට එය සියයට 14.5කට පහත වැටිලා තිබෙනවා. ඒකට හේතුව තමයි ආරක්ෂණකාරී පියවර නොගැනීම. එම තත්ත්වයෙන් මිදිලා, එතුමන්ලාත් හැම වෙලාවේම කියන ආකාරයට තරගකාරී ආර්ථිකයට මුහුණ දිය හැකි විවෘත ආර්ථිකයක් නිර්මාණය කරලා ලෝකය ජයගැනීමේ හැකියාව අපට තිබෙනවා. හොංකොං නුවර සහ තායිවානය කොහොමද චීනයට දොරටුවක් වුණේ? සිංගප්පූරුව කොහොමද සම්පූර්ණ ආසියාවට දොරටුවක් වුණේ? ඩුබායි රට කොහොමද Middle Eastවලට හා අප්‍රිකාවට දොරටුවක් වුණේ? ඒ ආකාරයට ලංකාවටත් පුළුවන් මේ සම්පූර්ණ කලාපයටම දොරටුවක් වෙන්න. ඒ සඳහා අඩි තාලම දැමීමට විශාල වැඩ පිළිවෙළක් මේ අය වැය තුළින් ඉදිරිපත් කර තිබෙනවා කියන කාරණය කියන්න ඕනෑ.

ගරු කථානායකතුමනි, දැන් IMF එක සම්බන්ධයෙන් විශාල වශයෙන් කරුණු ප්‍රකාශ කළා. මීට ඉස්සෙල්ලා හැමෝම කිව්වා IMF එකට යන්න කියලා. කැබිනට් මණ්ඩලයේ එකම එක අමාත්‍යවරයායි -අපේ ගරු වාසුදේව නානායක්කාර හිටපු ඇමතිතුමා විතරයි- ඒකට විරුද්ධ වුණේ. IMF එකට ගියාම, දැන් IMF එක මොනවාද අපට කියා තිබෙන්නේ? IMF එක කියා තිබෙන මේ කරුණුවලට අපට විරුද්ධ වෙන්න අවශ්‍යතාවක් තිබෙනවාද? බදු ප්‍රතිපත්තිවල වෙනසක් ගැන කියනවා. හැමෝම කියනවා, පැරණි බදු ප්‍රතිපත්ති වැරැදියි කියලා. වියදම හා ගැළපෙන මිල ගණනක් ගැනත් කියනවා. ඇත්ත නේ දෙයියනේ! පෙට්‍රල් ගහගෙන කාර්වලින් යන්නේ සල්ලි තිබෙන මිනිස්සු. ඉතින් ඒ අය ඒක ගෙවන්නට ඕනෑ. කවදාවත් කාර් එකකට නැඟලා නැති මිනිස්සු මොකටද ඒකට ගෙවන්නේ? දරිද්‍රතාවෙන් පෙළෙන අය සඳහා වන සමාජ ආරක්ෂණ යන්ත්‍රණයක් ගැනත් කියනවා. ඒ කියන්නේ, දුප්පත් මිනිසුන්ට යම්කිසි මුදලක් දෙන්න කියන එක; cash transfer එක දෙන්න කියන එක; සමෘද්ධිය දෙන්න කියන එක. ඒ සඳහා තමයි අප මෙවර අය වැයෙන් වැඩිම මුදලක් වෙන් කරලා තිබෙන්නේ.

ඒක නරකද? ඊළඟට, සටන් පාඨ හා සුරංගනා කථාවලින් තොර, දත්ත මත පදනම් වූ මූල්‍ය ප්‍රතිපත්තියක් ඉදිරිපත් කර තිබෙනවා. බයිලා නොකියා, research and development මත පදනම් වූ ප්‍රතිපත්ති හදන්න කියන එකයි කියන්නේ. *[බාධා කිරීමක්]* මහ බැංකුවේ ස්වාධීනත්වය ආරක්ෂා කරන්න කියලා තිබෙනවා. ඊට පසුව, තිරසාර ප්‍රතිපත්තියක් තුළ හොරකම හා දූෂණය වළක්වන නීති ගෙනෙන්න කියලා තිබෙනවා. ඉතින් මේකට විරුද්ධ වෙන්න පුළුවන්ද? IMF එක කිව්වත්, නැතත් මේවා අපි කරන්න ඕනෑ දේවල්. IMF එක වෙන මොකක්වත් කියලා නැහැ. ගරු කථානායකතුමනි, මම හිතන විධියට අපි මේවා අනිවාර්යයෙන්ම සිදු කළ යුතු දේවල්. එහෙම නැතුව අපට ඉදිරියට යන්න වෙන ක්‍රමයක් නැහැ, ගරු කථානායකතුමනි.

පෞද්ගලීකරණයට සහ වෙනත් රටවලින් නවීන තාක්ෂණය ලබා ගැනීමට අපි අගුල් දමන්නේ ඇයි? ගරු කථානායකතුමනි, ඔබතුමාත්, අපි සියලුදෙනාත් දන්නවා, ඉස්සර දුරකථන සබඳතාවක් ගන්න ගියාම waiting list එකේ අවුරුදු 10ක් විතර ඉන්න ඕනෑ බව. අද ජනගහනය වාගේ තුන් ගුණයක් telephones තිබෙනවා. *[බාධා කිරීම්]* ඒක සිද්ධ වුණේ විදේශ ආයෝජකයෝ ආපු නිසා; තරගයක් තිබුණු නිසා. නැත්නම් ඒක සිද්ධ වෙන්නේ නැහැ. ඒක පිළිගන්න ඕනෑ. 2008 වර්ෂයේ එමිරේට්ස් ගුවන් සමාගම යටතේ අපේ ගුවන් සේවය තිබෙන කොට, ලාභය බිලියන 9යි. අපි ඒක ආපසු අරගෙන මේ වෙනකොට අවුරුදු 14යි; අලාභය බිලියන 1,117යි. ඉතින් එහෙම කරන්න ඕනෑද? *[බාධා කිරීම්]* ඔය බයිලා කියලා වැඩක් නැහැ නේ. දැන් පරණ කථා කියලා වැඩක් නැහැ. *[බාධා කිරීම්]* කවුද කළේ කියමින් - ඔය ගොල්ලොත් කළා; අපිත් කළා; හැමෝම කළා. *[බාධා කිරීම්]* ඔය ගොල්ලන් ඇවිල්ලා පඩිය වැඩි කළේ එක දවසකින්. රුපියල් 10,000කින් රාජ්‍ය සේවයේ වැටුප් වැඩි කළා. නිකම් විහිළුවට වාගේ කිව්වා, 10,000කින් වැටුප් වැඩි කරලා දෙනවා කියලා. එදා බලාපොරොත්තු වුණේ නැහැ, දිනයි කියලා. ඒ වුණාට දිනුවා. දිනපු ගමන් එක දවසකින් මුළු රාජ්‍ය සේවයේම සේවකයන්ට රුපියල් 10,000කින් වැටුප් වැඩි කළා. එතැනින් තමයි සම්පූර්ණයෙන් හැරුණේ මේ රට ආපස්සට යන්න. *[බාධා කිරීම්]* හැමෝම ඒ වාගේ දේවල් කළා. එහෙම කියන්න ගියොත් නවත්වන්න හම්බ වෙන්නේ නැහැ.

ගරු කථානායකතුමනි, ඉතා පැහැදිලියි - *[බාධා කිරීම්]* මේ අය වැය සුරංගනා කථා කියන, ලොසින්ජර්, ටොෆි බෙදන, අඩු පාඩු කියන අය වැයක් නොවෙයි. *[බාධා කිරීම්]* මේක යථාර්ථවාදී අය වැයක්. මේ යථාර්ථවාදී අය වැය මේ රටේ සංවර්ධනයේ නව නැඹුමක් බවට පත් වෙනවා, ගරු කථානායකතුමනි. ඒකයි මට කියන්න තිබෙන්නේ. *[බාධා කිරීම්]* මේ ගොල්ලන් - *[බාධා කිරීම්]* තව එක දෙයක් කියලා මම කථාව අවසන් කරන්නම්, ගරු කථානායකතුමනි. *[බාධා කිරීම්]*

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පොඩ්ඩක් ඉන්න. ඇමතිතුමාගේ කථාව අවසන් වුණාට පසුව අවස්ථාව දෙන්නම්.

**ගරු ජනාධිපති නීතිඥ එම්.යූ.එම්. අලි සබ්රි මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம்.யூ.எம். அலி சப்ரி)
(The Hon. M.U.M. Ali Sabry, PC)
අවසාන වශයෙන් තව එක දෙයක් කියලා මගේ කථාව අවසන් කරන්නම්. ගරු කථානායකතුමනි, මංගල සමරවීර මැතිතුමා අවස්ථා කිහිපයකදී විවිධ ප්‍රකාශ කරලා තිබුණා, මට මතකයි. මෙතුමන්ලා පවා ඒ ගැන කිව්වා. එතුමා අපිත් එක්කත්

හිටියා, පසුව අනෙක් පැත්තටත් ගියා. නමුත්, එතුමාගේ සමහර දේවල්වලට අපි ඒ කාලයේ එකඟ වුණේ නැහැ. සමහර දේවල්වලට අපි එකඟ වුණා. එක දෙයක් සම්බන්ධයෙන් අපි දිගටම එතුමාත් එක්ක එකඟ වුණා. එතුමා කිව්වා, මේ රටේ සිංහල දරුවාටයි, මුස්ලිම් දරුවාටයි, දෙමළ දරුවාටයි "මේ මගේ රට" කියලා ඔහුගේම හිතට දැනෙන තුරු අපට සැබෑ සංහිඳියාවක් ඇති කර ගන්නට බැහැ කියලා. සැබෑ සංහිඳියාවක් නැති තාක් රට දියුණු කරන්න බැහැ කියල එතුමා කිව්වා. අපි ඒකට එකඟ වුණා. එතුමා ඒ කාලයේ fuel pricing formula එකක් ගෙනාවා. අපි ඒකට හිනා වුණා. නමුත් අද අපට සිද්ධ වෙලා තිබෙනවා, ඒක ආයෙත් ගෙනෙන්න. *[බාධා කිරීම්]* ඒක හරි. එහෙම තමයි, ඒකේ ප්‍රශ්නයක් නැහැ. ඒක හිනා වෙන්න දෙයකුත් නොවෙයි. බදු ප්‍රතිපත්ති ගෙනෙන කොට, එතුමා ඒ හා සමානවම Twitter message එකකින් කිව්වා, "මේ බදු ප්‍රතිපත්ති ඉතාම භයානකයි. ඉදිරියේ දී ලංකාව වෙනිසියුලාව වාගේ වෙන්න ඉඩ තිබෙනවා" කියලා. ඒකත් යම් ප්‍රමාණයකට සත්‍ය වෙලා තිබෙනවා. එතුමා තව එක දෙයක් කිව්වා. මෙතුමන්ලා ඒ ගැන කියන්නේ නැහැ. 2020 වර්ෂයේ පැවැති ඡන්දයෙන් එක්සත් ජාතික පක්ෂය සම්පූර්ණයෙන්ම අයින් වෙලා ගියාට පස්සේ, දැනට සිටින ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමා එදා පැරදුණාම, හැමෝම හිතුවා එතුමාගේ දේශපාලන ජීවිතය ඉවරයි කියලා. එදා මංගල සමරවීර මැතිතුමාගෙන් ඇහුවා, "රනිල් වික්‍රමසිංහ මහත්මයා ගැන ඔබට කියන්න තිබෙන්නේ, මොකක්ද කියලා. He said, "Sri Lankans will remember the President whom we never had." එතුමා නොකියා කිව්වේ මොකක්ද? "ලංකාවේ මිනිස්සු කවදා හෝ කියාවි, ඔහු කවදාවත් ජනාධිපති නොවුණු, නමුත් විය යුතු කෙනෙක්" කියලා. නමුත් කවදාවත් ජනාධිපති නොවේ යැයි හිතපු රනිල් වික්‍රමසිංහ මැතිතුමා, දෛවයේ හාස්කමකින් හෝ අද ජනාධිපති වෙලා තිබෙනවා. ඒකත් මතක තියා ගන්න. *[බාධා කිරීම්]* එහෙම වුණේ, මේ අවස්ථාවේ මේ අභියෝගය භාර ගන්නට එතුමාට හැකියාව තිබෙන නිසායි කියන එකත් මම ප්‍රකාශ කරනවා. *[බාධා කිරීම්]* ඒ අභියෝග හමුවේ මේ අය වැය තුළින් මේ රටේ හැරවුම් ලක්ෂ්‍යය නිර්මාණය වෙනවා කියන එකත් ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා,

ගරු කථානායකතුමනි. බොහොම ස්තුතියි. *[බාධා කිරීම්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විසර්ජන පනත් කෙටුම්පත - 2023, දෙවන වර කියවීම, සභාව එකඟද?

**ගරු නීතිඥ ලක්ෂ්මන් කිරිඇල්ල මහතා**
(மாண்புமிகு சட்டத்தரணி லக்ஷ்மன் கிரிஎல்ல)
(The Hon. Lakshman Kiriella, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, අපි විරුද්ධයි. බෙදීමක් ඉල්ලනවා.

***බෙදුම් සීනුව නාද වී අවසන් වුණාට පසු -***
*பிரிவுமணி ஒலித்து ஓய்ந்த பின் -*
*At the conclusion of the Division Bell -*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කරුණාකර ගරු මන්ත්‍රීවරුන් සියලුදෙනා ඉඳගන්න.

දැන් ඡන්දය ප්‍රකාශ කිරීමේ අවස්ථාව. ඡන්දය ප්‍රකාශ කර අවසන් වනතුරු ගරු මන්ත්‍රීවරුන් කරුණාකර අසුන්ගන්න.

***මේ අවස්ථාවේදී ඡන්දය දීම ආරම්භ කෙරිණි.***
*(இச்சந்தர்ப்பத்தில் வாக்கெடுப்பு ஆரம்பமானது.)*
*(At this stage, the Voting commenced.)*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරු ඉන්නවාද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා (මුදල් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய - நிதி இராஜாங்க அமைச்சர்)
(The Hon. Ranjith Siyambalapitiya - State Minister of Finance )

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ කොයි ආකාරයටද?

**ගරු රංජිත් සියඹලාපිටිය මහතා**
(மாண்புமிகு ரன்ஜித் சியம்பலாபிடிய)
(The Hon. Ranjith Siyambalapitiya)
පක්ෂයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ ආණ්ඩු පක්ෂයේ තවත් ගරු මන්ත්‍රීවරු ඉන්නවාද?

ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ විරුද්ධ පක්ෂයේ ගරු මන්ත්‍රීවරු ඉන්නවාද? *[බාධා කිරීමක්]*

ගරු වී. රාධාක්‍රිෂ්ණන් මන්ත්‍රීතුමා, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ කොයි ආකාරයටද?

**ගරු (ආචාර්ය) වී. රාධාක්‍රිෂ්ණන් මහතා**
(மாண்புமிகு (கலாநிதி) வீ. இராதாகிருஷ்ணன்)
(The Hon. (Dr.) V.Radhakrishnan)
විරුද්ධයි.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමනි, ඔබතුමා ඡන්දය ප්‍රකාශ කරන්නේ කොයි ආකාරයටද?

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
විරුද්ධයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ඡන්දය ප්‍රකාශ කිරීමට නොහැකි වූ තවත් ගරු මන්ත්‍රීවරු සිටිනවාද?

දැන් ඡන්දය දීමට ලබා දී තිබූ කාලය අවසානයි.

***ඡන්දය ප්‍රකාශ කිරීමෙන් පසුව -***
*வாக்கெடுப்பின் பின் -*
*On conclusion of the Voting -*

***මේ අවස්ථාවේදී පහත සඳහන් නම් සභා ගර්භයේ ඇති ඩිජිටල් පුවරුවේ ප්‍රදර්ශනය කෙරිණි.***

*(இவ்வேளையில், கீழ்வரும் பெயர்கள் சபாமண்டபத்திலுள்ள டிஜிற்றல் திரையில் காண்பிக்கப்பட்டது.)*

*(At this stage, the following names appeared on the digital screen in the Chamber.)*

***විද්‍යුත් ඡන්ද විමසීම අනුව පහත දැක්වෙන පරිදි - පක්ෂව 120: විරුද්ධව 82: වැළකී සිටි 01 යනුවෙන් බෙදුණේය.***

*இலத்திரனியல் வாக்கெடுப்பு முறைக்கிணங்க பாராளுமன்றம் பிரிந்தது: சார்பாக 120; எதிராக 82; விலகியிருந்தோர் 01.*

*According to Electronic Voting, Parliament divided: Ayes 120: Noes 82: Abstain 1.*

| | | |
|---|---|---|
| G 001. | Douglas Devananda | Yes |
| G 002. | Nimal Siripala De Silva | Yes |
| G 003. | Chamal Rajapaksa | Yes |
| G 004. | Mahinda Rajapaksa | Yes |
| G 005. | Prasanna Ranatunga | Yes |
| G 006. | Susil Premajayantha | Yes |
| G 007. | Dinesh Gunawardena | Yes |
| G 010. | Keheliya Rambukwella | Yes |
| G 011. | Mahinda Amaraweera | Yes |
| G 012. | Wijeyadasa Rajapakshe | Yes |
| G 013. | Harin Fernando | Yes |
| G 014. | Ramesh Pathirana | Yes |
| G 015. | M.U.M. Ali Sabry | Yes |
| G 016. | Vidura Wickramanayaka | Yes |
| G 017. | Kanchana Wijesekera | Yes |
| G 018. | Naseer Ahamed | Yes |
| G 019. | Manusha Nanayakkara | Yes |
| G 020. | Tiran Alles | Yes |
| G 021. | Ajith Rajapakse | Yes |
| G 022. | Nalin Fernando | Yes |
| G 023. | Roshan Ranasinghe | Yes |
| G 024. | Jagath Pushpakumara | Yes |
| G 026. | Dilum Amunugama | Yes |
| G 027. | Mohan Priyadarshana De Silva | Yes |
| G 028. | Janaka Wakkumbura | Yes |
| G 029. | Shehan Semasinghe | Yes |
| G 030. | Kanaka Herath | Yes |
| G 031. | Thenuka Vidanagamage | Yes |
| G 032. | Premitha Bandara Tennakoon | Yes |
| G 033. | Lasantha Alagiyawanna | Yes |
| G 034. | Rohana Dissanayaka | Yes |
| G 035. | Premalal Jayasekara | Yes |
| G 036. | Arundika Fernando | Yes |
| G 037. | Vijitha Berugoda | Yes |
| G 038. | Lohan Ratwaththe | Yes |
| G 039. | Sanath Nishantha | Yes |
| G 040. | Tharaka Balasuriya | Yes |
| G 041. | Indika Anuruddha Herath | Yes |
| G 042. | Siripala Gamalath | Yes |
| G 043. | Anuradha Jayaratne | Yes |
| G 044. | S. Viyalanderan | Yes |
| G 045. | D. V. Chanaka | Yes |
| G 046. | Sisira Jayakody | Yes |
| G 047. | Piyal Nishantha De Silva | Yes |
| G 048. | Prasanna Ranaweera | Yes |
| G 049. | D. B. Herath | Yes |
| G 050. | Shasheendra Rajapaksa | Yes |
| G 051. | Seetha Arambepola | Yes |
| G 052. | Shantha Bandara | Yes |
| G 053. | K. Kader Masthan | Yes |
| G 054. | Ashoka Priyantha | Yes |
| G 055. | A. Aravindh Kumar | Yes |
| G 056. | Geetha Samanmale Kumarasinghe | Yes |
| G 057. | Suren Raghavan | Yes |
| G 058. | Diana Gamage | Yes |
| G 059. | Sivanesathurai Santhirakanthan | Yes |
| G 060. | Chamara Sampath Dasanayake | Yes |
| G 061. | Anupa Pasqual | Yes |
| G 062. | Johnston Fernando | Yes |
| G 063. | S. B. Dissanayake | Yes |
| G 064. | Pavithradevi Wanniarachchi | Yes |
| G 065. | Gamini Lokuge | Yes |
| G 066. | Vajira Abeywardena | Yes |
| G 067. | Janaka Bandara Thennakoon | Yes |
| G 068. | C. B. Rathnayake | Yes |
| G 069. | S. M. Chandrasena | Yes |
| G 070. | Mahindananda Aluthgamage | Yes |
| G 071. | Rohitha Abeygunawardhana | Yes |
| G 072. | Namal Rajapaksa | Yes |
| G 073. | Sarath Weerasekera | Yes |
| G 074. | Wimalaweera Dissanayaka | Yes |
| G 075. | Dhammika Perera | Yes |
| G 076. | Kapila Athukorala | Yes |
| G 077. | Gayashan Nawananda | Yes |
| G 078. | S. M. M. Muszhaaraff | Yes |
| G 079. | Jayantha Ketagoda | Yes |
| G 080. | Sampath Athukorala | Yes |
| G 082. | U. K. Sumith Udukumbura | Yes |
| G 083. | Pradeep Undugoda | Yes |
| G 084. | Sanjeeva Edirimanna | Yes |
| G 085. | Akila Ellawala | Yes |
| G 086. | Jagath Kumara Sumithraarachchi | Yes |
| G 087. | Karunadasa Kodithuwakku | Yes |
| G 088. | Nalaka Bandara Kottegoda | Yes |
| G 089. | Udayakantha Gunathilaka | Yes |
| G 090. | Kokila Gunawardene | Yes |
| G 091. | Milan Jayathilake | Yes |
| G 092. | Kulasingam Dhileeban | Yes |
| G 093. | Sudarshana Denipitiya | Yes |
| G 094. | Isuru Dodangoda | Yes |
| G 095. | Premnath C. Dolawatte | Yes |
| G 096. | H. Nandasena | Yes |
| G 097. | Muditha Prishanthi | Yes |
| G 098. | Sudath Manjula | Yes |
| G 099. | Mayadunna Chinthaka Amal | Yes |
| G 100. | Nipuna Ranawaka | Yes |

| | | |
|---|---|---|
| G 101. | Kumarasiri Rathnayaka | Yes |
| G 102. | Gunathilaka Rajapaksha | Yes |
| G 103. | Upul Mahendra Rajapaksha | Yes |
| G 104. | Rajika Wickramasinghe | Yes |
| G 105. | M. W. D. Sahan Pradeep Withana | Yes |
| G 106. | Madhura Withanage | Yes |
| G 107. | D. Weerasingha | Yes |
| G 108. | Samanpriya Herath | Yes |
| G 109. | Sagara Kariyawasam | Yes |
| G 110. | Yadamini Gunawardena | Yes |
| G 111. | Manjula Dissanayake | Yes |
| G 112. | Ranjith Bandara | Yes |
| G 113. | Jayantha Weerasinghe | Yes |
| G 114. | Marjan Faleel | Yes |
| G 115. | Lalith Varna Kumara | Yes |
| G 116. | S. Jagath Samarawickrama | Yes |
| O 001. | Rishad Bathiudeen | No |
| O 002. | Rajitha Senarathne | No |
| O 003. | Imthiaz Bakeer Markar | No |
| O 004. | Tissa Attanayake | No |
| O 005. | Rauff Hakeem | No |
| O 006. | Gayantha Karunatilleka | No |
| O 007. | Lakshman Kiriella | No |
| O 008. | Sajith Premadasa | No |
| O 009. | Kumara Welgama | No |
| O 010. | Patali Champika Ranawaka | No |
| O 011. | Palany Thigambaram | No |
| O 012. | Mano Ganesan | No |
| O 013. | Maithreepala Sirisena | No |
| O 015. | G.L. Peiris | No |
| O 016. | Anura Dissanayaka | No |
| O 017. | A. L. M. Athaullah | Yes |
| O 018. | G. G. Ponnambalam | No |
| O 019. | C. V. Wigneswaran | Abstain |
| O 020. | Athuraliye Rathana Thero | No |
| O 021. | Kabir Hashim | No |
| O 022. | Thalatha Athukorala | No |
| O 023. | Abdul Haleem | No |
| O 024. | Sarath Fonseka | No |
| O 025. | Harsha De Silva | No |
| O 028. | R. M. Ranjith Madduma Bandara | No |
| O 029. | Niroshan Perera | No |
| O 030. | Eran Wickramaratne | No |
| O 031. | J. C. Alawathuwala | No |
| O 033. | John Seneviratne | Yes |
| O 034. | Anura Priyadharshana Yapa | No |
| O 035. | Tissa Vitharana | No |
| O 036. | Dullas Alahapperuma | No |
| O 037. | Vijitha Herath | No |
| O 038. | Selvarajah Kajendren | No |
| O 040. | Ali Sabri Raheem | Yes |
| O 041. | Angajan Ramanathan | No |
| O 042. | Faizal Cassim | No |
| O 043. | Ashok Abeysinghe | No |
| O 045. | Ajith Mannapperuma | No |
| O 046. | Buddhika Pathirana | No |
| O 047. | M. S. Thowfeek | No |
| O 048. | Nalin Bandara Jayamaha | No |
| O 049. | Hector Appuhamy | No |
| O 050. | Thushara Indunil Amarasena | No |
| O 052. | Kavinda Heshan Jayawardhana | No |
| O 053. | Dilan Perera | No |
| O 054. | Wimal Weerawansa | No |
| O 055. | Piyankara Jayaratne | Yes |
| O 056. | Vasudeva Nanayakkara | No |
| O 057. | Harini Amarasuriya | No |
| O 061. | Mayantha Dissanayake | No |
| O 062. | K. Sujith Sanjaya Perera | No |
| O 063. | S. M. Marikkar | No |
| O 064. | Imran Maharoof | No |
| O 065. | Ishak Rahuman | No |
| O 066. | Mujibur Rahuman | No |
| O 067. | Harshana Rajakaruna | No |
| O 068. | Rohini Kumari Wijerathna | No |
| O 069. | Chaminda Wijesiri | No |
| O 070. | Waruna Liyanage | No |
| O 071. | M. Udayakumar | No |
| O 072. | Hesha Withanage | No |
| O 074. | Duminda Dissanayake | Yes |
| O 075. | Chandima Weerakkody | No |
| O 076. | Dayasiri Jayasekara | No |
| O 081. | W. H. M. Dharmasena | No |
| O 082. | Kins Nelson | No |
| O 083. | Rohana Bandara | No |
| O 085. | Udaya Gammanpila | No |
| O 086. | Nalaka Godahewa | No |
| O 087. | Channa Jayasumana | No |
| O 089. | Nimal Lanza | Yes |
| O 090. | Jayantha Samaraweera | No |
| O 091. | Jeevan Thondaman | Yes |
| O 092. | B. Y. G. Rathnasekara | No |
| O 093. | Sarathie Dushmantha | No |
| O 094. | Mohomad Muzammil | No |
| O 095. | Lalith Ellawala | No |
| O 096. | Udayana Kirindigoda | No |
| O 097. | K. P. S. Kumarasiri | No |
| O 098. | Upul Galappaththi | No |
| O 099. | Shan Vijayalal de Silva | No |
| O 102. | Nimal Piyathissa | No |
| O 103. | Uddika Premarathne | No |
| O 104. | Wasantha Yapabandara | No |
| O 105. | Thilak Rajapakshe | No |
| O 106. | M. Rameshwaran | Yes |
| O 107. | Gamini Waleboda | No |
| O 108. | Weerasumana Weerasinghe | No |
| O 109. | Gevindu Cumaratunga | No |
| O 110. | Charitha Herath | No |

Electronic Voting Results:

**Participants:**

Present 203

**Votes:**

| | |
|---|---|
| Yes | 120 |
| No | 82 |
| Abstain | 1 |

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
විද්‍යුත් ඡන්ද විමසීම අනුව පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 120යි; විරුද්ධව 82යි; වැළකී සිටි 01යි.

නැඟී සිට පක්ෂව ඡන්දය දුන් සංඛ්‍යාව 01යි. ඒ අනුව, පක්ෂව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 121යි.

නැඟී සිට විරුද්ධව ඡන්දය දුන් සංඛ්‍යාව 02යි. ඒ අනුව, විරුද්ධව ලබා දුන් මුළු ඡන්ද සංඛ්‍යාව 84යි.

ඒ අනුව, විසර්ජන පනත් කෙටුම්පත, 2023 දෙවන වර කියවීම සම්මතයි.

***පනත් කෙටුම්පත ඊට අනුකූලව දෙවන වර කියවන ලදී.***
*அதன்படி, சட்டமூலம் இரண்டாம் முறை மதிப்பிடப்பட்டது.*
*Bill accordingly read a Second time.*

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
ගරු කථානායකතුමනි, මුදල් අමාත්‍යතුමා වෙනුවෙන්, "විසර්ජන පනත් කෙටුම්පත පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවකට පැවරිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කාරක සභාව කවදාද?

**ගරු නීතිඥ (ආචාර්ය) සුසිල් ප්‍රේමජයන්ත මහතා**
(மாண்புமிகு சட்டத்தரணி (கலாநிதி) சுசில் பிரேமஜயந்த)
(The Hon. (Dr.) Susil Premajayantha, Attorney-at-Law)
2022 නොවැම්බර් 23වන බදාදා.

***පනත් කෙටුම්පත, අංක 57 දරන ස්ථාවර නියෝගය යටතේ, 2022 නොවැම්බර් 23 වන බදාදා පවත්වන පූර්ණ පාර්ලිමේන්තු කාරක සභාවට පවරන ලදී.***
*சட்டமூலம், நிலைக்கட்டளை இல. 57இன்படி, 2022 நவம்பர் 23, புதன்கிழமை நடைபெறவிருக்கும் முழுப் பாராளுமன்றக் குழுவுக்குச் சாட்டப்பட்டது.*
*Bill committed to a Committee of the whole Parliament under Standing Order No. 57 for Wednesday, 23rd November, 2022.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ. භා. 5.00 පසු කර තිබුණෙන් ගරු කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***
***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ. භා. 6.13ට, 2022 නොවැම්බර් 19 වන දින සභා සම්මතිය අනුව, 2022 නොවැම්බර් 23වන බදාදා පූ. භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.00 மணிக்குப் பிந்திவிட்டமையால், மாண்புமிகு சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*
*அதன்படி, பி.ப. 6.13 மணிக்கு, பாராளுமன்றம் அதனது 2022 நவம்பர் 19ஆம் திகதிய தீர்மானத்திற்கிணங்க, 2022 நவம்பர் 23, புதன்கிழமை மு.ப. 9.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*And it being past 5.00 p.m., THE HON. SPEAKER adjourned Parliament without Question put.*
*Parliament adjourned accordingly at 6.13 p.m. until 9.30 a.m on 23rd Wednesday, 2022, pursuant to the Resolution of Parliament of 19th November, 2022.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களைத் தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts**
**Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.